# වාර්ෂික වාර්තාව

# 2019

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

**සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**උතුරු මැද පළාත් සභාව**

**අනුරාධපුර**

+94252222238/+94252225295/ncpplanning@yahoo.com

# වාර්ෂික වාර්තාව - 2019

## සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාත

## 2019

**මග පෙන්වීම**
ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත - එච්.එම්.පී.බණ්ඩාර මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - පී.බී.දයාරත්න මයා

**නිර්මාණය සැකසීම හා අධීක්ෂණය**
සහකාර ලේකම් (සැලසුම්) - කේ.ඒ.නොයෙල් මයා

**සහාය**
සංවර්ධන නිළධාරි - එච්.එම්.එන්.පී.හේරත් මෙය

## ගරු ආණ්ඩුකාරතුමාගේ පණිවිඩය



2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව එළිදක්වන මෙම අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මහත් සතුටට කරුණකි.

2019 වර්ෂය තුළදී උතුරු මැද පළාත් සභාව පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය දරමින් පළාතේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන පිළිබඳව ප්‍රමාණවත් අදහසක් ලබා ගැනීමට හැකි විය.

ශ්‍රී ලංකාවේ පළාත් අතරින් උතුරු මැද පළාත සුවිශේෂිවන අතර සංවර්ධනයේ විෂමතාවයන් හඳුනාගත හැකිවනවා මෙන්ම පළාත සංවර්ධනය කරා රැගෙන යා හැකි සුවිශේෂී මෙන්ම අනන්‍ය වූ විභවතාවයන්ගෙන් ද සමන්විත බව සඳහන් කළ හැකිය. එම නිසා පළාතේ සංවර්ධනය උදෙසා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අනෙකුත් ආයතන හා පෞද්ගලික අංශය ද ඇතුළුව සියළු පාර්ශවකරුවන්ගේ දායකත්වය හා සහභාගිත්වය ලබා ගනිමින් සංවර්ධන ඉලක්ක සාධනය කරගැනීම අරමුණු කරගත් සංවර්ධන වැඩසටහන මෙහෙයවීමට අපේක්ෂා කෙරේ.

පළාතේ සංවර්ධනයට අභියෝගයක්ව පවතින දිළිඳුකම හා බැඳුණු අනෙකුත් හඳුනාගත් ගැටළු විසඳාලමින් සංවර්ධනයේ මංපෙත් විවර කරගැනීමටත් එහි ප්‍රතිලාභ පළාතේ ජනතාවට භුක්ති විඳිමට අවස්ථාව සලසා දීමටත් හැකිවන අයුරින් 2020 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන ඉලක්කගත දිශානතියක් ඔස්සේ ළඟා වීම අපේක්ෂාව වේ. ඒ සඳහා පළාතේ කළමනාකරණ කණ්ඩායම සමග සියළු පාර්ශවකරුවන්ගේ දායකත්වය හා සහභාගිත්වය ලබා ගනිමින් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කාලෝචිත අයුරින් සැලසුම් සකස් කිරීමටත් අපේක්ෂිත ප්‍රතිඵල සාධනය කර ගැනීම උදෙසා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

එසේම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ අන්තර්ගත සංවර්ධන ඉලක්ක සැබෑකර ගැනීම සඳහා පළාත මෙහෙයවීම අපේක්ෂාවයි. එපමණක්ද නොව "සුන්දර දිවයින යළිත් හරිත වර්ණයෙන් බබළන අනාගත ලෝකයේ තිරසර සංවර්ධනයේ පරමාදර්ශය" බවට පත් කිරීමේ අපේක්ෂාව යථාර්තයක් බවට පත් කිරීම උදෙසා උතුරු මැද පළාතේ දායකත්වය උපරිම අයුරින් ලබා දීමට හැකි වන අයුරින් මෙන්ම සියළු අංශ සමබර සංවර්ධනයක් උදෙසා රැගෙන යා හැකි අයුරින් සංවර්ධන කාර්යය මෙහෙයවීමට කටයුතු කරන බව තිර අදිටනින් ප්‍රකාශ කර සිටිනු කැමැත්තෙමි.

මහීපාල හේරත්,

ආණ්ඩුකාරවර,

උතුරු මැද පළාත.

## ප්‍රධාන ලේකම්තුමාගේ පණිවිඩය



2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව එළි දක්වන මේ අවස්ථාවේ පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. අදාල වර්ෂය තුළදී උතුරු මැද පළාත් සභාව ලෙස පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය දරමින් සංවර්ධන කාර්යය කෙසේ ක්‍රියාත්මක කළේද යන්න පිළිබඳ කරුණු ඇතුළත් වාර්ෂික වාර්තාවක් සකස් කිරීම ඉතාමත් වැදගත් කොට සලකමි.

2019 වර්ෂයේදී ද පළාත් සභාව ප්‍රධාන කාර්යයන් 39 ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය විය. අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්මය, ප්‍රාදේශීය සංවර්ධන, වාරිමාර්ග, පශු සම්පත්, සමාජ ආරක්ෂණ හා සමාජ සුභසාධනය, ග්‍රාම සංවර්ධනය, පරිවාස හා ළමා රක්ෂණ සේවා, මාර්ග සංවර්ධන යන අංශ මගින් පළාතේ සැලසුම්ගත සංවර්ධන කාර්යය සඳහා කැපී පෙනෙන දායකත්වයක් සැපයීමට හැකිවිය.

මධ්‍යම රජය, මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු , පළාත් අරමුදල් හා වෙනත් විදේශීය අරමුදල් යටතේ පළාත් සංවර්ධන කාර්යය වඩාත් කාර්යක්ෂමව මෙන්ම ඵලදායීව ඉලක්කගත අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් අනුබද්ධිත ආයතන මනාව මෙහෙය විය හැකි වූ වසරකි. ඒ නිසාම අපේක්ෂිත ඉලක්ක සාධනය කර ගැනීම මනා අභිප්‍රේරණයකින් මෙන්ම කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම සඳහා මග පෙන්වීමට හැකිවීම තුළ 2018 වර්ෂයට සාපේක්ෂව යහපත් ප්‍රගතියක් කරා පළාත රැගෙන යාමට හැකි වූ බව විශ්වාස කරමි.

සමස්තයක් ලෙස ජනතාව මුහුණ දෙන ගැටළුවලට පිළියම් යොදමින් යහපත් සමාජයක් නිර්මාණය කිරීම යන ප්‍රමුඛ අභිමතාර්ථයන් සාධනය කරගැනිම කෙරෙහි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට වෙන් වූ ප්‍රතිපාදන යොදවමින් ඒ සඳහා ප්‍රමාණවත් ආරම්භයක් ලබා දීමට හැකි වූ වර්ෂයක් ලෙස දකිමි.

එසේම 2020 වර්ෂය තුළදී නව රජයේ ප්‍රතිපත්ති රාමුවද සැලකිල්ලට ගනිමින් දස ප්‍රතිපදාවන්ගෙන් යුක්තව ඵලදායි පුරවැසියෙක් , සතුටින් ජීවත්වන පවුලක්, විනයගරුක සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් යන චතුර්විධ අරමුණු ළඟාකර ගැනීම යන රජයේ ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනෙනු ඇත.

උතුරු මැද පළාතට ප්‍රමාණාත්මකව සැලකිය යුතු ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය නිවාරණය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද හැකි විය. එපමණක් ද නොව මේ වන විටත් වකුගඩු රෝගයෙන් පිඩා විඳින හා ප්‍රතිකාර ලබා ගැනිම සඳහා පැමිණෙන්නන්හට නවාතැන් පහසුකම්, විශේෂඥ වෛද්‍යවරුන්ට රෝගීන් පරීක්ෂාව සඳහා හා රසායනාගාර පහසුකම් සැපයීම, වෛද්‍ය පර්යේෂණ හා සමීක්ෂණ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කොට ඉදිකරන ලද **“මෙත් සිරි සෙවන ”**ව්‍යාපෘතිය ජනතා සුභසිද්ධිය උදෙසා විවෘත කොට ලබා දිමට හැකිවිම ද ලද විශාල ජයග්‍රහණයකි.

2019 වර්ෂයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගරු පළාත් ආණ්ඩුකාරතුමා හා අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් විසින් ලබාදුන් සහයෝගය තුළින් මෙම සියළු ජයග්‍රහණ ලබාගත හැකිවුත් ඉලක්කගත සංවර්ධන වැඩසටහනක් සැලැසුම්සහගතව ක්‍රියාත්මක කළ හැකි වුත් වර්ෂයක් බවද සිහිපත් කරමි.

එච්.එම්.පී.බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත් සභාව,අනුරාධපුර.

## නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) තුමාගේ පණිවිඩය



භූමිය වශයෙන් විශාල ප්‍රදේශයක පැතිරී පවතින උතුරු මැද පළාත, තිරසර සංවර්ධනය, පරිසර, සමාජ හා ආර්ථික යන කරුණු ඔස්සේ සලකා බලන විට ඉතාම වැදගත් වූ පළාතක් ලෙස සඳහන් කළ හැකිය. ප්‍රදේශයට වාර්ෂිකව ලැබෙන අඩු වර්ෂාපතනය එල්ලංගා තුළ පිහිටි වාරිමාර්ග පද්ධතිය තුළින් රටට අවශ්‍ය බත සහ අනෙකුත් ධාන්‍ය, එළවළු හා පළතුරු සපයන වාසනාවන්ත ප්‍රදේශයකි.

2019 වර්ෂය තුළ පළාත් සභාවේ සියළු ආයතන සමස්ත සංවර්ධනය සඳහා අනෙකුත් පාර්ශව හා ඒකාබද්ධව ඉටු කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සහිත කාර්ය සාධනය ඉදිරිපත් කිරීම සතුට දනවන කරුණකි.

අධ්‍යාපන,සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ, කෘෂිකර්ම හා සත්ත්ව නිෂ්පාදන, මාර්ග පද්ධතිය තුළ සැලකිය යුතු සංවර්ධනයක් ඇති කිරීමටත්,පළාතේ ජනතාවගේ ආදායම් උත්පාදන මාර්ග පුළුල් කිරීමටත්, පළාත් සංචාරක අංශයේ සංවර්ධනය උදෙසා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සැලකිය යුතු මට්ටමකින් සංවර්ධනය කිරිමටත් පළාතේ ජනතාවට අවශ්‍ය පිරිසිදු පානීය ජලය ලබා ගැනීම සඳහා පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පළාතේ ප්‍රබල ගැටලුවක්ව පවතින වකුගඩු රෝග නිවාරණ කටයුතු සඳහා හැකි පමණින් දායකත්වය සැපයිමටත් හැකිවූ වසරක් ලෙසද සඳහන් කරමි.

තවද විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය කරමින් සමස්ත පළාත් සංවර්ධන වැඩසටහන නියාමනය හා ඇගැයුම් කරමින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට හැකි විය.

පළාතේ සංවර්ධන ක්‍රියාවලිය තිරසර පදනමක් තුළ ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය පළාත් සැලැස්ම සකස් කිරිමේ කාර්යය ''තිරසර, ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම''නමින් වසම් මට්ටමින් තොරතුරු ලබාගෙන පළාත් සැලසුම සැකසීමේ කටයුතු අවසන් අදියරට ගෙන ඒමට හැකි විය. එසේම සංවර්ධන සැලසුම් මෙහෙයුම් පද්ධතිය (DPMS) හා තීරණ ගැනීම පහසු කිරීමේ මෙහෙයුම් පද්ධතිය (DSMS) හඳුන්වා දීමට කටයුතු කිරිම තුළ පළාතේ සංවර්ධන කාර්යය ක්‍රමානුකූලව ඉලක්ක වෙත ගමන් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේදී ගරු ආණ්ඩුකාරතුමා, ප්‍රධාන ලේකම්තුමා,අමාත්‍යාංශ ලේකම්වරුන්,දෙපාර්තමේන්තු ප්‍රධානින් හා ප්‍රාදේශිය ලේකම්තුමන්ලා ඇතුළු රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා සංවිධාන ප්‍රජා දායකත්වය ද සපයමින් පළාත් සංවර්ධන කාර්යය ශක්තිමත්කර ගැනීම සඳහා දායකත්වය සැපයු සියළු දෙනාටත්, මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා දායකත්වය දැක්වූ මෙම ආයතනයේ හා අනෙකුත් ආයතනවල නිලධාරීන් ද ගෞරවපූර්වකව සිහිපත් කරමි.

පි.බී.දයාරත්න,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම් ),

ප්‍රධාන ලේකම් කාර්යාලය,


උතුරු මැද පළාත.

## උතුරු මැද පළාත පිළිබඳව සැකෙවින්....




රජරට නුවරකලාවිය නොහොත් වැව් බැඳි රාජධානිය ලෙස විරුදාවලිය ලද උතුරු මැද පළාත, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ ද්විතීය රාජධානි ඇතුළත් වූ අතිශයින්ම පුණ්‍යවන්ත වූ ස්වර්ණ භූමියකි.

අනුරාධපුර සහ පොළොන්නරුව ලෙස වර්තමානයේදී භාවිතාවන පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත උතුරු මැද පළාත එයටම ආවේණික, අනන්‍ය,අද්විතීය අගයන්ගෙන් හා ශ්‍රී විභූතීන්ගෙන් සමන්විතය. අග්‍රගණ්‍ය සහ අසමසම අගයන් හා ජාතික උරුමයන් රැසක් දැයට දායාද කරමින් එම පෞඩත්වය මිහිදන්ව සහ ඇතැම්විට ඉස්මතු වී පෙනෙමින් ශ්‍රේෂ්ඨ ජාතියක විශ්මයජනක ගමන්මඟ යළි යළිත් සුජාතවන පරපුරට නිහඬව කියා දෙයි. සිංහල රාජ්‍ය වංශකතාව, ශිෂ්ටාචාරය හා සංස්කෘතියේ ප්‍රභවය හා විකාශනය මෙන්ම සිදු වූ ප්‍රවණතා පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීමේදී ඒ සඳහා අවශ්‍යවන ඓතිහාසික ශක්තිමත් අඩිතාලම රජරටින් සපයයි.




ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය, ජල ශිෂ්ටාචාරය, රාජ්‍ය වංශ කතාව, දේශපාලනය, කළමනාකරණය හා පරිපාලනය, බෞද්ධ දර්ශනය,පුරාවිද්‍යාව-වාස්තු විද්‍යාව, මූර්ති හා කැටයම් කලාව, භාෂාව හා සාහිත්‍ය ආදී සංස්කෘතිකාංග මෙන්ම ඒ මත ගොඩනැගුණු ශිෂ්ටාචාරයන් හා සභ්‍යත්වයන් ලොවට කියාපාන්නේ රජරට පුණ්‍ය භූමියෙන් ය. නවතම ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රමෝපායන් සහ තාක්ෂණය සොයා අප යා යුතු වන්නේ රජරට පැවති ශ්‍රී විභූතිය වෙතට ගමන් කිරිමෙනි.




ක්‍රි.පූ. 543 දී පමණ එනම් සම්බුද්ධ පරිනිර්වාණ දිනයේදීම සිදු වූ විජයාවතරණයෙන් පසු අනුරාධ නම් සෙනෙවියෙකු අනුරාධ නැකතින් මල්වතු ඔය අසල අනුරාධපුර ජනාවාසය ආරම්භ කරන ලදී. ක්‍රි.පූ. 4 දී පමණ ජෝතිය නැමැති ජෛන බමුණකුගේ සැලසුමකට අනුව පණ්ඩුකාභය රජතුමා විසින් අනුරාධපුර නගරය නිර්මාණය කර ඇත. එම නගර නිර්මාණය වර්තමානයේදී අගනගර නිර්මාණයේදී අනුගමනය කරනු ලබන අංගෝපාංග බහුතරයකගෙන් සමන්විත වී තිබීම විශ්මයජනකය.

පොළොන්නරුව මුලින්ම අගනුවර කරගත්තේ චෝල ආක්‍රමණිකයන් විසින්ය. ක්‍රි.ව 1070 පමණ චෝල ආක්‍රමණිකයන් පළවාහැර පළමුවන විජයබාහු රජු විසින් අගනුවර ලෙස පොළොන්නරුව තෝරා ගෙන ඇත. චෝල පාලන සමයේදී ජනනාතමංගලම් ලෙස හැඳින් වූ පොළොන්නරු යුගය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන වකවානුවකි.

අනුරාධපුර මෙන්ම ජල ශිෂ්ටාචාරය මත පදනම් වූ මෙම යුගය විශ්මිත කලා නිර්මාණ හා භාෂා සාහිත්‍ය අතින්ද ස්වර්ණමය යුගයකි. එම කාලයේදී මෙරටින් පිට රටට පවා සහල් යැවූ බව පැරණි පොත පතෙහි සඳහන් වේ.


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට සමගාමීව 1987 අංක 42 දරණ පළාත් සභා පනතින් සැලසුණු අවකාශයට අනුව ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත විය. මේ අනුව යහපාලන සංකල්පයට අනුගත වීම රජයේ ප්‍රධාන අරමුණක් වන අතර ඊට අනුව යමින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා පරිපාලන ව්‍යුහය තුළ පළාත් සභා ක්‍රමය හැරවුම් ලක්ෂයක් වන අතර පළාත් සභා ක්‍රමය තුළින් බලය බෙදා හැරීම සහ ප්‍රාදේශියව පවත්නා සමාජ ආර්ථික සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා මුලික දායකත්වයක් පළාත තුළින් සපයා ඇත.



මධ්‍යම රජයට අමතරව මධ්‍යම රජයේ නියාමනයට අනුව පළාතේ සංවර්ධන පරිපාලන සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ මෙන්ම පුනරුත්ථාපන හා ප්‍රතිසංවර්ධන කටයුතු වලදී ද ප්‍රධානම කළමනාකරණ කේන්ද්‍රස්ථානය වන්නේ පළාත් සභාවයි. පළාතක ජන ජීවිතයේ යහපැවැත්ම, සමෘද්ධිමත් බව, සුභසිද්ධිය, තිරසාර බවට බාධා පමුණුවන පීඩාවන්, ප්රබල අභියෝග හා ගැටළු හඳුනාගෙන ඒ සඳහා තිරසාර, කඩිනම්, විධිමත් සහ ඉලක්කගත පිළියම් යෙදීමට පළාත් සභා ක්‍රමය යොදාගෙන ඇත.



පරිපාලන දිස්ත්‍රික්ක අටකින් ද [8] මායිම්ව පිහිටා ඇති උතුරු මැද පළාත, දිවයිනේ විශාලම පරිපාලන දිස්ත්‍රික්කය වේ. පළාතේ සම්පූර්ණ ජනගහනය 1,401,561ක් වන අතර මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 10,645ක් පමණ වේ. එය ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසිනවයකින් ද [29], මහනගර සභා දෙකකින් ද [02], ප්‍රාදේශීය සභා විසිපහකින් ද [25], ග්‍රාම නිලධාරී වසම් නමසිය අසූ අටකින් ද [988] සමන්විත වේ.



උතුරු මැද පළාතේ ජනගහනය ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 6.5%ක පමණ ප්‍රතිශතයකි. පළාතේ මුළු පවුල් සංඛ්‍යාව 365,000 ක් පමණ වන අතර සමෘද්ධි සහනාධාර හිමි පවුල් සංඛ්‍යාව 83,180ක් පමණ වේ. දළ දේශීය නිෂ්පාදිතයට පළාතෙන් කරනු ලබන දායකත්වය 5.8%ක ප්‍රතිශතයකි.

ජනඝනත්වය දෙස බැලීමේදී වර්ග කිලෝ මීටර එකක පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව 142 කි. මෙහිදී විශේෂත්වය වන්නේ ජනඝනත්වය අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට වඩා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනඝනත්වය ඉහළ අගයක් ගැනීමයි. පළාතේ භූමි ප්‍රමාණයෙන් විවිධ ප්‍රමාණයේ ජලාශයන්ගෙන් වර්ග කිලෝමීටර 782ක් පමණ ආවරණය වී ඇත. සමස්ත ජනගහනයෙන් 5%ක් පමණ නාගරිකව ජීවත් වේ. පළාතේ පවතින විවිධ සම්පත් සහ විභව ශක්තීන් අතර මානව සම්පත, සරුසාර පස, ජලය, වනාන්තර, දැව, පොස්පේට්, රෝස තිරුවානා, සත්ව හා මිරිදිය ධීවර සම්පත, පරිසර පද්ධතිය සහ විශේෂයෙන්ම එල්ලංගා වාරි පද්ධතිය සහ 250,000 ද ඉක්මවා ඇති පළාතේ ගව සම්පත විශේෂිත වේ.

උතුරු මැද පළාතේ වැදගත් සමාජ ආර්ථික තොරතුරු

## 01. භූමි ප්‍රමාණය හා විශාලත්වය

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය(ව.කි.මී) | | |
|---|---|---|---|
| | ගොඩ බිම් | අභ්‍යන්තර ජලාශ | මුළු භූමි ප්‍රමාණය |
| අනුරාධපුර | 6,601 | 578 | 7,179 |
| පොළොන්නරුව | 3,262 | 204 | 3,466 |
| උතුරු මැද පළාත | 9,863 | 782 | 10,645 |

**මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## 02. ජනගහනය හා ජන ඝනත්වය

| විස්තරය | 2012* | 2016** | 2017*** | 2018*** |
|---|---|---|---|---|
| මුළු ජනගහනය | 1,266,700 | 1,401,561 | 1,349,000 | 1,366,000 |
| නාගරික ජනගහනය (5.9%) | 50,600 | 55,866 | 54,162 | 54,870 |
| ග්‍රාමීය ජනගහනය (94.1%) | 1,216,100 | 1,345,695 | 1,294,838 | 1,311,130 |
| ජන ඝනත්වය | 128 | 142 | 138 | 139 |

**මූලාශ්‍රය: මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ශ්‍රී ලංකා මහ බැංකුව** * 2012 ජන හා නිවාස සංගණනය ** සංඛ්‍යාලේඛන හා භූගෝලීය තොරතුරු ඒකකය මගින් රැස්කරන ලද දත්ත *** 2012 ජන හා නිවාස සංගණනයට අනුව ඇස්තමේන්තු කරන ලද තොරතුරු

## 03. ජාතික දළ දේශීය නිෂ්පාදිතයට පළාතේ දායකත්වය

| වර්ෂය | උ.මැ.ප (රු.මි.) | ජාතික (රු.මි.) | පළාතේ දායකත්වය (%) | පළාත් අතර ස්ථානය |
|---|---|---|---|---|
| 2012 | 379,243 | 7,578,554 | 5 | 7 |
| 2013 | 489,622 | 9,592,125 | 5.1 | 7 |
| 2014 | 561,261 | 10,361,151 | 5.4 | 8 |
| 2015 | 643,673 | 10,950,621 | 5.9 | 6 |
| 2016 | 690,728 | 11,906,752 | 5.8 | 7 |
| 2017 | 754,605 | 13,418,287 | 5.6 | 8 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2018**

## 04. පළාතේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික බෙදී යාම (%)

| කර්මාන්ත ප්‍රභවය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 12.35 | 12.77 | 12.76 | 11.4 | 13.0 |
| කර්මාන්ත | 21.24 | 18.62 | 18.92 | 22.0 | 17.8 |
| සේවා | 59.60 | 61.81 | 61.12 | 66.6 | 69.2 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2018**

## 05. දිස්ත්‍රික්ක අනුව දරිද්‍රතා දර්ශකය

| දිස්ත්‍රික්කය | දරිද්‍රතා දර්ශකය (%) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 1995/96 | 2002 | 2006/07 | 2009/10 | 2012/13 | 2016 |
| අනුරාධපුර | 27 | 20.4 | 14.9 | 5.7 | 7.6 | 3.8 |
| පොළොන්නරුව | 20.1 | 23.7 | 12.7 | 5.8 | 6.7 | 2.2 |
| උ.මැ.ප | 24.7 | 21.5 | 14.2 | 5.7 | 7.3 | 3.3 |
| ශ්‍රී ලංකාව | 28.8 | 22.7 | 15.2 | 8.9 | 6.7 | 4.1 |

**මූලාශ්‍රය: මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 06. දිළිඳු ගෘහ ඒකක සහ දරිද්‍රතා පරතරය

| දිස්ත්‍රික්කය | දිළිඳු ගෘහ ඒකක (%) | | | දරිද්‍රතා පරතරය (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2009/10 | 2012/13 | 2016 | 2009/10 | 2012/13 | 2016 |
| අනුරාධපුර | 4.6 | 6.3 | 2.7 | 1.0 | 1.1 | 0.5 |
| පොළොන්නරුව | 4.5 | 5.6 | 1.7 | 1.0 | 0.9 | 0.5 |
| උ.මැ.ප | 4.6 | 6.1 | 2.4 | 1.0 | 1.0 | 0.5 |
| ශ්‍රී ලංකාව | 7.0 | 5.3 | 3.1 | 1.7 | 1.2 | 0.6 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 07. සේවා වියුක්ති අනුපාතය සහ සේවා නියුක්තියේ ප්‍රතිශත ව්‍යාප්තිය 2017-2018

| | | සාක්ෂරතාවය | ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය | විරැකියා අනුපාතය | සේවා නියුක්තියේ ව්‍යාප්තිය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වැටුප් සහිත සේවා නියුක්තිකා | සේවා යෝජකා | තමාගේම රැකියාවක් කරන | පවුලේ රැකියා සඳහා දායකවන |
| 2017 | අ/පුර | 92.8 | 61.3 | 4.6 | 38.3 | 1.2 | 41.6 | 18.9 |
| | පො/නරුව | 89.1 | 50.0 | 3.6 | 46.4 | 2.3 | 42.4 | 8.9 |
| 2018 | අ/පුර | 93.3 | 57.3 | 4.6 | 40.8 | 0.8 | 43.8 | 14.6 |
| | පො/නරුව | 90.1 | 49.8 | 4.2 | 44.0 | 0.9 | 46.6 | 8.6 |

**මූලාශ්‍රය:ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 08. තරුණ විරැකියා ප්‍රතිශතය

| වර්ෂය | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
|---|---|---|
| 2013 | 15.2 | 19.2 |
| 2014 | 13.6 | 20.3 |
| 2015 | 16.3 | 20.8 |
| 2016 | 19.7 | 21.6 |
| 2017 | 17.3 | 18.5 |
| 2018 | 24.5 | 21.4 |

**මූලාශ්‍රය: ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 09. අධ්‍යාපන

| විස්තරය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 806 | 811 | 814 | 815 |
| ගුරුවරුන් සංඛ්‍යාව | 16,101 | 16,264 | 16,674 | 16,905 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 273,806 | 280,963 | 289,971 | 297,845 |
| ගුරු සිසු අනුපාතය | 1:17 | 1:17 | 1:17 | 1:18 |
| පරිගණක සාක්ෂරතාව [%] | 21.2 | 21.6 | 20.9 | 22.1 |

**මූලාශ්‍රය: පාසල් නාමාවලිය හා අධ්‍යාපනික දත්ත 2019 , උතුරු මැද පළාත**

## 10. ජාතික විභාග ප්‍රතිඵල

| 2015 | | | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය |
| අ.පො.ස.(සා.පෙළ) සමත් ප්‍රතිශතය (උ.පෙළ. සඳහා සුදුසුකම් ලැබූ) | | | | | | | | | | | |
| 66.61 | 69.33 | 6 | 66.34 | 69.94 | 7 | 70.03 | 73.05 | 6 | 72.78 | 75.0 | 5 |
| අ.පො.ස (උ.පෙළ.) සමත් ප්‍රතිශතය (විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් ලැබූ) | | | | | | | | | | | |
| 59.56 | 62.35 | 9 | 59.27 | 63.36 | 9 | 63.01 | 66.02 | 9 | 62.23 | 64.7 | 7 |

**මූලාශ්‍රය:- අ.පො.ස. (සා.පෙළ) සහ (උ.පෙළ) විභාග - අපේක්ෂකයින්ගේ කාර්ය සාධනය, විභාග දෙපාර්තමේන්තුව**

## 11. උතුරු මැද පළාතෙන් විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් වීම.

| පළාත් සහ දිස්ත්‍රික්ක | 2009/10 | 2010/11 | 2011/12 | 2012/13 | 2013/14 | 2014/15 | 2015/16 | 2016/17 |
|---|---|---|---|---|---|---|---|---|
| උ.මැ.ප | 879 | 992 | 1,374 | 1,186 | 1,294 | 1,327 | 1,472 | 1,554 |
| අනුරාධපුර | 619 | 714 | 972 | 830 | 935 | 966 | 1,054 | 1,097 |
| පො/නරු | 260 | 278 | 402 | 356 | 359 | 361 | 418 | 457 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන දත්ත 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 12. අනෙකුත් සෞඛ්‍ය අංශය හා සම්බන්ධ තොරතුරු

| විස්තරය | 2018 |
|---|---|
| ශික්ෂණ රෝහල් සංඛ්‍යාව | 1 |
| මහ රෝහල් සංඛ්‍යාව | 1 |
| මූලික රෝහල් සංඛ්‍යාව | 5 |
| ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව | 48 |
| ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ඒකක සංඛ්‍යාව | 35 |

**මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## 13. සෞඛ්‍ය තොරතුරු

| විස්තරය | 2016 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික |
| දළ උපත් අනුපාතිකය | 17.0 | 17.8 | 16.2 | 15.6 | 16.7 | 17.5 | 15.9 | 15.2 |
| දළ මරණ අනුපාතිකය | 5.1 | 6.3 | 4.0 | 6.2 | 6.0 | 7.1 | 5.0 | 6.5 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන දත්ත 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 14. වී නිෂ්පාදනය -යල හා මහ කන්නය -2017

| යෝජනා ක්‍රමය | | 2016/17 මහ | | | | 2017 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනු/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අනු/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| බීජ වැපුරූ ප්‍රමාණය (හෙක්.) | මහ වාරි | 12,610 | 43,672 | 56,282 | 259,734 | 5,833 | 36,736 | 42,569 | 176,965 |
| | සුළු වාරි | 15,784 | 5,175 | 20,959 | 110,937 | 2,410 | 4,138 | 6,548 | 42,537 |
| | වර්ෂා ජලය | 9,459 | 774 | 10,233 | 171,885 | 282 | 8 | 290 | 29,621 |
| | **එකතුව** | **37,853** | **49,621** | **87,474** | **542,556** | **8,525** | **40,882** | **49,407** | **249,123** |
| අස්වැන්න නෙලා ගත් භූමි ප්‍රමාණය (හෙක්.) | මහ වාරිමාර්ගය | 11,643 | 42,034 | 53,677 | 240,860 | 5,726 | 36,363 | 42,089 | 174,381 |
| | සුළු වාරිමාර්ග | 7,704 | 5,175 | 12,879 | 71,535 | 2,274 | 3,861 | 6,135 | 38,378 |
| | වර්ෂා ජලය | 389 | 573 | 962 | 70,461 | 272 | 4 | 276 | 23,720 |
| | **එකතුව** | **19,736** | **47,782** | **67,518** | **382,856** | **8,272** | **40,228** | **48,500** | **236,479** |
| දළ නිෂ්පාදිතය (MT) | | 73,127 | 214,722 | 287,849 | 1,473,832 | 26,004 | 173,595 | 199,599 | 909,321 |

**මූලාශ්‍රය: වී වගා තොරතුරු- 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## යල හා මහ කන්නය වී වගාව -2018

| යෝජනා ක්‍රමය | | 2016/17 මහ | | | | 2017 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනු/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අනු/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| බීජ වැපුරූ ප්‍රමාණය (හෙක්.) | මහ වාරිමාර්ග | 23,519 | 54,997 | 78,516 | 322,217 | 15,434 | 55,651 | 71,085 | 242,542 |
| | සුළු වාරිමාර්ග | 28,352 | 7,572 | 35,924 | 148,616 | 5,666 | 5,907 | 11,573 | 84,858 |
| | වර්ෂා ජලය | 7,687 | 2,834 | 10,521 | 196,358 | 141 | 1 | 142 | 46,363 |
| | **එකතුව** | **59,558** | **65,403** | **124,961** | **667,191** | **21,241** | **61,559** | **82,800** | **373,763** |
| අස්වැන්න නෙලා ගත් භූමි ප්‍රමාණය (හෙක්.) | මහ වාරි | 23,051 | 54,515 | 77,566 | 318,626 | 15,213 | 54,192 | 69,405 | 237,645 |
| | සුළු වාරි | 21,436 | 7,371 | 28,807 | 133,325 | 4,916 | 5,672 | 10,588 | 80,590 |
| | වර්ෂා ජලය | 3,214 | 2,791 | 6,005 | 167,977 | 121 | 1 | 122 | 44,731 |
| | එකතුව | **47,701** | **64,677** | **112,378** | **619,928** | **20,250** | **59,865** | **80,115** | **362,966** |
| දළ නිෂ්පාදිතය (MT) | | **169,316** | **277,349** | **446,665** | **2,396,926** | **85,691** | **268,472** | **354,163** | **1,532,905** |

**මූලාශ්‍රය: සංඛ්‍යා නිබන්ධන 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 15. අතිරේක භෝග නිෂ්පාදනය - යල හා මහ කන්නය

| | 2014/15 මහ | | | | 2015 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අ/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අ/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| කුරක්කන් | 2051 | 112 | 2163 | 7407 | 49 | 27 | 76 | 1509 |
| බඩ ඉරිඟු | 61741 | 968 | 62709 | 230871 | 1356 | 163 | 1535 | 30244 |
| ඉදල් ඉරිඟු | -- | 6 | 6 | 85 | -- | -- | -- | 16 |
| මෙනේරි | -- | -- | -- | 19 | -- | -- | -- | 24 |
| මුං ඇට | 449 | 220 | 669 | 7620 | 134 | 80 | 214 | 7438 |
| කව්පි | 638 | 187 | 825 | 7241 | 73 | 50 | 123 | 5035 |
| තල | 93 | 31 | 124 | 3191 | 7053 | 6 | 7059 | 10094 |
| රටකජු | 540 | 640 | 1180 | 12513 | 130 | 450 | 580 | 15990 |
| මඤ්ඤොක්කා | 3736 | 5869 | 9605 | 181737 | 1655 | 4061 | 5716 | 143360 |
| බතල | 589 | 995 | 1584 | 31953 | 74 | 1307 | 1380 | 20035 |
| අර්තාපල් | -- | -- | -- | 54312 | -- | -- | -- | 43079 |
| රතු ළූණු | 125 | 112 | 237 | 35215 | 34 | 46 | 80 | 25987 |
| ලොකු ළූණු | 151 | 150 | 301 | 4586 | 23509 | 2337 | 25846 | 84737 |
| අමු මිරිස් | 7034 | 838 | 7372 | 42831 | 2480 | 275 | 2755 | 20035 |
| අබ | 94 | -- | 94 | 228 | 1 | -- | 1 | 20 |
| අමු ඉඟුරු | 2 | 86 | 88 | 17273 | -- | -- | -- | -- |
| අමු කහ | -- | 74 | 74 | 14397 | -- | -- | -- | -- |

මූලාශ්‍රය: සංඛ්‍යා නිබන්ධන 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 16. මධ්‍යනය මාසික ආදායම

| අංශය | 2003/04 | | 2016 | |
|---|---|---|---|---|
| | උ.මැ.ප | ශ්‍රී ලංකාව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| ඒක පුද්ගල ආදායම | 3,814 | 3,968 | 16,567 | 16,377 |
| කුටුම්භ ආදායම | 15,624 | 17,109 | 60,298 | 62,237 |
| ආදායම් ලබන්නෙකුගේ ආදායම | 11,093 | 10,754 | 35,186 | 33,894 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2018

## දැක්ම

**සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ප්‍රජාවක්.**

## මෙහෙවර

**සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත් හා විභවතාවන් ප්‍රශස්ත අයුරින් උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට ඍජු හා අඛණ්ඩ ලෙස දායක වීම.**

## පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන්

- නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- පළාත් සභා පරිපාලනය.
- මූල්‍ය කළමනාකරණය.
- මානව සම්පත් කළමනාකරණය.
- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය.
- වාරිමාර්ග සංවර්ධනය.
- කෘෂිකර්ම සංවර්ධනය.
- පශු සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත සංවර්ධනය.
- ප්‍රාදේශීය සංවර්ධනය.
- සමූපකාර සංවර්ධනය.
- ප්‍රජා සංවර්ධනය.
- රෝහල් සේවාවන් සංවර්ධනය හා පවත්වාගෙන යාම.
- මහජන සෞඛ්‍ය සේවාවන් සංවර්ධනය.
- පොදු සෞඛ්‍ය සේවාවන් සහ පෝෂණ කටයුතු.
- දේශීය වෛද්‍ය සේවාවන්.
- පර්යේෂණ හා සංවර්ධන.
- ප්‍රාථමික හා ද්වීතීයික අධ්‍යාපනය.
- අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම.
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා.
- ක්‍රීඩා සංවර්ධනය.
- සංස්කෘතික සංවර්ධනය.
- සමාජ ආරක්ෂණය හා සමාජ සුභසාධනය.
- සංවර්ධන සැලසුම්කරණය හා මෙහෙයවීම.
- පළාතේ ප්‍රතිපත්ති, සැලසුම්කරණය හා පසු විපරම් කටයුතු.
- මාර්ග සංවර්ධනය.
- තොරතුරු තාක්ෂණය.
- මාර්ගස්ථ මගී ප්‍රවාහනය.
- ග්‍රාම සංවර්ධනය.
- ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා.
- නිවාස සංවර්ධනය.
- පළාතේ විගණන හා විමර්ශන කටයුතු.
- පළාත් ආදායම් කටයුතු.
- පළාත් පාලන කටයුතු.
- සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය හරහා ඉංජිනේරුමය,ආරක්ෂක සේවා හා මුද්‍රණ කටයුතු සිදු කිරීම.
- සංස්කෘතික හා කලා කටයුතු සංවර්ධනය.
- මුල් ළමාවිය සංවර්ධනය.
- පරිවාස හා ළමාරක්ෂක සේවා සැපයීම.
- මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන කටයුතු.

# පළාත් ගීතය

දිලේ රන්වැලි සෑ හිසින් හිරු
රන් කිරණ ගෙන සිළුමිණේ
සැලේ මහ බෝ ළදළු පවනින්
සිසිල පතුරා බුදු ගුණේ

සයුරු පරදන වැව් තලා මත
සිය දහස් සියපත් පිපේ
අතවනා සිරිකතට හිනැහෙයි
රන් කරල් පුලතිසි කෙතේ

සව් සිරින් ගැදි පැදි කුසුම් මී
පන්හිදෙන් උතුරා හැලේ
රළු පරළු සෙල් කුළු මෙලෙක් වී
රූ රටා විස්කම් මැවේ


සියකමින් නොව යුතුකමින් සිත්
පහන්කළ විරු පරපුරේ
ගැමුණු පැරකුම් රජුන් විකුමන්
දිසෙයි යළි රජරට බිමේ


පද රචනය - පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි
සංගීතය - විශාරද කරුණාරත්න විජේවර්ධන


පළාත් පුෂ්පය (ඇහැල මල)



පළාත් ධජය




උතුරු මැද පළාත - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ
වවුනියා දිස්ත්‍රික්කය
මන්නාරම දිස්ත්‍රික්කය
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
පුත්තලම දිස්ත්‍රික්කය
කුරුණෑගල දිස්ත්‍රික්කය
මාතලේ දිස්ත්‍රික්කය
මඩකලපුව දිස්ත්‍රික්කය
අම්පාර දිස්ත්‍රික්කය
අනුරාධපුර දිස්ත්‍රික්කය
1. ගලෙන්බිඳුණුවැව
2. ගල්නෑව
3. හොරොව්පොතාන
4. ඉපලෝගම
5. කහටගස්දිගිලිය
6. කැබිතිගොල්ලෑව
7. කැකිරාව
8. මහවිලච්චිය
9. මැදවච්චිය
10. මිහින්තලේ
11. නාච්චාදූව
12. නොච්චියාගම
13. මධ්‍යම නුවරගම් පළාත
14. නැගෙනහිර නුවරගම් පළාත
15. පදවිය
පොළොන්නරුව දිස්ත්‍රික්කය
1. දිඹුලාගල
2. ඇලහැර
3. හිඟුරක්ගොඩ
4. ලංකාපුර
5. මැදිරිගිරිය
6. තමන්කඩුව
7. වැලිකන්ද


උතුරු මැද පළාත් සභාවේ සංවිධාන ව්‍යුහය
ගරු ආණ්ඩුකාරතුමා
ගරු අමාත්‍ය මණ්ඩලය
ගරු ප්‍රධාන අමාත්‍ය
පළාත් සභාව
ප්‍රධාන ලේකම්
උතුරු මැද පළාත් නීතිය හා සාමය ,මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ විශේෂ ව්‍යාපෘති .සංචාරක,අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදි කිරීම සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය,සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක සේවා,පරිසර හා පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අලෙවි සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය,ධීවර සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
ප්‍රවාහන,ක්‍රීඩා හා යෞවන කටයුතු,සමුපාකාර වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
පළාත් ඉඩම්, වාරිමාර්ග,මාර්ග සංවර්ධන,ග්‍රාම සංවර්ධන,නිවාස සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය
ආණ්ඩු කාරවර ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්-සැලසුම්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්-ඉංජිනේරු
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ලේකම්
ලේක
ලේකම්
ලේකම්
ලේකම්
ලේකම්( සභා ලේකම් කාර්යාලය)
01.පළාත් පාලන දෙපාර්තමේන්තුව
02.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
03.පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව
04.සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය
05.මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය
06.පුස්තකාල සේවා මණ්ඩලය
07.පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
08.පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
09.පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
10.පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
11.පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
12.පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව
13.පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව
14.පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
15.පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
16.කර්මාන්ත සංවර්ධන අධිකාරිය
17.මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය
18.පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
19.පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
20.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
21.පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව
22.පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
දෙපාර්ත මේන්තු හා අනෙකුත් ආයතන
අභ්‍යන්තර විගණන හා විමර්ශන අධ්‍යක්ෂ
පළාත් ආදායම් කොමසාරිස්

# පටුන


| | | | පිටු අංකය |
|---|---|---|---|
| 01. | ආණ්ඩුකාරවර ලේකම් කර්යාලය | | 1-10 |
| 02. | පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලය | | 11-14 |
| 03. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | | 15-23 |
| 04. | පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | | 24-28 |
| **05.** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** | | **29-41** |
| | 5.1. | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 42-55 |
| | 5.2. | පළාත් භාණ්ඩාගාරය | 56-64 |
| | 5.3. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 65-75 |
| | 5.4. | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 76-80 |
| | 5.5. | පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 81-85 |
| | 5.6. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 86-91 |
| **06.** | **පළාත් ප්‍රධාන අමාත්‍යාංශය** | | **92-117** |
| | 6.1. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 118-133 |
| | 6.2. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 134-158 |
| | 6.3. | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 159-170 |
| | 6.4. | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 171-175 |
| | 6.5. | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 176-182 |
| | 6.6. | පුස්තකාල සේවා මණ්ඩලය | 183-190 |
| **07.** | **පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු අමාත්‍යාංශය** | | **191-203** |
| | 7.1. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 204-227 |
| | 7.2. | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 228-262 |
| **08.** | **පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය** | | **263-273** |
| | 8.1. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 274-288 |
| | 8.2. | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 289-299 |
| | 8.3. | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 300-313 |
| | 8.4. | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 314-337 |

**09.** **පළාත් ප්‍රවාහන, ක්‍රීඩා සහ යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය** **338-352**

9.1. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 353-360

9.2. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 361-367

9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය 368-373

9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය 374-386

9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව 387-398

**10.** **පළාත්, ඉඩම් , වාරිමාර්ග ,මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය** **399-404**

10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව 405-418

10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 419-441

10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව 442-463

10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය 464-475

**ඇමුණුම්**

ඇමුණුම් 01 - පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2019 476-485

ඇමුණුම් 02 - අනුමත වෙන් කළ ප්‍රතිපාදන සාරාංශය- 2019 486-488

ඇමුණුම් 03 - උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය- 2019.12.31 දිනට 489-492

ඇමුණුම් 04 - 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය 493-494

ඇමුණුම් 05 - උතුරු මැද පළාත් කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකයේ ලියාපදිංචි සම්පත්දායක සංචිතය 495-499

# උතුරු මැද පළාත් සංවර්ධන වැඩසටහන පිළිබඳ විශ්ලේෂණය - 2019

# OVERVIEW OF NORTH CENTRAL PROVINCIAL DEVELOPMENT PROGRAMME - 2019

**2019** වර්ෂයේ උතුරු මැද පළාත් සභාව සතු ප්‍රධාන කාර්යයන් 39ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය වූ අතර ඒ සඳහා මූලධන වැය ලෙස රු.මි.3210.19ක් දරා ඇති අතර සේවාවන් මහජනතාව කෙරෙහි සමීප කරවීම සඳහා දරන ලද පුනරාවර්තන වැය රු.මි.19922.44කි. සමස්ත ඉලක්කගත ආයෝජනය රු.මි.26643.83 ක් වූ අතර සැබෑ ආයෝජනය රු.මි.23,132.63කි.

**2019 වර්ෂය සඳහා ඉලක්කය රු.මි. 26643.83 වූ අතර රු.මි.23,132ක ආයෝජනයක් කර ඇත**

පළාත් අධ්‍යාපන අංශයේ සංවර්ධනය උදෙසා සියළු මූල්‍ය ප්‍රභවයන්ගෙන් කරන ලද සංවර්ධන ආයෝජනය හා දායකත්වය අතිමහත් ය. පළාතේ දූවාදරුවන්ගේ අධ්‍යාපනය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉහළ මට්ටමකට ගෙන ඒමට කරන ලද ආයෝජනය තුළින් පාසැල් පද්ධතියේ අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතුව පැවති පංති කාමර ගොඩනැගිලි, විද්‍යාගාර හා අනෙකුත් අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කරන ලද ආයෝජනය කැපී පෙනේ. මේ සඳහා රු.මි.11065ක මුදලක් ආයෝජනය කරන ලදී. එපමණක්ද නොව අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම මගින් පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල , අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ප්‍රතිඵල ලබා ගෙන ඇති ප්‍රගතිය සැලකිය යුතු මට්ටමක පවතී.

පළාතේ සෞඛ්‍ය සේවා නගා සිටුවීම සඳහා බටහිර ප්‍රතිකාරක සේවා හා රෝග නිවාරණ සේවා සඳහා සුවිශාල දායකත්වයක් වර්ෂය තුළදී සැපයිය හැකි විය. ඒ සඳහා රු.මි.4852.42ක ආයෝජනයක් සිදුකර ඇත. ඒ යටතේ මෙත්සිරි සෙවන ව්‍යාපෘතියද ඇතුළුව 2018 වර්ෂයේදී රු.මි. 521.7ක් ආයෝජනයකර ඇත. එසේම පළාතේ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගයෙන් පෙළෙන මෙන්ම ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පළාතේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන රෝගීන්ගේ සුභසාධනය වැඩිදියුණු කිරීම සඳහා 2016 ආරම්භ කරන ලද “මෙත්සිරි සෙවණ “ ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී රු.මි. 94.365ක් වැය කරමින් අවසන්කර ජනතා අයිතියට පත් කරන ලදී. එසේම පාරම්පරික මෙන්ම උතුරු මැද පළාත තුළ දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා 2019 වර්ෂයේදී රු.මි.554.20ක ආයෝජනයක් සිදුකර ඇත.

2030 වර්ෂයේදී සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක 01 සියළු තන්හී සෑම ආකාරයෙන්ම පවතින දුගී බව තුරන් කිරීම, අංක 02 සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය සහිත තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, අංක 12 තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් සහතික කිරිම යන අරමුණු කරා පළාතේ දායකත්වය සැලකිය යුතු මට්ටමකින් සැපයීම සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයේ සහ රේඛීය අමාත්‍යාංශවල සහය සහිතව ඒකාබද්ධව සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලදී.

ඒ සඳහා රු.මි. 344.95ක් ආයෝජනය කර ඇත. එසේම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළාතේ පශු සම්පත් සංවර්ධනය මෙන්ම පශු සම්පත් අංශයේ නියැලී ගොවීන්ගේ ආදායම් තත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපාදන ආයෝජනය කරන ලදී. ඒ යටතේ රු.මි.239.52ක් ආයෝජනයකර ඇත. ඒ අනුව කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය උදෙසා රු.මි.584.47 ක් ආයෝජනයකර ඇත.

පළාත් වාරි පද්ධතියේ සංවර්ධනය උදෙසා මෙන්ම ප්‍රශස්ත වාරි කළමනාකරණයක් තුළින් සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා 2019 වර්ෂයේදී රු.මි. 548.55ක ආයෝජනයක් කර ඇත. ඒ යටතේ වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම, නිරන්තර නඩත්තුව, වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් එකතු කිරීම, ගොවි සංවිධාන බලගන්වමින් ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරිම, ජල ගැලීම් හා හානී කළමනාකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ කමිටු සක්‍රියව පවත්වාගෙන යාම, පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම, තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාමට අදාල ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී. එසේම කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා මෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය අංශයේ සංවර්ධනය උදෙසා මෙම ආයෝජනය ඉවහල්වන බව කිව යුතුය.

පළාතේ සමාජ ආරක්ෂණය උදෙසා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ඒ ඒ විෂය පථයන්ගේ සංවර්ධනය උදෙසා 2019 වර්ෂයේදී කැපී පෙනෙන ආයෝජනයක් සිදුකර ඇත. ඒ යටතේ ළමා නිවාස හා රැඳවුම් නිවාස සංවර්ධනය කිරීම, ළමා රැකවරණය හා සුභසාධනය නගා සිටුවීම, ළමා අයිතිවාසිකම් සුරැකීම හා ළමා අපයෝජන හා අපචාර අවම කිරීම, උපදේශන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රු.මි.132.82ක් ආයෝජනයකර ඇත. එසේම පළාතේ වැඩිහිටි නිවාස, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ රැකවරණ මධ්‍යස්ථාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය මෙන්ම විවිධ මහජන ආධාර සපයමින් සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ සඳහා පළාත් ආයෝජනය රු.මි. 539.27කි. ඒ අනුව අංශයේ සංවර්ධනය උදෙසා සමස්ත ආයෝජනය රු.මි.672.09කි.

පළාතේ පළාත් පාලන විෂය යටතේ පවතින සේවා සංවර්ධනය උදෙසා 2019 වර්ෂයේ දායකත්වය කැපී පෙනේ. ඒ යටතේ පළාත් පාලන ආයතන බලප්‍රදේශවල ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම, වෙළෙඳ පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රජා ජල පහසුකම් වැඩිදියුණු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා තිරසර යාන්ත්‍රණයක් සැකසීම, පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදුයුණු කිරීම, ග්‍රාමීය පුස්තකාල, පෙරපාසල්, ළමා උද්‍යාන, සුසාන භූමි සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු විය. ප්‍රධාන අමාත්‍යාංශය, රේඛීය අමාත්‍යාංශයන්හී මූල්‍ය සහය සහිතව මෙම ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී. පළාත් සභාව සතු මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මාර්ගවල යටිතල පහසුකම් එනම් පාලම්, බෝක්කු හා නිර්මිතයන් සංවර්ධනය කිරීම, මාර්ග සංඥා සහ සලකුණු ස්ථාපිත කිරීම, දෛනික කාලීන හා හදිසි අවස්ථා සහිත ක්‍රමානුකූල නඩත්තුව සඳහා පළාත් සංවර්ධන ආයෝජනයන් සිදු කරන ලදී. මේ සඳහා රු.මි.1178.16ක මුදලක් ආයෝජනය කර ඇත.

උතුරු මැද පළාතේ සමුපාකාර අංශයේ සංවර්ධනය උදෙසාත් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහාත් සමුපකාර අමාත්‍යාංශය, සමුපකාර දෙපාර්තමේන්තුව, කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලැබූ අතර ඒ සඳහා රු.මි. 332.34ක මුදලක් ආයෝජනය කරන ලදී. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය මගින් රු.මි.87.82ක ආයෝජනයක් සිදු කරන ලදී.

ක්‍රීඩා අංශය මගින් පළාත තුළ ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා රු.මි.95.53ක මුදලක් 2019 වර්ෂය තුළදී ආයෝජනය කරන ලදී.

2019 වර්ෂයේ ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් අංශයන්හී පවතින අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා රු.මි. 80.72ක මූල්‍ය ආයෝජනයක් සිදු කරන ලදී.

ඉතාමත් වැදගත් මෙන්ම ශක්තිමත් කළ යුතු අංශයක් වන ග්‍රාම සංවර්ධන අංශය යටතේ පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා සමිති ශක්තිමත් කිරීම, ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවා පවත්වාගෙන යාම, කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන හා ලිය සවිය මධ්‍යස්ථාන මගින් මැහුම් පාඨමාලා පවත්වාගෙන යාම, දැහැමි නිවහන, ශ්‍රමාභිමානී වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ගම්දොර අබියස වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු වූ අතර මේ සඳහා රු.මි.83.16ක මුදලක් ආයෝජනය කෙරිණි.

සංචාරක අංශයේ සංවර්ධනය උදෙසා පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන අමාත්‍යාංශය මගින් රු. 28,645,639.51 ක් ආයෝජනය කර ඇත.

එක්සත් ජාතින්ගේ 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහාවන මූලික දැනුවත් කිරිමේ වැඩසටහන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමෙන් සියළු රාජ්‍ය නිළධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ අතර ඒ සඳහා තිරසර සංවර්ධන හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය මගින් රු.මි 01ක ප්‍රතිපාදන ලබා දෙන ලදී.

එසේම ප්‍රධාන ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා රු.මි.930.81ක් වැයකර ඇත. 2019 වර්ෂයේදී උතුරු මැද පළාතේ අනුමත සේවක සංඛ්‍යාව 9290ක් වුවද වර්ෂය තුළදී සේවයේ නියුතු සංඛ්‍යාව 6893කි. විශේෂයෙන්ම පළාත් සෞඛ්‍ය අංශයේ සේවාවන් ජනතාව වෙත සමීප කරලීම සඳහා සේවයේ නියුතු වූ සේවකයින් සංඛ්‍යාව 3960කි. එසේම පළාතේ අධ්‍යාපන අංශය සැලකූ විට 2019 වර්ෂයේදී 298869ක් වන ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ගුරුවරුන් 16238කගේ මෙන්ම ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් 787ක් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ ද දායකත්වය සපයන ලදී.

ඒ සියල්ල සමග 2019 වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස රු.මි.19922.44ක්ද, මූලධන වියදම් ලෙස රු.මි. 3210.19ක්ද රු.මි. 26643.83 ක ආයෝජනයක් ද සිදුකර ඇත.

## තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ සැලකිළිමත් බව.

## Concern of the North Central Province towards achieving global sustainable development goals and objectives.

උතුරු මැද පළාත් දැක්ම කරා ළඟාවිම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන තිස් හතක් (37) මගින් වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබයි. එසේම වාර්ෂිකව එකිනෙක අංශයන් මගින් අපේක්ෂිත සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා විම ප්‍රමුඛ කොට සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි.




තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ සාධනය කරගැනිම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් සංවර්ධන සැලැස්ම සකස් කරන ලදී. මෙම කාර්යයයේදී ජාතික මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ කරා ළඟා වීමට පළාතේ දායකත්වය සැපයිය හැකි අයුරින් පළාතට උචිත මෙන්ම ගැළපෙන අයුරින් සකස් කරගන්නා ලද දර්ශක හා ඉලක්ක කෙරෙහි වාර්ෂිකව ආයෝජනයන් සිදුකරයි. පළාත් මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි සාධනීය පෙළඹීමක් සහිත ගමනක පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන නිරතවිම උතුරු මැද පළාත 2019 වර්ෂයේ ලද ජයග්‍රහණයකි.

එක් එක් අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන තම ආයතනයට අනන්‍ය වු තිරසර සංවර්ධන අරමුණු සාධනය කරගැනිම කෙරෙහි සෘජුව දායකවන අතර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන ඒකාබද්ධ (INTEGRATED) ලෙස ද තිරසර සංවර්ධන අරමුණු සාධනය කරගැනිම කෙරෙහි දායකත්වය සපයයි.

2019 වර්ෂය තුළදී ගෝලීය තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනිම සම්බන්ධයෙන් රටක් ලෙස ශ්‍රී ලංකාවේ දායකත්වය අපේක්ෂිත මට්ටම කරා ළඟා වීමට පළාතේ දායකත්වය ප්‍රශස්ත අයුරින් ලබා දීමටත් සැලකිය යුතු මට්ටමකින් දායක වීමටත් අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තුවට අයත් විෂයපථය තුළ සංවර්ධන වැඩසටහන ක්රියාත්මක කරන ලදී.

උතුරු මැද පළාත් සභාවට අයත් සියළු ආයතන 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු ව්‍යාපෘති හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි අවධානය යොමු කරමින් මෙහෙයවන ලද අතර ඒ සඳහා රු.මි.23,132ක පමණ මුදලක් ආයෝජනය කරන ලදී.

# 01. ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය

### ජාතික විධායකයේ පළාත් නියෝජනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ (1) අනු ව්‍යවස්ථාව අනුව සෑම පළාත් සභාවකම ආණ්ඩුකාර ධූරයක් පවතී. 154 ආ (2) අනුව ව්‍යවස්ථාවප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාගේ අත්සන යටතේ වූ අධිකාරී පත්‍රයකින් පත් කෙරෙන ආණ්ඩුකාර ධූරය පළාත් සභාවක ජනාධිපතිතුමාගේ නියෝජිතයා ලෙස වූ කාර්යභාරයක් ද ඉටු කරනු ලබයි. ජනාධිපතිතුමාගේ විධානය මත ආණ්ඩුකාරතුමා විසින් ගනු ලබන තීරණ අවසානාත්මක වන අතර, එය අධිකරණයක දී ප්‍රශ්න කළ නොහැකි බලයකි.

### ආණ්ඩුකාර ධූරය සතු බලතල

- විධායක බලතල
- මූල්‍ය බලතල
- පරිපාලන බලතල

### 01. විධායක බලතල

13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවක විෂය ක්ෂේත්‍රය පිළිබඳ ආණ්ඩුකාරවර ධූරය සතු විධායක බලතල 154 හා (ඇ) 154 (ඊ) ව්‍යවස්ථා පරිදි සෘජුව හෝ අමාත්‍ය මණ්ඩලය මගින් හෝ නිළධාරීන් මගින් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

### පළාත් සභා කටයුතු පිළිබඳ බලතල

- 154 අ (8) (අ) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයා නිශ්චය කරන අවස්ථාවකදී නියම කරනු ලබන වේලාවක සභාව කැඳවීම.
- 154 අ (8) ( ආ) වගන්තිය අනුව සභාව වාර අවසාන කිරිම.

### අමාත්‍ය මණ්ඩලය පිළිබඳ බලතල

- 154 ඊ (4) වගන්තිය අනුව ප්‍රධාන අමාත්‍යවරයා පත් කිරීම.
- 154 ඊ (5) වගන්තිය අනුව අමාත්‍යවරුන් 4 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කිරිම.
- අමාත්‍යවරු අතර විෂයන් බෙදීම.
- 154 අ (11) (අ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලු යෝජනා දැන ගැනීම.
- 154 අ (11) (ආ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනා පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- 154 අ (11) (ඇ) වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොමැති එහෙත් අමාත්‍යවරයෙකු විසින් ගන්නා ලැබූ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවරයාට නියම කළ හැකිය.

- 154 අ (10) (අ) වගන්තිය අනුව සභාව ඇමතීම හා ඒ සඳහා මන්ත්‍රීවරුන් කැඳවීමට නියමයන් කිරීම.
- 154 අ (8) (ඇ) වගන්තිය අනුව සභාව විසුරුවා හැරීම.

## 02. මූල්‍ය බලතල

- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 (5) වගන්තිය අනුව පළාත් සභා අරමුදල් භාරය, අරමුදලට මුදල් ගෙවීම ආදී සියලු රීති මගින් විධිමත් කිරීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (1) වගන්තිය අනුව පළාතේ හදිසි අවස්ථා අරමුදල පිළිබඳ භාරය දැරීම හා පාලනය සඳහා රීති සැදීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 (2) වගන්තිය අනුව පළාත් සභා අරමුදලේ ගිණුම් සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව පළාත් සභාවට ඉදිරිපත් කිරීම.
- 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 27 (4) වගන්තිය අනුව පළාත් සභාව විසුරුවා හැර හෝ කටයුතු කිරීම නතර කර ඇති අවස්ථාවක පළාතේ පරිපාලන කටයුතු සඳහා අරමුදලෙන් වියදම් කිරීමට අනුමැතිය දීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව බදු පැනවීම, අහෝසි කිරීම, අඩු කිරීම, වෙනස් කිරීම, විධිමත් කිරීම, ඊට අදාල නීති සංශෝධනය , පළාත් සභා අරමුදල් විසර්ජනය කිරීම , පළාත් සභා අරමුදලට මුදල් භාර ගැනීම සහ වියදම් දැරීම සඳහා වූ ප්‍රඥප්ති නිර්දේශ කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය ඇතුළු ක්‍රියාත්මකවන ප්‍රඥප්ති සහ නව ප්‍රඥප්ති අනුමැතියට පෙර සලකා බලන ලෙස සභාවට දැන්වීම.
- 154 (ඌ) වගන්තිය අනුව පළාත් සභාවෙන් අනුමත කළ වියදම් සඳහා බලය දීම.
- 154 (ඌ) වගන්තිය අනුව පරිපූරක ප්‍රදානයන් සඳහා අනුමැතිය ලබා දීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 28 (2) වගන්තිය අනුව ප්‍රදාන කිරීමට නිර්දේශ කිරීම.
- 154 (ඌ) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය අනුමත කිරීම.

## 03. පරිපාලන බලතල

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ විනය පාලන කටයුතු කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2) වගන්තිය අනුව බලතල පැවරීම, නියෝග නිකුත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (8) වගන්තිය අනුව විනය අභියාචනා පිළිබඳ අවසන් තීරණ ගැනීම.

1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුව උතුරු මැද පළාත් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධ සියලු බලතල ආණ්ඩුකාර ධූරයට හිමිව ඇත. එම බලතල අවස්ථානුකූලව අදාළ නිලධාරීන් වෙත පවරා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ , පළාතේ මූල්‍ය පාලනයේ හා පළාත සංවර්ධනයේ සියලු කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා මග පෙන්වීම සඳහා පහත කාර්යයන් සිදු කෙරේ.

- පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති නිර්දේශ කර ඉදිරිපත් කිරීම, පරිපූරක ඇස්තමේන්තු නිර්දේශ කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති අනුමත කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීම / ස්ථාන මාරු කිරීම/ නිදහස් කිරීම.
- විශ්‍රාමික නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම , පත් කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම.
- විධිමත් විදේශ ගමන් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරට යාමට අනුමැතිය දීම.
- සියලු නව බඳවා ගැනීම්, පත් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
- දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම.
- බඳවා ගැනීමේ පටිපාටි සහ ව්‍යවස්ථා සංග්‍රහ අනුමත කිරීම / සංශෝධන සඳහා අනුමැතිය ලබා දීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරීම.
- ආණ්ඩුකාරවර අරමුදලින් ලබා දෙන ආධාර හා පරිත්‍යාග පිළිබඳව කටයුතු කිරීම.
- පළාත් සභා රාජ්‍ය සේවයට අදාල නිලධාරීන්ගේ ආයතන කටයුතු සඳහා ආයතන අධ්‍යක්ෂ ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දීම.
- මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාල කිරීම.
- උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය නියෝගවලට එරෙහිව අභියාචනා පිළිබඳ තීරණ ලබා දීම.
- උතුරු මැද පළාත් සභා නිලධාරීන්ගෙන්, අමාත්‍යාංශවලින් , ආයතනවලින් ලැබෙන ලිපි පෙත්සම් පිළිබඳ කටයුතු කිරීම.
- පළාත් සභාවේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ අභියාචනා දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වෘත්තීය සමිති ඉල්ලීම් අනුව සාකච්ඡා කැඳවීම, රැස්වීම් පැවැත්වීම, වාර්තා නිකුත් කිරීම.

## දැක්ම

"අභිමානවත් ජනතාවක් සහිත සමෘද්ධිමත් පළාතක්

## මෙහෙවර

"ව්‍යවස්ථාපිත කටයුතු, ආයතනික කටයුතු, මූල්‍ය නියාමනය, සමාජ සංවර්ධන කටයුතු සහ යහපාලන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වය ඇතිව ජාතික ප්‍රතිපත්තියට අනුගතව හා විනිවිදභාවයෙන් යුතුව සාධාරණ ක්‍රමවේදයක් මඟින් අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් ගොඩනැගීම සඳහා අඛණ්ඩව දායකවීම".

## අරමුණු

- ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.
- විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.
- පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- මහජන ගැටලු විසඳීම සඳහා මග පෙන්වීම.
- සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ඵලදායිතාවය වැඩිදියුණු කරලීම සඳහා පංචවිධ සංකල්පය යොදා ගැනීම, ඵලදායිතාවය මඟින් සේවක පිරිස් අභිප්‍රේරණය කරලීම, පළාත් රාජ්‍ය සේවයේ අක්‍රමිකතා අඩුකරලීම හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ, පුහුණු වැඩමුළු, සාකච්ඡා, සම්මන්ත්‍රණ සංවිධානය හා පසු විපරම් කාර්යය ක්‍රියාත්මක කරලීම . ( අහඹු පරීක්ෂා කිරීම් හා සමීක්ෂණ මඟින්)
- වාර්ෂික මුදල් ප්‍රකාශයට අනුව ඇස්තමේන්තු කරන ලද කාර්යයන් අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කරවීම. (පළාත් භාණ්ඩාගාරය මඟින් සිදුකරන දැනුවත් කිරීම් සඳහා මග පෙන්වීම, උපදෙස් හා අනුමැතීන් ලබාදීම, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කරවීම හා පසු විපරම් ක්‍රියාවලියක් ඇති කරවීම,සිදුකරන ලද විමර්ශන වාර්තා අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදාල බලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම. )
- සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ සංවර්ධනයට අත්වැලක් සැපයීම, ආගමික හා සිවිල් සමාජ සංවිධාන හරහා අධ්‍යාපනික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අඩු පහසුකම් සහිත විහාරස්ථාන සංවර්ධනය හා සාමණේර වහන්සේලා සඳහා අධ්‍යාපන උපකාර කිරීම හා දහම් පාසල් සංවර්ධනය කිරීම හා රණවිරු පවුල් සුභසාධනයට මග පෙන්වීම.

## ප්‍රධාන කාර්යයන්

### ප්‍රධාන උපාය මාර්ගයන්

පළාතේ පරිපාලන හා මූල්‍ය යාන්ත්‍රණය ක්‍රියා කරවීමේ ප්‍රධානම ආයතනය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක කරවීම.




එසේම ජනතා සුභසාධනය හා සමාජ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය ජාතික හා පළාත් සැලසුම් නිර්දේශයන් අනුව ක්‍රියාත්මක වෙමින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පළාත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




රටවල් තුළ හා රටවල් අතර පවතින අසමානතා අවම කිරීම

තිරසර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය, යුක්තිය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සඵලදායි , වගවීම් සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම


තිරසර සංවර්ධනය සඳහා වන්නා වූ සහයෝගිතා ක්‍රියාදාමය සවිමත් කිරීම හා පුනර්ජීවය

තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තියට අනුගතව, වසර 2030 වනවිට පළාත් සංවර්ධනයට අදාල තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් හා මග පෙන්වීම අනුව , පළාතේ සියලුම අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාල අරමුණු ක්‍රියාවට නැංවීම මඟින් පළාතේ තිරසර සංවර්ධනය ඇති කිරීම මූලික අරමුණ වේ.

3.1.උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියළුම ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් මහජන දින වැඩසටහන් සෑම සතියකම බදාදා දින පළාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබන අතර එහිදී පළාතේ ජනතාවගේ ගැටළුවලට විසඳුම් ලබා දීමත් සිදු කරනු ඇත.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | ගරු ආණ්ඩුකාරතුමා සහ පුද්ගලික කාර්යය මණ්ඩලය | ආණ්ඩුකාර ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අනුමත සංඛ්‍යාව | 25 | 21 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 19 | 18 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 06 | 03 |
| අනියම් | 08 | 00 |



## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 26.42 | 23.55 | 2.87 | 88.79 |
| ගමන් වියදම් | 1.05 | 0.99 | 0.06 | 94.28 |
| සැපයීම් | 6.11 | 5.96 | 0.15 | 97.54 |
| නඩත්තු වියදම් | 7.03 | 5.15 | 1.88 | 73.25 |
| ගිවිසුම්ගත සේවා | 43.34 | 31.96 | 11.38 | 73.74 |
| මාරු කිරීම් | 0.13 | 0.12 | 0.01 | 92.30 |
| වෙනත් පුනරාවර්තන වැය | 0.06 | 0.06 | 0 | 100.00 |
| **එකතුව** | **84.14** | **67.79** | **16.35** | **80.56** |

## මූලධන වියදම - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු (රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.70 | 1.70 | 0.00 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.33 | 0.29 | 0.04 | 87.87 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.11 | 0.01 | 0.10 | 9.09 |
| සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 3.60 | 3.58 | 0.02 | 99.40 |
| **එකතුව** | **5.74** | **5.58** | **0.16** | **97.21** |

## කාර්ය සාධන ඉලක්ක - 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක |
|---|---|---|
| ❖ ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.<br>❖ විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.<br>❖ පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.<br>❖ මහජන ගැටලු විසඳීම සඳහා මග පෙන්වීම.<br>❖ සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ප්‍රධාන ලේකම් කාර්යාලය/ අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍යාංශවල නිර්දේශ සහිතව ඉදිරිපත් කරන සියළු පත් කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම්, චක්‍රලේඛ ප්‍රඥප්ති හා උපදෙස් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා නිරීක්ෂණ හා නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලැබුණු පසු නැවත ඒවා අදාල ආයතන වෙත යොමු කිරීම | ඉදිරිපත් වන සියළු නිර්දේශ ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමුකර අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම, නිර්දේශයන්ට අදාල තීරණයන් ලබා දී අවසන් කිරීම |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

### 01. උතුරු මැද පළාත් සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර - අධ්‍යාපන ආධාර ලබාදීම.

| ආධාර වර්ගය | ස්ථානය | එකතුව | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | මුදල(රු.මි) |
| 2018 වර්ෂයේ අ.පො.ස. සා/පෙළ විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | පළවන ස්ථානය | 2 | 0.033 |
| | දෙවන ස්ථානය | 2 | 0.025 |
| | තුන්වන ස්ථානය | 2 | 0.018 |
| 2018 වර්ෂයේ උසස් පෙළ විභාගයෙන් දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | පළවන ස්ථානය | 12 | 0.252 |
| | දෙවන ස්ථානය | 14 | 0.245 |
| | තුන්වන ස්ථානය | 11 | 0.138 |
| **මුළු එකතුව** | | **43** | **0.711** |

### වැඩිහිටි සත්කාර වැඩසටහන්.

2019.07.20 දින සාලියපුර වැඩිහිටි නිවාසයේ නේවාසික 300ක පමණ පිරිසක් බෙහෙත් වතුරෙන් ස්නානය කරවීම, ඔවුන්ගේ වාට්ටු පිරිසිදු කිරීම.

### මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්.

| වැඩසටහන් මෙහෙයවීම | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| කැබිතිගොල්ලෑව ප්‍රධාන පොලිස් පරීක්ෂක | කැදෑව ම.වි | 150 |
| | රඹෑව ම.වි | 200 |
| | විලයාය ම.වි | 150 |
| | වෙහෙරගල ම.වි | 150 |

### ලේ දන්දීමේ වැඩසටහන

| ක්‍රියාකාරකම | සහභාගී වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය |
|---|---|---|
| ලේ දන්දීමේ වැඩසටහන පැවැත්වීම | 200 | 2019.06.04 |

### සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද වැඩසටහන් - 2019

| | | | |
|---|---|---|---|
| වැඩිහිටි සත්කාර වැඩසටහන් | සාලියපුර වැඩිහිටි නිවාසයේ නේවාසිකයින් සංඛ්‍යාව - 300 |  |  |

| | | |
|---|---|---|
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | **සහභාගී වූ සංඛ්‍යාව - 650** |  |
| ලේ දන්දීම | **වැඩසටහන්- 01 සහභාගීත්වය-200** |   |
| අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහන | **2018 වර්ෂයේ අ.පො.ස. සා/පෙළ විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම හා 2018 වර්ෂයේ උසස් පෙළ විභාගයෙන් දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා පළමු, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසු සිසුවියන් 43ක් සඳහා රු.මි.0.711ක මුල්‍යාධාර ලබා දීම** | |

## ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගින් පවත්වන ලද වෙනත් වැඩසටහන්.

### පළාත් රණවිරු සැමරුම් උළෙල

රට, දැය, සමය වෙනුවෙන් තම ජීවිතය පුජාකල විරෝධාර රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන රණවිරු සැමරුම් උළෙල 2019 වර්ෂයේද ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් උතුරු මැද පළාත් රණවිරු ස්මාරකය අබියසදී උත්සවාකාරයෙන් පවත්වන ලදී.

| සහභාගී වූ පිරිස් | සහභාගී වූ සංඛ්‍යාව | සිදුකරන ලද ක්‍රියාකාරකම් |
|---|---|---|
| පළාතේ ආගමික නායකයින් , ගරු ආණ්ඩුකාරතුමා, රණවිරු සේවා අධිකාරියේ සභාපතිනිය ඇතුළු රාජ්‍ය නිලධාරීන් හා උළෙල සඳහා අනුග්‍රහය දක්වන ලද රාජ්‍ය නොවන ආයතනවල ප්‍රධානීන් | 80 | මියගිය රණවිරුවන් අනුස්මරණය කරමින් රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර දැක්වීම හා රණවිරු උළෙල මෙහෙයවීම |
| ත්‍රිවිධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරින් හා සිවිල් ආරක්ෂක බලකා නිලධාරින් | 300 | ආචාර පෙළපාලිය හා බියුගල් වාදනය |
| මියගිය රණවිරුවන්ගේ දෙමාපියන් ඇතුළු ඥාතීන් | 1000 | රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර දැක්වීම. |

නියඟයෙන් පීඩා විඳින පළාතේ ජනතාවට සහන සැලසීමේ වැඩසටහන යටතේ පළාතේ තෝරාගත් පවුල් 87ක් සඳහා 1000L පානීය ජල ටැංකි බෙදාදීම සිදුවිය. එසේම වෘත්තීය පුහුණු සඳහා සිසුන් යොමු කිරීමේ වැඩසටහන යටතේ වෘත්තීය පුහුණු ආයතන පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ පුවරු 197ක් සකස්කර ඒවා පාසල්වල ප්‍රදර්ශනය කිරීම සඳහා පාසැල් 197කට ලබාදීම සිදු විය.

## ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගින් පවත්වන ලද වෙනත් වැඩසටහන් - 2019

| | | |
|---|---|---|
| පළාත් රණවිරු සැමරුම් උළෙල | වැඩසටහන් 01 |  |
| නියඟයෙන් පීඩා විඳින පළාතේ ජනතාවට සහන සැලසීමේ වැඩසටහන | බෙදා දුන් ජල ටැංකි සංඛ්‍යාව **87** |  |
| වෘත්තීය පුහුණු සඳහා සිසුන් යොමු කිරීමේ වැඩසටහන | **පාසල් සංඛ්‍යාව 197** |  |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියළුම ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් මහජන දින වැඩසටහන් සෑම සතියකම බදාදා දින පළාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබන අතර එහිදී පළාතේ ජනතාවගේ ගැටළුවලට විසඳුම් ලබා දීමක් සිදු කරනු ඇත.

| | |
|---|---|
| 1. | ප්‍රඥප්ති සකස් කිරීමට ප්‍රධාන ලේකම් වෙත අනුමැතිය ලබා දීම. |
| 2. | 2020 වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කිරීම. |
| 3. | පරිපූරක අනුමත කිරීම. |
| 4. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම් හා සංශෝධනය කිරීම් අනුමත කිරීම. |
| 5. | ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරන අභියාචනා සඳහා කටයුතු කිරීම. |
| 6. | පළාත් පාලන ආයතනවලට අදාළ උසාවි දඩ මුදල් නිදහස්කිරීම් සඳහා අනුමැතිය ලබා දීම. |
| 7. | පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම. |
| 8. | විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම. |
| 9. | දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම , පත්කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම. |
| 10. | දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම. |
| 11. | අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරීම. |
| 12. | මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කිරීම. |

2019 වර්ෂයේදි පළාත් අණ්ඩුකාරවර කාර්යාලය සතු විෂය පථය මැනවින් ඉටුකරමින් වර්ෂය තුළ කාර්ය සාධනය යහපත් ලෙස සාධනය කර ගත හැකි වූ වසරක් ලෙස සඳහන් කළ හැකිය.

# 02. පළාත් සභා ලේකම් කාර්යාලය

**පළාත් සභා ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය**
**පළාත් සභා ඉතිහාසය**
**ආයතනයේ කටයුතුවලට බලාධිකාරිය ලැබී ඇති ආකාරය**

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (සංශෝධනය)
- පනත් -- 1987 අංක 42 දරණ පළාත් සභා පනත
- ප්‍රඥප්ති -- 1990 අංක 14 දරණ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය
- චක්‍රලේඛ හා වෙනත්

**ආයතනය ආරම්භ කරන ලද දිනය හා ඊට අදාළ මූලික තොරතුරු**

- දිනය - 1988 මැයි මස
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 17.1, 17.2 වගන්ති ප්‍රකාර පිහිටුවන ලද පළාත් සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා සභා ලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

**ආයතනය මේ දක්වා පැමිණි අතීත ගමන් මග**

1988 මැයි මස ආරම්භ කරන ලද පළාත් සභා ලේකම් කාර්යාලයට ස්ථිර වශයෙන් ගොඩනැගිල්ලක් නොතිබූ අතර මහලේකම් කාර්යාලයේ ලබාගත් කුඩා කාමරයක කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. පළාත් සභා රැස්වීම් පැවැත්වීම සඳහා නිසි ස්ථානයක් නොතිබුණි. අනුරාධපුර පණ්ඩුලගම ගම් උදා භූමියේ ඇති ගොඩනැගිල්ලක 1988.05.12 වෙනි දින ප්‍රථම සභා රැස්වීම පවත්වා ඇත. පසුව අනුරාධපුර විවේකානන්ද විද්‍යාලයේ සන්ථාගාර ශාලාව ද මාස කිහිපයක් ප්‍රයෝජනයට ගත් අතර, නැවත අනුරාධපුර මහලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලේ කුඩා රැස්වීම් ශාලාවක් ස්ථාපිත කර 2004 සැප්තැම්බර් දක්වා එහි සභා රැස්වීම් කටයුතු පවත්වාගෙන ගොස් ඇත.

**පළාත් සභාවේ සංයුතිය - 2018**

| සංයුතිය | සංඛ්‍යාව |
|---|---|
| අමාත්‍යවරුන් | 05 |
| සභාපති | 01 |
| නියෝජ්‍ය සභාපති | 01 |
| විපක්ෂනායක | 01 |
| සභා නායක | 01 |
| ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක | 01 |
| විපක්ෂයේ ප්‍රධාන සංවිධායක | 01 |
| අනෙකුත් මන්ත්‍රීවරුන් | 22 |
| **එකතුව** | **33** |

**මහජන නියෝජිතයින්**

| දිස්ත්‍රික්කය | පාර්ලිමේන්තු | පළාත් සභා |
|---|---|---|
| අනුරාධපුර | 08 | 22 |
| පොළොන්නරුව | 05 | 11 |
| **එකතුව** | **13** | **33** |

**දැක්ම**

“මනා ක්‍රියාකාරිත්වයෙන් යුත් ජනතාවාදී පළාත් සභාවක්, සමෘද්ධිමත් පළාතක්”.

## මෙහෙවර

“උතුරු මැද පළාතේ සමස්ත පළාත් සභා කටයුතුවල සංවර්ධනය උදෙසා සැසි හා රැස්වීම් කටයුතු සහ කාරක සභා කටයුතු අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව බල ගැන්වීම”

## දිගුකාලීන අරමුණු

පළාත් ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවමින් පොදුවේ පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට දායක වීම.

## කෙටි කාලීන අරමුණු

- පළාත් සභාවට පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා පිහිටුවා ඇති ආයතන (පළාත් සභාව සහ කමිටු) විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගෙන යෑම තුළින් ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටළු නිරාකරණය කිරීම.
- ගරු පළාත් අමාත්‍යවරුන්ට මන්ත්‍රී වරප්‍රසාද යටතේ හා ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු විපක්ෂනායකතුමා, ගරු සභානායකතුමා, ගරු ආණ්ඩු පක්ෂයේ හා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන්ට ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා වරප්‍රසාද හා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ඉහත I හා II කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 22 |
| 2 | සේවයේ නියුතු | 24 |
| 3 | පුරප්පාඩු | 02 |
| 4 | කොන්ත්‍රාත් | 01 |

## පුනරාවර්තන වියදම් - 2019

### පළාත් සභා ලේකම් කාර්යාලය

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 14.11 | 13.81 | 0.29 | 97.87 |
| ගමන් වියදම් | 0.24 | 0.22 | 0.01 | 91.66 |
| සැපයීම් | 1.25 | 0.94 | 0.30 | 75.20 |
| නඩත්තු වියදම් | 1.36 | 0.63 | 0.73 | 46.32 |
| ගිවිසුම්ගත සේවා | 0.31 | 0.20 | 0.10 | 64.51 |
| මාරු කිරීම් | 0.01 | 0.00 | 0.01 | 0.00 |
| **එකතුව** | **16.38** | **15.13** | **1.25** | **92.36** |

## පුනරාවර්තන වියදම් - 2019

### පළාත් සභාව

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 3.43 | 1.86 | 1.56 | 54.22 |
| ගමන් වියදම් | 0.36 | 0.07 | 0.28 | 19.44 |
| සැපයීම් | 1.54 | 1.13 | 0.40 | 73.37 |
| නඩත්තු වියදම් | 1.43 | 0.38 | 1.05 | 26.57 |
| ගිවිසුම්ගත සේවා | 3.14 | 1.15 | 1.98 | 36.62 |
| **එකතුව** | **9.90** | **4.61** | **5.29** | 46.56 |

## මූලධන වියදම් - 2019

### පළාත් සභා ලේකම් කාර්යාලය

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වෙනත් මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 16.38 | 15.13 | 1.25 | 95 |
| **එකතුව** | **16.38** | **15.13** | **1.25** | **95** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩි දියුණු කිරීම | 1.05 | 0.00 | 1.05 | 0.00 |
| **එකතුව** | **1.05** | **0.00** | **1.05** | **0.00** |

පසුගිය වසරේ ක්‍රියාත්මක කරන ලද නමුත් ප්‍රතිපාදන අවුරා තැබිම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වු සභා ශාලාව සඳහා තිර රෙදි දැමීම , සභා රැස්වීම සඳහා සංග්‍රහ කිරීම සඳහා බුෆේ සෙට් 01ක් මිලදී ගැනීම,ගරු මන්ත්‍රිවරුන්ගේ ඉල්ලිම ලැබෙන පරිදි ප්‍රතිපාදන නිදහස් කිරීම හා කාර්යාලය සඳහා ලිපිකරු මේස ලිපිගොනු කබඩ් මිලදී ගැනීම වැනි ව්‍යාපෘති මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

| අරමුණු | ඉලක්ක 2020 | ඉලක්ක 2021 | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|---|
| පළාත් ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවමින් පොදුවේ පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට දායක වීම | පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීම | පළාතේ ජන ජීවිතය සාර්ථක කර තිරසර සංවර්ධනය තුළින් දිළිඳු බව තුරන් කිරීම | විධිමත් හා අඛණ්ඩව පවත්වාගෙන යාම තුළින් ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටළු නිරාකරණය කිරීම මගින් පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

තිරසර සංවර්ධනය මගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධානම ආයතනය වන මෙම පළාත් සභාව එහි ගෞරවය හා අභිමානය සුරැකෙන ආකාරයෙන් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සියල්ලක්ම පාහේ සපුරා ගැනීමට සමත් වී ඇත.

පළාත් සභාව විසුරුවා හැරීමත් සමග පළාත් සභාව හා සම්බන්ධ කාර්යයන් වර්ෂය තුළ ක්‍රියාත්මක නොවීය.

ගොඩනැගිලි පහසුකම්, ප්‍රවාහන පහසුකම් අවශ්‍ය මට්ටමට සපුරා ගෙන ඇති අතර, අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු නොමැති වීම ද හේතුවෙන් මෙම කාර්යාලයේ සේවාවන් අඛණ්ඩව හා යාවත්කාලීනව ඉටු කිරීමට සමත්වී ඇත. කාර්යාලයේ ගිණුම් කටයුතු හා අනෙකුත් රාජකාරි කටයුතු යාවත්කාලීනව පවත්වා ගෙන යමින් අපේක්ෂිත සේවාවන් උපරිම තලයකට ගෙන ඒමට කටයුතු කර ඇත.

කාර්ය මණ්ඩල පුරප්පාඩු නොමැති වීම ද හේතුවෙන් මෙම කාර්යාලයේ සේවාවන් අඛණ්ඩව හා යාවත්කාලීනව ඉටු කිරීමට සමත් වි ඇත. කාර්යාලයේ ගිණුම් කටයුතු හා අනෙකුත් රාජකාරි කටයුතු යාවත්කාලීනව පවත්වා ගෙන යමින් අපේක්ෂිත සේවාවන් උපරිම තලයකට ගෙන ඒමට කටයුතු කර ඇත.

# 03. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පැවරෙන ආකාරය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අනුව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිතකර ඇත.

1987 අංක 42, 1989 අංක 12 දරණ පළාත් සභා අනුශාංගික විධිවිධාන පනත හා 1990 අංක 28 දරණ පළාත් සභා සංශෝධිත පනත අනුව, ගරු ආණ්ඩුකාරතුමා සතු පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධ කටයුතු සිදු කිරීමේ බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරේ.

උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කරන ලද දින සිට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වන අතර පළාත් සභා පනතේ හා සංශෝධිත වගන්ති අනුව සහ ගරු ආණ්ඩුකාරතුමා විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල අනුව කටයුතු කරනු ලබයි.

### දැක්ම

“ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක් ”

### මෙහෙවර

“බඳවා ගැනීමේ පරිපාටි සහ පළාත් රාජ්‍ය සේවා කළමනාකරණය, සිය පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව විධිමත්ව ඉටුකරමින් ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක් සඳහා අඛණ්ඩව දායක වීම.”


### දිගුකාලීන අරමුණු

- ❖ තෘප්තිමත් රාජ්‍ය සේවයක් ගොඩනැංවීම පිණිස පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කිරීම, කාලීනව සුදුසු තීරණ ගැනීම හා ක්‍රියා කිරීම.
- ❖ පළාත් රාජ්‍ය සේවය තුළ විනය පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම.
- ❖ ප්‍රශස්ත රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව මැදිහත්වීම.

### කෙටිකාලීන අරමුණු

- ❖ උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ආයතනික කටයුතු විධිමත් කිරීම.
- ❖ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.
- ❖ විනය නියෝගවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීම.
- ❖ නිසිකලට කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තුගත පරීක්ෂණ පැවැත්වීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- කාර්ය මණ්ඩල තොරතුරු හඳුනා ගැනිම හා යාවත්කාලීන කිරීම.
- බඳවා ගැනීමේ පරිපාටි විධිමත්ව අනුමතකර ගැනීම හා කාලීන අවශ්‍යතා අනුව අදාල සංශෝධන කිරීම.
- පත් කිරීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරීම.
- විනය පාලනයට අදාල අභියාචනා පිළිබඳව සමාලෝචනය හා තීරණ ගැනීම.
- පත් කිරීම හා ස්ථානමාරු පිළිබඳව මධ්‍යම රජය හා අනෙකුත් පළාත් සභා සමග කටයුතු කිරීම.
- බඳවා ගැනීමේ හා උසස්වීම් සඳහා වූ වාර්ෂික විභාග සැලැස්ම විධිමත්ව සකස් කිරීම හා සැලසුම්සහගතව ක්‍රියාත්මක කිරීම.
- විනය කටයුතු හා කාර්ය මණ්ඩල නියාමනය සඳහාවන උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම.
- අවශ්‍යතා පරිදි නිසි කල්හී පුරප්පාඩු පිරවීම, උසස්වීම්, ස්ථිර කිරීම් ලබා දීම හා විනය ක්‍රියාමාර්ග ගැනීම.

## අංශ නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

8 DECENT WORK AND ECONOMIC GROWTH

තිරසාර පරිපූර්ණ අර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම, සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම සඳහා රාජ්‍ය සේවයට බඳවා ගැනීම්, මාරු කිරීම්, උසස් කිරීම් ආදි කටයුතුවලදී රාජ්‍ය ක්‍රමවේදයන්ට අනුව සාධාරණව හා යුක්තිගරුකව කටයුතු කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත සංඛ්‍යාව | 29 |
| 2 | සේවයේ නියුතු සංඛ්‍යාව | 27 |
| 3 | පුරප්පාඩු | 02 |

## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 16.44 | 16.29 | 0.16 | 99 |
| ගමන් වියදම් | 0.09 | 0.08 | 0.01 | 86 |
| සැපයීම් | 1.77 | 1.66 | 0.11 | 94 |
| නඩත්තු වියදම් | 0.76 | 0.51 | 0.24 | 67 |
| ගිවිසුම්ගත සේවා | 7.71 | 6.88 | 0.82 | 89 |
| මාරු කිරීම් | 0.20 | 0.20 | 0.00 | 100 |
| **එකතුව** | **26.97** | **25.62** | **1.34** | **95** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්භාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.80 | 0.20 | 1.60 | 11 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.30 | 0.29 | 0.007 | 98 |
| **එකතුව** | **2.10** | **0.49** | **1.61** | **23** |

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| විභාග ගාස්තු | 6.00 | 11.17 | 186 |

## අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශකය |
|---|---|---|
| තිරසාර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම, සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම. | වසර තුළ ලබාදෙන ලද පත්වීම් ගණන | පත්වීම් ගණන |
| | වසර තුළ සිදුකරන ලද ස්ථිර කිරීම් ගණන | ස්ථිර කිරීම් ගණන |
| | වසර තුළ සිදුකරන ලද උසස්වීම් ගණන | උසස්වීම් ගණන |

## කාර්ය සාධන ඉලක්ක - 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2020 |
| **උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ආයතනික කටයුතු විධිමත් කිරීම.** | | | | |
| බඳවා ගැනීම් | බඳවා ගැනීම් ප්‍රමාණය | 146 | 1059 | ඉල්ලීම් ලැබෙන පරිදි |
| සේවය ස්ථිර කිරීම | සේවය ස්ථිර කිරීම් ප්‍රමාණය | 271 | 201 | |
| උසස්වීම් | උසස්වීම් ප්‍රමාණය | 208 | 164 | |
| විශ්‍රාම ගැන්වීම් | විශ්‍රාම ගැන්වීම් ප්‍රමාණය | 66 | 70 | |
| **වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම** | | | | |
| සංවර්ධන නිලධාරී | ප්‍රමාණය | 169 | 128 | ඉල්ලීම් ලැබෙන පරිදි |
| කළමනාකරණ සහකාර | ප්‍රමාණය | 106 | 127 | |
| කාර්යාල කාර්ය සහයක | ප්‍රමාණය | 18 | 33 | |
| රියදුරු | ප්‍රමාණය | 31 | 32 | |
| නිසි කලට කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තුගත පරීක්ෂණ පැවැත්වීම | කාර්යක්ෂමතා කඩඉම් ප්‍රමාණය | 36 | 46 | |
| පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කිරීම, කාලීනව සුදුසු තීරණ ගැනීම හා ක්‍රියා කිරීම | ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | - | - | 01 |
| පළාත් රාජ්‍ය සේවය තුළ විනය පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම,වාර්ෂික විනය සංචිතය පිහිටුවීම | - | 01 | - | 01 |
| ප්‍රශස්ත රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව මැදිහත්වීම, බඳවා ගැනීම් පරිපාටි සකස් කර අනුමත කර ගැනීම (සංශෝධන හැර) | අනුමත කළ බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | 01 | 01 | 04 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2019 වර්ෂය තුළදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු විෂය පථය තුළ පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සඳහා බඳවා ගැනීමේ විභාග පැවැත්වීම හා ඒ අනුව පත්කිරීම් සිදු කිරීම ද , කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා උසස්වීම ලබා දීමද සිදු විය. එසේම සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම් මෙන්ම වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම ද විනය නීතිවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ද සිදු විය.

## 2019 වර්ෂය තුළ බඳවා ගැනීම් හා පත් කිරීම්

| අනු අංකය | තනතුරු හා ආයතන විස්තර | බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සමූපකාර සංවර්ධන නිලධාරී 111 ශ්‍රේණිය | 2 |
| 2 | සහකාර ගිණුම් නිලධාරී 111 ශ්‍රේණිය | 1 |
| 3 | ශ්‍රී ලංකා ගුරු සේවය 3- 1 ( අ ) ( වෘත්තීය විෂයයන් සඳහා) | 11 |
| 4 | ගුරු සේවය 111 ශ්‍රේණිය 1 අ | 1 |
| 5 | සමාජ සේවා නිලධාරී 11 ශ්‍රේණිය | 27 |
| 6 | භාෂා පරිවර්තක 11 ශ්‍රේණිය | 2 |
| 7 | පරිවාස නිලධාරී 11 ශ්‍රේණිය | 3 |
| 8 | අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවය 2 - 11 ශ්‍රේණියට පත්කිරීම | 4 |
| 9 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි( සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් 111 ශ්‍රේණියට පත් කිරීම | 5 |
| 10 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි ( සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් 111 ශ්‍රේණියට පත් කිරීම | 3 |
| 11 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි ( සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් 111 ශ්‍රේණියට පත් කිරීම | 3 |
| 12 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි ( සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් 111 ශ්‍රේණියට පත් කිරීම | 1 |
| 13 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ උපස්ථායක තනතුරට පත් කිරීම | 117 |
| 14 | ආදායම් පරීක්ෂක 111 ශ්‍රේණිය | 8 |
| 15 | අභ්‍යන්තර විගණන නිලධාරී 111 ශ්‍රේණිය | 21 |
| 16 | ආදායම් පරීක්ෂක 111 ශ්‍රේණිය | 3 |
| 17 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහායක 111 ශ්‍රේණිය | 1 |
| 18 | ප්‍රමාණ සමීක්ෂක (විධායක) 111 ශ්‍රේණිය | 1 |
| 19 | ශ්‍රී ලංකා ගුරු සේවය 3- 1 ( අ ) සහ ( ඇ) | 539 |

| අනු අංකය | තනතුරු හා ආයතන විස්තර | බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|---|
| 20 | ශ්‍රී ලංකා ගුරු සේවය 3- (ආ) ( විද්‍යාපීය) | 104 |
| 21 | ශ්‍රී ලංකා ගුරු සේවය 3- 1 ( අ ) ( වෘත්තීය විෂයයන් සඳහා) | 22 |
| 22 | රාජ්‍ය කළමනාකරණ සහකාර 111 ශ්‍රේණිය | 71 |
| 23 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ප්‍රමාණ සමීක්ෂක 111 ශ්‍රේණිය | 1 |
| 24 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක 111 ශ්‍රේණිය | 26 |
| 25 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක 111 ශ්‍රේණිය | 43 |
| 26 | තාක්ෂණ සහායක ( කෘෂි ව්‍යාප්ති) 111 ශ්‍රේණිය | 29 |
| 27 | රෝහල් ඕවරසියර් 111 ශ්‍රේණිය | 4 |
| 28 | අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවය 2 - 11 ශ්‍රේණියට පත්කිරීම | 5 |
| 29 | අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවය 2 - 11 ශ්‍රේණියට පත්කිරීම | 1 |
| **එකතුව** | | **1059** |

## 2019 වර්ෂයේදී පවත්වන ලද බඳවා ගැනීමේ විභාග

| තනතුර | විභාගය පැවැත්වූදිනය |
|---|---|
| උතුරු මැද පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රමාණ සමීක්ෂක (විධායක ගණය) විවෘත බඳවා ගැනීම - 2018 (2019) | 2019.01.19 |
| උතුරු මැද පළාත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක, සත්ත්ව සංවර්ධන උපදේශක, ප්‍රමාණ සමීක්ෂක, සැලසුම් ශිල්පී හා තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) තනතුර සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2018 (2019) | 2019.01.19/ 2019.01.26 |
| උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2019) | 2019.02.16 |
| උතුරු මැද පළාත් තොරතුරු හා තාක්ෂණ සහායක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2019) | 2019.03.30 |
| උතුරු මැද පළාත් පාසල් සඳහා උපාධිධාරීන් / ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය | 2019.06.29 |

## 2019 වර්ෂයේදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග

| අ.අ | කාරණය | අයදුම්කරුවන් ගණන |
|---|---|---|
| 1 | සත්ත්ව සංවර්ධන උපදේශක - දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය | 01 |
| 2 | කාර්මික නිලධාරී (එක් අවුරුදු) පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් ස්ථිර සේවයට පත් කිරීම (නැවත) | 01 |
| 3 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - නීති නිලධාරී - III ශ්‍රේණිය | 01 |
| 4 | පරිවාස දෙපාර්තමේන්තුව - පරිවාස නිලධාරී - II ශ්‍රේණිය | 05 |
| 5 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව - මැහුම් උපදේශිකා - III ශ්‍රේණිය | 12 |
| 6 | පරිවාස දෙපාර්තමේන්තුව - පෙර පාසල් ගුරු - III ශ්‍රේණිය | 01 |
| 7 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව - ක්‍රීඩා නිලධාරී - III ශ්‍රේණිය | 11 |
| 8 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව - ක්‍රීඩා පුහුණුකරු - III ශ්‍රේණිය | 03 |
| 9 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව - ක්‍රීඩා පුහුණුකරු - II ශ්‍රේණිය | 01 |
| 10 | රියදුරු - III ශ්‍රේණිය | සි - 26,<br>දෙ - 01 |
| 11 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය - II ශ්‍රේණිය | 15 |
| 12 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය - I ශ්‍රේණිය | 11 |
| 13 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය - III ශ්‍රේණිය | 04 |
| 14 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බාණ්ඩ 02 - I ශ්‍රේණිය | 01 |
| 15 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව - ග්‍රාම සංවර්ධන නිලධාරී - II ශ්‍රේණිය | 03 |
| 16 | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ - වැඩ පරිපාලක / සෞඛ්‍ය පරිපාලක / පොදු වෙළඳසැල් පරිපාලක - III ශ්‍රේණිය | 03 |
| 17 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - විමර්ශන නිලධාරී - I ශ්‍රේණිය | 17 |
| 18 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ප්‍රජා සංවර්ධන නිලධාරී - I ශ්‍රේණිය | 18 |
| 19 | රියදුරු - I ශ්‍රේණිය | 19 |
| 20 | කාර්මික නිලධාරී (දෑවුරුදු) පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් ස්ථිර සේවයට පත් කිරීම | 20 |
| 21 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ආදායම් පරීක්ෂක - II ශ්‍රේණිය | 21 |
| 22 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ආදායම් පරීක්ෂක - III ශ්‍රේණිය | 22 |
| 23 | තාක්ෂණ සහායක - III ශ්‍රේණිය | 04 |
| 24 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව - ක්‍රීඩා පුහුණුකරු - I ශ්‍රේණිය | - |
| 25 | පරිවාස දෙපාර්තමේන්තුව - ප්‍රාථමික අර්ධ ශිල්පීය (අරක්කැමි/සුළු සේවා පාලක (ඕවර්සියර්) - III ශ්‍රේණිය | 01 |
| 26 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - ප්‍රාථමික ශිල්පීය (බර යන්ත්‍ර ක්‍රියාකරු) | 02 |
| 27 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව - මැහුම් උපදේශිකා - I ශ්‍රේණිය | 12 |
| 28 | පළාත් පාලන දෙපාර්තමේන්තුව - සහකාර ගිණුම් නිලධාරී - III ශ්‍රේණිය | 01 |
| 29 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව - මැහුම් උපදේශිකා - II ශ්‍රේණිය | 01 |
| 30 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව - වඩු උපදේශක / පේෂ උපදේශිකා - I ශ්‍රේණිය | 04 |

| අ.අ | කාරණය | අයදුම්කරුවන් ගණන |
|---|---|---|
| 31 | කර්මාන්ත සංවර්ධන දෙපා: - වඩු උපදේශක / පේෂ උපදේශිකා - II ශ්‍රේණිය | 03 |
| 32 | කර්මාන්ත සංවර්ධන දෙපා - වඩු උපදේශක / පේෂ උපදේශිකා - III ශ්‍රේණිය | 02 |
| 33 | පරිවාස දෙපාර්තමේන්තුව - වෘත්තීය උපදේශක - III ශ්‍රේණිය | 01 |
| 34 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ප්‍රාථමික ශිල්පීය නොවන - III ශ්‍රේණිය | 19 |
| 35 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ප්‍රාථමික ශිල්පීය නොවන - II ශ්‍රේණිය | 04 |
| 36 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ප්‍රාථමික ශිල්පීය නොවන - I ශ්‍රේණිය | 05 |
| 37 | ආදායම් දෙපාර්තමේන්තුව - බදු නිලධාරී - II ශ්‍රේණිය | 03 |
| 38 | පරිවාස දෙපාර්තමේන්තුව - නිවාස මාතා - III ශ්‍රේණිය | 03 |
| 39 | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපා: - අභ්‍යන්තර විගණන නිලධාරී - III ශ්‍රේණිය | 21 |
| 40 | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපා: - අභ්‍යන්තර විගණන නිලධාරී - I ශ්‍රේණිය | 02 |
| 41 | සමාජ සේවා දෙපාර්තමේන්තුව - සමාජ සේවා නිලධාරී | **26** |
| 42 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) | **සි - 24 - දෙ - 03** |
| 43 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී | 03 |
| 44 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව - ප්‍රමාණ සමීක්ෂක (විධායක ගනය) | 01 |
| 45 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව - ඉංජිනේරු සේවය | - |
| 46 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - සමූපකාර සංවර්ධන නිලධාරී | **සි - 10 - දෙ - 01** |

## කොමිෂන් සභා වාර්ෂික ප්‍රගති වාර්තාව - 2019.12.31 දිනට

| අ.අ | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම | 60 |
| 02 | i. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (මුදා හැරීම) | 197 |
| | ii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (සුහද) | 14 |
| | iii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 01 |
| | iv. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (පැමිණීම්) | 107 |
| 03 | i. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (මුදා හැරීම්) | 14 |
| | ii. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (සුහද) | 13 |
| | iii. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 06 |
| | iv. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (පැමිණීම්) | 42 |
| 04 | i. අභ්‍යන්තර ස්ථාන මාරු (මුදාහැරීම්/ පැමිණීම්) | 25 |
| | ii. අභ්‍යන්තර ස්ථාන මාරු (සුහද) | 08 |
| | iii.අභ්‍යන්තර ස්ථාන මාරු (සුහද තුන්කොන්) | 00 |
| 05 | විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම. | 50 |
| 06 | පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම. | 201 |
| 07 | උසස්වීම. | 164 |
| 08 | විශ්‍රාම ගැන්වීම් - i.ශ්‍රී ලංකා විදුහල්පති සේවය | 37 |
| | ii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 03 |
| | iii.පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු | 30 |
| 09 | වෙනත් තීරණ - i.කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ | 557 |
| | ii.කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තීරණ | 218 |
| | iii.කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යොමු කළ ලිපි | 03 |
| | iv. පළාත් රාජ්‍ය සේවයට අදාළව කොමිෂන් සභාව විසින් ගත් වෙනත් තීරණ | 14 |
| 10 | වෙනත් කාර්යයන් i. කොමිෂන් සභාවේ බලතල සංශෝධනය කිරීම | 01 |
| | ii. ආයතනික ධාරිතා සංවර්ධන වැඩසටහන් - කාර්යය මණ්ඩලය සඳහා පුහුණුව | 01 |
| | iii.ඵලදායිතා වැඩසටහන් | 01 |

## සම්පත් උපයෝජනය හා කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සමාලෝචිත වර්ෂයේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 03 ක් වූ අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 27 ක් විය. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව යමින් අනුමත රාජ්‍ය ප්‍රතිපත්තිවලට හා විධිමත් කාර්ය පටිපාටිවලට අනුකූලව 2019 වර්ෂය තුළදී ක්‍රියාකර ඇත.

2019 වර්ෂය තුළ දී 602 වැය ශීර්ෂය යටතේ පෞද්ගලික පඩිනඩි වශයෙන් රු. 16,289,300.00 ක මුදලක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් රු. 9,339,586.00 ක මුදලක් වියදම් දරා ඇත.

2019 වර්ෂයේදී මූලධන වියදම් යටතේ මෙම ආයතනයට වාර්ෂික ඇස්තමේන්තු අනුව රු. 2,100,000.00ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. එයින් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු. 300,000.00ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර, රු. 292,980.00ක මුදලක් වැයකර කාර්ය මණ්ඩලයේ හා පරිපාලනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවන පරිදි යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සපයා ගන්නා ලදි. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වෙන් කර දුන් රු. 1,800,000.00ක ප්‍රතිපාදනයෙන් රු. 200,000.00ක මුදලක් වැයකර කාර්යාලයේ සහ සභා කාමරයේ බිත්ත ආලේප කරන ලදි.

මෙම කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් අංක 60201 සඳහා වාර්ෂික ඇස්තමේන්තු යටතේ රු. 2,000,000.00ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, ඒ යටතේ රු. 1,897,480.00ක මුදලක් කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් වශයෙන් ගෙවීමට හා ණය ශේෂ පියවීමට කටයුතු කර ඇත. එසේම වාර්ෂික ඇස්තමේන්තු යටතේ අවම බැර සීමාව රු. 1,200,000.00 ක් වූ අතර තත්‍ය බැරකිරීම් ප්‍රමාණය රු. 1,442,686.00 ක් විය.

කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් කැපවීම වැදගත් විය. ඒ අනුව 2019 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත කාර්යක්ෂමතා කඩයිම් විභාග , බඳවා ගැනීමේ විභාග හා පත් කිරීම් ආදිය සිදුකර ඇත. එමෙන්ම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා නියාමනය කිරීමට අදාල රාජ්‍ය සේවකයින්ගේ සියළුම කටයුතු මෙම ආයතනයට ලැබෙන පරිදි ඉටු කිරීම සිදු කර ඇත. මෙම කාර්යාලය මඟින් ඉදි කිරීම් හා මහජන සේවා ලාභී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරයි. පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා නියාමනය කිරීමට දායක වීම තුළින් ප්‍රශස්ත රාජ්‍ය සේවයක් ඇතිකරලීම අපේක්ෂාව වේ. කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස මානව සම්පත් ප්‍රමාණවත් නොවීම , කාර්යාල ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම ආදිය දැක්විය හැකිය.

# 04. පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

## දැක්ම

“තෘප්තිමත් සමුපකාර කාර්යය මණ්ඩලයක්, උසස් මට්ටමේ සේවාවක්”.

## මෙහෙවර

“සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු හා සේවා සේවක ගැටුම් නිරාකරණය සහ ආයතනික ධාරිතාව වර්ධනය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යහපාලනය පවත්වා ගනිමින් තෘප්තිමත් කාර්යය මණ්ඩලයක් බිහිකොට සමුපකාර සේවාව උසස් මට්ටමකට ගෙන ඒමට අඛණ්ඩව දායක වීම”.

- ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක්.
- යහපත් සේවා සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේවා සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක්.
- සංහිදියාවෙන් යුත් ආයතනයක්.

## කෙටිකාලීන අරමුණු

- සමුපකාර සේවක පත් කිරීම, උසස් කිරීම, සේවා ස්ථිරත්වය ලබා දීම.
- සමුපකාර සේවක පුහුණු පැවැත්වීම.
- සේවක අභියාචනා සලකා බැලීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්


- සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු නිරාකරණය.
- සේවා සේවක ගැටුම් නිරාකරණය.
- යෝජිත නව වැටුප් සංශෝධනයක් ක්‍රියාත්මක කිරීම තුළින් සේවක මානසිකත්වය වර්ධනය ඇති කිරීම.
- ආයතනය තුළ යහපාලනය හා සම්බන්ධ මූලධර්ම ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කෙරෙහි මැදිහත්වීම.
- නව චක්‍රලේඛ නිකුත් කිරීම හා නිකුත් කර ඇති චක්‍රලේඛ කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය
- ක්ෂේත්‍ර පරීක්ෂාව
- සමුපකාර සේවක කොමිෂන් සභාව , සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල සමග සාකච්ඡා කිරීම.
- අන්තර් පුද්ගල හා අන්තර් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

- සමුපකාර සේවක පත්වීම්, ස්ථිර කිරීම්, උසස් වීම් ලබාදීම මගින් විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීම.
- සමුපකාර සේවක පුහුණු වැඩමුළුව පැවැත්වීම මගින් සේවකයින්ගේ දැනුම වර්ධනය වීම, සමිතිවල උසස් මට්ටමේ සේවාවක් පවත්වාගෙන යාමට හැකි වීම, මහජන සේවාවන් උසස් මට්ටමින් ලබා දීමට හැකි විම.
- සමුපකාර සේවක අභියාචනා පිළිබඳව නිවැරදි තීරණ ගැනීම, සමුපකාර සේවක අභිප්‍රේරණය වැඩි දියුණු වීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 08 |
| 2 | සේවයේ නියුතු | 07 |
| 3 | පුරප්පාඩු | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 5.54 | 4.57 | 0.97 | 82.49 |
| ගමන් වියදම් | 0.21 | 0.18 | 0.03 | 85.71 |
| සැපයීම | 0.52 | 0.49 | 0.03 | 94.23 |
| නඩත්තු වියදම් | 0.33 | 0.29 | 0.04 | 87.87 |
| ගිවිසුම්ගත සේවා | 0.77 | 0.69 | 0.08 | 89.61 |
| **එකතුව** | **7.37** | **6.25** | **1.12** | **84.80** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 0.012 | 0.012 | 0.00 | 100 |
| **එකතුව** | **0.012** | **0.012** | **0.00** | **100** |

## දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධනඅරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය(රු.මි) | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| 01 | සමුපකාර සේවකයින් පුහුණු කිරීම | සේවකයින්ගේ දැනුම වර්ධනය | 0.24 | 0.24 |
| 02 | සමුපකාර සේවක පත් කිරීම්,උසස් කිරීම් , සේවා ස්ථිරත්වය ලබා දීම | විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට හැකි වීම | - | - |
| 03 | සේවක අභියාචනා සලකා ගැනීම | සේවකයින්ට සහන සැලසීම | - | - |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|
| සමුපකාර සේවකයින් පුහුණු කිරීම | දැනුවත් සේවකයින් ගණන | පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.24 | 0.24 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම

| ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ඉලක්ක(සංඛ්‍යාව) | | ආයෝජනය(රු.මි) | |
|---|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2019 | 2020 |
| සමුපකාර සේවකයින් පුහුණු කිරීම | සේවකයින්ගේ දැනුම වර්ධනය | 351 | 394 | 0.24 | 0.30 |
| සමුපකාර සේවක පත් කිරීම්, උසස් කිරීම්, සේවා ස්ථිරත්වය ලබා දීම | විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට හැකි වීම | 67 | 52 | 0.00 | 0.00 |
| සේවක අභියාචනා සලකා ගැනීම | සේවකයින්ට සහන සැලසීම | 10 | 07 | 0.00 | 0.00 |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හී ප්‍රගතිය - 2019

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| සමුපකාර සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම | සමුපකාර සේවකයින්ගේ ආකල්ප, දැනුම හා කුසලතා වර්ධනය වීම | 0.24 | 0.24 | 100 |
| ආයතනයේ සේවකයින්ට පරිගණක හා උපාංග මිලදී ගැනීම | සේවක කාර්ය සාධනය ඉහළ නැංවීම | 0.01 | 0.01 | 100 |

## කාර්ය සාධන ඉලක්ක 2017 – 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | සමුපකාර සේවකයින් පුහුණු කිරීම | සේවකයින්ගේ දැනුම වර්ධනය | 180 | 351 | 400 |
| 02 | සමුපකාර සේවක පත් කිරීම්, උසස් කිරීම් සේවා ස්ථීරත්වය ලබා දීම | විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට හැකි වීම | 40 | 67 | 75 |
| 03 | සේවක අභියාචනා සලසා ගැනීම | සේවකයින්ට සහන සැලසීම | 08 | 10 | 20 |

## කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණු | ඉටු කර ගැනීම සඳහා කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අරමුණු 01 | සමුපකාර සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම | සමුපකාර සේවකයින්ගේ ආකල්ප දැනුම, කුසලතා වර්ධනය | 0.32 | 0.31 | 97 |
| ප්‍රධාන අරමුණු 02 | සමුපකාරවල පුරප්පාඩු වී ඇති සාමාන්‍යාධිකාරී, ගණකාධිකාරි තනතුර සඳහා බඳවා ගැනීම | සමුපකාර සමිතිවල ස්ථාවරත්වය තහවුරු කිරීම | 0.08 | 0.03 | 37 |
| ප්‍රධාන අරමුණු 03 | ආයතනයේ සේවකයින්ට පරිගණක හා උපාංග මිලදී ගැනීම | සේවක කාර්ය සාධනය ඉහළ නැංවීම | 0.08 | 0.08 | 100 |

## ආයතනයේ අනාගත අපේක්ෂාවන්

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| සමුපකාර සේවක පුහුණු පැවැත්වීම | 450 | 500 | සේවක දැනුම වැඩි කිරීම | ගුණාත්මක සේවාවන් සැපයීම |
| සමුපකාර සේවක පත් කිරීම්, උසස් කිරීම්,සේවා ස්ථිරත්වය ලබා දීම | 85 | 90 | සේවක ස්ථාවරත්වය ඇති කිරීම | ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක් අනුගමනය කිරීම |
| අභියාචනා සලකා බැලීම | 25 | 30 | සේවක සහන සැලසීම | සේවක සහන සැලසීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස...

2019 වර්ෂයේදී සැලසුම් කළ ආකාරයට සංවර්ධන කටයුතු මෙහෙයවීමට හැකියාව ලැබුණි. ඒ යටතේ සමුපකාර සේවකයින්ගේ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගනිමින් ඒ සඳහා සමුපකාර සේවක පුහුණු පැවැත්වීමට හැකි විය. තවද විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කරමින් සමුපකාර සේවක පත්කිරීම්, උසස්වීම් හා ස්ථිර කිරීම් වඩාත් ඵලදායිව මෙන්ම කාර්යක්ෂමව කිරීමට හැකි විය.2019 වර්ෂය සඳහා වෙන් වු ප්‍රතිපාදන යොදවා සමුපකාර ක්ෂේත්‍රයේ නවතාවයන් ඇති කිරීමට හැකියාව ලැබීම හා සමුපකාර සමිතිවල සේවකයින් පුහුණු කිරීම මගින් සේවාවන් උසස් මට්ටමකට රැගෙන ඒමට හැකි විය. මෙහිදී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස සමිතිවලට බඳවාගෙන ඇති සේවකයින්ගේ පත්වීම්, ස්ථිර කිරීම හා විධිමත් කිරීමට අවශ්‍ය තොරතුරු නිවැරදිව ඉදිරිපත් නොවීම ආදිය දැක්විය හැකිය.

ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අදහස් හා යෝජනා ලෙස උතුරු මැද පළාත තුළ පිහිටුවා ඇති විවිධ සේවා සමුපකාර සමිතිවල ලාභදායි තත්වය ඉහළ නැංවීමත්, සේවකයින්ට දැනට ගෙවනු ලබන වැටුප් පරිමාණයන් ද පවත්නා වැටුප් පරිමාණවලින් ඉහළ නැංවීමට කටයුතු කිරීම හා සේවක අභියාචනා විසඳීමෙන් සේවක ප්‍රශ්න අවම කිරීමට කටයුතු සැලසීමට හැකිවිය.

# 05.ප්‍රධාන ලේකම් කාර්යාලය

ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංයුතිය ආයතන 06කින් සමන්විත වේ.




## දැක්ම

"කාර්යක්ෂම, ඵලදායි හා ජනතාවාදී පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක්"

## මෙහෙවර

"පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු , මානව සම්පත්, මූල්‍ය, සැලසුම්, ඉංජිනේරු කටයුතු හා මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය, විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයිම, ආපදා කළමනාකරණය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම. "

## දිගුකාලීන අරමුණු

- පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීම තුළින් මහජනතාවට තෘප්තිමත් හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබාදෙන කුසලතා පූර්ණ කාර්ය මණ්ඩලයක් බිහි කිරීම.
- මහජනතාවට ගුණාත්මක සේවයක් සපයන ආයතන පද්ධතියක් බිහි කිරීම.
- ඉහළ ඵලදායිතාවයකින් යුතු සමාජයීය, ආර්ථික හා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.
- මහජනතාව තෘප්තිමත් කළ හැකි කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දීමේ හැකියාව ඇති නිළධාරී හා සේවක මණ්ඩලයක් බිහි කිරීම.
- වර්තමාන නෛතික හා පරිපාලන ව්‍යුහයට අනුගත වෙමින් අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල සංවර්ධන, සැලසුම් හා පරිපාලන යන ත්‍රිත්ව කාර්යයන්හී සම්බන්ධීකරණය හා නියාමන කටයුතු සඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකර දීම.
- පළාත තුළ මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය හා සංවර්ධන කාර්යයන් පිළිබඳ පළාතේ විධායකය හා ව්‍යවස්ථාදායකය විසින් ගනු ලබන තීරණ හා තීන්දු, ක්‍රමවත් සන්නිවේදනයක් හා සම්බන්ධීකරණයක් තුළින් විධිමත්ව ක්‍රියාත්මක කිරීම හා විනිවිදභාවයෙන් යුතු වැඩ නියාමන ක්‍රමවේදයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ කාර්යය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය.
- ❖ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබා දීම සඳහා ආයතනික පරිසරය සකස් කිරීම.
- ❖ මහජනතාවට ඵලදායි දීර්ඝකාලීනව ප්‍රතිලාභ ලැබිය හැකි සමාජයීය හා ආර්ථික සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම, තක්සේරුකරණය සහ ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යයන්


- පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු හා මානව සම්පත් සංවර්ධනය.
- අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල කටයුතු නියාමනය.
- මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය සංවර්ධනය.
- විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයීම සංවර්ධනය.
- ආපදා කළමනාකරණය සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.
- උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාරී යන ආයතන මගින් ඉටුකරන, විශේෂ සමාජ, ආර්ථික වැඩසටහන් හා ව්‍යාපෘති, ආපදා කළමනාකරණ වැඩසටහන්, රට හදන සෞභාග්‍යයේ දැක්ම යටතේ සිදුකරන සංවර්ධන වැඩසටහන් ආදී කාර්යයන් නිසි පරිදි ඉටුවන බව අධීක්ෂණය හා නියාමනය කිරීම.
- පළාතේ විධායකය හා ව්‍යවස්ථාදායකය විසින් ගනු ලබන තීරණ හා තීන්දු සම්බන්ධව සියළුම අමාත්‍යාංශවලට දැන්වීම , සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම මෙන්ම අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- මූල්‍ය හා භෞතික සම්පත් සංවර්ධනය සහ මානව සම්පත් කළමනාකරණය කිරීම, පුහුණු කිරීම හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ආයතනගත පරිපාලන කටයුතු සිදු කිරීම.
- පළාත් සභා මට්ටමින් බාහිරව ජනාධිපති ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරය, මුදල් කොමිෂන් සභාව, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හා රේඛීය අමාත්‍යාංශවලින් පළාත් සභා වෙත ලබාදෙනු ලබන උපදෙස් හා කාර්යයන් සම්බන්ධීකරණය.

## ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

- ♦ වර්තමාන නෛතික හා පරිපාලන ව්‍යුහයට අනුගත වෙමින්, මානව සම්පත් සංවර්ධනය සහ අභිප්‍රේරණය.
- ♦ සංවර්ධන, සැලසුම් හා පරිපාලන යන ත්‍රිත්ව කාර්යයන්හී මෙහෙයුම් හා අධීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම.
- ♦ විශේෂ සමාජ,ආර්ථික වැඩසටහන් හා ව්‍යාපෘති, ආපදා කළමනාකරණ වැඩසටහන්, යහපාලන කටයුතු සංවර්ධනය , මත්ද්‍රව්‍ය නිවාරණය ආදී කාර්යයන් නිසි පරිදි ඉටුවන බව අධීක්ෂණය සඳහා විවිධ සාකච්ඡා, රැස්වීම් හා වැඩසටහන් පැවැත්වීම.
- ♦ විවිධ තීන්දු තීරණ අදාළ ආයතන වෙත දැනුම් දීම සඳහා විවිධ චක්‍රලේඛ නිකුත් කිරීම හා රැස්වීම් පැවැත්වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ගිවිසුම්ගත වීම් සිදු කිරීම.
- ♦ පළාත් රාජ්‍ය ආයතනවල නීතිමය ගැටළු සඳහා සහය ලබා දීම.
- ♦ පළාත තුළ පවත්වන ආගමික, සංස්කෘතික හා වෙනත් උත්සව පැවැත්වීම හා සංවිධානය සඳහා අවශ්‍ය පූර්ණ සහය ලබාදීම.
- ♦ මානව සම්පත් සංවර්ධනය උදෙසා දෙස්-විදෙස් පුහුණු අවස්ථා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම , නිලධාරීන්ගේ වරප්‍රසාද හා සුභසාධක කටයුතු වෙනුවෙන් වන විධිමත් ඉල්ලීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා දීම.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත | 86 |
| සේවයේ නියුතු | 68 |
| පුරප්පාඩු | 20 |
| අනියම් | 02 |
| කොන්ත්‍රාත් | 03 |
| පුහුණු | 03 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 43.13. | 42.77 | 0.36 | 99.17 |
| ගමන් වියදම් | 27.18 | 9.58 | 17.60 | 35.24 |
| සැපයීම් | 8.40 | 5.31 | 3.09 | 63.25 |
| නඩත්තු වියදම් | 15.92 | 9.18 | 6.73 | 57.69 |
| ගිවිසුම්ගත සේවා | 43.34 | 37.74 | 5.61 | 87.06 |
| මාරු කිරීම් | 0.50 | 0.29 | 0.20 | 40.70 |
| **එකතුව** | **138.47** | **104.84** | **33.59** | **75.71** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 199.42 | 198.11 | 1.30 | 99 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.70 | 0.18 | 0.52 | 26 |
| වාහන | 4.90 | 4.86 | 0.04 | 99 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම් | 21.60 | 18.63 | 2.97 | 86 |
| **එකතුව** | **226.62** | **221.78** | **4.83** | **98** |

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 16

**තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.**

16.6. සියළුම මට්ටම්වලදී ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.

16.7. සියළුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක , සියළු දෙනා අන්තර්ගත වූ සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම.

## අමාත්‍යංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු/ ඉලක්ක හා නිමවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක |
|---|---|
| සුරක්ෂිත වැඩ පරිසරයක් තුළින් තෘප්තිමත් නිලධාරීන් හා සේවක මණ්ඩලයක් බිහි කිරීම උදෙසා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය නිළධාරීන්ගේ සේවා හා සුභ සාධක අවශ්‍යතා සපුරාලීම ක්‍රමවත්ව සිදු වන බවට තහවුරු කිරීම. | ( තිරසාර සංවර්ධන ඉලක්ක අංක 08) දැනුමෙන් හා හැකියාවෙන් පරිපූර්ණ කාර්යක්ෂම රාජ්‍ය නිලධාරීන් පිරිසක් බිහිවීම |
| යුක්තිය හා සාධාරණය සඳහා වගවීමක් සහිතව මනා විනිවිදභාවයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | ( තිරසාර සංවර්ධන ඉලක්ක අංක 16) ක්‍රමානුකූල නීති රාමුවක් තුළ සේවා සැපයීමේ අවස්ථාව හිමි වීම නව නීති සම්පාදනය කිරීම |
| යහපත් සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, ගුණාත්මක අධ්‍යාපනය සහ සුරක්ෂිත පරිසරයක් බිහි කිරීම උදෙසා කැපවූ ආයතන පද්ධතියක් ඇති කිරීම වෙනුවෙන් ක්‍රමවත් අධීක්ෂණය හා නියාමනය ක්‍රමවේදයක් ඇති බවට තහවුරු කිරීම. | (තිරසාර අරමුණු අංක 03, අංක 04, අංක 06, අංක 15 ) පළාත තුළ සෞඛ්‍යය, අධ්‍යාපනය හා පරිසර ආරක්ෂාව පිළිබඳ ධනාත්මක දර්ශකවල අගය ඉහළ යාම |

ප්‍රධාන ලේකම් කාර්යාලය ආයතන අංශය, ගිණුම් අංශය, තොරතුරු තාක්ෂණික ඒකකය, නීති අංශය, භාෂා පරිවර්තක ඒකකය, මත්ද්‍රව්‍ය නිවාරණන ඒකකය යන අංශ වලින් සමන්විත වේ.

## ප්‍රධාන ලේකම් කාර්යාලයේ දායකත්වය

### 01. මානව සම්පත් සංවර්ධනය

**2019 වසර තුළ මානව සම්පත් සංවර්ධනය යටතේ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් අලුතින් අනුමත කළ තනතුරු**

| තනතුර | ප්‍රමාණය |
|---|---|
| ගුරු තනතුරු | 988 |
| **මෙත්සිරි සෙවන වකුගඩු රෝග පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා** | |
| හෙද නිලධාරී | 04 |
| වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පී | 02 |
| උපදේශන සේවා නිලධාරී | 02 |
| කළමනාකරණ සහකාර | 01 |
| රියදුරු | 01 |
| රසායනාගාර සහයක | 01 |
| අරක්කැමි | 02 |
| සෞඛ්‍ය කාර්ය සහයක (කනිෂ්ඨ) | 05 |
| **සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව** | |
| ආහාර නිරීක්ෂිකා | 05 |
| නිවාස භාරකාරිණී | 04 |
| **පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය** | |
| සහකාර අධ්‍යක්ෂ | 02 |
| පරිපාලන නිලධාරී | 01 |
| වැඩසටහන් නිලධාරී | 05 |
| **පළාත් ආදායම් දෙපාර්තමේන්තුව** | |
| කාර්යාල කාර්ය සහයක | 01 |

විවිධ රාජ්‍ය ආයතනවලින් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට යොමු කෙරෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 247 දෙනෙකු 2019 වසරේදී ප්‍රායෝගික පුහුණුව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

එමෙන්ම 2019 තුළදී උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ 64 දෙනෙකු පුහුණු වීම සඳහා විදේශගත කිරීම්වලට අදාල කටයුතු ද ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් සිදු කර ඇත.

### 02. පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සමස්ත කටයුතු අධීක්ෂණය හා නියාමනය.

උතුරු මැද පළාත් සභාව යටතේ ක්‍රියාත්මකවන අමාත්‍යාංශ 05ක් ඇති අතර ඒ ඒ අමාත්‍යාංශ යටතේ සහ ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ ඇති දෙපාර්තමේන්තු 18ක සියළුම පරිපාලන කටයුතු සම්බන්ධ ප්‍රමුඛ විධායක නිලධාරියාගේ කාර්ය භාරය උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබයි.

ඒ අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කටයුතු නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු මට්ටමින් විවිධ සාකච්ඡා සහ රැස්වීම් විශාල සංඛ්‍යාවක් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබීය.

ඒ අතර පරිපාලනමය හා මූල්‍ය ගැටළු සඳහා විසඳුම් ලබා දීම, ආයතනික අරමුණු හා ඉලක්ක වෙත ළඟා වීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම සිදු කිරීම ප්‍රධාන වශයෙන් සිදු කර ඇත. එමෙන්ම 2019 වසරේදී ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සහ පළාත් සභාව යටතේ ඇති සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, ආණ්ඩුකාර ලේකම්තුමා, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහභාගීත්වයෙන් ලේකම් කමිටු 01 ක් පවත්වා ඇත.

## 03. උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක ජල සම්පාදන ව්‍යාපෘති

පානීය ජලය පිළිබඳ පළාත් සම්බන්ධීකරණ කමිටුව 2019.11.22 වන දින කමිටු සභාපතිත්වය දරණ ප්‍රධාන ලේකම්තුමාගේ මූලිකත්වයෙන් පවත්වන ලද අතර උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක කරන හා ක්‍රියාත්මක කිරීමට යෝජිත ජල ව්‍යාපෘතිවල ප්‍රගතිය එහිදී සාකච්ඡා කරන ලදි.

| ව්‍යාපෘතිය | ප්‍රා.ලේ කොට්ඨාස ගණන | ග්‍රාම නිලධාරී වසම් ගණන | දී ඇති සම්බන්ධතා ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| අනුරාධපුර උතුරු ජල සම්පාදන ව්‍යාපෘතිය 01 අදියර - | 02 | 75 | 22,777 | 79,720 |
| අනුරාධපුර උතුරු ජල සම්පාදන ව්‍යාපෘතිය 02 අදියර - | 04 | 104 | 32,294 | 113,029 |
| තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | 03 | 42 | 36,006 | 126,021 |
| • විසල් අනුරාධපුර උතුර හා ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය.<br>• අනුරාධපුර දකුණ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර . 2<br>• එප්පාවල ,රාජාංගනය , ගිරිබාව ජල ,නොච්චියාගම<br>• ගල්නෑව- පලාගල ජල සම්පාදන ව්‍යාපෘතිය.<br>• පලුගස්වැව ජල ව්‍යාපෘතිය.<br>• ගලෙන්බිදුණුවැව ජල ව්‍යාපෘතිය. | 26 | 404 | 322,834 | - |
| නැගෙනහිර පොළොන්නරුව | 06 | 186 | 69,091 | - |

ඉහත සියළු ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීමත් සමඟ උතුරු මැද පළාත තුළ ජල ආවරණය 80% ක් දක්වා වර්ධනය වන අතර මෙය හඳුනා නොගත් වකුගඩු රෝගයන්ට ස්ථිර විසඳුමක් ලෙස පෙන්වා දිය හැකිය.

## 03. නීතිමය අංශය සවිබල ගැන්වීම සඳහා 2019 වසරේ සෘජු දායකත්වය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ නීති ඒකකයක් පිහිටුවා ඇති අතර මෙම ඒකකය හරහා උතුරු මැද පළාත් සභාවට අයත් ආයතනයන්හී සියළුම නෛතික කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්වලදී නීති සහය ලබාදීම සිදු කරනු ලැබේ. 2019 වසරට අදාලව ලැයිස්තු ගත වූ නඩු සංඛ්‍යාව 29ක් වන අතර 2019 වසරේ අවසන් වූ නඩු සංඛ්‍යාව10 කි.

## 2019 වර්ෂය තුළ සකස් කරන ලද ගිවිසුම්

| අ.අ | ගිවිසුම | ආයතනය |
|---|---|---|
| 01 | බහුකාර්ය අපද්‍රව්‍ය එකතු කිරිමේ යන්ත්‍රය නිර්මාණය කිරිම | ආණ්ඩුකාර ලේකම් කාර්යාලය |
| 02 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ ඉදිකර ඇති දැන්වීම් පුවරුව | ආණ්ඩුකාර ලේකම් කාර්යාලයීය සුභ සාධක සංගමය |
| 03 | වාහන අළුත්වැඩියා කිරීම | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව |
| 04 | රජරට පොත් වසන්තය | පුස්තකාල සේවා මණ්ඩලය |
| 05 | කොරකහවැව පුහුණු මධ්‍යස්ථානය | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 06 | කිරි ගොවිපළ ව්‍යාපෘතිය | පළාත් සෞඛ්‍ය හා සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව |

## 2019 වර්ෂය තුළ උපදෙස් හා නිරීක්ෂණ ලබා දීම

| අ/අ | කාරණය | ආයතනය |
|---|---|---|
| 1 | මහබුලංකුලම පහලගම කම්මල් ගම්මානය සඳහා උපකරණ ලබා දීම | පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, |
| 2 | අංක 2102/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පැවරි ඇති බලතල ක්‍රියාත්මක කිරීම | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 3 | කර්මාන්ත ගම්මාන චක්‍රීය ණය වැඩසටහන 2016 | කර්මාන්ත සංවර්ධන අධිකාරිය |
| 4 | අත්තිකාරම් වශයෙන් ලබා දුන් මුදල් අය කර ගැනීම | කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, |
| 5 | නීති උපදෙස් ලබා ගැනීම, එන්තරවාසි එවීම ( අවස්ථා 04 ක් සඳහා) | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 6 | අනවසර ඉදිකිරිම් ඉවත් කිරිම | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 7 | උතුරුමැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වූ වාර්ෂික ස්ථානමාරු ක්‍රියා පටිපාටිය අනුමත කරවා ගැනීම | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 8 | 2011 ගංවතුරින් හානි වූ මාර්ග ප්‍රතිසංස්කරණයන්ට අදාල ගෙවීම් සම්බන්ධව නීති උපදෙස් ලබා ගැනීම | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 9 | සේවය අතහැර ගිය නිළධාරින්ගේ ණය ශේෂ අයකර ගැනීම. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 10 | පාරිතෝෂික ගෙවීම | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 11 | 2019.09.16 දින පැවති ප්‍රධාන අමාත්‍ය අරමුදල සම්බන්ධ රැස්වීම් වාර්තා | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 12 | අනුරාධපුර කඩ 50 විස්කම් පියස අලෙවි සංකීර්ණයේ අලෙවි කුටි සඳහා හිඟ කඩකුලී ගෙවීම | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 13 | 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් හා 1987 අංක 42 දරණ පළාත් සභා පනත මගින් ආණ්ඩුකාරවරයා සතු කර ඇති බලතල | ආණ්ඩුකාර ලේකම් කාර්යාලය |

## උතුරු මැද පළාත තුළ ප්‍රධාන ලේකම් කාර්යාලයේ මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකයේ මූලිකත්වයෙන් සිදු කළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්හී ප්‍රගතිය

| අ.අ | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | වැඩසටහන් ගණන |
|---|---|---|
| 01 | පාසල් තුළ සිදු කළ වැඩසටහන් | 22 |
| 02 | ප්‍රජා සන්නිවේදන වැඩසටහන් | 04 |
| 03 | රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 01 |
| 04 | යොවුන් සමාජ දැනුවත් කිරීම | 08 |
| 05 | සිවිල් ආරක්ෂණ සේවා/මහජන නියෝජිතයින් වෙනුවෙන් සංවිධානය කළ වැඩසටහන් | 12 |
| 06 | දහම්පාසල් වැඩසටහන් | 02 |
| 07 | ජංගම සේවා ක්‍රියාත්මක කිරීම් | 02 |
| 08 | ජනාධිපති මධ්‍ය ඒකකය සමගින් සිදු කළ වැඩසටහන් | 02 |
| 09 | හඳුනාගත් මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් පුනරුත්ථාපනය වෙනුවෙන් පැවැත් වූ වැඩසටහන් | 236 |

මේ යටතේ සියළු පාර්ශවකරුවන් ආවරණයවන පරිදි වැඩසටහන් දෙසිය අසූ නවයක් (289)ක් වර්ෂය තුළදී පවත්වන ලදී. විශේෂයෙන්ම පාසල් සිසුන් හා දෙමාපියන්, රාජ්‍ය නිලධාරීන්, බන්ධනාගාර නිලධාරින්, පළාත් මත්ද්‍රව්‍ය පාලන කමිටු ආවරණයවන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. අතිගරු ජනාධිපතිතුමාගේ මත් නිවාරණ වැඩසටහන යටතේ පළාතේ මත් නිවාරණ වැඩසටහන් දෙකක් (02)ක්‍රියාත්මක කරන ලදී.

තිරසර සංවර්ධන අරමුණු අංක 03 යටතේ දක්වා ඇති නීරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා දිනෙන් දින උග්‍රවන මත්ද්‍රව්‍ය භාවිතයෙන් සමාජය මුදවා ගැනීම අරමුණුකොට මත් නිවාරණ වැඩසටහන් පවත්වන ලදී.

අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්, පෝස්ටර් ප්‍රදර්ශන වැඩසටහන්, පොලිස් ජංගම සේවා, වීථි නාට්‍ය මගින් දැනුවත් කිරීම්, ප්‍රජා විශෝදන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදුණු පුද්ගලයින් සමග අත්දැකීම් බෙදා ගැනීමේ වැඩසටහන් ආදී ලෙස විවිධ වැඩසටහන් රාශියක් පැවැත්වීම තුළින් පළාත තුළ මත් උවදුරෙහි අවධානම අවම කර ගැනීම සඳහා කටයුතු කර ඇත.

## පළාත තුළ යහපාලන සහ කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම සඳහා

උතුරු මැද පළාත තුළ යහපාලන සහ කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමේ අරමුණින් මධ්‍යම රජය විසින් පවත්වනු ලබන විවිධ චක්‍රලේඛ හා අණපනත් මෙම පළාතට අදාලකර ගැනීම, ක්‍රියාවට නැංවීම උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2019 වසර තුළදී පහත චක්‍රලේඛනයන් උතුරු මැද පළාත් සභාව තුළ ක්‍රියාත්මක වී ඇත.

ඒ යටතේ අභ්‍යන්තර චක්‍රලේඛ 02ක් නිකුත්කර ඇත. එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32ක්, සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ 06ක්, ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 04ක් ආදී වශයෙන් චක්‍රලේඛ 44 ක් පළාතට අදාල කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලදී.

## උතුරු මැද පළාත කේන්ද්‍රකර ගනිමින් 2019 වසරේදී පැවැත්වූ විවිධ උත්සව

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අබියසදී පවත්වන ලද 52 වන ජාතික අලුත් සහල් මංගල්‍ය හා පොළොන්නරු දිස්ත්‍රික් අලුත් සහල් මංගල්‍ය උත්සවය, අසිරිමත් ජයශ්‍රී මහ බෝ වන්දනාව සහ මහබෝ පෙරහැර, 71 වන නිදහස් සමරු උළෙල, 45 වන ජාතික මහා ක්‍රීඩා උළෙල, වෙසක් උත්සවය, අනුරාධපුර ඓතිහාසික ශ්‍රී දළදා පෙරහර, මිහින්තලා රජමහා විහාරයේ අනුබුදු පූජෝපහාර උත්සවය, ඓතිහාසික රත්නමාලී චෛත්‍යරාජයාණන් වහන්සේගේ චූඩා මාණික්‍ය පැළඳවීමේ හා කොත්වහන්සේ නිරාවරණය කිරීමේ පුණ්‍ය මහෝත්සවය, රජරට විස්කම් කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශනය, V 2025 Enterprise Sri Lanka ප්‍රදර්ශනය, මිහිඳු පරිනිර්වාණ පූජෝත්සවය වැනි උත්සව සඳහා සංවිධානය හා පැවැත්වීම සඳහා විවිධ අයුරින් දායකත්වය හා සහභාගීත්වය ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ලබා දී ඇත.

## ආයතනික ධාරිතා සංවර්ධනය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය , එම කාර්යාලයේ පමණක් නොව සමස්ත උතුරු මැද පළාත් සභාවේ සියළුම ආයතනයන්හි ආයතනික ධාරිතා සංවර්ධනය සඳහා සෘජු දායකත්වයක් දක්වයි. ඒ අනුව 2019 වසර තුළදී, සතියේ සෑම බදාදා දිනකම උදෑසන ප්‍රධාන රැස්වීම පැවැත්වීමේ වගකීම උතුරු මැද පළාත් සභා පරිශ්‍රයේ ස්ථාපිත ආයතන 13ක් වෙත, ක්‍රමවත් කාලසටහනකට අනුව වගකීම පැවරීම මගින් වර්ෂය තුළදී උදෑසන රැස්වීම් 47ක් සාර්ථකව පවත්වා ඇත.

## භාෂා පරිවර්තක සේවය ලබා දීම

උතුරු මැද පළාත් සභා වෙබ් පිටු, විගණන වාර්තා, පළාත් පාලන ආයතනික කාර්ය පටිපාටික රීති සංග්‍රහයන්, එක් එක් ආයතනවල ඉල්ලීම පරිදි කැඳවීම් ලිපි, අයදුම්පත් හා පත්වීම් ලිපි ඉංග්‍රීසි හා දෙමල භාෂාවන්ට පරිවර්තනය කිරීම සිදු කරන ලදී. එසේම 2018 වාර්ෂික කාර්ය සාධන වාර්තාව දෙමල භාෂාවට පරිවර්තනය කිරීමද සිදු කරන ලදී. ප්‍රධාන ලේකම් කාර්යාලීය භාෂා පරිවර්තන ඒකකය මගින් ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය යටතේ පළාත් රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයට අනුකූලව විවිධ නිවේදන හා වාර්තා , දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ට යුහුසුළුව පරිවර්තනය කරදීම සිදු කරන ලදී.

## පරිවර්තන සේවා ලබාදුන් අවස්ථා

| අ/අ | සේවාව පිළිබඳව විස්තරය | සේවාව ලබාදුන් ආයතනය |
|---|---|---|
| 01 | ආයතනික වෙබ්පිටු දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම | ප්‍රධාන ලේකම් කාර්යාලය, අභ්‍යන්තර විගණන ඒකකය,ආණ්ඩුකාර කාර්යාලය ප්‍රධාන අමාත්‍යාංශය |
| 02 | කාර්ය සාධන වාර්තාව - 2018 දෙමළ භාෂාවට පරිවර්තනය කිරිම | පළාත් සැළසුම් දෙපාර්තමේන්තුව |
| 03 | අයදුම්පත්‍ර, නිවේදන, කැඳවීම් ලිපි, පත්වීම් ලිපි, ප්‍රකාශන දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 04 | 2006, 2007 විගණන වාර්ථා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම | පළාත් භාණ්ඩාගාරය |
| 05 | 2006, 2007 විගණන වාර්තා ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම | පළාත් භාණ්ඩාගාරය |
| 05 | අණ පනත්, රෙගුලාසි දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 07 | පාර්ලිමේන්තු කාරක සභා වාර්තා 2011,2012,2013 ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම | පළාත් භාණ්ඩාගාරය |
| 08 | දැක්ම , මෙහෙවර, ප්‍රධාන කාර්යයන් ඇතුළු ආයතනික කාර්යයන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 09 | වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමෙදී යොදන ලද තොරතුරු ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම | ප්‍රධාන ලේකම් කාර්යාලය, ප්‍රධාන අමාත්‍යාංශය, පළාත් පරිවාස දෙපාර්තමේන්තුව |
| 10 | බදු නිවේදන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම | නැ.නු.ප, ම.නු.ප, ගලෙන්බිඳුණුවැව, මිහින්තලේ, කහටගස්දිගිලිය යන ප්‍රාදේශීය සභා |
| 11 | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ නිවේදන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම | ප්‍රධාන ලේකම් කාර්යාලය |

## තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය මගින් ඉටුකරන ලද කාර්යයන්







- උතුරු මැද පළාත් රාජ්‍ය අයතනයන්හි විශේෂයෙන් පළාත් සභා සංකීර්ණයේ පිහිටි ආයතනවල පරිගණක දත්ත ජාලා පද්ධතිය කළමනාකරණය හා නඩත්තු කටයුතු සිදු කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව Desktop පරිඝණක 414 ක් සඳහා ජාලගත සම්බන්ධතා හා නඩත්තු සේවා සැපයීම.
- පළාත් සභා සංකීර්ණයේ පිහිටි ආයතනවල ජාලගත දුරකථන පද්ධතිය නඩත්තු සේවා සැපයීම සිදු කරනු ලබයි. ඒ අනුව ඍජු දුරකථන ජාල සම්බන්ධතා 48ක් හා අභ්‍යන්තර දුරකථන ජාල සම්බන්ධතා 600 ක් සඳහා ජාලගත සම්බන්ධතා හා නඩත්තු සේවා සැපයීම.
- පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත ඇමතුම් පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය සැපයීම.
- ඇඟිළි සළකුණු යන්ත්‍ර හා අදාළ පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම හා නඩත්තු සේවා සැපයීම.

( ඇඟිළි සළකුණු යන්ත්‍ර 22ක් පවතී)

- පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත ආරක්ෂිත කැමරා පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම , නඩත්තු කිරීම හා අවශ්‍ය Backup ලබා ගැනීම.
- පළාත් ආයතනයන්හි ( අමාත්‍යංශ 05, දෙපාර්තමේන්තු 05 හා වෙනත් ආයතන 15ක වෙබ් අඩවි) ත්‍රෛභාෂිත වෙබ් අඩවි යාවත්කාලීන කිරීම්, වැඩි දියුණු කිරීම හා ක්‍රමවත්ව පවත්වා ගැනීම සිදු කිරිමේ සේවා සැපයීම.

## 2019 වර්ෂයේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය මගින් හඳුන්වාදුන් මෘදුකාංග

| අ/ අ | මෘදුකාංගය පිළිබඳ විස්තරය | සේවාව ලබා දුන් ආයතනය |
|---|---|---|
| 01. | විභාග තොරතුරු නිකුත් කිරීමේ තොරතුරු පද්ධතිය www.pscexam.nc.gov.lk | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 02. | ආදායම් කළමනාකරණ තොරතුරු පද්ධතිය www.rmis.nc.gov.lk | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව |
| 03. | පුහුණු කළමනාකරණ පද්ධතිය www.tms.nc.gov.lk | කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය |
| 04. | කාර්ය මණ්ඩල තොරතුරු කළමනාකරණ පද්ධතිය www.cmis.nc.gov.lk | ප්‍රධාන ලේකම් කාර්යාලය |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

**ව්‍යාපෘති වර්ගය** - ග්‍රාමීය පාළම් ව්‍යාපෘතිය **ප්‍රධාන ක්‍රියාකාරකම්** - උතුරු මැද පළාත තුළ පාලම් ඉදි කිරීම **ක්‍රියාත්මක කරන ආයතනය** - පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

| අදියර අංකය | ප්‍රතිපාදන ලබාදෙන රට | කාල සීමාව | මුළු වටිනාකම (රු.මි) | 2019.12.31 දිනට වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය ( %) |
|---|---|---|---|---|---|---|
| අදියර 1 | එක්සත් රාජධානිය | 2013-2015 | 1154.94 | 817.81 | 70.8 | 71.28 |
| අදියර 11 | එක්සත් රාජධානිය | 2014-2020 | | | | |
| අදියර111 | නෙදර්ලන්තය | 2014-2020 | | | | |

## පාලම් ව්‍යාපෘති ප්‍රගතිය

| අ.අ | පාලම් අංකය | ප්‍රා.ලේ කොට්ඨාශය | ග්‍රා.නි කොට්ඨාශය | පාලමේ නම | ප්‍රගතිය (%) | මුළු වියදම ( රු.මි) | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | | | | අනුරාධපුර දිස්ත්‍රික්කය | | | |
| 01 | 2678 | කහටගස්දිගිලිය | 201 කොක්මඩුව | කොක්මඩුව-නැ/හිර | 3.57 | 39.28 | Mobilizing |
| 02 | 2732 | තලාව | 403 කුරුදුවැව | කුරුදුවැව මහවැලි ඇළ පාර ( යෝධ ඇළ) | 57 | 34.25 | - |
| 03 | 2736 | මැදවච්චිය | අංක 50, යකාවැව තුලාන | බෙලන්කඩවැව ප්‍රධාන පාර | 57 | 39.28 | - |
| 04 | 2910 | නොච්චියාගම | ඉහළකොඩි තොක්කුව 348/මිහිරිපුර-351 | මිහිරිපුර වැව පාලම | 100 | 34.25 | Completed |
| 05 | 2911 | නොච්චියාගම | අමුණුකුළ තුලාන-349 | ඔළුවැව පාළම-නොච්චියාගම | 5 | 44.71 | Mobilizing |
| 06 | 2912 | නොච්චියාගම | අදම්පනේ | කොකාවිද්ධවැව පාලම | 100 | 34.25 | Completed |
| 07 | 2913 | ම.නු.ප | හීනවත්ත-572 | නිසල මාවෙත, හීනවත්ත පාලම | 100 | 29.21 | Completed |
| 08 | 2914 | ම.නු.ප | බසවක්කුලම | බසවක්කුලම රත්නමාලි දහම්පාසල අසළ පාළම | 100 | 23.93 | Completed |
| 09 | 2915 | ම.නු.ප | බණ්ඩාරපුලියන්කුලම-319 | බණ්ඩාරපුලියන්කුලම වාන් ඇළ පාලම | 100 | 23.93 | Completed |
| 10 | 2916 | ම.නු.ප | පෙරියන්කුළම | ගල්පාළම මල්වතුඔය | 80 | 44.71 | - |
| 11 | 2917 | ම.නු.ප | සාලියපුර-314 | අශෝකපුර පාර ආරම්භක පාළම | 100 | 29.21 | Completed |
| 12 | 2918 | ම.නු.ප | සාලියපුර-314/පනියන්කඩවල-312 | අශෝකපුර, පණියන්කඩවල, පහළජනපද පාර | 87.5 | 39.28 | - |
| 13 | 2919 | ම.නු.ප | සාලියපුර-314 | මංගලගම, සෙනෙවිරත්න මාවත | 100 | 23.93 | Completed |
| 14 | 3048 | 397 අදිරාණිගම | තලාව | මහවැලි ප්‍රධාන ඇළ හරහා | 100 | 23.93 | Completed |
| 15 | 3049 | ඉපලෝගම | උදේනිපුර | පරණ යෝධ ඇළ හරහා උදේනිපුර | 100 | 34.25 | Completed |

| අ. අ | පාලම් අංකය | ප්‍රා.ලේ කොට්ඨාශය | ග්‍රා.නි කොට්ඨාශය | පාලමේ නම | ප්‍රගතිය (%) | වියදම (රු.මි | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| 16 | 3050 | මැදවච්චිය | No 71 අගුනොච්චිය තුලාන | අගුනොච්චිය සීපාව මින්හෙට්ටිගම | 100 | 23.93 | Completed |
| 17 | 3051 | පලාගල | 691 ගම්සභාව | බමුණුගම | 100 | 39.28 | Completed |
| 18 | 3052 | ඉපලෝගම | 503 ගන්තිරියගම | ගන්තිරියගම පාලම හරහා සහ අළුත්ගන්තිරියගම | 100 | 34.25 | Completed |
| 19 | 3054 | තිරප්පනේ | 550 සෙම්බුකුලම | දෙමටගම ජලාශය හරහා | 100 | 34.25 | Completed |
| 20 | 3055 | කැකිරාව | 654 කඩියන්ගල | හීවන්තෙනිගම උඩුලම කොළණිය | 100 | 34.25 | Completed |
| 21 | 3056 | පළුගස්වැව | පළුගස්වැව | යාන්ඔය හිරිවඩුන පන්සල පාර පාලම | 100 | 39.28 | Finishing |
| 22 | 3175 | ගලෙන්බිඳුණුවැව | 165 සඳරැස්පුර | සඳරැස්පුර | 50 | 39.28 | - |
| 23 | 3176 | තඹුත්තේගම | 437 තලකොළවැව | වැව ඇල | 100 | 39.28 | Completed |
| 24 | 3180 | කහටගස්දිගිලිය | 222 මහකුඹුක්වැව | මහකුඹුක්වැව පාලම | 65 | 44.71 | - |
| 25 | 3181 | තිරප්පනේ | 542 පතිස්රඹැව | පතිස්රඹැව කදුවතපාර | 36 | 29.21 | - |
| 26 | 3184 | තිරප්පනේ | 546 කට්ටමුරිච්චන | තිඹිරිකඩවල පාර | 5 | 44.71 | - |
| 27 | 3186 | මිහින්තලේ | 570 කට්ටබුවාගම | රඹැව, කුඩාරඹැව පාළම | 70 | 44.71 | - |
| 28 | 3188 | තලාව | 376 නල්ලමුදාව | නල්ලමුදාව ඇළ | 55 | 39.28 | - |
| 29 | 3189 | කැකිරාව | 610 ගනේවල්පොළ | මල්වතුඔය පාලම | - | 34.25 | - |
| 30 | 3190 | තිරප්පනේ | 537 සෙලිස්තිමඩුව | කරුවළගස්වැව පාලම | 18 | 44.71 | - |
| | පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | | | | |
| 31 | 2831 | මැදිරිගිරිය | 106 සෙනරත්පුර | වැලිගම්පුර ගම්මාන පාර | 100 | 18.8 | Completed |
| 32 | 2985 | හිගුරක්ගොඩ | 38-රාජ ඇළ | නුගගහදමන පාලම | 10 | 23.9 | - |
| 33 | 3057 | ලංකාපුර | 143 දඹරුල්ල | අක්කර 45 , නිහාල් පැළ තවාන අසළ | 90 | 29.2 | - |
| 34 | 3058 | මැදිරිගිරිය | 35 පළුවද්දන | යුධගනාව පාර | 10 | 29.2 | - |
| 35 | 3059 | මැදිරිගිරිය | 96 දිගල්පුර | අත්තනායක කඩේ අසළ පාර | 100 | 29.2 | Completed |

## පළාතේ වකුගඩු රෝගීන්ට ප්‍රශස්ත පහසුකම් සැලසීම සඳහා මෛත්‍රීසිරි සෙවණ ව්‍යාපෘතිය

ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය සාධන බලකායේ ප්‍රතිපාදන හා ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වය මත උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ ඉදිකරන ලද මෛත්‍රීසිරි සෙවණ වකුගඩු රෝගී සහන සත්කාර, සුබසාධන හා පර්යේෂණ මධ්‍යස්ථානය 2019.03.20 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පත්කරන ලදි.



මෙම නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා කාමර 23 ක්, වාට්ටු 2 ක්, උපදේශක කාමර, පර්යේෂණාගාරයක් සහ අනෙකුත් වෛද්‍ය පහසුකම් සහිත අංගෝපාංගයන්ගෙන් සමන්විත වන අතර,



එහි විදුලි සැපයුම සූර්ය පැනල මගින් සම්පූර්ණයෙන් ක්‍රියා කරන අතර, නිධන්ගත වකුගඩු රෝගී මධ්‍යස්ථානය වෙත හා අනුරාධපුර රෝහලට පැමිණෙන රෝගීන් සඳහා රාත්‍රී නවාතැන් පහසුකම් ද සැපයීමට හැකි ලෙස ඉදිකරනු ලැබූ මෙම ගොඩනැගිලි සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා 2015 වර්ෂය සඳහා වෙන්කොට තිබූ ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 437 ක මුදලක් ලබාදී ඇත. තවද පරිත්‍යාගශීලින්ගේ උපකාර මෙන්ම විවිධ පුද්ගලයින්ගේ ආශිර්වාදය ද මේ සඳහා හිමිවිය.

මෙම මධ්‍යස්ථානය ජනතා අයිතියට පත්කිරීමෙන් අනතුරුව අදාළ මධ්‍යස්ථානයේ පරිපාලනමය කටයුතු සිදු කරගෙනයාම සඳහා පළාත් සෞඛ්‍යය අමාත්‍යාංශය වෙත වගකීම් පවරා ඇත.



## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂයේ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් වාර්ෂික කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා සැලසුම්ගත ක්‍රියාවලියක නිරත විය. පළාතේ සංවර්ධනය උදෙසා විවිධ විෂයන් සඳහා ගිවිසුම් සකස් කිරීම, උපදෙස් හා නිරීක්ෂණ ලබා දෙමින් මග පෙන්වීම, උතුරු මැද පළාත දුමින් මතින් නිදහස් සෞඛ්‍යමත් ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහාවන ක්‍රියාමාර්ග ගැනීම, අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම, ආයතනික ධාරිතා සංවර්ධනය, පළාත තුළ ක්‍රියාත්මක විවිධ රාජ්‍ය උත්සව සඳහා සහයෝගය ලබාදීම යන කාර්යයන් ඒ අතර ප්‍රමුඛ වේ.ඒ අනුව ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් 2018 වර්ෂයට සාපේක්ෂව වඩාත් ඵලදායිව මෙන්ම කාර්යක්ෂමව ඉටු කිරීමට 2019 වර්ෂයේදී හැකි වී ඇත.

තවද රාජ්‍ය ප්‍රතිපත්තිමය ගමන් මගට අනුකූලව “රට හදන සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති මාලාවේ සැලසුම් ක්‍රියාත්මක කිරිම තුළින් සෞභාග්‍යමත් හා සුන්දර ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම උදෙසා උතුරු මැද පළාතේ පූර්ණ දායකත්වය ලබා දීම වෙනුවෙන් 2020 වර්ෂයේ දි සියළුම පළාත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය සඳහා නවීන තාක්ෂණික හා ඵලදායී ශිල්පීය ක්‍රම භාවිතා කිරීම ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉදිරි අපේක්ෂාව වේ.

# 5.1.පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

1988.05.12 දින උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කිරීමත් සමඟම ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ඒකකයක් වශයෙන් මෙම ආයතනය ආරම්භ කරන ලදී. පසුව මෙම ආයතනය පළාත් සභා කැබිනට් තීරණයක් මඟින් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදී. මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

## දැක්ම

"ඵලදායි පළාත් සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්."

## මෙහෙවර

"පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරණය , ප්‍රගති පාලනය හා ඇගයීම , අංගසම්පූර්ණ දත්ත පද්ධතිය , අධ්‍යයන හා පර්යේෂණ , විදේශ ව්‍යාපෘති අධීක්ෂණය , පළාතේ සංවර්ධන සැලසුම් අංශ මනාව මෙහෙයවීම, ප්‍රතිපත්ති, කාර්ය සාධනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් , විනිවිදභාවයෙන් හා සමතාවයෙන් ක්‍රියාවට නංවමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අඛණ්ඩව දායකවීම"

### දිගුකාලීන අරමුණු

- රාජ්‍ය ආයතන ප්‍රධානින් අතර සැලසුම්කරණ ක්ෂේත්‍රය පිළිබඳ සාමූහික බවක් ඇති කිරිම.
- නායකත්වය අතර සාමූහික වගකීමක් සහ පැවැත්මක් ඇති කිරිම.
- පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරිම.
- කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.
- පළාතේ යහපාලනය ඇති කිරිමට සැලසුම්කරණය තුළින් මග පෙන්විම.
- කළමනාකරණ තොරතුරු පද්ධතියක් ඇති කිරිම මගින් පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරිම.

පළාතේ සංවර්ධනය කඩිනම් කිරිම

### කෙටිකාලීන අරමුණු

- තොරතුරු තාක්ෂණය පදනම් කරගෙන දත්ත පද්ධතිය වඩා නිවැරදිව යාවත්කාලීන කර දත්ත පාර්ශවකරුවන් අතට පත් කිරිම.
- පළාත් ආයෝජනයේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- රැකියා විරහිත උපාධිධාරීන් ලියාපදිංචි කිරිම
- උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම
- වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම.
- වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිකුත් කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය හා මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරිම.
- ජාතික ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් පළාත තුළ ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛස්ථානය ලබා දීම.
- විශේෂ ව්‍යාපෘති,විදේශ ව්‍යාපෘති,විමධ්‍යගත ආදි වැඩසටහන් ක්‍රියාත්මක කිරිම

## ප්‍රධාන කාර්යයන්


01. පළාත සඳහා දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම් පිළියෙල කිරීම.
02. වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුමක් පිළියෙලකර එය ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය ඇගයීම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම.
03. සංවර්ධන සැලසුම් සඳහා දත්ත රැස් කිරීම, පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම.
04. සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම.
05. පළාත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ප්‍රගතිය ඇගයීම හා ඉලක්කයන් කරා ළඟා වීම.
06. නව ව්‍යාපෘති හඳුනා ගැනීම, ඇගයීම හා තක්සේරුව.
07. විදේශාධාර හා ණය ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
08. ආංශික සැලසුම් හා ආයතනික සැලසුම් පිළියෙල කිරීම හා ඒ සඳහා ආයතනවලට සහාය වීම.
09. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සැලසුම් ඒකක මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
10. ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් රැස්කර ගැනීම හා පළාත් සැලසුම් සඳහා අදාලකර ගැනීම.
11. රජයේ ආයතන සමඟ සැලසුම් කටයුතු සම්බන්ධීකරණය.
12. අනෙකුත් පළාත් සභාවල සැලසුම් දෙපාර්තමේන්තු සමඟ කටයුතු කිරීම.
13. සැලසුම්වලට අදාල මුදල් කොමිෂම, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම.
14. ප්‍රධාන අමාත්‍යවරයාට, අමාත්‍යවරුන්ට හා ප්‍රධාන ලේකම්වරයාට සැලසුම්කරණයට සහය වීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

1. දිගුකාලීන,මධ්‍යකාලීන හා කෙටිකාලීන සංවර්ධන සැලසුම් සැකසීම.
2. වාර්ෂික ක්‍රියාකාරි සැලසුම සැකසීම, ක්‍රියාත්මක කිරිම හා ප්‍රගතිය මැනීම.
3. සංවර්ධන සැලසුම්කරණය සඳහා යාවත්කාලීන කරන ලද දත්ත භාවිතය.
4. නව ව්‍යාපෘති අවස්ථා හඳුනා ගැනිම හා ක්‍රියාත්මක කිරිම.
5. අන්තර් ආයතන සම්බන්ධීකරණය.
6. විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ .අං | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 55 |
| 2 | සේවයේ නියුතු | 39 |
| 3 | පුරප්පාඩු | 16 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 26.84 | 25.73 | 1.11 | 96 |
| ගමන් වියදම් | 2.16 | 2.09 | 0.07 | 97 |
| සැපයීම් | 2.42 | 2.31 | 0.11 | 96 |
| නඩත්තු වියදම් | 1.60 | 1.54 | 0.06 | 96 |
| ගිවිසුම්ගත සේවා | 3.10 | 1.55 | 1.55 | 50 |
| මාරු කිරීම් | 0.60 | 0.57 | 0.03 | 95 |
| **එකතුව** | **36.72** | **33.79** | **2.93** | **92** |

2019 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් සඳහා රු.මි.36.72ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් ලැබිණි. පුද්ගල පඩිනඩි , ගමන් වියදම් , සැපයීම්, නඩත්තු වියදම්, ගිවිසුම්ගත සේවා හා මාරු කිරීම් සඳහා රු.මි.33.79ක මුදලක් වියදම් වශයෙන් දරන ලදි. පුනරාවර්තන වියදම්හී සමස්ත උපයෝජනය 92% ක් විය.

## මුලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 1.43 | 0.83 | 0.60 | 58 |
| වාහන | 0.20 | 0.00 | 0.20 | 0 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 0.30 | 0.29 | 0.01 | 97 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.10 | 0.00 | 0.10 | 0 |
| පර්යේෂණ හා සමීක්ෂණ | 0.20 | 0.00 | 0.20 | 0 |
| තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන | 0.50 | 0.16 | 0.34 | 32 |
| සැලසුම් හා මෙහෙයුම් | 3.30 | 0.87 | 2.43 | 26.40 |
| ධාරිතා සංවර්ධනය | 0.10 | 0.00 | 0.10 | 0 |
| වෙනත් මුලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 31.80 | 25.34 | 6.46 | 80 |
| **එකතුව** | **37.93** | **27.49** | **10.44** | **72.47** |

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු





පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමේ භාරදූර වගකීම ඉටු කරන ආයතනයක් ලෙස කටයුතු කරමින් 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙහෙයවීම සිදු කරන ලදී. ඒ යටතේ පළාත් හා මධ්‍යම රජයේ රාජ්‍ය නිලධාරීන් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී. එපමණක් ද නොව පළාතේ සංවර්ධන සැලසුම් සකස් කිරිමේදි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙරෙහි අවධනය යොමු කරවිමටත්, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි පළාත් මට්ටමෙන් ජාතික මට්ටමට සැලකිය යුතු දායකත්වයක් ලබා දිමටත් හැකිවන පරිදි තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරවිමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි.

## 2019 වර්ෂය තුළදී ලද සුවිශේෂී ජයග්‍රහණ

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳව කාරක සභාවේ අධීක්ෂණයට යටත් රාජ්‍ය ආයතනයන්හී මූල්‍ය හා භෞතික කාර්ය සාධනය ඇගයීමේදී 2018 වසර සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට කුසලතා සහතිකයක් හිමි විය.එය 2019 වසරේදි දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයක් වූ අතර එයට හිමි ඇගැයීම් සම්මානය 2020 වර්ෂයේදි ප්‍රදානය කරන ලදී. එම සම්මානයට පාත්‍ර වීම පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව ලද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙසද දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන්ගේ කැපවීම සම්බන්ධයෙන් කරන ලද මනා ඇගයීමක් ද වන්නේය. එසේම දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හී මනා විනිවිදභාවය හා කළමනාකරණය පිළිබඳව කරන ලද සුවිශේෂී තහවරුවක් ද වේ. එසේම මේ අයුරින් දෙපාර්තමේන්තුව ඇගයීමට ලක් වීම තුළ සේවක අභිප්‍රේරණය මෙන්ම වඩාත් ඵලදායි දිසානතියක් කරා ආයතනය යොමු වීම ලද සුවිශේෂී ජයග්‍රහණයකි.




## ප්‍රාදේශීය සභා සඳහා වූ කාර්යපටිපාටි සංග්‍රහය සකස් කිරීම




උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා සඳහා පුරවැසි ප්‍රඥප්තිය සහ කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කිරීම 2019 වර්ෂය තුළදී සිදු කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ මග පෙන්වීම යටතේ උතුරු මැද පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය හා එක්ව පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සහයෝගය සහිතව මෙය එළි දක්වන ලදී. ඒ මගින් සේවාලාභී තෘප්තිය ඉහළ යන අයුරින් විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම සිදු විය.

## 01.විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

පළාත් නිශ්චිත අරමුදල් යටතේ ලද රු.මි.230 භාවිතා කරමින් 2018 වර්ෂයේදී අත්‍යාවශ්‍ය අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගන්නා ලද, ප්‍රමුඛතාගත කරන ලද ව්‍යාපෘති දෙසිය විසි නවය (229)ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ විශේෂයෙන්ම ග්‍රාමීය පාලම්, බෝක්කු ඉදි කිරීම හා නවීකරණය, පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම, අත්‍යාවශ්‍ය ග්‍රාමීය මාර්ග පද්ධතියේ සංවර්ධන කටයුතු ,ඇළ වේලි, අමුණු, වගා ළිං ලබා දීම, විදුලි සම්බන්ධතා ලබා දීම් ක්‍රියාත්මක කරන ලදී. වියදම් සඳහා වු බිල්පත් පියවීම සඳහා රු.මි.207.47ක් වැය කරන ලදී. එසේ වුවද 2018 වර්ෂය තුළ වැඩවලින් කිසිදු අවිච්ඡේද ව්‍යාපෘතියක් ඉතිරි නොවු අතර අතැති බිල් ගෙවීම සඳහා පමණක් සංවර්ධන ව්‍යාපෘති 29ක් 2019 වර්ෂයට ඉතිරි විය.

ඒ අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලද රු.මි.31.80ක මුදල අවිච්ඡේද ව්‍යාපෘති 29 ක වියදම පියවීම සඳහා යොදවන ලද අතර ඒ සඳහා රු.මි.31.72ක මුදලක් වැය විය. 2019 වර්ෂයේදී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද්දේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගිනි.

පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වගකීම දරන ලද වර්ෂයට අදාල ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම නිම වු අතර එහි කාර්ය සාධනය 100%කි.

## 02.පළාත් සංවර්ධන සැලැස්ම සැකසීම හා මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචනය කිරීම.

2019 වර්ෂයේ උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා අදාල ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ප්‍රමුඛ කාර්යය විය.

මේ යටතේ විවිධ මට්ටම්වලදී කාර්තුමය හා මාසිකව සහ විශේෂයෙන් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හීදී විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් අදාල ව්‍යාපෘති ඉලක්ක කරා රැගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ අනුව පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද පසු විපරම් ඇගයුම්, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට 2019 වසරේදීද කටයුතු කරන ලදී. ඒ අනුව 2019 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන විවිධ මට්ටම්වලදී ප්‍රගතිය සවිස්තරාත්මකව සමාලෝචනය කරන ලදී.

## පළාත් සංවර්ධන සැලසුම් මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය

පළාත් සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ක්‍රමානුකූල ක්‍රමවේදයක් තුළ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. එහිදි ප්‍රධාන අවස්ථා කිහිපයකදී ප්‍රගතිය සමාලෝචනය කරමින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

ඒ අනුව උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින් 2019 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, සංවර්ධන ව්‍යාපෘති මෙහෙයුම්කරණ මෘදුකාංග පද්ධතිය (DPMS) යාවත්කාලීන කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම, ප්‍රතිඵල පාදක මධ්‍යකාලින සංවර්ධන සැලසුම සකස් කිරිම සඳහා විවිධ පාර්ෂවකරුවන් සමග දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම හා සංවර්ධන නිලධාරින් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්විම් පැවැත්වීම සිදු කරන ලදී.

01
- 2019 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම( උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින්) 05

02
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම අනුරාධපුර 04, පොළොන්නරුව 02

03
- සංවර්ධන ව්‍යාපෘති මෙහෙයුම්කරණ මෘදුකාංග පද්ධතිය (DPMS) යාවත්කාලීන කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් 09 ක් පැවැත්වීම (ව්‍යාපෘතිය, වියදම, භෞතික ප්‍රගතිය, මුල්‍ය ප්‍රගතිය, අතැති බිල්පත් විස්තර යනාදිය ඇතුළත් කිරීම)

04
- ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන සංවර්ධන සැලසුම සකස් කිරීම සඳහා විවිධ පාර්ෂවකරුවන් සමග දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් පැවැත්වීම

05
- සංවර්ධන නිළධාරින් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් 01ක් පැවැත්විම

## 03. විමධ්‍යගත සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම


**2019** වර්ෂයේදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විමධ්‍යගත සංවර්ධන වැඩසටහන පළාත් සභාව විසිරීමත් සමග ක්‍රියාත්මක නොවිණි. එසේ වුවද 2017 වර්ෂයේදී ප්‍රධාන සංරචක 05ක් ඔස්සේ ව්‍යාපෘති 2654 ක් පළාත තුළ ක්‍රියාත්මක කර ඇත. එහි පසුවිපරම් කටයුතු 2019 වර්ෂය තුළදි සිදු කරන ලදි.

## 04. උතුරු මැද පළාත සඳහා ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම සකස් කිරිම

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ(UNDP) ආධාර මත උතුරු මැද පළාත සඳහා ප්‍රතිඵල පාදක කරගත් මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙලක් සැකසීම සඳහා කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ වුවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන් දැනුවත් කරමින් සැලැස්ම සැකසීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු "ගම" පොත හරහා ලබා ගැනීම සිදු විය.

**ප**ළාත් සංවර්ධන ක්‍රියාවලිය තුළ ළඟා කරගත යුතු හා ළඟාකර ගත හැකි ප්‍රතිඵලයන් හඳුනා ගැනීම මෙහි ප්‍රමුඛතම කාර්යය විය. පළාතේ ආර්ථික, සමාජ හා සංස්කෘතික ලෙස භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනයක් සඳහා මෙම සැලැස්ම දිගුකාලීන සහ තිරසාර ලෙස ඉදිරියට විකාශය කළ යුතුය.

ඒ සඳහා තොරතුරු හා දත්තයන් අඩංගු අත්පොතක් සකස්කොට ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ලබා දීම සඳහා කටයුතු ක්‍රමික වැඩපිළිවෙළක් තුළ ක්‍රියාත්මක කරන ලද ගම පොත සම්පූර්ණකර භාර දීම සඳහා වසම් භාර සංවර්ධන නිලධාරියාට පවරන ලදී.
තිරසර ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාල සැලසුම් මෙහෙයුම් පද්ධතිය ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය මගින් සකස් කරන ලදී. ඒ අනුව තිරසර ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාලව සහ සැලසුම් මෙහෙයුම් පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කිරීම සඳහාවන වැඩමුළු 06ක් පවත්වන ලදී.




## 05. වාර්ෂික සංගණන කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා මහබැංකුව මඟින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අර්ධ වාර්ෂික සංගණන කටයුතු සිදු කිරීමටත් 2019 වසරේදී ඍජු දායකත්වයක් සැපයීමට හැකි විය.
ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සිදු කරන ලද උතුරු මැද පළාතේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණන කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

## 06. ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත වෙනුවෙන් දැක්වූ දායකත්වය

2017 වර්ෂය දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස ප්‍රකාශිත ජාතික වැඩපිළිවෙලට අවශ්‍ය දිළිඳුකම පිළිබඳ පළාතට අදාළ තොරතුරු සැපයීමටද කටයුතු කෙරිණි. ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ 2019 වර්ෂයේදී වකුගඩු රෝග නිවාරණය ජාතික වැඩසටහන ක්‍රියාත්මක විය.

### 6.1. වකුගඩු රෝග නිවාරණය ජාතික වැඩසටහන වෙනුවෙන් පළාත නියෝජනය කිරීම.

උතුරු මැද පළාත තුළ ව්‍යාප්ත වෙමින් පවතින මෙන්ම ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය නිවාරණය හා පාලනය කිරීම සඳහාත් පළාතේ දැනට පවතින රෝගීන් සංඛ්‍යාවට අලුතින් එකතුවන ප්‍රමාණය ප්‍රමාණාත්මකව පාලනය කිරීම සඳහාත්, ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන වකුගඩු රෝග නිවාරණ වැඩසටහන සඳහා පළාත සම්බන්ධීකරණය කරමින් දායකත්වය ලබා දීමත් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් සිදු වේ.

එසේම වකුගඩු රෝග නිවාරණය සඳහා ජාතික මට්ටමේ සැලසුම් සකස් කිරීමේදී පළාත නියෝජනය කරමින් වඩාත් ඵලදායි මෙන්ම ප්‍රායෝගික යෝජනා ලබාදීමෙන්ද ක්‍රියාත්මක තලයේදී පළාත් දායකත්වය කාර්යක්ෂමව ලබා දෙමින්ද පළාත තුළ සමාජ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය සැලකිය යුතු මට්ටමකින් පාලනයකර ගැනීම සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සහසම්බන්ධව කටයුතු කිරීමට හැකි විය.

ජාතික වකුගඩු රෝග නිවාරණ වැඩසටහනට සමගාමීව පළාත් වකුගඩු රෝග නිවාරණ ආදර්ශ ගම්මාන වැඩසටහන "නිරෝගිමත් ජනතාවක් - සපිරි ගමක්" යන තේමාවෙන් යුක්තව උතුරු මැද පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ මුලිකත්වයෙන් පළාතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගණනාවක සහයෝගයෙන් ක්‍රියාත්මකවන වැඩසටහනකි.

## “නිරෝගිමත් ජනතාවක් - සපිරි ගමක්” යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන අංශ 05

1. රෝග නිවාරණ කටයුතු
2. පෝෂ්‍යදායී ආහාර රටාවකට ජනතාව හුරු කිරීම.
3. ජනතාවගේ චර්යා රටාවන් සංවර්ධනය කිරීම.
4. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
5. පවුල් ඒකකයේ ආර්ථිකය ශක්තිමත් කිරීම

## සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය වෙනුවෙන් දැක්වූ දායකත්වය.

### දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය(Climate Smart Irrigated Agriculture Project)-world Bank

මේ යටතේ කෘෂිකාර්මික සහ වාරි පද්ධති පුනරුත්ථාපනය සිදු කරයි. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය, කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පාදනය,ව්‍යාපෘති කළමණාකරණය,මෙහෙයවීම හා ඇගයීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි140කි. ව්‍යාපෘති කාල සීමාව 2018-2024 වේ.

### නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයJICA

මේ යටතේ ග්‍රාමීය ජල ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඉදි කිරීම, ග්‍රාමීය මාර්ග සැලසුම් කිරීම හා ඉදි කිරීම,වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සිදු කරයි. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය මගින් මෙය ක්‍රියාත්මක කරන අතර මුළු පිරිවැය රු.මි.32,000ක් වන අතර ව්‍යාපෘති කාලසීමාව 2018 – 2021 දක්වා වේ.

### පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය - (පුරනැගුම)

ජල සැපයුම් ලබා දීම මේ යටතේ සිදු කරනු ලබන අතර අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. මුළු පිරිවැය රු.මි. 2,630ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2017-2020 දක්වා වේ.

### ප්‍රාථමික සෞඛ්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Primary Healthcare Strengthening In)

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත මෙම ව්‍යාපෘතිය උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි 180කි.

### පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (ESA)- UNDP

වාරිමාර්ග පුනරුත්ථාපනය හා කෘෂිකාර්මික අංශය ඉලක්කකර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.කාබනික ගොවිතැන සහ ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය ඇතුළත් පාරම්පරික ගොවිතැන ප්‍රචලිත කිරීම,ගෙවතු තුළ බහුකාර්ය ශාක වර්ග වැඩි දියුණු කිරීම හා ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා නව වගා ආදර්ශණ සඳහා අනුගත වීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවයි. වාරිමාර්ග පුනරුත්ථාපනය සඳහා රු.මි.435.72ක මුදලක් 2018-2024 කාල සීමාව සඳහා ද කෘෂිකාර්මික අංශය සඳහා රු.මි. 9.55ක මුදලක් ද ව්‍යාපෘතියේ මුළු පිරිවැය ලෙස දරනු ලබයි.

## ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන අයි මාර්ග ව්‍යාපෘතිය(i- Roads) - ADB

ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම මේ යටතේ සිදු වේ. මාර්ග සංවර්ධන අධිකාරිය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග 04ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග 03ක් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරනු ලබයි. ව්‍යාපෘති පිරිවැය රු.මි. 10502.00කි. (ව්‍යාපෘති කාල සීමාව 2016.08.01- 2021.07.31).

## අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

නාගරික හා ප්‍රවාහන සංවර්ධනය මේ යටතේ සිදු විය. දුම්රිය පොදු චතුරශ්‍රය සහ සිංහ කුළුණ වටරවුම සංවර්ධනය කිරීම (කඩිනම් ව්‍යාපෘති 1), ශ්‍රී මහා බෝධි නැගෙනහිර රථගාල සංවර්ධනය කිරීම සහ පූජනීය නගරයේ අර්ථ නිරූපණ පුවරු සවිකිරීම (කඩිනම් ව්‍යාපෘති 2), අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් සඳහා උපදේශන සේවාව, වැසි ජල කළමණාකරණය හා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම, අනුරාධපුර පූජා භූමියේ හා නව නගරයෙහි නාගරික සංචලතාවය නාගරික සංවර්ධනය හා පොදු ස්ථාන සංවර්ධනය, අපජල කළමනාකරණ පද්ධතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවාව, පූජනීය නගරයේ අර්ථ නිරූපණ පුවරු සවිකිරීම (කඩිනම් ව්‍යාපෘති 2),අ/පුර මහ නගර සභාවේ කසල එකතු කිරීමේ වැඩසටහන සඳහා ට්‍රැක්ටර් ට්‍රේලර් නවතා තැබිය හැකි ස්ථාන සකස් කිරීම (කඩිනම් ව්‍යාපෘති 2) මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වේ. අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) (උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන/මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය) මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි. 10125.00කි. ව්‍යාපෘති කාල සීමාව 2016-2021 වේ.සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිතායතනය හා ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මෙහෙයවීමෙන් සිදු කරන මෙම ව්‍යාපෘතිය සඳහා අනුරාධපුර නගරය ආශ්‍රිත කලාපය පහත අංග 4 යටතේ සංවර්ධනය කරයි.

- ජල කළමනාකරණය.
- ගමනාගමන පහසුකම් සංවර්ධනය.
- නගර අලංකරණය හා පහසුකම් සංවර්ධනය.
- නගර සංවර්ධනයට හා උරුම කළමනාකරණයට සම්බන්ධ ආයතනවල ධාරිතා සංවර්ධනය.

**අනුරාධපුර** නගරයට මෙතෙක් වෙන්වූ විශාලම මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 57.5ක මුදලක් මේ සඳහා ආයෝජනය කිරීමට නියමිත අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම සම්බන්ධීකාරක ලෙස පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ද පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. 2013- 2024 දක්වා උතුරු මැද පළාතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබයි.

## වැව්ගම් පුබුදුව (CRIWMP) -GEF(හරිත දේශගුණ අරමුදල)

කුඩා වැව් 52 ප්‍රතිසංස්කරණය, දේශගුණික සංවේදී කෘෂිකර්මය , ප්‍රජා ජල සම්පාදන පද්ධති ඉදිකිරීම , පෙරහන් පද්ධති ලබාදීම හා වැසි ජල ටැංකි ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව , පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි.52.04 (රු.මි.9400)ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2017-2024 වේ.

## කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) - World Bank

කෘෂිකාර්මික අංශය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. නවීන කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන පිහිටුවීම,(නියමු ව්‍යාපෘතීන්), නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය (වැව් පුනරුත්තාපනය, ඇලමාර්ග නවීකරණය, කෘෂි මාර්ග නවීකරණය) හා ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි.58.63ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2016-2021 වේ.

## සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- (ADB)

සෞඛ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා ප්‍රාථමික රෝග නිවාරණ සේවය සංවර්ධනය මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි.2260.44කි.

## ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය - (ADB)

වාරිමාර්ග ඉදිකිරීම් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වේ. මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ මොරගහ කන්ද ජලාශයේ සිට අනුරාධපුරය දක්වා නව ඇළ මාර්ගයක් ඉදිකිරීමයි. මහවැලි අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මුළු පිරිවැය රු.මි.65,000ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව වසර 06 කි.

## මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය (CCAP II) - UNAF

කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රම ප්‍රචලිත කිරීම, වගා ළිං තැනීම, විදුලි වතුර මෝටර් ලබාදීම, බිම්මල් වගාව ප්‍රචලිත කිරීම, පැල තවාන් සඳහා සෙවණ දැල්ගෘහ ඇති කිරීම, ධාරිතා ගොඩනැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කාර්යාලීය උපකරණ මිළදී ගැනීම හා පාංශු සංරක්ෂණ වැඩසටහන මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මෙය ක්‍රියාත්මක කරන ලද අතර එහි ව්‍යාපෘති මුළු පිරිවැය රු.5,516,000.20කි.

**පළාත තුළ විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘති නියාමනයේදී උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා වශයෙන් පළාතේ සියළු විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති ප්‍රගතිය අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රගති සමාලෝචනය කරනු ලබයි. එහිදී අවශ්‍ය තීන්දු තීරණ ගැනීම හා නියාමන කටයුතු පළාත් මට්ටමින්, ජාතික මට්ටමින් පිහිටුවා ඇති කමිටු නියෝජනය කරමින් අපේක්ෂිත අරමුණු කරා ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් ලෙස අවශ්‍ය මැදිහත්වීම් 2019 වර්ෂය තුළ දී සිදුකර ඇත.**

## 08. පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් සියළුම සංවර්ධන අංශ ආවරණය වන පරිදි ඉදිරි වසර සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම.

ඉදිරි වසරෙහි පළාතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හඳුනා ගනිමින් එම ව්‍යාපෘති සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල පිළිබඳව ගණනය කිරීම හා එය මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරිම මෙහිදී සිදු කරන ලදි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘතිප්‍රකාරව උතුරු මැද පළාත් සභාවට අයත් සියළුම ආයතන වෙත යොමුකර නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරනු ලබන අතර සංවර්ධන යෝජනාවන්හි යෝග්‍යතාවය පිළිබඳ සාකච්ඡා සිදු කරනු ලබයි. මෙහිදී වඩාත් ඵලදායි යෝජනා ලබාගත් පසු උතුරු මැද පළාත වෙනුවෙන් ඉදිරි වසර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවය තක්සේරුකර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

## 09. වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරිම.

ඉදිරිපත් කරනු ලැබු ප්‍රාග්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ එක් එක් විෂයට අදාලව ලබා දිය හැකි ප්‍රතිපාදන ප්‍රමාණය මුදල් කොමිෂන් සභාව මගින් දැනුම් දීමෙන් පසු සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබයි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘති ප්‍රකාරව අදාල වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස්කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි.

**2019** වර්ෂයේදී වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් වැඩමුළු 04ක් පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම්, අධ්‍යක්ෂවරු හා සහකාර පර්යේෂණ නිලධාරීන්, උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා, ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු, අමාත්‍යාංශ ලේකම්වරු, සහකාර ලේකම්වරු සහ විෂය සම්බන්ධ නිලධාරීන් සහභාගී විය.






## 10. පළාත් සංවර්ධනය උදෙසා තොරතුරු තාක්ෂණ භාවිතය.

### 10.1 වෙබ් අඩවි යාවත්කාලීන කිරීම.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මානව හා භෞතික සම්පත් වඩාත් ඵලදායීව හා කර්යක්ෂමව පළාතේ සමස්ත සංවර්ධනය සඳහා යොමු කිරීමේදී ලොව වේගවත්ම තාක්ෂණය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් එය වඩාත් සාර්ථකව ඉටු කිරීමේ අවශ්‍යතාවය මත ස්ථාපනයකර ඇති උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණ ඒකකය මගින් 2019 වර්ෂය තුළදී පළාතේ පවතින රාජ්‍ය ආයතන 34 ක් සඳහා වන වෙබ් අඩවි යාවත් කාලීනව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත.

ඒ අනුව වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ වැඩමුළු හතරක් මෙම වර්ෂයේදී සිදු කරන ලදි. ආයතන 34හි සිටින නව්‍යකරණ නිලධාරින් එකම ස්ථානයකට කැඳවා වෙබ් අඩවිවල තිබෙන අඩුපාඩු සහ දෝෂ නිරාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම මෙමගින් සිදු කරන ලදි.

මීට අමතරව තොරතුරු තාක්ෂණ ඒකකයේ සහාය අවශ්‍ය වූ ආයතන සඳහා පරිගණක පුහුණු අභ්‍යාසලාභීන් යොදවා එම ආයතනවල වෙබ් අඩවි යාවත්කාලින කිරීම දිගින් දිගටම සිදු කරන ලදි. සෑම මසකම වෙබ් අඩවි 34 පිළිබඳවම පරික්ෂා කර බලා අඩුපාඩු ඇති ආයතන වෙත දැනුවත් කිරීම් කර ඒවා යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා කටයුතු කරන ලදි.

### 10. 2.පරිගණක පුහුණු වැඩසටහන් පැවැත්වීම.

පරිගණක පුහුණු අවශ්‍යතාවයන් අනුව පුහුණු වැඩසටහන් පවත්වා නිලධාරීන් දැනුවත් කරන ලදි. ඒ අනුව සංවර්ධන නිලධාරීන් සඳහා පරිගණක පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදි.

### 10.3.තොරතුරු තාක්ෂණය හා බැඳුණු උපකරණවල දෝෂ නිරාකරණය කිරීම.

උතුරු මැද පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුළ ජාලගත කර ඇති සියළුම පරිගණක හා උපාංගවල හා පරිගණක හරහා අන්තර්ජාල භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ගැටළු නිරාකරණය කිරීමත් පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ ඇති අන්තර්ජාලය හා දුරකථන පද්ධතිය සම්බන්ධ Server Room එක සහ Switching Rooms පහක ක්‍රියාකාරීත්වය රැකගැනීමත්, ජාලගත කිරීම මඟින් පරිගණක සඳහා Share folder පහසුකම එක් එක් ආයතනය සඳහා වෙන වෙනම සපයා දීමත් මෙම පහසුකම සහිත පරිගණක සඳහා Virus guard server ජාලය හරහා ලබා දීමත් සිදු කරන ලදි.

පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ට බාධාවකින් තොරව තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම හා සහාය ලබා දීම ඇතුළු කාර්යයන් ඉටු කරමින් පළාත් තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යභාරය ඉටු කරමින් අදාල කාර්යසාධනය වෙත ළඟාවී ඇත. පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ ජාලගත කරන ලද 450කට අධික පරිගණකවල ක්‍රියාකාරිත්වය යාවත්කාලීනව පවත්වා ගැනීම, පරිගණක සියල්ලේම නඩත්තු කටයුතු සියල්ලක්ම තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් නිරාකරණය කර දෙමින් සේවා පහසුකම් ලබා දෙන ලදී.

පරිපාලන ගොඩනැගිල්ලේ පොදු ඇමතුම් පද්ධතියේ සහ දුරකථනවල සියලු දෝෂ නිරාකරණය කිරීම, පරිගණක භාවිතා කරන්නන්ට අවශ්‍ය මෘදුකාංග පරිගණකයට සපයා දෙමින් ඔවුන්ට සහය වීම (Ms office, Internet Browsers, Photoshop, etc..) හා ප්‍රධාන අමාත්‍යාංශයේ මුද්‍රණ යන්ත්‍රවල Toner සඳහා වැය වන අධික වියදම අඩු කර ගැනීම සඳහා එම අමාත්‍යාංශයේ ආයතන, ගිණුම්, සැලසුම් යන අංශ සියල්ලම මුද්‍රණ යන්ත්‍ර තුනක් වෙත ජාලගත කිරීම වැනි කටයුතුද මෙම ඒකකය මගින් සිදු කරන ලදී. පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ පැය 24 පුරාම ක්‍රියාකාරිත්වයෙන් යුත් කැමරා 16 ක් පවතින CCTV කැමරා පද්ධතිය සම්බන්ධ දෝෂ නිරාකරණය කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු සිදු කර ඇත. එසේම ඇඟිලි සලකුණු යන්ත්‍ර මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වා ගැනීම හා මාසිකව ඇඟිලි සලකුණු වාර්තා ලබාදීම සම්බන්ධයෙන් කටයුතු සිදු කර ඇත.

## 11. පළාත් සංවර්ධනය උදෙසා GIS භාවිතය .

පළාතේ සංවර්ධන සැලසුම්කරණය සඳහා භාවිතයට ගත හැකි වන අයුරින් විවිධ ක්ෂේත්‍ර සඳහා GIS භාවිතයෙන් සිතියමක් ලබා දීමට භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් හැකි විය. පළාත් පාලන ආයතනවල වරිපණම් බල ප්‍රදේශ සිතියම්ගත කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල සේවය කරන තාක්ෂණික නිලධාරීන් සහ තාක්ෂණ සහායක නිලධාරීන්ට සිතියම් සකස් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන ලදි.

උතුරු මැද පළාත අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකින් සමන්විත වේ. කෘෂිකාර්මික ආර්ථිකය ප්‍රධාන ආදායම් මාර්ගය වන මෙම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක්, මහ නගර සභා දෙකක් ඇතුළු පළාත් පාලන ආයතන 27 ක් ඇත. එමෙන්ම ග්‍රාම නිලධාරී තුලාන 988 ක් ඇත. පළාතේ වර්තමාන ජනගහනය 1,400,000 ක් වන අතර ජනගහන ඝනත්වය 130 ක් පමණ වේ. විශාල වශයෙන් විදේශීය හා දේශීය වශයෙන් සංචාරකයින් පැමිණෙන කලාපයකි.

උතුරු මැද පළාතේ මෙම මූලික කරුණු පැහැදිළිව හඳුනා ගැනීම සඳහා සිතියමක් ලබා දීමට භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් හැකි විය. GIS සමඟ බැඳී සිටිමින් මහජනතාවට හිතකර පරිසරයක් ඇති කිරීම හා මෙම පළාත සඳහා තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා අදාල කළමණාකරණ තීරණ ගැනීම සඳහා විශ්වාසනීය සහ යාවත්කාලීන දත්ත සහ තොරතුරු ලබා ගැනීම සඳහා කළමනාකරුවන්ට ප්‍රයෝජනවත් වන දත්ත හා තොරතුරු ලබා දීම සිදු කරන ලදි. අදහස් අර්ථ නිරූපණය කිරීම සඳහා සිතියම් වඩා නිවැරදිව භාවිත කිරීම මෙහිදී සිදු කරන ලදි.

විවිධ භූගෝලීය විෂමතාවන්ගෙන් යුත් මෙම පළාතේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කරන පහසුම කාරකය වන සිතියම් ඇඳීම සම්බන්ධව මෙම පළාතේ නිපුණතාවයෙන් යුත් පිරිසක් මෙම වර්ෂය වන විට බිහි කිරීමට මෙම ඒකකයට හැකිවිය.

ඒ අනුව උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතනවල සේවය කරන තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහායකයින් 38 දෙනෙකු සඳහාත්, ග්‍රාම ශක්ති විෂය සම්බන්ධීකරණ සංවර්ධන නිලධාරීන් 28 දෙනෙකු සඳහා දින පහක පුහුණු වැඩසටහනක්ද, ග්‍රාම ශක්ති විෂය සම්බන්ධ තුලාන භාර සංවර්ධන නිලධාරීන් 64 දෙනෙකු සඳහා කණ්ඩායම් දෙකක් ලෙස එක් දින පුහුණු වැඩමුළු දෙකක්ද, පළාත් පාලන ආයතනවල තාක්ෂණ නිලධාරීන් වරිපනම් බලප්‍රදේශ සිතියම්ගත කිරීමේ එක් දින ප්‍රායෝගික වැඩමුළුවක්ද, ප්‍රාදේශීය ලේකම්කාර්යාලවල සහකාර අධ්‍යක්ෂවරු, අමාත්‍යාංශවල සහකාර ලේකම්වරු සහ සංවර්ධන නිලධාරීන් ඇතුළත් 39 දෙනෙකු සඳහා GPS භාවිතයෙන් සිතියම් සකස් කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ එක් දින ප්‍රායෝගික පුහුණු වැඩමුළුව ආදී වශයෙන් වැඩමුළු හයක් සංවිධානය කර සම්පත්දායකත්වය සපයමින් පවත්වන ලදි.

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ නිලධාරීන් 12 දෙනෙකු සඳහා භූගෝලීය තොරතුරු පද්ධති පුහුණුව සඳහා සම්පත්දායකත්වය ලබාදීම සහ පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය විසින් සංවිධානය කරන ලද GPS භාවිතයෙන් සිතියම් සකස් කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ දින පහක ප්‍රායෝගික පුහුණු වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය සපයන ලදි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන භූගෝලීය තොරතුරු පද්ධති GIS පිළිබඳ කෙටිකාලීන මූලික පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරීන් යොමු කිරීම සිදු කරන ලද අතර නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවැත්වෙන භූගෝලීය තොරතුරු පද්ධති සහ දුරස්ථ සංවේදන පිළිබඳ කෙටිකාලීන උසස් පාඨමාලාවටද යොමු කරන ලදි.

භූගෝලීය තොරතුරු පද්ධති ඒකකය සඳහා උතුරු මැද පළාතට අදාල 1:10000 භූවිද්‍යාත්මක දත්ත පද්ධතිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම මෙම වර්ෂයේදී සිදු කරන ලදි.

## භූගෝලීය තොරතුරු පද්ධතිය මගින් සකස් කරන ලද සිතියම්

- උතුරු මැද පළාතේ වන ආවරණ සිතියම සකස් කිරීම.
- උතුරු මැද පළාතේ කුඹුරු සහ ජල පද්ධතිවල විසිරීම සිතියම් ගත කිරීම.
- උතුරු මැද පළාතේ ජනගහන සිතියම සකස් කිරීම.
- වන අලි තර්ජිත ගම්මාන සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිවලට අදාළ විශේෂ අවස්ථා සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිවලට අදාළ විශේෂ අවස්ථා සිතියම්ගත කිරීම.
- උතුරු මැද පළාතේ මාර්ග පද්ධතිය සිතියම්ගත කිරීම.

## භූගෝලීය තොරතුරු පද්ධති හා සංඛ්‍යාලේඛන අංශය මගින් සිදු කරන ලද වෙනත් සේවාවන්

- පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල සේවය කරන තාක්ෂණික නිලධාරීන් සහ තාක්ෂණ සහායක නිලධාරීන්ට සිතියම් සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා තෝරාගත් ක්ෂේත්‍රයකට ගොස් පුහුණුව ලබාදීමෙන් අනතුරුව මේ වන විට පළාත් පාලන ආයතනවලට අදාල වරිපනම් බල ප්‍රදේශ සිතියම් සකස් කර ඇත.
- විශේෂිත ව්‍යාපෘතීන් සඳහා සිතියම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ක්ෂේත්‍රයට ගොස් තොරතුරු එක් රැස් කිරීම සිදු කරන ලදි.

- උතුරු මැද පළාත සඳහා මූලික සිතියම් සකස් කිරීම අවශ්‍ය පරිදි සිදු කිරීම.උදාහරණ: පළාත් සිතියම, දිස්ත්‍රික් සිතියම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සිතියම, ග්‍රාම නිලධාරී තුලාන සිතියම ආදී සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී අවශ්‍යවන විශ්ලේෂණාත්මක සිතියම් සකස් කිරීම හා සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය කරන මාර්ග සිතියම් සකස් කිරීම.

- පළාතේ පවතින විවිධ ගැටළු සම්බන්ධව සමීක්ෂණ පැවැත්වීමේදී අවශ්‍ය වන සිතියම් සකස් කිරීම

  උදාහරණ: වකුගඩු රෝගී පවුල් පිළිබඳ තොරතුරු, ගංවතුර තර්ජනයට ලක්වන ප්‍රදේශ හඳුනා ගැනීමේ සිතියම, වල් අලි තර්ජනය පිළිබඳ සිතියම් සකස් කිරීම

- පළාතේ සුවිශේෂී තොරතුරු ඇතුළත් සිතියම් සකස් කිරීම.
  උදාහරණ: සංචාරක සිතියම, පාසල්, රෝහල්, වාරිමාර්ග, මාර්ග

- හඳුනාගත් වෙනත් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය සිතියම් සකස් කිරීම සහ සංඛ්‍යාලේඛන තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ නිබන්ධන සැකසීම සිදු කිරීම.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

ජාතික ප්‍රතිපත්තීන්ට සහ නියාමනයන්ට සමගාමීව ජාතික සංවර්ධනයට සෘජුවම දායක වෙමින් 2019 වර්ෂයේදීද පළාත් සභා සංවර්ධන කටයුවලදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව සුවිශාල වගකීමක් සහ කාර්යභාරයක් ඉටුකරන ලදී. මෙහිදි පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද ක්‍රමානුකූල වැඩපිළිවෙලක් තුළ ක්‍රියාත්මක වූ මෙහෙයුම් සහ ඇගයුම් ක්‍රියාවලිය තුළින් පළාතේ සංවර්ධන කාර්යය වඩාත් ක්‍රමානුකූල කිරීම සඳහා දායකත්වය සපයන ලදී. 2019 ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කරන ලදී.

පළාතේ සංවර්ධන, පරිපාලන, සමාජ සුභසාධන, සමාජ ආරක්ෂණ, ආදායම් උත්පාදන, ව්‍යවසායකත්ව සහ ජීවනෝපාය සංවර්ධන ආදී ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙහිදී විනිවිදභාවය, ඵලදායිතාව සහ ආයෝජනයන්ට සාපේක්ෂ ප්‍රතිලාභ ඉලක්කගත පුද්ගලයන්ට ලැබීම පිළිබඳවද සංවර්ධන ව්‍යාපෘතිවල ගුණාත්මක අගය සහ යෙදවුම් පිළිබඳවද විවිධ මෙහෙයුම් කටයුතු සිදු කෙරිණි.

ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ අනුව ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති 100% නිරීක්ෂණ පදනම මත පරීක්ෂා කිරීමටත් එහි ප්‍රගතිය මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ඉදිරිපත් කිරීමටත් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇත. 2019 වර්ෂය තුළදි පළාත් සංවර්ධන සැලසුම ක්‍රියාවට නංවමින් පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය වූ අතර විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පළාතේ අත්‍යාවශ්‍ය අවශ්‍යතා සැලකිය යුතු ප්‍රමාණයකින් සම්පූර්ණ කිරීමටත් හැකි විය. එසේම ප්‍රතිඵල පාදක සංවර්ධන සැලස්ම සකස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කළ අතර පළාත තුළ විදේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති නියාමනය කිරීම ද සිදු විය.

# 5.2. පළාත් භාණ්ඩාගාරය

**ආයතනය පිළිබඳ හැඳින්වීම**

ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක් යන දැක්ම කරා ළඟා වීම උදෙසා රාජ්‍ය මූල්‍ය පිළිබඳ තීරණ ගැනීම පිණිස මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන පළාත් සභා ආදායම්, වියදම්, අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් ඇතුළු මූල්‍ය කටයුතු වාර්තා කිරීමේ මධ්‍යගත ආයතනය වශයෙන් " පළාත් භාණ්ඩාගාරය" ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශයක් යටතට නොවැටෙන දෙපාර්තමේන්තුවක් වන මෙම ආයතනයේ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා පළාත් භාණ්ඩාගාරයේ ද ලේකම්වරයා වන අතර, මෙහෙයුම් කටයුතු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) මගින් සිදුවේ. පළාත් භාණ්ඩාගාරය යටතේ පහත සඳහන් දෙපාර්තමේන්තු හා අංශ ක්‍රියාත්මක වේ. අයවැය දෙපාර්තමේන්තුව , මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව , ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව සහ පරිපාලන හා ගිණුම් අංශය වශයෙනි.

## අයවැය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනයේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ පළාත් සභාවලට පැවරී ඇති විෂයයන් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමේ අරමුණින් අයවැය ඇස්තමේන්තු පිළියෙල කරන ලදි. පළාත් මූල්‍ය රීති 26.3 අනුව 2019 වර්ෂයේ මුල් මාස හතර සඳහා අතුරු සම්මත ගිණුම මගින් ප්‍රතිපාදන ලබා දීමද ඉතිරි මාස සඳහා විසර්ජන ප්‍රඥප්තිය මගින් ප්‍රතිපාදන වෙන් කිරීමද සිදු කරන ලදි.

එසේම තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය අනුව පළාත් සංවර්ධනයට අදාළ තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි හඳුනාගෙන ඇති අතර එම අරමුණු වසර 2030 වනවිට ළඟා කර ගැනීම සඳහා 2019 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී අවධානය යොමු කර ඇත.

| | | |
|---|---|---|
| SDG 01 | - | සියළුම ආකාරයේ දරිද්‍රතාව තුරන් කිරීම. |
| SDG 02 | - | සියළුම ආකාරයේ කුසගින්න හා මන්දපෝෂණය තුරන් කිරීම. |
| SDG 03 | - | ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය, මැලේරියාව හා අනෙකුත් වසංගත රෝග තුරන්කරමින් සෞඛ්‍ය හා යහපැවැත්ම සහතික කිරීම. |
| SDG 04 | - | සියළුම ගැහැණු හා පිරිමි ළමුන් නිදහස්, ප්‍රාථමික හා ද්විතීයික පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කරන බවට තහවුරු කිරීම. |
| SDG 06 | - | සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අදාළ විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම. |
| SDG 07 | - | දැරිය හැකි විදුලිය සඳහා විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම. |
| SDG 08 | - | අවම ආදායම් කාණ්ඩවලට අයත් ආදායම් උපයන්නන් බලගැන්වීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය හා ජනවර්ගය,ස්ත්‍රී පුරුෂ භාවය වැනි කරුණු නොසලකා සමාජයේ සියළු දෙනාම ඇතුළත් වන පරිදි ආදායම් ප්‍රවර්ධනය සහතික කරලීම. |
| SDG 15 | - | වනාන්තර, තෙත් බිම්, වියළි ඉඩම් සහ කඳු යන භෞමික පරිසර පද්ධතීන් කඩිනමින් සංරක්ෂණය හා ස්ථාපනය කිරීම. |
| SDG 16 | - | සියල්ලන් සඳහා යුක්තිය හිමිකර ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම, |

## මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව

පළාත් සභා මූල්‍ය රීති අධ්‍යනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතනවල මූල්‍ය කටයුතු විධිමත් කිරීමට ප්‍රඥප්ති සකස් කිරීම හා භාණ්ඩාගාර චක්‍රලේඛ නිකුත් කිරීම වැනි කාර්යන් ප්‍රමුඛ කරගත් මුදල් දෙපාර්තමේන්තුව ද ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිශෝධනය, ආදායම් ගිණුම් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම වැනි කාර්යන් ප්‍රධාන කරගත් ආදායම් දෙපාර්තමේන්තුව ද මේ යටතේ ක්‍රියාත්මක වේ.

## ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තියට අනුව පිහිටුවා ඇති පළාත් සභා අරමුදලට, පළාත් සභාව වෙත බලය පැවරි ඇති ප්‍රභවයන්ගෙන් එකතුවන සියලුම ආදායම්, මධ්‍යම රජය විසින් එකතුකර ප්‍රේෂණය කරනු ලබන බදු ආදායම් ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පළාත් සභාවට ලබා දෙන ලද සියලුම ප්‍රදාන, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් පළාත් සභාවට දෙන ලද සියලුම ණය මුදල් සහ පළාත් සභාවට ලැබෙන සියලු ලැබීම් සහ පළාත් සභා ආයතන වෙත අක්මුදල් නිකුත් කිරීම් සහ වෙනත් ගෙවීම් කළමනාකරණය කිරීම සිදු කරයි.

එමෙන්ම, පළාත් සභා අරමුදල සම්බන්ධව අවශ්‍ය නියමිත ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම, පළාත තුළ විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියන් පවත්වාගෙන යාමට අවශ්‍ය මග පෙන්වීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත වරින් වර චක්‍රලේඛ නිකුත් කිරීම, උපදෙස් හා නියෝග නිකුත් කිරිම, වියදම් හා ආදායම් පිළිබඳ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම ආදී ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබයි. එමෙන්ම, 2019 වර්ෂය සඳහා සම්මත කරන ලද විසර්ජන ප්‍රඥප්තිය මගින් වෙන්කර දෙනු ලැබූ ප්‍රතිපාදන සහ පරිපූරක ප්‍රතිපාදනවලට අනුකූලව භාණ්ඩාගාරය වෙත වාර්තා කරනු ලැබූ ආදායම් සහ වියදම් ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. ඒ අනුව 2019 වර්ෂයේදී මෙම කාර්යභාර්ය ඉටු කිරීමේදී පළාත් භාණ්ඩාගාර මූල්‍ය කළමණාකරණ අධීක්ෂණ විෂය පථයට වැය ශීර්ෂ 30 ක්ද, පළාත් සභා නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 34ක්ද, වාණිජ අත්තිකාරම් ගිණුම් 07ක්ද, ඇතුළත් වන අතර පළාත් පාලන ආයතන 27ක්ද, ප්‍රඥප්ති මගින් පිහිටුවනු ලැබූ ආයතන 06ක්ද, හදිසි අවස්ථා අරමුදල් ගිණුම ද ඇතුලත්ව අරමුදල් ගිණුම් 06ක මූල්‍ය අධීක්ෂණ කටයුතු මෙහෙයවීම හා ඒ සඳහා ගිණුම්මය උපදෙස් ලබාදීම සිදු කරන ලදී.

## දැක්ම

“ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්”

## මෙහෙවර

“සංවර්ධිත පළාතක් බිහි කිරීම සඳහා පළාතේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශනය, පළාතේ ගිණුම් පවත්වාගෙන යාම සහ ප්‍රසිද්ධ කිරීම, මූල්‍ය කළමනාකරණ තොරතුරු සැපයීම හා සියළු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් යුක්තව ගිණුම් ක්‍රම සංවර්ධනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

- දීර්ඝකාලීන සංවර්ධන සැලසුම් හා ව්‍යපෘති යෝජනා පදනම් කරගෙන සම්පත් වෙන් කිරීම.
- ගිණුම්කරණ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන යෙදවුම් භාවිතය ඉහළ නැංවීම.
- මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම.
- වත්කම් කළමනාකරණය ශක්තිමත් කිරීම.
- ඉහත කාර්යන් ශක්තිමත්ව විධි විධාන ක්‍රියාත්මක කිරිම තුළින් දැක්ම ළඟාකර ගැනිම.
- පළාත් සභා හා පළාත් පාලන ගිණුම් ඒකකවල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරිම.
- මූල්‍ය කළමනාකරණය සඳහා වගවීම හා විනිවිදභාවය තහවුරු කිරිම කාලීන හා ගුණාත්මක තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- මනා සම්බන්ධීකරණයක් තුළින් පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් කරනු ලබන ආයෝජනයන්හීදි එකම කාර්යය සඳහා දෙඅංශයෙන්ම සිදුවන ආයෝජන වැළැක්වීම.
- ගුණාත්මක හා යාවත්කාලීන වාර්තාකරණ ක්‍රමයක් ඇති කිරීම.
- වියදම් ප්‍රමුඛතා හා අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධ අඛණ්ඩ අවධානය.
- නිමැවුම් පදනම් කරගත් ඇගයීමේ ක්‍රමයක් පිහිටුවීම.
- ගිණුම් ඒකකවල පරිගණකගත ගිණුම්කරණ මෘදුකාංග පද්ධති සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය දීම.
- අයවැය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය දීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් ආදායම් අයවැය ප්‍රතිපත්ති සහ ගිණුම් ප්‍රතිපත්ති සම්පාදනය හා සංවර්ධනය.
- පළාත් අරමුදල, අවිනිශ්චිත අවස්ථා අරමුදල සහ වෙනත් අරමුදල් පවත්වාගෙන යාම සහ සංවර්ධනය.
- මධ්‍යගත මුල්‍ය පාලනය, මුල්‍ය උපදෙස් ලබා දීම සහ මුල්‍ය කළමනාකරණ තොරතුරු ලබා දීම.
- පළාත් ආදායම් රැස් කිරීමේ කටයුතු නියාමනය සහ සංවර්ධනය.
- පළාතේ ක්‍රමවත් ගිණුම් ක්‍රමයක් පවත්වා ගැනීම සහ පළාතේ ගිණුම් ප්‍රසිද්ධ කිරීම.
- ගිණුම් ක්‍රම සංවර්ධනය.
- ප්‍රසම්පාදන කටයුතු නියාමනය හා සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

01. මුල්‍ය කළමනාකරණය

02. වියදම් පාලනය

03. වත්කම් කළමනාකරණය.

04. තොරතුරු සන්නිවේදනය භාවිතයෙන් ගිණුම්කරණ කටයුතු වැඩිදියුණු කිරීම

## අපගේ සාරධර්ම

| | | |
|---|---|---|
| **නායකත්වය** | - | සමාජීය හා වෘත්තීය වගකීම් සපුරාලමින් පළාත තුළ මුල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමේ නායකයා ලෙස කටයුතු කිරීම. |
| **යහපාලනය** | - | තීරණ ගැනීමේදී අරමුණුගතභාවය,වගවීම,විනිවිදභාවය සාධාරණ සැලකිල්ල හා ප්‍රමුඛ පාලනය පිළිබිමු කිරීම. |
| **ගුණාත්මකභාවය** | - | කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම තුළින් ගුණාත්මක සේවාවන් සැපයීම. |
| **විශේෂඥතාව** | - | පරිචයට අදාල ශිල්ප ක්‍රම, මුල්‍ය න්‍යායන් හා නවීන ගිණුම්කරණ ක්‍රමවේදයන් භාවිතය පිළිබඳ විශේෂ දැනුම. |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 32 |
| 2 | සේවයේ නියුතු | 27 |
| 3 | පුරප්පාඩු | 05 |

## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 21.15 | 21.08 | 0.07 | 99.67 |
| ගමන් වියදම් | 0.53 | 0.39 | 0.14 | 73.58 |
| සැපයීම් | 5.08 | 3.10 | 1.98 | 60.90 |
| නඩත්තු වියදම් | 1.53 | 1.05 | 0.47 | 68.62 |
| ගිවිසුම්ගත සේවා | 12.55 | 9.71 | 2.84 | 77.30 |
| මාරු කිරීම් | 415.13 | 268.92 | 146.2 | 64.78 |
| **එකතුව** | **455.98** | **304.27** | **151.74** | **66.72** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වෙනත් මූලධන වත්කම් අත්පත් කරගැනිම I .නිල නිවාස ඉදිකිරිම | 12.00 | 0.00 | 12.00 | - |
| II.ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.00 | 0.53 | 0.46 | 53.97 |
| 4.වෙනත් මූලධන වත්කම් - ගිණුම්ක්‍රම සංවර්ධනය හා නව පරිඝනක මෘදුකාංග හඳුන්වා දීම | 1.00 | 0.41 | 0.59 | 41.25 |
| **එකතුව** | **14.00** | **0.95** | **13.05** | **6.8** |

## ආදායම් ඉපයිම - 2019

| ශිර්ෂය | ඉලක්කය (රු.මි) | ආදායම (රු.මි) | එකතු කිරිමේ % |
|---|---|---|---|
| 10.02.05.04 මෝටර් රථ ලියා පදිංචි ගාස්තු | 140.00 | 92.55 | 66.10 |
| 10.02.07.00 මුද්දර ආදායම | 550.00 | 469.93 | 85.44 |
| 10.02.12.00 ජාතිය ගොඩ නැඟිමේ බද්ද | 2500.00 | 1625.88 | 65.03 |
| 10.03.07.09 වෙනත් බලපත්‍ර ගාස්තු | 0.05 | 0.00065 | 1.3 |
| 20.02.01.01 නිවාස කුලී | 23.00 | 26.75 | 116.30 |
| 20.02.02.02 රජයේ නිලධාරීන්ගේ ණය සහ අත්තිකාරම් පොළී | 63.00 | 73.45 | 116.58 |
| 20.02.02.03 ආයෝජන පොළී | 77.00 | 71.35 | 92.68 |
| 20.03.02.99 විවිධ ලැබීම් | 107.00 | 93.96 | 87.81 |
| 20.06.02.00 භාවිතයට නොගන්නා ප්‍රාග්ධන වත්කම් විකිණීම | 11.55 | 2.87 | 24.85 |
| **එකතුව** | **3471.60** | **2456.75** | **70.77** |

සටහන :-

2019 දෙසැම්බර් මස 01 දින සිට රජයේ ප්‍රතිපත්තිමය තීරණය මත ජාතික ගොඩනැගිමේ බද්ද අහෝසි කිරිම නිසා ආදායම අඩුවිම සිදු වී ඇත.

## පළාතේ සංවර්ධන කාර්යය සාර්ථකකර ගැනීම සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් සැපයෙන විවිධ මැදිහත්වීම්

- උතුරු මැද පළාත " ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්" යන දැක්ම කරා ගමන් කිරීමේදී, දායකත්වය දක්වන මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් කටයුතු කිරීමට වාර්ෂිකව අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කරමින්, රාජ්‍ය භාණ්ඩාගාරයෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.
- ලබා ගන්නා මූල්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනුබද්ධිත ආයතන වෙත නිදහස් කිරීම තුළින් එකිනෙක අමාත්‍යාංශ වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.
- පළාතේ සංවර්ධනය උදෙසා විදේශයන්ගෙන් ලැබෙන ණය හා ආධාර උපයෝගී කරගනිමින් ඉටු කරනු ලබන විදේශ ව්‍යාපෘති ඉටුකිරීමේදී මැදිහත්කරුවෙකු වශයෙන් දායකත්වය ලබා දී ප්‍රශස්ත මූල්‍ය පාලනයක් සහ පසු විපරම් කිරීම මඟින් සංවර්ධයට දායකත්වයක් ලබා දීම.
- සංවර්ධන කටයුතු ක්‍රමවත්ව විනිවිදභාවයකින් යුක්තව ඉටු කිරීම උදෙසා අයවැය ප්‍රතිපත්ති සකස් කිරීම, නව ගිණුම් පාලන ක්‍රම හඳුන්වා දීම, ඒ වෙනුවෙන් කලින් කලට චක්‍රලේඛ නිකුත් කිරීම.මෙම කාර්යයන් කරගෙන යාමේදී මූල්‍ය පාලනය හා විනය ඇති කිරීම උදෙසා චක්‍රලේඛ අණපනත් නිකුත් කිරීම, විවිධ රැස්වීම් පවත්වමින් උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම හා අදාළ ක්ෂේත්‍රවල කටයුතු කරන නිලධාරීන් සඳහා පුහුණුවීම් හා වැඩමුළු පැවැත්වීම සිදු කරයි.
- වත්කම් කළමනාකරණ මෘදුකාංගය හඳුන්වා දෙමින්, පළාත පුරා විසිරී ඇති පළාත් රාජ්‍ය සේවයට අනුබද්ධිත ආයතනවල ඇති සියළුම ස්ථාවර වත්කම්, ඉඩම් හා ගොඩනැඟිලි, මහා මාර්ග, වැව් ආදී තොරතුරු එක් ස්ථානයකින් ලබා ගැනීමට හැකි වන පරිදි සකස් කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව හා කඩිනම්ව ඉටු කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම.
- උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනුබද්ධිත ආයතන කාර්යයන් ඉටු කිරීමේදී සිදු වන දෝෂයන් සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවෙන් පෙන්වා දෙන වැරදි සහ අඩුපාඩු නිවැරදි හා අවම කර ගැනීමට උපදෙස් ලබා දීම.
- විවිධ අරමුදල් පවත්වාගෙන යමින් අවශ්‍ය අවස්ථා වලදී ඒවා නිකුත් කිරීම.

## කාර්ය සාධන දර්ශක ළඟා කර ගැනීමේ ප්‍රගතිය


| ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ළඟා කර ගැනීමේ ප්‍රගතිය ( 2019) |
|---|---|---|
| **අයවැය දෙපාර්තමේන්තුව** | | |
| පළාත තුළ සියලුම ආයතනයන්හි ක්‍රමවත් අයවැය පාලනයක් සඳහා සහය වීම. | 10% කින් ප්‍රතිපාදන මාරු කිරීම් අවම කිරීම, ප්‍රශස්ථ ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇති කිරීම | 80 % කින් පමණ අඩුකර ගැනීමට හැකි වී ඇත |
| සියළු ආයතන සම්බන්ධීකරණයක් ඇති කිරීම. | නිවැරදි කාර්ය මණ්ඩල දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම. | 100% නිවැරදි කර ගැනීමට හැකි වී ඇත |
| **ආදායම් හා මුදල් දෙපාර්තමේන්තුව** | | |
| මනා මූල්‍ය පාලනයක් තුළින් මුදල් ප්‍රකාශය මඟින් වෙන් කරනු ලබන මුදල් උතුරු මැද පළාතේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා යෙදවෙන බවට වග බලා ගැනීම. | ආයතනවල විගණන විමසුම් ප්‍රමාණය 20% කින් අවම කිරීම. | 5% කින් පමණ අයකර ගැනීම |
| | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අභියාචනා දුක්ගැනිවිලි 40% කින් අවම කිරීම. | 90% ක් අඩු කිරීමට හැකි වී ඇත. |
| | පළාත් සභා සතු සියළු වත්කම් ලේඛන ගත කිරීම. | 60% ක් පමණ වත්කම් ලේඛණගත කර ඇත. |
| | පළාත් සභාආයතන වලින් 60% ඊළඟ වර්ෂයේ මාර්තු 31 වන විට භාණ්ඩ සමීක්ෂණ නිම කිරීම. | 50%ක් පමණ අවසන් වීඇත. |


| ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ළඟා කර ගැනීමේ ප්‍රගතිය( 2019) |
|---|---|---|
| පළාත් සභාවට ලැබිය යුතු ආදායම් පිළිබඳ මනා පාලනයක් තබා ගනිමින් සභාවට ලැබිය යුතු සියළු ආදායම් නිසි ලෙස එක් රැස් කර ගැනිම. | සියළු ආදායම් ශීර්ෂවල ඇස්තමේන්තුගත ආදායමෙන් 80%ක මට්ටමක්වත් අවම ලෙස එකතුකර ගැනීම. | 70% ක් පමණ මට්ටමකට ආදායම් එකතුකර ගැනීමට හැකි වී ඇත. |
| | ආදායම් ගිණුම් හා සම්බන්ධ විගණන විමසුම් 20% කින් අඩුකර ගැනීම. | 20% ක් පමණ අයකර ගැනීමට හැකි වී ඇත |
| | පළාත් සභාව වෙතින් ප්‍රාදේශිය සභා වෙත ප්‍රේශණය වන ආදායම් ඉල්ලිම් ලැබී මසක් ඇතුළත ඔවුන් වෙත ලබා දීම. | නියමිත දිනට ලබා දී ඇත. |
| **ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව** | | |
| උතුරු මැද පළාත් සභාව සඳහා තීරණ ගැනීමට අවශ්‍ය පාර්ශවයන් වෙත නිවැරදි සහ සත්‍ය තොරතුරු ලබා දීම. | පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික ගිණුම් සියල්ල නියමිත දිනට පෙර ඉදිරිපත් කිරිම. | 100% නියමිත දිනට ලබා දී ඇත. |
| | ගිණුම්වල නොසැසදීම්, ගිණුම් දෝෂ 10% දක්වා අවම කිරිම. | 90% ක මට්ටමකට අවම කරගෙන ඇත |
| **පරිපාලන හා ගිණුම් අංශය** | | |
| පළාත් භාණ්ඩාගාරයේ මූල්‍ය හා ආයතනික කටයුතු මනා කළමනාකාරිත්වයකින් යුක්තව පවත්වාගෙන යාම. | විගණන විමසුම් 30%කින් අඩු කිරිම. | 20% කින් පමණ විගණන විමසුම් අඩු කරගෙන ඇත. |
| | අයවැය ඇස්තමේන්තු කලට වේලාවට පිළියෙල කිරිම. | නියමිත දිනට පිළියෙල කර ඉදිරිපත් කරන ලදී |
| | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරිම. | නියමිත දිනට පිළියෙල කර ඉදිරිපත් කරන ලදී |

## 2019 වර්ෂයේ පළාතේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම හා ඒ වෙනුවෙන් වැයවන වියදම් වෙනුවෙන් සකසන ලද අයවැය ඇස්තමේන්තුවේ සාරාංශය

| | ලැබීම් | මුදල |
|---|---|---|
| 1 | රජයෙන් ලැබුණු ප්‍රදාන | |
| | I සාමූහික ප්‍රදාන | 16300.00 |
| | II උපමාන පාදක ප්‍රදාන | 482.00 |
| | III පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 2769.00 |
| | IV විදේශ සහයෝගිතා ව්‍යාපෘති | |
| | ලෝක බැංකු හා ඕස්ට්‍රේලියානු ආධාර - අධ්‍යාපන | - |
| | ලෝක බැංකු ආධාර - සෞඛ්‍ය | 150.00 |
| | ආසියානු සංවර්ධන බැංකු ආධාර - මාර්ග | |
| | ලෝක බැංකු ආධාර - අධ්‍යාපන නවීකරණ | 150.00 |
| | V රේඛීය අමාත්‍යාංශ ලැබීම් හා වෙනත් ලැබීම් | 100.00 |
| 2 | ඇස්තමේන්තුගත ආදායම රැස් කිරීම | 4731.00 |
| 3 | විවිධ අත්තිකාරම් ගිණුම් යටතේ අපේක්ෂිත ලැබීම් | 0.54 |
| | එකතුව | 25227.00 |
| | වියදම් | |
| 1 | පුනරාවර්තන වියදම් | 20377.00 |
| 2 | මූලධන වියදම් | 4068.00 |
| 3 | අත්තිකාරම් ගිණුම් යටතේ වියදම් | 808.70 |
| | එකතුව | **25253.70** |

## 2019 වර්ෂයේ උතුරු මැද පළාතේ මූල්‍ය විශ්ලේෂණය-2019 වර්ෂයේ මුදල් ලැබීම් මූලාශ්‍ර



**අරමුණු කරා යාමේදී ඇතිවන ගැටළු හා අභියෝග විනය හා මූල්‍ය පාලනය උදෙසා 2019 වර්ෂයේදී නිකුත් කරන ලද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ නාමාවලිය**

| අ/අ | චක්‍රලේඛ අංකය | අන්තර්ගතය |
|---|---|---|
| 01 | 2019/01 | වියදම් සඳහා බලාධිකාරය පැවරීම - 2019 |
| 02 | 2019/02 | 2019 වර්ෂය තුළදී වැටුප් හා වැටුප් අත්තිකාරම් ගෙවීම |
| 03 | 2019/03 | වාහන අළුත්වැඩියා කිරීමට පෙර හා පසු පරීක්ෂා කිරීම සඳහා වන ගෙවීම් |
| 04 | 2019/04 | ගිණුම් ආරම්භ කිරීම හා වියදම් ගිණුම්ගත කිරීම - 2019 |
| 05 | 2019/05 | අග්‍රිම නිදහස් කිරීම හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම - 2019 |
| 06 | 2019/06 | ගිණුම් ආරම්භ කිරීම හා වියදම් ගිණුම්ගත කිරීම - 2019 |
| 07 | 2019/07 | පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ රීති අංක 97.2,97.5,97.6 සඳහා සංශෝධන ඇතුළත් කිරීම |
| 08 | 2019/08 | අත්තිකාරම් ගිණුම - 2018 |
| 09 | 2019/09 | ආදායම් හා වියදම් ඇස්තමේන්තු - 2020 |
| 10 | 2019/10 | වියදම් සඳහා බලාධිකාරය පැවරීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය - 2019 |
| 11 | 2019/11 | රාජ්‍ය වියදම් දැරීමේ විචක්ෂණශීලීභාවය වර්ධනය කිරීම - 2019 |
| 12 | 2019/12 | 2019 වර්ෂයේ ඉතිරි කාල සීමාව තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම |
| 13 | 2019/13 | ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් වෙතින් දේශිය අරමුදල් යටතේ රු.මිලියන 50 දක්වා වන වැඩ ප්‍රසම්පාදනය කර ගැනීම |
| 14 | 2019/13(II) | රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ අයවිය යුතු ණය |
| 15 | 2019/14 | 2019 වර්ෂයේ භාණ්ඩ සහ වත්කම් සමීක්ෂණය |
| 16 | 2019/15 | 2019 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම |
| 17 | 2019/16 | රජයේ ආයතන සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීම |
| 18 | 2019/17 | රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම |
| 19 | 2019/18 | මූල්‍ය ප්‍රකාශන - 2019 |
| 20 | 2019/19 | ගිණුම් ආරම්භ කිරීම හා වියදම් ගිණුම් ගත කිරීම - 2020 |
| 21 | 2019/20 | පළාත් සභාවේ ව්‍යාවස්ථාපිත ආයතනවල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම - 2020 |
| 22 | 2019/21 | අත්තිකාරම් ගිණුම - 2019 |
| 23 | 2019/19(I) | ගිණුම් ආරම්භ කිරීම හා වියදම් ගිණුම් ගත කිරීම - 2020 |

## 2019 වර්ෂය තුළදී පළාත් භාණ්ඩාගාරය අත්කරගත් ජයග්‍රහණයන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකාවේ පළාත් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අධිකාරී යන ආයතනවල වාර්ෂික වාර්තා ඇගයීම් තරඟාවලියේදී 2014, 2015 යන වර්ෂ වෙනුවෙන් උතුරු මැද පළාත් භාණ්ඩාගාරය විසින් සකස් කළ වාර්ෂික වාර්තා වෙනුවෙන් ප්‍රථම ස්ථානය හිමි වූ අතර 2017 වර්ෂය සඳහා පළමු අනුශූරතාවයට ද හිමි සම්මානය 2019 වර්ෂයේදී පිරිනමන ලදී.

රාජ්‍ය ගිණුම් කාරක සභාව මහින් මාර්ගගත ඇගයීම් ක්‍රමය යටතේ පැවැත්වූ ඇගයීම් ක්‍රියාවලියේදී උතුරු මැද පළාත් සභාවේ පළාත් සභා අරමුදල් ගිණුම වෙනුවෙන් රන් සම්මානය හිමි විය.






## හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

-උතුරු මැද පළාත් සභාව සතු වත්කම් පිළිබඳ තොරතුරු වාර්ථාකරණය කාර්යක්ෂම කිරීමත්, වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමත්, නිශ්ක්‍රීය හා අභාවිත වත්කම් හඳුනාගෙන ඒ පිළිබඳ තීරණ ගැනීම පහසු කිරීම සඳහාත්, වත්කම් පාලනය හා වත්කම් හුවමාරුව කාර්යක්ෂම කිරීමත්, අරමුණු කරගෙන වැඩිදියුණු කරන ලද වත්කම් කළමනාකරණ මෘදුකාංගය ක්‍රියාත්මක කරන ලදී. 2019 වර්ෂය තුළදී ද වත්කම් කළමනාකරණ මෘදුකාංගය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරමින් අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදෙන ලදී. එමගින් වත්කම්වලට අදාල සංචලනයන් වාර්තා කිරීමට පහසුකම් සළසන ලදී. ඒ අනුව 2019.12.31 දිනට රු.මි 3,474 ක යටිතල පිරියත හා උපකරණද රු.මි 20,263 ක ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකමක්ද හඳුනාගෙන වාර්තාකර ඇත. අනෙකුත් පළාත් සභා හා සැසඳීමේදී ජංගම නොවන වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හෙළිදරවු කිරීමේ කාර්යයේදී උතුරු මැද පළාත් සභාව ප්‍රමුඛස්ථානය ලබාගෙන ඇත.



නව සිගාස් වැඩසටහන ක්‍රියාත්මක කිරීම





2019 වර්ෂයට අදාල විසර්ජන නියෝගය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කිරීම

-මූල්‍ය ක්ෂේත්‍රයේ වාර්තාකරණය සඳහා හඳුන්වා දෙනු ලබන නව්‍යකරණයන්ට යොමුවෙමින් පැවති මුදල් පදනමින් වෙනස්ව අනෙකුත් පළාත් සභාවන්ට අභිභවා උපචිත පදනමින් ගිණුම් වාර්තා සැකසීමට අනුව 2019 වර්ෂය තුළදී පළාත තුළ පවතින සියළුම ගිණුම් ඒකක සඳහා විසර්ජන ගිණුම වෙනුවට මූල්‍ය ප්‍රකාශන සකස්කර විගණනයට ලබාදී එම සියළු ගිණුම් සඳහා තත්වාගණනය කළ විගණන මතයක් ලබා දී ඇත. මේ යටතේ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 267/2018 චක්‍රලේඛයට අනුව, නව ආකෘතියට මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2019.03.07 දින සිදු කරන ලදී.

-2019 වර්ෂය සඳහා නව සිගාස් වැඩසටහන සහ වැටුප් සැකසීමේ පුහුණු කිරීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම තුළින් කළමනාකරණ සහකාර සේවයේ ධාරිතා සංවර්ධනය ඉහළ නැංවීම තුළින් මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂමතාවයට අවස්ථාව ලැබී ඇත.


-2020 වර්ෂය සඳහා අයවැය සකස් කිරීමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශයන් සැපයීම සඳහා 2019 වර්ෂය තුළ පළාත් සභාවට අයත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත ආයතනවල අදාල නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම සිදු කරන ලදී. එමෙන්ම මුදල් කොමිෂන් සභාව විසින් හඳුන්වාදුන් MIS වැඩසටහනට නිවැරදි තොරතුරු ලබාදීමේ කාර්යයට සාර්ථකව සහය ලබාදීම ද සිදුකරන ලදී.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සමස්තයක් වශයෙන් ගත්විට 2019 වර්ෂය වෙනුවෙන් අයවැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී, මූල්‍ය වාර්තාකරණයේ දී හා මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ දී පවතින සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව ප්‍රශස්ත ආකාරයට උපයෝජනය කිරීම මගින් සාර්ථක ප්‍රතිඵල ළඟාකර ගැනිමට හැකිවිය. උතුරු මැද පළාත සංවර්ධිත පළාතක් කිරීම උදෙසා පළාත් භාණ්ඩාගාරය විසින් මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට රාජ්‍ය භාණ්ඩාගාරය සමග කටයුතු කරමින් ද විදේශීය අරමුදල්, විදේශීය ණය ආධාර සහ වෙනත් රේඛීය අමාත්‍යාංශ වෙතින් ලබා දෙන ප්‍රතිපාදන විෂයයෙහි ද පළාත් සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරන ලදී. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිපාදන 10% හා 15% ලෙස අඩු කිරීම, පුනරාවර්තන වියදම් ප්‍රතිපාදන සීමා වීම සහ අත්‍යාවශ්‍ය වියදම් පමණක් දැරීම, කාර්යය මණ්ඩල සීමා වීම , අපේක්ෂිත ආදායම් ලැබීමේ අඩුවීම යන අභියෝග හා ගැටළු මධ්‍යයේ වුවද වර්ෂයේ අපේක්ෂිත කාර්ය සාධනය කරා ළඟා වීමට හැකි විය.

# 5.3. පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් ආවරණය කරනු ලබන ප්‍රදේශයන්.




## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

1999 ජනවාරි මස 01 වන දින ආරම්භ කළ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ව්‍යුහයන්ගෙන් සමන්විත වේ.

01. ප්‍රධාන කාර්යාලය
02. අධ්‍යක්ෂ කාර්යාලය
03. තත්ව පාලන ඒකකය
04. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-අනුරාධපුර
05. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-මැදවච්චිය
06. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-මහඉලුප්පල්ලම
07. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-කැකිරාව
08. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-මින්නේරිය
09. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-පොළොන්නරුව

## ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

| අනු අංකය | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
|---|---|---|
| 01 | අනුරාධපුර | නැගෙනහිර නුවර ගම් පළාත |
| | | මධ්‍යම නුවර ගම් පළාත |
| | | තලාව |
| | | විලච්චිය |
| | | නොච්චියාගම |
| 02 | මැදවච්චිය | පදවිය |
| | | කැබිතිගොල්ලෑව |
| | | මැදවච්චිය |
| | | රඹෑව |
| | | හොරොව්පතාන |
| | | කහටගස්දිගිලිය |
| | | මිහින්තලේ |
| 03 | කැකිරාව | කැකිරාව |
| | | තිරප්පනේ |
| | | ගලෙන්බිදුණුවැව |
| | | පළුගස්වැව |
| 04 | මහඉළුප්පල්ලම | රාජාංගනය |
| | | තඹුත්තේගම |
| | | ඉපලෝගම |
| | | ගල්නෑව |
| | | පලාගල |
| 05 | මින්නේරිය | මැදිරිගිරිය |
| | | හිඟුරක්ගොඩ |
| | | ඇළහැර |
| 06 | පොළොන්නරුව | තමන්කඩුව |
| | | ලංකාපුර |
| | | දිඹුලාගල |

### දැක්ම

"ගුණාත්මක හා ජනහිතකාමී ඉංජිනේරු ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්"

### මෙහෙවර

"ඉංජිනේරු කටයුතු, ප්‍රජා සහභාගීත්වය, ඉංජිනේරු කටයුතුවලදී නවීන තාක්ෂණය භාවිතය, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම "

### දිගුකාලීන අරමුණු

01. කාලීන පැවැත්මක් ඇති ඉදි කිරීම් පද්ධතියක් ඇති කිරීම උදෙසා තාක්ෂණ කාර්ය මණ්ඩල ශක්තිමත් කිරීම

02. දිර්ඝ කාලීන ප්‍රශස්ත ප්‍රමිතියක් ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණ පරිගණක ශක්‍යතාව ලබා ගැනීම හා ක්‍රමයෙන් දියුණු කිරීම.

### කෙටිකාලීන අරමුණු


නියමිත වේලාවට ඉදි කිරීම් ඇස්තමේන්තු කිරීම, තත්ත්ව පාලන ක්‍රියාවලියට ක්ෂණික විසඳුම් ලබා දීම, කාලීන අවශ්‍යතාවය වෙනුවෙන් පුහුණුවීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- උතුරු මැද පළාතේ ගොඩනැගිලි, වාරිමාර්ග සහ තත්ත්ව පාලන කටයුතුවලට අදාල මිල පොත සකස් කිරීම.
- ඉංජිනේරු කටයුතු සංවර්ධනය.
- උතුරු මැද පළාතේ සියළුම දෙපාර්තමේන්තුවල සංවර්ධන සැලැස්මට අදාල අළුත්වැඩියා හා නවීකරණ කටයුතුවල ඇස්තමේන්තු සැකසීම, අධීක්ෂණය හා බිල්පත් නිර්දේශ කර යැවීම.
- උතුරු මැද පළාතේ සියළුම නව ඉදිකිරීම්වල වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහගත සැලසුම් හා සවිස්තරාත්මක වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
- නව ඉදිකිරිම්වලට අදාල අධික්ෂණය, වැඩ බිම් පරීක්ෂාව හා රැස්වීම පැවැත්වීම හා බිල්පත් නිර්දේශකර යැවීම.
- ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය.
- ඉංජිනේරු කටයුතුවලදී නවීන තාක්ෂණය භාවිතය සංවර්ධනය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 191 |
| 2 | සේවයේ නියුතු | 152 |
| 3 | පුරප්පාඩු | 39 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි.) | 2019 වර්ෂයේ වියදම (රු. මි.) | ඉතිරිය (රු. මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 96.01 | 92.81 | 3.20 | 97 |
| ගමන් වියදම් | 5.41 | 5.01 | 0.40 | 92 |
| සැපයීම් | 9.26 | 7.98 | 1.28 | 86 |
| නඩත්තු වියදම් | 11.50 | 10.60 | 0.90 | 92 |
| ගිවිසුම්ගත සේවා | 9.46 | 7.61 | 1.85 | 80 |
| මාරු කිරීම් | 0.60 | 0.46 | 0.14 | 77 |
| පාඩු හා කපා හැරීම් | 0.05 | 0.00 | 0.05 | 0 |
| **එකතුව** | **132.29** | **124.47** | **7.82** | **94.08** |

## මූලධන වියදම් - 2019

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 11.69 | 6.36 | 5.33 | 54 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 4.50 | 3.74 | 0.76 | 77 |
| වාහන | 0.50 | 0.43 | 0.07 | 87 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 10.00 | 6.80 | 3.20 | 68 |
| **එකතුව** | **26.69** | **17.33** | **9.36** | **65** |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 09*

**සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරි ගැන්වීම.**

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

**9.4. 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම, කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගි කර ගැනීම.**

**9.5. විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කිරීම.**

### පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සපයන සේවාවන්.

01. වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
02. ව්‍යුහගත සැලසුම් සකස් කිරීම.
03. ඇස්තමේන්තු සකස් කිරීම.
04. ප්‍රසම්පාදන කටයුතු.
05. කොන්ත්‍රාත් කළමනාකරණය.
06. තත්ත්ව සහතික ලබා දීම.
07. තාක්ෂණික නිලධාරීන් හා කොන්ත්‍රාත්කරුවන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

### පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ සේවාදායක ආයතන

01. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
02. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
03. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව
04. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
05. පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව
06. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
07. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
08. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
09. ප්‍රධාන ලේකම් කාර්යාලය
10. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
11. මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය
12. මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු
13. මණ්ඩල සහ සංස්ථා

### ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගින් සිදු කළ කාර්යභාරය -2019.12.31 දිනට

| ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | වෙන් කළ ප්‍රතිපාදනය(රු.මි) | ඇස්තමේන්තුගත මුදල(රු.මි) | ගිවිසුම්ගත මුදල (රු.මි) |
|---|---|---|---|
| අනුරාධපුර | 4.67 | 4.66 | 4.65 |
| කැකිරාව (නව වැඩ) | 0.95 | 0.93 | 0.93 |
| මින්නේරිය | 1.51 | 1.49 | 1.25 |
| පොළොන්නරුව (නව වැඩ) | 0.14 | 0.14 | 0.14 |
| **එකතුව** | **7.27** | **7.22** | **6.97** |

### අළුත්වැඩියා කටයුතු

| ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.මි) | ගිවිසුම්ගත මුදල (රු.මි) |
|---|---|---|---|
| අනුරාධපුර | 05 | 9.51 | 8.15 |
| කැකිරාව | 02 | 0.93 | 0.93 |
| මින්නේරිය | 02 | 4.03 | 3.75 |
| පොළොන්නරුව | 01 | 0.14 | 0.14 |
| මහඉලුප්පල්ලම | 01 | 2.62 | 2.59 |
| **එකතුව** | **11** | **17.23** | **15.56** |

## මිලදී ගැනීම් හා ඉදි කිරීම්

| කාර්යයය | වෙන් කළ මුදල(රු.මි) | ගිවිසුම්ගත මුදල(රු.මි) | ගෙවන ලද මුදල(රු.මි) |
|---|---|---|---|
| කාර්යාල උපකරණ මිලදී ගැනීම | 4.50 | 3.97 | 3.45 |
| යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම හා | 0.50 | 4.33 | 4.33 |
| නව ඉදි කිරීම් | 10.00 | 11.6 | 6.80 |
| **එකතුව** | **15.00** | **19.66** | **14.58** |

## පළාතේ සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයකත්වන ඉදි කිරීම්වල ගුණත්වය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව පාලන ඒකකයේ දායකත්වය

තත්ත්ව පාලන ඒකකය මගින් පාංශු පරීක්ෂා, කොන්ක්‍රීට් පරීක්ෂා, සමස්ත (Aggregate) පරීක්ෂා, ඇළුමිණියම් පරීක්ෂාවන් හා අනෙකුත් පරීක්ෂණ සිදු කරනු ලබයි.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යංශය, පෞද්ගලික ආයතන හා උතුරු හා මධ්‍යම පළාතට අයත් ආයතන තත්ත්ව පාලන සේවා ලබා ගන්නා ආයතන අතර වේ.

2019 වර්ෂයේදී පළාත් තත්ත්ව පාලන ඒකකය මගින් විවිධාකාර පරීක්ෂාවන් දාහත්දහස් එකසිය තිස් එකක් (17,131) ක් සිදුකර ඇති අතර ඒ තුළින් රු.මි 17.32 ක ශුද්ධ ආදායමක් උපයන ලදී.

## 01. තත්ත්ව පාලන ඒකකය මගින් සිදු කරන ලද කාර්යභාරය

| පරීක්ෂා වර්ගය | ප්‍රාදේශීය සභා | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | පෞද්ගලික ආයතන | බඩගම් ප්‍රමුඛ ව්‍යාපෘතිය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | මහවැලි සංවර්ධන අධිකාරිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| අමුද්‍රව්‍ය පරීක්ෂාව (Meterial Testing) | 249 | 32 | 121 | 137 | 18 | - | 03 | 560 |
| ක්ෂේත්‍ර පරීක්ෂාව (Field Testing) | 1467 | 74 | 2268 | 198 | 167 | - | 35 | 4209 |
| කොන්ක්‍රීට් පරීක්ෂාව (Concrete Testing) | 1139 | 173 | 1493 | 1478 | 142 | - | 17 | 4442 |
| අන්තර් සම්බන්ධිත කුට්ටිගල් (Inter Lock) | 3898 | 62 | 3454 | 100 | - | 93 | 08 | 7615 |
| සිමෙන්ති ගල් (Cement Block) | 09 | - | 24 | 48 | - | - | - | 81 |
| ගඩොල්(Bricks) | 05 | - | 04 | 20 | - | - | - | 29 |
| පරීක්ෂාව Protector | 63 | 09 | 67 | 49 | 06 | - | 01 | 195 |
| **මුළු එකතුව** | **6830** | **350** | **7431** | **2030** | **333** | **93** | **64** | **17131** |

## 02. ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය සඳහා දායකත්වය ලබා දීම

පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සඳහා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් 2019 වර්ෂයේදී සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී. එසේම මෙම ව්‍යාපෘති 2016 සිට 2019 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව ඇත.

**ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේ දායකත්වය…**


| අනු අංකය | ව්‍යාපෘති කාර්යය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු වටිනාකම (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| 01 | ගුරු නිවාස සඳහා පහසුකම් සැපයීම | 31 | 444.78 | 318.94 |
| 02 | පාසල් සඳහා ජල පහසුකම් ලබා දීම | 76 | 22.41 | 2.96 |
| 03 | පාසල් සඳහා වැසිකිළි පහසුකම් ලබා දීම | 331 | 328.04 | 356.01 |
| 04 | පාසල් සඳහා විදුලි පහසුකම් ලබා දීම | 812 | 174.08 | 120.83 |
| 05 | ප්‍රාථමික අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන | 74 | 801.90 | 751.84 |
| 06 | සෞන්දර්යය ඒකක පිහිටුවීම | 05 | 79.36 | 93.96 |
| 07 | පන්ති කාමර හා අනෙකුත් ගොඩනැගිලි | 42 | 1152.00 | 1044.67 |
| 08 | අත්‍යාවශ්‍ය සුළු අළුත්වැඩියා කටයුතු | 520 | 747.62 | 673.64 |
| 09 | මහා පරිමාණ අළුත්වැඩියා කටයුතු | 39 | 216.50 | 174.09 |
| 10 | විදුහල්පති නිල නිවාස ඉදි කිරීම | 30 | 227.75 | 192.85 |
| 11 | කණිෂ්ඨ දෙවන මට්ටමේ විද්‍යාගාර ඉදි කිරීම | 44 | 630.38 | 549.52 |
| 12 | ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම | 04 | 45.48 | 29.41 |
| 13 | තාක්ෂණික ගොඩනැගිලි ඉදි කිරීම | 32 | 604.00 | 437.58 |
| 14 | පාසල් දන්ත සෞඛ්‍ය සේවාව සඳහා නව ඉදි කිරීම් හා පුනරුත්ථාපන කටයුතු | 09 | 43.45 | 33.73 |
| 15 | භෝජනාගාර පහසුකම් | 13 | 88.50 | 96.72 |
| 16 | වෙනත් | 00 | 00 | |
| | එකතුව | 2062 | 5606.25 | 4876.75 |

## "ළඟම පාසල හොඳම පාසල "යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පාසල් යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතියට අදාල සියළු ඇස්තමේන්තු කටයුතු පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. ඒ අනුව 2019 වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘති 2062කට අදාල ඇස්තමේන්තු සකස්කර ඇති අතර එහි වටිනාකම රු.මි. 4877.89කි.

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ පාසල්වල ජල පහසුකම්, විදුලි පහසුකම්, වැසිකිළි පහසුකම් සැපයීම වැනි යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම, පාසල් දන්ත සෞඛ්‍ය සේවාව ප්‍රවර්ධනය, ගුරු හා විදුහල්පති නිල නිවාස සංවර්ධනය, පාසල් සිසුන් සඳහා සෞන්දර්ය ඒකක පිහිටුවීම හා ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම යන සංවර්ධන කාර්යයන් සිදු කරන ලදී.

## 03.උතුරු මැද පළාත් ඒකක මිල ගණන් සකස් කිරීම
## SCHEDULE OF RATES FOR BUILDING,IRRIGATION & MARERIAL TESTING IN NORTH CENTRAL PROVINCE 2019




සෑම වසරකටම අදාල උතුරු මැද පළාත තුළ භාවිත කිරීම සඳහා ඒකක මිල ගණන් සකස් කිරීම පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. එය සකස් කිරීමේදී මූලිකවම අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් මිල කමිටු රැස්වීමේදී අනුමත කරන ලද භාණ්ඩවල මිල උපයෝගී කර ගනී. ඊට අමතරව අවශ්‍ය කරන ඉදි කිරීම් ද්‍රව්‍යවල මිල ගණන් උතුරු මැද පළාතෙන් මිල ගණන් කැඳවා යොදා ගනු ලබයි.

මෙම මිල පොත උපයෝගී කරගෙන සෑම වසරකම පළාත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සියල්ලට අදාල නව ඉදි කිරීම්, නවීකරණ, අළුත්වැඩියාවන්ට අදාල ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. එසේම මෙම ඒකක මිල ගණන් මධ්‍යම රජයට අයත් ආයතනවල ඉදි කිරීම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහාද භාවිතා කරනු ලබයි. මෙය සකස් කිරීමේදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), විධායක ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයින්, කාර්මික නිලධාරීන්, සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කමිටුවක් දායකත්වය ලබා දෙන ලදී.

### අමාත්‍යාංශ 05ට අදාල ඉදි කිරීම්වල ප්‍රගතිය - 2019

| අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.මි) | ගිවිසුම් ගත මුදල (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 16 | 13 | 237.19 | 52.49 | 8.98 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 36 | 15 | 44.50 | 9.28 | 6.66 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 206 | 129 | 712.99 | 405.99 | 223.56 |
| සමුපකාර අමාත්‍යාංශය | 40 | 25 | 59.87 | 33.07 | 10.05 |
| වාරිමාර්ග අමාත්‍යාංශය | 09 | 06 | 15.52 | 6.36 | 5.59 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 30 | 19 | 50.29 | 31.11 | 15.14 |
| අනෙක් දෙපාර්තමේන්තු | 08 | 06 | 9.88 | 2.89 | 3.11 |
| මධ්‍යම රජය | 40 | 13 | 191.95 | 25.35 | 11.42 |
| විදේශ ව්‍යාපෘති | 05 | 05 | 31.49 | 51.07 | 13.08 |

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ක්‍රියාකාරිත්වය

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව යටතේ ඇති වැදගත් අංශයක් ලෙස යාන්ත්‍රික ඉංජිනේරු අංශය හැඳින්විය හැකිය. මෙම අංශය මගින් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සිදු කරනු ලබයි.

**01.** පළාත් සභාවේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ කාර්යාලවලට අදාල වාහන හා යන්ත්‍ර උපකරණවල සිදු කරනු ලබන අළුත්වැඩියාවන්, සේවාවන් අධීක්ෂණය කිරීම සහ නිර්දේශ ලබා දීම.

**02.** මිල දී ගැනීම්වලට අදාල පිරිවිතර සකස් කිරීම, තාක්ෂණ කමිටු වාර්තා සැකසීම.

**03.** වාහන හා යන්ත්‍ර උපකරණ අපහරණ කටයුතුවලට අදාල වාර්තා සැකසීම.

**04.** අනතුරු විශ්ලේෂණය, ඇස්තමේන්තු වාර්තා සැකසීම.

**05.** ඡායා පිටපත් යන්ත්‍ර , පරිගණක යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම ඉලෙක්ට්‍රොනික උපකරණ සේවා අළුත්වැඩියා සඳහා නිර්දේශ ලබා දීම.

**06.** පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ නඩත්තු ඒකකයට අදාල උපකාරක සේවා ඒකකය සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම.

**07.** යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන් සඳහා අවශ්‍ය උපදේශණ සේවාවන් සිදු කිරීම.


**08.** අනෙකුත් යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සැකසීම.

**09.** ගොඩනැගිලි සේවා ඉංජිනේරු සැලසුම් සැකසීම සහ අවශ්‍ය උපදේශණ සේවාවන් සැපයීම. (Design & Consulting)

**10.** ප්‍රසම්පාදන කමිටු රැස්වීම්, සම්මුඛ පරීක්ෂණ, වෙනත් කමිටු /රැස්වීම්.

## යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සැකසීම හා සේවාවන් ලබා දීම

| මාසය | නිකුත් කරන ලද වාර්තා සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 24 |
| පෙබරවාරි | 23 |
| මාර්තු | 32 |
| අප්‍රේල් | 29 |
| මැයි | 42 |
| ජූනි | 53 |
| ජූලි | 58 |
| අගෝස්තු | 55 |
| සැප්තැම්බර් | 62 |
| ඔක්තෝබර් | 59 |
| නොවැම්බර් | 52 |
| දෙසැම්බර් | 44 |
| **එකතුව** | 533 |




2019 වර්ෂය තුළ මෙම අංශය මගින් නිකුත් කරන ලද මුළු වාර්තා සංඛ්‍යාව 533කි.

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ සේවය ලබා ගන්නා සේවාලාභීන් /ආයතන

යාන්ත්‍රික ඉංජිනේරු අංශය මගින් උතුරු මැද පළාත් සභාවේ සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල යාන්ත්‍රික ඉංජිනේරුමය අවශ්‍යතාවයන් ඉටු කිරීම සිදු විය.

ඒ යටතේ ප්‍රධාන අළුත්වැඩියාවන්, සුළු අළුත්වැඩියාවන්, සේවාවන්(මුල් පරීක්ෂාව, විසන්ධි කළ පසු පරීක්ෂාව, අමතර කොටස් පරීක්ෂාව, පසු පරීක්ෂාව, මිල ගණන්පත් ඇගයීම හා වෙනත්)පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් වාර්තා සකස් කිරීම, පසු වාර්තා සකස් කිරීම,පරීක්ෂාවන්, වෙළෙඳපොළ මිල සැසදීම, තක්සේරු කිරිම, ඇස්තමේන්තු වාර්තා සකස් කිරීම,අධීක්ෂණය, මිල සැසදීම, නිර්දේශ ලබා දීම ක්ෂේත්‍ර පරීක්ෂාව, ගැටළු සාකච්ඡා කිරීම, අවශ්‍ය උපදේශන ලබා දීම, වාර්තා සැකසීම, නඩත්තු, අළුත්වැඩියා, මිලදී ගැනීම්, වෙනත් තත්ත්ව වාර්තා, තාක්ෂණික වාර්තා, භාණ්ඩ අපහරණය, භාණ්ඩ සමීක්ෂණ, අනෙකුත් වායු සමීකරණ සැලසුම, උපකාරක සේවා සැලසුම, විදුලි සැලසුම හා යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන්වලට අදාලව උපදෙස් ලබා දීම වැනි සේවාවන් සපයන ලදී.

## යාන්ත්‍රික ඉංජිනේරු අංශය මගින් සිදු කළ සේවාවන්වල ප්‍රගතිය

| අ.අ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව /කාර්යාලය | විස්තරය | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම(රු.මි) | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | තිරප්පනේ සහ ඉපලෝගම ප්‍රාදේශීය සභා | Low Bed repair | 0.54 | Completed |
| 2 | ඉපලෝගම ප්‍රාදේශීය සභා | CCTV Design & Engineering Estimates | 0.27 | D & E Estimates Sent |
| 3 | මැදිරිගිරිය ප්‍රාදේශීය සභා | CCTV Design & Engineering Estimates | 0.55 | Completed |
| 4 | තිරප්පනේ ප්‍රාදේශීය සභා | Animal fence energyser replacing -Compost project - Thirappane | 0.19 | Completed |
| 5 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | Lift Installation TEC - | 4.85 | TEC Sent |
| 6 | පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන | AC installation- | 2.70 | Completed |
| 7 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | New Panel board & wiring rearrangement - | 2.77 | Estimate Sent |
| 8 | පළාත් සභා සංකීර්ණය | CCTV Design & Engineering Estimates (SBD 04-Design & Built) - | 3.00 | D & E Estimates Sent |
| 9 | සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | Exibition Stall fabrication with Crystal Pannel | 8.00 | Completed |
| 10 | ඉපලෝගම ප්‍රාදේශීය සභා | 10 Kw Generator Repair- | 0.19 | Estimate Sent |
| 11 | සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | Hay baler purchasing 02 nos-Tender Document, TEC | 1.94 | Completed |
| | | AC installation 14 Nos | 2.10 | Completed |
| 12 | ආණ්ඩුකාර කාර්යාලය | Waist Collecting Machine - New Innovation | 1.50 | On Progress |
| 13 | සමුපකාර අමාත්‍යාංශය | මැටි පහන් අච්චු (30) | 0.06 | Completed |
| 14 | සමුපකාර අමාත්‍යාංශය | විදුලි සකපෝරු (26) | 1.77 | Completed |
| 15 | ප්‍රධාන ලේකම් කාර්යාලය | Conference hall lighting | 0.34 | Completed |
| 16 | මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය | New bus stand lighting | 0.03 | Completed |

**Ab : D & E - Design & Engineering**

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ප්‍රධාන කාර්යයන්

| අ.අ | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් |
|---|---|---|
| 01 | පළාත් සභාවේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ කාර්යාලවලට අදාල වාහන හා යන්ත්‍ර උපකරණවල සිදු කරනු ලබන අළුත්වැඩියාවන්, සේවාවන් අධීක්ෂණය කිරිම හා නිර්දේශ ලබා දීම | ප්‍රධාන අළුත්වැඩියාවන්, සුළු අළුත්වැඩියාවන්, සේවාවන්(මුල් පරික්ෂාව, විසන්ධි කළ පසු පරික්ෂාව, අමතර කොටස් පරික්ෂාව, පසු පරික්ෂාව, මිල ගණන්පත් ඇගයීම හා වෙනත්) |
| 02 | මිලදී ගැනීම්වලට අදාල පිරිවිතර සකස් කිරීම , තාක්ෂණ කමිටු වාර්තා සැකසීම | පිරිවිතර සකස් කිරීම,තාක්ෂණික ඇගයීම් වාර්තා සකස් කිරීම, පසු වාර්තා සකස් කිරීම |
| 03 | වාහන හා යන්ත්‍ර උපකරණ අපහරණ කටයුතුවලට අදාල වාර්තා සැකසීම | පරීක්ෂාවන්, වෙළෙඳපොළ මිල සැසඳීම, තක්සේරු කිරිම |
| 04 | අනතුරු විශ්ලේශණය, ඇස්තමේන්තු වාර්තා සකස් කිරීම | පරික්ෂාවන්, ඇස්තමේන්තු වාර්තා සකස් කිරීම |
| 05 | ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම ඉලෙක්ට්‍රොනික උපකරණ සේවා අළුත්වැඩියා සඳහා නිර්දේශ ලබා දීම | අධීක්ෂණය, මිල සැසඳීම,නිර්දේශ ලබා දීම |
| 06 | පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ නඩත්තු ඒකකයට අදාල උපකාරක සේවා ඒකකය සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම | ක්ෂේත්‍ර පරීක්ෂාව,ගැටළු සාකච්ඡා කිරීම, අවශ්‍ය උපදේශන ලබා දීම, වාර්තා සැකසීම |
| 07 | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් සිදු කිරීම | නඩත්තු, අළුත්වැඩියා, මිලදී ගැනීම්, වෙනත් |
| 08 | අනෙකුත් යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සකස් කිරීම | තත්ත්ව වාර්තා, තාක්ෂණික වාර්තා, භාණ්ඩ අපහරණය, භාණ්ඩ සමීක්ෂණ,අනෙකුත් |
| 09 | ගොඩනැගිලි සේවා ඉංජිනේරු සැලසුම් සැකසීම සහ අවශ්‍ය උපදේශන සේවාවන් සැපයීම | වායු සමීකරණ සැලසුම, උපකාරක සේවා සැලසුම, විදුලි සැලසුම |
| 10 | ප්‍රසම්පාදන කමිටු රැස්වීම, සම්මුඛ පරීක්ෂණ,වෙනත් කමිටු/ රැස්වීම් | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන්වලට අදාලව උපදෙස් ලබා දීම |

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් | වාර්ෂික නිමවුම |
|---|---|---|---|
| 01 | දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ කාර්යාලවලට අදාල වාහන හා යන්ත්‍ර උපකරණවල සිදු කරනු ලබන අළුත්වැඩියාවන්, සේවාවන් අධීක්ෂණය කිරීම සහ නිර්දේශ ලබා දීම. | ප්‍රධාන අළුත්වැඩියාවන්, | 85 |
| | | සුළු අළුත්වැඩියාවන් | 234 |
| | | සේවාවන් | 24 |
| 02 | මිල දී ගැනීම්වලට අදාල පිරිවිතර සකස් කිරීම, තාක්ෂණ කමිටු වාර්තා සැකසීම | පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් වාර්තා සැකසීම, පසු වාර්තා සකස් කිරිම | 89 |

| අනු අංකය | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් | වාර්ෂික නිමවුම |
|---|---|---|---|
| 03 | වාහන හා යන්ත්‍ර උපකරණ අපහරණ කටයුතු වලට අදාල වාර්තා සැකසීම | පරීක්ෂාවන්, වෙළඳපොල මිල සැසඳීම, තක්සේරු කිරීම් | 4 |
| 04 | අනතුරු විශ්ලේෂණය, ඇස්තමේන්තු වාර්තා සැකසීම | පරීක්ෂාවන්, ඇස්තමේන්තු සැකසීම | 7 |
| 05 | ඡායා පිටපත් යන්ත්‍ර , පරිගණක යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම ඉලෙක්ට්‍රොනික උපකරණ සේවා අළුත්වැඩියා සඳහා නිර්දේශ ලබා දීම | අධීක්ෂණය, මිල සැසදීම, නිර්දේශ ලබා දීම | 12 |
| 06 | පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ නඩත්තු ඒකකයට අදාල උපකාරක සේවා ඒකකය සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම. | ක්ෂේත්‍ර පරීක්ෂාව, ගැටළු සාකච්ඡා කිරීම, අවශ්‍ය උපදේශණ ලබා දීම, වාර්තා සැකසීම | 14 |
| 07 | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන් සඳහා අවශ්‍ය උපදේශණ සේවාවන් සිදු කිරීම. | නඩත්තු, අළුත්වැඩියා, මිල දී ගැනීම්, වෙනත් | 6 |
| 08 | අනෙකුත් යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සැකසීම. | තත්ත්ව වාර්තා, තාක්ෂණික වාර්තා, භාණ්ඩ අපහරණය, භාණ්ඩ සමීක්ෂණ, අනෙකුත් | 11 |
| 09 | ගොඩනැගිලි සේවා ඉංජිනේරු සැලසුම් සැකසීම සහ අවශ්‍ය උපදේශණ සේවාවන් සැපයීම. (Design & Consulting) | වායු සමීකරණ සැලසුම් | 8 |
| | | උපකාරක සේවා සැලසුම් | 6 |
| | | විදුලි සැලසුම් | 4 |
| 10 | ප්‍රසම්පාදන කමිටු රැස්වීම්, සම්මුඛ පරීක්ෂණ, වෙනත් කමිටු /රැස්වීම් | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන්වලට අදාලව උපදෙස් ලබා දීම. | 29 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව පළාත් සභාවේ සියළු ආයතන මගින් ඉංජිනේරු සේවා සපයා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් අවශ්‍ය කරන වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු සේවා සපයා දීම සිදු කරනු ලබන අතර 2019 වර්ෂය තුළ දී ඉල්ලා සිටි සියළුම ඉල්ලීම් ඉටු කිරීමට හැකි වී ඇත.

2019 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධනය සඳහා උතුරු මැද පළාත් සභාව වෙත ලැබුණු විශේෂ ප්‍රතිපාදන වඩා කාර්යක්ෂමව හා ඵලදායිව භාවිතා කිරීම සඳහා අවශ්‍ය සැලසුම්, ඇස්තමේන්තු හා අනෙකුත් අත්‍යාවශ්‍ය සියළු තාක්ෂණික කාරණා ඉටු කිරීම කෙරෙහි කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම තුළ ඉතා සාර්ථක ප්‍රතිඵල කරා ළඟා විය හැකි විය.

එපමණක් ද නොව ඉදිකිරීම් ආරම්භයේ දී, ක්‍රියාත්මකවන අතරතුර හා එකී ව්‍යාපෘති සාර්ථකව නිමකර ජනතා අයිතියට පත් කරන තුරු නිරන්තර ක්ෂේත්‍ර මට්ටමේ අධීක්ෂණ කටයුතු කරමින් හා වැඩ බිම් රැස්වීම් පවත්වමින් ව්‍යාපෘතිය හා සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන්ද මනාව සම්බන්ධීකරණය කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක සහගත ක්‍රියාවලියක් ඉටු කිරීමට 2019 වර්ෂයේදී හැකි විය.

# 5.4.පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් යටතේ අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආයතන 898 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආයතන 375ක් වශයෙන් මුළු පළාත් සභා ආයතන 1273ක විගණන කටයුතු සිදු කරනු ලබයි.

## දැක්ම

"ඵලදායී මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක්, විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් "

## මෙහෙවර

"ඵලදායි මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක් මගින් විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් බිහිකරනුවස් විගණන කාර්යයන් හා විමර්ශන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ විධිමත් සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව අඛණ්ඩව හා කාලානුරූපීව ශක්තිමත් කිරිම. "

## අරමුණු

- සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා උපකාර වීම.
- පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නීත්‍යානුකූලව සිදු වේදැයි විපරම් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරිම.

## ප්‍රධාන කාර්යයන්

01
- විගණන කාර්යයන් සංවර්ධනය

02
- විමර්ශන කටයුතුවල ඵලදායිතා වර්ධනය.

03
- ආයතනික ධාරිතා වර්ධනය

04
- යහපාලන කටයුතු සංවර්ධනය

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සභාවට අයත් සියලු ආයතන වලට ගොස් (වාර්ෂික සැලැස්මට අනුව) ස්ථානීය පරීක්ෂාවන් කිරිම.
- ක්ෂේත්‍රයට ගොස් විමසුම් කිරිම.
- පුද්ගලයින් හා එක්ව ක්‍රියා කිරිම, සාකච්ඡා කිරිම, ප්‍රකාශ ලබා ගැනිම.
- ලැබෙන නියෝජන/ නියෝග අනුව ක්‍රියා කිරිම.
- සමූහ ක්‍රියාකාරකම්වලට සහභාගි වීම ( විදුහල්පති රැස්වීම්වලට සහ සහභාගි වීම සහ පළාත් ගිණුම්කාරක සභාවට සහභාගි වීම).
- විගණන වාර්තා නිකුත් කිරිම.
- විනය කටයුතු සඳහා චෝදනා පත්‍ර කෙටුම්පත්කර අදාළ ආයතන වෙත ලබා දීම.
- විනය පරික්ෂණ/ නිතීමය කටයුතු වලට ඉදිරිපත් වීම. (අධිකරණ කටයුතුවලට සහයවීම).

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු





උතුරු මැද පළාත තුළ පිහිටුවා ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/සංස්ථා සහ පළාත් සභාවට අයත් අනෙකුත් ආයතනවල කටයුතු තිරසර සංවර්ධන ඉලක්ක 17ට අනුව හා එහි අන්තර්ගත දර්ශනයන්ට අනුව ළඟා කර ගැනීමට කටයුතු කිරිම සම්බන්ධව අවධානය යොමු කරමින් එම අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාතේ සියළුම ආයතනවලට අවශ්‍ය සහය ලබා දීම සිදු කරනු ලබයි.

**විශේෂයෙන්ම 12-vii ඉලක්කයට ළඟා වීම සඳහා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව පූර්ණ අවධානය යොමු කරමින් එම අරමුණු කරා ළඟා වීමට පළාතේ සියළුම ආයතන මෙහෙයවීම සිදු කරයි.**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 38 |
| 2 | සේවයේ නියුතු | 32 |
| 3 | පුරප්පාඩු | 06 |




## පුනරාවර්තන වියදම් -2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 14.15 | 12.95 | 1.20 | 92 |
| ගමන් වියදම් | 1.07 | 0.61 | 0.46 | 57 |
| සැපයිම් | 2.57 | 1.20 | 1.37 | 47 |
| නඩත්තු වියදම් | 1.08 | 0.46 | 0.62 | 43 |
| ගිවිසුම්ගත සේවා | 1.26 | 0.62 | 0.64 | 49 |
| මාරු කිරීම් | 0.19 | 0.18 | 0.01 | 95 |
| **එකතුව** | **20.32** | **16.02** | **4.30** | **79** |

## මුලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.50 | 0.15 | 0.35 | 30 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 1.00 | 0.93 | 0.07 | 93 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 1.50 | 0.25 | 1.25 | 17 |
| **එකතුව** | **3.00** | **1.33** | **1.67** | **44** |

## කාර්ය සාධන ඉලක්ක 2017 - 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2020 |
| පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හී සියළුම පරිපාලන ඒකක පරීක්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම | වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා නිකුත් කිරීම | 123 | 140 | 320 |

## විධිමත් මුල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු - 2019

| අනු අංකය | සහභාගී වු අමාත්‍යාංශය/ආයතනය | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 04 |
| 02 | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 04 |
| 03 | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 04 |
| 04 | පළාත් සමුපකාර අමාත්‍යාංශය | 04 |
| 05 | පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | 04 |
| 06 | ප්‍රධාන ලේකම් කාර්යාලය ඇතුළු අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතන | 04 |

සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මගපෙන්වීම හා උපකාර විමත් පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නීත්‍යානුකූලව සිදු වේ දැයි විපරම් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරිමත් අරමුණු කොට වඩාත් ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා 2019 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම සිදුවිය. 2019 වර්ෂය තුළ විගණන හා විමර්ශන වාර්තා 128ක් නිකුත්කර ඇත. ගරු ආණ්ඩුකාරතුමාගේ ,ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පෙත්සම් මත විශේෂිත විමර්ශන කටයුතු 06ක් සිදුකරන ලදී.

ඒ තුළින් උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන තුළ මූල්‍ය කළමනාකරණයේදී ඇති ගැටළු හඳුනා ගැනීමටත් එම ගැටළු සාකච්ඡාකර විසඳුම් ඉදිරිපත් කිරීමත් තුළින් වඩාත් කාර්යක්ෂම මෙන්ම විනිවිදභාවයෙන් යුතු මූල්‍ය විනයෙන් යුතු ආයතන පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙන ලදී.

## අනාගත අපේකෂාවන් පිළිබඳ විග්‍රහය 2020 - 2021

උතුරු මැද පළාතේ ආයතන තුළ වඩාත් විනිවිදභාවයකින් යුක්තව මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබා දීමත් කාර්ය මණ්ඩලවල ධාරිතාවය ඉහළ නැංවීම තුළින් ඵලදායක සේවාවක් ලබා දීමත් යන ප්‍රතිඵල අපේක්ෂාවෙන් 2020 හා 2021වර්ෂවලදී වඩාත් ඉලක්ක සහගත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.

| අරමුණු | ඉලක්ක | | අපේකෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගු කාලීන |
| 01.සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයකින් යුක්තව සහ අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා සහාය දැක්වීම මගින් ප්‍රතිඵල ළඟාකර ගැනීම හා ප්‍රගතිය සොයා බැලීම.<br><br>02.පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නියමානුකූලව සිදුවේදැයි විපරම් කර ඉහළ කළමනාකාරිත්ව යට වාර්තා කිරීම. | 01.පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.<br><br>02.පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.<br><br>03. පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු,ව්‍යා වස්ථාපිත ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම | 01.පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශය යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.<br><br>02.පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.<br><br>03. පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු,ව්‍යව ස්ථාපිත ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම | ඉහළම කාර්ය සාධනයකින් හා වගවීමකින් යුත් පළාත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතු කරන විශිෂ්ටතම අභ්‍යන්තර විගණන කොටස්කරු බවට පත් වීම. | පළාත් සේවයේ සංවිධානවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම හා අවධානම අවම කිරීම මගින් අපේක්ෂිත කාර්ය සාධනය සාක්ෂාත්කර ගැනීම සඳහා පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව ලෙස සහාය සහ මාර්ගෝපදේශ සැපයීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

"ඵලදායී මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක්, විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් " යන දැක්ම කරා ළඟා විමට ඵලදායි මුල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක් මගින් විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් බිහිකරනුවස් විගණන කාර්යයන් හා විමර්ශන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ විධිමත් සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව අඛණ්ඩව හා කාලානුරූපිව ශක්තිමත් කිරිම පිණිස සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිදභාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මගපෙන්වීම හා උපකාර විමත් පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නීත්‍යානුකූලව සිදු වේ දැයි විපරම් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරිමත් අරමුණුකොට වඩාත් ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා 2019 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම සිදුවිය. 2019 වර්ෂය තුළ විගණන හා විමර්ශන වාර්තා 128ක් නිකුත්කර ඇත.

එක් එක් අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අධිකාරී තුළ ඇති වූ ගැටළු හඳුනා ගැනිම සහ ඒ සඳහා සාධාරණ විසඳුම් යෝජනා කර විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරිම තුළින් කාර්යක්ෂමතාවය හා ඵලදායී රාජ්‍ය සේවයේ නිර්මාණය කිරිම සඳහා සක්‍රිය දායකත්වයක් සැපයීමට හැකිවු ඉලක්ක සහගතව හා සුභවාදිව ගමන් කිරිමට හැකිවු වර්ෂයක් ලෙස 2019 වර්ෂය විග්‍රහ කළ හැක.

සෑම ආයතනයකම යම් නිශ්චිත කාලයකදි කරන ලද ආයතනික කටයුතු මෙන්ම ගිණුම් ක්‍රියාවලියද ඇතුළත්ව සමස්ත කළමනාකරණ කාර්යයන් පිරික්සීම මෙම දෙපාර්තමේන්තුවට නියමි වී ඇත. එම නිසා කුඩා කණ්ඩායමක් ලෙස විශාල කැපවීමකින් යුක්තව ක්‍රියා කිරිම තුළින් මහජන ප්‍රසාදයට ලක්ව ඇත. මහජන මුදල් වැය කිරීමේදී වංචා දූෂණ හෙළිවීම මාධ්‍ය මගින්ද හෙළිදරව් කිරීම නිසා සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය තුළ මහජනයා විසින් විවිධ පෙත්සම් හා ලිපි එවිමද සිදු විණි. සියළු රාජකාරිවල විනිවිදභාවය මෙන්ම නීත්‍යානුකූල හා නිවැරදිභාවය ඇති කිරීමට ක්‍රියා කිරිම සහ මේවායේ ප්‍රතිඵල ඉදිරි කාලයේදී ලැබෙනු ඇත. ඒ තුළින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා ඵලදායි බව වැඩි කිරීමට හැකි විය.

# 5.5. පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ පවතින ආයතනයක් වේ. පළාතේ මානව සම්පත් සංවර්ධනය සඳහා කටයුතු කරනු ලබන ප්‍රධානතම ආයතනය වේ. එමගින් පළාත් රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සිදුකරනු ලැබේ. පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය හා පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය යන ප්‍රධාන අංශ වලින් සමන්විතවේ. කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින මානව සම්පත්, මූල්‍ය සම්පත් හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරමින් වාර්ෂික පුහුණු සැලැස්ම හා බාහිර ආයතනවල ඉල්ලීම් අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

## දැක්ම

"පරිපූර්ණ මහජන සේවකයෙක්, ගුණාත්මක රාජ්‍ය සේවයක්"

## මෙහෙවර

"ජාතික ප්‍රතිපත්තියට අනුගතව පළාතේ රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා ඉහළ නැංවීම, පුහුණු අවශ්‍යතා තක්සේරුව, කාර්ය සාධන නියාමනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවිධානය කරමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් බිහි කිරීමට අඛණ්ඩව දායකවීම."

## දිගුකාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම.

## ප්‍රධාන කාර්යයන්


- රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය
- පුහුණු අවශ්‍යතා තක්සේරුව
- කාර්ය සාධන නියාමනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ජාතික වැඩපිළිවෙල අනුව මානව සම්පත් සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සභාවේ විවිධ අංශයන්හි වගකීම් දරන විධායක නිලධාරීන් මගින් පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
- සුදුසුකම්ලත් ප්‍රවීණ දේශක මණ්ඩලයකගේ සම්පත්දායකත්වය ලබා ගැනීම.
- වාර්ෂික පුහුණු සැලැස්ම සකස්කර අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ආදර්ශ ආයතනයක් ලෙස ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුහුණු දත්ත පද්ධතිය පවත්වාගෙන යාම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුමත සංඛ්‍යාව | 37 |
| 02 | සේවයේ නියුතු සංඛ්‍යාව | 26 |
| 03 | පුරප්පාඩු සංඛ්‍යාව | 11 |
| 04 | අනියම් | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 17.78 | 17.03 | 0.75 | 96 |
| ගමන් වියදම් | 0.50 | 0.31 | 0.19 | 62 |
| සැපයීම් | 3.60 | 2.20 | 1.40 | 61 |
| නඩත්තු වියදම් | 3.10 | 2.65 | 0.45 | 87.10 |
| ගිවිසුම්ගත සේවා | 15.80 | 8.97 | 6.83 | 56.80 |
| මාරු කිරීම් | 0.09 | 0.03 | 0.06 | 33 |
| **එකතුව** | **40.87** | **31.19** | **9.68** | **76.31** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන වැඩ ඉටු කිරීම.

| අනු අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | 2019 වාර්ෂික පුහුණු සැලැස්ම අනුව සහ පළාත් රාජ්‍ය ආයතනවල ඉල්ලීම අනුව මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | උතුරු මැද පළාත් සභාවේ සියළුම රාජ්‍ය සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, පැවැත්වීම හා පසුවිපරම් කිරීම | උතුරු මැද පළාත් සභාවේ සියළුම රාජ්‍ය සේවකයින්ගේ දැනුම, කුසලතා වර්ධනය හා ආකල්ප සංවර්ධනය තුළින් ගුණාත්මක රාජ්‍ය සේවයක් ඇති කිරීම | 2019 වර්ෂයේ පුහුණුව ලැබූ පුහුණුලාභීන් සංඛ්‍යාව 3410 |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වෙනත් මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 2.32 | 1.82 | 0.50 | 78 |
| **එකතුව** | **2.32** | **1.82** | **0.50** | **78** |

## කාර්ය සාධක ඉලක්ක - 2019

| කාර්ය සාධන දර්ශකය | ඉලක්ක (පුහුණු වැඩසටහන්) | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| වාර්ෂික පුහුණු සැලැස්ම අනුව රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, පැවැත්වීම හා පසුවිපරම් කිරීම | | | |
| වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් | 60 | 55 | 60 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණ | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 01 | වාර්ෂික පුහුණු සැලැස්ම අනුව | වාර්ෂික පුහුණු සැලැස්ම අනුව වැඩසටහන් පැවැත්වීම( පුහුණු වැඩසටහන් 120) | 6.9 | 6.8 | 99 |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් පුහුණු කිරිම | පුහුණු වැඩසටහන් 124 | පුහුණු වැඩසටහන් 135 | රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලීම. | කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් තුළින් මහජන අපේක්ෂා ඉටුකිරිම |

## 2019 වර්ෂයේදී පවත්වන ලද වෙනත් පුහුණු වැඩසටහන්

| වැඩසටහන | දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව | මුළු වියදම ( රු.මි) |
|---|---|---|---|
| පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 22 | 0.022 |
| ගබඩා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 42 | 0.085 |
| කණිෂ්ඨ සේවක පුහුණු පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 54 | 0.047 |
| මූල්‍ය විනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 46 | |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 65 | |
| විනය ක්‍රියාපටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 38 | 0.063 |
| අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල | 02 | 24 | 0.021 |
| වාහන ලිපිගොනු නඩත්තුව | 01 | 45 | 0.041 |
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 40 | 0.072 |
| කණිෂ්ඨ සේවක පුහුණු පිළිබඳ වැඩසටහන | 02 | 47 | 0.051 |
| NEW SIGAS | 03 | 50 | 0.071 |
| පාඩු හා කපා හැරීම් පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 41 | 0.081 |
| උපයන විට ගෙවීම් බදු පුහුණු වැඩමුළුව | 01 | 110 | 0.037 |
| විනය ක්‍රියා පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 20 | |
| මානසික සෞඛ්‍ය වර්ධනය තුළින් වැඩබිමේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම | 01 | 103 | |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 26 | - |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ මුලික හැඳින්වීම | 02 | 55 | 0.056 |

2019 වර්ෂයේදී පවත්වන ලද වෙනත් පුහුණු වැඩසටහන් ඉතිරි කොටස...

| වැඩසටහන | දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව | මුළු වියදම ( රු.මි) |
|---|---|---|---|
| මහජන සම්බන්ධතාවය හා සන්නිවේදනය | 01 | 40 | 0.023 |
| පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 33 | 0.018 |
| රියදුරු කාර්ය සාධනය ඉහළ නැංවීමේ වැඩමුළුව | 02 | 42 | 0.088 |
| අත්තිකාරම් ගිණුම් පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 60 | |
| ආයතන කාර්ය පටිපාටිය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 54 | 0.045 |
| වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 50 | 0.041 |
| වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය පිළිබඳ පුහුණු වැඩමුළුව | 06 | 30 | 0.115 |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 26 | |
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 28 | 0.073 |
| කණිෂ්ඨ සේවක පුහුණු පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 28 | |
| අන්තර්ජාලගත කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 24 | 0.034 |
| ලේඛනාගාර නඩත්තුව පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 55 | 0.030 |
| පාඩු හා කපා හැරීම් පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 40 | 0.026 |
| දෙමල භාෂා පුහුණු වැඩමුළුව | 06 | 100 | 0.078 |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 70 | |
| වත්කම් කළමනාකරණය සහ භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය | 01 | 35 | 0.047 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 15 | 0.062 |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 50 | |
| දෙමළ භාෂා පුහුණු වැඩමුළුව | 06 | 138 | 0.052 |
| මූලික විමර්ශණ පිළිබඳ න්‍යායාත්මක වැඩසටහන | | | 0.065 |
| සංවර්ධන සැලසුම්කරණය | 01 | 22 | |
| සිගාස් පුහුණු වැඩමුළුව | 03 | 36 | 0.087 |
| මූල්‍ය විනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 40 | 0.035 |
| කොන්ත්‍රාත්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 40 | |
| සිගාස් පුහුණු වැඩමුළුව | 03 | 22 | |
| පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 51 | |
| දෙමළ භාෂා පුහුණු වැඩමුළුව | 06 | 92 | 0.056 |
| දෙමළ භාෂා පුහුණු වැඩමුළුව | 06 | 121 | 0.112 |
| නීති කටයුතු පුහුණුව | 01 | 28 | 0.115 |
| නව පරිපාලන නිලධාරීන් සඳහාවන ප්‍රාරම්භක පුහුණු වැඩසටහන | 05 | 23 | |
| අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල | 02 | 14 | |
| අධීක්ෂණ කළමනාකරණය පිළිබඳ පුහුණුව | 02 | 19 | |
| නවක විගණන නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව | 10 | | |

| වැඩසටහන | දින ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| මූලික පරිගණක පුහුණු වැඩමුළුව | 05 | 19 | 0.034 |
| සැලසුම්කරණය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු රැස් කිරීම පුහුණුව | - | - | 0.016 |
| වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය පිළිබඳ පුහුණු වැඩමුළුව | 05 | | 0.125 |
| මූලික සිංහල භාෂා පාඨමාලාව | 06 | 82 | 0.099 |
| දෙමළ භාෂා පුහුණු වැඩමුළුව | 06 | 108 | 0.050 |
| රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | 02 | | 0.192 |
| මූලික පරිගණක පුහුණු වැඩමුළුව | 05 | 24 | 0.043 |
| තිරසාර සංවර්ධන ඉලක්ක පුහුණු වැඩමුළුව | 01 | 141 | 0.082 |
| දෙමළ භාෂා පුහුණු වැඩමුළුව | 06 | 67 | 0.052 |
| අන්තර්ජාලගත කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 33 | 0.025 |
| පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 30 | |
| ඉංග්‍රීසි භාෂාවෙන් ලිපි සැකසීම | 05 | | 0.094 |
| මූලික පරිගණක පුහුණු වැඩමුළුව | 05 | 24 | |
| ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 05 | 36 | 0.090 |
| Autocad පුහුණු වැඩමුළුව | 05 | 10 | |
| ඵලදායිතා පුහුණු වැඩමුළුව | 02 | 06 | |
| ග්‍රාම සංවර්ධන නිලධාරී දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව | 02 | | 0.094 |
| දෙමළ භාෂා පුහුණු වැඩමුළුව | 06 | 96 | 0.105 |
| වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩමුළුව | 01 | 18 | 0.008 |
| උද්‍යාන අලංකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 03 | 26 | 0.026 |
| 2020 නව ප්‍රමිත අනුව ගිණුම් සකස් කිරීමේ වැඩමුළුව | 04 | 38 | 0.032 |
| නව කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩමුළුව 2 අදියර | 03 | 52 | 0.022 |
| උද්‍යාන අලංකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 26 | 0.008 |
| අන්තර්ජාල පුහුණු කළමනාකරණ පද්ධතිය | 01 | 15 | 0.008 |
| විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 56 | 0.020 |
| නව කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩමුළුව 2 අදියර | 02 | 52 | 0.021 |
| නව කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩමුළුව 3 අදියර | 03 | 52 | 0.027 |
| වත්කම් ලේඛණගත කිරීම, භාණ්ඩ සමීක්ෂණ හා හානි පාඩු කපා හැරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 02 | 43 | 0.016 |
| අභ්‍යාසලාභී උපාධිධාරී නිලධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩමුළුව 01 අදියර | 03 | 56 | 0.021 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩසටහන් 80ක් පවත්වන ලදි. ඒ අනුව 2019 වර්ෂයේදී පළාත් රාජ්‍ය සේවයේ නියුතු විවිධ කාර්ය මණ්ඩල නිලධාරීන් 3410 ක් පමණ පුහුණුව ලබා දී ඇති අතර ඒ සඳහා රු.මි. 3.159ක මුදලක් වැය කර ඇත.

# 5.6. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු.

1991 වර්ෂයේ ජනවාරි මස දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත වූ උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ආරම්භක පළාත් ආදායම් කොමසාරිස් වූයේ ඒ.ඩී.ජයවර්ධන මහතාය. පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිස් වූයේ එච්.බී.ඒ.සෙනෙවිරත්න මහතාය. ආරම්භයේ දී පළාත් ආදායම් කොමසාරිස්, නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරුන්ට අමතරව තක්සේරුකරු, බදු නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ද ඇතුළුව නිලධාරි මණ්ඩලය 08 දෙනෙකුගෙන් සමන්විත විය. ක්‍රමානුකූලව වර්ධනය වූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 1992 වර්ෂයේ ආයතන හා ගිණුම් අංශ පිහිටුවන ලදි. 2003 වර්ෂයේ දී පොළොන්නරුව නියෝජ්‍ය පළාත් ආදායම් කාර්යාලයක් පිහිටුවා ඒ සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලදි.

පළාතේ ප්‍රශස්ත බදු රැස් කරන්නා වශයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව නවතම පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කරමින් හා නිලධාරීන් පුහුණු කිරීම මඟින් බදු රැස්කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කර පළාතේ සංවර්ධනයට විශාල මෙහෙයක් ඉටු කරයි. වර්තමානයේ ඒ සඳහා නිලධාරින් හතළිස් දෙදෙනෙකුගේ( 42) සහය ලැබේ.

## දැක්ම

"ප්‍රශස්ත බදු රැස්කිරීමේ ක්‍රියාවලියක්, සංවර්ධිත පළාතක්."

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහිකිරීම සඳහා බදු හා ගාස්තු රැස් කිරීම, බදු හා ගාස්තු ගෙවන්නන්ගේ ආකල්ප සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය, අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගු කාලීන අරමුණු

- සියළු බදු හා ගාස්තු ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම.
- ස්වේච්ඡා බදු අනුකූලතාව වර්ධනය.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාව විසින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත, වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම්, හැකි උපරිමයෙන් රැස් කිරීම.

## ප්‍රධාන කාර්යයන්


- බදු හා ගාස්තු පැනවීම හා අයකිරීම.
- රැස් කරනු ලබන ආදායම මාසිකව වාර්තාකර පළාත් භාණ්ඩාගාරය වෙත මාරු කිරීම.
- අධිකරණ දඩ හා මුද්දර ගාස්තු වශයෙන් රැස්කරන ආදායම පළාත් පාලන ආයතනවලට බෙදාහැරීම සඳහා නිර්දේශ ලබාදීම.
- උකස් ගන්නන්ගේ ව්‍යාපාර නියාමනය කිරීම හා ගාස්තු අය කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- බදු හා ගාස්තු ගෙවන්නන්ගෙන් හා විවිධ ආයතන වලින් තොරතුරු කැඳවීම.
- බදු හා ගාස්තු ගෙවන්නන් කැඳවා සම්මුඛ සාකච්ඡා තුළින් පෙර බදු හා ගාස්තු අය කිරීම.
- බදු/ ගාස්තු ගෙවන්නන් හා නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- හිඟ බදු හා ඌණ මුද්දර ගාස්තු අය කිරීම.
  I. චංචල හා නිශ්චල දේපළ තහනම් කිරීම.
  II.බැංකු ගිණුම් තහනම් කිරීම.
  III.නඩු පැවරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 52 |
| 2 | සේවයේ නියුතු | 42 |
| 3 | පුරප්පාඩු | 10 |
| 4 | අනියම් | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 40.75 | 39.07 | 1.69 | 96 |
| ගමන් වියදම් | 0.75 | 0.75 | 0.00 | 100 |
| සැපයීම් | 1.33 | 1.32 | 0.01 | 99 |
| නඩත්තු වියදම් | 0.97 | 0.91 | 0.05 | 94 |
| ගිවිසුම් ගත සේවා | 1.94 | 1.80 | 0.14 | 93 |
| මාරු කිරීම් | 0.47 | 0.46 | 0.01 | 98 |
| **එකතුව** | **46.21** | **44.31** | **1.90** | **96** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.70 | 0.55 | 0.14 | 89 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.80 | 0.67 | 0.13 | 83 |
| **එකතුව** | **1.50** | **1.22** | **0.27** | **82.33** |

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය(%) |
|---|---|---|---|---|
| 10-02-04-05 | මත්පැන් බලපත්‍ර ගාස්තු | 63.00 | 60.80 | 97 |
| 10-02-07-01 | දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 180.00 | 149.60 | 83 |
| 10-02-07-02 | අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | 4.00 | 8.30 | 208 |
| 10-02-09-00 | පිරිවැටුම් බදු | 0.50 | 0.90 | 180 |
| 10-03-07-10 | උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු | 1.00 | 1.40 | 140 |
| 20-03-02-27 | ඖෂධ හා රසායන බද්ද | 1.00 | 1.20 | 120 |
| 20-03-02-30 | ඛනිජ බද්ද | 6.00 | 8.40 | 140 |
| 20-03-03-01 | උසාවි දඩ | 238.00 | 312.80 | 131 |
| **එකතුව** | | **493.50** | **543.40** | **110** |

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු හා සම්බන්ධ ක්‍රියාකාරකම්

01.සියළු බදු හා ගාස්තු රැස් කිරීම, ඉහළ නැංවීම මඟින් පළාතේ සංවර්ධනය.




02.නොතාරිස්වරුන් දැනුවත් කිරීම තුළින් නිසි කලට රජයේ බදු ආදායම් රැස්කර දීම.

03.බදු පැනවීමේ හා රැස් කිරීමේ සියළු ක්‍රියාවලීන් පරිගණක පද්ධතියක් තුළින් විධිමත් කිරීම මඟින්, වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව බදු රැස්කර ආදායම් ඉහළ නැංවීම.

04.ඉඩම් ඔප්පුවල වටිනාකම් පිළිබඳව මතය ලබා ගැනීමේ ක්‍රියාදාමය වර්ධනය කිරීම තුළින්, කාර්යක්ෂමව, විධිමත්ව, බදු ආදායම් කඩිනමින් රැස් කර දීම.

## කාර්ය සාධන ඉලක්ක - 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | සත්‍ය ආදායම (රු.මි) | |
|---|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2018 | 2019 |
| කාර්යක්ෂමව නිවැරදිව බදු ආදායම් රැස්කර දීම. | දෙපාර්තමේන්තු අභ්‍යන්තර ඉලක්ක ලබා දීම හා සාමූහිකව එම ඉලක්ක සපුරාලීම. | 465.50 | 498.50 | 482.30 | 543.40 |

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය (රු.මි.) (සත්‍ය ආදායම) | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| බදු හා ගාස්තු රැස් කිරීම සංවර්ධනය | වාර්ෂිකව රැස්කරන ලද බදු හා ගාස්තු ප්‍රමාණය | | 493.5 | 543.4 |
| අනෙකුත් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය සංවර්ධනය | වාර්ෂිකව රැස්කරනු ලබන තොරතුරු ප්‍රමාණය | | | |
| පළාත් සභා අරමුදලට දක්වන දායකත්වය වර්ධනය කිරීම | වාර්ෂිකව පළාත් සභා අරමුදලට බැර කළ මුදල් ප්‍රමාණය. | | | |

## විදේශාධාර මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය

මුද්දර ගාස්තු නිවැරදිව ගෙවීම සඳහා නොතාරිස්වරුන් පෙළඹවීම මත මුද්දර ආදායම ඉහළ නැංවීම, නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ ආදායම් ඉහළ නැංවීම, අනෙකුත් පළාත්වල නිලධාරීන් සමඟ සුහදත්වය තුළින් දැනුම හුවමාරු කර ගැනීම, නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීම හා දේපල තක්සේරු කිරීම සඳහා නිවැරදි ක්‍රමවේද අනුගමනය කිරීම මඟින් ඇතිවන දෙපාර්තමේන්තු කාර්යක්ෂතාවය තුළින් බදු රැස් කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගනිමින් පළාතේ ආදායම් එකතු කිරීම ඉහළ නැංවීම යන කෙටි කාලීන/දිගු කාලීන ප්‍රතිඵල ළඟාකර ගැනීමේ අරමුණින් UNDP ආධාර මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

## UNDP ආධාර මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය

| තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|
| | වෙන් කළ මු. රු. | වැය කළ මු. රු. | භෞතික (%) | මූල්‍ය (%) | |
| **නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු 2 ක් පැවැත්වීම** | | | | | පළාත් සභාවේ ආදායම් ඉහළ යාම තුළින් පළාතේ සංවර්ධනය කඩිනම් වීම |
| වෙළඳපළ වටිනාකමට ඔප්පු ලිවීමට පෙළඹවීම හා වටිනාකම් පිළිබඳව තක්සේරුකරුවන්ගේ මතය ලබා ගැනීමට දැනුවත් කිරීම. | 0.50 | 0.50 | 100 | 100 | |
| **දෙපාර්තමේන්තුවේ නව දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.** | | | | | |
| ආදායම් එකතු කිරීම පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | 1.20 | 1.17 | 90 | 97 | |
| **උපායශීලි උපදේශන වාර්තාවක් පිළියෙල කිරීම** | | | | | |
| ආදායම් ඉහළ නැංවීම | 0.30 | - | 0 | 0 | |
| **වෙනත් පළාත් ආදායම් කාර්යාලවල අධ්‍යයන** | | | | | |
| දෙපාර්තමේන්තු පරිපාලන කටයුතු හා ආදායම් රැස් කිරීමේ කටයුතු අධ්‍යයනය කිරීම. | 0.30 | 0.18 | 60 | 61 | |
| **ධාරිතා සංවර්ධන වැඩසටහන් හා G I S පුහුණු පාඨමාලා පැවැත්වීම, පේරාදෙණිය/ජයවර්ධනපුර විශ්වවිද්‍යාල** | | | | | |
| තාක්ෂණික දැනුම හා කුසලතා වර්ධනය කිරීම | 0.50 | 0.36 | 55 | 71 | |
| **නව පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කිරීම** | | | | | |
| මෘදුකාංගය යාවත්කාලීන කිරීම | 0.30 | 0.11 | 70 | 35 | |
| **උපායශීලි උපදේශන වාර්තාවක් පිළියෙල කිරීම** | | | | | |
| ආදායම් ඉහළ නැංවීම | 0.30 | - | 0 | 0 | |
| **වෙනත් පළාත් ආදායම් කාර්යාලවල අධ්‍යයන** | | | | | |
| දෙපාර්තමේන්තු පරිපාලන කටයුතු හා ආදායම් රැස් කිරීමේ කටයුතු අධ්‍යයනය කිරීම. | 0.30 | 0.18 | 60 | 61 | |
| **ධාරිතා සංවර්ධන වැඩසටහන් හා G I S පුහුණු පාඨමාලා පැවැත්වීම,පේරාදෙණිය/ජයවර්ධනපුර විශ්වවිද්‍යාල** | | | | | |
| තාක්ෂණික දැනුම හා කුසලතා වර්ධනය කිරීම | 0.50 | 0.36 | 55 | 71 | |
| **නව පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කිරීම** | | | | | |
| මෘදුකාංගය යාවත්කාලීන කිරීම | 0.30 | 0.11 | 70 | 35 | |
| **පරිපාලන වියදම්** | | | | | |
| කම්ටු රැස්වීම | 0.25 | 0.25 | 100 | 100 | |
| **උපකරණ මිලදී ගැනීම්.** | | | | | |
| පරිගණක,කැමරා,ස්කැනර්, ලැප්ටොප් මිලදී ගැනීම. | 0.50 | 0.38 | 80 | 76 | |
| **උකස් ප්‍රඥප්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව** | | | | | |
| උකස් ව්‍යාපාරිකයින්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම | 0.50 | 0.16 | 100 | 32 | |
| **ඉඩම් රෙජිස්ටාර් කිරීම සඳහා පරිගණක 02ක් මිලදී ගැනීම** | | | | | |
| කඩිනමින් ඉඩම් තොරතුරු ලබා ගැනීම | 0.25 | - | 0 | 0 | |

## තම ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේ දී ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අදහස් හා යෝජනා

2020 දී රැස්කිරීමට අපේක්ෂිත ආදායම් ඇස්තමේන්තු

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුව(රු.මි.) |
|---|---|
| මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | 63.00 |
| දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 180.00 |
| අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | 5.00 |
| ව්‍යාපාර පිරිවැටුම් බදු | 0.30 |
| ඖෂධ හා රසායන බදු | 1.00 |
| ඛනිජ සම්පත් මත බදු | 6.00 |
| උසාවි දඩ | 240.00 |
| උකස් බලපත්‍ර ගාස්තු | 1.00 |

## ආයතනයේ අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

ඉඩම් ඔප්පු පරීක්ෂා කිරීම හා යාවත්කාලින කිරීම, මහජනතාව දැනුවත් භාවයෙන් යුක්තව බදු ගෙවීම, වාර්ෂිකව ආදායම් ඉලක්ක සම්පූර්ණ කරගැනීම, නිලධාරීන්ට තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ දැනුම අවබෝධය ලබා දීම, මුද්දර ආදායම ඉහළ නැංවීම, මුද්දර බදු ආදායම ඉහළ නැංවීම, නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමෙන් දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය වැඩි කිරීම තුළින් පළාතේ ආදායම ඉහළ නැංවීම, ආදායම් පරිපාලනය කිරීමේ කටයුතු නිවැරදිව හා කාර්යක්ෂමව කිරීමට හැකි වීම තුළ පළාතේ නව ආදායම් මාර්ග හඳුනා ගැනීම මඟින් ආදායම් උත්පාදනය ඉහළ නැංවීමටත් ඒ තුළින් ජාතික මට්ටම කෙරෙහි උතුරු මැද පළාතේ දායකත්වය වර්ධනය කිරීමටත් 2020-2021 වර්ෂවලදී ඉලක්කගත කෙරේ.

## ආයතනයේ අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය 2020-2021

| ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|
| **2020** | **2021** | |
| **සියළු බදු හා ගාස්තු ආදායම රැස් කිරීම,ඉහළ නැංවීම** | | |
| 2020 දී කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම. | – | මුද්දර ආදායම ඉහළ නැංවිම |
| **ස්වේච්ඡා බදු අනුකූලතා වර්ධනය** | | |
| 2020 වර්ෂය වනවිට මතය ලබා ගැනීමේ ප්‍රතිශතය 50%ක් දක්වා ඉහළ නංවා ගැනීම. | 2021 වර්ෂය වනවිට මතය ලබා ගැනීමේ ප්‍රතිශතය 75%ක් දක්වා ඉහළ නංවා ගැනීම. | මුද්දර බදු ආදායම ඉහළ නැංවිම |
| **වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම් හැකි උපරිමයෙන් රැස් කිරීම.** | | |
| බදු කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම. | තව දුරටත් අවශ්‍ය පුහුණුව ලබාදීම. | නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමෙන් දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය වැඩි කිරිම තුළින් පළාතේ ආදායම ඉහළ නැංවීම |
| **ආදායම එකතු කිරීම, පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම** | | |
| පරිගණක ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.(මාසික ආදායම් වාර්තා හා හිඟ ආදායම් වාර්තා පිළියෙල කිරීම) | සියළු ආදායම් ප්‍රභවයන් සඳහා පරිගණක ක්‍රමවේදය ව්‍යාප්ත කිරීම | ආදායම් පරිපාලනය කිරීමේ කටයුතු නිවැරදිව හා කාර්යක්ෂමව කිරීමට හැකි විම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස.

කාර්ය සාධනය කරා ළඟා වීමේ දී දෙපාර්තමේන්තුවේ තනතුරු පුරප්පාඩු පැවතීම, වාහන පහසුකම්වල හිඟතාවය වැනි ගැටළුවලට මුහුණ දීමට මෙම වර්ෂයේදී ද සිදු විය.

2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව ආදායම් ප්‍රභවයන් 08 ක් යටතේ රැස්කළ යුතු සමස්ත ආදායම් ඇස්තමේන්තුව රු.මි. 493.5 වූ අතර එම වර්ෂය සඳහා ආදායම් රැස් කිරීම රු. මි.543.4 කි. ඒ අනුව සමස්ත ආදායම 110 % කින් සම්පූර්ණ කිරීමට හැකිවී තිබේ.

මත්පැන් බලපත්‍ර ගාස්තු හා දේපළ පැවරීම මත මුද්දර ගාස්තු මගින් ආදායම් ඇස්තමේන්තු කරා ළගාවීමට නොහැකිවී ඇත. ඊට හේතු වන්නේ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නිකුත් කරනු ලබන මත්පැන් බලපත්‍රවලට අදාළව චෙක්පත් එවීමේ ප්‍රමාදය හා පසුගිය වසරේ අප්‍රේල් මස ඇති වූ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපළ හුවමාරු වෙළඳපළ කඩා වැටීමයි.ආර්ථිකයේ පැවති අයහපත් තත්ත්වයද ඊට බලපා ඇත.

අනෙකුත් සියළු ආදායම් ප්‍රභවයන් ඇස්තමේන්තු ප්‍රමාණයන් ඉක්මවා රැස්කිරීමට හැකි වී තිබේ. එනම් අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු 207% ක්ද, පිරිවැටුම් බද්ද 188% ක්ද , උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු 135 % ක්ද ඖෂධ හා රසායන බද්ද 122% ක්ද, ඛනිජ බද්ද 140% ක්ද, උසාවි දඩ 131% ක්ද වශයෙන් ඇස්තමේන්තු ඉලක්ක ඉක්මවා රැස්කිරීමට හැකිවී තිබේ.

දෙපාර්තමේන්තුවේ ඉහළ තනතුරුවල පුරප්පාඩු පැවතියද කාර්ය මණ්ඩලයේ කැපවීම හා උනන්දුව මත අනෙකුත් නිළධාරීන්ගේ රාජකාරිද ආවරණය කරමින් එම ප්‍රගතිය ලබා ගැනීම සඳහා සමස්ත කාර්ය මණ්ඩලය මෙහෙයවීමට හැකි විය.

# 06.ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදි කිරිම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ඉටු කිරීමට පැවරී ඇති විෂයන් වශයෙන් පළාතේ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික යන විෂයන්ට අදාල කටයුතු මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම  සඳහන් කළ හැකි ය. මේ යටතේ පවතින දෙපාර්තමේන්තු වන්නේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව යි. ව්‍යවස්ථාපිත ආයතන වන්නේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය, පුස්තකාල සේවා මණ්ඩලය හා මුල් ළමාවිය සංවර්ධන අධිකාරියයි. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම්, මුදල්, ආයතන , අධ්‍යාපන , හා ප්‍රසම්පාදන කටයුතු යන අංශ කිහිපයකට බෙදී අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ.

## දැක්ම හා මෙහෙවර

**මෙහෙවර**

" සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව පළාත් පාලනය, පළාත් මාර්ග, ග්‍රාමීය යටිතල පහසුකම්,විකල්ප බලශක්ති,ජනමාධ්‍ය හා සන්නිවේදනය, පුස්තකාල, මුද්‍රණ හා තාක්ෂණික සේවා, ජනතා සුභසාධනය හා සවිබල ගැන්වීම, සංචාරක, අධ්‍යාපනය, සංස්කෘතික, මුල් ළමාවිය අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීම සහ පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම

**දැක්ම**

යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක්


## දිගුකාලීන අරමුණු

- අධ්‍යාපන සංවර්ධනය තුළින් ගුණාත්මකභාවයෙන් යුක්තව පළාතේ දරුවන් සඳහා ඵලදායි සේවාවක් සැපයීම සඳහා යෝග්‍ය වූ ආයතන ලෙස නියාමනය කිරීම.
- උතුරු මැද පළාත තුළ දේශිය විදේශිය සංචාරක කර්මාන්තය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරිම.
- උතුරු මැද පළාතේ පරිසර හිතකාමී විකල්ප බලශක්ති ක්‍රමවේදයක් ලෙස සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන සූර්ය විථි ලාම්පු හා සූර්ය පැනල් මඟින් ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ලබා දිම.
- පූර්ව ළමා විය අවධියේ දී ලබා ගත යුතු කුසලතා ලබා දීම හා ඔප් නැංවීම හා පාසල් අධ්‍යාපන යට හුරු කිරීම.
- ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවිම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම.
- ජීවනෝපාය සංවර්ධනය තුළින් උතුරු මැද ජනතාවගේ ආර්ථික හා සමාජීය තත්ත්වය ඉහළ නැංවිම.
- උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරිම හා පුස්තකාල සේවා සංවර්ධනය.
- උතුරු මැද පළාතේ පොදු මහජනතාවට ගුණාත්මක භාවයෙන් ඉහළ පළාත් පාලන සේවාවක් ලබා දීම, සහතික කිරිම සඳහා එම ආයතන නියාමනය කිරිම.
- උතුරු මැද පළාතේ සංස්කෘතික අංගයන් හා කලා ශිල්ප ප්‍රවර්ධනය.

## කෙටිකාලීන අරමුණු

- පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම හා විධිමත් සංවර්ධනයක් තුළින් ජනතාවගේ දෛනික කටයුතු පහසු කිරීම.
- ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබාගත හැකිවන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- යටිතල පහසුකම් පද්ධතීන් විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරීම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරීම හා පළාත තුළ ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම.
- රටේ ජීවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවීම.
- පළාත් සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරීම.
- අධික විදුලි අවශ්‍යතාවයන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වාදීම.
- සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංචාරක ගම්මාන ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

❖ නීතිය හා සාමය පවත්වා ගැනීමට පළාත් සභාව සියළු ආරක්ෂක අංශ ඒකාබද්ධව ක්‍රියාත්මක වීම.

❖ පළාත් පාලනය ආයතන පරිපාලනය කිරීම හා මූල්‍ය පාලනය සඳහා මාසික, ත්‍රෛයිමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

❖ පළාතේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.

❖ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු යහපත් පරිසරයක සිට සාර්ථකව ක්‍රමවත් ලෙස ලබා දිම සඳහා ආයතනයේ ගොඩනැගිලි සංවර්ධනය කිරිම.

❖ ගුණාත්මක සංචාරක කර්මාන්තයක් තුළින් දේශිය ආදායම ඉහළ නැංවිම.

❖ බල ශක්ති සඳහා වැයවන මුදල් අවම කිරිම.

❖ පූර්ව ළමා විය සංවර්ධනය සඳහා නිලධාරින් වෙනුවෙන් විධිමත් පුහුණුවක් ලබා දිම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.

❖ පළාත තුළ පුස්තකාල සේවාව සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණ උපකරණ ලබා දිම මගින් ග්‍රාමිය ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




**1** — සෑම දෙසකම, සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිමා කිරීම




**4** — පරිපූර්ණ ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.





**5** — ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.




**6** — සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීම සහ තිරසර කළමනාකරණය




**7** — දැරිය හැකි, විශ්වසනීය,තිරසර නව බලශක්ති සැපයුම සහතික කිරීම




**8** — ධරණීය, සංයුක්ත හා තිරසර ආර්ථික වර්ධනය, සැමට පූර්ණ සහ ඵලදායි රැකියා හා නිසි කාර්ය ප්‍රවර්ධනය





**9** — ස්ථායි යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරි ගැන්වීම




**11** — නගර හා ජනාවාස ඇතුළත්, සුරක්ෂිත, ස්ථායි සහ තිරසරකරලීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 111 |
| 2 | සේවයේ නියුතු | 71 |
| 3 | පුරප්පාඩු | 40 |
| 4 | අධි සේවක පදනම | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 54.01 | 53.19 | 0.82 | 98 |
| ගමන් වියදම් | 3.5 | 2.36 | 1.14 | 67 |
| සැපයීම | 12.41 | 6.65 | 5.76 | 54 |
| නඩත්තු වියදම් | 4.65 | 3.44 | 1.21 | 74 |
| ගිවිසුම්ගත සේවා | 37.83 | 32.21 | 5.62 | 85 |
| මාරු කිරීම් | 144.22 | 128.59 | 15.63 | 89 |
| **එකතුව** | **256.62** | **226.44** | **30.18** | **88** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම | 264.83 | 99.08 | 165.75 | 37 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.59 | 0.34 | 0.25 | 58 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 680.72 | 416.13 | 264.59 | 61 |
| **එකතුව** | **946.14** | **515.55** | **430.58** | **54** |

## ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිය පසුගිය වර්ෂ වලදී ක්‍රියාත්මක වූ TJC අඹ වගා ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය හා වගාව සම්බන්ධයෙන් මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම

| | |
|---|---|
| ව්‍යාපෘතියේ නම | **පසුගිය වර්ෂවලදී ක්‍රියාත්මක වූ TJC අඹ ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය හා වගාව සම්බන්ධයෙන් මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම** |
| ව්‍යාපෘති අංකය | 19/610/52/04/2502/23(xxiii) /N/C/03 |
| වෙන්කළ මුදල | රු. 2000,000.00 |
| වියදම | රු. 1,740,225.50<br>(2019.12.15 දිනට වියදම) |
| ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය | 96% |

උතුරු මැද පළාතේ ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම සඳහා වාණිජ වගාවක් ලෙස ආන්තික ඉඩම් යොදා ගනිමින් අක්කර 500 ක TJC අඹ වගා කිරීමට 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා පූර්ණ අධීක්ෂණ කටයුතු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ. ඒ අනුව අඹ වගා අයදුම්කරුවන්ගේ ඉඩම් වගාව සඳහා සුදුසු ද යන්න පරීක්ෂා කිරීම කෘෂිකර්ම උපදේශකවරුන් මගින් සිදුකර ඒ සඳහා නිර්දේශයන් ලබාගෙන සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන පැල බෙදා දීම සිදුකර ඇත. 2015/2016 වර්ෂවල ප්‍රතිලාභීන් 521 ක් සඳහා අක්කර 290.38 කට අඹ පැල 21301 ක් බෙදාදී ඇත. එමෙන්ම 2017/2018 වර්ෂවල ප්‍රතිලාභීන් 302ක් සඳහා අක්කර 203.5කට අඹ පැල 14272 ක් මේවන විට බෙදාදී ඇත. ඒ අනුව මුළු ඉඩම් අක්කර 493.88ක් වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් 823 ක් සඳහා අඹ පැල 35573 ක් බෙදාදී තිබේ.

කෘෂිකර්ම උපදේශකවරුන්ගෙන් ලබාගත් තොරතුරු අනුව මේ වන විට ක්ෂේත්‍රයේ තිබෙන මුළු පැල ගණන 12,076 ක් වන අතර එයින් පැල 7,343 ක් එල දරණ ගස් වන අතර අනෙකුත් ගස්වල මල් හටගෙන ඇත. 2015/2016 වර්ෂවල වගාකරන ලද TJC අඹ වගාවේ අස්වැන්න මේ වසර අවසන් වනවිට ලබාගැනීම ආරම්භ වන බැවින් අඹ වගාකරුවන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපල වටිනාකම වැඩිකිරීම සහ හොඳ අස්වැන්නක් ලබාදීම අරමුණු කරගෙන උසස් තත්ත්වයේ පරිසර හිතකාමී TJC අඹ ආවරණ කවර ආදර්ශයක් ලෙස 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව ලබාදීමට කෘෂිකර්ම උපදේශකවරුන්ගේ නිර්දේශය මත වගාකරුවන්ගේ වගාවන් හි දැනට පවතින පැල සංඛ්‍යාව පදනම් කරගෙන එල ආවරණ 87,950ක් මිලදී ගෙන 2015/2016 වගාකරුවන් වෙත බෙදා දෙන ලදී.

ඊට අමතරව පහත ක්‍රියාකාරකම් 2019 වර්ෂයේදී ඉටු කර ඇත.

- 2017/2018 වර්ෂවල පැල බෙදාදුන් TJC අඹ වගා ව්‍යාපෘතියේ සියළුම අඹ වගාකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන සහ ඔවුන්ගේ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම.




- ක්ෂේත්‍රයේ තාක්ෂණික සහය ලබාදීම, අධීක්ෂණ තොරතුරු ලබාගැනීමේ කටයුතු හා නිරන්තර මඟපෙන්වීම.

ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර මෙම ව්‍යාපෘතිය ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හා කෘෂිකර්ම අමාත්‍යාංශයට පවරා ඇත.

## සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා පළාතේ දායකත්වය

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් ජාත්‍යන්තර යුනෙස්කො සංවිධානය විසින් 1982 වර්ෂයේ නම් කරන ලද ලෝක උරුම නගරයකි. ඊට හේතු වනුයේ ශ්‍රී ලංකාවේ පළමු අග නගරය වීමත්, වාරි කර්මාන්තය අතින් ඉහළ නිර්මාණයන් බිහිවීම සහ ජාතික උද්‍යානවලින් පිරි පාරිසරික වටිනාකමින් යුත් දිස්ත්‍රික්කයක් වීමයි. සුවිසල් දාගැබ් හා ලොව පුරා බැතිමතුන්ගේ වන්දනාවට ලක් වන්නාවූ පැරණි නගරය ආශ්‍රිතව ඉදිකර ඇති මහා දාගැබ් හා නටඹුන් නගරයේ සංචාරක ආකර්ෂණය වැඩි කිරීමට ප්‍රබල සාධකයන්ය.

මෙම නගරයට පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ ප්‍රමාණය දිනෙන් දින වැඩි වුවද, පැමිණෙන සංචාරකයින් අනුරාධපුර නගරයේ නේවාසිකව නතර නොවීම හේතුවෙන් විදේශ විනිමය අනුරාධපුර සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන්හට නොලැබීම හේතුවෙන් සංචාරක කර්මාන්තයේ ගැටළු මතුවී ඇත. පසුගිය 2017 වසර තුළ විදේශීය සංචාරකයින් 89000 අධික පිරිසක් ද, 2018 වසර තුළ 99500 අධික සංචාරකයින් ප්‍රමාණයක් පැමිණ ඇති බව මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් නිකුත් කරන ප්‍රවේශ පත්‍ර අලෙවි සංඛ්‍යා ලේඛණ මගින් මනාව පිළිබිඹු කරයි.




2018 වර්ෂයේ ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරක ප්‍රමාණය මිලියන 2.3 සාපේක්ෂව බලන විට මෙම නගරයට පැමිණෙන සංචාරක ප්‍රමාණය ඉතාමත් පහළ අගයක් ගන්නා බව තව දුරටත් පැහැදිළි වේ. ඊට පිළියමක් ලෙස පැමිණෙන විදේශීය සංචාරකයින් දින කිහිපයක් අනුරාධපුර නගරය තුළ රඳවා තබා ගැනීමට පිළියමක් ලෙස විවිධ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කර ඇත.

අනුරාධපුරයට පැමිණෙන විදේශ සංචාරකයින් ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් සංවිධානය කළ වැඩසටහන් අතර ජාතික මට්ටමේ ප්‍රදර්ශන පැවැත් වීම , වෙබ් වැඩසටහන් විකාශනය කිරීම (ආදරණීය ශ්‍රී ලංකා), අත්පත්‍රිකා හා සඟරා බෙදා හැරීම හා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ එක් වී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය සිදු කරන ලදී.

මීට සමගාමීව මෙම වසරේ පළමුවරට විදේශීය සංචාරකයින් සඳහා දේශීය සංස්කෘතික නැටුම් හා අංගම් හරඹ ඇතුළත් නැටුම් සංදර්ශනයක් පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව හා අනුරාධපුර නගර සභාව සමග එක්ව සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් පළාත් ප්‍රධාන අමාත්‍යාංශය සැලසුම් කරන ලදි . මෙම වැඩසටහන අනුරාධපුර කුම්බිච්චන්කුලම වැව අභියස පළමුවරට පැවැත්වූ අතර, ඒ සඳහා පූර්ව කිසිදු ප්‍රචාරයක් නැතිව විදේශීය සංචාරකයින් 50ක් සහ දේශීය සංචාරකයින්ගේ විශාල ප්‍රමාණයක් සහභාගීවූ අතර විදේශීය සංචාරකයින් ධනාත්මක ප්‍රතිචාරයක් තිබූ බැවින් මෙම වැඩසටහන තවදුරටත් ඉදිරියට කරගෙන යෑම සුදුසු වේ.

මෙම වැඩසටහනේ දෙවන පියවර වශයෙන් අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ අතර දෙවන අදියර වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සංචාරක හෝටල් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇති නුවර වැව අසල ඇති රන්දිය ,මිරිදිය, රජරට හෝටල් අසල උද්‍යානයේදී මෙම සංදර්ශණය පවත්වන ලදී.

- ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 60
- ආවරණය කරන ලද පළාත - උතුරුමැද පළාත
- වෙන්කල මුදල - රු.ලක්ෂ 4
- ප්‍රතිශතය - 92%
- මූල්‍ය ප්‍රගතිය - 368,650.00

## සංචාරක වැඩසටහනේ ප්‍රධාන අරමුණු

- ❖ උතුරු මැද පළාත් සංචාරක කර්මාන්තය නගා සිටුවීම මෙන්ම උතුරු මැද පළාතට ආවේණිකව වූ දේශීය කලා ශිල්ප තුළින් විදේශීය සංචාරකයින් දැනුවත්කර සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම.
- ❖ අනුරාධපුර දිස්ත්‍රික්කයට පැමිණෙන විදේශීය සංචාරකයින් සංචාරය කර එදිනම වෙනත් ප්‍රදේශයකට සංචාරය කරන අතර අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ දින ගණනාවක් රඳවා ගැනීමේ උපක්‍රමයක් වශයෙන් රාත්‍රී කාලයේ සංදර්ශණ පැවැත්වීම.
- ❖ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක හෝටල්,සංචාරක මාර්ග උපදේශකයිගේ හා සංචාරකයින් ප්‍රවාහනය කරන්නන්ගේ අදායම චක්‍ර වශයෙන් වර්ධනය කිරීමට දායක වීම.
- ❖ සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම තුළින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා නිවැරදි හා ගුණාත්මක බවින් යුත් තොරතුරු ලබාදීම.
- ❖ සංචාරක සත්කාරක සේවා පුහුණු වැඩසටහන යටතේ පුහුණු පාඨමාලා පිළිබඳ දැනුවත් කර හෝටල් ක්ෂේත්‍රයේ විදේශීය රැකියා සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරීම.
- ❖ ප්‍රංශ භාෂා පුහුණු වැඩසටහන යටතේ විදේශ භාෂා පුහුණු ලබාදීම තුළින් විවිධ ක්ෂේත්‍රයන්හි විදේශීය රැකියා අවස්ථාවන් සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරීම.
- ❖ සංචාරක කර්මාන්තයේ නියැලි සිටින විවිධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ මාධ්‍යයන් ක්‍රියාත්මක කිරීම තුළින් ගුණාත්මක සංචාරක කර්මාන්තයක් පළාත තුළ ඇති කිරීම.
- ❖ සංචාරක කර්මාන්තයට සම්බන්ධ පර්ශවකරුවන් පුහුණු කිරීම හා ධාරිතා සංවර්ධනය.

## ශ්‍රී ලංකා ගුවන් හමුදා අනුරාධපුර කඳවුරේ ගුවන් ගමන් පර්යන්තය වැඩි දියුණු කිරීම - II අදියර



වසර 30 ක පැවති යුද්ධය නිමා වීමත් සමග දෙස් විදෙස් සංචාරකයින් විශාල ප්‍රමාණයක් ගුවනින් අනුරාධපුරයට පැමිණීමත් සමග ඒ සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් 2018 වර්ෂයේ මිලියන 3.5 වියදම් කොට ගුවන් පර්යන්තය භාවිත කිරීමෙන් අනතුරුව එහි පැවැති සාර්ථකත්වය මත II අදියරේ ඉදිකිරීම් ආරම්භ කරන ලදි.

II අදියර යටතේ ගුවන් ගමන් මෙහෙයුම් ගොඩනැගිල්ලේ ගුවන් මගින් පැමිණ විවේක ගන්නා ස්ථානය (waiting room) වැඩි දියුණු කිරීම,අලෝකකරණයට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දිම,ගුවන් නියමුවන් සඳහා විවේකාගාරය සකස් කිරීම විශේෂ අමුත්තන් පර්යන්තය ( v I p room) සකස් කිරීම,සනීපාරක්ෂක පහසුකම් සකස් කිරීම, ගුවන් මගින් රැදී සිටින ස්ථානයට පැමිණීම සහ පිටත් වීම ලෙස වෙන් කිරීම් ආදි කටයුතු සිදුකරන ලදි. මේ සඳහා වෙන් කළ මුදල රු .මි 5799420.75ක් වු අතර මේ වනවිට වැය කළ මුදල රු.මි 5799420.75කි.

## ජීවිතාරක්ෂක පුහුණු වැඩසටහන

උතුරු මැද පළාතේ පිහිනීමේ හැකියාවන් ඇති තරුණ තරුණියන් හා සංචාරක ගෙවල් තුළ පිහිණුම් තටාක තුළ සේවය කරන ජීවිතාරක්ෂකයින්ගේ තත්වය වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් I.L.S. ජාත්‍යන්තර ජීවිතාරක්ෂක පිහිනුම් තටාක සහතික පාඨමාලාවන් පවත්වන ලදී. ඒ සඳහා 53 දෙනෙකු සහභාගි වූ අතර දින 06 ක් පමණ පවත්වන ලදී.

එම පුහුණුව න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් යුත් ජාත්‍යන්තර මට්ටමේ පුහුණුකරුවන් විසින් පවත්වන ලදි. ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දෙනුයේ ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය මගිනි. එම පුහුණුව අවසන් කරන පුහුණුලාභීන් සඳහා දේශිය හා විදේශීය රටවල පිහිනුම් තටාක, ජීවිතාරක්ෂක රැකියා ලබා ගැනිම සඳහා සුදුසුකම් සපුරා ගත හැකි පුහුණු වැඩසටහනක් ලෙස හැදින්විය හැකිය.

ජීවිතාරක්ෂක උපකරණ මිලදි ගැනීම වෙනුවෙන් අනුරාධපුර ප්‍රධාන වැව් තුළ ජීවිතාරක්ෂක සේවයේ නියුතු ජීවිතාරක්ෂක නිළධාරින් සඳහා අවශ්‍ය උපකරණ කට්ටල ලබා දිම සිදු කළ අතර ඒ සඳහා වෙන්කළ මුදල රු.මි.03කි. ජීවිතාරක්ෂක පුහුණු වැඩසටහන මගින් උතුරු මැද පළාතේ රැකියා විරහිත, පිහිනීමට හැකියාවක් ඇති තරුණ තරුණියන් සඳහා දේශිය විදේශිය වශයෙන් ඇති පිහිනුම් තටාකවල ජීවිතාරක්ෂකයන් ලෙස සේවය කිරීමට පුහුණුව ලබා දීම සිදු කරන ලදී. අනුරාධපුර නගරයේ ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය මගින් උතුරු මැද පළාත තුළ දින 06 ක් ප්‍රයෝගික හා න්‍යායාත්මක දැනුම ලබා දෙන ලදි. මෙම වැඩසටන සඳහා රු.990,000.00 මුදලක් වැය කරන ලද අතර පුහුණුලාභීන් 50 දෙනෙකු ඒ සඳහා සහභාගී වන ලදි.

## ප්‍රජා සංචාරක ගම්මාන වැඩසටහන (Home Stay)

සංචාරක කර්මාන්තයේ එක් අංගයක් වන ප්‍රජා සංචාරක ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතීන් ගම් මට්ටමින් එළි දැක්විම මගින් ශ්‍රී ලාංකීය ගැමි සංස්කෘතික වටිනාකම සංචාරකයින්හට ලබා දීමේ අරමුණින් ගෘහස්ථ සංචාරක වැඩසටහන විල්පත්තුව (හුණුවිලගම) ප්‍රතිලාභින් 17 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදි. 2018 වසර තුළ ඔවුන්ගේ ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කළ අතර 2019 වසර තුළදී ප්‍රතිලාභින් සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික ප්‍රතිලාභ ලබා දීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා සංචාරක අමාත්‍යංශය සම්බන්ධ වී ඇත.

## ලෝක සංචාරක දින සැමරුම - 2019



අනුරාධපුර නගරයේ සංචාරක ක්ෂේත්‍රයේ නියුතු පාර්ෂවකරුවන්ගේ සහභාගිත්වයෙන් ලෝක සංචාරක දින සැමරුම පවත්වන ලදි. අනුරාධපුර නගර සභාව හා පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව හා එක්ව දෙස් විදෙස් සංචාරකයින් සඳහා සංස්කෘතික සංදර්ශනයක් පැවැත්වීම, ත්‍රිවිල් රථ සංගමය මඟින් පූජා නගරය තුළ රථ පෙළපාලියක් තිබිම හා පාරිසරික සංරක්ෂණ ක්‍රමවේදයක් ලෙස කුම්බිච්චන්කුලම උද්‍යානය අවට කසල බඳුන් ස්ථාපිත කිරීම සඳහා කසල බඳුන් කට්ටල 12ක් ලබා දිම සිදු කරන ලදී. සංචාරකයින් සඳහා සංස්කෘතික සංදර්ශනයක් හා පාර්ශවකරුවන් සඳහා ප්‍රතිලාභ ලබාදීමේ වැඩසටහනක් මෙදින ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා වැය කළ මුදල රු.මි. 450,000.00කි.

## ධාරිතා සංවර්ධන පුහුණුව



සංචාරක ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවකරුවන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරිමේ අරමුණින් මෙම වැඩසටහන තෙදිනක් පුරා අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පවත්වන ලදී.එහිදී රජරට විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන්ගේ හා සංචාරක සේවා සපයන ආයතනවල ප්‍රධානීන්ගේ අදහස් හා දැනුම පාර්ශවකරුවන් අතර බෙදාගන්නා ලදි. මීට සමගාමීව වනජීවි සංරක්ෂණය හා වනජීවින් දැකගත හැකි ස්ථාන නැරඹීම (විල්පත්තුව) අභය භූමිය හා පාරිසරික සංචාරක කර්මාන්තයට හිමිකම් පාන forest rock හෝටලය නැරඹීමද මෙහිදී සිදු විය. මේ සඳහා පාර්ශවකරුවන් 65 දෙනෙකු සහභාගි විය. මූල්‍ය දායකත්වය (රු මිලි 1) පළාත් සංචාරක අමාත්‍යංශය මගින් දරන ලදී.

## උතුරුමැද පළාත් සංචාරක මර්ගෝපදේශ නිලධාරීන් පුහුණු කිරීම

ක්‍රියාකාරකම් -:

1. උතුරුමැද පළාතේ ස්ථිර පදිංචි වයස අවුරුදු 18 වැඩි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසු පුද්ගලයින් තෝරා ගැනීම.
2. තෝරා ගන්නා ලද පුහුණුලාභීන් සඳහා පැය 190 දේශනයක් පැවැත්වීම. දේශනයන් සඳහා විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් හා සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ සම්පත්දායකයින් සහභාගි කර ගැනීම.
3. උතුරුමැද පළාතේ පිහිටි සංචාරක ආකර්ෂණීය ස්ථානවල දින 05 ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
4. පාඨමාලාව අවසානයේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම.
5. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ සමත්වන පුහුණුලභීන්හට ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශ බලපත්‍රය වර්ෂ දෙකකට වලංගු වන සේ ලබා දීම. මේ සඳහා රු.මි 93.2ක මුදලක් වෙන් කරන ලද අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 28කි.




අනුරාධපුර සංචාරක ස්ථාන දැක්වෙන සිතියම නිර්මාණය කිරිම



හබරණ සංචාරක මධ්‍යස්ථාන හා සංචාරක නගර ව්‍යාපෘතිය

## අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ තෝරාගත් පොදු හා සංචාරක ආකර්ෂණීය ස්ථානයන් හි සූර්ය වීදි ලාම්පු සහ තෝරා ගත් පාසල්වල සූර්ය පැනල ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය




බලශක්ති මාධ්‍යයක් ලෙස සූර්ය විදුලි බලය ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව විශාල වශයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. වර්තමානයේ නාගරික ප්‍රදේශ ආශ්‍රිතවද ඉල්ලුමක් ඇති වීම නව ප්‍රවණතාවක් ලෙස දක්නට හැක. ඉහළ යන ලෝක ඉන්ධන අර්බුධයත් සමඟ විකල්ප බලශක්ති භාවිතය කෙරේ ඉහළ අවධානයක් යොමු වී තිබෙන අතර සූර්ය විදුලි බලය ඒ අතර ඉහළ අවධානයකට ලක් වී තිබේ.


උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 2 හි ප්‍රාදේශීය සභා මට්ටමින් තෝරාගත් සංචාරක ආකර්ශණ ස්ථානයන් හි සූර්ය වීදි ලාම්පු සවිකිරීම , ජාතික විදුලිබල පද්ධතිය මගින් විදුලිය ලබාගත නොහැකි මහජනතාව නිතර ගැවසෙන ස්ථානයන්හි සූර්ය වීදි ලාම්පු සවිකිරීම සහ නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් පාසල් 12 ක් සඳහා සූර්ය පැනල ස්ථාපිත කිරිම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරන ලදී.

මහජනතාව අතර පරිසර දූෂණයෙන් තොර විකල්ප බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම හා බල ශක්තිය අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීම හා විශාල බල ශක්ති ප්‍රමාණයක් ඉතිරි කරදීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු විය. මෙම ව්‍යාපෘතිය උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, පළාත් පාලන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා හා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය , එක්ව ක්‍රියාත්මක කළ සංචාරක ආකර්ෂණය ඇති ස්ථානයන්හි සහ ජාතික විදුලිබල පද්ධතිය මගින් විදුලිය ලබා ගත නොහැකි මහජනතාව ගැවසෙන ස්ථානවල සූර්යවිදි ලාම්පු සවිකරන ලදි. පළාත් පාලන ආයතන 26 ආවරණය වන පරිදි සූර්ය වීදි ලාම්පු ස්ථාපිත කළ අතර , අධ්‍යාපන කලාප කාර්යාල මගින් මාසිකව වැඩිම මාසික විදුලි පරිභෝජනයක් සිදුවන පාසල් 12 ක් සඳහා සූර්ය විදුලි පැනල ස්ථාපිත කරන ලදි.

## අනුරාධපුර සංචාරක අකර්ශනීය ස්ථාන දැක්වෙන සිතියමක් නිර්මාණය කිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සංචාරක ආකර්ශනිය ස්ථාන දැක්වෙන සිතියමක් නිර්මාණය කිරීම මේ යටතේ සිදු විය.මේ සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 500,000.00කි.




## අවුකන පුදබිම ආශ්‍රිතව සනීපාරක්ෂක සංකීර්ණය ඉදිකිරීම

අවුකන පුදබිම වෙත පැමිණෙන්නා වූ දෙස් විදෙස් සංචාරකයින් හා බැතිමතුන් පාදකකර මෙම සනීපාරක්ෂක පද්ධතිය ඉදිකරන ලදි.

## තන්තිරිමලේ පුදබිම ආශ්‍රිතව සනීපාරක්ෂක පද්ධතියක් ඉදි කිරීම

ඓතිහාසික තන්තිරිමලේ රජමහා විහාරය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරක බැතිමතුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දී උතුරු මැද පළාතට පැමිණෙන සංචාරකයින් සඳහා වඩාත් හොඳ සේවාවක් ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

## හඳගල පුදබිම ආශ්‍රිතව සනීපාරක්ෂක පද්ධතියක් ඉදි කිරීම

හඳගල පුදබිමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් හා බැතිමතුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම අරමුණු කොටගෙන මෙය ඉදිකරන ලදි.

## නාම පුවරු ප්‍රදර්ශනය හා සංවර්ධන කිරීම




පොළොන්නරුව මඩකලපුව ප්‍රධාන මාර්ගයේ ගිරිතලේ පාසල ඉදිකිරීමට ඇති ඇළ මාර්ගයේ දැනට වඳවී යන සත්ත්ව කොට්ඨාශයක් වන තිලැ කබරයින් විශාල වශයෙන් දක්නට ලැබේ. මෙම ස්ථානය හඳුනා ගැනීමට කිසිම ප්‍රදර්ශන පුවරුවක්, ප්‍රචාරයක් මේ සඳහා නොතිබූ බැවින් මෙම ස්ථානය සංවර්ධනය කර ප්‍රදර්ශන පුවරුවක් සකස් කිරීමෙන් දෙස් විදෙස් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමත්, පහසුවෙන් එම ස්ථානය හඳුනා ගැනිමට සැලැස්වීම මෙහි මූලික අරමුණ විය. වෙන්කල මුදල රුපියල් ලක්ෂ 03කි.

## වැලිකන්ද බොර වැව උණුදිය උල්පත් ව්‍යාපෘතිය



උතුරු මැද පළාතේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නෙළුම්වැව ස්වභාවික උණුදිය උල්පත් 07 ක් පිහිටා ඇත. එකම ස්ථානයක වැඩිම උල්පත් සංඛ්‍යාවක් පිහිටා තිබීම හා මෙහි උෂ්ණත්වය එකිනෙකට වෙනස් වීමත් මෙහි ඇති විශේෂිත ලක්ෂණයක් වේ. මෙවායේ උෂ්ණත්වය 62c'ක් වන අතර එය ලංකාවේ උණු දිය උල්පත්වලින් වැඩිම උෂ්ණත්වයක් ඇති උණුදිය උල්පත් වේ. එබැවින් පාසිකුඩා ආරුගම්බේ වැනි ප්‍රදේශවලට යන සංචාරකයින්ගේ ආකර්ෂණයට ලක් වී ඇති මෙම ස්ථානයට පැමිණෙන සංචාරකයින්ට සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් ඉදිකිරීම ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය මහවැලි අධිකාරිය එක්ව සිදු කරන ලදි. මෙහි මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා පමණක් 2019 වර්ෂයේ රු මිලියන 5 වෙන් කරන ලදී. මුළු ඇස්තමේන්තු මුදල රු.මි 22.04කි. භෞතික හා මූල්‍ය ප්‍රගතිය 30%කි.

## හොඳම පාසල ළඟම පාසල

පාසල් පද්ධතිය තුළ තිබෙන භෞතික අවශ්‍යතාවයන් යටතේ කාලයක් තිස්සේ සම්පූර්ණ නොවීම තුළින් පළාතේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම් ඉහළ නැංවීමට නොහැකි විය.එම තත්වයට පිළියමක් ලෙස හොඳම පාසල ළඟම පාසල ව්‍යාපෘතිය මෙරට දරු පරපුරේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉමහත් අත්වැලක් විය. 2016- අයවැය යෝජනාව අනුව ශ්‍රී ලංකාවේ පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපදන ලබා දෙමින් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට 2020 දක්වා වසර 5 තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව උතුරු මැද පළාතේ පාසල් සංවර්ධනය සඳහා රු මි 5600 ප්‍රතිපාදන ලබා දෙමින් ව්‍යාපෘති 1975 ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කර ඇත. ඒ අනුව උතුරු මැද පළාතේ තෝරාගත් පාසල් 546 ක භෞතික සම්පත් සංවර්ධනය කිරීමට යෝජිත වේ. මෙම ව්‍යාපෘතිය පහත සඳහන් අයුරින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

1. පාසල්වල නව ගොඩනැගිලි ඉදි කිරීම.
   පන්ති කාමර ගොඩනැගිලි ඉදි කිරීම,විද්‍යාගාර ගොඩනැගිලි, තාක්ෂණ ගොඩනැගිලි, ක්‍රීඩා සංකීර්ණ, සෞන්දර්යය ඒකක, ආපනශාලා, විදුහල්පති හා ගුරු නිල නිවාස.
2. තිබෙන පාසල් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම .(සුළු හා විශාල අළුත්වැඩියා)
3. යටිතල පහසුකම් යටතේ විදුලි පහසුකම්,පානීය ජල පහසුකම්.

මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේ රු මි 595 වියදම් කරන ලදී. 2016 සිට 2019/12/31 දින දක්වා රු.මි 4877 වියදම් කරමින් ව්‍යාපෘති 1541 සිසු අයිතියට පත් කිරීමට හැකි විය. 2020 වර්ෂයේ තවදුරටත් ව්‍යාපෘතීන් 387ක් ක්‍රියාක්මක කිරීමට සැලසුම් කර ඇත.





## අධ්‍යාපන සංවර්ධනය

- අනාගත අභියෝගවලට මුහුණ දිය හැකි නිපුණතා සපිරි දරු පිරිසක් යන දැක්මක් සහිතව ක්‍රියාත්මක වන අධ්‍යාපන අමාත්‍යාංශය අධ්‍යාපනයේ සම අවස්ථා සලසමින් මානව සම්පත් සහ භෞතික සම්පත් මනා කළමණාකාරිත්වයකින් යුතුව භාවිතා කිරීමේ මෙහෙවර ඉටු කරමින් පළාතේ දරුදැරියන් හෙට දින රට භාරගන්නා පිරිපුන් නායකයන් බවට පත්කිරීම සඳහා ගුණාත්මක අධ්‍යාපනයට මුල්තැන දෙමින් එය පහසුවෙන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම අමාත්‍යාංශය විසින් සිදු කරන ලදි.

- පළාත තුළ විසිරි ඇති පාසල් 817 ක් තුළ අධ්‍යාපනය හදාරණ ශිෂ්‍යයින් 298,868 ක් අතර රුපියල් මිලියන 332 ක ප්‍රතිපාදන සමව බෙදා හරිමින් භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සිදුකරන ලදී. එහිදී ව්‍යාපෘති 67 ක් ක්‍රියාත්මකකර ඇති අතර ඒ තුළ 2019 වර්ෂයේ ආරම්භ කළ නව ව්‍යාපෘති 40 ක් ද, පසුගිය වර්ෂවල සිට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 10ක් ද 2018 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති 17 ක් ද ක්‍රියාත්මක කරන ලදී.



පොළොන්නරුව රාජකීය ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ වැඩ නිම කිරීම

- අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ප්‍රාථමික පාසල් 03ක 2020 වර්ෂයේ 01 වන ශ්‍රේණියට බඳවා ගන්නා සිසුන් සඳහා පන්තිකාමර නොමැතිකමට පිළියම් වශයෙන් පන්තිකාමර ඉදිකර 2019 වර්ෂය තුළදී සිසු අයිතියට පත්කරන ලදී.



නිවත්තකචේතිය මහා විද්‍යාලිය H ගොඩනැගිල්ල

- කැබිතිගොල්ලෑව මධ්‍ය විද්‍යාලයේ ගොඩනැගිලි තුළ පවත්වාගෙන යන කැබිතිගොල්ලෑව ප්‍රාථමික විද්‍යාලය ඒ සඳහා වෙන්කර ඇති භූමියේ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සපයමින් 2020 වර්ෂයේ 1 ශ්‍රේණියේ පන්ති එම නව ස්ථානයේ ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. ප්‍රධාන පාසල් සංවර්ධනය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අ/ ශාන්ත ජෝශප් විද්‍යාලය, අ/ වලිසිංහ හරිස්චන්ද්‍ර මහ විද්‍යාලය හා නිවත්තකචේතිය මහ විද්‍යාලය සංවර්ධනය සඳහා රු.මි 510ක පමණ ඇස්තමේන්තු වටිනාකමකින් යුත් ව්‍යාපෘති 2016 වර්ෂයේ ආරම්භ කළ අතර ඒ සඳහා මේ වනවිට රුපියල් මිලියන 420 ක් පමණ වැයකර ඇත.
- අනුරාධපුර කළාප අධ්‍යාපන කාර්යාලය සඳහා මහල් 5 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2016 වර්ෂයේ ආරම්භ කළ අතර රුපියල් මිලියන 128 කට ගිවිසුම් ගතවී ඇත. මේ වනවිට රුපියල් මිලියන 80 ක පමණ වියදමක් දරා ඇත.
- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2020 වර්ෂයට බඳවාගන්නා 01 වන ශ්‍රේණියේ සිසුන්ට පන්තිකාමර නොමැති ගැටළුවට මුහුණපා සිටි මැදිරිගිරිය සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රාථමික පාසලේත්, රාජකිය ප්‍රාථමික විද්‍යාලයේත්, පලුගස්දමන ජනාධිපති විද්‍යාලයේත් පන්තිකාමර හිඟයට 2019 වර්ෂයේ පිළියම් යොදන ලදී.
- ව්‍යාපෘති 56 ක් අතැති බිල්පත් හා අවිච්ඡේද ව්‍යාපෘති ලෙස 2020 වර්ෂයට ද ගමන්කරන අතර ඒ සඳහා රු.මි 141ක පමණ ප්‍රතිපාදන අපේක්ෂා කරයි. හදිසි හා අත්‍යාවශ්‍ය අළුත්වැඩියා සහ නව ගොඩනැගිලි අවශ්‍යතා සඳහා රු.මි 800 ක පමණ ප්‍රතිපාදන අවශ්‍යව ඇත.



## පසුගාමී සංවර්ධන ව්‍යාපෘතිය

හදිසි අවශ්‍යතා අනුව කඩමින් ඉදිකළ යුතු නිවාස මෙම නිවස ව්‍යාපෘතිය යටතේ ඉටු කර දෙන ලදී. ඒ අනුව පැවති ප්‍රතිපාදන මත අන්ත දිළිඳු පවුල් තුනකට නිවාස තුනක් පළාත තුළ ඉදි කරන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය කාර්යාලයෙන් මගින් සිදුවන අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුවක් මඟින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරන ලදී.මූලස්ථාන සමෘද්ධි නිලධාරීන් , තාක්ෂණ නිලධාරීන් ,සමාජ සේවා නිලධාරීන් ,ප්‍රජා සංවර්ධන නිලධාරීන් මඟින් අධීක්ෂණය කිරීම හා ප්‍රගතිය ලබා ගැනීම සිදු කරන ලදී.



## දිරිය සහන වැඩසටහන

උතුරු මැද පළාතේ ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා උතුරු මැද පළාතේ ස්වයං රැකියාලාභීන් සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් සවිබල ගැන්විමේ අරමුණින් දිරිය සහන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ නව ස්වයං රැකියා සඳහා ජනතාව පෙළඹවීම හා දැනට ස්වයං රැකියාවක නියුතුව සිටින ජනයාගේ ආදායම් තත්වය ඉහළ නැංවිම තුළින් ආර්ථික මට්ටම ඉහළ නැංවීමට නියමිතයි. මෙම අරමුණු පෙරදැරිව 2015 වර්ෂයේදී ආරම්භ කළ දිරිය සහන වැඩසටහන 2019 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය.

ගෝලීය ප්‍රවණතාවය අනුව ස්වයංරැකියා , කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සැලකෙන්නේ ආර්ථිකයේ වර්ධනය හා සංවර්ධනය සඳහා වූ ගාමක බලවේගයක් වශයෙන්ය. ප්‍රාදේශිය සංවර්ධනය, රැකියා උත්පාදනය හා දිළිදුකම පහත හෙළිම යන කාර්යන් සඳහා ඍජු දායකත්වයක් ස්වයංරැකියා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය තුළින් ඉටුවේ. ඒ මගින් පසුගාමී ආර්ථිකයන් නැග එන හා සමෘද්ධිමත් ආර්ථිකයන් බවට පරිවර්තනය කිරිමට හැකිවනු ඇතැයි අපෙක්ෂා කෙරේ. ස්වයංරැකියා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුළු ව්‍යවසාය ක්ෂේත්‍රයෙන් 75% ක් වන අතර සමස්ත රැකියාවන්ගෙන් 45%ක ප්‍රමාණයක් සපයන බැවින්ද දළ දේශිය නිෂ්පාදිතයෙන් 52%ක් හෝ ඊට වැඩි දායකත්වයක් සපයන බැවින්ද ප්‍රාදේශිය සංවර්ධනයේ කොඳු නාරටිය ලෙස ස්වයංරැකියා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය හඳුනාගෙන ඇත.

පසු හා මන්දගාමී ආර්ථික වර්ධනයක් සහිත උතුරු මැද පළාතේ, ජනතාවගේ ආර්ථික හා සමාජිය ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා පුළුල් පරාසයක සංවර්ධනය ප්‍රවර්ධනය කරන පළාතේ ස්වයං රැකියාලාභීන් සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් සවිබල ගැන්විම ප්‍රමුඛතම කාර්යක් ලෙස හඳුනාගෙන ඇත. ඒ සඳහා ප්‍රධාන අමාත්‍යාංශය මගින් දිරිය සහන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ නව ස්වයං රැකියා සඳහා ජනතාව පෙළඹවීම හා දැනට ස්වයං රැකියාවක නියුතුව සිටින ජනයාගේ ආදායම් තත්වය ඉහළ නැංවිම, වෙළඳපොළ සංවර්ධනය, හිතකර පරිසරය ,නවින තාක්ෂණය භාවිතය, පුහුණු හා කුසලතා සංවර්ධනය, ධාරිතා සංවර්ධනය, සම්පත් කාර්යක්ෂම ලෙස යෙදවිම අංශ සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## දිරිය සහන වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් දායකත්වය ලබා දෙන තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු 01 යටතේ සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීමත්, තිරසර සංවර්ධන අරමුණු 04 යටතේ පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනිමේ අවස්ථාවත්, තිරසර සංවර්ධන අරමුණු 08 යටතේ සියල්ලන් සඳහාම පෝෂිත , පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය , පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරිමත් සහ තිරසර සංවර්ධන අරමුණු 09 සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම සඳහා දායකත්වය ලබා දෙන ලදි.

2015 වර්ෂයේදී ආරම්භ කළ දිරිය සහන වැඩසටහන සඳහා වාර්ෂිකව විශාල ඉල්ලුම්පත් සංඛ්‍යාවක් ලැබෙන අතර වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය මත ප්‍රතිලාභ ලබාදිය හැකිවන්නේ එයින් 1% ප්‍රමාණයකට පමණි.

මෙම වැඩසටහන යටතේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර මෙහිදී විවිධ ක්ෂේත්‍ර සඳහා ප්‍රතිලාභ ලබා දීම සිදු කරන ලදී. මැහුම්, විසිතුරු මල් හා කෘෂි, විසිතුරු මත්ස්‍ය, වී, ආහාර හා කුළු බඩු නිෂ්පාදනය, කුකුලන් පාලනය, වඩු කර්මාන්තය,පෙදරේරු කර්මාන්තය, විදුලි කාර්මික, චිත්‍ර පේන්ටින්, කිරි ගව පාලනය වැනි ක්ෂේත්‍ර සඳහා ජුකි, ඕවලොක්,පැටලොග් මැෂින් වර්ග,සෙවන දැල් , GI බට හා ගෙල් ඉසින මැෂින් ,කෘෂී උපකරණ, දැල් උපකරණ, වතුර මැෂින්, ඇඹරුම් උපකරණ, දැල් උපකරණ, බහුකාර්ය වඩු කට්ටල, වඩු කැටයම් උපකරණ කට්ටල, මේසන් උපකරණ, විදුලි කාර්මික උපකරණ, කම්පෙෂර්, වතුර ටැංකි, හයිපෙෂර් හා ලෙදර් ස්කැවින් මැෂින් වැනි උපකරණ ලබා දෙන ලදි. බෑග් නිර්මාණය, ලෙදර් ආශ්‍රිත නිර්මාණ, ඔකිඩ්, සැන්ඩ්‍රියා වගාව වැනි ක්ෂේත්‍ර සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල ආශ්‍රිතව තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීම හා වැඩිදියුණු කිරීම

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය අනුග්‍රහයෙන් 2019 වර්ෂයේ පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංරචකය යටතේ ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල ආශ්‍රිතව තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීමේ හා වැඩිදියුණු කිරීම සඳහා රුපියල් 2,996, 199.00ක මුදලක් වෙන් වී ඇත.



උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් 2019 වර්ෂයේ මුල් භාගයේදී උතුරු මැද පළාතේ ලියාපදිංචි පුස්තකාලවල සිදුකළ සමීක්ෂණයන්ට අනුව තොරතුරු තාක්ෂණය අඩු පුස්තකාල හඳුනා ගැනීමක් සිදුකර ඇත. එම හඳුනාගත් පුස්තකාල අතරින් වඩාත්ම තොරතුරු තාක්ෂණය අඩු ප්‍රදේශවල පිහිටි ලියාපදිංචි පුස්තකාල 28ක් මේ සඳහා තෝරා ගන්නා ලදී. මේ වැඩසටහනේ දෙවෙනි පියවර ලෙසට දැනට පුස්තකාලවල සේවයේ නියුතු නිලධාරීන් උදෙසා දින 04 ක තොරතුරු තාක්ෂණය හා අන්තර්ජාලය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. වර්තමානය වනවිට කෘෂිකර්මාන්තය, ව්‍යාපාරික අංශය, අධ්‍යාපන , සාමාජික , හා සංස්කෘතික ඇතුළු සියළු අංශ සඳහා තොරතුරු තාක්ෂණය ඉතා ඉහළ මට්ටමින් පවතී. එමනිසා අදාළ ප්‍රදේශවල අයට තමන්ට අවශ්‍ය තොරතුරු මේ පුස්තකාල හරහා ලබා ගැනීමට මේ සඳහා අවස්ථාව උදාකර දීම මෙහි ප්‍රධාන අරමුණක්ව පවතී.ඉහත වැඩසටහන යටතේ තෝරාගත් පුස්තකාලවලට ලබාදෙන උපකරණ සම්බන්ධයෙන් දෙවන පාර්ශවය සමඟ පළමු පාර්ශවය ගිවිසුමකට එළඹෙන අතර වසර 03ක් ගතවන තුරු අදාළ උපකරණවල අයිතිය ප්‍රධාන අමාත්‍යාංශය සතුවන අතර , ඉන් අනතුරුව ඒ ඒ ප්‍රාදේශීය සභාවල ඉන්වෙන්ටරිය යටතේ සටහන් කර පුස්තකාලවලම පවත්වාගෙන යමින් ඉහත අරමුණු ළඟා කරගැනීමට යොදවයි.

## වකුගඩු රෝගීන් පවුල්වල ආර්ථික මට්ටම ඉහළ නැංවීම

උතුරු මැද පළාතේ බහුල වශයෙන් වකුගඩු රෝගයෙන් පෙළෙන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජීවත්වන රෝගීන්ගේ පවුල්වල ආර්ථික මට්ටම ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරි කරගනිමින් ඔවුන් නියැලෙන වෘත්තිය හා නව වෘත්තියක් ආරම්භකර ගැනීමට ඔවුන්ගේ අවශ්‍යතාවය පරිදි ඉල්ලුම් කරන ලද උපකරණ ලබා දිම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකරනු ලබයි.

ප්‍රතිලාභීන් තෝරා ගැනිම සඳහා පොළොන්නරුව හා අනුරාධපුර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල මගින් සහ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මහජන ඉල්ලීම් ද වකුගඩු රෝගය බහුලව ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් යොමු කරන ලද ඉල්ලීම් ද සැලකිල්ලට ගනිමින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කළ අතර, එහිදි විශේෂයෙන්ම තම පවුල තුළ ආර්ථික කටයුතු සඳහා කිසියම් වූ වෘත්තියක නියැලෙන රෝගී පවුල් සඳහා වැඩි අවධානයක් යොමු කොට ක්ෂේත්‍රය පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසු ප්‍රතිලාභීන් සඳහා මෙම උපකරණ ලබා දිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

## විධිමත් පුහුණුවක් නොමැතිව වඩු කර්මාන්තයේ නියුතුව සිටින ශිල්පීන් සඳහා දැව ආශ්‍රිත ගෘහ භාණ්ඩ නිෂ්පාදන සම්බන්ධ වෘත්තීය පුහුණුවක් ලබාදීම හා දිරිගැන්වීම.

විධිමත් පුහුණුවක් නොමැතිව වඩු කර්මාන්තයේ නියුතුව සිටින ශිල්පීන් සඳහා දැව ආශ්‍රිත ගෘහ භාණ්ඩ නිෂ්පාදන සම්බන්ධ අවශ්‍ය තාක්ෂණික දැනුම, ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම හා ඔවුන් දිරිමත් කිරීම සඳහා නියමු පුහුණු වැඩසටහනක් ලෙස අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක පදනම් කරගනිමින් ක්‍රියාත්මක විය.අනුරාධපුර දිස්ත්‍රික් වැඩසටහන 2019 නොවැම්බර් මස 28,29,30 හා දෙසැම්බර් මස 1 හා 2 යන දිනවල අනුරාධපුර තාක්ෂණ විද්‍යාල පරිශ්‍රයේදී පෙ.ව 8.30 සිට ප.ව 5.00 දක්වා ක්‍රියාත්මක වූ අතර පොළොන්නරු දිස්ත්‍රික් වැඩසටහන 2019 දෙසැම්බර් මස 13 සිට 17 වන දින දක්වා පොළොන්නරුව ගල්ලැල්ල කාර්මික විද්‍යාල පරිශ්‍රයේ පෙ.ව 8.30 සිට ප.ව 5.00 දක්වා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සුදුසුකම්ලත් වෘත්තිය උපදේශකවරුන්ගේ මෙහෙයවීමෙන් දින 10 ක් පැවැත් විය.

වැඩසටහන් 2 සඳහා අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 30 දෙනෙකු වුවත් වැඩසටහන 39 දෙනෙකු සම්බන්ධ විය. අනුරාධපුර වැඩසටහනේ අවසන් දිනයේදි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ( අනුරාධපුර ශාඛාව) රවුටර් මැෂිමක් එම වැඩසටහනේ දක්ෂතම ප්‍රතිලාභියා සඳහා නොමිලේ ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කළ අතර වැඩසටහන සඳහා සක්‍රියව සම්බන්ධ වු ප්‍රතිලාභීන් 07 දෙනෙකු තෝරා ඔවුන් පිළිබඳව සිදු කළ පසු විපරමකින් (ක්ෂේත්‍ර පරික්ෂාවකින්) අනතුරුව ඒ සඳහා ප්‍රතිලාභියෙක් තෝරා ගන්නා ලදි . ප්‍රතිලාභීන් සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා මෙම අමාත්‍යාංශය එක්ව ප්‍රදානය කරන සහතික පත්‍රය පෙබරවාරි මාසය තුළ ප්‍රදානය කරනු ලැබිණි.මේ සඳහා දරන ලද වියදම රු.මි.0.57කි.භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් විය.



| කාර්ය සාධන දර්ශක | ඉලක්ක(සංඛ්‍යාව) | | වියදම අයෝජනය(රු.මි) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2018 | 2019 |
| **උ.මැ පළාත තුළ අධ්‍යාපනය සංවර්ධනය** | | | | |
| ඉදිකරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව හා අළුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි සංඛ්‍යාව | 97 | 67 | මි.ලි 315 | 169 |
| **උ.මැ.පළාත තුළ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය** | | | | |
| ප්‍රතිලාභ ලබාගත් පවුල් සංඛ්‍යාව | 710 | 710 | ලකෂ 06 | 8.1 |
| ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 12 | 12 | - | - |
| **පුස්තකාල සංවර්ධනය** | | | | |
| උ.මැ. පළාත තුළ තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා තාක්ෂණ උපකරණ ලබාදීම. | - | - | 10මි.ලි | 16.8 |
| **උ.මැ.පළාත තුළ විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය බල ශක්තිය ප්‍රචලිත කිරීම.** | | | | |
| I. සවිකරන ලද විදුලි පැනල් ගණන<br>II. සවිකරන ලද සූර්ය වීථි ලාම්පු ගණන | 125 | - | - | 144 |
| **ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම** | | | | |
| ඉටුකරන ලද ව්‍යපෘති තුළින් ප්‍රතිලභීන් ගණන | 20,000 | 20,000 | ගිණුම් | 38.3 |
| **සංචාරක කර්මාන්තය නගා සිටුවීම.** | | | | |
| I. වැඩසටහන් පැවැත්වීම | - | - | - | 94 |
| II. ඉදිකිරීම් | 206 | - | - | - |
| **අධ්‍යාපන සංවර්ධන අරමුදල** | | | | |
| I. විෂය සමගාමි කටයුතු සංවර්ධනය.<br>II. ආර්ථික අපහසුතාවය සහිත දරුවන් වෙත පාසල් උපකරණ ලබාදිම | - | 03 | - | 1.5 |
| **සංස්කෘතික කටයුතු සංවර්ධනය** | - | - | - | 9.9 |
| **යන්ත්‍රෝපකරණ ඒජන්සිය** | - | - | - | 0.9 |

අතිගරු ජනාධිපතිතුමාගේ '' සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් යහපත් සමාජයක් '' සෞභාග්‍යමත් පළතක් '' යන ආයතනයේ දැක්ම කරා ළඟා වීමට පළාතේ දරුවන් සඳහා අධ්‍යාපන පහසුකම් සංවර්ධනය, ප්‍රාදේශීය මහජන අවශ්‍යතා සපුරාලීම සඳහා පළාත් පාලන සේවා දියුණු කිරීම, ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරිම, පළාතේ තරුණ තරුණියින් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබා ගත හැකි වන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරිම සිදු විය.

යටිතල පහසුකම් පද්ධතින් විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරීම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරීම හා පළාත තුළ ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම, රටේ ජීවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නඟා සිටුවීම, පළාතේ සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරීම, අධික විදුලි අවශ්‍යතාවන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වාදීම, සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංචාරක ගම්මාන ඇති කිරීම, ප්‍රවර්ධනය, මානව සම්පත් සංවර්ධනය හා දේශීය විදේශීය සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම ආදි කටයුතු ද මෙමගින් සිදු විය.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ,දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
| ළඟම පාසල හොඳම පාසල | පාසල් ගොඩනැගිලි ඉදිකිරීම | 5604.18 | 4877.32 | 91% | 87.07 |
| සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම | ධාරිතා සංවර්ධනය | 0.552 | 172,450 | 100% | 40 |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | 2020 | 2021 | |
| 1. අධ්‍යාපන සංවර්ධනය | I.ප්‍රාථමික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම | මි.ලි 300 | මි.ලි 330 | ගුණාත්මක අධ්‍යාපනයට මුල් තැන දෙමින් එය පහසුවෙන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම |
| | II.ද්විතියික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම | මි.ලි 200 | මි.ලි 220 | |
| | III. කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම | මි.ලි.150 | මි.ලි 165 | ගුණාත්මක භාවයෙන් ඉහළ පළාතේ දරුවන් සඳහා ඵලදායි සේවාවක් සැපයීම සඳහා යෝග්‍ය වූ ආයතන ලෙස ක්‍රමවත් කිරීම. |
| | IV. ගුණාත්මක සංවර්ධනය වැඩිදියුණු කිරීම | මි.ලි.150 | මි.ලි 165 | |
| 2. සංචාරක සංවර්ධනය | I.යටිතල පහසුකම් සංවර්ධනය. | මි.ලි 120 | මි.ලි.132 | ගුණාත්මක සංචාරක කර්මාන්තයක් තුළින් දේශිය ආදායම ඉහළ නැංවීම |
| | II.සංචාරක ආකර්ශණීය ස්ථාන පහසුකම් සැපයීම. | මි.ලි.40 | මි.ලි.44 | |
| | III. සංචාරක මානව සම්පත් සංවර්ධනය හා උතුරු මැද පළාතේ සංචාරක ස්ථාන ප්‍රවර්ධනය | මි.ලි.20 | මි.ලි .22 | |
| | IV. ආයතන සම්බන්ධිකරණය | මි.ලි.10 | මි.ලි.110 | |

| ක්‍රියාකාරකම් | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| | 2020 | 2021 | |
| **3.විකල්ප බලශක්ති** | | | |
| උතුරු මැද පළාත තුළ සූර්ය බලශක්ති වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම | මි.ළි.40 | මි.ළි.44 | බල ශක්තිය සඳහා වැයවන මුදල අවම කිරිම. |
| **4. ජීවනෝපාය සංවර්ධනය** | | | |
| උතුරු මැද පළාත ජීවනෝපාය සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මකකිරිම. | මි. ළි. 50 | මි.ළි.55 | ග්‍රාමීය ජනතාවගේ අදායම් තත්ත්වය ඉහළ නැංවිම. |
| **5.ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය** | | | |
| නිවාස ඉදිකිරිම | 150 | 115 | ග්‍රාමීය ජනතාවගේ ජවන තත්ත්වය ඉහළ නැවීම |
| **6.සස්කෘතික කටයුතු සංවර්ධනය සංවර්ධනය** | | | |
| ආගමික හා සංස්කෘතික කටයුතු සංවර්ධනය | 60 | 66 | උතුරු මැද ජනතාවගේ ආධ්‍යාත්මක යහපැවැත්ම සංවර්ධනයට දායකත්වය සැපයිම. |
| **7.පුස්තකාල සංවර්ධනය** | | | |
| උතුරුමැද පළාතේ පුස්තකාල සේවා කටයුතු සැලසුම් කිරීම සම්බන්ධීකරණය. | - | - | පූර්ව ළමා විය සංවර්ධනය |

## අමාත්‍යාංශය / දෙපාර්තමේන්තු හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **07. සියල්ලන් සඳහා දැරිය හැකි,විශ්වාසනීය,තිරසර සහ නවීන බල ශක්ති සැපයුම සහතික කිරිම.** | | | |
| සමස්ත අවසන් බලශක්ති පරිභෝජනයෙන් පුනර්ජනනීය බලශක්තිය පංගුව | 1 සවිකරන ලද විදුලිසූර්ය පැනල් ගණන | 9.9 | 5.0 |
| | 11සවිකරන ලද සූර්ය වීථි ලාම්පු ගණන | 14.9 | 9.4 |
| **04.පරිපූර්ණ ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම** | | | |
| ළමුන් ,ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපනපහසුකම් ගොඩනැංවීම,වැඩිදියුණු කිරිම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරි,ප්‍රචණ්ඩත්වයෙන් තොර ,සියලු දෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයෙන් තහවරු කිර දීම.( 4.අ) | ඉදිකරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 267.6 | 134.3 |
| | අළුත් වැඩියා කරන ලද ගොඩනැඟිලි සංඛ්‍යාව | 62.29 | 27.4 |
| | ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මත කිරීම. | 3.00 | 3.33 |

| | | | |
|---|---|---|---|
| **නගර ජනාවාස පරිපූර්ණ ,ආරක්ෂිත සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම.** | | | |
| (11.4.1)උරුමයේ ආකාරයේ පරිපාලන මට්ටම වියදම් ආකාරයේ පුද්ගලික යෙදවුම් අනුව සියළු සංස්කෘතික උරුමයන් රුකගැනීම ඵආරාක්ෂා ව සහ සංරක්ෂණය වෙනුවෙන් සිදු කරන සමස්ත ඒක පුද්ගල වියදම. | කරන ලද ව්‍යාපෘති ගණන | 115.5 | 90.4 |
| **නගර ජනාවාස පරිපූර්ණ ,ආරක්ෂිත සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම** | | | |
| (11.1.1)පැල් පත් අවධිමත් ජනාවාස හෝ ප්‍රමාණත් නොවන නිවාස පහසුකම් යටතේ ජිවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය | ඉදිකරන ලද නිවාස ගණන | 1.8 | 1.8 |
| **සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමණාකරණය සහතික කිරීම.** | | | |
| සුරක්ෂිතව කළමණාකරණය කෙරෙන පානිය ජල සැපයුම් සේවා භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය | සපයන ලද ජල පහසුකම් පද්දති ගණන | 2.5 | 2.5 |
| **සියල්ලන් සඳහාම පෝෂිත ,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධන,පූර්ණ,ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරිම(8)** | | | |
| 8.3.1ස්ත්‍රී පුරුෂ භාවය අනුව ,කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය | I. ප්‍රතිලාභ ලබාගත් පවුල් සංඛ්‍යාව | 2.2 | 1.7 |
| **සියල්ලන් සඳහාම පෝෂිත ,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධන, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරිම(8)** | | | |
| සංචාරක ක්ෂේත්‍රයේ සමස්ත රැකියා ප්‍රමාණයේ තිරසර සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා ප්‍රමාණය . | පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩ සටහන් | 3.09 | 1.89 |
| **නගර ජනාවාස පරිපූර්ණ ,ආරක්ෂිත සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම** | | | |
| (11.4.1) උරුමයේ ආකාරයේ පරිපාලන මට්ටම වියදම් ආකාරයේ පුද්ගලික යෙදවුම් අනුව සියළු සංස්කෘතික උරුමයන් රැකගැනීම ආරාක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් සිදු කරන සමස්ත ඒක පුද්ගල වියදම. | ආගමික කටයුතු වැඩි දියුණු කිරිම | 10.00 | 9.7 |
| **නගර ජනාවාස පරිපූර්ණ ,ආරක්ෂිත සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම** | | | |
| (11.7.1) පුරුෂ භාවය ,වර්ෂ සහ ආබාධ සහිත පුද්ගලයන් යන කරුණු අනුව නගර වල මහජන භාවිතයට ඇති විවෘත අවකාශ අතරින් ගොඩනඟන ලද සාමාන්‍ය පංගුව | නිම කරන ලද ව්‍යාපෘති ගණන | 0.8 | 0.05 |
| **සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමණාකරණය සහතික කිරීම.** | | | |
| 6.2.1 සබන් සහ ජලය සහිත අත් සේදීමේ පහසුකම ඇතුළුව ආරක්ෂිතව පාලනය වන සනීපාරක්ෂක සේවා භාවිත කරන අතර ජනගහනයේ ප්‍රමාණය | නිම කරන ලද ව්‍යාපෘති ගණන | 33.4 | 32.3 |

| | | | |
|---|---|---|---|
| **පරිපූර්ණ ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම** | | | |
| 4.4.1කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය | ධාරිතා සංවර්ධනය හා උපකරණ ලබා දුන් පුස්ත කාල ගණන | 2.9 | 2.2 |
| **සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම , පරිපූර්ණ සහ තිරසර කාර්මිකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරි ගැන්වීම.** | | | |
| 9.1.1වසර පුරා භාවිත කළ හැකි මාර්ගයක සිට කි.මී. 2 ක දුරක් තුළ ජනගහනයේ ප්‍රමාණයක් තුළ ජීවත්වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය | ක්‍රියාත්මත කරන ව්‍යපෘතිවලට අදාලව අධික්ෂණ දිමනා ගෙවිද | 118.2 | 76.9 |
| **සියල්ලන් සඳහාම පෝෂිත ,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධන, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය** | | | |
| 8.3.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව. කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය | පවත්වන ලද පුහුණු | 1 | 0.9 |
| **සියල්ලන් සඳහාම පෝෂිත ,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධන,පූර්ණ,ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය** | | | |
| 8.1.1 සත්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ වාර්ෂික වර්ධනය. | ප්‍රතිලාභීන් ගණන | 2.1 | 2 |
| 8.2.1 සේවා නියුක්ති පුද්ගලයෙකු සඳහා වන සත්‍ය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය. | ප්‍රතිලාභීන් ගණන | 2. | 1.8 |
| 8.5.1හා 8.5.2 රැකියාව, වයස සහ ආබාධිත සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම් ඉපැයීම. | පවත්වන ධාරිතා සංවර්ධන වැඩ සටහන් හා උපකරණ ගණන | 2.3 | 2.2 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

### අධ්‍යාපන

අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ අත්‍යාවශ්‍ය පන්තිකාමර හා වෙනත් අත්‍යාවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම, අත්‍යාවශ්‍ය පන්තිකාමර වැඩිදියුණුකිරීම, ප්‍රධාන පාසල් සංවර්ධනය කිරීම, නිල නිවාස වැඩිදියුණු කිරීම, සනීපාරක්ෂක පද්ධති අළුත්වැඩියා කිරීම හා නව සනීපාරක්ෂක පද්ධති ඉදි කිරීම, ගුරුනිවාස හා විදුහල්පති නිල නිවාස අළුත්වැඩියාව, පුස්තකාල අලුත්වැඩියා කිරීම, පානීය ජල පහසුකම් ලබා දීම හා ජලනල පද්ධතිය වැඩිදියුණු කිරීම, උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණය, රොබෝ තාක්ෂණය සහ වෙබ් නිර්මාණ දැනුම ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු විය.

### බලශක්ති

තෝරාගත් පාසල් හා වෙනත් සුදුසු ස්ථානවල සූර්ය විදුලි පැනල ස්ථාපිත කිරීමේ වැඩසටහන, පොදු ස්ථාන සහ සංචාරක ආකර්ෂණ ස්ථානවල සූර්ය වීථි ලාම්පු ස්ථානගත කිරීම , මහජන ආකර්ශනය සහිත සංචාරක ආගමික හා පුරාවිද්‍යා ස්ථාන ආලෝකමත් කිරීම සඳහා වීථි ලාම්පු ස්ථානගත කිරීම, (මිහින්තලය,අටමස්ථානය,තන්තිරිමලය,සෝමාවතිය,ගල්විහාරය අවට පුදබිම,මැදිරිගිරිය වටදාගෙය) වැනි කාර්යයන් මේ යටතේ සිදු කරන ලදි.

### පසුගාමී ගම්මාන සංවර්ධනය

වැලිකන්ද , මහින්දාගම සමගි ක්‍රිඩාංගනය ප්‍රතිසංස්කරණය කිරිම, හදිසි ආපදා හානියට පත්, ප්‍රමුඛ හා කඩිනමින් ඉටුකළ යුතු නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජරට විද්‍යාලය සඳහා RO තාක්ෂණය සහිත පානීය ජල ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම වැනි කාර්යයන් මේ යටතේ සිදු විය.

## පෙර පාසල් සංවර්ධනය

පෙර පාසල් ඩිප්ලෝමා පාඨමාලාවේ ii කොටස පැවැත්වීම පෙර පාසල් ගුරුවරියන් සඳහා පරීක්ෂණයක් පැවැත්වීම පෙර පාසල් සහතික පත්‍ර විභාගය පැවැත්වීම නව කාර්යාල පරිශ්‍රය හා සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු විය.

## සංචාරක

ගෘහස්ත සංචාරක කර්මාන්ත සංවර්ධනය (නොච්චියාගම විල්පත්තුව ආශ්‍රිතව), සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් සඳහා ප්‍රවර්ධන හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම,
හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම (ii අදියර) (බිල්පත් පියවීම), වැලිකන්ද නිදහස් හා සුවපහසු මධ්‍යස්ථානයේ වැට ගැසීම හා නාම පුවරුව සවි කිරීම,සංචාරක කර්මාන්තයේ නියැලී සිටින පාර්ශවකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ මාර්ගෝපදේශකයන් සඳහා පුහුණු වැඩසටහන, සංචාරකයින් සඳහා සංස්කෘතික සංදර්ශන සංවිධානය කිරීම (සුරපුර එළිමහන් රංග පීඨය), අනුරාධපුර සංචාරක ආකර්ශනීය ස්ථාන දැක්වෙන සිතියමක් නිර්මාණය කිරීම, අනුරාධපුර ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ පිහිටි ගුවන්තොටුපොළෙහි මගී ගුවන්ගමන් පර්යන්තය සංචාරකයින් සඳහා ගැළපෙන අයුරින් නවීකරණය කිරීම (ii අදියර) (ඍජු ශ්‍රමය), වැලිකන්ද බොරවැව උණු ලිං ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම (01 අදියර) සිදු කරන ලදී.
ගිරිතලේගම පාසැල ඉදිරිපිට ඇති ඇළ ආශ්‍රිතව වඳවී යන සත්ත්ව කොට්ඨාශයක්වන දියකඹුරයන් සංචාරකයින්ගේ ආකර්ශනයට ලක් වී ඇත. එම ස්ථානය සඳහා ප්‍රවර්ධන පුවරු සවි කිරීම හා සංචාරක දිනය සහ සංචාරක සැමරුම් උත්සව පැවැත්වීම, දේශිය හා විදේශිය සංචාරකයින්ගේ ආරක්ෂාව සඳහා ජීවිතාරක්ෂක කුටි, කුඩාරම් ඉදිකිරීම හා ජීවිතාරක්ෂක උපකරණ මිලදී ගැනීම, සංචාරක ආකර්ශනීය ස්ථාන ආශ්‍රිත හඳුනාගත් ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් ස්ථාපිත කිරීම, (තන්තිරිමලේ,අවුකන,දිඹුලාගල,) හබරණ සංචාරක මධ්‍යස්ථාන හා සංචාරක නගර ව්‍යාපෘතිය සෝමාවතී පුදබිම තුළ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම වැනි කාර්යයන් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු විය.

## ග්‍රාමීය යටිතල පහසුකම්

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ පිහිටි මහජන වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම, ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල ආශ්‍රිතව තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීම හා වැඩිදියුණු කිරීම දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ තාප්පය හා ගේට්ටුව ඉදිකිරීම සහ භූමිය අලංකරණය සිදුකිරීම මෙමගින් සිදු විය.

## විශේෂ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

නාගරික මාර්ග සංවර්ධන විශේෂ ව්‍යාපෘති අධීක්ෂණය කරන ලද මාර්ග සංවර්ධන අධිකාරීයේ තාක්ෂණ ශිල්පීන්ට ගෙවීම් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු විය.

## ජීවනෝපාය සංවර්ධනය

දිරිය සහන වැඩසටහන ප්‍රතිලාභීන් සඳහා ධාරිතා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම දිරිය සහන වැඩසටහන 40% ප්‍රතිලාභීන් සඳහා උපකරණ ලබාදීම, පසුගිය වර්ෂවලදී ක්‍රියාත්මක වූ TJC අඹ වගා ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය හා වගාව සම්බන්ධයෙන් මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම, සංචාරක හෝටල්වල පිහිණුම් තටාක ආශ්‍රිත සේවකයන් සඳහා ජීවිතාරක්ෂක පුහුණුව සහ සහතිකපත් පාඨමාලාව පැවැත්වීම,වකුගඩු රෝගයෙන් පෙළෙන පවුල්වල ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා ස්වයං රැකියා නිෂ්පාදන දිරිගැන්වීමේ ව්‍යාපෘතිය,ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු නුපුහුණු සේවකයන් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීම, මෙම ව්‍යාපාතිය යටතේ සිදු විය.

## පුස්තකාල සංවර්ධනය

තඹුත්තේගම නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම III අදියර දිඹුලාගල මහජන පුස්තකාලය සඳහා ගෘහ උපකරණ හා කාර්යාලීය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම මහජන පුස්තකාල සහ පාසල් පුස්තකාල සඳහා පුස්තකාල උපකරණ සහ පොත් ලබාදීම කියවීමේ කඳවුරු පැවැත්වීම මහජන පුස්තකාල සඳහා ප්‍රමිතිකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ස්වයං නිර්මාණ මිලදී ගැනීම, මුද්‍රණ ආධාර ලබාදීම, නිර්මාණ තරඟ පැවැත්වීම, නිර්මාණකරණය පිළිබඳ නව ලේඛකයන් දැනුවත් කිරීම හා උතුරු මැද පළාතේ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම වැනි කාර්යයන් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු විය.

## තිරසර සංවර්ධන අරමුණු අංක 04

මෙම අරමුණට අදාලව ඉලක්කයන් කරා ළඟා වීම සඳහා අධ්‍යාපනික අංශයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙහි ඉලක්කගත ආයෝජනය රු.මි. 687.98කි. ඉලක්කගත වියදම රු.මි. 346.7කි.

## තිරසර සංවර්ධන අරමුණු අංක 07

මෙම අරමුණට අදාලව ඉලක්කයන් කරා ළඟා වීම සඳහා බලශක්තිය සැපයීම් අංශයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙහි ඉලක්කගත ආයෝජනය රු.මි. 24.80කි. ඉලක්කගත වියදම රු.මි. 14.40කි.

## තිරසර සංවර්ධන අරමුණු අංක 06

මෙම අරමුණට අදාලව ඉලක්කයන් කරා ළඟා වීම සඳහා ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම් අංශයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙහි ඉලක්කගත ආයෝජනය රු.මි. 38.8 කි. ඉලක්කගත වියදම රු.මි. 34.7කි.

## තිරසර සංවර්ධන අරමුණු අංක 08

මෙම අරමුණට අදාලව ඉලක්කයන් කරා ළඟා වීම සඳහා අංශයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙහි ඉලක්කගත ආයෝජනය රු.මි. 15.19කි. ඉලක්කගත වියදම රු.මි. 10.49කි.

## තිරසර සංවර්ධන අරමුණු අංක 09

මෙම අරමුණට අදාලව ඉලක්කයන් කරා ළඟා වීම සඳහා අංශයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙහි ඉලක්කගත ආයෝජනය රු.මි. 118.2කි. ඉලක්කගත වියදම රු.මි. 76.9කි.

## තිරසර සංවර්ධන අරමුණු අංක 11

මෙම අරමුණට අදාලව ඉලක්කයන් කරා ළඟා වීම සඳහා ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම් අංශයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙහි ඉලක්කගත ආයෝජනය රු.මි. 126.3කි. ඉලක්කගත වියදම රු.මි. 100.2කි.

## ප්‍රධාන අරමුණු හා අපේක්ෂිත ප්‍රතිඵල

| ප්‍රධාන අරමුණ | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| අධ්‍යාපන සංවර්ධනය සඳහා යෝග්‍ය වූ ආයතන ලෙස නියාමනය කිරීම | පළාතේ දරුවන්ගේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක අධ්‍යාපනය සහතික කිරීම | 310.39 | 161.73 | 52 |
| පරිසර හිතකාමී විකල්ප බලශක්ති ක්‍රමවේදයක් ලෙස සූර්ය විථි ලාම්පු හා සූර්ය පැනල් මඟින් ජාතික විදුලි බල පද්ධතියට විදුලිය ලබා දීම | උතුරු මැද පළාතේ පරිසර හිතකාමී විකල්ප බල ශක්ති ක්‍රමවේදය ප්‍රවර්ධනය කිරීම. | 24.80 | 14.40 | 58 |
| පළාත තුළ දේශීය විදේශීය සංචාරක කර්මාන්තය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරිම | පළාතේ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය. | 7.20 | 4.30 | 59.7 |
| උතුරු මැද පළාත තුළ දේශීය විදේශීය සංචාරක කර්මාන්තය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරිම | දෙස් විදෙස් සංචාරකයින් සඳහා ගුණාත්මක සේවාවන් හා පහසුකම් සැපයිම. | 122.09 | 94.04 | 77 |

| ප්‍රධාන අරමුණ | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| උතුරු මැද පළාතේ සංස්කෘතික අංගයන් හා කලා ශිල්ප ප්‍රවර්ධනය. | උතුරු මැද පළතේ දහම් අධ්‍යාපනය නඟා සිටුවීම. | 10.00 | 9.70 | 97 |
| පූර්ව ළමා විය අවධියේ දී ලබා ගත යුතු කුසලතා ඔප් නැංවීම හා පාසල් අධ්‍යාපනයට හුරු කිරීම | මුල් අවධියේ දරුවන් ප්‍රාථමික අධ්‍යාපනයට සුදුසු අයුරින් ගොඩනැංවීම. | 3.00 | 2.30 | 77 |
| ග්‍රාමිය ජනතාවගේ ජිවන තත්ත්වය ඉහල නැංවිම සඳහා ග්‍රාමිය ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම. | ගුණාත්මක යටිතල පහසුකම් ලබා දිම. | 160.40 | 113.70 | 71 |
| ජිවනෝපාය සංවර්ධනය තුළින් ජනතාවගේ ආර්ථික හා සමාජිය තත්වය ඉහළ නැංවිම. | උතුරු මැද පළාතේ වෙසෙන ජනතාවගේ ජිවන තත්වය නඟා සිටු වීම. | 10.40 | 7.80 | 75 |
| උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරිම හා පුස්තකාල සේවා සංවර්ධනය. | පළාතේ පාසල් ,පිරිවෙන් හා මහජන පුස්තකාල නුතන තාක්ෂණය සහිතව දියුණු පුස්තකාල සේවාවක් ලබා දීම | 19.40 | 16.54 | 85 |
| **එකතුව** | | **667.68** | **424.51** | **64** |

## ආයතනයේ අරමුණු, කාර්ය සාධන දර්ශක, ඉලක්ක හා වියදම /අයෝජනය

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | වියදම අයෝජනය(රු.මි) | |
|---|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2018 | 2019 |
| උතුරු මැද පළාත තුළ අධ්‍යාපනය සංවර්ධනය | ඉදිකරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව හා අළුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි සංඛ්‍යාව | 97 | 67 | 315 | 169 |
| උතුරු මැද පළාත තුළ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය | ප්‍රතිලාභ ලබාගත් පවුල් සංඛ්‍යාව | 710 | 710 | ලකෂ 06 | 8.1 |
| | ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 12 | 12 | - | - |
| පුස්තකාල සංවර්ධනය | උතුරු මැද පළාත තුළ තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා තාක්ෂණ උපකරණ ලබාදීම. | - | - | 10 | 16.8 |
| උතුරු මැද පළාත තුළ විකල්ප බලශක්ති ප්‍රභවයක් ලෙස සූර්ය බල ශක්තිය ප්‍රචලිත කිරීම. | සවිකරන ලද විදුලි පැනල් ගණන සවිකරන ලද සූර්ය වීථි ලාම්පු ගණන | 125 | - | - | 144 |
| ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම. | ඉටුකරන ලද ව්‍යපෘති තුළින් ප්‍රතිලභින් ගණන | 20,000 | 20,000 | ගිණුම් | 38.3 |
| | වැඩසටහන් පැවැත්වීම | - | - | - | 94 |
| | ඉදිකිරීම් | 206 | - | - | |
| අධ්‍යාපන සංවර්ධන අරමුදල | විෂය සමගාමි කටයුතු සංවර්ධනය. ආර්ථික අපහසුතාවය සහිත දරුවන් වෙත පාසල්උපකරණ ලබාදිම | - | 03 | - | 1.5 |
| සංස්කෘතික කටයුතු | | - | - | - | 9.9 |
| යන්ත්‍රෝපකරණ එජන්සිය සංවර්ධන කටයුතු | ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | - | - | - | 0.9 |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| ළඟම පාසල හොඳම පාසල | පාසල් ගොඩනැගිලි ඉදිකිරීම | 5604.18 | 4877.32 | 91 | 87.07 | අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය |
| සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම | ධාරිතා සංවර්ධනය | 0.552 | 172,450 | 100 | 40 | පාර්ශවකරුවන් දැනුවත් කිරීම හා සංචාරක කර්මාන්තය සංවර්ධනය |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | 2020 | 2021 | |
| අධ්‍යාපන සංවර්ධනය | ප්‍රාථමික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම | මි.ලි 300 | මි.ලි 330 | ගුණාත්මක අධ්‍යාපනයට මුල් තැන දෙමින් එය පහසුවෙන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම |
| | ද්විතියික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම | මි.ලි 200 | මි.ලි 220 | |
| | කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම | මි.ලි.150 | මි.ලි165 | ගුණාත්මක භාවයෙන් ඉහළ පළාතේ දරුවන් |
| | ගුණාත්මක සංවර්ධනය වැඩි දියුණු කිරීම | මි.ලි.150 | මි.ලි 165 | ඵලදායි සේවාවක් සැපයීම සඳහා යෝග්‍ය වූ ආයතන ලෙස ක්‍රමවත් කිරීම. |
| සංචාරක සංවර්ධනය | යටිතල පහසුකම් සංවර්ධනය. | මි.ලි 120 | මි.ලි.132 | ගුණාත්මක සංචාරක කර්මාන්තයක් තුළින් දේශීය ආදායම ඉහළ නැංවීම |
| | සංචාරක ආකර්ශණීය ස්ථාන පහසුකම් සැපයීම. | මි.ලි.40 | මි.ලි.44 | |
| | සංචාරක මානව සම්පත් සංවර්ධනය. උතුරුමැද පළාතේ සංචාරක ස්ථාන ප්‍රවර්ධනය | මි.ලි.20 | මි.ලි .22 | |
| | ආයතන සම්බන්ධීකරණය | මි.ලි.10 | මි.ලි.110 | |
| විකල්ප බල ශක්ති | පළාත තුළ සූර්ය බලශක්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | මි.ලි.40 | මි.ලි.44 | බල ශක්තිය සඳහා වැයවන මුදල අවම කිරීම. |
| ජීවනෝපාය සංවර්ධනය | පළාතේ ජීවනෝපාය සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මකකිරීම. | මි. ලි. 50 | මි.ලි.55 | ග්‍රාමීය ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම. |
| ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | නිවාස ඉදිකිරීම | 150 | 115 | ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම |
| සංස්කෘතික කටයුතු සංවර්ධනය | ආගමික හා සංස්කෘතික කටයුතු සංවර්ධනය | 60 | 66 | ජනතාවගේ ආධ්‍යාත්මික යහපැවැත්ම සංවර්ධනයට දායකත්වය සැපයීම. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය ඉහළ කාර්ය සාධනයක් කරා ළඟා වීමට හැකි වූ බව ප්‍රකාශ කළ හැකිය. විශේෂයෙන්ම පළාතේ අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා පැවැති භෞතික මෙන්ම මානව සම්පත් අවශ්‍යතා 2019 වර්ෂය තුළ දී සැලකිය යුතු මට්ටමකින් සම්පූර්ණකර ගැනීමට හැකි විය. එහිදි පාසල් ගොඩනැගිලි, පන්ති කාමර අවශ්‍යතා, විද්‍යාගාර අවශ්‍යතා, ගුරු නිවාස,කාර්යාල ගොඩනැගිලි,ගුණාත්මක යෙදුම් ආදී පාසල් පද්ධතියේ සංවර්ධනය උදෙසා භෞතික අවශ්‍යතා මෙන්ම ගුරුවරුන්ගේ පුහුණු අවශ්‍යතා වැනි මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කරගත හැකි විය.

පළාත් රැකියා විරහිත ජනතාව සඳහා ස්වයං රැකියා අත්වැලක් සැපයීම සඳහා දිරිය සහන වැඩ සටහන යටතේ ප්‍රතිලාභීන් ප්‍රමාණයකට ද පළාතේ වගාව සඳහා භාවිතා නොකළ ඉඩම්වල ඵලදායීව ඉහළ නංවමින් හා එම ජනතාවගේ ආර්ථික තත්වය ඉහළ නංවමින් අපනයනය අභිමුඛ ආර්ථික වගාවක් ලෙස අඹ වගා ව්‍යාපෘතිය ද කැපී පෙනේ. එමෙන්ම සංචාරක,දිරිය සහන,අධ්‍යාපන,පූර්ව ළමාවිය,නිවාස පහසුකම්,විකල්ප විදුලිබල සැපයීම් ස්ථාපිත කිරීම,සංස්කෘතික,පුස්තකාල ජීවනෝපාය සංවර්ධනය ආදි සංරචකයන් තුළින් කැපීපෙනන වෙනස්කම් කිරිමට හැකිවිය.

අතිගරු ජනාධිපතිතුමාගේ '' සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් යහපත් සමාජයක් '' සෞභාග්‍යමත් පළාතක් '' යන ආයතනයේ දැක්ම කරා ළඟා වීමට පළාතේ දරුවන් සඳහා අධ්‍යාපන පහසුකම් සංවර්ධනය, ප්‍රාදේශීය මහජන අවශ්‍යතා සපුරාලීම සඳහා පළාත් පාලන සේවා දියුණු කිරීම, ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරිම, පළාතේ තරුණ තරුණයින් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබා ගත හැකි වන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරිම, යටිතල පහසුකම් පද්ධතීන් විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරිම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරිම හා පළාත තුළ ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම වැනි දෑ ක්‍රියාත්මක කරන ලදී.

රටේ ජීවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරිම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවිම,පළාතේ සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳව දැනුවත් කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මෙන්ම තරුණ තරුණයින්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරිම, අධික විදුලි අවශ්‍යතාවන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වාදීම, සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරිම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංචාරක ගම්මාන ඇති කිරීම, ප්‍රවර්ධනය, මනව සම්පත් සංවර්ධනය හා දේශීය විදේශීය සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම වැනි වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස 2019 වර්ෂයේ පැවති ජනාධිපතිවරණ මැතිවරණ නිසා මැතිවරණ නිතිරිති අනුව කටයුතු කිරිමට සිදුවීම තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් සිදු වීම , විවිධ ව්‍යාපෘති සඳහා පාසල් ගොඩනැගිලි ඉංජිනේරු අංශයෙන් සැලසුම් ප්‍රමාණ පත්‍ර හා අදාල ගැලපීම් සහිත ඇස්තමේන්තු ලබා ගැනීමේදි කඩිනමින් ලබා ගැනීමට නොහැකි විම හේතුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන ආරම්භ කිරිමට ප්‍රමාදවිම, අත් මුදල් නිසි කලට නොලැබීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිම, අත් මුදල් අවශ්‍යතාවයට නොලැබීම , 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ සංවර්ධන ව්‍යාපෘතිවලින් 25% ප්‍රතිපාදන අවුරා තැබීම වැනි අභියෝග හා ගැටළු සඳහන් කළ හැකිය.

# 6.1.පළාත් පාලන දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

මහජන සෞඛ්‍ය, පොදු මංමාවත්, උපයෝගිතා සේවා විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම තුළින් සුබ විහරණය හා පහසුකම් සුභසාධනය ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනය අනුව පළාත් ආයතන පිහිටුවා ඇත.

ඒ අනුව පළාත් පාලන ආයතනයක් යනු නෛතික පුද්ගලභාවයක් ඇති ,අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත, ආයතනය නමින් නඩු පැවරීමට හා නඩු පැවරීමකට යටත්ව දේපල අත්පත්කර ගැනීම , දැරීම බැහැර කිරීම හා ගිවිසුම්වලට එළඹීමට හැකි ආයතනයක් ලෙස ක්‍රියාත්මකව පවතී. මේ සඳහා මහනගර සභා පනතේ 34 (1) (2), නගර සභා පනතේ 31 හා ප්‍රාදේශීය සභා පනතේ (2)92) වගන්තිවලින් ප්‍රතිපාදන සැලසී ඇත.ඉහත කාර්යයන් කාර්යය අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා උතුරු මැද පළාතේද පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පොළොන්නරුව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය පිහිටුවා ඇත. එහි පළාත් පාලන කොමසාරිස්වරයෙකු හා සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකු පත්කර ඇති අතර එම කාර්යාල යටතේ පිහිටුවා ඇති පළාත් පාලන ආයතන 27ක් මගින් උතුරු මැද පළාතේ වෙසෙන ජනතාව වෙත සේවා සැපයීම් කරනු ලැබේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 19ක් ක්‍රියාත්මක වේ. ඒවා නම් අනුරාධපුර මහ නගරසභාව,පදවිය,කැබිතිගොල්ලෑව,කහටගස්දිගිලිය,හොරොව්පතාන,ගලෙන්බිඳුණුවැව,මිහින්තලේ, මැදවච්චිය, රඹෑව, තලාව, නොච්චියාගම, රාජාංගනය, කැකිරාව, තිරප්පනේ, ගල්නෑව, පලාගල, ඉපලෝගම , ම.නු.ප හා නැ.නු.ප යන ප්‍රාදේශිය සභා වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ උප කාර්යාලය මගින් පළාත් පාලන ආයතන 09ක් පාලනය වේ. පොළොන්නරුව මහා නගර සභාව, ඇලහැර ප්‍රාදේශීය සභාව, හිඟුරක්ගොඩ, ලංකාපුර, මැදිරිගිරිය, දිඹුලාගල, වැලිකන්ද, පොළොන්නරුව ප්‍රාදේශීය සභා ලෙස මේවා ක්‍රියාත්මක වේ.

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහ නගර සභා | 1 | 1 | 2 |
| ප්‍රාදේශිය සභා | 18 | 7 | 25 |
| ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු | 401 | 173 | 574 |

## ප්‍රාදේශිය සභා - අනුරාධපුර

| | | |
|---|---|---|
| 1. මිහිතලේ | 8. ඉපලෝගම | 15. රාජාංගනය |
| 2. ගලෙන්බිඳුණුවැව | 9. කහටගස්දිගලිය | 16. නොච්චියාගම |
| 3. රඹෑව | 10. නැ.නු.ප | 17. හොරොව්පොතාන |
| 4. කැබිතිගොල්ලෑව | 11. ම.නු.ප | 18. පලාගල |
| 5. පදවිය | 12. කැකිරාව | |
| 6. ගල්නෑව | 13.තිරප්පනේ | |
| 7. මැදවච්චිය | 14. තලාව | |

## ප්‍රාදේශිය සභා - පොළොන්නරුව

| | | | |
|---|---|---|---|
| 1. ඇලහැර | 3.මැදිරිගිරිය | 5. ලංකාපුර | 7. හිඟුරක්ගොඩ |
| 2. වැලිකන්ද | 4.දිඹුලාගල | 6. පොළොන්නරුව | |

## පළාත් පාලන මාර්ග

| ග්‍රාමීය මාර්ග | අනුරාධපුර (කි.මී) | පොළොන්නරුව (කි.මී) | එකතුව |
|---|---|---|---|
| තාර මාර්ග | 965.14 | 155.10 | 1120.24 |
| බොරළු මාර්ග | 7055.45 | 2095.03 | 9150.48 |
| කොන්ක්‍රීට් මාර්ග | 176.79 | 199.87 | 376.66 |
| කුට්ටිගල් මාර්ග | 204.44 | 429.78 | 634.22 |
| කාපට් මාර්ග | 207.05 | 54.35 | 261.43 |
| **එකතුව** | **8608.87** | **2934.13** | **11543.03** |

## පළාත් පාලන පොදු පහසුකම්

| අ.අ | පොදු පහසුකම් වර්ගය | අනුරාධපුර | පොළොන්නරුව | සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | පුස්තකාල | 39 | 25 | 64 |
| 2 | පොදු වෙළඳපල | 637 | 60 | 697 |
| 3 | ප්‍රජා ශාලා | 875 | 235 | 1110 |
| 4 | පෙර පාසල් | 732 | 197 | 929 |
| 5 | බෙහෙත් ශාලා | 91 | 24 | 115 |
| 6 | ක්‍රීඩා භූමි | 269 | 148 | 417 |
| 7 | සුසාන භූමි | 1202 | 219 | 1421 |
| 8 | උද්‍යාන | 25 | 4 | 29 |
| 9 | උත්සව ශාලා | 41 | 5 | 56 |
| 10 | පිහිණුම් තටාක | 2 | 0 | 2 |
| 11 | ගිනි නිවන මධ්‍යස්ථාන | 1 | 1 | 2 |
| 12 | වැඩිහිටි නිවාස | 5 | 0 | 5 |
| 13 | ළමා නිවාස | 7 | 2 | 9 |
| 14 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 32 | 5 | 37 |
| 15 | පොදු ළිං | 6252 | 359 | 6611 |
| 16 | පොදු වැසිකිළි | 58 | 21 | 79 |
| 17 | ළමා සායන | 170 | 45 | 215 |
| 18 | මාතෘ සායන | 46 | 45 | 91 |
| 19 | කොම්පෝස්ට් අංගන | 16 | 3 | 19 |

## දැක්ම

"අවශ්‍යතා සපුරාගත් තෘප්තිමත් ප්‍රජාවක්".

## මෙහෙවර

පළාත් පාලන ආයතනවල මිතුරෙකු, මගපෙන්වන්නෙකු, නියාමකයෙකු සහ දාර්ශනිකයෙකු වශයෙන් විනිවිදභාවයකින් යුතුව සමාජ හා ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සේවා සැපයීම, කාර්යක්ෂම කිරීම සියළුම පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධතා ශක්තිමත් කිරීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහය වීම.

## දිගු කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතනවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය.
2. පළාත් පාලන ආයතනවල සමාජ  යටිතල පහසුකම් සංවර්ධනය.
3. පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණය.
4. ආයතනික ධාරිතා සංවර්ධනය.
5. යහ පාලනය ස්ථාපිත කිරීම.

## කෙටි කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතනවල මං මාවත් වැඩි දියුණු කිරීම.
2. කාර්යක්ෂම වෙළඳ පහසුකම් ඇති කිරීම.
3. ප්‍රජා ජල පහසුකම්  වැඩි දියුණු කිරීම.
4. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තිරසාර යාන්ත්‍රණයක් සැකසීම.
5. පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
6. පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම.
7. පෙර පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය.
8. කාලීනව අතුරු ව්‍යවස්ථා පැනවීම.
9. පළාත් පාලන බල ප්‍රදේශවල සුසාන භූමි සංවර්ධනය.
10. පළාත් පාලන බල ප්‍රදේශවල ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි සංවර්ධනය.
11. පළාත් පාලන ආයතනවල සඵලතාවය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.
12. පළාත් පාලන ආයතන පුද්ගලික අංශය, මධ්‍යම රජය හා පළාත් සභාව අතර මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම.
13. පළාත් පාලන ආයතනවල කාර්යක්ෂම මනා පුහුණුවකින් යුත් කාර්යය මණ්ඩල ස්ථාපිත කිරීම.
14. පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කර්මාන්ත අධීක්ෂණය.

## ප්‍රධාන කාර්යයන්

1. පළාත් පාලන ආයතනවලට තේරීපත්වූ මහජන නියෝජිතයින් පළාත් පාලන විෂය ක්ෂේත්‍රයෙහි දැනුවත් කිරීම හා මර්ගෝපදේශකත්වය ලබා දීම.
2. පළාත් පාලන ආයතනවල ශක්තීන් ගොඩනැගීම.
3. පළාත් පාලන ආයතනවල මූල්‍යම ශක්තීන් ගොඩනැගිම.
4. සම්බන්ධිකරණ කටයුතු.

## ප්‍රධාන උපාය මාර්ගය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්, පළාත් පාලන ආයතන භාර විමර්ෂණ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් පළාත් පාලන ආයතනවල කටයුතු නිරීක්ෂණය හා අධීක්ෂණය.

## අංශය සෘජුව හා වක්‍රව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




**2030 වනවිට ජලය එක්රැස් කිරිම, පිරිපහදු කිරිම, ජලය කාර්යක්ෂමව භාවිතා කිරිම, අප ජලය පිරිසිදු කිරිම, ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතා කිරිම සඳහා තාක්ෂණයද ඇතුළත්ව ජලය හා සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරිම**


2030 වනවිට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මගින් අඩු කිරීම.

ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය දිරිගැන්වීම සහ සහය ලබා දීම.

**යටිතල පහසුකම් නිසි ප්‍රමිතියෙන් යුතුව සංවර්ධනය කිරීම**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 124 |
| 2 | සේවයේ නියුතු | 64 |
| 3 | පුරප්පාඩු | 66 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්භාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 46.86 | 46.05 | 0.81 | 98 |
| ගමන් වියදම් | 2.11 | 2.11 | 0 | 99 |
| සැපයීම් | 4.98 | 4.88 | 0.10 | 98 |
| නඩත්තු වියදම් | 2.14 | 1.73 | 0.41 | 84 |
| ගිවිසුම් ගත සේවා | 4.79 | 3.85 | 0.94 | 80 |
| මාරු කිරීම් | 846.74 | 832.14 | 14.60 | 98 |
| **එකතුව** | **907.63** | **890.76** | **16.87** | **98** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්භාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම් | 415.79 | 121.81 | 293.98 | 31 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 66.43 | 55.71 | 10.72 | 84 |
| ධාරිතා සංවර්ධනය | 0.40 | 0 | 0.40 | 0 |
| වෙනත් මූලධන වියදම් | 153.25 | 46.54 | 106.71 | 30 |
| ආයෝජන (ප්‍රාදේශිය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිය) | 63.34 | 63.34 | 0 | 100 |
| **එකතුව** | **699.22** | **287.40** | **411.82** | **41** |

## අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමවුම් දර්ශක

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **අරමුණු අංක 09 - සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.** | | | |
| 9.1. ආර්ථික සංවර්ධනය හා මානව යහ පැවැත්ම වෙනුවෙන් සියළු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>9.1.1. වසර පුරා භාවිතා කල හැකි මාර්ගයක සිට කි.මී.2 ක දුර ප්‍රමාණයක් තුළ ජීවත්වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය<br>9.1.2. ප්‍රවාහන මාධ්‍ය අනුව මගින් සහ භාණ්ඩ ප්‍රමාණය | පළාත තුල ජීවත්වන ප්‍රජාවගේ අවශ්‍යතාවන් ඉටුකර ගැනීම සඳහා අපහසුතාවයකින් තොරව භාවිතා කල හැකි ආකාරයට සංවර්ධනය කරන ලද ප්‍රවේශ මාර්ග ප්‍රමාණය (බොරළු/තාර/කුට්ටිගල්/කොන්ක්‍රීට්/කාපට් කර සංවර්ධනය කරන ලද කි.මී.ප්‍රමාණය) | 416 | 122 |
| **අරමුණු අංක 06 - සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම** | | | |
| 6.1. 2030 වන විට සියළුදෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකිවීම. | පළාත තුල සුරක්ෂිත කරන ලද පානීය ජලය පාරිභෝජනය කරන පවුල් ඒකක ප්‍රමාණය | 153 | 47 |
| 6.a. 2030 වන විට ජලය එක්රැස් කිරීම ,පිරිපහදු කිරීම,ජලය කාර්යක්ෂමව භාවිතා කිරීම,ප්‍රතිචක්‍රීකරණය,නැවත භාවිතා කිරීම සඳහා තාක්ෂණය ද ඇතුළත්ව ජලය හා සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ වැඩ සටහන් හා ක්‍රියාකාරකම් සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ලබාදෙන අන්තර්ජාතික සහයෝගිතාව හා ධාරිතාවන් ශක්තිමත් කිරීමේ සහයෝගය ඉහළ නැංවීම. | ස්ථාපිත කරන ලද ජල ව්‍යාපෘති ප්‍රමාණයෙන් සක්‍රියව පවතින ව්‍යාපෘති ප්‍රමාණය | | |
| 6.b. ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශිය ප්‍රජාවගේ සහභාගිත්වය දිරි ගැන්වීම හා සහය ලබාගැනීම.<br>සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන පානීය ජල පහසුකම් සේවා භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය | නිකුත් කරනු ලබන පරිභෝජනයට සුදුසු ජල ධාරිතාවය | | |
| 6.a.1. රාජ්‍ය සම්බන්ධිකරණයෙන් යුක්ත වැය සැලැස්මේ කොටසක් ලෙස ජල හා සනීපාරක්ෂණය සහ සම්බන්ධව ක්ෂේත්‍ර සංවර්ධනයට සහය ලැබෙන ප්‍රමාණය | - | | |
| 6.b.1. ජල සහ සනීපාරක්ෂක කළමනාකරණය සඳහා ප්‍රාදේශිය ජන කණ්ඩායම් සහභාගි කර ගැනීම සඳහා ස්ථාපිත සහ ක්‍රියාත්මක ප්‍රතිපත්ති සහිත පළාත් පාලන ඒකක ප්‍රමාණය නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම | ඉදිකරන ලද මහජන වැසිකිළි පද්ධති ප්‍රමාණය | | |

## තිරසර සංවර්ධන අරමුණ අංක 11- නගර සහ ජනාවාස පරිපූර්ණ,ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක |
|---|---|
| 11.6. 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම | 01.පළාත් පාලන ආයතන මට්ටමින් පහසුකම් සංවර්ධනය කරන ලද හා අළුතින් ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ ප්‍රමාණය |
| 11.8. ජාතික සහ කලාපීය සංවර්ධන සැලසුම් ශක්තිමත් කිරීම මඟින් නාගරික, උප නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ධනාත්මක ආර්ථික සමාජයීය සහ පරිසරාත්මක සම්බන්ධතාවලට සහාය දැක්වීම. | 02.පහසුකම් සපයන ලද ශ්‍රවණාගාර ප්‍රමාණය<br>03.වැඩිදියුණු කරන ලද පුස්තකාල ප්‍රමාණය |
| 11.6.1. නගරවල ජනනය වන මුළු නාගරික ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය අතරින් නිතිපතා එකතු කෙරෙන සහ නිසි පරිදි බැහැර කෙරෙන නාගරික ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය | 04.පහසුකම් සපයන ලද නිදහස් උයන් හා පොදු ස්ථාන ප්‍රමාණය |
| 11.a.1. නගර ප්‍රමාණය අනුව ජනගහන ප්‍රක්ෂේපණයන් සහ සම්පත් අවශ්‍යතාවයන් ඒකාබද්ධ කරමින් සිදුකරන නගර සහ ප්‍රාදේශිය සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන නගරයන්හි ජීවත්වන ජනගහනයේ ප්‍රමාණය | 05.පහසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු පළාත් පාලනවල ආදායම් මට්ටමේ වෙනස්වීම |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 09 | 9.1 | 9.1.1/9.1.2 | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 426.737 | 162.074 |
| 06 | 6.1 | 6.a/6.b//6.a.1/ 6.b.1 | පානීය ජල පහසුකම් කළමනාකරණය කිරීම | 83.685 | 32.583 |
| 11 | 11.6<br>11.8 | 11.6.1<br>11.a.1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය කිරීම | 94.191 | 38.690 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති
## (පළාත් පාලන දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති)

| 01 | ව්‍යාපෘතිය - පළාත් පාලන මාර්ග සංවර්ධනය |
|---|---|
| උතුරු මැද පළාත් පලාත් පාලන ආයතන 14 ප්‍රතිලාභින් 175000ක් පමණ ආවරණය වන පරිදි මීටර් 63522 ක් බොරළු දමා සංවර්ධනය කිරීම. | |
| උතුරු මැද පළාත් පලාත් පාලන ආයතන 12 ප්‍රතිලාභින් 150000ක් පමණ ආවරණය වන මීටර් 6017.75 ක් අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇල්ලීම | |
| උතුරු මැද පළාත් පලාත් පාලන ආයතන 03 ප්‍රතිලාභින් 135000ක් පමණ ආවරණය වන මීටර් 2426ක් කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. | |
| උතුරු මැද පළාත් පලාත් පාලන ආයතන 01 ප්‍රතිලාභින් 20000ක් පමණ ආවරණය වන මීටර් 840ක් තාර දමා සංවර්ධනය කිරීම. | |
| උතුරු මැද පළාත් පලාත් පාලන ආයතන 01 ප්‍රතිලාභින් 6500ක් පමණ ආවරණය වන මීටර් 967.25 ක කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | |
| උතුරු මැද පළාත් පලාත් පාලන ආයතන 01ක් ප්‍රතිලාභින් 15000ක් පමණ ආවරණය වන බෝක්කු 09ක් ඉදිකිරීම. | |

| 02 | ව්‍යාපෘතිය - ප්‍රජා ජල පහසුකම් සැපයීම |
|---|---|

| |
|---|
| උතුරු මැද පළාත් පළාත් පාලන ආයතන 10ක් ප්‍රතිලාභීන් 35000ක් ආවරණය වන පරිදි ජල පෙරහන්(RO PLANT) 14ක් ඉදිකිරීම |
| පළාත් පාලන ආයතන 01 ක් ප්‍රතිලාභීන් 50000ක් ආවරණය කරමින් නව ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම |
| පළාත් පාලන ආයතන 06 ක් ප්‍රතිලාභීන් 50000ක් ආවරණය කරමින් ජල ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිමකිරීම හා නවීකරණය කිරීම. |
| පළාත් පාලන ආයතන 03 ක් ප්‍රතිලාභීන් 7500ක් ආවරණය කරමින් නළ එලීම් හා නවීකරණය කිරීම. |
| පළාත් පාලන ආයතන 02 ක් සඳහා නළ ළිං ඉදිකිරීම |

| 03 | ව්‍යාපෘතිය - වෙනත් පළාත් පාලන සේවා |
|---|---|

| |
|---|
| ප්‍රාදේශිය සභා ශ්‍රවණාගාරයේ පියගැටපෙළ සමඟ අත්වැට සැකසීම සිදු කරන ලද අතර මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 15000 කි. |
| පළාත් පාලන අයතන 04ක් ප්‍රතිලාභීන් 25000ක් ආවරණය කරමින් පුස්තකාල 05 සංවර්ධනය |
| ළිඳවැව පොම්පාගාරයේ වැට සහ වැසිකිළිය ඉදිකිරීමේ ඉතිරි වැඩ නිම සිදු කරන ලද අතර මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 750කි. |
| කලාඔය පෙරපාසල සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සිදු කරන ලද අතර මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 6000කි. |
| පදවිය නගරයේ කඩ කාමර 05 ක් ඉදිකිරීම (පළමු අදියර) මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 15000කි. |
| පදවිය ප්‍රාදේශිය සභා රංගශාලාවේ ඉතිරි වැඩ නිම කිරීම සිදු කරන ලද අතර මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 15000කි |
| කැබිතිගොල්ලෑව දිවා සුරකුම් මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිම කළ අතර මෙහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 250කි. |
| පළාත් පාලන දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීම |
| නිල නිවස අළුත් වැඩියාව |
| තලාව,එප්පාවල ආදාහනාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම |
| පළාත් පාලන ආයතන 02ක් සිදු කරන ලද අතර මෙහි ප්‍රතිලාභීන් 50000 ක් ආවරණය කරමින් පොදු වෙළඳ සංකීර්ණ 02 ක ඉතිරි වැඩ නිම කිරීම |

## පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන හඳුනා ගැනීම

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආවරණය කරන ලද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ගණන / ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| පළාත් පාලන මාර්ග සංර්ධනය | බෝක්කු ඉදිකිරීම | 150000 | ප්‍රා.ලේ.කො. 15 තුළ ග්‍රා.නි වසම් 110 ක් ආවරණය කෙරේ. |
| | කුට්ටිගල් අල්ලා මාර්ග සංවර්ධනය කිරීම. | 75000 | ප්‍රා.ලේ.කො 16 තුළ ග්‍රා.නි වසම් 121ක් ආවරණය කෙරේ. |

## විචල්‍ය ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආවරණය කරන ලද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ගණන / ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| පළාත් පාලන මාර්ග සංවර්ධනය | මාර්ග සංවර්ධනය කිරීම | 100000 | ප්‍රා.ලේ.කො. 12 ක් හා ග්‍රා.නි වසම් 40 ආවරණය කෙරේ. |
| පානීය ජල පහසුකම් ලබාදීම | පානීයජල පහසුකම් සකස් කිරීම | 1500 | ප්‍රා.ලේ.කො.01ග්‍රා.සේ.ව. 01 |
| වෙනත් පළාත් පාලන සේවා | වහලය සකස් කිරීම | 1500 | ප්‍රා.ලේ.කො.01ග්‍රා.සේ.ව. 01 |

## විශේෂ පළාත් පාලන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම |
|---|---|
| පානිය ජල පහසුකම් ලබාදීම | සිසුන්ගේ හා මව්වරුන්ගේ පරිහරණය සඳහා ජල මූලාශ්‍රයක්,කාමරයක්,ජල කුළුණක් හා නළ පද්ධතිය සවිකිරීම |
| වෙනත් පළාත් පාලන සේවා | ගොඩනැගිලි නවීකරණය, ක්‍රීඩා පිටි හා ක්‍රීඩාංගණ සංවර්ධනය |
| පළාත් පාලන මාර්ග වැඩිදියුණු කිරීම | පළාත් පාලන ආයතන බලප්‍රදේශ ආවරණය කරමින් බොරළු,කුට්ටිගල්,කොන්ක්‍රීට්,තාර මාර්ග සංවර්ධනය කිරීම |

## යටිතල පහසුකම් වත්කම් ප්‍රාදේශිය සහා මාර්ග වැඩි දියුණු කිරීම

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම |
|---|---|
| පානිය ජල පහසුකම් ලබාදීම | සිසුන්ගේ හා මව්වරුන්ගේ පරිහරණය සඳහා ජල මූලාශ්‍රයක්,කාමරයක්,ජල කුළුණක් හා නල පද්ධතිය සවිකිරීම |
| වෙනත් පළාත් පාලන සේවා | ගොඩනැගිලි නවීකරණය හා වහලය සකස් කිරීම, ක්‍රීඩා පිටි හා ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම |
| පළාත් පාලන මාර්ග වැඩිදියුණු කිරීම | පළාත් පාලන ආයතන බලප්‍රදේශ ආවරණය කරමින් බොරළු,කුට්ටිගල්,කොන්ක්‍රීට්,තාර හා අවශ්‍ය ස්ථානවල කාණු පද්ධතිය සංවර්ධනය කිරීම |

## ආයෝජන - ස්වභා උයන් හා උල්පත් සංවර්ධනය

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම |
|---|---|
| ප්‍රජා ජල පහසුකම් සංවර්ධනය | ස්වභාවික උල්පත් සංවර්ධනය කිරීම |

## තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට කරන ලද දායකත්වය

පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් 2019 වර්ෂයේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

## පළාත් පාලන මාර්ග සංවර්ධනය

2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද හා අනුමත වියාපෘති ගණන 174 කි. එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 106 ක් සඳහා සියළුම ගෙවීම් සිදුකර අවසන් අතර , අතැති බිල්පත් වශයෙන් ව්‍යාපෘති 51 ක් සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණි. එක් අවිච්ඡේද ව්‍යාපෘතියක් ඇති අතර , වැඩ අවසන් කිරීමට නොහැකි වූ හා බිල්පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ ව්‍යාපෘති ගණන 16 කි. ඒ අනුව ගෝලීය තිරසර සංවර්ධන අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද අපහසුතාවයකින් තොරව භාවිතා කළ හැකි ආකාරයට සංවර්ධනය කරන ලද ප්‍රවේශ මාර්ග ප්‍රතිලාභින් ලක්ෂ පහක් පමණ (500000) ආවරණය කරමින් පළාත් පාලන ආයතන 25 ක් තුළ ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා වෙන් කරන ලද රු.194,000,000.00 මුදලින් රු.101,472,768.00 ක ව්‍යාපෘති වෙනුවෙන් ගෙවා අවසන් කර ඇති අතර, අතැති බිල්පත් හා අවිච්ඡේද වැඩ සඳහා පිළිවෙලින් රු. 48,976,440.00ක් හා 3,710,941.00 වශයෙන් ගෙවීමට ඇත.

මෙසේ ව්‍යාපෘති සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමට වර්ෂ ආරම්භක කාර්තුව අවසන් වීමත් සමඟ රටතුළ ඇතිවන ලද භීෂණකාරී වටපිටාව හා වර්ෂ අවසානයේ පවත්වන ලද ජනාධිපතිවරණ ඡන්ද විමසීම මෙන්ම අයහපත් කාළගුණික තත්වය ද පෙන්වා දිය හැකි අතර , අපේක්ෂිත අක් මුදල් නොලැබීමද එක් හේතුවකි. එසේම 661 වැය ශීර්ෂය යටතේ පළාත් පාලන මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.166,599,990.00 ක මුදලක් වෙන් කරමින් ව්‍යාපෘති 260 ක් ක්‍රියාත්මක කිරීම අනුමත කර මෙම දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබිණි.

මෙමඟින් ප්‍රතිලාභින් 150,000ක් පමණ ආවරණය කරමින් පළාත් පාලන ආයතන තුළ ක්‍රියාක්මක කරන ලද ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 19 ක සම්පූර්ණ වැඩ අවසන් කරන ලද බිල්පත් 19 ක් වෙනුවෙන් රු. 19,332,423.00 ගෙවා ඇත. එසේම අතැති බිල්පත් 211 ක් සඳහා රු. 115,045,321.00 ක් ලබා දෙන ලෙස පළාත් භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

විචල්‍ය ව්‍යාපෘති යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති 45 ක් සඳහා රු.55,500,000.00 වෙන් කර දී තිබුණි. එම ව්‍යාපෘතිවලින් එක් ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන් අවසන් කරන ලද අතර , ව්‍යාපෘති 33 සඳහා අතැති බිල්පත් වශයෙන් රු.40,231,424.00 ක මුදලක් ඉල්ලා ඇත.

පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංක 662 යටතේ අඛණ්ඩ ව්‍යාපෘති සඳහා වෙන්කර දී තිබූ රු. 8,664,929.00 ක මුදලින් රු. 8,311,513 ක් වියදම් දරා සියළුම අඛණ්ඩ ව්‍යාපෘති සඳහා ගෙවීම් අවසන් කර ඇත.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2019 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය වෙනුවෙන් රු.18,000,000.00 වෙන් කර දී තිබුණි. එම මුදලින් 2018 වර්ෂයේ ඉදිරිපත් කරන ලද අඛණ්ඩ ව්‍යාපෘති සඳහා රු.5,277,798.00 ක වියදමක් දරා සියළුම අඛණ්ඩ වැඩ අවසන් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත භාරදී ඇත. 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පළාත් භාණ්ඩාගාර චක්‍ර ලේඛ 11/2019 හා 12/2019 අනුව අවලංගු කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අපේක්ෂිත අරමුණු හා තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සම්බන්ධයෙන් තරමක සාධනීය නොවන තත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

## පානීය ජල පහසුකම් ලබාදීම.

පානීය ජල පහසුකම් ලබා දීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.75,000,000.00 මුදලක් වෙන්කර දී තිබුණි. එම මුදලින් සම්පූර්ණ වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් රු. 23,898,198.00 ක මුදලක් ගෙවා ඇත. අතැති බිල්පත් වෙනුවෙන් රු. 28,923,907.00 ක මුදලක් ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් ඉල්ලා ඇති අතර , අඛණ්ඩ වැඩ සඳහා ව්‍යාපෘති 19 ක් සඳහා රු. 11,066,228.00 මුදලක් ඉල්ලීම් කර ඇත.

මෙම සියළුම ව්‍යාපෘති සඳහා ගෝලීය තිරසර සංවර්ධන අරමුණු වන සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම පාදක කර ගනිමින්, සියළු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමේ ඉලක්ක සපුරා ගැනීමට ප්‍රතිලාභීන් ලක්ෂයකට (100000) ආසන්න ප්‍රමාණයකට ජල පහසුකම් ලබාදීමට අවකාශ සලසා දී ඇත.

## වෙනත් පළාත් පාලන පහසුකම් ලබාදීම

පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වෙනත් පොදු සහසුකම් සංවර්ධනය කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2019 වර්ෂයේ ව්‍යාපෘති 22 ක් සඳහා රු.60,000,000.00 වෙන්කර දෙන ලදී. එම ව්‍යාපෘතිවලින් රු. 17,764,255.00 ක් සම්පූර්ණයෙන් වැඩ අවසන්කර බිල්පත් ගෙවා නිම කර ඇත. එසේම අතැති බිල්පත් වශයෙන් රු. 1,156,718.00 ක මුදලක් ව්‍යාපෘති 04 ක් යටතේ ද ඇති අතර, රු.10,406,205.00ක් අඛණ්ඩ වැඩ වෙනුවෙන් ගෙවීමට ද ඇත.

නගර සහ ජනාවාස පරිපූර්ණ,ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම යන ගෝලීය තිරසර සංවර්ධන අරමුණ ළගාකර ගැනීමට ප්‍රතිලාභීන් දෙලක්ෂ පනස්දාහකට (250000) පමණ ප්‍රතිලාභ සැලසීමේ ඉලක්ක සපුරා ගැනීමට පළාත් පාලන ආයතන මට්ටමින් පහසුකම් සංවර්ධනය කරන ලද හා අළුතින් ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ ,පහසුකම් සපයන ලද ශ්‍රවණාගාර ,වැඩිදියුණු කරන ලද පුස්තකාල,පහසුකම් සපයන ලද නිදහස් උයන් හා පොදු ස්ථාන ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට හැකියාව ලැබුණි.

පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා වෙනත් අමාත්‍යාංශ හා රේඛීය අමාත්‍යාංශ යටතේ ව්‍යාපෘති 39 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. 65,204,354.00 ක මුදලක් වෙන්කර දී තිබුණි. එම මුදලින් ව්‍යාපෘති 33 ක් සම්පූර්ණයෙන් අවසන් කර රු. 56,290,797.00 ක මුදලක් ගෙවා අවසන් කර ඇති අතර ව්‍යාපෘති 06 ක් අවසන් කිරීමට නොහැකි වී ඇත.

පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පලාත් පාලන ආයතන 29 ක් ආවරණය කරමින් ව්‍යාපෘති 75 ක් සඳහා 2019 වර්ෂයේ රු.123,868,499.00 ක් වෙන්කරමින් රු. 87,001,176.00ක් වියදම් දැරීමට කටයුතු කර ඇත.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම

| අ.අ. | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | වියදම /ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 01 | පළාත් පාලන මාර්ග සංවර්ධනය | නවීකරණය කරන ලද හා අළුතින් ඉදිකරන ලද මාර්ග ප්‍රමාණය | 69 | 174 | 101.472 | 425 |
| 02 | ප්‍රජා ජල පහසුකම් ලබාදීම | ප්‍රජා ජල පහසුකම් සපයන ලද ස්ථාන ගණන | 1 | 30 | 23.898 | 77.5 |
| 03 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ස්ථාපිත කරන ලද මධ්‍යස්ථාන ගණන | 11 | 05 | 5.277 | 162 |
| 05 | වෙනත් සේවා | පුස්තකාල සේවා,ක්‍රීඩා පිටි සංවර්ධනය,පූජා භූමි සංවර්ධනය වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය කරන ලද ස්ථාන ගණන | 08 | 22 | 17.364 | 192 |

## 2019 වර්ෂයේ නව වැඩ සාරාංශය

| ව්‍යාපෘතියේ නම | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පළාත් පාලන මාර්ග සංවර්ධනය | 136.04 | 67.49 | 50 |
| ප්‍රජා ජල පහසුකම් සැපයීම | 52.84 | 7.97 | 15.08 |
| වෙනත් පළාත් පාලන සේවා | 29.24 | 11.52 | 39.39 |
| **එකතුව** | 218.12 | 86.98 | 39.87 |

## විශේෂ අවශ්‍යතා ඇති ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ මාර්ග සකස් කිරීම, පෙට්ටි බෝක්කු ඉදි කිරීම, කාණු පද්ධති සකස් කිරීම,පාලම් ඉදි කිරීම වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු.මි.157.89ක මුදලක් වෙන් කරන ලද අතර රු.මි.19.32 ක මුදලක් වැය කරන ලදී.

## විචල්‍ය සංවර්ධන ව්‍යාපෘති - 24

උතුරු මැද පළාත තුළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන යටතේ කුට්ටිගල් අල්ලා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, බෝක්කු ඉදි කිරීම හා පානීය ජල පහසුකම් ලබා දීම වැනි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ, ගලෙන්බිඳුණුවැව, මධ්‍යම නුවරගම් පළාත, නැගෙනහිර නුවරගම් පළාත, කැකිරාව, ගල්නෑව, පලාගල, ඉපලෝගම, මිහින්තලය. කැබිතිගොල්ලෑව, හොරොව්පතාන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු.මි.55.50 ක මුදලක් වෙන් කරන ලද අතර රු.මි 1.00ක මුදලක් වැය කරන ලදී.

## විශේෂ පළාත් පාලන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ ජල පද්ධති ලබා දීම, ළදරු පාසල් ගොඩනැගිල්ල නවීකරණය කිරීම, කාණු පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම, බොරළු දමා මාර්ග සංවර්ධනය කිරීම, කුට්ටිගල් අතුරා මාර්ග සකස් කිරීම වැනි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම, ගල්නෑව, තලාව, පලාගල,මිහින්තලය, කැබිතිගොල්ලෑව, මධ්‍යම නුවර ගම් පළාත, ගලෙන්බිඳුණුවැව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු.මි.19.39 ක මුදලක් වෙන් කරන ලද අතර රු.මි 10.68ක මුදලක් වැය කරන ලදී.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂයය පථයට හසුවන අරමුණ | මුදල | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| | | වෙන්කල (රු.මි) | වැය කළ (රු.මි) | |
| ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ප්‍රාදේශිය සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතියේ(LDSP) වැඩ 2019 වර්ෂ අවසානයේ ආරම්භ කිරීමට කටයුතු කර ඇත | පළාත් පාලන මාර්ග සංවර්ධනය, ප්‍රජා ජල පහසුකම් සැපයීම, වෙනත් පළාත් පාලන සේවා සංවර්ධනය කිරීම. | 1583 | 63.340 | මේ වන විට ව්‍යාපෘතිය ආරම්භක මට්ටමේ පවතී. |

## වෙනත් රේඛීය අමාත්‍යංශ/දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය/ ක්‍රියාකාරකම | අරමුණ | මුදල | | ප්‍රගතිය | | දිගුකාලීන හා කෙටි කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය(%) | |
| කඩාටුගම මාර්ගය ප්‍රතිසංස්කරණය | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 5.127 | 5.127 | 100 | 100 | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. |
| කටුකැලියාව ගම මැද පාර ප්‍රතිසංස්කරණය | | 5.150 | 5.150 | 100 | 100 | |
| කටුකැලියාව මාර්ගය ප්‍රතිසංස්කරණය | | 7.090 | 7.090 | 100 | 100 | |
| ඉහල අඟුනොච්චිය කුඹුක්ගොල්ලෑව මාර්ගය කුට්ටිගල් ඇල්ලීම | | 1.990 | 1.990 | 100 | 100 | |
| ලේවාසපිරිවැව මාර්ගය කුට්ටිගල් ඇල්ලීම | | 1.955 | 1.955 | 100 | 100 | |
| මුක්කරවැව මැදවච්චිය මාර්ගයේ සිට දඹගහවැව දක්වා මාර්ගය කුට්ටිගල් ඇල්ලීම | | 1.989 | 1.989 | 100 | 100 | |
| නිකවැව මාර්ගය කුට්ටිගල් ඇල්ලීම | | 1.976 | 1.976 | 100 | 100 | |
| කිවුලේකඩ වවුනියා මාර්ගයේ සිට සුසාන භූමිය දක්වා මාර්ගය කුට්ටිගල් ඇල්ලීම | | 1.992 | 1.992 | 100 | 100 | |
| **එකතුව** | | **27.26** | **27.26** | **100** | **100** | |

**වෙනත් රේඛීය අමාත්‍යංශ/දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස...**

| ව්‍යාපෘතිය /ක්‍රියාකාරකම | මුදල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
| ඉහළ අඟුනොච්චිය සුසාන භූමිය ඉදිරිපිට මාර්ගය අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇල්ලීම | 1.839 | 1.839 | 100 | 100 |
| ආනඹලොන්දැව පාසල අසල සිට සායන මධ්‍යස්ථානය දක්වා මාර්ගය කුට්ටිගල් ඇතිරීම. | 1.983 | 1.983 | | |
| වැලිගොල්ලැව ගම මැද මාර්ගය ගල් අතුරා තාර යෙදීම | 1.248 | 1.248 | | |
| 119 ඉහළ අඟුනොච්චිය මුස්ලිම් විද්‍යාලයේ ක්‍රීඩා පිටිය ඉදිකිරීම | 1.871 | 1.871 | | |
| කිවුලේකඩ ගම්මානයේ පොදු ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | 1.984 | 1.984 | | |
| රන්පත්විල මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | 0.896 | 0.896 | | |
| මිහින්තලේ තිස්ස ක්‍රීඩාංගනය සඳහා ප්‍රේක්ෂකාගාරයක් ඉදිකිරීම | 0.429 | 0.429 | | |
| කටුකැලියාව මුස්ලිම් විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය | 1.964 | 1.964 | | |
| නාච්චාදූව මහජන ක්‍රිඩාංගනය ප්‍රතිසංස්කරණය කිරීම | 1.630 | 1.630 | | |
| 528 ඥානික්කුලම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | 1.084 | 1.084 | | |
| රන්පත්විල මහා විද්‍යාලයීය ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | 1.074 | 1.074 | | |
| මිහින්තලේ තිස්ස ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම | 1.459 | 1.459 | | |
| කැබිතිගොල්ලෑව කලවැදි උල්පත සංවර්ධනය කිරීම | 0.878 | 0.878 | | |
| කැබිතිගොල්ලෑව වත්තේවැව ශ්‍රී බෝධිරාජාරාම විහාරයේ ජල පෙරණ යන්ත්‍රය සඳහා ජල ටැංකියක් ලබා ගැනීම හා ජල නළ පද්ධතිය එලීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 1.725 | 1.725 | | |
| කැබිතිගොල්ලෑව වත්තේවැව ශ්‍රී බෝධිරාජාරාම විහාරයේ ජල පෙරණ යන්ත්‍රය සඳහා ජල ටැංකියක් ලබා ගැනීම හා ජල නළ පද්ධතිය එලීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 0.494 | 0.494 | | |
| 521 වන්නම්කුලම තුලානේ වන්නම්කුලම ජල පෙරණය සවිකිරීමේ ව්‍යාපෘතිය | 1.975 | 1.975 | | |
| පදවිය රුවන්පුර ජල පිරිපහදු ඒකකයක් ස්ථාපිත කිරීම | 2.612 | 2.612 | | |
| ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස දක්වා මාර්ගය අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇල්ලීම | 1.858 | 1.505 | | |
| **මුළු එකතුව** | **11.001** | **10.648** | | |

## පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන -2019

| පළාත් පාලන ආයතනය | විෂයය පථයට අදාල අරමුණ | මුදල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි) | වැය කළ(රු.මි) | භෞතික ප්‍රගතිය(%) | මූල්‍ය ප්‍රගතිය(%) |
| නැ.නු.ප | ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම | 11.70 | 2.56 | 50 | 50 |
| කැකිරාව | | 5.75 | 2.69 | 50 | 50 |
| ගල්නෑව | | 1.98 | 0.97 | 100 | 100 |
| ඉපලෝගම | | 0.99 | 0.96 | 100 | 100 |
| කැකිරාව | | 3.93 | 3.85 | 100 | 100 |
| තිරප්පනේ ප්‍රා .ස | | 2.97 | 2.97 | 100 | 100 |
| තලාව ප්‍රා .ස | | 0.95 | 0.92 | 100 | 100 |
| පලාගල ප්‍රා. ස | | 1.99 | 1.89 | 1.99 | 1.89 |
| පොළොන්නරුව | යටිතල පහසුකම් සංවර්ධනය | 10.02 | 2.92 | 50 | 50 |
| මැදිරිගිරිය ප්‍රා. ස | | 1.95 | 1.29 | 100 | 100 |
| එකතුව | | **42.23** | **21.02** | | |
| ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) - 2019 | | | | | |
| කහටගස්දිගිලිය | ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම | 1.91 | 1.61 | 100 | 100 |
| රාජාංගනය | ප්‍රාදේශිය සභා ආදායම් තත්වය ඉහළ නැංවීම | 3.86 | 3.53 | 100 | 100 |
| පදවිය | | 1.75 | 1.63 | 100 | 100 |
| කැබිතිගොල්ලෑව | | 3.58 | 1.48 | 100 | 100 |
| තිරප්පනේ | | 1.98 | 1.95 | 100 | 100 |
| ම.නු.ප | | 8.13 | 7.12 | 100 | 100 |
| හිඟුරක්ගොඩ | | 1.99 | 1.99 | 100 | 100 |
| පලාගල | | 3.87 | 3.61 | 100 | 100 |
| ගල්නෑව | | 5.23 | 4.55 | 100 | 100 |
| ඇළහැර | | 1.16 | 1.07 | 100 | 100 |
| තලාව | | 3.79 | 1.60 | 90 | 90 |
| නැ.නු.ප | | 0.77 | 0.76 | 100 | 100 |
| රඹෑව | | 1.44 | 0.00 | 100 | 100 |
| මැදවච්චිය | | 2.82 | 2.57 | 100 | 100 |
| හොරොව්පතාන | | 4.39 | 2.33 | 100 | 100 |
| ලංකාපුර | | 1.98 | 0.43 | 100 | 100 |
| වැලිකන්ද | | 1.88 | 1.68 | 100 | 100 |
| නොච්චියාගම | | 1.99 | 1.17 | 50 | 50 |
| එකතුව | | **52.52** | **39.08** | | |

පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ප්‍රාදේශීය සභාවල ස්වයං උත්පාදන ආදායම් වර්ධනය, ප්‍රාදේශිය සභාවල ආදායම් තත්වය ඉහළ නැංවීම වැනි කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිඵල කරා ළඟා වීම අපේක්ෂාව විය.

## ග්‍රාමීය මාර්ග කි.මී.1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2019

| පළාත් පාලන ආයතනය | විෂයය පථයට අදාල අරමුණ | මුදල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික ප්‍රගතිය(%) | මූල්‍ය ප්‍රගතිය(%) |
| ලංකාපුර | ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම | 11.89 | 11.81 | 100 | 100 |
| මැදිරිගිරිය | ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම | 17.19 | 15.07 | 100 | 100 |
| එකතුව | | 29.08 | 26.88 | - | - |

2019 වර්ෂය තුළ වෙනත් රේඛීය අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති සඳහා රු.මි. 123.87ක් වෙන් කරන ලද අතර ඒ සඳහා වැය වූ මුදල රු.මි.87කි.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අංශය/අරමුණු | ඉලක්ක 2020 -2021 | | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|---|
| පළාත් පාලන මාර්ග සංවර්ධනය(කි.මී) | 175 | 200 | අවම කාලයක් තුළ ගමනාන්තය කරා ළඟා වීමට සුදුසු මාර්ග පද්ධතියක් පළාත තුළ ඇති කිරීම |
| ප්‍රජා ජල පහසුකම් සංවර්ධනය(RO) | 25 | 35 | පරිභෝජනයට සුදුසු පානීය ජල පහසුකම් පළාතේ ජනතාව සුරක්ෂිත කිරීමෙන් නිරෝගී ප්‍රජාවක් බිහි කිරීම |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | 10 | 20 | පිරිසිදු වාත්‍රාශ්‍රය සහිත හා කුණු කසල වලින් තොර පරිසරයක් ඇති කිරීම. කාබනික පොහොර භාවිතය සඳහා ප්‍රජාව යොමු කිරීම තුළින් වස විෂ වලින් තොර ආහාර වර්ග සඳහා හුරු කිරීම තුළින් නිරෝගී පිරිසක් බිහි කිරීම. |
| වෙනත් පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීම | 100 | 150 | කියවීමට හුරු ජනතාවක් බිහි කිරීම තුළින් පළාත තුළ අධ්‍යාපන තත්ත්වය නගා සිටුවීමට අවශ්‍ය පහසුකම් සැලසීම. |

## වියදම් සාරාංශය

| වෙන්කළ කාර්යය | වෙන් කරන ලද මුදල (රු.මි) | වැය කල මුදල (රු.මි) | ව්‍යාපෘති ගණන | ගෙවීම් කර අවසන් ව්‍යාපෘති ගණන | ඉතිරි වූ ව්‍යාපෘතිගණන | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ඇරඹූ | ආරම්භ නොවූ | වෙනත් |
| පළාත් පාලන මාර්ග සංවර්ධනය | 194.00 | 101.47 | 174 | 106 | 51 | 01 | 16 |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති | 18.00 | 5.28 | 05 | 05 | 00 | 00 | 00 |
| පානීය ජල පහසුකම් සැපයීම | 75.25 | 23.89 | 30 | 09 | 19 | 01 | 01 |
| වෙනත් පළාත් පාලන සේවා | 60.00 | 17.76 | 22 | 13 | 04 | 05 | 00 |
| විශේෂ අවශ්‍යතා ඇති ගම්මාන සංවර්ධනය | 166.59 | 19.33 | 260 | 19 | 211 | 00 | 30 |
| විචල්‍ය ව්‍යාපෘති | 52.50 | 1.00 | 46 | 1 | 33 | 00 | 12 |
| ප්‍රාදේශිය සංවර්ධනය (662) | 8.66 | 8.31 | 05 | 05 | 00 | 00 | 00 |
| **එකතුව** | **575.00** | **177.04** | **541** | **158** | **318** | **07** | **58** |

## වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් ලද ව්‍යාපෘති

| අ.අ. | වෙන් කල කාර්යය | | වෙන්කරන ලද මුදල (රු.මි) | වැය කල මුදල (රු.මි) | ව්‍යාපෘති ගණන | ගෙවීම් කර අවසන් ව්‍යාපෘති ගණන | ඉතිරි වූ ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|---|---|---|
| 01 | ස්වභා උයන් හා උල්පත් සංවර්ධනය (630) | | 0.88 | 0.88 | 1 | 01 | 00 |
| 02 | විශේෂ පළාත් පාලන ව්‍යාපෘති (661) – 30 | 2502(viii) | 4.50 | 1.00 | 2 | 01 | 01 |
| | | 2004 (vi) | 1.50 | 1.40 | 02 | 02 | 00 |
| | | 2005 (iii) | 11.39 | 6.42 | 12 | 07 | 05 |
| | | 2005(v) | 2.00 | 1.85 | 02 | 02 | 00 |
| 03 | යටිතල පහසුකම් වත්කම් ප්‍රාදේශිය සහා මාර්ග වැඩි දියුණු කිරීම. (33) 2005(ii) | | 32.59 | 32.34 | 11 | 11 | 00 |
| 04 | යටිතල පහසුකම් වත්කම් ක්‍රීඩා පිටි හා ක්‍රීඩාංගන සංවර්ධනය. (33) 2005(iv) | | 12.69 | 12.39 | 09 | 09 | 00 |
| **එකතුව** | | | **65.55** | **56.28** | **39** | **33** | **06** |

| අ.අ | වෙන් කරන ලද කාර්යය | වෙන්කල මුදල(රු.මි) | වැයකළ මුදල (රු.මි) | අතැති බිල්පත් (රු.මි) | අවිච්ඡේද වැඩ වටිනාකම (රුමි) |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාලීය උපකරණ මිළදී ගැනීම | 0.20 | 0.11 | 0.00 | 0.00 |
| 02 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.40 | 0.18 | 0.00 | 0.00 |
| 03 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.40 | 0.00 | 0.00 | 0.00 |
| 04 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම(30) | 4.65 | 0.00 | 3.03 | 0.00 |
| | **එකතුව** | **5.65** | **0.29** | **3.03** | 0.00 |

## රේඛීය අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

| වෙන්කරන ලද කාර්යය | පළාත් පාලන ආයතන ගණන | ව්‍යාපෘති ගණන | වෙන්කල මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|
| පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩ සටහන -2019 | 07 | 13 | 30.29 | 16.82 |
| ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන (ප්‍රාග්ධන) | 02 | 03 | 11.96 | 4.21 |
| ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) | 18 | 43 | 52.52 | 39.09 |
| ග්‍රාමීය මාර්ග කි.මි.1000 ක් සංවර්ධනය කිරීම | 02 | 16 | 29.09 | 26.88 |
| **එකතුව** | **29** | **75** | **123.86** | **87.00** |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික විසර්ජන ගිණුමෙන් පහත පරිදි ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

**පුනරාවර්තන වියදම් - රු. මි.907**

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - රු.මි. 569**

**පළාත් සභා සංවර්ධන ප්‍රදාන - රු.මි 67**

**වෙනත් මූලධන වියදම් (ආයෝජන) - රු.මි.63**

**2019** වර්ෂය තුළදී ලබා ඇති මූල්‍ය ප්‍රගතිය ලෙස වෙන් කර දෙන ලද පුනරාවර්තන ප්‍රතිපාදන වලින් රු.මි.907 ක් වියදම් දරා තිබුණි . එය වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් 98% ක ප්‍රතිශතයකි. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන්කර දී තිබූ රු.මි. 569 ක මුදලින් රු.මි.168 ක වියදම් දරා 30% ක ප්‍රගතියක් පෙන්වා දී ඇත. නමුත් වර්ෂ අවසානයේ දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අතැති බිල්පත් අනුව අක් මුදල් ලැබුනේ නම් 95% පමණ ප්‍රගතියක් පෙන්වීමට හැකියාව තිබුණි. පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ වෙන්කර දී තිබූ රු.මි.67 ක මුදලින් රු. මි.55 ක වියදම් දරා 87% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්වා දී ඇත.

එසේම වෙනත් මූලධන වියදම් යටතේ වෙන්කර දී තිබූ රු.මි.63 න් රු.මි.63 ම වියදම් දරා 100% ප්‍රගතියක් පෙන්වා දී ඇත. ඒ අනුව පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා 2019 වර්ෂයේ ලබාදෙන ලද ප්‍රතිපාදනවලින් 75% ක පමණ සමස්ත මූල්‍ය ප්‍රගතියක් පෙන්වා ඇත.

| ප්‍රධාන අරමුණ | නව | අඛණ්ඩ |
|---|---|---|
| පළාත් පාලන මාර්ග සංවර්ධනය | 174 | 01 |
| පානීය ජලය | 30 | 01 |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරනය | 05 | 00 |
| වෙනත් සේවා | 22 | 05 |
| රේඛීය අමාත්‍යංශ | 75 | 00 |
| වෙනත් රේඛීය අමාත්‍යංශ /දෙපාර්තමේන්තු යටතේ | 350 | 00 |

ඒ අනුව නව වැඩ යටතේ පවතින ව්‍යාපෘතිවල 70% ක පමණ ප්‍රගතියක් පෙන්වා දී ඇති නමුත් ,අඛණ්ඩ ව්‍යාපෘතිවල 100% ප්‍රගතියක් පෙන්වා දී ඇත.මානව සම්පත් පිළිබඳව සැලකීමේදී පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 124 ක් වුවත් දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය වන්නේ 65කි. දෙපාර්තමේන්තුව සඳහා පැවරී ඇති කාර්යභාරය සමඟ අධීක්ෂණ මට්ටමේ රාජකාරි කටයුතු බොහෝ සෙයින් අවශ්‍ය කාරණයක් වුවත් යම් යම් අවස්ථාවන්වලදී කාර්ය මණ්ඩලය හිඟකමින් එම අවස්ථාවන් මඟ හැරී යාම ගැටළුවට කරුණකි. ඉදිරියේදී පුරප්පාඩුව පවතින කාර්ය මණ්ඩලය සම්පූර්ණකර ගැනීම අත්‍යාවශ්‍යය.

දෙපාර්තමේන්තුව යටතේ පවතින පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී පවතින භෞතික සම්පත් හිඟකම නිසා පවත්වාගෙන යාමේ ගැටළු පවති. එසේ වුවද 2019 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය පිළිබඳව 2018 වර්ෂයට සාපේක්ෂව යහපත් මට්ටමක පවතී.

# 6.2. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ආයතන

1. පාසල්
2. කලාප අධ්‍යාපන කාර්යාල
3. කොට්ඨාස අධ්‍යාපන කාර්යාල
4. අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන
5. ගුරු සංවර්ධන මධ්‍යස්ථාන
6. පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන
7. පරිගණක සම්පත් මධ්‍යස්ථාන

## උතුරුමැද පළාත් පාසල් වර්ගීකරණය - 2019

| කලාපය | ජාතික පාසල් | පළාත් පාසල් | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | | | | | |
| අනුරාධපුර | 3 | 12 | 29 | 46 | 53 | 140 |
| තඹුත්තේගම | 1 | 8 | 11 | 26 | 27 | 72 |
| කැකිරාව | 1 | 9 | 30 | 26 | 65 | 130 |
| ගලෙන්බිඳුණුවැව | 0 | 4 | 18 | 25 | 48 | 95 |
| කහටගස්දිගිලිය/කැබිති | 1 | 6 | 12 | 41 | 68 | 127 |
| **එකතුව** | **6** | **39** | **100** | **164** | **261** | **564** |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | | | | |
| පොළොන්නරුව | 3 | 9 | 8 | 15 | 22 | 54 |
| හිඟුරක්ගොඩ | 5 | 9 | 9 | 26 | 51 | 95 |
| දිඹුලාගල | 1 | 7 | 16 | 17 | 64 | 104 |
| **එකතුව** | 9 | 25 | 33 | 58 | 137 | 253 |
| **උතුරු මැද පළාත** | 15 | **64** | **133** | **222** | **398** | **817** |


1AB- අ.පො.ස(උ.පෙළ) විද්‍යා විෂය ධාරාව සහිත පාසල්
1C- අ.පො.ස(උ.පෙළ) පවතින නමුත් විද්‍යා විෂය ධාරාව නොමැති පාසල්
T2-පළමුවන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඇති පාසල්
T3- පළමුවන ශ්‍රේණියේ සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති පාසල්

## උතුරු මැද පළාතේ මූලික අධ්‍යාපන තොරතුරු

2019 වර්ෂයේදී පළාත් සභාව විවිධ මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් උතුරු මැද පළාත් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය උදෙසා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කළ හැකි විය. උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් ඒ යටතේ ක්‍රියාත්මක කලාප අධ්‍යාපන කාර්යාල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සහ සමස්ත පාසල් පද්ධතියේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය මගින් ගුණාත්මක අධ්‍යාපනයක් කරා උතුරු මැද පළාත ගෙනයාම මුඛ්‍ය පරමාර්ථය විය.

උතුරින් උතුරු පළාතටත්, නැගෙනහිරින් නැගෙනහිර පළාතටත්, බටහිරින් වයඹ පළාතටත්,දකුණින් මධ්‍යම පළාතටත් මායිම් වන රජරට නුවරකළාවිය හෙවත් වැව් බැඳි රාජධානිය ලෙස විරුදාවලිය ලද උතුරු මැද පළාත පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වේ.පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත උතුරු මැද පළාත අධ්‍යාපන කලාප 08 කින් යුක්ත වේ. අනුරාධපුර, කැකිරාව,තඹුත්තේගම, ගලෙන්බිඳුණුවැව හා කැබිතිගොල්ලෑව යන අධ්‍යාපන කලාප 05 අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් අතර පොළොන්නරුව,හිඟුරක්ගොඩ හා දිඹුලාගල යන අධ්‍යාපන කලාප 03 පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වේ.

අධ්‍යාපන කලාප හා කොට්ඨාස පිහිටීම - උතුරු මැද පළාත




මෙම කලාප අධ්‍යාපන කාර්යාල 08 යටතේ අධ්‍යාපන කොට්ඨාස තිහක් පාලනය වන අතර, උතුරු මැද පළාතට අයත් අධ්‍යාපන කලාප 08 හා අධ්‍යාපන කොට්ඨාස 30 සහ පාසල් 817 හි ව්‍යාප්තිය පහත වගුව පරිදි දැක්වේ.

## අධ්‍යාපන කලාප අනුව කොට්ඨාස සහ පාසල් සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | කලාපය | කොට්ඨාස සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | ජාතික පාසල් | පළාත් පාසල් | එකතුව |
| අනුරාධපුර | අනුරාධපුරය | 6 | 3 | 137 | 140 |
| | කැකිරාව | 5 | 1 | 129 | 130 |
| | තඹුත්තේගම | 4 | 1 | 71 | 72 |
| | ගලෙන්බිඳුණුවැව | 3 | 0 | 95 | 95 |
| | කැබිතිගොල්ලෑව | 4 | 1 | 126 | 127 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **22** | **6** | **558** | **564** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 2 | 3 | 51 | 54 |
| | හිඟුරක්ගොඩ | 3 | 5 | 90 | 95 |
| | දිඹුලාගල | 3 | 1 | 103 | 104 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **8** | **9** | **244** | **253** |
| උතුරු මැද පළාත | | **30** | **15** | **802** | **817** |

මෙම පාසල් අටසිය දාහතෙන් (817)  1 ඒබී පාසල් හැට හතරකින් (64 ) , 1 සී පාසල් එකසිය තිස්තුනකින් (133) , Type 2 වර්ගයේ පාසල් දෙසිය විසි දෙකකින් (222) සහ Type 3 වර්ගයේ පාසල් තුන්සිය අනු අටකින් (398) සමන්විත වේ.

## පාසල් වර්ගීකරණය අනුව පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප මට්ටමින්

උතුරු මැද පළාතේ 2019 වර්ෂය අවසන් වනවිට පාසල් 817 ක් පැවති අතර එහි සිසුන් දෙලක්ෂ අනුඅටදහස් අටසිය හැට නමයක් (298,869) ඉගෙනුම ලබා ඇත. ක්‍රියාත්මක පාසල් 817 න් 802 ක් පළාත් සභා පාසල් වන අතර පාසල් 15 ක් ජාතික පාසල් වේ.

| කලාපය | 1 AB | 1 C | Type 2 | Type 3 | එකතුව |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 12 | 29 | 46 | 53 | 140 |
| කැකිරාව | 9 | 30 | 26 | 65 | 130 |
| තඹුත්තේගම | 8 | 11 | 26 | 27 | 72 |
| ගලෙන්බිඳුණුවැව | 4 | 18 | 25 | 48 | 95 |
| කැබිතිගොල්ලෑව | 6 | 12 | 41 | 68 | 127 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **39** | **100** | **164** | **261** | **564** |
| පොළොන්නරුව | 9 | 8 | 15 | 22 | 54 |
| හිඟුරක්ගොඩ | 9 | 9 | 26 | 51 | 95 |
| දිඹුලාගල | 7 | 16 | 17 | 64 | 104 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **25** | **33** | **58** | **137** | **253** |
| **උතුරු මැද පළාත** | **64** | **133** | **222** | **398** | **817** |

## ගුරුවරුන් සංඛ්‍යාව සහ ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව

| දිස්ත්‍රික්කය | කලාපය | ගුරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | අනුරාධපුරය | 3488 | 69647 |
| | කැකිරාව | 2437 | 40731 |
| | තඹුත්තේගම | 1793 | 38463 |
| | ගලෙන්බිඳුණුවැව | 1865 | 26982 |
| | කැබිතිගොල්ලෑව | 1955 | 31773 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | **11538** | **207596** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 1327 | 28447 |
| | හිඟුරක්ගොඩ | 1781 | 37891 |
| | දිඹුලාගල | 1592 | 24935 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **4700** | **91273** |
| උතුරු මැද පළාත | | **16238** | **298869** |

## දැක්ම

"අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි, නිපුණතා සපිරි දරු පිරිසක්, සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"අධ්‍යාපනයේ සම අවස්ථා සලසමින් මානව සම්පත් හා භෞතික සම්පත් මනා කළමණාකාරිත්වයකින් යුතුව භාවිතාකර උතුරු මැද පළාත සමෘද්ධිමත් කිරීම සඳහා දායකත්වය සැපයීම".

## දිගුකාලීන අරමුණු

- ❖ දරුවන් බුද්ධිමත් හා රැකියා වෙළඳපොළට සුදුසු නිපුණතා ඇති දරුවන් බවට පත් කිරීම.
- ❖ ඉපැරණි රජරට සංස්කෘතිය හා කෘෂි ජීවන රටාව මෙන්ම දේශීය හර පද්ධතිය හා සාරධර්ම අගය කරන පුරවැසි පිරිසක් පාසල් අධ්‍යාපනය තුළින් බිහි කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ උතුරු මැද පළාතේ අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාව තුළ සිටින සියලුම දරුවන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- ❖ උතුරු මැද පළාතේ පාසල්වල ඉගැන්වීම් කාර්යයයේ නියුතු ගුරුවරුන්ගේ ඉගැන්වීම් කුසලතා හා ක්‍රමවේදයන් ඉහළ තලයට ගෙන ඒමට අවශ්‍ය මග පෙන්වීම් සිදුකිරීම.
- ❖ උතුරු මැද පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ භෞතික, මානව හා මූල්‍ය සම්පත් සැපයීම.
- ❖ පළාතේ පාසල් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය සහ කුසලතා ඉහළ නැංවීම.
- ❖ ඵලදායී ඉගෙනුම් පරිසරයක් ගොඩනැඟිය හැකිවන පරිදි නිලධාරීන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ ශක්තිය ඉහළ නැංවීම.

## ප්‍රධාන කාර්යයන්


- ❖ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ප්‍රවේශය සඳහා සම අවස්ථා වර්ධනය.
- ❖ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය.
- ❖ භෞතික සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ යහපාලනය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික ඉඩකඩ සම්පූර්ණ කිරීම.
- ❖ උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ ඉඩකඩ සම්පූර්ණ කිරීම.
- ❖ උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- ❖ උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- ❖ මානව සම්පත් සංවර්ධනය.
- ❖ ශිෂ්‍ය සංවර්ධනය

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 146 |
| 2 | සේවයේ නියුතු | 122 |
| 3 | පුරප්පාඩු | 27 |
| 4 | අනියම් | 03 |
| 5 | කොන්ත්‍රාත් | 01 |
| 6 | අධි සේවක පදනම | 01 |
| 7 | පුහුණු | 08 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 10489.00 | 10486.00 | 3.00 | 100 |
| ගමන් වියදම් | 28.00 | 26.00 | 2.00 | 93 |
| සැපයීම් | 57.00 | 44.00 | 13.00 | 77 |
| නඩත්තු වියදම් | 227.00 | 200.00 | 27.00 | 88 |
| ගිවිසුම්ගත සේවා | 260.00 | 207.00 | 53.00 | 80 |
| මාරු කිරීම් | 83.00 | 63.00 | 20.00 | 76 |
| **එකතුව** | **11144.00** | **11026.00** | **118.00** | **99** |

## පුනරාවර්තන වියදම් දරමින් ප්‍රාග්ධන සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.

| ව්‍යාපෘතිය /වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| ප්‍රාථමික පාසල් සංවර්ධනය | අළුත්වැඩියා කටයුතු | ඉහළ සිසු සාධනය |
| ද්විතීයික පාසල් සංවර්ධනය | | |
| සාමාන්‍ය පරිපාලනය | නඩත්තු කටයුතු/විදුලිය ලබාදීම | |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 90.00 | 39.00 | 51.00 | 43 |
| වෙනත් මූලධන වත්කම් | 150.00 | 0.00 | 150.00 | 0 |
| **එකතුව** | **240.00** | **39.00** | **201.00** | **16** |

## අංශය *තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු*

## අංක - 04 - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.




**4.1.**2030 වනවිට ඵලදායි ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත හැකි ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ , ප්‍රාථමික, ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණකර සිටින බව තහවරු කිරීම.

**4.2.**2030 වනවිට සියළුම ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට ,සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවරු කිරීම.

**4.3.**2030 වනවිට සියළුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම.

**4.4.**තාක්ෂණික හා වෘත්තිය සුදුසුකම් සහිත අදාල කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.

**4.5.**2030 වනවිට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවරු කිරීම.

**4.6.**2030 වනවිට සියළුම තරුණ තරුණියන් සහ කාන්තා,පිරිමි,වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම.

**4.7.**2030 වනවිට ඉගෙනුම ලබන සියළුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබාගෙන තිබීම.

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | ඉලක්කය කරා ළඟාවීම |
|---|---|---|
| **04.** පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. | | |
| 4.1. ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා යොමු කිරීම. | 4.1.1 ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ, කියවීමට හා ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු සහා පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය ( 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70 ට වැඩි අගයක් ගන්නාසිසු ප්‍රතිශතය) 85% | 86.4% |
| | 1.2 ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම අවම මට්ටමක සහිත පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය - (අ.පො.ස.- සා/පෙළ සිංහල විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 82 % | 82.14% |
| | 1.3 ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම අවම මට්ටමක සහිත ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය - ( අ.පො.ස. - සා.පෙළ සිංහල විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 90 % | 96.44% |
| | 1.4 ද්විතියික ශ්‍රේණි අවසානයේ ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය -(අ.පො.ස. - සා.පෙළ ගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 60% | 61.46% |
| | 1.5 ද්විතියික ශ්‍රේණි අවසානයේ ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු ළමුන්ගේ ප්‍රමාණය (අ.පො.ස. - සා.පෙළ ගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 70% | 73.19% |
| 4.3. සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරියහැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | විධිමත් අධ්‍යාපනය හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ හා වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය<br>4.3.1 අ.පො.ස.(උසස් පෙළ) විද්‍යාව හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 38% | 35.44% |
| | 4.3.2 අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 30% | 41.28 |
| | 4.3.3 අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය අඩු කිරීම. 35% | 18.10 |
| | 4.3.4 නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් සඳහා සහභාගීවන සංඛ්‍යාව | 2500 |
| | 4.3.5 නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා සංඛ්‍යාව - 125 | 113 |
| 4.4. තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම්ලත් තරුණ සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව ඉහළනැංවීම. | 4.4.1 කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුත් සිසුන් ප්‍රමාණය<br>6 – 9 ශ්‍රේණි සිසුන් - 9712<br>10-11 ශ්‍රේණි සිසුන් - 26150<br>12-13 ශ්‍රේණි සිසුන් - 9576 | 6 – 9 සිසුන් - 9712<br>10-11 සිසුන් - 26150<br>12-13 සිසුන් - 9576 |
| 4.5. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | 4.5.1 විශේෂ අධ්‍යාපනය සඳහා මනා පුහුණුවක් ඇති ගුරුවරුන් සංඛ්‍යාව - 93 | 93 |
| | 4.5.2 කුසලතා සංවර්ධනය වූ විශේෂ අධ්‍යාපන ශිෂ්‍ය සංඛ්‍යාව - 644 | 644 |
| | 4.5.3 පෝෂණ වැඩසටහන් (උදැසන ආහාර හා කිරි) ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව - 817 | 817 |
| | 4.5.4.සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම තහවුරුකිරීම සඳහා පැවැත්වෙන වැඩසටහන් සඳහා සහභාගී ශිෂ්‍ය සංඛ්‍යාව - 6000 | 5577 |
| | 4.5.5.සිසුන් සඳහා පැවැත්වූ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පවත්වන පාසල් ගණන - 817 | 817 |

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක ඉතිරි කොටස...

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | ඉලක්කය |
|---|---|---|
| 4.6. සියලු ම තරුණයින් හා කාන්තා හා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම. | 4.6.1 අවම සාක්ෂරතාව ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (අ.පො.ස. - සා/පෙළ සිංහල විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 88 % | 89.32 % |
| | 4.6.2 සංඛ්‍යාමය කාර්ය කුසලතාවය සහිත ශිෂ්‍ය ප්‍රතිශතය (අ.පො.ස. - සා/පෙළ ගණිත විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 65 % | 65.66% |
| 4.7. තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම. | 4.7.1 සියළුම විෂයයන් සඳහා නිපුණතා සංවර්ධනය වූ ගුරු සංඛ්‍යාව 1935 | 1935 |
| | 4.7.2 සියළුම විෂයයන් සඳහා පවත්වනලද සිසුපුහුණු සංඛ්‍යාව - 159669 | 159669 |
| | 4.7.3 ශිෂ්‍ය ඇගයීම් පැවැත්වීම (වාර විභාග) – 3 – 13 ශ්‍රේණි සඳහා සියලු ප්‍රශ්න පත්‍ර ලබාදීම ප්‍රශ්න පත්‍ර - 337 | 100% |
| 4.8. ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායී ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම. | 4.8.1 බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව - 817 | 631 |
| 4.10.සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුව සඳහා ජාත්‍යාන්තර සහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම. | 4.10.1 පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සිදු කරන පාසල් සංඛ්‍යාව - 817 | 817 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම කෙරෙහි පළාත් දායකත්වය

**4.1. ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා යොමු කිරීම.**

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| 4.1.1 ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ, කියවීමට හා ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු සහා පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය ( 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70 ට වැඩි අගයක් ගන්නා සිසු ප්‍රතිශතය) 85% | 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70 ට වැඩි සිසු ප්‍රතිශතය | 85% | 100% |
| 4.1.2 ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම අවම මට්ටමක සහිත පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය - (අ.පො.ස.- සා/පෙළ සිංහල විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 82 %<br>4.1.3 ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම අවම මට්ටමක් සහිත ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය සා.පෙළ සිංහල විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 90 % | අ.පො.ස.- සා/පෙළ සිංහල විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | 88% | 100% |
| 4.1.4 ද්විතියික ශ්‍රේණි අවසානයේ ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය -(අ.පො.ස. - සා.පෙළ ගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 60%<br>4.1.5 ද්විතියික ශ්‍රේණි අවසානයේ ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු ළමුන්ගේ ප්‍රමාණය (අ.පො.ස. - සා.පෙළ ගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 70% | සා.පෙළ ගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | 70% | 85% |

**4.3. සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරිය හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| විධිමත් අධ්‍යාපනය හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ හා වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය 4.3.1 අ.පො.ස.(උසස් පෙළ) විද්‍යාව හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 38% | 4.3.1 අ.පො.ස.(උසස් පෙළ) විද්‍යාව හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 38% | 38 | 77 |
| 4.3.2 අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 30% | 4.3.2 අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 30% | 30 | 77 |
| 4.3.3 අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය අඩු කිරීම. 35% | 4.3.3 අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය අඩු කිරීම. 35% | 35 | 100 |
| 4.3.3 නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් සඳහා සහභාගී වන සංඛ්‍යාව - 2137 | 4.3.3 නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් සඳහා සහභාගී වන සංඛ්‍යාව - 2137 | 2137 | 47 |
| 4.3.4 නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා සංඛ්‍යාව - 125 | 4.3.4 නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා සංඛ්‍යාව - 125 | 125 | 100 |
| **4.4. අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම්වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.** | | | |
| 4.4.1 කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුත් සිසුන් ප්‍රමාණය<br>6 – 9 ශ්‍රේණි සිසුන් - 9712<br>10-11 ශ්‍රේණි සිසුන් - 26150<br>12-13 ශ්‍රේණි සිසුන් - 9576 | කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුත් සිසුන් ප්‍රමාණය<br>6 – 9 ශ්‍රේණි සියලු සිසුන් - 9712<br>10-11 ශ්‍රේණි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය හදාරන සිසුන් - 26150<br>12-13 ශ්‍රේණි සියලු සිසුන් - 9576 | ශ්‍රේණිය සිසුන්<br>6 – 9 - 9712<br>10-11 - 26150<br>12-13 - 9576 | 100 % |
| **4.5. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂසමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන්සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.** | | | |
| 5.1 විශේෂ අධ්‍යාපනය සඳහා මනා පුහුණුවක් ඇති ගුරුවරුන් සංඛ්‍යාව - 93 | විශේෂ අධ්‍යාපනය සඳහා මනා පුහුණුවක් ඇති ගුරුවරුන් සංඛ්‍යාව - 93 | 93 | 67.93% |
| 5.2 කුසලතා සංවර්ධනය වූ විශේෂ අධ්‍යාපන ශිෂ්‍ය සංඛ්‍යාව - 644 | කුසලතා සංවර්ධනය වූ විශේෂ අධ්‍යාපන ශිෂ්‍ය සංඛ්‍යාව | 644 | 68% |
| 5.3 පෝෂණ වැඩසටහන් (උදැසන ආහාර හා කිරි) ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව - 817 | පෝෂණ වැඩසටහන් (උදැසන ආහාර හා කිරි) ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව | 817 | 100% |

**05. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| 5.4.සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම තහවුරුකිරීම සඳහා පැවැත්වෙන වැඩසටහන් සඳහා සහභාගී ශිෂ්‍ය සංඛ්‍යාව - 6000 | සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම තහවුරු කිරීම සඳහා පැවැත්වෙන වැඩසටහන් සඳහා සහභාගී ශිෂ්‍ය සංඛ්‍යාව | 6000 | 92.95% |
| 5.5. සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම තහවුරුකිරීම සඳහා පැවැත්වෙන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී විදුහල්පති, ගුරුවරු, නිලධාරීන් සංඛ්‍යාව - 800 | සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම තහවුරුකිරීම සඳහා පැවැත්වෙන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී විදුහල්පති, ගුරුවරු, නිලධාරීන් සංඛ්‍යාව | 800 | 100% |
| 5.5.සිසුන් සඳහා පැවැත්වූ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පවත්වන පාසල් ගණන - 419 | සිසුන් සඳහා පැවැත්වූ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පවත්වන පාසල් ගණන - | 419 | 419 |
| **06. සියලු ම තරුණයින් හා කාන්තා හා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත්කර ගන්නා බවට සහතික වීම.** | | | |
| 6.1 අවම සාක්ෂරතාව ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (අ.පො.ස. - සා/පෙළ සිංහල විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 88 % | අ.පො.ස. - සා/පෙළ සිංහල විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය | 88 | ප්‍රතිඵල නිකුත් ව නොමැත |
| 6.2 සංඛ්‍යාමය කාර්ය කුසලතාවය සහිත ශිෂ්‍ය ප්‍රතිශතය (අ.පො.ස. - සා/පෙළ ගණිත විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍යප්‍රතිශතය) 65 % | අ.පො.ස. - සා/පෙළ ගණිත විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය - 65 % | 67 | |
| **07. තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.** | | | |
| 7.1 සියළුම විෂයයන් සඳහා නිපුණතා සංවර්ධනය වූ ගුරුසංඛ්‍යාව - 1985 | සියළුම විෂයයන් සඳහා නිපුණතා සංවර්ධනය වූ ගුරුසංඛ්‍යාව | 1985 | 100 % |
| 7.2 සියළුම විෂයයන් සඳහා පවත්වන ලද සිසු පුහුණු සංඛ්‍යාව - 159969 | සියළුම විෂයයන් සඳහා පවත්වන ලද සිසුපුහුණු සංඛ්‍යාව | 159969 | 100 % |
| **08. ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම** | | | |
| 8.1 බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව - 817 | බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව | 419 | 419 |
| **09.සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුව දහා ජාත්‍යාන්තර සහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතුලෙස වැඩිකිරීම.** | | | |
| **09.1 පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සිදු කරන පාසල්සංඛ්‍යාව - 817** | පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සිදු කරන පාසල්සංඛ්‍යාව- 817 | නැත | නැත |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක/ දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු. මි.) | ඉලක්කගත වියදම (රු. මි.) |
|---|---|---|---|---|
| 4.1 | 4.1.1 | ප්‍රාථමික ගුරු/ සිසු නිපුණතා සංවර්ධන වැඩමුළු හා පුහුණු | 8.5 | 5.41 |
| | 4.1.2, 4.1.3, 4.1.4,4.1.5 | ද්විතියික ගුරු/ සිසු නිපුණතා සංවර්ධන වැඩමුළුහා පුහුණු | 257 | 218.66 |
| 4.3 | 4.3.1, 4.3.2,4.3.3 | ගුරුසිසු නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම | 1.5 | 1.10 |
| | 4.3.4 ,4.3.5 | නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 2.3 | 1.09 |
| 4.4 | 4.4.1, | තොරතුරු තාක්ෂණ විෂය සංවර්ධන පුහුණු | 0.35 | 0.26 |
| 4.5 | 4.5.1, 4.5.2 | විශේෂ අධ්‍යාපන වැඩසටහන | 1.4 | 0.95 |
| | 4.5.3, 4.5. | සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන කිරීම | 2.05 | 6 |
| | 4.5.5 | වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | 0.35 | 0.26 |
| 4.6 | 4.6.1 , 4.6.2 | ගුරුසිසු නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම | 3.81 | 3.37 |
| 4.7 | 4.7.1, 4.7.2, 4.7.3 | ගුරු සිසු නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම | 9 | 8.75 |
| 4.8 | 4.8.1 | පළාත්හා කලාප මාර්ගෝපදේශ වැඩසටහන | නැත | නැත |
| 4.10 | 4.10.1 | පළාත් හා කලාප මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | නැත | නැත |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

### 01. පළාත් හා කලාප මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

කණ්ඩායම් මාර්ගෝපදේශ සැලැස්ම කලාප හා පළාත් මට්ටමින් සැකසීම, කණ්ඩායම් මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, කණ්ඩායම් මාර්ගෝපදේශ වාර්තා සැකසීම හා වාර්තා පාසල් වෙත ලබා දීම, අවශ්‍ය පාසල් සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ,ප්‍රගති වාර්තා ලබා ගැනීම හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යැවීම වැනි ක්‍රියාකාරකම් සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි  මේ යටතේ සිදු කරන ලද අතර පාසල් 612 හි සිසුන් සඳහා මෙහි ප්‍රතිලාභ හිමි විය.

### 02.ගුරුසිසු නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම (ප්‍රාථමික)

නුපුහුණු ප්‍රාථමික ගුරු පුහුණු, නව විෂය නිර්දේශ හඳුන්වාදීම පිළිබඳ ගුරු පුහුණු, සිසු කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන් (ක්‍රියාකාරීව ප්‍රීතිමත් වෙමු වැඩසටහන) ,4,5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණ ,ප්‍රශ්න පත්‍ර සැකසීම හා මුද්‍රණය, සිසු සම්මන්ත්‍රණ, ප්‍රගති සමාලෝචනය වැනි කටයුතු මෙහිදි සිදු කරන ලදී. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි මෙම වැඩසටහන් සිදු කරන ලද අතර සිසුන් හා ගුරුවරුන් වෙත  මෙහි ප්‍රතිලාභ හිමි විය.



නිලධාරි ධාරිතා සංවර්ධන වැඩමුළුව

## 03.අධ්‍යයනහා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු

නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු කටයුතු මෙහිදි සිදු කරන ලද අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 603ක් විය.

## 04.ගුරු සිසු පුහුණු වැඩසටහන්

ගුරුවරු දැනුවත් කිරීමේ හා සිසු ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 101500ක් විය.

## 05.ගුරුසිසු නිපුණතා සංවර්ධනය ඉහළ නැංවීම (ද්වීතියික)

නව විෂය නිර්දේශ හඳුන්වා දීම, දැනුම යාවත්කාලීන කිරීම, විෂය නව ප්‍රවණතා හඳුන්වා දීම පිළිබඳ ගුරු පුහුණු, නවක උපාධි ගුරු පුහුණුව, සිසු පුහුණු ප්‍රායෝගික කඳවුරු හා සම්මන්ත්‍රණ පැවැත්වීම, විවිධ විෂයයන්හි කොට්ඨාස තරඟ පැවැත්වීම, විවිධ විෂයයන්හි කලාප තරඟ පැවැත්වීම, නව විෂය නිර්දේශ හඳුන්වා දීම, දැනුම යාවත්කාලීන කිරීම, විෂය නව ප්‍රවණතා හඳුන්වා දීම පිළිබඳ ගුරු පුහුණු

නවක උපාධි ගුරු පුහුණුව,සිසු පුහුණු ප්‍රායෝගික කඳවුරු හා සම්මන්ත්‍රණ පැවැත්වීම, විවිධ විෂයයන්හි කොට්ඨාස තරඟ පැවැත්වීම, විවිධ විෂයයන්හි කලාප තරඟ පැවැත්වීම වැනි කාර්යයන් මෙහිදි සිදු කරන ලදී.


නර්තන විෂය යටතේ ප්‍රායෝගික ගුරු පුහුණුව

## 06.ගුරු සිසු ඇගයීම් උත්සවය

ගුරුසිසු ඇගයීම් උත්සවය පැවැත්වීම - කලාප උත්සවය ( 2019 වර්ෂයේ ජාතික විභාග ප්‍රතිඵලවලින් /විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින්/ විවිධ විෂයයන්හි සමස්ත ලංකා මට්ටමේ තරඟවලින් විශිෂ්ට කුසලතා දැක්වූ දරුවන් , ගුරුවරු, කොට්ඨාස හා කලාප පළාත් හා කලාප මට්ටමින් ඇගයීමේ උත්සවය සඳහා) මෙහිදී සිදු කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18ක් ආවරණය වන පරිදි සිසුන් 2858ක්, ගුරුවරු 340 ක් සහ විදුහල්පතිවරුන් 120ක් ඇගයීමට ලක් කරන ලදි.

## 07.පර්යේෂණ ක්‍රියාත්මක කිරීම

සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි අධ්‍යාපන සංවර්ධන සැලසුම් සැකසීම සිදු කළ අතර එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 151ක් විය.පර්යේෂණ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම ද සිදු කළ අතර ප්‍රතිලාභීන් 290කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06ක් ආවරණය වන පරිදි අධ්‍යාපන පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සිදු කරන ලද අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 02කි.


ගෘහ විද්‍යා විෂය හදාරණ සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුව

## 08.පාසල් වාර විභාග පැවැත්වීම

වාර විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම, මුද්‍රණය හා බෙදා හැරීම සහ දෙවන හා තෙවන වාර විභාග පැවැත්වීම මේ යටතේ සිදු විය.

## 09.සෞඛ්‍යය හා පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු, සෞඛ්‍ය කඳවුරු, පෝෂණ වැඩසටහන්, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම මෙහිදි සිදු කරන ලදී.

## 10. විවිධ විෂය තරඟ පැවැත්වීම

පළාත් තරඟ විවිධ විෂයයන් යටතේ පැවැත්වීම හා ජයග්‍රාහකයින් ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා ඉදිරිපත් කිරීම හා පුහුණු කිරීම මේ යටතේ සිදු වු අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3991ක් විය.

## 11.නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පාඨමාලා උපදේශකයින් පුහුණු කිරීම හා පාඨමාලා පැවැත්වීම සිදු කරන ලද අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1259 ක් විය.

## 12.විශේෂ අධ්‍යාපන වැඩසටහන

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා සිසු පුහුණුව හා ගුරු පුහුණුව හා තරඟ පැවැත්විම සිදු කළ අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 150ක් විය.

## 13.ක්‍රීඩා සංවර්ධන වැඩසටහන

කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තෝරා ගත් ක්‍රීඩා 16 ක් සංවර්ධනය සඳහා සිසු සංචිත පිහිටුවීම, සිසු පුහුණු කඳවුරු හා කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තරඟ පැවැත්වීම සිදු කරන ලද අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10912ක් විය.

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට සිදුකරන ලද දායකත්වය

**4.1 අරමුණ - ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා යොමු කිරීම.**

මෙම අරමුණෙහි දර්ශකය වන ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ 11 ද්විතීයික ශ්‍රේණි සිසුන් අතර කියවීම හා ගණිතමය කුසලතා සඳහා වන අවම මට්ටම සහිත අයගේ ප්‍රමාණය ඉහළ දැමීමට කටයුතුකර ඇත. මේ අනුව ප්‍රාථමික හා ද්විතීයික ශ්‍රේණිවල ගුරුවරු සඳහා නව නිර්දේශ පිළිබඳ පුහුණු නවක පත්වීම්ලාභී ගුරු පුහුණු හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානවල ක්‍රියාකාරකම් කාමර භාවිතය පිළිබඳ ගුරු පුහුණු සිදු කර ඇත. සිසුන් සඳහා සිසු ප්‍රායෝගික කඳවුරු , කියවීම් කුසලතා සංවර්ධනය සඳහා කියවීම් කඳවුරු, පුස්තකාල සඳහා පොත් ලබාදීම සහ 4 / 5 ශ්‍රේණි සඳහා ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණ, ගණිත හා සිංහල විෂයය සංවර්ධනය සඳහා පෙරහුරු පරීක්ෂණ, වාර විභාග ලකුණු විශ්ලේෂණ අනුව ලකුණු 40 ට අඩු සිසුන්ට ප්‍රතිපෝෂණ වැඩසටහන්, අනාවරණ පරීක්ෂණ අනුව ප්‍රතිපෝෂණ වැඩසටහන් හා සිසුන්ට ස්වයං ඉගෙනුම සඳහා කාර්ය පත්‍රිකා සහ පෙරහුරු ප්‍රශ්න පත්‍ර ඇතුළත් පොත් ලබාදී ඇත. දෙවන හා තෙවන වාර විභාග පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සිදුකර ඇත. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වැය කළ මුදල රු.මි. 5.41 ද මෙයින් සිසුන් 10767 ක් සඳහා ප්‍රතිලාභ ලැබී ඇත. ගණිත හා සිංහල විෂයය සඳහා රු.මි. 6.48 ක් වැය කර ඇති අතර එහි ප්‍රතිලාභී සිසුන් සංඛ්‍යාව 144447 ක් වේ.

**4.3 අරමුණ - සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරිය හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

මෙහි දර්ශකය වන විධිමත් අධ්‍යාපනය හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ හා වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය ඉහළ නැංවීම සඳහා සිසුන්ගේ තාක්ෂණික හා වෘත්තිය නිපුණතා සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් දියත් කර ඇත. ඒ අනුව විවිධ විෂයන් යටතේ කුසලතා සංවර්ධනය සඳහා අදාළ විවිධ ආයතන හා විශ්ව විද්‍යාල ඒකාබද්ධව ගුරු සිසු සංවර්ධන වැඩසටහන් දියත් කර ඇත. ඊට අමතරව 8-9 ශ්‍රේණි, 10-11 ශ්‍රේණි සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ පිළිබඳ වැඩසටහන් පාසල් මට්ටමින් සිදු කර ඇති අතර විදුහල්පතිවරු හා ගුරුවරු දැනුවත් කිරීමේ වැඩසටහන් කලාප මට්ටමින් සිදු කර ඇත.

මෙහිදි කලා විෂය ධාරාව සඳහා ශිෂ්‍ය සහභාගීත්වය අඩු කිරීමත් විද්‍යා, වාණිජ, හා තාක්ෂණ විෂයය ධාරා සඳහා සිසු සහභාගීත්වය ඉහළ දැමීමත් ඉලක්කකර ඇත. මේ සඳහා අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීම , අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ශිෂ්‍ය සම්මන්ත්‍රණ, දෙවන හා තෙවන වාර විභාග සඳහා ප්‍රශ්න පත්‍ර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සකස් කිරීම, සිසු ප්‍රායෝගික කඳවුරු, අදාළ ආයතන හා ඒකාබද්ධව වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් විදුහල්පතිවරු, ගුරුවරු හා සිසුන් සඳහා පවත්වා ඇත. මෙහි ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව 144447 ක් වන අතර මේ සඳහා වැය කළ වියදම ද්වීතියික අංශය සඳහා රු.මි. 7.17 කි.

**4.4 අරමුණ - අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම්වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයන්ගෙන් යුක්ත සිසුන් ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා දැනට 2019 වර්ෂයේ සිට 6 – 9 ශ්‍රේණි සඳහා තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ කුසලතා විෂයය හඳුන්වා දී ඇති අතර පාසල් මට්ටමින් එම සිසුන්ට විෂය කුසලතා ලබාදීම සිදු කරයි. එම ගුරුවරු පුහුණු කිරීම හා 10-11 ශ්‍රේණිවල විෂයය උගන්වන ගුරුවරු හා 12-13 සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂය ගුරුවරු පුහුණු කිරීම සිදු කර එමඟින් සිසුන්ගේ කුසලතා සංවර්ධනය සිදු කරයි. ඊට අමතරව සිසුන් සඳහා ප්‍රායෝගික සිසු කඳවුරු, සිසුන් අතර අධ්‍යාපන මෘදුකාංග නිර්මාණය කිරීමේ තරඟ පවත්වා ඇත. වාර විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සැපයීම, පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම සිදු කර ඇත. මෙම වැඩසටහන සඳහා වැය කළ වියදම රුපියල් මිලියන 0.9 ක් වන අතර ප්‍රතිලාභී සිසුන් සංඛ්‍යාව 45438 ක් විය.

**4.5 අරමුණ - අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

මේ සඳහා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් හඳුනා විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කිරීම එම ගුරුවරු පුහුණු කිරීම, විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් දියත් කෙරේ. මේ සඳහා වියදම් කළ මුදල රු.මි. 0.95 ක් වන අතර ප්‍රතිලාභී සිසුන් සංඛ්‍යාව 644 කි.

සියලු පාසල්වල පෝෂණ වැඩසටහන ක්‍රියාත්මකවන අතර (උදෑසන ආහාරය හා කිරි ලබා දීම) ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබාදේ. ඊට අමතරව සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සෞඛ්‍ය කඳවුරු පවත්වනු ලබයි. ඊට අමරතව වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් දියත් කරයි. සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දැරූ වියදම රු.මි. 2.05 ක් වන අතර ප්‍රතිලාභ ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 297035 ක් වේ.

**4.6.අරමුණු - සියලුම තරුණයින් හා කාන්තා හාපිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම.**

මෙහි දර්ශකය වන්නේ යම් වයස් කාණ්ඩයකට අදාළ අවම සාක්ෂරතා හා සංඛ්‍යාමය කාර්ය කුසලතාවයක් අත්කරගෙන සිටින සංඛ්‍යාව වේ. ඒ අනුව සිංහල හා ගණිත විෂයය සංවර්ධනය සඳහා ගුරු හා සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් සිදු කර ඇත. මේ අනුව අ.පො.ස. (සා/පෙළ) ගණිතය හා සිංහල විෂය සංවර්ධන ගුරු හා සිසු වැඩසටහන් පිළිබඳව 4.1 නිපුණතාවය යටතේ දක්වා ඇත.

**4.7. අරමුණ - තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.**

මේ යටතේ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා මානව හිමිකම් (ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා විෂය මාලා , ගුරු අධ්‍යාපනය හා ශිෂ්‍ය ඇගයීම් යන සියලු මට්ටම්වල තිරසර සංවර්ධනය සඳහාවන ඉගෙනුම යන දර්ශකය ළඟාකර ගැනීම සඳහා සියලුම විෂයයන්වල සංවර්ධනය උදෙසා ගුරු සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් දියත් කර ඇත. ශිෂ්‍ය ඇගයීම් සඳහා පාසල් මට්ටමින් පාසල් පාදක තක්සේරුකරණය සහ වාර විභාග පැවැත්වේ. මේ සඳහා ගුණාත්මක ප්‍රශ්න පත්‍ර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබයි. වාර විභාග සඳහා වියදම රු.මි. 49.08 වන අතර ප්‍රතිලාභී සිසුන් සංඛ්‍යාව 241440 ක් වේ.

**4.8. අරමුණ - ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම.**

මෙහි ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩ නැඟිම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කලාප අධ්‍යාපන කාර්යාලය ඒකාබද්ධව සියලුම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හඳුන්වාදෙන ලද ප්‍රමිති පදනම් කරගෙන බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මකකර ප්‍රගති සමාලෝචන හා වාර්තා පාසල්වලට ලබාදී අවශ්‍ය ප්‍රතිපෝෂණ සිදුකරයි. මේ සඳහා ප්‍රතිපාදන වැය කිරීමක් නොමැති අතර සියලු පාසල්වල සිසුන් ප්‍රතිලාභීන් වේ. එනම් සිසුන් 200000 ප්‍රමාණයකි.

**4.10.අරමුණ - සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුව සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.**

මෙහිදි පාසල් මට්ටමින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධන වැඩසටහන් සියලු පාසල්වල ක්‍රියාත්මක කෙරේ. මේ පිළිබඳව සියලුම විදුහල්පතිවරු , සියලුම නිලධාරින් හා ගුරුවරුන් දැනුවත් කිරීම් සිදු කර ඇත. ඒ අනුව පාසල් පාදකව ගුරුවරුන්ගේ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය ගුරු සංවර්ධනය පාසල් මට්ටමේදී සිදු කරනු ලබයි.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම

| අ.අ | අරමුණ | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | වියදම | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2018 | 2019 |
| 1 | පාසල් ඇගයීමට ලක් කරමින් ඒවා විශිෂ්ටත්වය කරා ප්‍රවේශ කරවීමට අවශ්‍ය මඟ පෙන්වීම | මාර්ගෝපදේශන වැඩසටහන දියත් කළ පාසල් ගණන හා වාර්තා | 817 | 817 | නැත | නැත |
| 2 | ප්‍රාථමික අධ්‍යාපනය - අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සහිත දරුවෙකු ද්විතියික අධ්‍යාපනයට ප්‍රවේශ කරවීම | පවත්වන ලද ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 4 | 4 | 2.86 | 1.55 |
| | | පුහුණුව ලද ශිෂ්‍ය සංඛ්‍යාව | 62000 | 543930 | 1.20 | 0.01 |
| | | පෙරහුරු ප්‍රශ්න පත්‍ර කට්ටල සංඛ්‍යාව | 3 | 3 | 3.33 | 2.44 |
| | | තරඟ සංඛ්‍යාව | 1 | 1 | 2.12 | 0.48 |
| 3 | අධ්‍යයනහා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වෘත්තිය සංවර්ධනය හා අභිප්‍රේරණය | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 14 | 15 | 3.43 | 5.56 |
| 4 | 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීම | ගුරු හා සිසු වැඩසටහන් සංඛ්‍යාව | 09 | 09 | 0.16 | 0.51 |
| 5 | ද්විතියික අධ්‍යාපනය -ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය | පවත්වන ලද ගුරු පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ සංඛ්‍යාව | 2025 | 1985 | 21.38 | 69.56 |
| | | පවත්වන ලද සිසු පුහුණු කඳවුරු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූ සිසුන් සංඛ්‍යාව | 60000 | 57000 | | |
| | | පවත්වන ලද කොට්ඨාස තරඟ සංඛ්‍යාව | 30 | 30 | | |
| | | පවත්වන ලද කලාප තරඟ සංඛ්‍යාව | 8 | 8 | | |

| අ. අං | අරමුණ | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | ආයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2018 | 2019 |
| 6 | විදුහල්පතිවරු, ගුරුවරු හා සිසුන් ඇගයීම | ඇගයීම් උත්සව | 9 | 9 | 2.34 | 1.63 |
| 7 | පර්යේෂණ තුළින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය | විශේෂ අධ්‍යාපන සිසුකුසලතා ගොඩනැංවීමට අවශ්‍ය අනාවරණ සංඛ්‍යාව | නැත | 47 | - | 0.14 |
| 8 | ගුණාත්වයෙන් යුතු ප්‍රශ්න පත්‍ර සැපයීම මගින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම. | සකසන ලද ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව | 338 | 338 | 50.00 | 49.08 |
| | | වාර විභාග ලකුණු විශ්ලේෂණ වාර්තා | 2 | 2 | | |
| 9 | පළාත තුළ සෑම පාසලක්ම සෞඛ්‍ය ප්‍රවර්ධිත පාසලක් බවට පත් කිරීම | සෞඛ්‍ය කඳවුරු සංඛ්‍යාව | 3500 | 3825 | 1.74 | 2.05 |
| | | පෝෂණ වැඩසටහන් සඳහා සහභාගි වූ පාසල් සංඛ්‍යාව | 817 | 817 | 1.70 | 2.39 |
| 10 | පාසල් කළමනාකරණය ශක්තිමත් කරමින් පාසල ශක්තිමත් කිරීම. | විදුහල්පති ධාරිතා සංවර්ධනයට සහභාගි වූ සංඛ්‍යාව | 700 | 402 | 1.40 | 5.52 |
| | | කමිටු දැනුවත් කිරීම සඳහා සහභාගීවූ සංඛ්‍යාව | 500 | 332 | | |
| 11 | විවිධ විෂයයන් යටතේ කලාප මට්ටමින් දක්ෂතා දැක්වූ සිසුන් හට පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමට යාමට අවශ්‍ය සහාය ලබා දීම. | පවත්වන ලද තරඟ සංඛ්‍යාව හා ජාතික, ජාත්‍යන්තර තරඟ සඳහා ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව | තරඟ 45 සහභාගි වූ 120000 | තරඟ 50 සහභාගි වූ 103082 | 5.43 | 5.71 |
| 12 | පාසල්හැර ගිය සිසුන් ව්‍යවසායකයින් බවට යොමු කිරීම | පවත්වන ලද ගුරු පුහුණු සංඛ්‍යාව | 22500 | 2137 | 1.65 | 0.95 |
| | | පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 112 | 125 | | |
| 13 | විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම | පවත්වන ලද සිසු පුහුණු, ගුරු පුහුණු සංඛ්‍යාව හා තරඟ සංඛ්‍යාව | සහභාගි 692 | 368 | 0.09 | 0.87 |
| 14 | ක්‍රීඩා හැකියාවන්ගෙන් පරිපූර්ණ දරුවන්ගේ දක්ෂතා එළි දැක්වීම. | පවත්වන ලද සිසු පුහුණු කඳවුරු සංඛ්‍යාව හා තරඟ සංඛ්‍යාව | තරඟ 50 සහභාගි 135000 | 40 | 13.08 | 6.77 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

### අධ්‍යාපන සංවර්ධන ප්‍රගතිය -2019

| අ.අ | අරමුණු | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) |
|---|---|---|---|
| 1 | පාසල්ඇගයීමට ලක්කරමින් විශිෂ්ටත්වය කරා ප්‍රවේශ කරවීමට මඟ පෙන්වීම | නැත | නැත |
| 2 | අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සහිත දරුවෙකු ද්විතියික අධ්‍යාපනයට ප්‍රවේශ කරවීම | 8.50 | 5.41 |
| 3 | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වෘත්තීය අභිප්‍රේරණය කිරීම | 8.00 | 5.56 |
| 4 | සියළු දරුවන්ට අධ්‍යාපනය සඳහා සාධාරණ ඉගෙනුම් අවස්ථා වැඩි දියුණු කිරීම - 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 2.00 | 0.51 |

| අ.අ | අරමුණු | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) |
|---|---|---|---|
| 5 | ද්විතියික අධ්‍යාපනය -ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය | 93.00 | 71.74 |
| 6 | විදුහල්පතිවරු, ගුරුවරු හා සිසුන් ඇගයීම මගින් අභිප්‍රේරණය | 3.00 | 1.63 |
| 7 | පර්යේෂණ තුළින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය- ප්‍රාථමික | 1.00 | 0 |
| | පර්යේෂණ තුළින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය- ද්විතියික | 1.50 | 0.45 |
| 8 | ගුණාත්මක බවින් ඉහළ ප්‍රශ්න පත්‍ර සැපයීම මගින් සිසු සාධනය නැංවීම. | 50.00 | 49.08 |
| 9 | සෑම පාසලක්ම සෞඛ්‍ය ප්‍රවර්ධිත පාසලක් බවට පත් කිරීම - ප්‍රාථමික | 3.00 | 0.81 |
| | සෑම පාසලක්ම සෞඛ්‍ය ප්‍රවර්ධිත පාසලක් බවට පත් කිරීම -ද්විතියික | 3.00 | 1.23 |
| 10 | පාසල් කළමනාකරණය ශක්තිමත් කරමින් පාසල ශක්තිමත් කිරීම. | 1.71 | 0.75 |
| 11 | විවිධ විෂයයන් යටතේ කලාප මට්ටමින් දක්ෂතා දැක්වූ සිසුන්හට පළාත්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමට යාමට අවශ්‍ය සහාය ලබා දීම. | 7.00 | 5.80 |
| 12 | පාසල් හැර ගිය සිසුන් ව්‍යවසායකයින් බවට යොමු කිරීම | 2.30 | 1.09 |
| 13 | විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම | 1.40 | 0.95 |
| 14 | ක්‍රීඩා හැකියාවන්ගෙන් පරිපූර්ණ දරුවන්ගේ දක්ෂතා එළි දැක්වීම. | 170 | 6.77 |
| | **එකතුව** | **202.41** | **151.78** |

මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2019 වර්ෂයේ අධ්‍යාපන සංවර්ධනය සඳහා සංවර්ධන ව්‍යාපෘති 14ක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 202.41කි. මෙම ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුදල රු.මි. 151.78කි.

## අධ්‍යාපන භෞතික සංවර්ධන ප්‍රගතිය - 2019

2019 වර්ෂයේ අධ්‍යාපන භෞතික සංවර්ධන උදෙසා සංවර්ධන ව්‍යාපෘති අසූ එකක් (81) ක්‍රියාත්මක කරන ලදී.මෙහි ප්‍රධාන අරමුණ වූයේ සියළු සිසුන්ට සම අධ්‍යාපන අවස්ථා සහතික කිරීමයි.අපේක්ෂිත ප්‍රතිඵලය වූයේ පාසල තුළ ආරක්ෂිත සහ සිත්ගන්නා සුළු ඉගෙනුම් පරිසරයක් ඇතිවීම/සිසුන්ගේ සාධන මට්ටම් ඉහළ යාමයි. මේ යටතේ පාසල් ගොඩනැගිලි ඉදි කිරීම, අළුත්වැඩියා කිරීම, සනීපාරක්ෂක පහසුකම් ලබා දීම, නිල නිවාස හා ගුරු නිවාස අළුත්වැඩියා කිරීම, නව විදුලි සම්බන්ධතා ලබා දීම වැනි කාර්යයන් සිදු කළ අතර මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 146.48ක මුදලක් වෙන් කරන ලද අතර කොන්ත්‍රාත් පිරිනැමූ වටිනාකම වූයේ රු.මි. 129.42 කි. මෙම ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුදල රු.මි. 120.12කි.

### වෙනත් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | මුදල | |
|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) |
| 1 | ගොඩනැගිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියා | 80 | 622.02 | 414.88 |
| 2 | වාණිජ ශිෂ්‍ය කඳවුරු පැවැත්වීම | 02 | 0.30 | 0.22 |
| 3 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | 09 | 4.39 | 3.17 |
| 4 | තරඟ පැවැත්වීම | 03 | 2.20 | 1.75 |
| 5 | ගුරු භවතුන් සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය | 04 | 1.78 | 1.37 |
| 6 | පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 252 | 265.26 | 183.44 |
| 7 | පිරිවෙන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 08 | 7.05 | 4.65 |
| 8 | පාසල්වල ආබාධ සහිත දරුවන් සඳහා ප්‍රවේශ පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 11 | 19.53 | 3.58 |

## ආයතනයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් - 2020-2021

එක් එක් විෂයය හා ශ්‍රේණි යටතේ අත්‍යවශ්‍ය නිපුණතා සිසුන්ට ලබාදීම සඳහා වාර විභාගවලින් ලකුණු 40 ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාව අවම කිරීම කළ යුතුය. ඊට අමතරව ජාතික විභාග ප්‍රතිඵල 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව , අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල ඉහළ නැංවීම අපේක්ෂාව වේ. මේ සඳහා ඒ ඒ විෂයය සඳහා ගුරු සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන්, නිලධාරී පුහුණු වැඩසටහන් තවද සිසුන් තුළ මෘදු කුසලතා සංවර්ධනය කිරීම ද සිදු කළ යුතුය. මේ සඳහා විෂයය සමගාමී කටයුතු එනම් බාලදක්ෂ, ශිෂ්‍යභට, පරිසර නියමු, ප්‍රථමාධාර වැඩසටහන්, දැනුම මිනුම තරග, විවාද තරග, ක්‍රීඩා තරඟ සඳහා සිසුන් වැඩි සංඛ්‍යාවකට අවස්ථාව ලබා දීම අපේක්ෂාව වේ. එමෙන්ම පාසල්වල කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා විදුහල්පතිවරු බලගැන්වීම කළ යුතුය. එමෙන්ම පාසල්වල අධ්‍යාපන ගුණාත්මක දර්ශකය විශිෂ්ටත්වය කරා ළඟා කරවීම අපේක්ෂාව වේ. තවද ඒ ඒ සේවාවන්ට අදාළ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ පුහුණු වැඩසටහන් දියත් කිරීම අපේක්ෂාව වේ.

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2020 හා 2021 වර්ෂයන් තුළදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් මගින් අධ්‍යාපන අංශයේ සංවර්ධනය කෙටිකලීන හා දිගුකාලීන ප්‍රතිඵල ළඟාකර ගැනීම ඉලක්කකර ක්‍රියාත්මක කිරීමට නියමිතය.**

ළඟාකර ගැනීමට අපේක්ෂිත කෙටිකාලින ප්‍රතිඵල ලෙස පාසල සතු සීමිත සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කරවීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම, ප්‍රාථමික ශ්‍රේණිවල අත්‍යවශ්‍ය නිපුණතා සහිත සිසුන් 6 ශ්‍රේණියට යොමු කිරීම, නව විෂය නිර්දේශ හඳුන්වාදීම පිළිබඳ ගුරු පුහුණු, ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරු පුහුණු,සිසුකුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන්(ක්‍රියාකාරීව ප්‍රීතිමත් වෙමු වැඩසටහන,4,5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර සැකසීම හා මුද්‍රණය, සිසු භාෂා නිපුණතා තරඟ, තම රාජකාරිය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කරන සේවක මණ්ඩලයක්, වැඩ ලෝකයට අවශ්‍ය සිසුන් සමාජගත කිරීම කෙටිකාලීනව අපේක්ෂා කරයි.

එසේම ද්විතියික අංශයේ ඒ ඒ ශ්‍රේණිවලට අදාල නිපුණතා සහිත සිසුන්, ඉහළ කාර්ය සාධනයක් සහිත විදුහල්පතිවරු හා ගුරුවරු ඉහළ ප්‍රතිඵල සහිත ගුරුවරු, පර්යේෂණ තුළින් ගැටළු නිරාකරණය, තක්සේරුකිරීම හා ඇගයීම් ක්‍රම වැඩි දියුණුවී ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම, සිසුන්ගේ සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම,කළමනාකරණය ශක්තිමත්වූ පාසල් පද්ධතියක් ඇති කිරීම, සිසුන්ගේ මෘදු කුසලතා වැඩිදියුණු කිරීම හා පළාත් ජයග්‍රහණ සංඛ්‍යාව වැඩි කිරීම, ස්වයංරැකියා හරහා ආදායම් උත්පාදනය, විශේෂ අවශ්‍යතා සහිත සිසුන්හට සම අධ්‍යාපන අවස්ථා ලබා දීම, විවිධ ක්‍රීඩා කුසලතාවන්ගෙන් හෙබි සිසුන්, පළාත් පාසල්වල සහ අධ්‍යාපන පරිපාලන ආයතනවල භෞතික අවශ්‍යතා පූරණය වීම අපේක්ෂිතය.

කණ්ඩායම් මාර්ගෝපදේශ සැලැස්ම කලාප හා පළාත් මට්ටමින් සැකසීම, වැඩසටහන ක්‍රියාත්මක කිරීම, කණ්ඩායම් මාර්ගෝපදේශ වාර්තා සැකසීම හා වාර්තා පාසල් වෙත ලබා දීම, අවශ්‍ය පාසල් සඳහා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නුපුහුණු ප්‍රාථමික ගුරු පුහුණු, නව විෂය නිර්දේශ හඳුන්වා දීම පිළිබඳ පුහුණු, ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරු පුහුණු, සිසු කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන්, 4,5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර සැකසීම හා මුද්‍රණය, සිසු භාෂා නිපුණතා තරඟ පැවැත්වීම, නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු පැවැත්වීම, ගුරුවරු දැනුවත් කිරීමේ හා සිසු ප්‍රායෝගික පුහුණු වැඩසටහන්, නව විෂය නිර්දේශ හඳුන්වා දීම, දැනුම යාවත්කාලීන කිරීම, විෂය නව ප්‍රවණතා හඳුන්වා දීම පිළිබඳ ගුරු පුහුණු, නවක උපාධි ගුරු පුහුණුව, සිසු පුහුණු ප්‍රායෝගික කඳවුරු හා සම්මන්ත්‍රණ පැවැත්වීම, විවිධ විෂයයන්හි කොට්ඨාස තරඟ පැවැත්වීම, විවිධ විෂයයන්හි කලාප තරඟ පැවැත්වීම, ගුරුසිසු ඇගයීම් උත්සව පැවැත්වීම සිදු කිරීමට අපේක්ෂිතය.

අධ්‍යාපන සංවර්ධන සැලසුම් සැකසීම, පර්යේෂණ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම, අධ්‍යාපන පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, සිසු පුහුණු ප්‍රායෝගික කඳවුරු හා විවිධ විෂයයන්හි කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තරඟ, සමස්ත ලංකා ජයග්‍රාහකයින් පුහුණු කඳවුරු වාර විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම, මුද්‍රණය හා බෙදා හැරීම, දෙවන හා තෙවන වාර විභාග පැවැත්වීම, වාර විභාග ලකුණු විශ්ලේෂණය, ප්‍රතිපෝෂණ වැඩසටහන් සිදු කිරීම, නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු, සෞඛ්‍ය කඳවුරු, පෝෂණ වැඩසටහන්, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, පාසල් විධායක කමිටු, කළමනාකරණ කමිටු දැනුවත් කිරීමේ වැඩසටහන්, විදුහල්පතිවරු දැනුවත් කිරීම, පාසල් කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, දෙමව්පියන් දැනුවත් කිරීම, පළාත් තරඟ විවිධ විෂයයන් යටතේ පැවැත්වීම හා ජයග්‍රාහකයින් ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා ඉදිරිපත් කිරීම හා පුහුණු කිරීම, ගුරු පුහුණු - ඇද හැලීමට ආසන්න දරුවන් හඳුනාගැනීම, දෙමාපියන් දැනුවත් කිරීම, පාසල් හැර ගිය සිසුන් වෘත්තීය පුහුණුවලට යොමුකිරීම සඳහා ගුරු පුහුණු ,විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා සිසු පුහුණුව හා ගුරු පුහුණුව හා තරඟ පැවැත්විමට අපේක්ෂිතය.

කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තෝරා ගත් ක්‍රීඩා 16 ක් සංවර්ධනය සඳහා සිසු සංචිත පිහිටුවීම, සිසු පුහුණු කඳවුරු හා කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමේ තරඟ පැවැත්වීම සඳහා,පාසල් සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම අධ්‍යාපන පරිපාලන ආයතනවලට අවශ්‍ය උපකරණ හා ලී බඩු සැපයීම,පාසල්වල පවතින අලුත්වැඩියා කළයුතු ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තුව, පාසල් සඳහා ලී බඩු සැපයීම,පාසල් සඳහා උපකරණ සැපයීම,අධ්‍යාපන පරිපාලන ආයතනවල ගොඩනැගිලි අලුත්වැඩියාව, අධ්‍යාපන පරිපාලන ආයතනවලට අවශ්‍ය උපකරණ හා ලී බඩු සැපයීම ආදි කටයුතුද සිදු කිරීමට අපේක්ෂිතය.

## ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය - උතුරු මැද පළාතේ සිසු සාධනය පිළිබඳ තොරතුරු

පළාතේ අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය සඳහා විවිධ මූලාශ්‍ර මඟින් ලැබෙන අරමුදල් අරපිරිමැස්මකින් යුතුව ආයෝජනය කිරීම සඳහා විවිධ ක්‍රමෝපායන් ද ක්‍රියාත්මක කළ අතර ප්‍රාථමික අධ්‍යාපනය හා ද්විතීයික අධ්‍යාපනය සඳහාවන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම, ගුරු සංවර්ධනය, පාසල් පාදක ඇගයීම් ශක්තිමත් කිරීම, පාසල්වල භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා අධ්‍යාපන පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම ඒ යටතේ ප්‍රධාන විය.

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහාවන ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම යටතේ උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා 2020 වර්ෂයේදී නව ප්‍රාථමික පාසල් 01 ක් ආරම්භ කළ අතර උසස් පෙළ විද්‍යා විෂය ධාරාව ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව 64 දක්වා ඉහළ දැමීමට හැකිවිය. එමෙන්ම තාක්ෂණ විද්‍යාගාර 83 හි හා තාක්ෂණ විෂය ධාරාව හඳුන්වාදීමත් සමඟ පාසල් 22 ක තාක්ෂණ විද්‍යා පීඨ 22 ක් ඉදිකළ අතර මේවන විට මෙම සියළු භෞතික සම්පත් සිසුන්ගේ ඉගෙනුම් අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා සිසු අයිතියට පත්කර අවසන් කර ඇත.

සෑම පාසල් දරුවෙකුටම පළමු ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණිය දක්වා අඛණ්ඩ පාසල් අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කරගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් “ 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන “ 2017 ඔක්තෝම්බර් මාසයේ සිට ආරම්භ කළ අතර, එමගින් අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි සියලු සිසුන්ට සමත් අසමත්භාවය නොසලකා ඇතුළත් වීමට අවස්ථාව සලසන අනාගත අභියෝග ජයගත හැකි වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම අරමුණ කරගත් නව වෘත්තීය විෂයයන් 26 ක් ඇතුළත් විෂයය ධාරාවක් ඒ යටතේ හඳුන්වා දී ඇත.

එහි නියමු වැඩසටහන සඳහා 2017 වර්ෂයේදී මුළු දිවයිනේම පාසල් 43 ක් තෝරාගෙන ඇති අතර, උතුරු මැද පළාතෙන් පාසල් 02 ක් තෝරාගෙන ක්‍රියාවට නංවා ඇත. 2018 වර්ෂයේදී දෙවන අදියර ලෙස උතුරු මැද පළාතේ පාසල් 12 ක් තෝරා ගෙන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2018 වර්ෂය අවසාන වන විට පාසල් 14 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර, 2019 වර්ෂය වන විට මුළු පාසල් 22 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

මෙම වෘත්තීය විෂයධාරාව හඳුන්වාදීමත් සමඟම සිසුන්ට තම අධ්‍යයන කටයුතු පහසුවෙන් ඉටු කර ගැනීම සඳහා සුහුරු පන්ති කාමර (Smart Class Rooms) 29 ක් ඉදිකර සිසු අයිතියට පත් කර අවසන් කර ඇත.

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල සහ අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල විශ්ලේෂණ 2015-2019

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලකුණු 70 ට වැඩි 2015 - 2019

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල විශ්ලේෂණය - කලාප මට්ටමින්**


**ලකුණු 70 ට වැඩි (2015-2019)**

| ස්ථානය | කලාපය | 2015 | | | 2016 | | | 2017 | | | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය | ලකුණු 70 ට වැඩි(%) | දිවයිනේ කලාප මට්ටමින් ලබා ගත් ස්ථානය | පළාත් මට්ටමින් ලබා ගත් ස්ථානය |
| 1 | අනුරාධපුර | 76.3 | 49 | 5 | 74.54 | 52 | 6 | 69.77 | 42 | 4 | 78.23 | 55 | 6 | 78.8 | 45 | 4 |
| 2 | ගලෙන්බිඳුණුවැව | 73.0 | 62 | 8 | 75.06 | 48 | 5 | 69.48 | 46 | 5 | 78.35 | 54 | 5 | 77.8 | 49 | 5 |
| 3 | පොළොන්නරුව | 80.8 | 22 | 2 | 79.76 | 27 | 2 | 72.97 | 27 | 2 | 83.75 | 14 | 2 | 80.3 | 34 | 2 |
| 4 | කැකිරාව | 77.2 | 41 | 3 | 76.18 | 44 | 4 | 69.25 | 47 | 6 | 79.74 | 44 | 4 | 79.4 | 38 | 3 |
| 5 | කැබිතිගොල්ලෑව | 76.5 | 44 | 4 | 72.53 | 61 | 8 | 67.41 | 58 | 7 | 75.8 | 68 | 7 | 75.8 | 64 | 7 |
| 6 | දිඹුලාගල | 74.1 | 57 | 6 | 73.15 | 58 | 7 | 6.95 | 62 | 8 | 73.94 | 75 | 8 | 75.8 | 65 | 8 |
| 7 | හිඟුරක්ගොඩ | 73.2 | 61 | 7 | 76.86 | 41 | 3 | 72.18 | 33 | 3 | 81 | 32 | 3 | 76.1 | 59 | 6 |
| 8 | තඹුත්තේගම | 82.8 | 14 | 1 | 80.91 | 16 | 1 | 74.14 | 23 | 1 | 83.76 | 13 | 1 | 82.1 | 19 | 1 |
| **උතුරු මැදපළාත** | | **77.5** | **5** | | **76.13** | **5** | | **70.37** | **5** | | **79.43** | **5** | | 79.2 | | |
| **සමස්ථ දිවයින** | | **76.3** | | | **75.67** | | | **69.40** | | | 79.09 | | | **78.1** | | |

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලකුණු 70 ට වැඩි 2015-2019

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵලවල ධනාත්මක වර්ධනයක්.......**


2015 වර්ෂය හා සමග සසඳා බලන විට පෙනී යන්නේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵලවල ධනාත්මක වර්ධනයක් පන්වන බවයි. විභාගය සඳහා පෙනී සිටි සිසුන් ප්‍රමාණයට සාපේක්ෂව ලකුණු 70ට වැඩියෙන් ලබාගත් සිසුන් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්වන බවයි.එසේම ප්‍රතිශතාත්මක වෙනස සලකා බලන විට 2015 සිට 2017 වර්ෂය දක්වා පහළ යාමක් පෙන්නුම් කළ ද 2018 වර්ෂයේ ශීඝ්‍ර වර්ධනයක් 90.36% පෙන්වන බවයි. එය සාපේක්ෂව ලද ජයග්‍රහණයකි.





### අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල - අධ්‍යාපන කලාප මට්ටමින් (2015 -2018 )
### (උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ)

| කලාපය | 2015 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2015 සමත් සංඛ්‍යාව | 2015 ප්‍රතිශතයක් ලෙස(%) | 2016 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2016 සමත් සංඛ්‍යාව | 2016 ප්‍රතිශතයක් ලෙස(%) | 2017 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2017 සමත් සංඛ්‍යාව | 2017 ප්‍රතිශතයක් ලෙස(%) | 2018 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2018 සමත් සංඛ්‍යාව | 2018 ප්‍රතිශතයක් ලෙස(%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 4155 | 2911 | 70.06 | 4704 | 3232 | 68.71 | 4782 | 3440 | 71.94 | 4825 | 3678 | 76.23 |
| කැකිරාව | 2283 | 1535 | 67.24 | 2559 | 1691 | 66.08 | 2552 | 1810 | 70.92 | 2614 | 1877 | 71.81 |
| තඹුත්තේගම | 2001 | 1299 | 64.92 | 2458 | 1660 | 67.53 | 2396 | 1578 | 65.86 | 2446 | 1717 | 70.20 |
| ගලෙන්බිඳුණුවැව | 1400 | 950 | 67.86 | 1582 | 1069 | 67.57 | 1709 | 1235 | 72.26 | 1672 | 1238 | 74.04 |
| කැබිතිගොල්ලෑව | 1706 | 1144 | 67.06 | 1895 | 1184 | 62.48 | 1996 | 1423 | 71.29 | 1966 | 1396 | 71.01 |
| පොළොන්නරුව | 1644 | 1138 | 69.22 | 1841 | 1266 | 68.77 | 1923 | 1345 | 69.94 | 1920 | 1421 | 74.01 |
| හිඟුරක්ගොඩ | 2129 | 1288 | 60.50 | 2531 | 1607 | 63.49 | 2625 | 1806 | 68.80 | 2470 | 1743 | 70.57 |
| දිඹුලාගල | 1242 | 765 | 61.59 | 1460 | 915 | 62.67 | 1472 | 988 | 67.12 | 1474 | 1043 | 70.76 |
| උතුරු මැද පළාත | **16560** | **11030** | **66.61** | **19030** | **12624** | **66.34** | **19455** | **13625** | **70.03** | **19387** | **14113** | **72.80** |

## අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල මත ලබා ඇති ප්‍රගතිය....




**2019** වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල නිකුත් කර නොමැති අතර, 2018 වර්ෂයේ පැවති අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා සිසුන් 19387ක් පෙනී සිටි අතර සිසුන් 14,113ක් අ.පො.ස(උ/පෙළ ) සඳහා සුදුසුකම් ලැබීමට සමත් විය. එය ප්‍රතිශතයක් ලෙස 72.80% කි. එමෙන්ම 2017 වර්ෂයට සාපේක්ෂව 2.77% ක වර්ධනයකි.

එමෙන්ම 2019 පැවති අ.පො.ස(උ/පෙළ) විභාගයේදී ජෛව විද්‍යා ප්‍රතිඵල අනුව සමත් ප්‍රතිශතය 49.15% ක් වේ. එය 2018 වර්ෂයට සාපේක්ෂව 3.35%ක වර්ධනයකි. භෞතික විද්‍යා අංශයේ සමත් ප්‍රතිශතය 48.25% ක් වේ. එය 2018 වර්ෂයට සාපේක්ෂව 0.25% ක වර්ධනයකි. ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය 68.35% ක් වූ අතර, එය 2018ට සාපේක්ෂව 7.65% ක වර්ධනයක් ද , වෙනත් විෂය ධාරාව යටතේ සමත් ප්‍රතිශතය 24.26% ක් වූ අතර එය 2018ට සාපේක්ෂව 11.74% ක අඩු වීමක් ද ලබා ගෙන ඇත. වාණිජ විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය 78.65% ක් වූ අතර එය 2018ට සාපේක්ෂව 11.85% ක වැඩි වීමක් ද, කලා විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය 69.74%ක් වූ අතර එය 2018ට සාපේක්ෂව 1.26% ක අඩු වීමක් ද දැකිය හැක.


**2018 වර්ෂයේ පැවති අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා සිසුන් 19387 ක් පෙනී සිටි අතර සිසුන් 14113 ක් අ.පො.ස (උ/පෙළ ) සඳහා සුදුසුකම් ලැබීමට සමත් විය. එය ප්‍රතිශතයක් ලෙස**


එසේම ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව යටතේ සමත් ප්‍රතිශතය 72.12% ක් වූ අතර, එය 2018 ට සාපේක්ෂව 19.12% ක වැඩි වීමක් ද, පෙන්නුම් කර ඇත. මෙය උතුරු මැද පළාතේ පමණක් නොව සමස්ත දිවයිනේම දක්නට ඇති තත්ත්වයකි.


## අ.පො.ස.උසස් පෙළ විභාග ප්‍රතිඵල - විෂය ධාරාව අනුව (2015 -2019)


| | 2015 | | | 2016 | | | 2017 | | | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) |
| ජෛව විද්‍යා | 2040 | 857 | 42.0 | 2070 | 863 | 41.69 | 1782 | 767 | 43.04 | 1894 | 868 | 45.83 | 1878 | 923 | 49.15 |
| භෞතික විද්‍යා | 1053 | 421 | 39.98 | 1148 | 478 | 41.63 | 1164 | 510 | 43.81 | 1115 | 536 | 48.01 | 1287 | 621 | 48.25 |
| වාණිජ්‍ය | 2529 | 1726 | 68.24 | 2563 | 1769 | 69.02 | 2653 | 1779 | 67.05 | 2509 | 1676 | 66.80 | 3078 | 2114 | 78.65 |
| කලා | 4935 | 3421 | 69.32 | 4644 | 3310 | 71.27 | 5134 | 3857 | 75.12 | 5475 | 3888 | 71.01 | 6249 | 4358 | 69.74 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 721 | 319 | 44.24 | 1009 | 461 | 45.68 | 731 | 401 | 54.85 | 822 | 436 | 53.04 | 1009 | 641 | 72.12 |
| ජෛව පද්ධති තාක්ෂණවේදය | 500 | 291 | 58.2 | 675 | 350 | 51.85 | 490 | 272 | 55.51 | 605 | 367 | 60.66 | 553 | 378 | 68.35 |
| වෙනත් | 132 | 59 | 44.69 | 198 | 63 | 31.81 | 176 | 57 | 32.38 | 161 | 58 | 36.02 | 169 | 41 | 24.26 |


### විෂය ධාරාව අනුව අ.පො.ස.උසස් පෙළ විභාග ප්‍රතිඵල විශ්ලේෂණය 2016 – 2019










ජෛව විද්‍යා අංශය-2016-2019
2500
2000
1500
1000
500
0
2070
1782
1894
1878
863
767
868
923
2016
2017
2018
2019
පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව



ජෛව විද්‍යාව සමත් වීමේ ප්‍රතිශතය(%)
50
48
46
44
42
40
38
36
41.69
43.04
45.83
49.15
2016
2017
2018
2019
සමත් වීමේ ප්‍රතිශතය(%)



භෞතික විද්‍යා අංශය 2016-2019
1400
1200
1000
800
600
400
200
0
1148
1164
1115
1287
41.63
510
536
621
2016
2017
2018
2019
පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව
සමත් සංඛ්‍යාව



භෞතික විද්‍යාව සමත් වීමේ ප්‍රතිශතය(%)
50
45
40
35
41.63
43.8
48
48.25
2016
2017
2018
2019
සමත් වීමේ ප්‍රතිශතය(%)



වාණිජ්‍යය අංශය -2016-2019
4000
3000
2000
1000
0
2563
2653
2509
3078
1769
1779
1676
2114
2016
2017
2018
2019
පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව
සමත් සංඛ්‍යාව



වාණිජ්‍යය සමත් වීමේ ප්‍රතිශතය(%)
80
75
70
65
60
69
67.1
66.8
78.65
2016
2017
2018
2019
සමත් වීමේ ප්‍රතිශතය(%)



කලා අංශය - 2016-2019
8000
6000
4000
2000
0
4644
3310
5134
3857
5475
3888
6249
4358
2016
2017
2018
2019
පෙනි සිටි ශිෂ්‍ය සංඛ්‍යාව
සමත් සංඛ්‍යාව



කලා විෂය සමත් විමේ ප්‍රතිශතය(%)
76
74
72
70
68
66
71.3
75.1
71
69.74
2016
2017
2018
2019
සමත් විමේ ප්‍රතිශතය(%)


ඉංජිනේරු තාක්ෂණවේද අංශය- 2016-2019
1200
1000
800
600
400
200
0
1009
461
731
401
822
436
1009
641
2016
2017
2018
2019
පෙනි සිටි ශිෂ්‍ය සංඛ්‍යාව
සමත් සංඛ්‍යාව


ඉංජිනේරු තාක්ෂණවේදය සමත් විමේ ප්‍රතිශතය(%)
80
60
40
20
0
45.7
54.9
53
72.12
2016
2017
2018
2019
සමත් විමේ ප්‍රතිශතය(%)


ජෛව පද්ධති තාක්ෂණවේද අංශය - 2016-2019
800
600
400
200
0
675
350
490
272
605
367
553
378
2016
2017
2018
2019
පෙනි සිටි ශිෂ්‍ය සංඛ්‍යාව
සමත් සංඛ්‍යාව


ජෛව පද්ධති තාක්ෂණවේදය සමත් විමේ ප්‍රතිශතය(%)
80
60
40
20
0
51.9
55.5
60.7
68.35
2016
2017
2018
2019
සමත් විමේ ප්‍රතිශතය(%)




## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

කාර්යය සාධන ඉලක්ක කරා ළඟා වීමේදී මානව සම්පත් සහ භෞතික සම්පත් ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවිය . ගුරුවරු 592 (2019.12 31 දිනට ත්‍රෛමාසික වාර්තාවට අනුව) ක පමණ හිඟයක් පවති. අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් 94කගේ හිඟයක් උතුරු මැද පළාත තුළ ඇත. එබැවින් එක් නිලධාරියෙකුට විෂයයන් ආවරණය කිරීමට සිදුවීම, ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන්ගේ හිඟය, ගුරුවරුන් සහ නිළධාරීන් පළාත තුළ රඳවා ගැනීමේ ගැටළු , පාසල් නියාමනය හා ගුරුවරු සඳහා සහාය සේවා සැපයීමට ගුරු උපදේශක හිඟය, කළමණාකරණ සහකාර සේවයේ අනුමත සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම වැනි ගැටළුවලට මුහුණ දීමට සිදු විය.

පාසල්වල ගුරුවරු නියමිත ප්‍රමාණය ස්ථානගත කර ඇතත්, විෂයයට අවශ්‍ය ගුරුවරු බොහෝ පාසල්වල නොමැති වීම, වෙනත් විෂයයන් පත්වීම් ලද ගුරුවරු අදාළ විෂයයන් ඉගැන්වීම හා මානව සහ භෞතික සම්පත් ගැටළු රාශියකට මුහුණ දෙන ලදී. උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් ඉහළ නංවමින් අධ්‍යාපනයේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක වර්ධනයක් සඳහා 2019 වර්ෂයේ දී වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රේඛීය අමාත්‍යාංශයෙන් හා අනෙකුත් ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් සියලුම පාර්ශවකරුවන් ද සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අපේක්ෂිත ප්‍රතිඵල කරා සහ ඉලක්ක කරා ළඟා වීමටත් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රමික වර්ධනයක් සිදු කරමින් අධ්‍යාපනයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකිවිය.

# 6.3. පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

**පළාතේ කලායතන පිහිටීම** | **ආගමික සිද්ධස්ථාන**

| කලායතනය | සංඛ්‍යාව |
|---|---|
| නර්තන | 147 |
| සංගීත | 14 |
| නාට්‍ය | 07 |

| ආගමික සිද්ධස්ථාන | සංඛ්‍යාව |
|---|---|
| පන්සල් | 1112 |
| කෝවිල් | 42 |
| මුස්ලිම් පල්ලි | 198 |
| කතෝලික දේවස්ථාන | 47 |
| පිරිවෙන් | 57 |
| දහම් පාසල් | 978 |

## දැක්ම

"සංස්කෘතිකාංග ගරු කරන සාරධර්ම සපිරි සමාජයක්, සෞභාග්‍යවත් පළාතක්".

## මෙහෙවර

**" දැහැමි කලාකාමී හා අභිමානවත් සමාජයක් බිහි කිරීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව දහම් අධ්‍යාපනය නංවාලීම, උසස් කලා නිර්මාණකරණය හා රසවින්දනය දිරිගැන්වීම, අතීත සංස්කෘතික උරුමයන් හා ශිල්ප සංරක්ෂණය සහ කලාකරුවන්ගේ කුසලතා ඔප නැංවීම".**

## දිගු කාලීන අරමුණු

- අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්.
- දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සඳහා දායක වීම.
- පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාමට විධිමත් ක්‍රමවේදයක්.
- ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක්.
- උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම.

## කෙටි කාලීන අරමුණු

- කාර්යක්ෂම ආයතන පද්ධතියක්.
- නර්තන කලාව, ලේඛණ කලාව, සංගීත හා රංග කලාව වැනි සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනයට කටයුතු සැලසීම.
- පළාතේ කලාකරුවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඇගයීමට ලක් කිරීම.
- පළාතේ ආගමික පුනර්ජීවය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- දහම් අධ්‍යාපනය නංවාලීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සංවර්ධනය.
- උසස් රසාස්වාදය ප්‍රචලිත කිරීම.
- අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය.
- කලාකරුවන්ගේ කුසලතා නංවාලීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්


- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- ❖ කලා උළෙල හා එයට සමගාමී ක්‍රියාකාරකම්.
- ❖ සංස්කෘතික සංරක්ෂණය සිදු කිරීම.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ සංවර්ධන ආධාර (දහම් පාසල්, කලායතනාධාර, ආගමික සිද්ධස්ථාන)

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

**ලෝකයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම**
**හා**
**ආරක්ෂාකර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 19 |
| 2 | සේවයේ නියුතු | 16 |
| 3 | පුරප්පාඩු | 03 |
| 5 | තාවකාලික | 01 |
| 6 | පුහුණු | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | 2019 වර්ෂයේ වියදම් (රු. මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 12.29 | 10.64 | 1.65 | 86.5 |
| ගමන් වියදම් | 0.80 | 0.61 | 0.19 | 76 |
| සැපයීම් | 1.44 | 1036 | 0.08 | 95 |
| නඩත්තු වියදම් | 3.00 | 1.81 | 1.19 | 60 |
| ගිවිසුම්ගත සේවා | 7.46 | 5.96 | 1.50 | 80 |
| මාරු කිරීම් | 0.15 | 0.15 | 0.00 | 100 |
| එකතුව | 25.14 | 20.53 | 4.61 | 82 |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | දෙපාර්තමේන්තු භූමියේ ගොඩනැගිල්ල ප්‍රමාණවත් නොවීම නිසා පිටුපස කොටස අළුත්වැඩියා කිරීම | සේවාලාභීන් සඳහා කඩිනම් සේවා සැපයීම සහ කාර්යාල නිලධාරීන් සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම | මහජනතාව සහ දෙපාර්තමේන්තුවේ සියළුම සේවකයින් |

## මූලධන වියදම් - 2019

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 4.00 | 2.60 | 1.40 | 65 |
| වෙනත් පුනරාවර්තන | 0.85 | 0.70 | 0.15 | 83 |
| **එකතුව** | **4.85** | **3.30** | **1.55** | **68** |

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා නිමවුම් දර්ශක

**තිරසර සංවර්ධන අරමුණ - සියල්ලන් සඳහා පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ,ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.**

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය(රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| 2020 වන විට රැකියාවක් නොලබන,රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීම, අධ්‍යාපනය නොලබන, රැකියාවක නියුක්ත නොවන නැතහොත් පුහුණුවක් නොලබන යෞවනයන්ගේ වයස් ප්‍රමාණය සංචාරක ක්ෂේත්‍රයේ සමස්ත රැකියා ප්‍රමාණයෙන් තිරසර සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා ප්‍රමාණය | පුහුණුව ලැබූ දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව | 2.00 | 1.99 |
| | ග්‍රන්ථ 2500 හා සී.ඩී. තැටි 1000 ක් නිකුත් කිරීම | 1.673 | 1.673 |
| | නිර්මාණය කරන ලද පෙරහැර කණ්ඩායම් සංඛ්‍යාව | | |
| | කෙටි චිත්‍රපටි ඡායාරූප හා නාට්‍ය වැඩමුළුවට සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | 0.52 | 0.52 |
| | සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට දායක වන වැඩසටහන් සඳහා යෝග්‍ය වන පරිදි නර්තන කණ්ඩායම් පුහුණු කිරීම | 0.645 | 0.645 |

**තිරසර සංවර්ධන අරමුණ - නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සැකසීම**

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය(රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්කය | ප්‍රගතිය |
| සියළු සංස්කෘතික හා ස්වභාවික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂාව හා සංරක්ෂණය වෙනුවෙන් සිදු කරනු ලබන සමස්ත ඒක පුද්ගල වියදම | බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර | 4.414 | 4.412 |
| | සාහිත්‍ය නිර්මාණ ශිල්පීන් තිදෙනෙකු සහ ගීත රචකයන් අටදෙනෙකු ජාතික තලයට ප්‍රවිශ්ට වීම | | |
| | ප්‍රසංග නැරඹීමට පැමිණි ප්‍රේක්ෂක සංඛ්‍යාව | 1.275 | 1.275 |
| | මුද්‍රණය කරනු ලබන සඟරා සංඛ්‍යාව | 0.13 | 0.129 |
| | ආධාර ලබාදුන් කලායතන සංඛ්‍යාව | 0.85 | 0.85 |
| | දේශීය හා විදේශීය ප්‍රේක්ෂකයන්ගේ ආකර්ෂණය දිනා ගැනීම හා කාර්යාල පරිශ්‍රයේ ආරක්ෂාව | 4.00 | 2.602 |
| | සියළුම කාර්යාල නිලධාරීන් හා නර්තන කණ්ඩායම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ලබාගත් යන්ත්‍රෝපකරණ | 0.85 | 0.703 |
| | මිලදී ගන්නා ලද නර්තන භාණ්ඩ ප්‍රමාණය | 0.093 | 0.093 |
| | ආධාර ලබාදුන් පෙරහැර හා ආගමික උත්සව සංඛ්‍යාව | 2.6 | 2.562 |
| | ආධාර ලබාදුන් ආගමික සිද්ධස්ථාන සංඛ්‍යාව | 1.4 | 1.4 |
| | ආධාර ලබා දුන් දහම් පාසල් සංඛ්‍යාව | 4.00 | 3.993 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජන(රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|
| 8 | නර්තන කණ්ඩායම පුහුණු කිරීම (පුනරාවර්තන වැය) | 3.1 | 2.833 |
| | සංගීත කණ්ඩායම පුහුණු කිරීම (පුනරාවර්තන) | 2.1 | 1.575 |
| | පුහුණු වැඩමුළු පැවැත්වීම | 0.645 | 0.645 |
| | කලායතන ආධාර ලබා දීම | 0.85 | 0.85 |
| | දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම | 2.00 | 1.999 |
| | නර්තන කණ්ඩායම් පුහුණු කිරීම | 0.52 | 0.52 |
| 11 | පළාත් කලා උළෙල | 5.087 | 4.412 |
| | කලා ප්‍රසංග පැවැත්වීම | 1.375 | 1.374 |
| | සුභාෂණ සංස්කෘතික සඟරාව මුද්‍රණය | 0.13 | 0.129 |
| | සුරපුර සංවර්ධන ව්‍යාපෘතිය | 4.00 | 2.602 |
| | ආගමික කටයුතු | 4.00 | 3.962 |
| | දහම්පාසල් සංවර්ධනය | 4.00 | 3.993 |

## 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන ව්‍යාපෘති

### පළාත් කලා උළෙල

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි 30වන උතුරු මැද කලා උළෙලට උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී. මෙහිදි චිත්‍ර තරඟ,සංගීත තරඟ,නර්තන තරඟ,නාට්‍ය තරඟ, නිවේදන තරඟ හා මූර්ති කැටයම් ශොක් කලා තරඟ පැවැත්විණි. මේ සඳහා තරඟකරුවන් 4000කට අධික පිරිසක් සහභාගී වූ අතර ඒ සඳහා විවිධ වයස් සීමාවන්ට අයත් තරඟකරුවන් තරඟ වැදුණි. මෙහි විනිශ්චය මණ්ඩල අදාළ කෂේත්‍රයේ ප්‍රවීණයන් හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් කටයුතු කරන ලදී. එසේම 2018 වසරේ ජයග්‍රාහී සාහිත්‍ය නිර්මාණ සරසවි ග්‍රන්ථ ප්‍රකාශන ආයතනය මගින් මුද්‍රණය කරන ලදී. සන්ධ්‍යා මධුරසිංහ මහත්මියගේ රාජ සජ්න ළග හීන පාංකඩ පද්‍ය රචනා සංග්‍රහය, උදයන්ත ප්‍රියන්ත මහතාගේ කාල යන්තරේ ළමා කතන්දරය,ස්වර්ණපාලි ප්‍රියදර්ශණී මහත්මියගේ මිතුරු තුමෝ නවකථාව මුද්‍රණය කරන ලදී. 2018 වසරේ ජයග්‍රාහී ගී පද රචකයන්ගේ ගීත ඇතුලත් සී.ඩී තැටියක් එළි දක්වන ලදී. මෙහිදී ගීත ගායනයෙන් පළාතේ ආධුනික ගායක ගායිකාවන් තිදෙනෙක් සහ සේනානායක වේරලියද්ද, උරේෂා රවිහාරී, චන්දන ලියනආරච්චි, නෙළු අධිකාරී, ජානක වික්‍රමසිංහ යන ප්‍රවීන ගීත රචකයන් දායක විය. උතුරු මැද පළාතේ තරඟකරුවන් 5000 ක් පමණ මේ සඳහා ඉදිරිපත් වූ අතර එයින් 2500 ක් පමණ සහතික සම්මාන කුසලතා දිනා ගන්නා ලදී.

### කලා ප්‍රසංග පැවැත්වීම

සුරපුර එළිමහන් රංග පියයේ ප්‍රසංග පවත්වන ලදී. මේ යටතේ, පළාත් රාජ්‍ය සේවකයන් වෙනුවෙන් පොසොන් බැති ගී ප්‍රසංගයක් පැවැත්විම,මකරෙක් ඇවිත් ළමා නාට්‍ය රඟදැක්වීම, රාජකපුරු වේදිකා නාට්‍ය, ඉපලෝගම ප්‍රාදේශීය සභා රංග ශාලාවේදී සිංහබාහු වේදිකා නාට්‍ය, සුරපුර එළිමහන් රංග පියයේදී මිහිරි සුයාමය සංගීත ප්‍රසංගය, බකමූණ විද්‍යාලයේ රසවින්දන වැඩසටහන, පොළොන්නරුව සේනක එදිරිසිංහගේ විලංගුව වේදිකා නාට්‍ය ආදිය රඟ දක්වන ලදී. එක් සංදර්ශණයක් නැරඹීම සඳහා දහසකට වැඩි පිරිසක් සහභාගී විය. මධ්‍යම නුවරගම් පළාත, නැගෙනහිර නුවරගම් පළාත, කැකිරාව, බකමූණ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් මෙම කලා ප්‍රසංග පවත්වන ලදී.

### පුහුණු වැඩමුළු පැවැත්වීම

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු පවත්වන ලදී.මේ යටතේ උතුරු මැද පළාතේ නාට්‍යකරුවන් සඳහා නාට්‍ය පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. එසේම කෙටි චිත්‍රපටි ඡායාරූප පුහුණු වැඩමුළුවක් පැවැත්විය. ඓතිහාසික දළදා පෙරහැර සඳහා උඩැක්කි, පන්තේරු සහ හේවිසි කණ්ඩායම් පුහුණු කරන ලදී. පුහුණු වැඩමුළු සඳහා 500 ක් පමණ පුහුණු ශිල්පීන් සහභාගී විය.

## සුභාෂණ සගරාව සකස් කිරීම

උතුරු මැද පළාතේ ලේඛකයන්ගේ ලිපි ඇතුළත් කරමින් සුභාෂණ සඟරාවේ පිටපත් 600 ක් මුද්‍රණය කිරීම, උතුරු මැද පළාතේ සියළුම රාජ්‍ය ආයතන සඳහා ද උතුරු මැද පළාතේ පාසල් හා පුස්තකාල අතර නොමිලේ බෙදා හැරීම සිදු කරන ලද අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරන ලදී.

## කලායතන ධාරිතා සංවර්ධනය

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණයවන පරිදි උතුරු මැද පළාතේ ක්‍රියාකාරී කලායතන 16 ක් සඳහා මූල්‍ය ආධාර ලබා දීම, සිදු කරන ලදී. කලායතන 16 න් ඉගෙනුම ලබන සිසුන් දහසක් පමණ දෙනාට මෙහි ප්‍රතිලාභ ලැබිය හැකි විය.

## නර්තන හා සංගීත කණ්ඩායමට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි උතුරු මැද පළාත් නර්තන කණ්ඩායම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම මේ යටතේ සිදුවිය. නර්තන කණ්ඩායමේ පුහුණුව ලබන ශිල්පීන් මෙහි ප්‍රතිලාභීන් වූහ.

## සුරපුර සංවර්ධන ව්‍යාපෘතිය

නැනුප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුරපුර එළිමහන් රංගපීඨයේ කාර්යාල පරිශ්‍රය අවට භූමිය සකස් කිරීම හා කාර්යාලයේ ඉදිරිපස තාප්පය හා ගේට්ටුව සකස් කිරීම මේ යටතේ සිදුවිය.කාර්යාල නිලධාරීන් හා කාර්යාල පරිශ්‍රයට පැමිණෙන ජනතාවට මින් ප්‍රතිලාභ හිමි විය.

## ආගමික කටයුතු

උතුරු මැද පළාතේ පවත්වනු ලබන පෙරහැර, ආදාහන පූජෝත්සව හා අනෙකුත් ආගමික උත්සව සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම හා ප්‍රදේශයේ පවතින දුෂ්කර ආගමික සිද්ධස්ථාන සඳහා මූල්‍යමය ආධාර පෙරහැර හා අනෙකුත් ආගමික ස්ථාන 25 ක් සඳහා මූල්‍යමය අනුග්‍රාහකත්වය ලබා දීම,
උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණයවන පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන 10 ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන 04ක් සඳහා මින් ප්‍රතිලාභ හිමි විය.
අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දුෂ්කර දහම් පාසල් සඳහා මූල්‍යමය අනුග්‍රහය ලබා දීම, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දහම් පාසල් 14ක ඉගෙනුම ලබන සිසුන් හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ දහම් පාසල් 49ක ඉගෙනුම ලබන සිසුන් සඳහා මින් ප්‍රතිලාභ හිමි විය.

## දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම හා දහම් පාසල් ධාරිතා සංවර්ධනය

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණයවන ලෙස පළාත තුළ ක්‍රියාත්මක වන දහම් පාසල්වල සේවය කරනු ලබන ගුරු භවතුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් දහම් පාසල් ගුරුවරුන්ගේ කුසලතා ආකල්ප සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්විය. බෞද්ධ ආගමික දහම් පාසල් හැරුණු කොට අනෙකුත් ආගමික සිද්ධස්ථාන යටතේ ක්‍රියාත්මක වන දහම් පාසල් සඳහාද පුහුණු වැඩමුළු පැවැත්විය. මේ සඳහා ඉහළම සුදුසුකම් වලින් පරිපූර්ණ භික්ෂූන් වහන්සේලා, පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් මේ සඳහා සම්පත්දායකවරුන් වශයෙන් යොදා ගැණුනි. උතුරු මැද පළාතේ දහම් පාසල්වල ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට මෙහි ප්‍රතිලාභ හිමි විය.

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පළාත තුළ විසිරී පවතින දහම් පාසල්වල භෞතික අවශ්‍යතා සංවර්ධනය කිරීම මේ යටතේ සිදුවිය. මෙහිදී උතුරු මැද පළාතේ පවතින දුෂ්කර දහම් පාසල්හි පවතින අඩුපාඩු පිළිබඳ ඉල්ලීම් ලිපි ලබා ගන්නා ලදී. එම දහම් පාසල් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් පසු දහම් පාසල්වල අවශ්‍යතාවය තක්සේරු කරන ලදී. ඉන්පසු කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට ඇණවුම් ලබා දී ඩෙස් බංකු දහම් පාසල් වෙත ලබා දෙන ලදී.

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. එහි ප්‍රධානම ව්‍යාපෘතියක් වශයෙන් නර්තන හා සංගීත කණ්ඩායම පුහුණු කිරීම දැක්විය හැකිය. මේ තුළින් නර්තන හා සංගීත අංශවලට දක්ෂතාවයක් දක්වන ශිල්පීන්ට එම ක්ෂේත්‍රය පිළබඳ පූර්ණ අවබෝධයක් ලබාගත හැකිය. එසේම කණ්ඩායම් දෙකේ ශිල්පීන් පළාතේ පවත්වනු ලබන  උත්සව සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව සැලසේ. එම ශිල්පීන්ට මේ තුළින් ආදායම් උපයා ගැනීමට අවස්ථාව සැලසේ. මෙමගින් උතුරු මැද පළාතේ වයස අවුරුදු 18-30 ත් අතර රැකියාවක නියුක්ත නොවන සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් අඩුවනු ඇත. සංස්කෘතිය, සංචාරක කර්මාන්තය හා නිරන්තරයෙන් සමගාමීව ගමන් කරන විෂය පථය දෙකක් බව තේරුම් ගනිමින් සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා පළාතේ ක්‍රියාත්මක කරන වැඩසටහන්  සඳහා නර්තන හා සංගීත කණ්ඩායම දායකත්වය ලබා දීම තුළින් සංචාරක කර්මාන්තයේ දියුණුව මෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ රැකියාවන්වල යෙදීම තුළින් ආදායම් උපයා ගැනීමේ මූලික වැඩසටහන් කිහිපයක් 2019 වර්ෂයේ ක්‍රියාත්මක විය.

ලෝකයේ  සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කරගැනීම  සඳහා උතුරු මැද පළාතේ පවත්වනු ලබන සාම්ප්‍රදායික උත්සව සඳහා ආධාර ලබා දීම සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙහිදී ප්‍රදේශයේ පවත්වනු ලබන සාම්ප්‍රදායික උත්සව අඛණ්ඩව පවත්වාගෙන යාම අපේක්ෂා කරයි. එසේම පෙරහැර සංස්කෘතිය ආරක්ෂාකර ගැනීම සඳහාද දායකත්වය ලබා දීම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙහි ප්‍රතිලාභය උතුරු මැද පළාතේ ජනතාවට පමණක් නොව සියළු ශ්‍රී ලාංකිකයන්ට හා විදේශීය සංචාරකයන්ට ලැබෙනු ඇත.

එසේම සාම්ප්‍රදායික සංස්කෘතික අංගයන් මතු පරපුරට දායාද කිරීම සඳහා පළාත් කලා උළෙල පැවැත්වීමද දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙහිදී සාම්ප්‍රයික නර්තන හා සංගීත අංග තරඟ සඳහා ඇතුළත් කර ඇත. මේ තුළින් වර්තමාන පරම්පරාව සාම්ප්‍රදායික නර්තන හා සංගීත අංග වෙත  යොමු කරවීම  අපේක්ෂා කරයි.

දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන කලා ප්‍රසංග ව්‍යාපෘතිය මඟින්ද සාම්ප්‍රදායික කලා අංග ජනතාවට නැරඹීමට අවස්ථාව සලසා ඇත. ඒ අනුව පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව උතුරු මැද පළාතේ ආගමික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම තුළින් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට දායක වී ඇත.

## කාර්ය සාධනය ඉලක්ක කරා ළඟා වීම

| අ. අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක සංඛ්‍යාව | | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 01 | භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක් | ආධාර ලබා දුන් දහම් පාසල් සංඛ්‍යාව | 50 | 100 | 3.993 | 3.993 |
| | | පුහුණුව ලැබූ දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව | | 2500 | 1.999 | 2.00 |
| 02 | දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමේ කාර්යක්ෂම ක්‍රම වේදයක් සකස් කිරීම | කලා උළෙලට ඉදිරිපත් වන තරඟකරුවන් සංඛ්‍යාව | 1500 | 1800 | 6.087 | 6.5 |
| | | කලා උළෙලට ඉදිරිපත් වන නව නිර්මාණ සංඛ්‍යාව | 5 | 8 | | |
| | | 2018 වසරේ කලා උළෙලේ ජයග්‍රාහී ගීත නිර්මාණ හා සාහිත්‍ය කෘති එළි දැක්වීම | 0 | 20 | | |
| | | අළුතින් හදුනාගත් ලේඛකයන් සංඛ්‍යාව | 18 | 25 | 1.29 | 2.00 |
| | | සඟරාව සඳහා ලැබෙන ලිපි සංඛ්‍යාව | 75 | 100 | | |

| අ. අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක සංඛ්‍යාව | | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 03 | උසස් කලා නිර්මාණ බිහි කිරීමට දායක වීම | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 8 | 3 | 1.165 | 2.00 |
| | | ශිල්පීන් සංඛ්‍යාව | 900 | 1200 | | |
| | | පෙරහැර සඳහා පුහුණු කරන ලද ශිල්පීන් සංඛ්‍යාව | 0 | 150 | | |
| 04 | පළාතේ ආගමික පුනර්ජීවනයට සහය වීම | ආධාර ලබා දෙන පෙරහැර හා අනෙකුත් ආගමික උත්සව සංඛ්‍යාව | 15 | 25 | 2.562 | 5.00 |
| | | අධාර ලබා දෙන ආගමික සිද්ධස්ථාන සංඛ්‍යාව | 50 | 20 | 1.4 | 5.00 |
| 06 | උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම | පවත්වන ලද කලා ප්‍රසංග සංඛ්‍යාව | 8 | 10 | 1.375 | 2.00 |
| | | නැරඹීමට පැමිණි ප්‍රේක්ෂක සංඛ්‍යාව | 3000 | 4500 | | |
| 07 | ආයතනික ධාරිතා සංවර්ධනය | මිලදී ගත් කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරන ප්‍රමාණය | 7 | 9 | 7.039 | 1.00 |
| | | ලැබෙන සේවක පැමිණිලි සංඛ්‍යාව | 5 | 3 | | |
| | | මිලදී ගත් නර්තන භාණ්ඩ සංඛ්‍යාව | 15 | 05 | 0.093 | 0.5 |
| | | කාර්යාල පරිශ්‍රය පිළිබඳ බාහිර පාර්ශවයෙන් ලැබෙන යහපත් ප්‍රතිචාර | 06 | 10 | 2.602 | 10.0 |

## කාර්ය සාධන ඉලක්ක 2017 - 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක් | ආධාර ලබා දුන් දහම් පාසල් සංඛ්‍යාව | 100 | 50 | 100 |
| 02 | දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමේ කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම (කලා උළෙල හරහා) | ඉදිරිපත්වන තරඟකරුවන් සංඛ්‍යාව | 1500 | 1800 | 2000 |
| | | ඉදිරිපත්වන නව නිර්මාණ සංඛ්‍යාව | 3 | 5 | 8 |
| | | නව ලේඛකයන් සංඛ්‍යාව | 5 | 18 | 25 |
| | | සඟරාව සඳහා ලැබෙන ලිපි සංඛ්‍යාව | 60 | 73 | 90 |
| 03 | උසස් කලා නිර්මාණ බිහි කිරීම සඳහා දායක වීම | පවත්වනු ලබන පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 3 | 8 | 3 |
| | | සහභාගීවන ශිල්පීන් සංඛ්‍යාව | 600 | 3000 | 720 |
| 04 | අඛණ්ඩව පවත්වාගෙන හා සංස්කෘතික සංරක්ෂණය කිරීම. | පවත්වනු ලබන පූජා කර්ම සංඛ්‍යාව | 0 | 5 | 0 |
| | | නරඹන ප්‍රේක්ෂක සංඛ්‍යාව | 0 | 3000 | 0 |
| 05 | පළාතේ ආගමික පුනර්ජීවනය වෙනුවෙන් සංවර්ධන කාර්යන් ඉටු කිරීම. | අධාර ලබා දෙන පෙරහැර සංඛ්‍යාව | 10 | 15 | 18 |
| | | ආධාර ලබා දෙන ආගමික හා සංස්කෘතික උත්සව සංඛ්‍යාව | 5 | 12 | 16 |
| | | ආධාරදුන් ආගමික ස්ථාන සංඛ්‍යා | 50 | 50 | 60 |
| 06 | උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම. | පවත්වන ලද කලා ප්‍රසංග සංඛ්‍යාව | 04 | 6 | 8 |
| | | නැරඹීමට පැමිණි ප්‍රේක්ෂක සංඛ්‍යාව | 1600 | 1800 | 2300 |
| 07 | ආයතනික ධාරිතා සංවර්ධනය. | මිලදීගත් කාර්යාල උපකරණ ප්‍රමාණය | 5 | 7 | 9 |
| | | ලැබෙන සේවක පැමිණිලි සංඛ්‍යාව | 12 | 8 | 5 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2019

| ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන්කල මුදල (රු.මි) | වැයකල මුදල (රු.මි) |
|---|---|---|---|
| **01.අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්** | | | |
| දහම් පාසල් සංවර්ධන | උතුරු මැද පළාතේ දහම්පාසල්වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ විම අපේක්ෂාව විය . මේ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දහම් පාසල් 49 ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දහම් පාසල් 14 ක් සඳහා අවශ්‍ය ඩෙස් බංකු ලබා දෙන ලදී. | 4.00 | 3.993 |
| දහම් පාසල් ගුරු පුහුණුව | දහම් පාසල් ගුරුවරුන්ගේ ආකල්ප වර්ධනය තුළින් යහපත් සමාජයක් බිහිකිරීම | 2.00 | 1.993 |
| **02.දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමේ කාර්යක්ෂම ක්‍රම වේදයක් සකස් කිරීම** | | | |
| උතුරු මැද කළා උළෙල | උතුරු මැද පළාතේ කලාකරුවන්ගේ දක්ෂතා එළි දැක්වීම හා ප්‍රාදේශීය ශිල්පීන් ජාතික තලයට රැගෙන යාම මෙහි අපේක්ෂිත ප්‍රතිඵලය වේ. මෙමගින් අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කය ආවරණයවන පරිදි චිත්‍ර ,නැටුම්, සංගීත, සාහිත්‍ය, නාට්‍ය, කෙටි චිත්‍රපටි, ඡායාරූප ආදී ක්ෂේත්‍රයන්ගෙන් තරඟ පවත්වන ලදී. | 6.087 | 6.085 |
| **03.උසස් කලා නිර්මාණ බිහි කිරීම බිහි කිරීම සඳහා දායක වීම** | | | |
| පුහුණු වැඩමුළු පැවැත්වීම | පළාතේ කලායතන සියළුම කලාකරුවන්ගේ දැනුම අවබෝධය වර්ධනය කර ගැනීම හා ජාතික තලයට රැගෙන යා හැකි නිර්මාණ පළාත තුළ බිහි කිරීම අපේක්ෂාව විය. | 1.165 | 1.161 |
| සුභාෂණ සංස්කෘතික සඟරාව අටවන කලාපය ප්‍රකාශයට පත් කිරීම | උතුරු මැද පළාත තුළ විසිරී සිටින ලේඛකයන්ගේ ලේඛන හැකියාව වර්ධනය කිරීම සඳහා සහ උසස් නිර්මාණ, පාඨකයා වෙත ඉදිරිපත් කිරීමේ අරමුණින් සුභාෂණ සංස්කෘතික සඟරාවේ අටවන කලාපය ප්‍රකාශයට පත් කෙරුණි. | 0.13 | 0.129 |
| **04.ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක් බිහි කිරීම** | | | |
| කලායතන ධාරිතා සංවර්ධනය | කලායතනවල භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම තුළින් උසස් නිර්මාණ බිහි කිරීමට දායක වීම. මේ යටතේ උතුරු මැද පළාත තුළ පවතින නර්තන කලායතන, සංගීත කලායතන, නාට්‍ය කලායතන සඳහා මූල්‍ය ආධාර ලබා දීම සිදු කරන ලදී | 0.85 | 0.85 |

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන්කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| **05.පළාතේ ආගමික පුනර්ජීවනය වෙනුවෙන් සංවර්ධන කාර්යන් ඉටු කිරීම** | | | |
| ආගමික කටයුතු | අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන ආගමික හා සාම්ප්‍රදායික උත්සව හා පෙරහැර සඳහා ආධාර ලබාදීම තුලින් ආගමික පුනර්ජීවනය ඇති කිරීම හා පළාතේ දුෂ්කර ආගමික සිද්ධස්ථාන සඳහා ආධාර ලබා දීම තුළින් ආගමික සිද්ධස්ථාන සංවර්ධනය අපේක්ෂා කෙරුණි. | 4.00 | 3.962 |
| **06.උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම** | | | |
| කලා ප්‍රසංග පැවැත්වීම | ප්‍රදේශයේ ජනතාවට උසස් රසවින්දනයක් ලබා දීම හා ජාතික තලයේ නිර්මාණ ප්‍රදේශයේ සාමාන්‍ය ජනතාවට නැරඹීමට සැලැස්වීම අපේක්ෂාව විය. | 1.275 | 1.274 |
| **07.ආයතනික ධාරිතා සංවර්ධනය** | | | |
| ගෘහ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | දෙපාර්තමේන්තු සේවකයන්ට තම කාර්යන් කාර්යක්ෂමව ඉටුකර ගැනීමට හැකිවීම තුළින් සේවක අභිප්‍රේණය ඇති කිරීම | 0.85 | 0.703 |
| සුරපුර සංවර්ධන ව්‍යාපෘතිය | කාර්යාලයේ ඉදිරිපස ගේට්ටුව සහ අවට භූමය සකස් කිරීම මඟින් ක්‍රමවත් කාර්යාල පරිසරයක් ගොඩ නැගීම අපේක්ෂාව විය. | 4.00 | 2.602 |
| නර්තන හා සංගීත භාණ්ඩ මිලදී ගැනීම | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන නර්තන හා සංගීත කණ්ඩායමේ භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම තුළින් මෙම කණ්ඩායම් දෙකෙහි සේවය ලබා ගන්නා බාහිර පාර්ශවයන්ට වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දීම අපේක්ෂාව විය. | 0.093 | 0.093 |

**තම ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අදහස් හා යෝජනා**

සංස්කෘතියට ගරු කරන සාරධර්ම සපිරි සමාජයක් , සෞභාග්‍යමත් පළාතක් බිහි කරීම ප්‍රධාන දැක්ම කර ගනිමින් එම දැක්ම කරා ළඟා වීමට 2020 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

අපේ රටේ කාලාන්තරයක් තිස්සේ පැවැති සිරිත් විරිත් ආචාර ධර්ම, පාරම්පරික කලා සම්ප්‍රදායන් රැසක් ක්‍රමයෙන් සමාජයෙන් ඈත් වී යන තත්ත්වයක් උද්ගත වී ඇත. විවිධ ජනමාධ්‍ය ඔස්සේ ක්‍රියාත්මක වන විජාතික සංස්කෘතික වැඩසටහන් නිසා ඉහත කී සංස්කෘතික ලක්ෂණ දක්නට නොලැබීම හේතුවෙන් කාලයක් ගතවන විට අපේ උරුමය අපේ සමාජය තුළ ඉතිරි නොවනු ඇත.

සෞභාග්‍යමත් පළාතක් බිහි වීමට නම් පළාතේ ජනතාවගේ මානසික සංවර්ධනය ඇති කළ යුතුය. ඒ සඳහා කලාව මහඟු මෙහෙයක් ඉටු කරයි. ඒ තුළින් ජනතාවගේ සිත් සතන් තුළ ඊර්ෂ්‍යාව, වෛරය, ද්වේෂය වැනි අගතිගාමී සිතුවිලි ප්‍රහීනව ගොස් අධ්‍යාත්මක වර්ධනයක් ඇති වී සමාජය වඩාත් යහපත් කිරීම සඳහා අවස්ථාව සැලසේ.

ඒ අනුව පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් කලාවේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් 31 වන උතුරු මැද කලා උළෙල 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙමගින් උතුරු මැද පළාත තුළ විසිරී සිටින දක්ෂ කලාකරුවන්ට අතහිත දෙමින් ඔවුන්ගේ නිර්මාණ හා දක්ෂතා එළි දැක්වීම, සුරක්ෂිත කිරීම ප්‍රවර්ධනය කිරීම මෙමගින් සිදුවේ. 2020 වර්ෂයේ කලා උළෙලට සමගාමීව මේ දක්වා ජයග්‍රහණය කරන ලද ගීත නිර්මාණ ඇතුළත් සී.ඩී තැටියක් එළි දැක්වීමට නියමිතය. එසේම කලා කරුවන්ගේ නිර්මාණ හැකියාව වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට නියමිතය.මේ සඳහා ජාතිත තලයේ සම්පත්දායකයන් යොදා ගනු ලබයි.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය විදහාපාන ප්‍රධාන ඓතිහාසික පුරවරය අනුරාධපුර රාජධානියයි. දන්ත ධාතුන් වහන්සේගේ පූජෝපාහරයක් වශයෙන් වාර්ෂිකව පවත්වනු ලබන දළදා පෙරහැර 2020 වර්ෂයේදී පැවැත්වීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. ඈත අතීතයේ සිටම උතුරු මැද පළාතේ ආගමික හා සංස්කෘතික උත්සව පවත්වන අතර ඒ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. එසේම ආගමික කටයුතු ව්‍යාපෘතිය යටතේ පළාතේ දුෂ්කර ආගමික සිද්ධස්ථාන සඳහා අනුග්‍රහය දැක්වීම සිදු කරයි.

ආයතනයේ දැක්ම කරා ළඟා වීම සඳහා අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි දහම් පාසල් පද්ධතියක් සහ දැනුම ආකල්ප කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක් නිර්මාණය කරගත යුතුව ඇත. මේ සඳහා දුෂ්කර ප්‍රදේශවල පවතින දහම් පාසල්වල පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. එසේම දහම් ගුරුවරුන්ගේ දැනුම ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා දහම් පාසල් ගුරු පුහුණු ව්‍යාපෘතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පැවැත්වීමට දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

කලා නිර්මාණ වෙත ප්‍රේක්ෂකයන් වැඩි පිරිසක් සහභාගී කරමින් වින්දනීය ජනතාවක් බිහි කිරීම දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වේ . ඒ සඳහා ඉපැරණි සාම්ප්‍රදායික කලා නිර්මාණ ජනතාවට අත් විඳීමට අවස්ථාව සලසා දීම මෙන්ම උතුරු මැද පළාතේ දුෂ්කර පාසල් සිසුන්ට හා කලා කරුවන් වෙත ජාතික තලයේ නිර්මාණ වෙත ප්‍රේක්ෂකයා හුරු කිරීම හා කලා ක්ෂේත්‍රය වෙත ඔවුන් යොමු කිරීම කලා ප්‍රසංග ව්‍යාපෘතිය තුළින් 2020 වසරේ අපේක්ෂා කරයි.

උතුරු මැද පළාත තුළ දැනුමෙන් පිරිපුන් පාඨක පිරිසක් බිහි කිරීම සඳහා උතුරු මැද පළාතේ ලේඛකයන්ගේ නිර්මාණ ඇතුළත් කරමින් සුභාෂණ සඟරාවේ දසවන කලාපය 2020 වර්ෂයේදී එළි දැක්වීමට නියමිතය. එසේම ප්‍රදේශයේ අප්‍රකට ස්ථානයන්හි තොරතුරු ඇතුළත් කරමින් සංස්කෘතික උරුමයන් පිළිබඳ පර්යේෂණ කෘතියක් 2020 වර්ෂයේදී එළි දැක්වීමට නියමිතය.

2020 වර්ෂයේදී සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් සංස්කෘතික හුවමාරු වැඩසටහන් 02 ක් පැවැත්වීමට නියමිත ය. මෙය දේශීය හා විදේශීය වශයෙන් පැවැත්වීමට අපේක්ෂා කරයි. මෙමගින් දේශීය සංස්කෘතික අංග ජාත්‍යන්තර තලයට රැගෙන යාම තුළින් සංචාරක ආකර්ෂණය ඇති කිරීම ප්‍රධාන අපේක්ෂාව වේ.

ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ දැක්ම කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

**ආයතනයේ සහ අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.**

| ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|
| 2020 | 2021 | කෙටි කාලීන | දිගු කාලීන |
| **01. භෞතික සම්පත් සහිත දැහම් පාසල් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්** | | | |
| දහම් පාසල් 100<br><br>දහම් පාසල් ගුරුවරුන් 2000 ක් පුහුණු කිරීම | දහම් පාසල් 100<br><br>දහම් පාසල් ගුරුවරුන් 2500 ක් පුහුණු කිරීම | දහම් පාසල්වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම<br>උතුරු මැද පළාත තුළ විසිරී පවතින දහම් පාසල්වල ඉගැන්වීම් කටයුතුවල නිරතව සිටින දහම් පාසල් ගුරුවරුන්ගේ කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම | දහම් අධ්‍යාපනයට සිසුන් වැඩි වශයෙන් යොමු වීම තුළින් ගුණ ගරුක සමාජයක් ගොඩ නැගීම<br><br>වඩා යහපත් හා ක්‍රමවත් අධ්‍යාපනයක් පළාතේ දහම් පාසල් සිසුන්ට ලබා දීම |
| **02.දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමේ කාර්යක්ෂම ක්‍රම වේදයක් සකස් කිරීම** | | | |
| කලා උළෙල 01 | කලා උළෙල 01 | පළාතේ කලා කරුවන්ගේ නිර්මාණ එළි දැක්වීම | ප්‍රාදේශීය නිර්මාණ ජාතික තලයට රැගෙන යාම |
| ජයග්‍රාහී නිර්මාණ ඇතුලත් සී.ඩී තැටියක් හා සාහිත්‍ය නිර්මාණ එළි දැක්වීම | නිර්මාණ ඇතුලත් සී.ඩී තැටියක් හා සාහිත්‍ය නිර්මාණ එළි දැක්වීම | ප්‍රාදේශීය වශයෙන් නිර්මාණ ඇගයීමට අවස්ථාව සැලසීම | උසස් කලා නිර්මාණ බිහිවීමට අත්වැලක් සැපයීම |
| සුභාෂණ සංස්කෘතික සහරාවේ පිටපත් 600 ක් මුද්‍රණය කිරීම | සුභාෂණ සහරාවේ පිටපත් 750 ක් මුද්‍රණය | පළාතේ ලේඛකයෙන්ගේ හැකියාවන් හා දක්ෂතා ඔප් නැංවීම | උතුරු මැද පළාත තුළ දැනුමෙන් පිරිපුන් පාඨක පිරිසක් බිහි කිරීම |
| පුහුණු වැඩ සටහන් 03 ක් පැවැත්වීම | පුහුණු 05 ක් පැවැත්වීම | කලා කරුවන්ගේ හැකියාවන් වර්ධනය වීම | පළාත තුළ ගුණාත්මකභාවයෙන් යුතු නිර්මාණ බිහි වීම |
| ප්‍රාදේශීය වශයෙන් පුහුණු මධ්‍යස්ථාන 10 ක් ඇති කිරීම | ප්‍රාදේශීය වශයෙන් පුහුණු මධ්‍යස්ථාන 10 ක් ඇති කිරීම | ප්‍රාදේශීයව විසිරී සිටන කලා කරුවන්ට තම ප්‍රදේශයේම පුහුණුවට අවස්ථාව සැලසීම | නිරන්තර පුහුණුව තුළින් උසස් නිර්මාණ බිහි වීම |
| **03.පළාතේ ආගමික පුනර්ජීවනය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම** | | | |
| ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | උතුම් දළදා වහන්සේට අනුරාධපුරයේ ජනතාවට පූජෝත්සවය පැවැත්විය හැකි වීම | පෙරහැර සංස්කෘතිය අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට හැකි වීම |
| ප්‍රදේශයේ පවතින ආගමික උත්සව 20ක් සඳහා අනුග්‍රහය දැක්වීම | ආගමික උත්සව 25 ක් සඳහා අනුග්‍රහය දැක්වීම | අවස්ථානුකූලව සිදු කළ යුතු ආගමික උත්සව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සැපයීම | පළාතේ ආගමික උත්සව අඛණ්ඩව පවත්වාගෙන යාමට සහය වීම |
| ආගමික සිද්ධස්ථාන 50ක් සංවර්ධනය කිරීම | ආගමික ස්ථාන 60ක් සංවර්ධනය කිරීම | ආගමික සිද්ධස්ථානවල භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම | පළාතේ ආගමික පුනර්ජීවනයට අවස්ථාව සැලසීම |
| **04.උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම** | | | |
| කලා ප්‍රසංග 10ක් පැවැත් වීම | කලා ප්‍රසංග 12ක් පැවැත්වීම | වින්දනීය ජනතාවක් බිහි කිරීම | ජාතික තලයේ නිර්මාණ රස විඳීමට අවස්ථාව සැලසීම |
| **05.පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාම හා සංස්කෘතික සංරක්ෂණය සිදු කිරීම** | | | |
| පළාතේ සාම්ප්‍රදායික උත්සව හා ජාතික උත්සව 10 ක් පැවැත්වීම | පළාතේ සාම්ප්‍රදායික හා ජාතික උත්සව 12 ක් පැවැත්වීම | පළාතේ සාම්ප්‍රදායික උත්සව හා ජාතික උත්සව පිළිබද ජනතාව තුල උනන්දුවක් ඇති කිරීම | පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාමට දායකත්වය සැපයීම |
| දේශීය හා විදේශීය සංස්කෘතික හුවමාරු වැඩ සටහන් 02 ක් පැවැත්වීම | දේශීය හා විදේශීය සංස්කෘතික හුවමාරු වැඩ සටහන් 04 ක් පැවැත්වීම | ප්‍රදේශයට ආවේනික සංස්කෘතිකාංග අනෙකුත් ප්‍රදේශවලට හා වෙනත් රටවලට ව්‍යාප්ත කිරීම තුලින් සංචාරක ව්‍යාපාරයේ දියුණුව සඳහා දායක වීම | වියැකී යන සාම්ප්‍රදායික කලා නිර්මාණ සංරක්ෂණයට, තරුණයන් සඳහා ආදායම් මාර්ග උත්පාදනය හා සංචාරක ප්‍රවර්ධනයට දායක වීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට 2019 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් රු.මි. 16 ක් මූලධන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට ලැබී තිබිණි. එයින් 15% ක් එනම්, රු.මි. 2.4 ක මුදලක් අවුරා තබන ලදී. ඉතිරි මුදලින් රු.මි 12.19 ක මුදලක් ව්‍යාපෘති සඳහා වියදම් දරා ඇත. ඒ අනුව සමස්ත උපයෝජනය 91% කි. 610 වැය ශීර්ෂය යටතේ රු.මි10.00 ක මූලධන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට වෙන් කර තිබිණි. එයින් රු.මි 9.995 ක මුදලක් වියදම් දරා තිබිණි. ඒ අනුව උපයෝජනය 9.95%කි. එසේම පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි. 1.00 ක මුදලක් ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කර තිබිණි. එයින් 0.15 මුදලක් අවුරා තබා ඇත. ඒ අනුව පළාත් සභා සංවර්ධන ප්‍රදානයන්හි සමස්ත උපයෝජනය 83% කි.

2019 වර්ෂයේදී කලා උළෙලට සමගාමීව 2018 වසරේ ජයග්‍රාහී ගීත රචකයින් විසින් රචිත ගීත 16 ක් ඇතුලත් සී.ඩී තැටියක් එළි දැක්වීමට දෙපාර්තමේන්තුවට හැකි විය. මේ සඳහා පළාත් සංගීත කණ්ඩායමේ ශිල්පීන් ගායකයන් සහ සංගීතයෙන් ප්‍රවීණ ශිල්පීන් සමඟ එම සී.ඩී. තැටිය සඳහා විය. ජාතික තලයේ කලාකරුවන්ගේ සහභාගීත්වය සමඟ කණ්ඩායමට ලද එම ප්‍රශස්ත අත්දැකීම තවදුරටත් ඔවුන් ජාතික තලය හා සම කිරීමට සුදුසුකම් ලැබූ අවස්ථාවක් විය.2018 වර්ෂයේ ජයග්‍රහණය කරන ලද සාහිත්‍ය නිර්මාණ දෙපාර්තමේන්තු මැදිහත් වීම තුළින් සරසවි වැනි ප්‍රසිද්ධ ග්‍රන්ථ ප්‍රකාශන ආයතනයක් මගින් මුද්‍රණයට අවස්ථාව සලසන ලදි. මෙම සියළු අවස්ථා උතුරු මැද පළාතේ කලාකරුවන්ට ආදායම් උත්පාදන අවස්ථා බවට පත්විය.

2019 වර්ෂයේදී අනුරාධපුර හා පොළොන්නරු යන දිස්ත්‍රික් දෙකම ආවරණය වන පරිදි බෞද්ධ හා කතෝලික දහම් පාසල් ගුරුවරුන්ට පුහුණු වැඩසටහන් පැවැත්විය. මේ සඳහා ගුරුවරුන් 2500කට අධික පිරිසක් සහභාගී විය.

2019 වර්ෂයේ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද උතුරු මැද පළාත් කලා උළෙල, කලා ප්‍රසංග ව්‍යාපෘතිය, පුහුණු වැඩමුළු ව්‍යාපෘතිය, සුභාෂණ සහරාව, කලායතන ධාරිතා සංවර්ධනය, නර්තන හා ගායන හැකියා වර්ධනය, දහම් පාසල් ගුරු පුහුණුව,ආගමික කටයුතු, දහම් පාසල් සංවර්ධනය, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම යන සියළු ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමට හැකි විය. ඒ අනුව සමස්තයක් වශයෙන් සියළු ව්‍යාපෘති සාර්ථකව නිම කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

# 6.4. සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු :

1990 අංක 11 දරණ උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ වූ ප්‍රඥප්තියට අනුකූලව උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන්නාවූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස හැඳින්විය හැකිය. 1990 මැයි මස 01 දින එවකට හිටපු පළාත් ප්‍රධාන අමාත්‍ය පී. ඩී මහින්ද සෝම මහතා විසින් ග්‍රාමීය මාර්ග සංවර්ධන කටයුතු සඳහා මෙම ආයතනය ආරම්භ කර ඇත.
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වැඩපළක් ලෙස නැවත මෙම පරිශ්‍රය පළාත් සභාව වෙත පවරා ගනිමින් අනතුරුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය නමින් ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී මෙම ආයතනය මගින් පළාතේ කෘෂිකාර්මික , වාරිමාර්ග, මහාමාර්ග ඉදිකිරීම්, ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කිරීම වාහන සහ යන්ත්‍ර/සූත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරීම මෙන්ම පළාතේ මුල් පෙළේ මුද්‍රණාලයක්ද මෙම ආයතනය සතුව ඇත. ඒ අනුව ගුණාත්මකභාවයෙන් සහ කාර්යක්ෂම ලෙස අඩු පිරිවැයක් යටතේ අවශ්‍ය මුද්‍රණ ඇණවුම් ලබාදීමේ හැකියාවක් ආයතනය සතුව ඇත.
වර්ෂ 2017 අවසාන භාගයේදී එවක පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ පේශල ජයරත්න බංඩාර මැතිතුමාගේ සංකල්පය අනුව ආරම්භ කරන ලද උතුරු මැද පළාත් සභා ආරක්ෂක ඒකකයද මෙම ආයතනය හරහා ක්‍රියාත්මක වේ. මේ වනවිට රැකියා විරහිත තරුණ තරුණියන් සියයකට ආසන්න ප්‍රමාණයක් සේවා නියුක්තව සිටි. එයද පළාතේ සේවා වියුක්තියට විසඳුමක් හා ජනතාවගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට පිටුවහලක් ලෙස හැඳින්විය හැකිය.

## දැක්ම

"උතුරු මැද පළාත් සභාවේ ඉලක්කගත අරමුණු හා අපේක්ෂාවන් සපුරා ගැනීම සඳහා සහයවන ප්‍රමුඛ ආයතනයක් බවට පත් වීම හා පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත් වීම".

## මෙහෙවර

"ඉදිකිරීම් කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ කුලි පදනම මත සැපයීම, යන්ත්‍ර වාහන අළුත්වැඩියා කටයුතු, සේවා කටයුතු සිදුකිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හී මුද්‍රණ කටයුතු සහ වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා සක්‍රීයව දායකවීම සහ යම් නිර්මාණ කටයුක්තක් හෝ සේවා සැපයීමක් උපරිම ඵලදායිතාවයෙන් හා කාර්යක්ෂමව සිදුකිරීමේ අභිලාශය පෙරදැරිව උතුරු මැද පළාතේ ජනතාවගේ ආර්ථික අභිවෘද්ධිය සඳහා සක්‍රීයව දායක වීම".

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත් වීම සඳහා කටයුතු කිරීම.
- පළාත් සභාවට බහුවිධ සේවාවන් සපයන ආයතනයක් බවට පත් කිරීමේ අරමුණින් මුද්‍රණ, යාන්ත්‍රික හා සේවා අංශයන්ගෙන් ලබා දෙන සේවාවන් පුළුල් කිරීම තුළින් උතුරු මැද පළාත තුළ ප්‍රමුඛතම සේවා සපයන ආයතනයට පත්වීම
- විවිධ අංශ කෙරෙහි වෙන්වෙන් වශයෙන් වූ පරිපූර්ණ දැනුම හා කුසලතාවයෙන් උසස් මානව සම්පතක් බිහි කිරීම තුළින් පළාතේ හදිසි ඕනෑම අවශ්‍යතාවයකදී දායක වීමට හැකිවන අයුරින් කටයුතු කිරීම.
- නවීන තාක්ෂණය හා කාර්යක්ෂමතාවයකින් ඉහළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහිත ආයතනයක් බවට පත්වීම තුළින් පළාත් සංවර්ධනයට දායක වීම.
- රජය විසින් ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා එමගින් රජය විසින් අපේක්ෂා කරන අරමුණු ළඟා කිරීම සඳහා සක්‍රීයව දායකවන ආයතනයක් බවට පත් වීම.
- 

## කෙටිකාලීන අරමුණු

- ❖ යාන්ත්‍රික, මුද්‍රණ හා සේවා අංශයන් සංවර්ධනය කිරීම සඳහා නව යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීම.
- ❖ සියළුම ඉදි කිරීම් හා යාන්ත්‍රික කටයුතු නිසි ප්‍රමිතියට හා කලට වේලාවට සිදු කර ගැනීම.
- ❖ පෞද්ගලික අංශය හා තරඟ කිරීමට හැකිවන පරිදි මුද්‍රණ අංශය සංවර්ධනය කිරීම.
- ❖ යන්ත්‍ර වාහන කුලී පදනම මත ලබාදීම තුළින් ආදායම් තත්වය වර්ධනය කිරීමටකටයුතු කිරීම.
- ❖ වාහන සේවා අංශ මගින් අවම මිලට කඩිනම් සේවය.

## ප්‍රධාන කාර්යයන්


- ❖ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි මුද්‍රණ කටයුතු සිදු කිරීම.
- ❖ වාහන අළුත්වැඩියා හා සේවා කටයුතු.
- ❖ ටයර් සේවා කටයුතු සිදු කිරීම.
- ❖ උතුරු මැද පළාත තුළ විශේෂ ව්‍යාපෘති සඳහා දායක වීම.
- ❖ යන්ත්‍ර කුලී පදනම මත ලබා දිම.
- ❖ පළාත් සභාවට හා අනුයුක්ත රාජ්‍ය ආයතනයන්ට ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා සැපයීම.
- ❖ ආපදා කටයුතුවලදී ජංගම සේවාවන් පැවැත්වීම.
- ❖ ප්‍රායෝගික පුහුණු හා උපදේශන කටයුතු සපයමින් සම්පත්දායකයෙකු ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මුද්‍රණ අංශය මගින් කරනු ලබන සියළුම මුද්‍රණ කටයුතු සඳහා නිසි ප්‍රමිතියට අනුව නියමිත වේලාවට ලබා දීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර උපයෝගි කර ගැනීම.
- ❖ යන්ත්‍ර/වාහන කුලියට දීමෙන් ලැබෙන ආදායම් වැඩිකර ගැනීම සඳහා වැඩි වශයෙන් රාජ්‍ය හා පුද්ගලික අංශයන් වෙත යන්ත්‍ර/වාහන සැපයීම අරමුණකි.
- ❖ වාහන සේවා අංශය මගින් අවම මිලට කඩිනමින් සේවාවන් ලබා දීම.
- ❖ ආයතනයේ පළපුරුදු කාර්යක්ෂම කාර්මිකයින් ලවා වාහන අළුත්වැඩියා කිරීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම.
- ❖ සියළුම ඉදි කිරීම් හා වෙනත් ව්‍යාපෘති කටයුතු නිසි ප්‍රමිතියට අනුව කලට වේලාවට සිදුකර ගැනීම.
- ❖ ඉහත ප්‍රධාන කාර්යයන්වලට අදාලව දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලබා ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ සහාය ලබා ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 58 |
| 2 | සේවයේ නියුතු | 58 |
| 3 | පුරප්පාඩු | 02 |
| 4 | අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් | 07 |
| 5 | ආයතනයට ස්ථිර සේවක සංඛ්‍යාව | 07 |
| **එකතුව** | | **74** |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. පුද්ගල පඩිනඩි | 36.56 | 35.27 | 1.29 | 96.47 |
| **එකතුව** | **36.56** | **35.27** | **1.29** | **96.47** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 1.05 | 0.82 | 0.23 | 78.09 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 15.00 | 1.31 | 13.69 | 8.73 |
| වාහන | 1.00 | 1.14 | -0.14 | 114 |
| **එකතුව** | **17.05** | **3.27** | **13.78** | **19.18** |

## ආදායම් ඉපයීම - 2019

| ශීර්ෂය | ඉලක්කය(රු.මි) | සත්‍ය ආදායම(රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය(%) |
|---|---|---|---|
| මුද්‍රණාල ආදායම | 80.00 | 89.60 | 112.00 |
| යන්ත්‍ර කුලී ආදායම | 7.50 | 1.91 | 25.47 |
| වාහන අළුත්වැඩියාව | 3.00 | 1.78 | 59.33 |
| සේවා අංශය | 4.00 | 4.48 | 112.00 |
| ටයර් සේවා ආදායම | 5.00 | 0.30 | 6.00 |
| ආරක්ෂක සේවය වෙනත් ඉපයීම් | 40.00 | 36.79 | 91.67 |
| **එකතුව** | **139.50** | **134.86** | **96.67** |

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති ප්‍රගතිය.


### මුද්‍රණ අංශය මගින් කරන ලද ආදායම් උත්පාදන කටයුතු - 2019

| අ/ අං | ආයතනය | අරමුණ ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | වටිනාකම (රු.මි) |
|---|---|---|---|
| 01. | මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය | 01.වසරේ සෑම මසකම මුද්‍රණය කරන ටික්කි ටිකිරි පුවත් පත | 10.24 |
| 02 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2018 මධ්‍ය වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය. | 27.08 |
| | | 2018 අවසාන වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය. | 27.62 |
| | | ප්‍රතිප්‍රබෝධා ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය | 2.45 |
| | | දින පොත් සහ ක්ෂේත්‍ර සටහන් පොත් මුද්‍රණය. | 0.37 |
| | | කාර්යය පත්‍රිකා හා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය | 12.36 |
| | | ඇසළ මල් පොත් මුද්‍රණය | 2.07 |
| 03 | කළමණාකරන පුහුණු ඒකකය | පොත් මුද්‍රණය. | 0.14 |
| 04 | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | ආකෘති පත්‍ර මුද්‍රණය | 0.25 |
| 05 | ප්‍රධාන අමාත්‍යාංශය | නාම පුවරු | 0.47 |
| 06 | රජරට විශ්ව විද්‍යාලය | සහතික පත්‍ර මුද්‍රණය | 0.43 |
| 07 | ප්‍රධාන ලේකම් කාර්යාලය | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ පොත් | 0.13 |
| 08 | සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | ලදු පොත් | 0.38 |
| 09 | මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය | මගී ටිකට්පත් මුද්‍රණය | 0.28 |

## සේවා අංශය ආදායම් උත්පාදන කටයුතු - 2019

වර්ෂ 2019 දී සේවා අංශය ඉහළ ප්‍රගතියක් ළඟා කරගෙන තිබෙන අතර ආයතනය විසින් විශාල ආයෝජනයක්ද ඒ වෙනුවෙන් සිදු කර තිබේ.

| වර්ෂය | සේවා කළ වාහන ප්‍රමාණය | වටිනාකම (රු.මි) |
|---|---|---|
| 2018 | 143 | 2.39 |
| 2019 | 182 | 4.49 |




2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂය තුළ සේවා කළ වාහන ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහල ගොස් ඇති බව පෙනී යන අතර ඒ තුළින් ලද ආදායම ද ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි

## ආරක්ෂක අංශය උත්පාදන කටයුතු - 2019

වර්ෂ 2019 දී රාජ්‍ය ආයතන සමග ආරක්ෂක සේවාව සැපයුම සම්බන්ධව ගිවිසුම් ගත වීමට හැකිවිය.

| අනු අංකය | ආයතනය | ආරක්ෂක නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පළාත් සභා සංකීර්ණය | 14 |
| 02 | කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 05 |
| 03 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 02 |
| 04 | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 08 |
| 05 | ප්‍රධාන අමාත්‍යාංශය - සුරපුර | 02 |
| 06 | මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානය | 02 |
| 07 | පොළොන්නරුව අධ්‍යාපන කළාපය | 08 |
| 08 | හිඟුරක්ගොඩ අධ්‍යාපන කළාපය | 08 |
| 09 | දිඹුලාගල අධ්‍යාපන කළාපය | 08 |
| 10 | පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 01 |
| 11 | පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 02 |
| 12 | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 06 |
| 13 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 02 |
| 14 | පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව | 02 |
| 15 | මහ ඇමති නිළ නිවස | 04 |
| 16 | මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය | 02 |
| 17 | සැලසුම් දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කාර්යාලය | 02 |
| 18 | පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 08 |
| 19 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 02 |
| | **එකතුව** | **88** |

**2019** වර්ෂයේදී මූල්‍ය සමාලෝචනය පිළිබඳ අර්ථ දැක්වීමේදී 2018 වර්ෂයට සාපේක්ෂව ඉතා ඉහළ මූල්‍ය කාර්ය සාධනයක් කරා ආයතනය රැගෙන යාමටත් ආයතනය තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහාත් ක්‍රමානුකූල වූත් සැලසුම්සහගත වූත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී. ඒ තුළින් පෙර වර්ෂය හා සසඳා බලන විට යහපත් මූල්‍ය කාර්යසාධනයක් ළඟා කරගෙන ඇති බව පැහැදිළි විය.





එසේම වාර සේවා අංශය, ආරක්ෂක සේවා අංශය, මුද්‍රණ අංශය යන ප්‍රධාන අංශ ශක්තිමත් කරමින් ද ආයතනයේ සේවකයන් සියළු දෙනා ඒකාරාශිකර ගනිමින්ද මනා අභිප්‍රේරණයකින් යුතුව ආයතනයේ අභිමතාර්ථ සාධනය කරගැනීම වෙනුවෙන් කටයුතු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 වර්ෂයේ සමස්ත මෙහෙයුම් ආදායම ආසන්න වශයෙන් රු.මි. 134 ප්‍රමාණයක් විය.එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 4.1% ක වර්ධනයකි.

මෑත ඉතිහාසයේ ආයතනය විසින් ලබා ගත් ඉහළම ආදායම 2019වර්ෂයේදී ලබාගන්නා ලදි. එය පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත්වීමේ ආයතන දැක්ම සම්පූර්ණ කර ගැනීම සඳහා වූ පෙර සූදානමක් ලෙස හැඳින්විය හැකිය.

# 6.5.මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

**මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව සැකෙවින්...**

ළමා අවධිය, මානව සම්පත පසු කරනු ලබන සොඳුරුතම අවධියයි. ඒ සොඳුරු අවධිය පසු කරන කිසිවෙකුත් එම කාලය නිදහසේ භුක්ති වින්දේද හෝ භුක්ති විඳින්නට ඉඩ සලසා දෙන්නේ ද යන්න මහත් ගැටළුවකි. ළමා පරපුරට, වර්තමානය වනවිට අතීතයට වඩා සංකීර්ණ වුත්, හුදකලා වුත්, ජීවිතයක් ගත කිරීමට සිදු වී තිබේ. මීට දශක 5කට පෙර දෙමාපිය වැඩිහිටි ආදරය, කරුණාව, පිළිගැනීම සුරක්ෂිතතාව, ඇගයීම, ප්‍රශංසාව ඇතිව තම නිවසේ හා අවට පරිසරයේ වැඩෙමින් සුන්දර ජීවිතයක් ගත කළ දරුවාගේ සමස්ත සංවර්ධනය සඳහා සුවදායි පරිසරයක් ගොඩනැගුණේ නිතැතිනි.

වැඩිහිටි ජීවන රටාව අවිවේකි වන වර්තමානයේදී දරුවා තම සියළු අයිතිවාසිකම් අහිමි වූ හුදකලාවේ අවධිය වන අ.වු 03-05 කාලයේදී හුදකලා පවුල් පරිසරයෙන් මිදී පෙර පාසල වෙත පිවිස, සම වයස් කණ්ඩායම් සමග සමාජානුයෝජනය වී තම ජීවිතයට අලුත් අත්දැකීම් එක්කර ගනී. මෙම ජීවන රටාවට අවතීර්ණවත්ම දරුවා පෙර පාසල් ගුරුවරිය සමග සමීප වී දරුවා සොයන ආදරය, කරුණාව, පිළිගැනීම, ප්‍රශංසාව ඇයගෙන් ලබා ගැනීමට උනන්දු වේ.

දරුවාගේ කායික හා මානසික ක්‍රියාකාරීත්වය වර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ආකල්ප හා ධාරිතා සංවර්ධනය සඳහාත්, දෙමාපිය ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත් දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට භෞතික සම්පත් සංවර්ධනය සඳහාත්, මේවන විට ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ 13 වන සංශෝධනය 09 වැනි උපලේඛනයේ 01 වන ලැයිස්තුවේ 03 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභාවට බලතල පැවරීමේ විධිවිධානවලට අනුකූලව උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනය කිරීම පිණිස පෙර පාසල් පිහිටුවීම හා අනුසාංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ප්‍රඥප්තියක් පිහිටුවා ඇත. එය අංක 04 දරණ උතුරු මැද පළාත් මුල් ළමාවිය  අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වන ලදී.

එය උතුරු මැද පළාත් සභාව විසින් සම්මතකර 2004 පෙබරවාරි මස 19 වන දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.
උතුරු මැද පළාතේ ස්ථාපිත කර ඇති මුල් ළමාවිය ප්‍රඥප්තියට අනුව පෙර පාසල් පද්ධතිය ගොඩනැගීම සඳහා මේවන විට උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දුන් ප්‍රතිපාදන වලින් ගුරු පුහුණු වැඩසටහන් සඳහා ද වැය කර ඇත.සෑම දරුවෙකුම සුවිශේෂී වන අතර, සමාන චරිතාකමකින් යුක්ත වේ. දරුවාට ආවේණික වේගයකින් සංවර්ධනය වන අතර, හැකියාවන්ගෙන් හා දක්ෂතාවයන්ගෙන් යුක්ත වේ.

උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් සමඟ එක්ව ළමා සංවර්ධනයට බලපාන පවුල, ප්‍රජාව හා සංස්කෘතිය යන සාධක හා බැඳුනු සන්දර්භයක් තුළ පෙර පාසල් දරුවන්ගේ සංවර්ධනය උදෙසා සමෝධානිත ඉගෙනුමක් ලබා දෙනු ලැබේ. දරුවන්ගේ සංවර්ධනය උදෙසා දරුවන්ට සැලසෙන රැකවරණය ප්‍රමුඛ කොට සලකන අතර, දෙමාපියන්, පෙර පාසල් ගුරුවරුන් හා ප්‍රජාව මේ පිළිබඳව වඩා සැලකිලිමත් විය යුතු ය.





පෙර පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා කායික සංවර්ධනය, සමාජීය හා චිත්තවේග සංවර්ධනය, ප්‍රජනන හැකියා සංවර්ධනය හා භාෂාව හා මුල් කාලීන සාක්ෂරතාවය ප්‍රමුඛ කොට ගත් ඉගෙනුම් ඵලවලට අදාල නිපුණතාවයන් හෙබි පුංචි දරුවන් තම දැනුම, ආකල්ප, කුසලතා, දියුණුකර ගනිමින් අනාගතය කරා පියනඟනු දැකීම මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අභිප්‍රාය වේ.

උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය මෙම පළාතේ මුල් ළමාවියෙහි පසුවන දරුවන්ගේ අනාගතය වෙනුවෙන් පෙර පාසල් නියාමනයේ යෙදෙන ආයතනයකි.

දරුවෙකුගේ ජීවිතයේ මුල් ළමාවිය අවධිය දරුවාගේ මොළයේ වර්ධනය සඳහා ඉතාමත් තීරණාත්මක අවධියයි. එම කාලය දරුවාගේ බුද්ධිමය ක්‍රියාකාරීත්වයෙන් ගුණාත්මක බව තීරණය කරන, බාහිර අත්දැකීම්වලට දරුවෙකු වඩාත් සංවේදී කරන, දරුවාගේ භාෂා සංවර්ධනය, සමාජානුයෝජනය හා පෞර්ෂය ගොඩනැඟීම ආදිය හා සම්බන්ධ ඉතා වැදගත් සංවර්ධන කාර්යයන් මේ අවධියේ දී දරුවා තුළ සිදු වේ. උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් සමඟ එක්ව ළමා සංවර්ධනයට බලපාන පවුල, ප්‍රජාව හා සංස්කෘතිය යන සාධක හා බැඳුනු සන්දර්භයක් තුළ පෙර පාසල් දරුවන්ගේ සංවර්ධනය උදෙසා සමෝධානිත ඉගෙනුමක් ලබා දෙනු ලැබේ.

මුල් ළමාවියට අදාළ සංවර්ධන කාර්යයන් ඉටු කර ගැනීමට, ඊට ශක්තිය සපයන පරිසරයක් තිබිය යුතු ය. එම පරිසරය පෙර පාසල් තුළින් ගොඩනැඟෙන අතර, විධිමත් ලෙස අවුරුදු 3 – 5 අතර දරුවෙකු සංවර්ධනයකර ගැනීමට පෙර පාසල් ශක්තිමත්කර සුදුසු ගුරුවරුන් පත්කරලීම මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ අරමුණයි.

අධිකාරියේ දැක්මට අනුව "සතුටින් පිරි නිපුණතාවන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කර ගැනීමට" මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් අධීක්ෂණය හා නියාමනය ඔස්සේ කටයුතු කරනු ලබයි.

## දැක්ම

"සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම".

## මෙහෙවර

"උතුරු මැද පළාත තුළ විවිධත්වයෙන් යුතු, මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, නිසඟ කුසලතාවයෙන් යුත්, සෞන්දර්යාත්මක හැඟීමෙන් පිරිපුන්, සාරධර්ම සපිරි, පෙර පාසල් දරු පරපුරක් බිහි කිරීම සඳහා මධ්‍යම රජයේ හා පළාත් සභාවේ මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ද සම්බන්ධ කරගනිමින් 2003 අංක 04 දරණ ප්‍රඥප්තියට අනුකූලව වැඩසටහන් සම්පාදනය, සම්බන්ධීකරණය හා ඵලදායි ලෙස මෙහෙයවීම පිළිබඳව පළාතේ කේන්ද්‍රීය ආයතනයක් ලෙස කැපවීමෙන් කටයුතු කිරීම".

## දිගුකාලීන අරමුණු

- ❖ ගුණාත්මක සේවා සපයන පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරීම
- ❖ පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳව මනා දැනුමක් සහිත සමාජයක් ඇති කිරීම.
- ❖ සෞභාග්‍යයේ දැක්ම තුළින් ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක් බවට මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ ළමා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- ❖ ළමා ආරක්ෂණය පිළිබඳ දෙමාපියන් මනාව දැනුවත් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ උතුරු මැද පළාතේ පූර්ව ළමා අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මග පෙන්වීම.
- ❖ ගුණාත්මක, නිපුණතාවන්ගෙන් හෙබි දරු පරපුරක් බිහි කිරීම.
- ❖ පෙර පාසල් ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් නියමයන් පැනවීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන් පුහුණු කිරීම හා පුහුණුව ලැබූ අයට සහතික පත්‍ර ලබා දීම.
- ❖ පෙර පාසල් දරුවන්ගේ පෞද්ගලික ස්වස්ථතාවය හා පෝෂණය ඇති කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මානව සම්පත් සංවර්ධනයට අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- ❖ අධිකාරියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අදාළ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.
- ❖ රාජ්‍ය නොවන ආයතන හා සංවිධානවල සහාය, අනුග්‍රහය ලබා ගැනීම.

## මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අරමුණු

- ❖ උතුරු මැද පළාත තුළ පෙර පාසල් පිහිටුවීම.
- ❖ ලියාපදිංචිය, ශිෂ්‍යයින් ඇතුළත්කර ගැනීම, ගුරුවරුන් බඳවා ගැනීම සඳහා.
- ❖ නිර්ණායක සැකසීම පෙර පාසල් පිහිටුවීම හා ඒවායේ ව්‍යාපෘති පිළිබඳව කටයුතු කිරීම.
- ❖ ඉහත අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්




| තිරසර සංවර්ධන අරමුණු | ක්‍රියාකාරකම |
|---|---|
| නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරිම | පෝෂණය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම<br>ස්වස්ථතාවය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම |
| පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම | පෙර පාසල් පාලිකාවන් සඳහා විවිධ පුහුණු<br>යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 40 |
| 2 | සේවයේ නියුතු | 33 |
| 3 | පුරප්පාඩු | 09 |
| 4 | කොන්ත්‍රාත් | 01 |
| 5 | පුහුණු | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි<br>ගමන් වියදම් | 16.38 | 16.38 | 100 |
| සැපයීම්<br>නඩත්තු වියදම්<br>ගිවිසුම්ගත සේවා<br>මාරු කිරීම් | 3.82 | 3.82 | 100 |
| **එකතුව** | **20.20** | **20.20** | **100** |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම

| අ.අ | ආයතනයේ අරමුණු | ඉලක්ක | | වියදම/ආයෝජනය | |
|---|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2019 | 2020 |
| 01 | මුල් ළමාවිය අධිකාරියට තේමා ගීතයක් නිර්මාණය කර ගීතවත් කිරීම | - | - | 0.05 | - |
| 02 | ගුරු ශිෂ්‍යාවන්ගේ ප්‍රයෝජනය සඳහා පුස්තකාලයක් ආරම්භ කිරීම | - | - | 0.10 | - |
| 03 | පෙර පාසල් ගුරු රක්ෂණය ලබා දීම | - | - | 3.50 | 3.50 |

**ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති**

| අ.අ | සංවර්ධන වැඩසටහන | සංවර්ධන වැඩසටහන යෝජනා කිරීමට පාදක වූ මූලික කරුණු |
|---|---|---|
| 01 | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය සඳහා පරිපාලන ගොඩනැගිල්ල සහ ශ්‍රවණාගාරය ඉදිකිරීම | I. භෞතික සම්පත් සංවර්ධනය තුළින් භෞතික සම්පත් වඩා ඵලදායි ලෙස පරිභෝජනය කිරීමට නවීන සුදුසු ස්ථානයක් ලෙස පරිපාලන ගොඩනැගිල්ල හා ශ්‍රවණාගාරය ඉදිකිරීම. |
| 02 | උතුරු මැද පළාතේ පෙර පාසල් සඳහා ගුණාත්මක යෙදවුම්/ භෞතික සංවර්ධනය | I. සෑම ග්‍රාම නිලධාරී වසමකම නියමිත ප්‍රමිතියෙන් යුතු එක් පෙර පාසලක් ස්ථාපනය කිරීම සඳහා |
| | | II. හරිත වටපිටාවක් සහිතව සුහුරු පන්තිකාමරක් ලෙස පෙර පාසල පරිවර්තනය කරදීම සඳහා |
| | | III. කසළ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මූලික වටපිටාව සකස් කරදීම සඳහා |
| | | IV. පෙර පාසල්වල භෞතික සංවර්ධනය සඳහා සුළු අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදු කිරීම |
| | | V. පෙර පාසල් දරුවන් සඳහා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් පරිසරහිතකාමී දරු පිරිසක් බිහි කිරීම. |
| | | VI. කාබනික ගෙවතු වගාවන් හඳුන්වා දීම. |
| | | VII. වස විසෙන් තොර යහපත් ආහාර පුරුදු ඇති කිරීම සඳහා දේශීය ආහාර පරිභෝජනයට හුරු කිරීම. |
| 03 | පෙර පාසල් ගුරුවරියන් සඳහා "පූර්ව අධ්‍යාපනය" පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සහ සහතිකපත්‍ර පාඨමාලාව පැවැත්වීමට කටයුතු කිරීම | පූර්ව අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස ඉතාම වැදගත් කලාපයන් වශයෙන් පෙර පාසල්, මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන පිළිගැනෙන බැවින්, නිරෝගී හා ඵලදායි පුරවැසියකු බිහිකිරීමේ මූලිකයා ලෙස පෙර පාසල් ගුරුවරියට අවශ්‍ය මූලික පුහුණුව ලබාදීම සඳහා |
| | | පෙර පාසල් අධ්‍යාපනයේ සිටම තාක්ෂණය භාවිතය පුළුල් කිරීම තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කිසිදු දරුවකුට අතරමංවීමට ඉඩ නොතැබීමට අවශ්‍ය නිවැරදි පුහුණුව ගුරුවරියන්ට ලබාදීම සඳහා. |
| 04 | පෙර පාසල් ගුරුවරියන්ගේ පරිහරණය සඳහා ආරම්භ කර ඇති පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම | ලෝකයේ යුගයෙන් යුගය නිර්මාණය වන අලුත් ප්‍රවණතා සමඟ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා දැනුමෙන් සවිමත් පෙර පාසල් ගුරුවරියන් නිර්මාණය කිරීම සඳහා |
| 05 | ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන | ළමා මන්දපෝෂණය තුරන් කිරීම සඳහා ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන |

| අ.අ | සංවර්ධන වැඩසටහන | සංවර්ධන වැඩසටහන යෝජනා කිරීමට පාදක වූ මූලික කරුණු |
|---|---|---|
| 06 | ගුරුවරියන් දැනුවත් කිරීමේ වැඩසටහන් කොට්ඨාස මට්ටමෙන් ක්‍රියාත්මක කිරීම (ආසන්න කොට්ඨාස 3 ක ගුරුවරියන් සඳහා වෙන වෙනම එක් දින වැඩමුළු ලෙස ක්‍රියාත්මක කිරීම) | පෙර පාසල සහ පෙර පාසල් ගුරුවරිය දරුවාගේ ආකර්ෂණය දිනාගත් තැනක් සහ තැනැත්තියක් බවට පත්කර ගැනීම පිළිබඳව |
| | | පෙර පාසල තුළ මෙන්ම බාහිර පරිසරය තුළින්ද අත්දැකීම් පදනම් කරගත් අධ්‍යාපනයක් දරුවන්ට ලබාදීම පිළිබඳව |
| | | ජෛව විවිධත්වය, පරිසර පද්ධති සහ වන සංරක්ෂණය, ජල සංරක්ෂණය, පාංශු සංරක්ෂණය, බලශක්ති කළමනාකරණය හා ශබ්ද කළමනාකරණය පිළිබඳව මෙන්ම පරිසරය අවභාවිතය සඳහා වන නීතිරීති පිළිබඳව |
| | | සෑම ආකාරයකම අපද්‍රව්‍ය මිනිසාගේ නිර්මාණයක් බව හඳුනාගෙන අපද්‍රව්‍ය නිෂ්පාදනය නොකර සිටීම සහ අපද්‍රව්‍ය නිර්මාණය කරන ප්‍රමාණය අවම කිරීම පිළිබඳව සහ තිරසර පාරිභෝගික සංකල්ප හඳුන්වාදීම පිළිබඳව |
| | | ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අනුකම්පාව නොව සමාන අවස්ථා සැලසීම සඳහා හුදෙකලාවීමෙන් තොරව අභිමානයෙන් නැඟී සිටීමට අවශ්‍ය පහසුකම් සහිත පරිසරයක් නිර්මාණය කිරීම පිළිබඳව |
| | | පෙර පාසල්, දිවාසුරැකුම් මධ්‍යස්ථානවලදී කිසිඳු ආකාරයක වෙනස්කමක්, කායික දණ්ඩනය හෝ ලිංගික අපයෝජනයට ලක්වීම මුළුමනින්ම වැළැක්වීම පිළිබඳව |
| | | කරුණාව, දයාව, මෛත්‍රිය පෙරදැරිව එකිනෙකාට ගරු කරන උදව් උපකාර කරන ගුණවත් විනයගරුක ආගමට දහමට ලැදි දරු පරපුරක් පෙර පාසලෙන් ඇති කිරීම පිළිබඳව |
| | | මත් ද්‍රව්‍ය උවදුර, දරුවන් පහසුවෙන් ඊට ගොදුරුවීම පිළිබඳව |
| 07 | පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ( කොට්ඨාස මට්ටමෙන් පැය 3 ක පමණ වැඩසටහන්) | කායික, මානසික, අධ්‍යාත්මීය වශයෙන් නිරෝගී දරුවකු සමාජගත කිරීම පිළිබඳව |
| | | බෝ වන සහ බෝ නොවන රෝග වැළඳීමෙන් පසු ප්‍රතිකාර වෙනුවට නිරෝගිකම රැක ගැනීම සඳහා ආහාර ,පිරිසිදු ජලය, සහ සනීපාරක්ෂක කටයුතු පිළිබඳව (වකුගඩු රෝග, දියවැඩියාව, පණු රෝග) |
| | | මත් ද්‍රව්‍ය උවදුර, දරුවන් පහසුවෙන් ඊට ගොදුරුවීම පිළිබඳව |
| | | දරුවන් කායික දණ්ඩනයට, මානසික පීඩනයට, ලිංගික හා වෙනත් ආකාරයක අපයෝජනයට, නීති විරෝධි වාණිජ කටයුතු සඳහා ළමයින් යොදාගැනීම පිළිබඳව |
| | | කරුණාව, දයාව, මෛත්‍රිය පෙරදැරිව ඒකිනෙකාට ගරු කරන උදව් උපකාර කරන, ගුණවත්, විනයගරුක, ආගමට දහමට ලැදි දරු පරපුරක් පෙර පාසලෙන් ඇති කිරීම පිළිබඳව |

## 01. උතුරු මැද පළාතේ දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය උදෙසා ක්‍රමෝපායික සංවර්ධන ගමන් මග

**01.පෙර පාසල් භෞතික පරිසරය සංවර්ධනය කිරීම**

**02.පෙර පාසල් ගුරුවරියන්ගේ සමස්ත සංවර්ධනය හා දැනුම යාවත්කාලීන කිරීම**

03.මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපිය ආකල්ප වර්ධනය කිරීම

**04.මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ප්‍රජාව බල ගැන්වීම**


පළාතේ දරුවන්ගේ මුල් අධ්‍යාපනය වඩාත් ඵලදායී මෙන්ම ක්‍රමානුකූල කිරීම සඳහා මෙන්ම මුල් ළමාවිය සංවර්ධනය පළාතේ අනාගත සංවර්ධනය ශක්තිමත් කිරීම උදෙසා භාවිතා කළ හැකිවන අයුරින් මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, කුසලතාවයෙන් යුත් සෞන්දර්යාත්මක මෙන්ම සාරධර්ම වලින් සපිරි අනාගත දරු පරපුරක් නිර්මාණය කිරීම සඳහා 2019 වර්ෂයේදී ශීර්ෂ 04ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවන ලදී.

ඒ සඳහා ප්‍රධාන අංශ හතරක් ඔස්සේ 2019 වර්ෂයේදී පළාත් සභා ප්‍රතිපාදන මත මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල හා පෞද්ගලික ආයතනවල සහයෝගය මත විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහිදී පෙර පාසල් භෞතික පරිසරය සංවර්ධනය කිරීම, පෙර පාසල් ගුරුවරියන්ගේ සමස්ත සංවර්ධනය හා දැනුම යාවත්කාලීන කිරීම, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපිය ආකල්ප වර්ධනය කිරීම හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ප්‍රජාව බල ගැන්වීම යන අංශ ශක්තිමත් කිරීම උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**මුල් ළමාවිය සංවර්ධනය උදෙසා පෙර පාසල් වල ඉගෙනුම් පරිසරය හා භෞතික පරිසරය සංවර්ධනය කිරීම.**

පළාත ආවරණය වන පරිදි පෙර පාසල්වල පැවති අත්‍යාවශ්‍යයෙන්ම සංවර්ධනය කළ යුතු පෙර පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම, සනීපාරක්ෂක පහසුකම් පද්ධතිවල පැවති අළුත්වැඩියා කිරීම් මෙන්ම නව සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී.

ඒ යටතේ 2019 වර්ෂයේදී පළාතේ ප්‍රමුඛතාවය අනුව තෝරා ගන්නා ලද පෙර පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරමින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පහසු කිරීම සඳහා දායකත්වය සපයන ලදී.




### II. පෙර පාසල් ගුරුවරියන්ගේ සමස්ත සංවර්ධනය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා 2019 වර්ෂයේ දායකත්වය සැපයීම.

පළාතේ පෙර පාසල් අධ්‍යාපනය ගුණාත්මක බවෙන් ඉහළ මට්ටමකට ගෙන ඒම අරමුණු කරගනිමින් පෙර පාසල් ගුරුවරියන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට ද 2019 වර්ෂය තුළදී කටයුතු කරන ලදී. එසේම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වන වෘත්තීමය මට්ටම ඉහළ නැංවීම සඳහා සහතික පත්‍ර පාඨමාලා ක්‍රියාත්මක කරන ලදී.එමෙන්ම මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සිංහල මාධ්‍යය මෙන්ම දෙමළ මාධ්‍යය ඩිප්ලෝමා පාඨමාලා පවත්වන ලදී. එය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දෙමළ මාධ්‍යය මුල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කරන එකම පළාත උතුරු මැද පළාතය.

**සමස්ත කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳ සමස්ත අදහස**

2019 වර්ෂයේදී සමස්ත කාර්ය සාධනය ළඟාකර ගැනීමේදී ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මෙන්ම කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉතාම අසීරු ලෙස ඉලක්ක කරා ළඟාවීමට වෙර දරා ඇත.

# 6.6.පුස්තකාල සේවා මණ්ඩලය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් පුස්තකාල සේවාවක් ඇති කරලීමත්, එමඟින් ජන කොටස් සඳහා දැනුම හා තොරතුරු ලබාදීමට සහය දීමත් උතුරු මැද පළාතේ සංවර්ධන කටයුතුවලට තොරතුරු සේවාව ලෙස ක්‍රියාත්මක වශයෙන් සහභාගී වීම සඳහා විධිවිධාන සැලැස්වීමට යන කාර්යයන් ඉටුකර ගැනීම පිණිස 2002 අංක 04 දරණ ප්‍රඥප්තිය, 2004 සහ 2009 වර්ෂ දෙකේ දී කරන ලද සංශෝධන දෙකකට පසුව 2011 වර්ෂයේ අගෝස්තු මාසයේදී එවකට ප්‍රධාන අමාත්‍ය ධූරය දැරූ ගරු බර්ටි ප්‍රේමලාල් දිසානායක මහතාගේ මූලිකත්වයෙන් පළමු වරට උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලදී.

## දැක්ම

"උතුරු මැද පළාත තුළ යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වා ගෙන යෑම".

## මෙහෙවර

"යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වාගෙන යාම තුළින් පොතපත කියවීමෙන් දැනුම, ආකල්ප, කුසලතාවලින් පිරිපුන් සංවේදී බුද්ධිමත් ජන සමාජයක් ගොඩනැගීම".

## දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාල නූතන තාක්ෂණ සම්පත් ද සහිතව දියුණු පුස්තකාල සේවාවක් ලබා දෙන ආයතන ලෙස ගොඩනැගීම.

## කෙටිකාලීන අරමුණු

පොතපත කියවීමෙන් බැහැරවන ජන සමාජයේ බාල පරපුර ඉලක්කකර ගනිමින් ඔවුන් පොතපත කියවීමට හුරු පුරුදු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- උතුරු මැද පළාතේ පුස්තකාල සහ තොරතුරු සේවා කටයුතු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය.
- පුස්තකාල සංවර්ධනයට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.
- පළාත්වාසී පාඨකයන් සඳහා පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීම.
- පුස්තකාල සේවා ව්‍යාපෘතියකට අවශ්‍ය වන්නා වූ සාමූහික ප්‍රතිග්‍රහණය, මධ්‍යගත සැලසුම්කරණය, ඒකාබද්ධ සුචීන් සම්පාදනය, ප්‍රාදේශිය එකතුන් සංවර්ධනය කරලීම, අන්තර් පුස්තකාල පිරුළු සේවා, ජංගම පුස්තකාල සේවා, විඥාපන ජාල පිහිටුවීම සහ අදාළ අනෙකුත් කටයුතු සිදු කිරීම.

- පොත් පත්, වාර සඟරා ඇතුළු මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සහ පරිගණකගත තොරතුරු සේවාවන් යොදා ගනිමින් පළාත තුළ උසස් මට්ටමේ තොරතුරු සේවාවක් පවත්වාගෙන යෑම.
- පොත්පත් හා ලේඛණ උතුරු මැද පළාතට විශේෂිත වූ දුර්ලභ ලිපි ලේඛණ හා ග්‍රන්ථයන්හි අත්පිටපත්, පුස්කොළ පොත් ආදිය රැස් කිරීම හා සංරක්ෂණය.
- ජාතික, ජාත්‍යන්තර හා කලාපීය තොරතුරු ජාල හා සේවාව සම්බන්ධ වීම.
- පළාත් සභාව ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය තොරතුරු සහ දත්ත සැපයීම මගින් සහය වීම.
- පුස්තකාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා උසස් කිරීම් පටිපාටි, විභාග පටිපාටි සකස් කිරීම.
- දැනට පවත්වාගෙන යන පුස්තකාල පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් අදාළ පුස්තකාල සංවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- පළාතේ පුස්තකාල හා තොරතුරු සේවා සංවර්ධනය සඳහා සුදුසු වෙනත් පියවර ගැනීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්


- පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාලයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- පාඨක සමාජ තරඟ සංවිධානය හා කියවීම් කඳවුරු පැවැත්වීම.
- නිර්මාණ තරඟ පැවැත්වීම.
- ස්වයං නිර්මාණ දිරිගැන්වීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය
- පුස්තකාල ප්‍රමිතකරණය

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්.



## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 09 |
| 2 | සේවයේ නියුතු | 07 |
| 3 | පුරප්පාඩු | 02 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි.) | 2019 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. පුද්ගල පඩිනඩි | - | 4.11 | - | - |
| 2. ගමන් වියදම් | - | 0.48 | - | - |
| 3. සැපයීම් | - | 0.28 | - | - |
| 4. නඩත්තු වියදම් | - | 0.04 | - | - |
| **එකතුව** | **5.17** | **4.91** | **0.26** | **94** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අ. අං | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| **01** | කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම | පාඨකයින්ට කාර්යක්ෂම තෘප්තිමත් තොරතුරු සේවාවක් ලබාදීමට හැකි පුස්තකාල කාර්ය මණ්ඩලයක් බිහිකිරීම | 110 |
| **02** | කර්තෘ ප්‍රකාශන මිලදී ගැනීම | පළාත් සහ පිට පළාත් ලේඛකයින්ගේ කෘතින් මිලදී ගැනීම | නිර්මාණකරණයේ නියැලෙන නව ලේඛකයින් මෙන්ම ප්‍රවීණ ලේඛකයින්ද නිර්මාණකරණය සඳහා දිරි ගැන්වීම | 55 |
| **03** | මුද්‍රණ ආධාර ලබාදීම | කෘතින් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ වියදමෙන් 50%ක් ලබාදීම. | නිර්මාණකරණයේ නියැලෙන පළාතේ ලේඛකයින් දිරිගැන්වීම | 02 |
| **04** | නිර්මාණ තරඟ පැවැත්වීම | පද්‍ය, කෙටිකතා, නවකතා යනාදී අංශ වලින් හොඳම නිර්මාණය තෝරා ජයග්‍රාහකයින්ට ත්‍යාග පදක්කම් ලබාදීම | නිර්මාණකරණයේ නියැලෙන පළාතේ නව ලේඛකයින් දිරි ගැන්වීම. | 55 |
| **05** | කියවීම් කඳවුරු පැවැත්වීම | පාසල් දරුවන් සම්බන්ධ කර ගනිමින් කියවීම් කඳවුරු පැවැත්වීම | පාසල් දරුවන්ගේ කියවීම් කුසලතාව මෙන්ම කියවීම් රුචිකත්වය වැඩි කිරීම. | 40 |
| **06** | නිර්මාණකරණය පිළිබඳ නව ලේඛකයින් දැනුවත් කිරීම. | නව ලේඛකයින්ට නිර්මාණකරනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | නව ලේඛකයින් නිර්මාණකරණය පිළිබඳ උනන්දු කරවීම මෙන්ම උසස් සාහිත්‍ය නිර්මාණ බිහිකිරීමට උනන්දු කරවීම | 300 |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 6.90 | 6.84 | 0.06 | 99 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.79 | 0.74 | 0.05 | 93.67 |
| **එකතුව** | **7.69** | **7.58** | **0.11** | **98.56** |

## ආදායම් ඉපයීම

| ශීර්ෂය | ඉල්කකය (රු.මි.) | සත්‍ය ආදායම(රු.මි.) | එකතු කිරීමේ ප්‍රතිශතය(%) |
|---|---|---|---|
| වෙනත් ඉපයීම් | 2.00 | 2.03 | 101.5 |

## කාර්ය සාධන ඉලක්ක

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| 01. | උතුරු මැද පළාත තුල අංග සම්පූර්ණ පුස්තකාල පද්ධතියක් බිහිකිරීම | 1. ඉදි කරනු ලැබූ පුස්තකාල සංඛ්‍යාව | 1 | 1 | - |
| | | 2. පොත් සහ කබඩ් ලබා දුන් පාසල් පුස්තකාල සංඛ්‍යාව | 110 | | 100 |
| | | 3. ප්‍රමිතියානුකූලව සකස් කරන ලද මහජන පුස්තකාල සංඛ්‍යාව | 5 | 8 | 10 |
| 02. | පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය සහ ලේඛන කුසලතාව වැඩි දියුණු කිරීම | 1. පවත්වනු ලබන කියවීම් කඳවුරු සංඛ්‍යාව | 35 | 50 | 70 |
| | | 2. පවත්වනු ලබන පාඨක සමාජ තරඟ සංඛ්‍යාව | - | 01 | 02 |
| | | 3. මුද්‍රණ ආධාර ලබාදෙන කෘති සංඛ්‍යාව | 06 | 01 | 10 |
| | | 4. මිලදී ගනු ලබන කර්තෘ ප්‍රකාශන සංඛ්‍යාව | 28 | 38 | 50 |
| | | 5. නිර්මාණ තරඟාවලිය සඳහා සාර්ථක නිර්මාණ ඉදිරිපත් කරනු ලබන ලේඛකයින් ගණන | 120 | 200 | 250 |
| 03. | මහජනතාවට ගුණාත්මක තොරතුරු සේවාවක් ලබා දීම සඳහා කාර්යක්ෂම පුස්තකාල නිලධාරීන් පිරිසක් බිහි කිරීම. | පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 8 | 6 | 10 |

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය (රු.මි.) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථාව සැලසීම.** | | | |
| 2030 වනවිට ඵලදායි ඉගනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම. | පොත් ලබා දුන් පාසල් පුස්තකාල සහ මහජන පුස්තකාල සංඛ්‍යාව 65 | 0.8 | 0.77 |
| 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබාගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනයද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තිය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම | දැනුවත් කරන ලද ආධුනික පාසල් ලේඛකයින් සංඛ්‍යාව 60 | 0.4 | 0.28 |
| | මුද්‍රණ ආධාර ලබාදුන් පාසල් ලේඛකයින් සංඛ්‍යාව 01 | 0.5 | 0.13 |
| 2030 වන විට සියලුම තරුණ තරුණියන් සහ කාන්තා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගේ සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම. | පවත්වනු ලැබූ කියවීම් කඳවුරු සංඛ්‍යාව 40 | 0.85 | 0.85 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 04 | 4.1 | 4.1.1 | පාසල් පුස්තකාල සහ මහජන පුස්තකාල සඳහා පොත් ලබාදීම | 0.8 | 0.77 |
| | 4.3 | 4.3.1 | නව ලේඛකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 0.4 | 0.28 |
| | 4.4 | 4.4.1 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.5 | 0.49 |
| | 4.6 | 4.6.1 | කියවීම් කඳවුරු පැවැත්වීම | 0.85 | 0.85 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම

| කාර්ය සාධන දර්ශක | ඉලක්කය (සංඛ්‍යාව) | | වියදම/ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| **පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය සහ ලේඛන කුසලතාව වැඩි දියුණු කිරීම** | | | | |
| පවත්වනු ලබන කියවීම් කඳවුරු සංඛ්‍යාව | 50 | 40 | 0.85 | 0.9 |
| නව ලේඛකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | - | 02 | 0.4 | 0.5 |
| මුද්‍රණ ආධාර ලබාදෙන කෘති සංඛ්‍යාව | 01 | 02 | 0.5 | 0.5 |
| මිලදී ගනු ලබන කර්තෘ ප්‍රකාශන සංඛ්‍යාව | 38 | 55 | 0.8 | 1 |
| නිර්මාණ තරඟාවලිය සඳහා සාර්ථක නිර්මාණ ඉදිරිපත් කරනු ලබන ලේඛකයින් ගණන | 200 | 280 | 0.5 | 0.6 |
| පවත්වනු ලබන පොත් ප්‍රදර්ශන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 25,000 | 40,000 | 6.4 | 3 |
| **මහජනතාවට ගුණාත්මක තොරතුරු සේවාවක් ලබාදීම සඳහා කාරයක්ෂම පුස්තකාල නිලධාරීන් පිරිසක් බිහිකිරීම** | | | | |
| පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 6 | 2 | 0.5 | 0.7 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය සහ ලේඛන කුසලතාව වැඩි දියුණු කිරීම** | | | | |
| කියවීම් කඳවුරු පැවැත්වීම | පාසල් දරුවන් තුළ කියවීම් රුචිකත්ව ඇති කිරීම | 0.85 | 0.85 | 100 |
| නව ලේඛකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | උතුරු මැද පළාතේ නව ලේඛකයින් තුළින් උසස් සාහිත්‍ය නිර්මාණ බිහිකරවීමට දායකත්වය දීම | 0.4 | 0.28 | 71 |
| මුද්‍රණ ආධාර ලබාදීම | උතුරු මැද පළාතේ නව ලේඛකයින් දිරි ගැන්වීම | 0.5 | 0.13 | 27 |
| ස්වයං නිර්මාණ මිලදී ගැනීම | උතුරු මැද පළාතේ මෙන්ම පිට පළාත්වලද ලේඛකයින්ගේ නිර්මාණ මිලදී ගැනීම තුළින් ඔවුන්ට දිරි ගැන්වීම | 0.8 | 0.77 | 97 |
| නිර්මාණ තරඟ පැවැත්වීම | නිර්මාණකරණය කෙරෙහි යොමු වන නව ලේඛකයින් දිරි ගැන්වීම | 0.5 | 0.43 | 88 |
| උතුරු මැද පළාතේ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම | උතුරු මැද පළාතේ පොදු ප්‍රජාව කියවීම කෙරෙහි යොමු කරවීම | 6.4 | 6.1 | 94 |
| **මහජනතාවට ගුණාත්මක තොරතුරු සේවාවක් ලබාදීම සඳහා කාර්යක්ෂම පුස්තකාල නිළධාරීන් පිරිසක් බිහි කිරීම** | | | | |
| පුස්තකාල කාර්යය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | ඵලදායි පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය බිහි කිරීම | 0.5 | 0.49 | 99 |

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|
| **2020** | **2021** | |
| **උතුරු මැද පළාතේ පුස්තකාල දියුණු පුස්තකාල සේවාවක් ලබා දෙන ආයතන ලෙස ගොඩනැගීම.** | | |
| මහජන පුස්තකාල 05 ක් ස්වයංක්‍රීයකරණය කිරීම | මහජන පුස්තකාල 10 ක් ස්වයංක්‍රීයකරණය කිරීම | මහජනතාවට තෘප්තිමත් තොරතුරු සේවාවක් ලබාදීම. |
| **උතුරු මැද පළාතේ ලේඛන කලාවේ නියැලෙන පිරිස් දිරි ගැන්වීම** | | |
| 1.ලේඛකයින් 60කගේ කෘතීන් මිලදී ගැනීම<br>2. ලේඛකයින්ගේ අත්පිටපත් 04ක් සඳහා මුද්‍රණ ආධාර ලබාදීම<br>3. නව ලේඛකයින් 280 ප්‍රමාණයක් දැනුවත් කිරීම.<br>4. නිර්මාණ තරඟාවලිය සඳහා ලේඛකයින්ගේ අත්පිටපත් 350ක ප්‍රමාණයක් ගෙන්වා ගැනීම | 1. ලේඛකයින්ගේ 80කගේ කෘතීන් මිලදී ගැනීම<br>2. ලේඛකයින්ගේ අත්පිටපත් 06ක් සඳහා මුද්‍රණ ආධාර ලබාදීම<br>3. නව ලේඛකයින් 300 ප්‍රමාණයක් දැනුවත් කිරීම.<br>4. නිර්මාණ තරඟාවලිය සඳහා ලේඛකයින්ගේ අත්පිටපත් 400ක ප්‍රමාණයක් ගෙන්වා ගැනීම | උතුරු මැද පළාතේ ලේඛකයින් විසින් ශාස්ත්‍රීය නිර්මාණ බිහි කිරීමේ ප්‍රවණතාව වැඩි කිරීම. |
| **පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය වැඩි දියුණු කිරීම** | | |
| උතුරු මැද පළාතේ කියවීම් කඳවුරු 70ක් පැවැත්වීම | උතුරු මැද පළාතේ කියවීම් කඳවුරු 80ක් පැවැත්වීම | පුස්තකාල පරිශීලනය තුළින් දැනුමෙන් බුද්ධියෙන් සපිරි පොදු මහජනතාවක් බිහිකිරීම |

## උතුරු මැද පළාත් සභා ප්‍රදාන යටතේ 2019 වර්ෂය සඳහා රු. මිලියන 12.06ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන්

| ව්‍යාපෘතිය | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|
| **අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන් - 2019** | | |
| මහජන සහ පාසල් පුස්තකාල සඳහා පුස්තකාල උපකරණ සහ පොත් ලබා දීම | 1.00 | 0.04 |
| කියවීම් කඳවුරු පැවැත්වීම | 0.86 | 0.86 |
| මහජන පුස්තකාල සඳහා ප්‍රමිතකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 1.00 | 0.0024 |
| මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.50 | 0.49 |
| නිර්මාණකරණය පිළිබඳ නව ලේඛකයින් දැනුවත් කිරීම | 0.40 | 0.29 |
| එකතුව | **3.76** | **1.704** |
| **පොදුවේ ක්‍රියාත්මක කළ වැඩසටහන් - 2019** | | |
| ස්වයං නිර්මාණ මිලදී ගැනීම | 0.80 | 0.78 |
| මුද්‍රණ ආධාර ලබා දීම | 0.50 | 0.14 |
| නිර්මාණ තරඟ පැවැත්වීම | 0.50 | 0.44 |
| උතුරු මැද පළාතේ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම | 1.75 | 1.75 |
| උතුරු මැද පළාතේ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම | 4.76 | 4.50 |
| **එකතුව** | **8.31** | **7.61** |
| **මුළු එකතුව** | **12.07** | **9.314** |

## උතුරු මැද පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය





උතුරු මැද පළාත් සභා ප්‍රදාන යටතේ 2019 වර්ෂයේ නව ව්‍යාපෘති සඳහා රු. මිලියන 12.073ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මහජන පුස්තකාල සඳහා ප්‍රමිතකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ස්වයං නිර්මාණ මිලදී ගැනීම, මුද්‍රණ ආධාර ලබාදීම නිර්මාණ තරඟ පැවැත්වීම, නිර්මාණකරනය පිළිබඳ නව ලේඛකයින් දැනුවත් කිරීම, උතුරුමැද පළාතේ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම වැනි වැඩසටහන් රාශියක් පවත්වනු ලැබූ අතර ඒ සඳහා රු.මි. 9.28ක මුදලක් වැය කරන ලදී.

පාසල් දරුවන් තුළ කියවීමේ කුසලතාව හා රුචිකත්වය වර්ධනය කිරීමේ අරමුණින් කියවීම් කඳවුරු සංවිධානය කරන ලද අතර අනුරාධපුර, දිඹුලාගල හා කැකිරාව අධ්‍යාපන කළාප තුළ මෙම කඳවුරු පවත්වන ලදී. මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම යටතේ මහජන පුස්තකාල කාර්යය මණ්ඩලය සඳහා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු ලබා දීම සිදු කරන ලදී. අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේ මහජන පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීමේ වැඩමුළු මෙහිදි පවත්වන ලදි.

උතුරු මැද පළාතේ ලේඛන කලාව සඳහා උනන්දුවක් ඇති ලේඛකයින් ඇගයීම හා දිරිමත් කිරීමේ අරමුණින් නිර්මාණ තරඟ පැවැත්වීම සිදු කරන ලදී. කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ හා විවෘත අංශ තුනේ හොඳම පද්‍ය සංග්‍රහය, හොඳම කෙටිකතා සංග්‍රහය, හොඳම නවකතාව තෝරා ගැනීම සිදු විය. උතුරු මැද පළාතේ අඩු මූල්‍ය පහසුකම් සහිත ලේඛකයින් දිරිමත් කිරීමේ අරමුණින් මුද්‍රණ ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. අමන්දි පබසරා රණවීරගේ "අහස් ගඟ ළඟ නතර වෙලා" සහ සුරංජිත් සමීරගේ "ළමා නාට්‍ය 05ක්" යන ග්‍රන්ථ මුද්‍රණය සඳහා ආධාර ලබා දෙන ලදී.

ස්වයං නිර්මාණ මිලදි ගැනිම යටතේ උතුරු මැද පළාතේ හා පිට පළාත්වල ලේඛකයින් දිරිමත් කිරිමේ අරමුණින් ඔවුන්ගේ ග්‍රන්ථ 30%ක වට්ටමක් යටතේ මිලදී ගැනීම සිදු කරන ලදී.මෙහිදි ග්‍රන්ථ 58ක් මිලදී ගන්නා ලදී. උතුරුමැද පළාතේ පොදු මහජනතාවගේ කියවීම් රුචිකත්වය වැඩි කිරීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම ද සිදු කරන ලදී.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත තුළ ඵලදායි පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීමට ආයතනයේ මූලික අරමුණු පෙරදැරිව පුස්තකාල සේවා මණ්ඩලය සතු භෞතික, මානව, මූල්‍ය සම්පත් කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කරමින් සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කළ මූල්‍ය සම්පත් ද ඵලදායිව යොදවමින් 2019 වර්ෂය තුළ අපේක්ෂිත කාර්ය සාධනය කරා ළඟා වීමට හැකි විය.


# 07. පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

**පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය පිළිබඳ මූලික විග්‍රහය**

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො)

| දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 16,325 | 9,650 | 12,990 | 15,760 | 12,940 | 17,840 |
| පොළොන්නරුව | 7,558 | 7,160 | 3,525 | 8,310 | 11,600 | 9,960 |
| එකතුව | **23,883** | **16,810** | **16,515** | **24,070** | **24,540** | **27,800** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය




මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ උතුරුමැද පළාතේ දායකත්වය

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| ජාතික නිෂ්පදනය (මිරිදිය මත්ස්‍ය) | 75,750 | 67,300 | 73,930 | 82,540 | 88,100 | 90,000 |
| උතුරුමැද පළාතේ දායකත්වය(%) | 31.53 | 25.00 | 22.34 | 29.16 | 27 | 30.8 |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

ශීතාගාර පහසුකම්

| දිස්ත්‍රික්කය | ශීතාගාර පහසුකම් | ධාරිතාවය (මෙ.ටො. දිනකට) |
|---|---|---|
| අනුරාධපුර | 1 | 15 |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

### මිරිදිය ධීවර යාත්‍රා

| දිස්ත්‍රික්කය | 2013 | 2014 | 2015 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 1103 | 1103 | 1153 | 1610 | 1721 |
| පොළොන්නරුව | 1048 | 1048 | 1073 | 1047 | 1254 |
| **එකතුව** | **2151** | **2151** | **2226** | **2657** | **2975** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

### ග්‍රාමීය කෘෂි නිෂ්පාදන අලෙවි සමිති පිළිබද තොරතුරු

| දිස්ත්‍රික්කය | සමිති සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | මූල්‍ය තත්වය (රු) |
|---|---|---|---|
| අනුරාධපුර | 207 | 6,259 | 4,405,431 |
| පොළොන්නරුව | 70 | 2,419 | 2,281,337 |
| **එකතුව** | **277** | **8,678** | **6,686,768** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

## දැක්ම

“ ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක් ”

## මෙහෙවර

“කෘෂිකර්ම, කෘෂි හා සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු, සියලු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම”

## දිගු කාලීන අරමුණු

**01** ජාතික ප්‍රතිපත්තීන්ට අනුගතව කෘෂිකාර්මික සම්ප්‍රදායන් රැක ගනිමින් නවීන තාක්ෂණයට අනුව කෘෂිකාර්මාන්තයේ ඵලදායිතාවය සහ නිෂ්පාදනය ඉහළ නැංවීම

**02** පළාතේ 80 % ක් වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම

**03** තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගත හැකි පරිදි කෘෂි කාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

**04.** තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගත හැකි පරිදි කෘෂි කාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

**05.** ධිවර කර්මාන්ත තුළ ධීවර පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම

**06.** මිරිදිය ධීවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනය සඳහා වැඩමි දායකත්වයක් සපයන පළාත බවට පත් කිරිම

## ළඟාකර ගැනිමට අපේක්ෂිත කෙටි කාලීන අරමුණු

කෙටිකාලීන අරමුණු

01අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුළ නිම කිරීම.

02. නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද / තාක්ෂණය පිළිබඳව දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහිකර ගැනීම.

03. වස විස නැති ආහාර පරිභෝජනයට යොමුවන පිරිස වර්ධනය කිරීම.

04 සුළු පරිමාණ ව්‍යාවසායකයින්ට අවශ්‍ය සානුබල සැපයීම තුළින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම.

05. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් ජාතික නිෂ්පාදනයට පළාතේ දායකත්වය වර්ධනය කිරීම.

06.මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.

07.ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.

08. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යාවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.

09. අපනයනය සඳහා විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම

## ප්‍රධාන කාර්යයන් හා ප්‍රධාන උපාය මාර්ගයන්

| අංකය | ප්‍රධාන කාර්යයන් | උපාය මාර්ග |
|---|---|---|
| 01 | අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය | • අධීක්ෂණය,පසුවිපරම හා ප්‍රගති සමාලෝචනය<br>• ආයතනයේ චක්‍රලේඛ නිකුත් කිරීම |
| 02 | වස විසෙන් තොර ඵලදායි නිෂ්පාදනය දිරිමත් කිරීම | • නොමිලේ බීජ කට්ටල ලබා දීම<br>• ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගාව පුහුණු කිරීම |
| 03 | ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | • දැනුවත් කිරීම හා වැඩමුළු<br>• මල් වගාකරුවන්ට ආරක්ෂිත ගෘහ ලබා දීම<br>• සුළු පරිමාණ ව්‍යවසායකයින් සංවිධානගත කිරීම |
| 04 | ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | • මත්ස්‍ය බීජ නිෂ්පාදනය<br>• මත්ස්‍ය බීජ තැන්පත් කිරීම<br>• ධීවර ආම්පන්න හා ආධාර ලබා දීම<br>• ජල ජීවී පොකුණු සංවර්ධනය කිරීම<br>• විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය<br>• මත්ස්‍ය ආයෝජන මධ්‍යස්ථාන සංවර්ධනය<br>• පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| 05 | ආයතනික ධාරිතා සංවර්ධනය | • පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම<br>• කාර්යාල උපකරණ මිලදී ගැනීම |

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී , පෝෂණයෙන් යුත් , ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම මෙන්ම අමාත්‍යාංශය යටතේ පවතින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා සහසම්බන්ධව ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ අදාල ඉලක්ක සාධනයකර ගැනිම සඳහා 2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 73 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 58 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 15 |
| අනියම් | 01 |

## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි.) | 2019 වර්ෂයේ වියදම (රු. මි.) | ඉතිරිය (රු. මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 27.58 | 23.54 | 4.04 | 85 |
| ගමන් වියදම් | 1.75 | 1.43 | 0.32 | 81 |
| සැපයීම් | 4.66 | 1.61 | 3.04 | 34 |
| නඩත්තු වියදම් | 2.00 | 0.97 | 1.03 | 48 |
| ගිවිසුම්ගත සේවා | 4.69 | 1.32 | 3.37 | 28 |
| මාරුකිරීම් | 0.33 | 0.31 | 0.02 | 92 |
| **එකතුව** | **41.01** | **29.18** | **11.82** | **71** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි.) | 2019 වර්ෂයේ වියදම (රු. මි.) | ඉතිරිය (රු. මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| මූලධන වත්කම් හා පුනරාවර්තන වැඩිදියුණු කිරීම | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.95 | 0.18 | 0.77 | 19 |
| | යන්ත්‍ර සූත්‍ර සවිකිරීම | 0.15 | 0.05 | 0.10 | 33 |
| | වාහන | 0.80 | 0.59 | 0.21 | 73 |
| මූලධන වත්කම් අත්පත්කර ගැනීම | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම | 0.95 | - | 0.95 | 0 |
| | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.95 | 0.44 | 0.51 | 46 |
| | ශීත ගබඩා සඳහා ආවරණ ගෘහ ඉදිකිරීම | 1.82 | 1.82 | 0 | 100 |
| | බවුසරයක් මිලදී ගැනීම | 8.00 | 5.10 | 2.90 | 63 |
| ධාරිතා සංවර්ධනය | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 0.20 | 0.11 | 0.09 | 55 |
| වෙනත් | මූලධන වියදම් | 50.19 | 40.90 | 9.35 | 81 |
| **එකතුව** | | **64.01** | **49.19** | **14.82** | **77** |

## අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු , ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය (රු.මි.) | |
|---|---|---|---|
| | | ඉලක්ක | භෞතික (%) |
| **2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී , පෝෂණයෙන් යුත් , ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම** | | | |
| 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් හා ධීවරයින්ගේ කාෂිකාර්මික ඵලදායිතාව හා ආදායම, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මගින් දෙගුණ කිරීම (තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක අංක 2.1)<br>***දර්ශකය***<br>ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ සාමාන්‍ය ආදායම (දර්ශක අංක 2.3.2) | පළාතේ මුළු ජලාශ සංඛ්‍යාවෙන් මත්ස්‍ය පැටවු මුදාහරින ලද ජලාශ සංඛ්‍යාව | 5.40 | 99 |
| | සංවර්ධනය කරන ලද මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ගණන | 2.60 | 100 |
| | මිරිදිය හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන්ගෙන් පුහුණු ශ්‍රමික සංඛ්‍යාව | 0.98 | 96 |
| | කෘෂි නිෂ්පාදන අලෙවි ක්ෂේත්‍රයේ සාර්ථකව ව්‍යාපාරය කරගෙන ව්‍යවසායකයින් සංඛ්‍යාව | 4.50 | 89 |

## තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි.) | ඉලක්කගත වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| **2.** | 2.3 | 2.3.2. | මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් මුදා හැරීම | 5.40 | 5.35 |
| | | | ප්‍රජා සහභාගිත්ව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම | 2.60 | 2.59 |
| | | | මත්ස්‍ය අගිල්ලන් හා ඇසිත්තන් ප්‍රවාහනය සඳහා බවුසරයක් මිලදී ගැනීම | 8.00 | 5.10 |
| | | | පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් | 0.98 | 0.95 |
| | | | කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන | 4.50 | 3.99 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම |
|---|---|
| මත්ස්‍ය ඇගිල්ලන් හා ඇසිත්තන් මුදා හැරීම | අභිජනන මධ්‍යස්ථාන තුළින් මත්ස්‍ය ඇගිල්ලන් හා ඇසිත්තන් මිලදී ගෙන වැව් තුළට හා දැල් කූඩු තුළට බහාලීම |
| ප්‍රජා සහභාගිත්ව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම | මත්ස්‍ය අභිජනනය සඳහා මඩ ටැංකිවල පැති බැමි කොන්ක්‍රීට් කිරීම |
| මත්ස්‍ය අගිල්ලන් හා ඇසිත්තන් ප්‍රවාහනය සඳහා බවුසරයක් මිලදී ගැනීම | මත්ස්‍ය අගිල්ලන් හා ඇසිත්තන් ප්‍රවාහනය සඳහා බවුසරයක් ලබාගැනීම |
| පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් | මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ නව තාක්ෂණ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා අත්දැකීම් හුවමාරුව, ගුණාත්මක වගා බිම් නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා 02 ක් යොදා ගැනීම |
| කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන | කෘෂි නිෂ්පාදන හා ආශ්‍රිත ස්වයං රැකියා කටයුතුවල නිරතවන පුද්ගලයින් සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සැපයීම |

## සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කරන ලද දායකත්වය

## තිරසර සංවර්ධන අරමුණ

2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී , පෝෂණයෙන් යුත් , ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.

## තිරසර සංවර්ධන දර්ශක හා ඉලක්ක

ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ ආදායම, ඉඩම්වල ආරක්ෂාකාරිව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා වෙළඳපොල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මගින් දෙගුණ කිරීම.

තිරසර සංවර්ධන අරමුණු හා ඉල්ක හා දර්ශක කරා ළඟාවීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කෘෂි කටයුතු සඳහා රු.මි. 4.5 ක් ද ධීවර කටයුතු සඳහා රු.මි. 16.98 ක්ද වශයෙන් විෂය ක්ෂේත්‍ර 2 යටතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී. කෘෂි කටයුතු සඳහා වෙන් කරන ලද රු. මි. 4.5 ක ප්‍රතිපාදනයෙන් රු. මි. 1 ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා ද රු. මි. 3.5 ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ද කෘෂි කර්මාන්තය ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන මුදා හරින ලදී. එසේම ධීවර කටයුතු සඳහා වෙන්වූ 16.98 ක ප්‍රතිපාදන යටතේ තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

| | | |
|---|---|---|
| මත්ස්‍ය ඇගිල්ලන් සහ ඇසිත්තන් මුදාහැරීම | - | රු.මි.5.4 |
| ප්‍රජා සහභාගීත්ව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ඉදිකිරීම | - | රු.මි.2.6 |
| ඇසිත්තන් හා ඇගිල්ලන් ප්‍රවාහනය සඳහා බවුසරයක් මිලදී ගැනීම | - | රු. මි.8.00 |
| පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් | - | රු.මි.0.98 |

## සමස්ත සම්පත් උපයෝජනය හා අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම.

2019 වර්ෂය සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 2 හි නව වැඩ යටතේ කෘෂි කටයුතු සඳහා රු. මි. 4.5 ක් හා ධීවර කටයුතු සඳහා රු. මි. 16.98 ක් ද වශයෙන් රු.මි.21.48ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කෘෂි කටයුතු සඳහා වෙන් කරන ලද රු. මි. 4 ක ප්‍රතිපාදනයෙන් රු. මි.1.0ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා ද රු. මි. 3.5 ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ද කෘෂි කර්මාන්තය ආශ්‍රිත ස්වයංරැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන මුදා හරින ලදී.

කෘෂි හා ධීවර කටයුතු ප්‍රවර්ධනය සඳහා 2019 වර්ෂයේ
රු.මි.21.48

| ව්‍යාපෘතිය | මුදල (රු.මි) | ක්‍රියාකාරකම් ඇතුළත් විස්තරය |
|---|---|---|
| **මත්ස්‍ය ඇඟිල්ලන් සහ ඇසිත්තන් මුදා හැරීම**  | රු. මි. 5.4 | පළාතම ආවරණය වන පරිදි 2019 වර්ෂයේදී මත්ස්‍ය පැටව් 2,553,676 ක් ජලාශවල තැම්පත් කරන ලදි. තවද මත්ස්‍ය ඇඟිල්ලන් ලබාදීම සඳහා ප්‍රමාණවත් පරිදි මත්ස්‍ය ඇඟිල්ලන් සපයා ගැනීම කළ නොහැකි නිසාත් , ඒ සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන නිසාත්, ඊට පිළියමක් ලෙස මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා අදාල ජලාශ තුළම ඇති කර එම ජලාශයට ම මුදාහැරීමට කටයුතු කරන ලදී. ඒ අනුව දැල් කූඩු සහිත ජලාශ සඳහා 2019 වර්ෂය තුළදී මත්ස්‍ය ඇසිත්තන් 237,000 ක් දැල් කූඩු තුල තැම්පත් කර ජලාශවලට මුදා හරින ලදී.වියදම රු.මි.5.35කි. |
| ප්‍රජා සහභාගීත්ව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ඉදිකිරීම  | රු . මි . 2.6 | උතුරු මැද පළාතේ ජලාශ සඳහා මුදා හැරීමට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය කරනු ලබන්නේ ජලජීවී අධිකාරියට අයත් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වලිනි . මුළු ශ්‍රී ලංකාව තුළම පිහිටි ජලාශ සඳහා අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් සැපයීමට මෙම අධිකාරියට සිදු වී ඇති බැවින් පළාතට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් අවශ්‍ය කාලය තුළදී ලබාගැනීමට අපහසුය. මීට පිළියමක් ලෙස ප්‍රජා සහභාගීත්වය මත පදවිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට කටයුතු කළ අතර, එම ටැංකිවල අභිජනනය සිදුකර වැඩි ජලාශ ප්‍රමාණයකට වැඩි මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් ප්‍රමාණයක් මුදා හැරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කළ අතර 2019 වර්ෂයේ මේ සඳහා වියදම රුපියල් මිලියන 2.59 කි. |

**සමස්ත සම්පත් උපයෝජනය හා අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම ඉතිරි කොටස...**

| | | |
|---|---|---|
| ඇසිත්තන් හා ඇගිල්ලන් ප්‍රවාහනය සඳහා බවුසරයක් මිලදී ගැනීම  | රු. මි 8.00 | ජලාශවලට මත්ස්‍ය ඇගිල්ලන් හා ඇසිත්තන් මුදා හැරීම තුළින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා මත්ස්‍ය පැටවුන් ප්‍රවාහනය සඳහා ධීවර සමිති මගින් විශාල මුදලක් වැයකරනු ලබයි. ඒ අනුව ධිවර අමාත්‍යාංශය සඳහා බවුසරයක් ලබා ගැනීමෙන් ප්‍රවාහන පිරිවැය අවමවීම, මත්ස්‍ය පැටව් පොලිතීන් උරවල බහාලීම මගින් සිදුවන හානිය අවම වීම හා කාලය නාස්ති නොවීම මෙන්ම කලට වේලාවට මත්ස්‍ය පැටව් ජලාශවලට බහාලීමට හැකිවීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟාවිය හැක.වියදම රු.මි.5.10ක් විය. |
| පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන්  | රු. මි. 0.98 | අනුරාධපුර හා පොළොන්නරුව වැව්වල ධීවර සමිති සාමාජිකයින් සඳහා සමිති කළමනාකරණය හා ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් දෙකක් මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පවත්වා ඇත. මේ සඳහා සහභාගි වූ සංඛ්‍යාව 80 කි.<br>රම්බඩගල්ල විසිතුරු මත්ස්‍ය අභිජනන පුහුණු මධ්‍යස්ථානය- ව්‍යවසායකයින් 89<br>ගිණිගත්හේන විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය- ව්‍යවසායකයින් 55 |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | වියදම (රු.මි.) | ආයෝජනය (රු.මි.) |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| **මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම** | | | | |
| වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදිත මෙට්‍රික් ටොන් ප්‍රමාණය | 6060 | 3,000 | 5.35 | 10.00 |
| ස්ථාපිත කරන ලද මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව. | 1 | 1 | 2.59 | 10.00 |
| ඇසිත්තන් හා ඇඟිල්ලන් ප්‍රවාහනය සඳහා බවුසරයක් මිලදී ගැනීම | - | 1 | 5.10 | - |
| **මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ නව තාක්ෂණ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම** | | | | |
| පුහුණුව සාර්ථකව සම්පූර්ණ කරන ලද මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය පුහුණුලාභීන් සංඛ්‍යාව | 292 | 280 | 0.95 | 0.11 |
| **කෘෂි ව්‍යවසායකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය** | | | | |
| කෘෂි නිෂ්පාදන ආශ්‍රිත භාණ්ඩ ලබාදෙන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව | - | 62 | 3.99 | 20 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| | **මිරිදිය ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ නව තාක්ෂණික දැනුම, කුසලතා ආකල්ප වර්ධනය කිරීම** | | | |
| **ධීවර කාර්මිකයින් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය** | අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ධීවර කාර්මිකයින් 80 ක් හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් 200 ක් පුහුණු කිරීම් කර ඇත. මෙ තුළින්<br>➢ ධිවර කාර්මිකයින්ගේ හා විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා, ආකල්ප වර්ධනය වීම.<br>➢ සමිති සාමාජිකයින්ගේ සමිති කළමනාකරණ හැකියාවන් වර්ධනය වීම<br>➢ නායකත්ව හැකියාවන් වර්ධනය වීම<br>➢ නව ස්වයං රැකියා අවස්ථා නිර්මාණය වීම<br>➢ අත්දැකීම් වැඩිදියුණු වීම<br>➢ අභිප්‍රේරණය වීම | 0.98 | 0.95 | 96 |

| ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම** | | | | |
| ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් බෙදීම | ➢ පළාතේ මත්ස්‍ය අස්වැන්න ඉහළ යාම<br>➢ ධීවර කාර්මිකයින්ගේ ආදායම් මට්ටම ඉහළ යාම තුළින් එම පවුල්වල ආර්ථික මට්ටම වැඩිදියුණු වීම<br>➢ පළාතේ ජනතාවගේ මත්ස්‍ය පරිභෝජනය ඉහළයාම තුළින් පෝෂණ මට්ටම ඉහළයාම<br>➢ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ යාම තුළින් ධීවර ක්ෂේත්‍රය තුළ ස්වයං රැකියා අවස්ථා ජනිතවීම<br>➢ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය අඩු වෙනත් ප්‍රදේශවල ජනතාවට පරිභෝජනය සඳහා අතිරික්ත මත්ස්‍ය නිෂ්පාදනය අලෙවි කිරීම | 5.40 | 5.35 | 99 |
| ප්‍රජා සහභාගිත්ව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම | ➢ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය ඉහළ නැංවීම<br>➢ නව ස්වයං රැකියා අවස්ථා ඇතිවීම | 2.60 | 2.59 | 100 |
| මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් ප්‍රවාහනය සඳහා බවුසරයක් මිලදී ගැනීම | ➢ මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් නිසි වේලාවටප්‍රවාහනය කර ගැනීමට පහසුවීම | 8.00 | 5.10 | 64 |
| **කෘෂි ආශ්‍රිත නිෂ්පාදන ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැපයීම** | | | | |
| කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන | ➢ කෘෂිබෝග මුල්කරගත් නව ව්‍යවසායකයින් බිහිවීම<br>➢ නව දේශීය නිෂ්පාදන බිහිවීම<br>➢ ග්‍රාමීය මට්ටමේ නව වෙළඳපොළවල් බිහිවීම<br>➢ පවුලේ ආර්ථික තත්වය වැඩිදියුණු වීම | 4.50 | 3.99 | 89 |

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන වැඩසටහනක් කෘෂි හා ධීවර යන අංශ දෙක යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

01. ජාතික නිෂ්පාදනයට ධීවර අංශය යටතේ පළාතෙන් දක්වන දායකත්වය වැඩි විම.
02. මිරිදිය ධීවර කාර්මිකයින් සවිබල ගැන්වීම.
03. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම.
04. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.

## කෘෂි ව්‍යවසායකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය යන අරමුණු කරා ළඟා වීමට ඉටු කළ යුතු ක්‍රියාකාරකම්

01. ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් සහ ඇසිත්තන් මුදා හැරීම.
02. ප්‍රජා සහභාගීත්වය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.
03. සහනාධාර පදනම මත ධීවර ආම්පන්න ලබා දීම.
04. සහනාධාර පදනම මත විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා උපකරණ ලබා දීම.
05. විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා සිමෙන්ති ටැංකි ලබා දීම.
06. විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන්.
07. ධිවර කාර්මිකයින් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන්.
08. කෘෂි නිෂ්පාදන ආශ්‍රිත අලෙවි මධ්‍යස්ථානයක් ඉදි කිරීම.
09. කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම.
10. ධීවර අලෙවි කුටි ලබා දීම.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| | 2020 | 2021 | |
| ජාතික නිෂ්පාදනයට ධීවර අංශය යටතේ පළාතෙන් දක්වන දායකත්වය වැඩිවීම | මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3000 | මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3000 | පළාතේ ජනතාවගේ පෝෂණ ඉහළ යාම හා ධීවර කාර්මිකයින්ගේ ආර්ථික මට්ටම දියුණුවීම |
| මිරිදිය ධීවර කාර්මිකයින් සවිබල ගැන්වීම | මිරිදිය ධීවර කාර්මිකයින් 500 | මිරිදිය ධීවර කාර්මිකයින් 500 | ධිවර කාර්මික පවුල්වල ආර්ථික හා සාමාජීය සංවර්ධනයට ළඟා වීම |
| විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම | ප්‍රතිලාභීන් 200 | ප්‍රතිලාභීන් 200 | විසිතුරු මත්ස්‍ය සේවා නියුක්තිය වැඩිවීම හා විසිතුරු මත්ස්‍ය අපනයනය වැඩිවීම |
| කෘෂි ව්‍යවසායකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය | ප්‍රතිලාභීන් 40 | ප්‍රතිලාභීන් 40 | කෘෂි නිෂ්පාදන ව්‍යවසායකයින්ගේ ආදායම් මට්ටම ඉහළ යාම තුළින් පවුලේ ආර්ථික මට්ටම වැඩිදියුණුවීම හා ග්‍රාමීය මට්ටමේ නව වෙළඳපොළවල් බිහිවීම |


## උතුරු මැද පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2014-2019

| දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 16,325 | 9,650 | 12,990 | 15,760 | 12,940 | 17,840 |
| පොළොන්නරුව | 7,558 | 7,160 | 3,525 | 8,310 | 11,600 | 9,960 |
| එකතුව | **23,883** | **16,810** | **16,515** | **24,070** | **24,540** | **27,800** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

## මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො) 2018 - 2019

අමාත්‍යාංශය යටතේ පවතින ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම යන ප්‍රධාන කාර්යය යටතේ 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 12940 සිට 17840 දක්වා වර්ධනයක් පෙන්නුම් කළ ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය මෙ.ටො. 11600 සිට 9960 දක්වා පසුබෑමක් පෙන්නුම් කරයි. 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනයක් පෙන්වයි. එය මෙ.ටො. 3260ක වැඩි වීමකි.




## ධීවර අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය 2020 – 2021

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| | 2020 | 2021 | |
| 1. ජාතික නිෂ්පාදනයට ධීවර අංශයෙන් පළාතෙන් දක්වන දායකත්වය වැඩිවීම | මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3000 | මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3000 | පළාතේ මත්ස්‍ය අස්වැන්න ඉහළ යාම. |
| 2. මිරිදිය ධීවර කාර්මිකයින් සවිබල ගැන්වීම | මිරිදිය ධීවර කාර්මිකයින් 100 | මිරිදිය ධීවර කාර්මිකයින් 100 | මිරිදිය ධිවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම |
| 3.විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම | ප්‍රතිලාභීන් 80 | ප්‍රතිලාභීන් 80 | ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය වීම.<br>2.නව ස්වයංරැකියා අවස්ථා නිර්මාණය වීම. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් ධීවර විෂයේ සංවර්ධනය උදෙසා 2019 වර්ෂයේදී අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට හැකි වූ අතර ඒ යටතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ දැනුම වර්ධනය කිරීම හා ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ සැපයීම විශේෂයෙන් කැපී පෙනේ. ඉහත කාරණා වෙනුවෙන් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘතීන් සාර්ථකව සතුටුදායක අන්දමින් නිම කිරීමට හැකි විය.

# 7.1. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ආයතනය පිළිබඳ මූලික තොරතුරු

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 01 | - |
| නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම (ව්‍යාප්ති) කාර්යාලය | 01 | - |
| සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - මහඉලුප්පල්ලම | 01 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කලාප) කාර්යාල | 04 | 01 |
| කෘෂිකර්ම උපදේශක කාර්යාල | 32 | 05 |
| පළාත්බද පර්යේෂණ ආයතනය | 01 | - |
| පාංශු පරීක්ෂණාගාරය | 01 | - |

මූලාශ්‍රය:-පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## දැක්ම

"තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් පළාතක් බිහි කිරිම".

## මෙහෙවර

"නව යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණය හා කෘෂිකාර්මික යටිතල පහසුකම් භාවිතයෙන් ආහාර සුරක්ෂිතතාව හා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය, වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහයෝගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරිම".

## දිගුකාලීන අරමුණු

- ❖ වී, අතිරේක බෝග, අල බෝග, එළවළු හා වෙනත් ආහාර බෝග සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති හා පළාත් කෘෂිකර්ම අවශ්‍යතාවයන් හා ප්‍රමුඛතාවයන් මත පිහිටා විශිෂ්ට පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ඉහළ කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් සාක්ෂාත් කර ගැනිම.
- ❖ පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් තුළින් ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම, දිළිඳුකම පිටු දැකිම හා ජාතික ආහාර සුරක්ෂිතතාව හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය මගින් ගුණාත්මක හා ආරක්ෂාකාරි ආහාර නිෂ්පාදනය, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ළඟාකර ගැනිම.
- ❖ ජලය හා පස සංරක්ෂණය කර ගනිමින්, වෙනස් වන සමාජ, ආර්ථික හා කාලගුණික ප්‍රවණතාවයකට අනුකූලවන සේ සැකසූ වැඩසටහන් තුළින් තිරසාර කෘෂිකාර්මික ක්‍රමෝපායන් ළඟාකර ගැනිම.
- ❖ උසස් ගුණත්වයෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය පළාත තුළ සුලභ කිරිම.
- ❖ දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගත් කෘෂිකර්මාන්තයට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් දියත් කිරිම තුළින් පළාතේ ගොවි ජනතාවගේ කෘෂි ව්‍යවසාය හැකියාවන් වර්ධනය කිරිම තුළින් තෘප්තිමත් ගොවි ජනතාවක් බිහි කිරිම.

## කෙටිකාලීන අරමුණු

- නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුළ ප්‍රචලිත කිරිම
- ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිම.
- පරිසර හිතකාමි කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය.
- වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය.
- කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය.

## ප්‍රධාන කාර්යයන්

- ✓ යහපත් ව්‍යාප්ති සේවාවක් සැපයීම සඳහා ගොවිජනතාවට නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ දැනුම , ආකල්ප, කුසලතාවයන් වර්ධනය කිරිම.
- ✓ ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සුලභතාවය ඇති කිරිම.
- ✓ පැළෑටි සංරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත, පළිබෝධනාශක පාලන පනත, බීජ පනත වැනි පනත් ක්‍රියාත්මක කිරිම.
- ✓ මහඉළුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් ක්ෂේත්‍ර පුහුණු හා ප්‍රායෝගික සේවාස්ථ පුහුණු ගොවීන් හා නිලධාරීන් වෙත ලබා දීම.
- ✓ පළාත තුළ පරිසර හිතකාමී යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයන් ප්‍රචලිත කිරිම.
- ✓ රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිම මගින් ආහාර ද්‍රව්‍ය ආනයනය අඩු කිරිම.
- ✓ පළාත තුළ කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත හා ව්‍යවසායකයින් හඳුනාගෙන වැඩි දියුණු කිරිම.
- ✓ ගොවීන්ගේ කෘෂි තාක්ෂණික ගැටළු හඳුනාගෙන පර්යේෂණ ආයතනයන් වෙත යොමු කිරිම.
- ✓ කෘෂිකර්මයට අදාල දත්ත හා තොරතුරු ජාලයක් හා තොරතුරු කේන්ද්‍රයක් පවත්වා ගැනීම තුළින් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතනයන් මෙන්ම තොරතුරු දැන ගැනිමේ අදාල අය වෙත තොරතුරු ලබා දීම.
- ✓ කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

**01.** වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශන ක්‍රියාත්මක කිරිම.

**02.** පරිසර හිතකාමී කෘෂිකර්මය සඳහා ඒකාබද්ධ පාලන ක්‍රම හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන වැඩසටහන් කිරිම.

**03.** අස්වනු වැඩි කිරිම සඳහා බෝගවලට ඒකාබද්ධ පැළෑටි පෝෂණ ආදර්ශණ ක්‍රියාත්මක කිරිම හා වී සඳහා පැරිෂුට් තාක්ෂණය හඳුන්වා දීම වැනි නව උචිත තාක්ෂණයන් හඳුන්වා දිම.

**04.** වී සහ අතිරේක බෝගවල ගුණාත්මක බීජ සුලභ කිරිම සඳහා බීජ නිෂ්පාදන යාය පිහිටුවීම හා බීජ පනත ක්‍රියාත්මක කිරිම.

**05.** කෘෂි නිෂ්පාදන ක්‍රමවත්ව අලෙවි කිරීම සඳහා වැඩසටහන් සැකසිම

**06.** නව කෘෂි ව්‍යවසායකයින් බිහි කිරිම සඳහා ගොවි කාන්තා හා තරුණ ගොවි සමාජ පිහිටු විම හා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

**07.** පාංශු සංරක්ෂණය දිරිමත් කිරිම සඳහා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරිම.

**08.** පළිබෝධ පාලන නියාමනය සඳහා පළිබෝධ පාලන පනත ක්‍රියාත්මක කිරිම.


**09.** කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ යාන්ත්‍රීකරණය හඳුන්වා දිම තුළින් ඵලදායිතාව ඉහළ නැංවිම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




## කාර්යය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත | 389 |
| සේවයේ නියුතු | 215 |
| පුරප්පාඩු | 130 |
| අනියම් | 11 |



## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 124.60 | 115.87 | 8.73 | 93 |
| ගමන් වියදම් | 7.16 | 7.03 | 0.13 | 98 |
| සැපයීම් | 8.85 | 7.42 | 1.43 | 83 |
| නඩත්තු වියදම | 6.95 | 6.18 | 0.77 | 89 |
| ගිවිසුම්ගත සේවා | 7.32 | 6.22 | 1.10 | 85 |
| මාරු කිරීම | 0.69 | 0.60 | 0.09 | 86 |
| එකතුව | **155.58** | **143.32** | **12.25** | **92** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ධාරිතා සංවර්ධන වැඩසටහන | දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් පුහුණු කිරීම, ගොවීන් පුහුණු කිරීම | දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය තුළින් ප්‍රජා සංවර්ධනය ඇති කිරීම | නිලධාරීන් - 748<br>ගොවීන් - 1482 |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 102.21 | 92.21 | 9.99 | 90 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.50 | 0.49 | 0.0096 | 98 |
| වාහන | 2.86 | 2.03 | 0.83 | 71 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 39.43 | 28.53 | 10.90 | 82 |
| එකතුව | **145.00** | **123.26** | **21.72** | **85** |

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| වෙනත් ඉපයීම් - වාණිජ අත්තිකාරම් ගිණුම | 7.0 | 2.0 | 28.57 |

## අමාත්‍යංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය (රු.මි.) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සඳහා** | | | |
| 2.1 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම<br>2.1.1 මන්ද පෝෂණයේ ව්‍යාප්තිය<br>2.1.2. ආහාර අනාරක්ෂිතතා අත්විදීම් දර්ශකය පදනම් කර ගනිමින් ජනගහනය තුළ මධ්‍යස්ථ හෝ තීව්‍ර ආහාර අනාරක්ෂිතභාවයේ ව්‍යාප්තිය. | 1. බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මය ඉහළ නැංවීම | 2.67 | 3.061 |
| 2.3 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයන්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීමේ හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මඟින් දෙගුණ කිරීම. | 2. නව තාක්ෂණය සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම | 2.637 | 2.243 |
| | 3. බෝග විවිධාංගීකරණය හා බෝග කලාපීකරණය | 2.3636 | 2.179 |
| | 4. පුද්ගල හා කණ්ඩායම් කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය | 0.690 | 0.593 |
| **තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම** | | | |
| 12.3 2030 වන විට සිල්ලර සහ පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි සිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම<br><br>12.3.1. ලෝක ආහාර හානි දර්ශකය | 1. පෙර හා පසු අස්වනු තාක්ෂණය හඳුන්වාදීම | 0.260 | 0 |
| **දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම** | | | |
| 13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම<br>13.2.1 ආහාර නිෂ්පාදනයට තර්ජනයක් නොවන පරිදි දේශගුණික වෙනස්වීමේ අහිතකර බලපෑම් සඳහා හැඩගැස්වීමට ඔවුන්ගේ හැකියාව වැඩි කරන ඒකාබද්ධ ප්‍රතිපත්ති /ක්‍රමෝපාය/සැලසුම් සහ කාළගුණික වෙනස්වීම් හා හරිතාගාර වායු විමෝචනයන් අවම කිරීම දියුණු කිරීම සඳහා වන කැපවීම් පිළිබඳ අදහස් හුවමාරු කරගෙන, ස්ථාපනය කර සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව | පාංශු හා ජල සංරක්ෂණය | 0.700 | 0.653 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජනය (රු.මි) | ඉලක්ක ගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 02 | 2.1 | 2.1.1 | 1. බීජ හා රෝපණ ද්‍රව්‍ය ගුණාත්මය ඉහළ නැංවීම | 2.670 | 3.061 |
| | | 2.1.2 | 2. නව තාක්ෂණය හා යහපත් කළමනාකරණ ක්‍රමවේද ප්‍රචලිත කිරීම | 2.637 | 2.243 |
| | | | 3. බෝග විවිධාංගීකරණය හා බෝග කලාපීකරණය | 2.630 | 2.170 |
| | 2.3 | 2.3.2 | කෘෂි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම | 0.600 | 0.593 |
| | | | කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධනය | 1.000 | 0.907 |
| 13 | 13.2 | 13.2.1 | පාංශු හා ජල සංරක්ෂණය | 0.700 | 0.653 |
| 12 | 12.3 | 12.3.1 | පෙර හා පසු අස්වනු තාක්ෂණය හඳුන්වාදීම | 1.48 | 1.22 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආවරණය කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන/ ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මය ඉහළ නැංවීම | අක්කර 01 බීජ නිෂ්පාදන වැඩසටහන්183 ක්,ස්වයං බිත්තර වී නිෂ්පාදන වැඩසටහන් 568 ක් පැවැත්වීම. | 284 | 22 |
| නව කෘෂිකාර්මික තාක්ෂණය ප්‍රචලිත කිරීම | නිලධාරී ක්ෂේත්‍ර චාරිකා, ගොවි පුහුණු හා ක්ෂේත්‍ර දින පැවැත්වීම, ඒකාබද්ධ පළිබෝධ පාලන අක්.05 යාය වැඩසටහන් 6 ක් පවත්වා ඇත. පැරෂුට් තැටි 400 ක් 40% ගොවි දායකත්වය මත මිල දී ගැනීම, අක්.01 යාය සඳහා බිත්තර වී 15 කි.ග්‍රෑ.15 ක් 25% ගොවි දායකත්වය මත ලබා දීම, නව ප්‍රභේද ආදර්ශන වැඩසටහන්, මැහි බෝග වගා ආදර්ශන ගම්මාන වැඩසටහන යටතේ කෘමි ආරක්ෂිත දැල් හා උගුළු සහ ප්‍රෝටීන ඇම මිල දී ගැනීම | 292 | 22 |
| බෝග විවිධාංගීකරණය හා බෝග කලාපීයකරණය | අක්කර 05 බෝග අස්වනු වැඩි කිරීමේ යාය වැඩසටහන් පැවැත්වීම, තුන්වන කන්නයේ මුං වගාව සිදු කිරීම, කජ්පාදු වැඩසටහන් | 172 | 22 |
| පාංශු හා ජල සංරක්ෂණය | තිරසර ගොවිපලවල් සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ලබා දීම. | 13 | 22 |
| පෙර හා පසු අස්වනු තාක්ෂණය හඳුන්වාදීම | ත්‍රිත්ව ස්ථර බෑග් ලබාදීම. | - | - |
| කෘෂි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම | බිම්මල් ගෘහ ඉදි කිරීම, අපනයනය ඉලක්ක කරගත් මල් ගම්මාන සංවර්ධනය, ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර ලබාදීම. | 06 | 01 |
| | ආහාර තාක්ෂණික පුහුණු. | 05 | 05 |

## කාර්ය සාධන ඉලක්ක 2017 - 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2019** |
| 01 | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුළ ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීම | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය භාවිතය සඳහා යොමු වූ ගොවීන් ගණන | 20,000 | 40,000 | 50,000 |
| 02 | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය | - ගුණාත්මක බිත්තර වී නිෂ්පාදිත ප්‍රමාණය (බුසල්) | 40,000 | 50,000 | 70,000 |
| | | - නිෂ්පාදිත ගුණාත්මක අතිරේක ආහාර බෝග බීජ ප්රමාණය (කි.ග්‍රෑ.) | 50,000 | 80,000 | 120,000 |
| 03 | පරිසර හිතකාමී කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය | අඩු කෘෂි රසායන භාවිතා කර යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යටතේ බෝග වගාව සඳහා යොමු කළ වගා වපසරිය (ha) | 50 | 400 | 600 |
| 04 | වාණිජ කෘෂි කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය | වාණිජ කෘෂි කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සඳහා යොමු වූ ගොවීන් සංඛ්‍යාව | 20 | 100 | 150 |

**ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය**

**2019 වර්ෂයේ යල කන්නය හා 2019/20 මහ කන්නයේ වී සහ අනෙකුත් ආහාර බෝගවල නිෂ්පාදනය**

| බෝගය | 2019 යල කන්නය | | අපේක්ෂා කළ නිෂ්පාදනය (මෙ.ටො.) | 2019/20 මහ කන්නය | | අපේක්ෂා කළ නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | |
| වී | 28012 | 4568 | 21926 | 69777 | 57053 | 273854 |
| බඩඉරිඟු | 294 | 57 | 285 | 27261 | 20306 | 101530 |
| මිරිස් | 552 | 213 | 256 | 2742 | 1209 | 1451 |
| උඳු | 168 | 55 | 110 | 4087 | 1435 | 2870 |
| මුං | 182 | 44 | 53 | 348 | 135 | 162 |
| කව්පි | 194 | 61 | 73 | 530 | 238 | 286 |
| තල | 1053 | 1670 | 1336 | 226 | 10 | 8 |
| කුරක්කන් | 33 | 2 | 4 | 852 | 522 | 1044 |
| රටකජු | 99 | 39 | 78 | 413 | 354 | 708 |
| එළවළු | 2609 | 771 | 11565 | 4309 | 1498 | 22470 |

2019 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි.141 ක් සහ පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි. 2.0 ක ප්‍රතිපාදනයක් වෙන් වී තිබූ අතර එමඟින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සංරචක 04 ක් යටතේ ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ අවිච්ඡේද සඳහා රු.මි. 70.8 ක් හා රු.මි. 1.9 ක් අවුරා තැබීම සිදු කරන ලදි.

පළමු සංරචකය වන නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා රු.මි. 4.47 ක් වෙන් කොට බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. බිත්තර වී නිෂ්පාදනය, අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනය සියළුම කෘෂි උපදේශක කොට්ඨාශ ආවරණයවන පරිදි ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ අක්කර 01 බීජ නිෂ්පාදන වැඩසටහන් 183 ක් පවත්වා ඇත. ස්වයං බිත්තර වී නිෂ්පාදන වැඩසටහන් 568 ක් පවත්වන ලදි.

## ගුණාත්මක බිත්තර වී නිෂ්පාදන වැඩසටහන

| ක්‍රියාකාරකම | වැඩසටහන් ගණන | | වපසරිය (අක්) | | ප්‍රතිලාභීන් ගණන | | අපේක්ෂිත නිෂ්පාදනය (බුසල්) | නිෂ්පාදනයේ අගම වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|---|
| | ලක්ෂ්‍යය | භෞතික | ලක්ෂ්‍යය | භෞතික | ලක්ෂ්‍යය | භෞතික | | |
| 1 Ac බිත්තර වී නිෂ්පාදන වැඩසටහන | 212 | 171 | 212 | 171 | 212 | 171 | 13680 | 13.68 |
| ස්වයං බිත්තර වී නිෂ්පාදනය | 2022 | 505 | 2015 | 565 | 2022 | 505 | 40400 | 40.40 |
| 1 Ac පැරෂුට් වගා වැඩසටහන | 99 | 10 | 99 | 10 | 99 | 10 | 800 | 0.80 |
| 5 Ac ඒකාබද්ධ පළිබෝධ පාලන වැඩසටහන | 21 | 08 | 105 | 40 | 105 | 40 | 3200 | 3.20 |
| **එකතුව** | | | **2431** | **786** | **2438** | **726** | **58080** | |

ලියාපදිංචි බීජ ලෙස ලේබල් යෙදූ ප්‍රමාණය බුසල් 1456 කි.ගොවීන් අතර මහ කන්නයේ දී හුවමාරු කර ගත් ප්‍රමාණය බුසල් 1310 කි.



රඹෑව කෘ.උ.කො. කඳුරුගස්දමන,පරසන්ගස්වැව



**අක්.01 බිත්තර වී ආදර්ශන ගල්පොත්තේගම මුළු අස්වැන්න බුසල් 114 සහතික ලේබල් යෙදූ අස්වැන්න බුසල් - 86**



ස්වයං ස්වයං බිත්තර වී නිෂ්පාදනය - අනුරාධපුර

## සියළුම කෘෂි උපදේශක කොට්ඨාශ ආවරණය වන ලෙස ක්‍රියාත්මක කළ ගුණාත්මක අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන්

| බෝගය | වපසරිය (අක්) | | ප්‍රතිලාභීන් ගණන | | අපේක්ෂිත නිෂ්පාදනය (kg) | නිෂ්පාදනයේ අවම වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | | |
| කව්පි | 100 | 70 | 160 | 155 | 50000 | 7.50 |
| මුං | 40 | 10 | 70 | 65 | 16000 | 3.20 |
| එකතුව | **340** | **80** | **570** | **553** | **166000** | **25.70** |

අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ලියාපදිංචි බීජ සපයා ගැනීම ප්‍රධාන අභියෝගයක් විය. ඒ නිසා අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදන වැඩසටහන්වලට අමතරව අතිරේක ආහාර බෝග අස්වනු වැඩි කිරීමේ යාය වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදි.

## අස්වනු වැඩි කිරීමේ යාය වැඩසටහන

| බෝගය | වපසරිය (අක්) | | ප්‍රතිලාභීන් ගණන | | අපේක්ෂිත නිෂ්පාදනය (kg) | නිෂ්පාදනයේ අවම වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | | |
| කව්පි | 150 | 160 | 280 | 282 | 75000 | 11.25 |
| උඳු | 200 | 255 | 360 | 357 | 80000 | 12.0 |
| මුං | 65 | 45 | 110 | 108 | 26000 | 5.2 |
| රටකජු | 100 | 150 | 85 | 90 | 60000 | 9.0 |
| මිරිස් | 300 | 150 | 550 | 544 | 2400000 | 960.0 |
| කුරක්කන් | 170 | 165 | 250 | 247 | 51000 | 5.1 |
| එකතුව | **1065** | **925** | **1715** | **1705** | **2748000** | **1007.3** |

## ක්‍රියාත්මක කරන ලද අතිරේක ආහාර බෝග අස්වනු වැඩි කිරීමේ යාය වැඩසටහන්





කව්පි අස්වනු වැඩි කිරීමේ යාය - පලුගස්වැව

## ස්වයං බීජ නිෂ්පාදන වැඩසටහන

| බෝගය | වපසරිය(අක්) | | ප්‍රතිලාභීන් ගණන | | අපේක්ෂිත නිෂ්පාදනය (kg) | නිෂ්පාදන යේ අවම වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | | |
| කව්පි (kg.1 පැ.) | 300 | 312 | 300 | 312 | 150000 | 22.5 |
| උඳු (kg.1 පැ.) | 250 | 250 | 250 | 250 | 100000 | 15.0 |
| මුං (kg.1 පැ.) | 120 | 122 | 120 | 122 | 48000 | 9.6 |
| රටකජු (kg.5 පැ.) | 50 | 50 | 50 | 50 | 30000 | 4.5 |
| කුරක්කන් (kg.1 පැ.) | 100 | 150 | 100 | 150 | 30000 | 3.0 |
| **එකතුව** | **820** | **884** | **820** | **884** | **358000** | **54.6** |





(ක්ෂේත්‍ර දිනය: කව්පි බීජ නිෂ්පාදන යාය මුරියාකඩවල - අක්කර 30)

## දෙපාර්තමේන්තුව යටතේ පවතින පැල තවාන් ක්‍රමවත් කිරීම.

දෙපාර්තමේන්තුවට අයත් පැල තවාන් ක්‍රමවත් කරමින් නිෂ්පාදනය ඉහළ නැංවීමටද කටයුතු කරන ලදි. එහි පළමු පියවර ලෙස දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තැන තැන ස්ථාපනය කර තිබූ කුඩා පරිමාණයේ පැල තවාන් සියල්ල ඉවත්කර මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස භූමියේ ක්‍රමවත් ලෙස පැල තවානක් ආරම්භ කරන ලදි.

## 2019 වර්ෂයේ GAP වැඩසටහනේ ක්‍රියාකාරකම්

වර්තමානය වනවිට මෙරට තුළ කෘෂි කර්මාන්තය සැලකීමේ දී කෘෂි රසායන අනිසි ලෙස භාවිතය කැපී පෙනේ. මෙම තත්ත්වය නිසා නිෂ්පාදනයන් සඳහා දායක වන ගොවියා මෙන්ම පාරිභෝගිකයා ද විවිධ රෝගාබාධවලට ලක්වීමේ අවදානමක් ඇත. මේ හේතුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.



මෙහි දී බිම සකස් කිරීමේ සිට අස්වනු අලෙවි කිරීම දක්වා සියලු අවස්ථාවන් නියාමනය සිදු කරයි. මෙම වැඩසටහන තුළදී විශේෂයෙන්ම රෝග හා පළිබෝධවලට වගාවන් පාත්‍ර වීම වැළැක්වීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කරමින්, වගාකරුවන්ගේ සනීපාරක්ෂාව හා සෞඛ්‍යාරක්ෂිත බව සුරක්ෂිත කරමින් පාරිභෝගියාටත් සෞඛ්‍යාරක්ෂිත එළවළු හා පළතුරු නිෂ්පාදනය සිදු කරයි.



GAP ගොවිපළ පිහිටුවීම- කෘ.උ. කොටස පූනෑව

ආම්භයේ දී මෙම වැඩසටහන තුළින් ගොවිපල් බිහි කරන ලද්දේ විදේශ වෙළඳපල ඉලක්ක කරගෙනය. 2019 වර්ෂයේ උතුරු මැද පළාත තුළ ගොවිපල් 78 ක් GAP වැඩසටහන යටතේ ලියාපදිංචිය සිදු කළ අතර මේ වන විට GAP සහතිකලාභී ගොවිපල් 21 ක් ඇත.

**නව කෘෂිකාර්මික තාක්ෂණය ප්‍රචලිත කිරීම.**

මෙම වැඩසටහන යටතේ නිලධාරී ක්ෂේත්‍ර චාරිකා, ගොවි පුහුණු හා ක්ෂේත්‍ර දින පැවත්වීම සිදු කර ඇත. ඒකාබද්ධ පළිබෝධ පාලන අක්කර 05 IBM යාය වැඩසටහන් 09 ක් පවත්වා ඇත. එමෙන්ම පැරශූට් තැටි අක්කර 10 ක් ලබා දී ඇත. මේවා 40% ගොවි දායකත්වය මත ගොවීන් වෙත නිකුත් කර ඇති අතර අක්කර 01 යාය සඳහා බිත්තර වී කි.ග්. 15 ක් 25% ගොවිදායකත්වය මත ගොවීන් වෙත නිකුත් කර ඇත.

මේ යටතේ පාංශු පරීක්ෂා වගා අස්වනු සමීක්ෂණය කිරීම හා පුහුණු වැඩසටහන් 02 ක් පවත්වා ඇත. දෙමුහුන් මිරිස් නව ප්‍රභේද ආදර්ශන වැඩසටහන් 50 ක් 2019 වර්ෂයේ දී පවත්වා ඇත. මැහි බෝග ගම්මාන 12 ක් තෝරාගෙන එකී ගම්මාන GAP වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සිදු කරන ලදී. එම වැඩසටහන යටතේ කෘමි ආරක්ෂිත දැල්, උගුළු හා ප්‍රෝටීන ඇම මිල දී ගෙන ගොවි කණ්ඩායම් 10 කට ලබා දි ඇත.

සඳහා කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන යටතේ
අපනයන ඉලක්ක කර ගත් ඕකිඩ් ගම්මාන බිහි කිරීම සිදු කර ඇත. මේ යටතේ සෙවන දැල් ගෘහ ඉදි කර ඇත. (ඉපලෝගම එකමුතු ගොවි කාන්තා සමිතිය) ආහාර හා තාක්ෂණ පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා ඇත. එසේම ගොවි කාන්තාවන් සහ ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර කැකිරාව, රඹෑව, කහටගස්දිගිලිය හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ගොවි කාන්තාවන් 04කට හා එක් ගොවි සංවිධානයකට ලබා දී ඇත.

**අලෙවිකරණය සහ තාක්ෂණ සංවර්ධනය යටතේ හෙළ බොජුන්හල් පිහිටුවීම**

මේ යටතේ අනුරාධපුර නගර සභා භූමියේ හෙළ බොජුන්හල, මැදවච්චිය හා රත්මල්ගහවැව
( කුඩා පට්ටිය හන්දිය ) කෘෂි උපදේශක කොට්ඨාශයේ හෙළ බොජුන් අලෙවි සැල් පිහිටුවීම ආදිය සිදු කරන ලදී.



හෙළබොජුන් අලෙවිසැළ විවෘත කිරීම - මැදවච්චිය

## ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් - 2019

| අනු අංකය | වැඩසටහන | |
|---|---|---|
| 01 | අපනයනය ඉලක්ක කරගත් මල් වගා ගම්මාන සංවර්ධනය-ඉපලෝගම |  |
| 02 | මිහින්තලේ GAP අලෙවිසැලක් විවෘත කිරීම |  |
| 03 | තිරසාර ගොවිපල සංවර්ධනය MICH–01 මිරිස් බීජ ලබා දීම, ඕලුකුඹුර පරසන්ගස්වැව |  |

| අනු අංකය | වැඩසටහන | |
|---|---|---|
| 04 | ආක්‍රමණශීලී ආගන්තුක සේනා දළඹුවා මර්දනය කිරීමේ ප්‍රචාරක කටයුතුවල නියැලෙමින් |  |
| 05 | කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන : බිංදු ජල සම්පාදන පද්ධති සවි කිරීම (කෘෂිකර්ම උපදේශක කොට්ඨාසය ගම්මිරිගස්වැව) |  |
| 06 | කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන : බිංදු ජල සම්පාදන පද්ධති සවි කිරීම (කෘෂිකර්ම උපදේශක කොට්ඨාසය පූනෑව) |  |

**2018** වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ලැබුණු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කෘෂි රසායන අඩු කිරීම සඳහා කෘමි ආරක්ෂිත දැල් භාවිතාකර වගා කටයුතු සිදු කිරීමේ වැඩසටහන යටතේ ආදර්ශන 114 ක් 2019 වර්ෂයේ පිහිටුවන ලදි. එම ආදර්ශන තුළ මිරිස්, මාළු මිරිස් වැනි බෝග වගා කර ඇත.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟාවීම - 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | වියදම / ආයෝජනය (රු.මි.) | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 01. | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුළ ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීම | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය භාවිතය සඳහා යොමු වූ ගොවීන් ගණන | 40,000 | 50,000 | 2.243 | - |
| 02. | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය | - ගුණාත්මක බිත්තර වී නිෂ්පාදිත ප්‍රමාණය (බුසල්) | 50,000 | 70,000 | 3.061 | - |
| | | - නිෂ්පාදිත ගුණාත්මක අතිරේක ආහාර බෝග බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 80,000 | 120,000 | | |
| 03. | පරිසර හිතකාමී කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය | අඩු කෘෂි රසායන භාවිතා කර යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යටතේ බෝග වගාව සඳහා යොමු කල වගා වපසරිය (ha) | 400 | 600 | | - |
| 04. | වාණිජ කෘෂි කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය | වාණිජ කෘෂි කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සඳහා යොමු වූ ගොවීන් සංඛ්‍යාව | 100 | 150 | 1.500 | - |
| 05 | ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම | අතිරේක ආහාර බෝග නිෂ්පාදනය | 40,000 | 50,000 | 2.170 | - |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| අනු අංකය | අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අරමුණු 01 | නව කෘෂි කාර්මික තාක්ෂණය ප්‍රචලිත කිරීම | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ ගොවීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය | 2.637 | 2.243 | 95 |
| 02 | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | ගුණාත්මක බීජ සුලභ වීම මඟින් නිෂ්පාදනය ඉහළ යාම | 2.670 | 3.061 | 100 |
| 03 | බෝග විවිධාංගීකරණය හා කළාපීයකරණය | වගා වපසරිය වැඩි කිරීම තුළින් නිෂ්පාදනය ඉහළ නැංවීම හා භූමියේ ඵලදායිතාවය ඉහළ නැංවීම | 2.630 | 2.170 | 95 |
| 04 | පාංශු හා ජල සංරක්ෂණය | භූමිය හා ජල භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | 0.700 | 0.653 | 100 |
| 05 | කෘෂි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම | පළාත තුල කෘෂි ව්‍යාපාර ඇති කිරීම හා ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීම | 1.600 | 1.500 | 100 |
| 06 | පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය | කෘෂි රසායන අඩුවෙන් භාවිතා කර යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යටතේ බෝග වගාව සඳහා යොමු කළ වගා වපසරිය (හෙක්ටයාර) | 6. 000 | 4.35 | 73 |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණය

| අංක | ව්‍යාපෘතිය | විෂය පථයට හසුවන අරමුණ | මුදල රු.මි | | කෙටිකාලීන/දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | |
| 1. | වැව් ගම් පුබුදුව (CRIWMP) | වැව් පද්ධති වැඩි දියුණු කිරීම, විමධ්‍යගත ජල සම්පාදන හා කළමනාකරණ විසඳුම් වැඩි දියුණු කිරීම, ගංවතුර හා නියඟ තත්ත්වයන් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීම | 8.63 | 8.63 | 1.පරිසර හිතකාමී ගෙවතු වගා ස්ථාපනය වීම<br><br>2. පාංශු සංරක්ෂණය මගින් පාංශු ඛාදනය වැළැක්වීම හා භූගත ජලය පෝෂණය වීම. |
| 2. | පාරිසරික සංවේදී කලාප පිහිටුවීම (ESA) | ප්‍රධාන පාරිසරික සංවේදී ප්‍රදේශවලට ආසන්නයේ පවතින ප්‍රදේශ සංරක්ෂණය කිරීම | 5.40 | 3.17 | 1.පරිසර හිතකාමී ගෙවතු වගා ස්ථාපනය වීම<br><br>2. පරිසර හිතකාමී ක්‍රමවේද ලෙද පැරණුට් වගාව,GAP වැඩසටහන සඳහා ගොවීන් යොමුවීම. |
| 3. | මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීම | අමතර ආදායම් මාර්ග ඇති කිරීම, පවුලේ එළවළු හා පළතුරු පරිභෝජනය ඉහළ දැමීම සඳහා ගෙවතු වගා ඇති කිරීම, පාංශු සංරක්ෂණ ක්‍රම ඇති කිරීම, අවම ජල පරිභෝජනයට හුරු වීම, ක්ෂුද්‍ර ජල පරිභෝජනයට හුරුවීම, කාන්තා ගොවි සංවිධාන බල ගැන්වීම, නව තාක්ෂණික උපකරණ හා දැනුම ලබාදීම | 5.52 | 5.48 | ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාව දියුණු කිරීම හා වර්ෂා ජලයෙන් වගා කරන ගොවි පවුල් සඳහා නම්‍යශීලී ජීවනෝපාය ක්‍රම හඳුන්වාදීම, වැසි දියෙන් ගොවිතැන් කරන ගොවි ජනතාවට දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දිය හැකි විකල්ප ආදායම් මාර්ග හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම. |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ.අ | ව්‍යාපෘතිය | විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | කෙටිකාලීන දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ(රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1. | පාංශු සංරක්ෂණ වැඩසටහන | බඩ ඉරිඟු වගාව සිදු කරන ඉඩම් තුළ පාංශු සංරක්ෂණය | 0.755 | 0.7 | 100 | 93 | පාංශු සංරක්ෂණය වීම තුළින් ඉඩමේ ඵලදායිතාවය ඉහළ නැංවීම හා කෘෂිකාර්මික තිරසර භාවය, ගොවීන්ගේ දැනුවත් බව වැඩි වීම |
| 2. | කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන | නව තාක්ෂණය ප්‍රචලිත කිරීම තුළින් කෘෂිකාර්මික සංවර්ධනය | 10.8 | 10.8 | 100 | 100 | ගොවීන්ට නව තාක්ෂණික උපකරණ ලබා දීම, නව කෘෂිකාර්මික තාක්ෂණය ගොවීන් අතර ප්‍රචලිත වීම |
| 3. | සේනා දළඹුවාගේ හානිය කළමනාකරණය සඳහා විශේෂ වැඩසටහන | සේනා දළඹුවා පාලනය කිරීම මඟින් හානිය අවම කිරීම | 1.0 | 1.0 | 100 | 100 | සේනා දළඹුවා පැතිරීම පාලනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, පෝස්ටර්, බැනර් ප්‍රදර්ශනය කිරීම හා අත්පත්‍රිකා බෙදා හැරීම ආදිය තුළින් ප්‍රජාව දැනුවත් කිරීම |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | කෙටි කාලීන | දිගු කාලීන |
| බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මය ඉහළ නැංවීම | අක්කර 01 බිත්තර වී නිෂ්පාදන වැඩසටහන්, කෙටි කාලීන වී ප්‍රභේද සඳහා ස්වයං බීජ නිෂ්පාදන වැඩසටහන්, බිත්තර වී නිෂ්පාදනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම අතිරේක බෝග නිෂ්පාදන වැඩසටහන් (කව්පි, කුරක්කන්, උඳු) | 15000 (බුසල්) රු.මි. 1.22 | 2000 බුසල් | ගුණාත්මක බිත්තර වී සුලභ කිරීම | නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම |
| නව තාක්ෂණය හා යහපත් කළමනාකරණ පිළිවෙත් හඳුන්වාදීම | නිලධාරීන්ගේ හා ගොවීන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා, නිලධාරී පුහුණු, ක්ෂේත්‍ර දිනබෝග සායන හා බෝග රැලි, කෘෂි රසායන අලෙවි සහායකයින් සහ පුහුණු වැඩසටහන් | රු.මි. 17.52 | - | ගොවීන්ගේ දැනුම, ආකල්ප හා සංවර්ධනය | නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම |
| බෝග විවිධාංගිකරණය හා බෝග කළාපීයකරණය | කව්පි, බඩඉරිඟු හා මුං වගාව වර්ධනය, කුඹුරු ඉඩම්වල බඩඉරිඟු වගා කරන ගොවීන් සහා අතුරුයත් ගෑමේ උපකරණ ලබා දීම, වැඩි අස්වනු රටකජු වගා පිහිටුවීම, ලොකුළුණු වගාව, තිරසර ගොවිපල සහා බහු වාර්ෂික බෝග ලබාදීම | රු.මි. 4.75 | - | වගා වපසරීන් ඉහළ නැංවීම | නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම |
| ගෙවතු වගාව සංවර්ධනය | බෝ නොවන රෝග නිවාරණ වැඩසටහන යටතේ ගෙවතු වගා සංවර්ධනය | රු.මි. 1.00 | - | පවුල් ඒකකයට පාරිභෝජන අවශ්‍ය එළවළු පළතුරු ගෙවත්ත තුළ නිෂ්පාදනය (කෘෂි රසායන වලින් තොර) | බෝ නොවන රෝග වලට පාත්‍රිතාව අවම වීම |

ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය ඉතිරි කොටස..

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්ක | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | | 2020 | කෙටිකාලීන | දිගු කාලීන |
| පාංශු හා ජල සංරක්ෂණය | ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ලබාදීම, වගා ලිං යටතේ එළවළු වගාව | 37.5 Ac<br>රු.මි. 1.76 | භූමිය හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩි කිරීම | නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම |
| අලෙවිකරණය හා තාක්ෂණය සංවර්ධනය | ආරක්ෂිත ගෘහ 02 ක් ඉදි කිරීම, පෙර අස්වනු තාක්ෂණය හඳුන්වාදීම (එලාවරණ ලබාදීම), පසු අස්වනු තාක්ෂණය හඳුන්වාදීම (ද්විත්ව ස්ථර බෑග්, Prococone ජංගම ගබඩා, බෝතල් මුද්‍රා උපකරණ) | 2<br><br>1365 | පෙර හා පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද ගොවීන්ට හඳුන්වා දීම | පසු අස්වනු හානිය අවම වීම තුළින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම |
| ඒක පුද්ගල හා කණ්ඩායම් ව්‍යවසායකයින් සංවර්ධනය | ගුණාත්මක සහල් නිෂ්පාදන වැඩසටහන, අගය එකතු කල නිෂ්පාදනය පිළිබඳ ගොවි කාන්තා පුහුණු, සුළු පරිමාණ එළවළු හා පළතුරු වියලන යන්ත්‍ර ලබාදීම | 30 | අගය එකතු කළ නිෂ්පාදකයින් සඳහා ව්‍යවසායකයින් සංවර්ධනය | ආහාර සුරක්ෂිතතාව |
| ආයතනික සංවර්ධනය | කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා යතුරු පැදි මිල දී ගැනීම, | 30 | ගුණාත්මක ව්‍යාප්ති සේවාවක් ගොවීන් වෙත සැපයීම | ගොවීන් නවීන තාක්ෂණික ක්‍රමවේදවලට අනුගතවීම තුළින් නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම |
| | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම, මහඉලුප්පල්ලම පළාත් පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම, | 4000 ගොවීන් | | |
| | නිල නිවාස වැඩි දියුණු කිරීම, අළුත්වැඩියාව හා භූමිය වෙන් කර ගැනීම | 10<br>(රු.මි. 82) | | |

## කෘෂිකාර්මික අංශයේ

## සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් 2020 – 2030

**අරමුණ : සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම**

| ඉලක්කය | පාදක වර්ෂය - 2015 | සංධිස්ථාන 01 - 2020 | සංධිස්ථාන 02 - 2025 | සංධිස්ථාන 03 - 2030 |
|---|---|---|---|---|
| 1. 2030 වන විට වී වගාවේ ඵලදායීතාවය 5.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 4. 0 mt/Ha | 4.2 mt/Ha | 4.5 mt/Ha | 5.0 mt/Ha |
| 2. 2030 වන විට මුං වගාවේ ඵලදායීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 0 mt/Ha | 1.2 mt/Ha | 1.6 mt/Ha | 2.0 mt/Ha |
| 3. 2030 වන විට මුං වගා වපසරිය 2000 Ha දක්වා ඉහළ නැංවීම | 507 Ha | 750 Ha | 1250 Ha | 2000 Ha |
| 4. 2030 වන විට උඳු වගාවේ ඵලදායීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 1 mt/Ha | 1.3 mt/Ha | 1.6 mt/Ha | 2.0 mt/Ha |
| 5. 2030 වන විට කව්පි වගාවේ ඵලදායීතාවය 1.5 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 0 mt/Ha | 1.1 mt/Ha | 1.3 mt/Ha | 1.5 mt/Ha |
| 6. 2030 වන විට කව්පි වගා වපසරිය 1500 Ha දක්වා ඉහළ නැංවීම | 542 Ha | 750 Ha | 1000 Ha | 1500 Ha |
| 7. 2030 වන විට සෝයා වගාවේ ඵලදායීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 5 mt/Ha | 1.6 mt/Ha | 1.8 mt/Ha | 2.0 mt/Ha |
| 8. 2030 වන විට සෝයා වගා වපසරිය 1500 Ha දක්වා ඉහළ නැංවීම | 109.5 Ha | 500 Ha | 1000 Ha | 1500 Ha |

| ඉලක්කය | පාදක වර්ෂය - 2015 | සංධිස්ථාන 01 - 2020 | සංධිස්ථාන 02 - 2025 | සංධිස්ථාන 03 - 2030 |
|---|---|---|---|---|
| 9. 2030 වන විට කුරක්කන් වගාවේ ඵලදයීතාවය 1.8 mt/Ha දක්වා ඉහළ නැංවීම | 0.8 mt/Ha | 1.0 mt/Ha | 1.4 mt/Ha | 1.8mt/Ha |
| 10. 2030 වන විට රටකජු වගා වපසරිය 1000 Ha දක්වා ඉහළ නැංවීම | 227 Ha | 400 Ha | 700 Ha | 1000 Ha |
| 11. 2030 වන විට ලොකු ළූණු වගාවේ ඵලදයීතාවය 25 mt/Ha දක්වා ඉහළ නැංවීම | 16 mt/Ha | 18 mt/Ha | 20 mt/Ha | 25 mt/Ha |
| 12. 2030 වන විට ලොකු ළූණු වගාව 1500 Ha දක්වා ඉහළ නැංවීම | 1061 Ha (231 Ha / 2017) | 1000 Ha | 1250 Ha | 1500 Ha |
| 13. 2030 වන විට ඵලවළු හා පළතුරු වල පසු අස්වනු හානිය 30% දක්වා පහළ දැමීම | 40% | 38% | 35% | 30% |
| 14. 2030 වන විට 1000 Ha අඹ වගාවන් අවාරයේ ඵල උත්තේජනයට යොමු කිරීම | 10 Ha | 200 Ha | 500 Ha | 1000 Ha |
| 15. 2030 වන විට ඵල දරණ අඹ වගාවන්හි ඵලදායීතාවය නැංවීම සඳහා ගස් කප්පාදුව100% කිරීම | 10% | 30% | 60% | 100% |
| 16. සෞඛ්‍ය ආරක්ෂිත කෘෂි නිෂ්පාදන සුලභ කිරීම සඳහා කෘෂිරසායන භාවිතය අවම කරමින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරමින් වගාකරන වගා වපසරිය 2030 වන විට 1200 Ha දක්වා ඉහළ නැංවිම | 20 Ha | 200 Ha | 700 Ha | 1200 Ha |

| ඉලක්කය | පාදක වර්ෂය - 2015 | සංධිස්ථාන 01 - 2020 | සංධිස්ථාන 02 - 2025 | සංධිස්ථාන 03 - 2030 |
|---|---|---|---|---|
| 17. කාලගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා භූගත ජලමට්ටම ඉහළ නැංවීමට හා මතුපිට පස ආරක්ෂාකර ගැනීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කරන වගා ඉඩම් ප්‍රමාණය 2030 වන විට 6000 Ha දක්වා ඉහළ නැංවීම | 60 Ha | 2000 Ha | 4000 Ha | 6000Ha |
| 18. උතුරු මැද පළාත තුළ පාරිභෝජනය සඳහා ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂක ආහාර සුලබ කිරීම සඳහා දේශීය ආහාර අලෙවිසැල් හා GAP අලෙවිසැල් 40 ක් 2030 වනවිට ස්ථාපනය කිරීම | 0 | 20 | 30 | 40 |
| 19. පවුලේ පෝෂණය හා ආර්ථිකය ඉහළ නැංවීම සඳහා 2030 වන විට ගෙවතු ඒකක 25000 ක් තිරසාර ඒකකයක් ලෙස සංවර්ධනය කිරීම | - | 6000 | 16000 | 25000 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

දේශගුණික විපර්යාසයන් හා වෙනස් වූ කාළගුණික තත්ත්වයන් නිසා සිදු වූ පාරිසරික බලපෑම් හමුවේ හා ආයතනයේ කාර්යමණ්ඩලය හිඟවීම තුළ වුවද (විශේෂයෙන් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා කෘෂි උපදේශකවරුන්ගේ ඌනතාවය) සමස්තයක් වශයෙන් ඉහළ කාර්ය සාධනයක් ලබා ගත් වර්ෂයක් බව කිව හැකිය. එසේම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පාර්ශවකරුවන්ගේ සහයෝගය ප්‍රමාණවත්ව ලැබීම නිසා බොහෝ ව්‍යාපෘති කටයුතු සාර්ථක කර ගැනීමට හැකියාව ලැබුණි.

කාර්ය සාධනය කරා ළඟා වීමේ දී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස කෘෂිකාර්මික සේවයේ නිලධාරින්ගේ හිඟය නිසා ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු හොඳින් සිදු කිරිමට අපහසු වීම, 2019 අග භාගයේ අධික වර්ෂා තත්වය හේතුවෙන් වගා හානි සිදු වීම.(උදා- එළවළු), බඩ ඉරිඟු වගාව සඳහා සේනා දළඹු හානිය වසංගත රෝගයක් ලෙස පැතිරීම, යල කන්නයේ වර්ෂාපතන රටාව අක්‍රමවත් වීම නිසා වර්ෂා පෝෂිත වගාවන් අසාර්ථක වීම.(උදා- තල), යල කන්නයේ ඉලක්ක සම්පූර්ණකර ගැනීම සඳහා සුළු වාරි කර්මාන්තයේ ජලය ප්‍රමාණවත් නොවීම, වසරේ මුල් කාර්තු තුනේදී ප්‍රමාණවත් ව්‍යාප්ති නිලධාරීන් නොසිටීම හා ගොවීන් තුළ කව්පි,මුං යන බෝග වගාවන් කිරීමට ඇති නැඹුරුතාවය අඩු වීම දැක්විය හැකිය.

# 7.2. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත පශු සම්පත් අංශයෙන් සංවර්ධන කිරිමට පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යක් ඉටු කරනු ලබයි. සත්ත්ව පාලනයේ නියැලෙන ගොවීන්ට සේවය ලබා දිම පිණිස පශු වෛද්‍ය කාර්යාල 29 ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවා තිබේ. සත්ත්ව අභිජනනය, සත්ත්ව සෞඛ්‍ය හා සත්ත්ව පාලන ව්‍යාප්ති සේවාව පවත්වාගෙන යෑමේ ප්‍රධාන කාර්යයන් මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලැබේ. සත්ත්ව සෞඛ්‍ය සේවය යටතේ රෝග මර්දන කටයුතු හා ප්‍රතිකාර කටයුතු ඉටු කෙරේ.

කෘතිම සිංචන ප්‍රවර්ධනය ප්‍රධාන කොට සත්ත්ව අභිජනනය මගින් උසස් ආරයේ කිරි ගවයින් බෝ කර ගැනිම හා වැස්සි පැටවුන් රැක බලා ගැනිමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවිම පිණිස සත්ත්ව පාලන ව්‍යාප්ති සේවා පවත්වා ගෙන යන අතර, කිරි ගොවිපල සංවර්ධනය, එළු ගොවිපල සංවර්ධනය, නිදැලි කුකුළු ව්‍යාපෘති, අගය එකතු කිරිම, ගොවි පුහුණු හා ධාරිතා සංවර්ධන කටයුතු සඳහා 2019 වර්ෂයේ මුලධන අයෝජන යෙදවිමට සැලසුම් කර ඇත.

**සත්ත්ව ගහනය හා ගොවිපල් පිළිබඳ තොරතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය 2015 – 2018**

| වර්ගය | අනුරාධපුර දිස්ත්‍රික්කය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොවිපල් සංඛ්‍යාව | | | | සතුන් සංඛ්‍යාව | | | |
| | 2015 | 2016 | 2017 | 2018 | 2015 | 2016 | 2017 | 2018 |
| එළ ගව | 27,023 | 28,598 | 27,225 | 28,602 | 113,900 | 119,287 | 126,118 | 130,530 |
| මී ගව | 1,620 | 1,599 | 1,581 | 1,275 | 32,610 | 31,267 | 32,783 | 36,517 |
| එළු | 2,299 | 1,941 | 1,700 | 1,734 | 29,878 | 29,604 | 29,168 | 35,266 |
| සූකර | 449 | 383 | 253 | 288 | 8,870 | 10,274 | 11,351 | 11,377 |
| කුකුළු | 11,200 | 11,870 | 14,599 | 14,171 | 405,401 | 613,716 | 3,047,614 | 1,454,472 |
| **එකතුව** | **42,591** | **44,391** | **45,358** | **46,070** | **590,659** | **804,148** | **3,247,034** | **1,668,162** |

මුලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## සත්ත්ව ගහනය හා ගොවිපල් පිළිබඳ තොරතුරු - පොළොන්නරුව දිස්ත්‍රික්කය 2015 – 2018


| වර්ගය | පොළොන්නරුව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොවිපල් සංඛ්‍යාව | | | | සතුන් සංඛ්‍යාව | | | |
| | **2015** | **2016** | **2017** | **2018** | **2015** | **2016** | **2017** | **2018** |
| එළ ගව | 10,185 | 12,406 | 13,445 | 12,642 | 63,100 | 72,591 | 71,390 | 81,093 |
| මී ගව | 682 | 740 | 938 | 796 | 22,110 | 25,406 | 21,603 | 25,428 |
| එළු | 857 | 916 | 1,129 | 953 | 8,220 | 9,175 | 13,813 | 17,273 |
| සූකර | 640 | 175 | 90 | 90 | 4,550 | 5,529 | 4,931 | 5,016 |
| කුකුළු | 8,750 | 9,124 | 6,953 | 5,033 | 642,000 | 438,358 | 3,469,278 | 3,306,281 |
| එකතුව | **21,114** | **23,361** | **22,555** | **19,514** | **739,980** | **551,059** | **3,581,015** | **3,435,091** |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාතේ සත්ත්ව ගොවිපළ සංඛ්‍යාව 2015-2018

| වර්ගය | සත්ත්ව ගොවිපල සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** |
| එළ ගව | 37,208 | 41,004 | 40,670 | 41,244 |
| මී ගව | 2,302 | 2,339 | 2,519 | 2,071 |
| එළු | 1,714 | 2,857 | 2,829 | 2,687 |
| සූකර | 1,089 | 558 | 343 | 378 |
| කුකුළු | 19,950 | 20,994 | 21,552 | 19,204 |
| එකතුව | **64,278** | **69,768** | **69,930** | **67,602** |


මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව



## උතුරු මැද පළාතේ සත්ත්ව සංඛ්‍යාව 2015-2018

| වර්ගය | සත්ත්ව සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** |
| එළ ගව | 177,000 | 145,182 | 197,508 | 211,623 |
| මී ගව | 54,720 | 56,673 | 54,386 | 61,945 |
| එළු | 38,098 | 38,779 | 42,981 | 52,539 |
| සූකර | 13,420 | 15,803 | 16,282 | 16,393 |
| කුකුළු | 1,047,401 | 1,052,074 | 6,516,892 | 4,760,753 |
| **එකතුව** | **1332654** | **1310527** | **6830066** | **5105271** |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව




## වාර්ෂික කිරි නිෂ්පාදනය 2015-2018

| දිස්ත්‍රික්කය | කිරි ලීටර් (මිලියන) | | | | සුළු පරිමාණ සැකසුම්කරුවන් | | | | අගය එකතු කළ කිරි ප්‍රමාණය (ලීටර් මිලියන) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** | **2015** | **2016** | **2017** | **2018** | **2015** | **2016** | **2017** | **2018** |
| අනුරාධපුර | 23.38 | 24.67 | 34.6 | 34.18 | 81 | 81 | 80 | 128 | 2.0 | 2.0 | 1.9 | 2.44 |
| පොළොන්නරුව | 13.27 | 10.90 | 14.6 | 9.96 | 17 | 17 | 20 | 39 | 0.9 | 0.9 | 1.6 | 1.96 |
| **එකතුව** | **36.65** | **35.57** | **49.2** | **44.14** | **98** | **98** | **100** | **167** | **2.9** | **2.9** | **3.5** | **4.4** |

මූලාශ්‍රය:- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## මස් සහ බිත්තර නිෂ්පාදනය 2015 - 2018

| විස්තරය | අනුරාධපුර (මෙ.ටො) | | | | පොළොන්නරුව (මෙ.ටො) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2015 | 2016 | 2017 | 2018 |
| ගව මස් | 2,570.50 | 1,143.94 | 1486.44 | 1,796.35 | 777.80 | 415.40 | 333.00 | 334.00 |
| එළු මස් | 41.40 | 41.78 | 17.54 | 22.94 | 24.00 | - | 0.00 | 0.00 |
| ඌරු මස් | 25.7 | 79.39 | 199.26 | 76.40 | 19.00 | - | 0.00 | 0.00 |
| කුකුළු මස් | 3,078.10 | 2,493.00 | 4,241.81 | 1,302.30 | 2,578.00 | 3,600.00 | 5,889.00 | 6,623.60 |
| **එකතුව** | **5,715.70** | **3,758.11** | **5,945.05** | **3,179.99** | **3,398.80** | **4,015.40** | **6,222.00** | **6,957.60** |
| බිත්තර (මිලියන) | 23.41 | 23.67 | 25.53 | 23.98 | 11.82 | 14.15 | 16.04 | 16.62 |

මුලාශ්‍රය:- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## පළාතේ පශු වෛද්‍ය කාර්යාලය (29) අනුරාධපුර දිසුත්‍රික්කය (22) පොළොන්නරුව දිස්ත්‍රික්කය (07)

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

| | |
|---|---|
| නැගෙනහිර නුවරගම් පළාත | නාච්චාදූව |
| රඹෑව | තලාව |
| මැදවච්චිය | තඹුත්තේගම |
| කැබිතිගොල්ලෑව | නොච්චියාගම |
| පදවිය | රාජාංගනය |
| මිහින්තලේ | ඉපලෝගම |
| කහටගස්දිගිලිය | පලාගල |
| හොරොව්පොතාන | ගල්නෑව |
| තිරප්පනේ | මධ්‍යම නුවරගම් පළාත |
| කැකිරාව | විලච්චිය |
| ගලෙන්බිදුණුවැව | පලුගස්වැව |

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

| | |
|---|---|
| පොළොන්නරුව | ලංකාපුර |
| මින්නේරිය | මැදිරිගිරිය |
| බකමූණ | වැලිකන්ද |
| අරංගල | |

## දැක්ම

“ නිරෝගී හා ඵලදායී පශු සම්පතක්, ඉසුරුමත් ප්‍රජාවක් ”

## මෙහෙවර

“ පශු සම්පත්, සත්ත්ව නිෂ්පාදන හා එහි ඵලදායිතාවය, වෙළඳපොල සහ ඒ ආශ්‍රිත පරිසර ආරක්ෂාව සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම ”.

## දිගු කාලීන අරමුණු

දේශීය කිරි නිෂ්පාදනයට උතුරු මැද පළාතේ 2016 වසරෙහි පැවති දායකත්වය වන 10% 2020 වසර වනවිට 30% දක්වා ඉහළ නැංවීම.

## කෙටි කාලීන අරමුණු

- ගොවිපළ සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීම.
- සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම.
- සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

ප්‍රශස්ත සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබා දීම තුළින් සත්ත්ව සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීමත්, ආරය උසස් කිරීම මගින් නිෂ්පාදන ධාරිතා වර්ධනය කර ගැනීමත් සහ තාක්ෂණ ප්‍රචාරණය මගින් උචිත නිෂ්පාදන ක්‍රමවේද ප්‍රචලිත කිරීම.

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු

**අරමුණු අංක -02**

**සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයක් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.**

2.1. 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී,පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි වීම.

2.3. 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවරු කිරීම.

2.4. 2020 වන විට බීජවල,වගා කරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවිධත්වය පවත්වාගෙන යාම.

2.a. කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම්,කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන් තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජනය වැඩි කිරීම.

**අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 12**

**තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.**

12.1. තිරසර පරිබෝජනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩ සැලැස්ම සංවර්ධනය වු රටවල ප්‍රධානත්වයෙන් සියළුම රටවල් විසින් ක්‍රියාත්මක කිරීම.

12.2. 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම හා කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ළඟා වීම.


12.3 2030 වන විට සිල්ලර හා පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්වාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැලසුම් දාමයන්හී සිදුවන්නා වු අපතේ යාම අවම කිරීම.

12.4. 2020 වන විට පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියළුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම.

12.8. 2030 වන විට සියළුම ප්‍රදේශවල සිටින සියළුම දෙනාට තිරසර සංවර්ධනය හා ස්වභාධර්මය සමග සුසංයෝගයෙන් යුත් ජිවන රටාවන් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවය තහවරු කිරීම.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත | 395 |
| සේවයේ නියුතු | 255 |
| පුරප්පාඩු | 137 |
| අතිරික්ත | 15 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 152.69 | 147.13 | 5.56 | 96 |
| ගමන් වියදම් | 8.85 | 8.85 | 0.00 | 100 |
| සැපයීම් | 5.55 | 5.53 | 0.02 | 99 |
| නඩත්තු වියදම් | 6.24 | 6.23 | 0.01 | 99 |
| ගිවිසුම්ගත සේවා | 5.36 | 5.19 | 0.17 | 97 |
| මාරු කිරීම් | 1.20 | 0.99 | 0.21 | 83 |
| **එකතුව** | **179.89** | **173.92** | **5.97** | **97** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අනු අංකය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රධාන ක්‍රියාකාරකම | ශුද්ධ අපේක්ෂිත ප්‍රතිඵල (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | අතිරේක පළාත් අධ්‍යක්ෂ නිලනිවාසය අළුත්වැඩියාව | 0.108 | 01 |

## මුලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 7.41 | 3.76 | 3.65 | 51 |
| වාහන | 1.50 | 0.00 | 1.50 | 0 |
| මුලධන වත්කම් අත්පත් කර ගැනීම | 26.36 | 6.85 | 19.51 | 26 |
| ධාරිතා සංවර්ධනය | 2.03 | 1.16 | 0.87 | 57 |
| වෙනත් මුලධන වත්කම් | 69.20 | 53.84 | 15.36 | 78 |
| **එකතුව** | **106.50** | **65.60** | **40.90** | **62** |

## ආදායම් ඉපයීම්- පළාත් සභා

| ආදායම් ඉපයීම් විස්තරය | 2019.12.31 ලැබීම් (රු.ශත) |
|---|---|
| පශු ඖෂධ | 157,018.34 |
| පත්‍රිකා අලෙවිය | 1,442.00 |
| සත්ව ප්‍රතිකාර | 45,784.00 |
| සෞඛ්‍ය සහතික | 597,910.00 |
| මරණ සහතික | 10,850.00 |
| උපදේශන සේවා | 29,960.00 |
| කිකිළි පැටව් අලෙවිය | 13,153,850.00 |
| තෘණ දඬු අලෙවිය | 141,200.00 |
| අලාභ අයකිරීම් | 2,230.00 |
| එළු පොහොර අලෙවිය | 14;680.00 |
| එළුවන් අලෙවිය | 230,420.00 |
| එළවළු අලෙවිය | 100,525.00 |
| කෘතිම සිංචන | 164,140.00 |
| එකතුව | **14,760,369.85** |

## අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු,ඉලක්ක හා නිමවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්කහා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය |
| අරමුණු .2. සාගින්න නැතිකර,ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරිම | 2.2,2.3,2.4 | සංවර්ධිත ගොවිපල 100 | 20.00 | 19.80 |
| | | ජංගම සායන 350 | 0.95 | 0.82 |
| | | කෘතිම සිංචනයෙන් බිහිවු වැස්සි පැටවුන් 1500 | 1.50 | 1.34 |
| | | පට්ටිවස්සන් 100ක් සැපයිම, කෘතිම සිංචනයෙන් බිහිවු වසු පැටවුන් 100 පෝෂණය | 4.00 | 3.95 |
| | | හේ බේලර් 02 සත්ව නිෂ්පාදන සමිති වෙත ලබාදිම | 2.00 | 1.91 |
| | | එළගවයින් හා මී ගවයින්ගේ වසංගත රෝග නිවාරණය සඳහා එන්නත් කිරිම | 2.50 | 2.38 |
| | | පට්ටි වස්සන් 30 සැපයිම | 0.95 | 0.95 |
| | | ගොවිපල් 1500 ස්ථාපනය | 4.00 | 4.00 |
| | 2.3 | ව්‍යවසායකයින් 15 සංවර්ධනය | 1.50 | 1.44 |
| | | අලෙවිසැල්15 ක් ස්ථාපණය | 3.90 | 3.37 |
| අරමුණු .3. නිරෝගි ජිවිත සහතික කර සැම වයසක සිටිනසියල්ලන් ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරිම | 3.3, 3.4, | ගොවිපල් 600 | 1.80 | 1.72 |
| | | A2 ප්‍රෝටිනය සහිත සතුන් හඳුනා ගැනිම | 0.90 | 0.84 |

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්කහා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය (රු. මි) | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය |
| අරමුණු .8. සියල්ලන් සඳහාමපෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය,පූර්ණ, ඵලදායි සහ රැකියා ප්‍රවර්ධනය කිරිම | 8.2,8.3,8.4,8.6 | ගොවින් 2,000 පුහුණුව | 2.00 | 1.30 |
| | | සත්ත්ව නිෂ්පාදන සමිති දිරි ගැන්විම | 1.50 | 0.96 |
| | | ගොවින් සඳහා ත්‍යාග ලබාදිම | 1.00 | 0.78 |
| | | ගෘහ භාණ්ඩ ලබා දීම | 1.35 | 0.59 |
| | | වැඩ කිරිම සඳහා යහපත් පරිසරයක් ඇති කිරිම | 1.64 | 1.48 |
| | | වැඩ කිරිම සඳහා යහපත් පරිසරයක් ඇති කිරිම | 1.00 | 0.94 |
| | | වැඩ කිරිම සඳහා යහපත් පරිසරයක් ඇති කිරිම | 0.76 | 0.67 |
| | | වැඩ කිරිම සඳහා යහපත් පරිසරයක් ඇති කිරිම | 2.00 | 1.99 |
| | | දත්ත කළමණාකරණ පද්ධතිය ස්ථාපනය | 7.00 | - |
| | | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | 1.50 | 1.17 |
| | | නිලධාරි පුහුණුව | 2.03 | 1.16 |
| | | වැඩ කිරිම සඳහා යහපත් පරිසරයක් ඇති කිරිම | 1.18 | - |
| | | එකතුව | **65.32** | **53.62** |

## සංවර්ධන ව්‍යාපෘති මගින් කෙටිකාලිනව අපේක්ෂා කරන ප්‍රතිලාභ

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලින බලපෑම් (outcomes) |
|---|---|---|
| 01. | කිරි ගොවිපළ සංවර්ධනය | පවුලේ මාසික ආදායම ඉහළ යෑම, නවින තාක්ෂණයට යොමුවිම |
| 02. | කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය | විවෘත වෙළපොළේ තරඟකාරිත්වයට මුහුණ දිමට හැකිවිම |
| 03. | නිදැළි කුකුල් පාලනය ප්‍රවර්ධනය | ස්වයං රැකියා ජනිත විම, පවුලේ ප්‍රෝටින අවශ්‍යතාවය සපුරාගත හැකිවිම |
| 04. | ගොවි පුහුණුව | නවින තාක්ෂණයට ගොවින් හුරු කිරිම |
| 05. | නිලධාරි පුහුණුව | දැනුම යාවත්කාලීන කිරිම |
| 06. | ජංගම සායන පැවැත්විම | සත්ත්ව රෝග වසංගත අවම විම, හඳුනාගත් ගොවිපළ ගැටළු වලට වහා විසඳුම් ලබා දිමට හැකිවිම |
| 07. | කිරි ගව පෝෂණය ඉහළ නැංවිම | අනපේක්ෂිත ස්වභාවික උවදුරුවලට (නියඟය) මුහුණදිමට හැකි විම |
| 08. | ගෘහ භාණ්ඩ හා කාර්යාලිය උපකරණ ලබා දිම/පශු වෛද්‍ය කාර්යාල ඉදිකිරිම | යහපත් වැඩ කිරිමේ වටපිටාවක් සැලසිම |

## දිගුකාලින හා කෙටිකාලින අරමුණු ඉටුකර ගැනිම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

### පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන නව වැඩ ව්‍යාපෘති

| අ.අ | අරමුණ | අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කරණ ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල රු.මි. | 2019.12.31 | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
| 1 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | ගොවි පුහුණුව | නවින තාක්ෂණික දැනුම ලබා දිම | 2621 | 29 | 2.00 | 100 | 100 |
| 2 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | නිලධාරි ධාරිතා සංවර්ධනය | නවින තාක්ෂණික දැනුම ලබා දිම | සියළුම නිලධාරින් | 29 | 2.03 | 100 | 57 |
| 3 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | නිදැලි කුකුළු පාලනය ප්‍රවර්ධනය කිරිම | මාසයක් වයසැති කිකිළි පැටවුන් ලබා දිම, පුහුණු කිරිම | 1000 | 29 | 4.00 | 100 | 100 |
| 4 | i.ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනිම ii.සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | කාර්යක්ෂම පශු වෛද්‍ය සේවාවක් ලබා දිමට ජංගම සායන පැවැත්වීම | රෝග පරික්ෂාව, අභිජනන ගැටළු විසදිම, ගොවිපල් කලමණාකර ණය පිළිබද දැනුවත් කිරිම, ගොවිපල් ලියාපදිංචිය, කණ් සළකුණු කිරිම, ව්‍යාපෘති පසුවිපරම | සායන 332 | 29 | 0.95 | 94 | 86 |

| අ.අ | අරමුණ | අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභින් ගණන | ආවරණය කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල රු.මි. | 2019.12.31 | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
| 5 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | ස්වභාවික අභිජනනය ප්‍රවර්ධනය | අභිජනන ගැටළු විසදීම, ගොවිපල් කලමණාකරණය පිළිබඳ දැනුවත් කිරිම, පට්ටි වස්සන් මිලදීගැනිම | 100 | 26 | 3.10 | 100 | 100 |
| 6 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | එළු ගොවිපල සංවරධනය | එළුවන් සැපයිම,එළුගාල් ඉදිකිරිම | 31 | 17 | 0.95 | 100 | 100 |
| 7 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | බුරුළු ප්‍රදාහය වැලැක්විම සදහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදිම | නවීන තාක්ෂණික දැනුම ලබා දිම උපකරණ ලබාදිම | පොදු | 29 | 1.80 | 88 | 95 |
| 8 | වැඩ කිරිම සඳහා යහපත් පරිසරයක් ඇතිකිරිම | කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ ලබාදිමහා ගෘහභාණ්ඩ ලබාදිම | උපකරණ හා ගෘහභාණ්ඩ ලබාදිම | පොදු | 14 | 1.35 | 90 | 94 |

| අ.අ | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කරන ලද ප්‍රා.ලේ කො.ගණන | වෙන් කළ මුදල (රු.මි.) | 2019.12.31 | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
| 09 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම | කෘත්‍රිම සිංචන ප්‍රවර්ධනය | කෘතිම සිංචනයෙන් බිහි වු වැස්සි පැටවුන් සඳහා කිණිතුළු බෙහෙත්,බණිජ , පණුබෙහෙත් ලබා දිම | සියළුම සත්ත්ව පාලන ගොවීන් | 29 | 1.50 | 100 | 90 |
| 10 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම | සත්ත්ව පෝෂණ සම්පත් ඉහල නැංවීම | තෘණ වගාව, සයිලේජ් නිෂ්පාදනයට ගොවින් යොමු කිරිම, හේ බේලර් මිලදි ගැනිම | සියළුම සත්ත්ව පාලන ගොවීන් | 29 | 2.00 | 100 | 95 |
| 11 | කිරි ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමිතිය ඉහළ නැංවීම | කිරි ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම | සෞඛ්‍ය ආරක්ෂිත කිරි නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරිම, කිරි සාම්පල් ප්‍රමිතිය පරික්ෂාව, කිරි නිෂ්පාදනාගාර වැඩිදියුණු කිරිම, උපකරණ ලබාදිම | 15 | 13 | 1.50 | 100 | 96 |
| 12 | i.ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වා ගැනිම ii.සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම | කිරි ගොවිපල වල යටිතල පහසුකම් සංවර්ධනය | ගවගාල් ඉදි කිරිම තෘණ කැබිළිකිරිමේ යන්ත්‍ර,කිරි දෙවිමේ යන්ත්‍ර, කිරි ගවයින් මිලදි ගැනිම සයිලේජ් නිෂ්පාදනය ,තෘණ වගා ස්ථානය, සයිලේජ් බැරල් මිලදි ගැනිම | 100 | 29 | 20.00 | 100 | 99 |

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කරණ ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල (රු.මි). | 2019.12.31 භෞතික ප්‍රගතිය (%) | 2019.12.31 මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 13 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම | පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාව ගළෙන් බිදුණුවැව | පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාවන් | සියළුම සත්ත්ව පාලන ගොවින් | 01 | 1.64 | 100 | 90 |
| 14 | | දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාව | දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාවන් සිදුකිරිම | එම | 22 | 1.18 | 100 | - |
| 15 | | පළාත් අධ්‍යක්ෂ කාර්යාලය නවිකරණය | පළාත් කාර්යාලය පාටිෂයන් කිරිම | එම | 29 | 1.00 | 100 | 94 |
| 16 | | පළාත් කාර්යාලය සංවර්ධන කටයුතු | ජලටැංකිය ඉදිකිරිම | එම | 29 | 0.76 | 100 | 88 |
| 17 | යහපත් වැඩ කිරිමේ පරිසරයක් ඇතිකිරිම | යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිළදි ගැනිම | පලාත් කාර්යාලය වායු සමනය සිදු කිරිම | | 01 | 2.00 | 100 | 99 |
| 18 | තාක්ෂණික දැනුම ලබාදිම,ප්‍රති ලාභ ලබා දිමේ විනිවද භාවය ඇතිවිම | ගොවින් බල ගැන්විම | සත්ත්ව නිෂ්පාදන සමිති පිහිටවිම | එම | 29 | 1.50 | 100 | 68 |

| අනු අංකය | අරමුණ | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කරන ලද ප්‍රා.ලේ.කො.ශ ගණන | වෙන් කළ මුදල (රු.මි) | 2019.12.31 භෞතික ප්‍රගතිය (%) | 2019.12.31 මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 19 | සත්ත්ව පාලනය ප්‍රවර්ධන කිරීම | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවීම | එළගවයින් හා මී ගවයින්ගේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම | වසංගත රෝග මර්ධනයට එන්නත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම | සියළුම සත්ත්ව පාලන ගොවින් | පොදු | 2.50 | 100 |
| 20 | | සත්ත්ව පාලන ගොවින් සහ ව්‍යවසායකයින් අභිප්‍රේරණය | හොඳම ව්‍යවසායකයා කිරිගොවියා,හොඳම පශු වෛද්‍ය කාර්යාය,පශු වෛද්‍ය නිලධාරි ,සත්ත්ව සංවර්ධන උපදේශක තේරීම | සියළුම සත්ත්ව පාලන ගොවින් | 29 | 1.00 | 100 | 78 |
| 21 | | ප්‍රදර්ශණ ඒකක ස්ථාපණය | වැඩමුළු පැවැත්වීම,නවින තාක්ෂණය හඳුන්වා දීම,ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කිරීම | සියළුම සත්ත්ව පාලන ගොවින්,පා සැල් සිසුන් සියළුම මහජනතාව | 29 | 1.50 | 100 | 78 |
| 22 | | කිරි නිෂ්පාදන ගොවිපල් හඳුනා ගැනීම A2 MILK | කිරි සාම්පල ,රුධිර සාම්පල පරික්ෂාව | සියළුම සත්ත්ව පාලන ගොවින් | 10 | 0.90 | 93 | 86 |
| 23 | | සත්ත්ව නිෂ්පාදන අලෙවි සැල් ස්ථාපණය | උපකරණ මිලදී ගැනීම, අලෙවිසැල් ස්ථාපණය | පොදු | 15 | 3.90 | 93 | 86 |

## කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක ව්‍යාපෘති

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කරණ ලද ප්‍රා.ලේ.කො ගණන | වෙන් කළ මුදල (රු.මි.) | 2019.12.31 භෞතික ප්‍රගතිය (%) | 2019.12.31 මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ස්වයං රැකියා ප්‍රවර්ධන, නිෂ්පාදන වල ප්‍රමිතිය ඉහළ නැංවීම | කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩ සටහන | උපකරණ මිලදි ගැනිම,කිරි අලෙවි සැල් ඉදිකිරිම, නිෂ්පාදනාගාර වැඩිදියුණු කිරිම<br>මාසයක් වයසැති කිකිළි පැටව් ලබාදිම | 15 | 13 | 3.5 | 100 | 90 |
| එකතුව | | | - | - | 3.50 | - | - | - |

## වෙනත් ප්‍රදාන - මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත කෘෂි කාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය 2019.12.31

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කරන ලද ප්‍රා.ලේ.කො. ගණන | වෙන් කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම | පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති | ගවගාල් ඉදිකිරීම තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර,කිරි දෙවීමේ යන්ත්‍ර, කිරි ගවයින් මිළදී ගැනීම සයිලේජ් නිෂ්පාදනය, සයිලේජ් බැරල් මිලදී ගැනීම, කුකුල් නිවාස ඉදිකිරීම,කිකිළි පැටවුන් බෙදා දීම, එළුවන් මිලදී ගැනීම, එළු නිවාස ඉදිකිරීම,ජංගම සායන පැවැත්වීම,ගොවි පුහුණුව | 123 | ලංකාපුර | 2.73 | 98 | 96 |
| 02. | | | | 98 | මැදිරිගිරිය | 6.75 | 75 | 68 |
| 03. | | පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති -UNDP | ගවගාල් ඉදිකිරීම ගොවි පුහුණුව, ක්ෂේත්‍ර චාරිකා උපකරණ මිලදී ගැනීම, කිකිළි පැටවුන් බෙදා දීම, තෘණ වගා ස්ථාපනය දියර කිරීම ප්‍රචලිත කිරීම | 255 | ලංකාපුර | 1.66 | 90 | 82 |
| 04. | | පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති -UNDP | | 400 පාසල් සිසුන් | මැදිරිගිරිය | 1.66 | 40 | 38 |
| එකතුව | | | | - | - | **12.80** | **-** | - |

## සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය - 2019

## 1. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අඛණ්ඩ ව්‍යාපෘති

### 1.1.අඛණ්ඩ ව්‍යාපෘති - අනුරාධපුර දිස්ත්‍රික්කය

ව්‍යාපෘති අංක 18/622/2104/24/C/A/01 මිහින්තලේ පශු වෛද්‍ය කාර්යාලය ඉදි කිරිම අවසන්කර ඇත.

### 1.2.අඛණ්ඩ ව්‍යාපෘති - පොළොන්නරුව දිස්ත්‍රික්කය

ව්‍යාපෘති අංක 19/622/45/4/2502/24(i) සත්ත්ව සංවර්ධනය - තිරප්පනේ ගොවිපලේ සංවර්ධන කටයුතු යටතේ කුකුල් නිවාසය ඉදිකිරිම හා ළිඳ ඉදිකිරිමේ කටයුතු නිමකර ඇත.

## 2. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන නව වැඩ

### 2.1. කිරි ගොවිපලවල යටිතල පහසුකම් සංවර්ධනය - අනුරාධපුර දිස්ත්‍රික්කය

| ඉටු කළ කාර්යය | ගොවිපළ ප්‍රමාණය |
|---|---|
| ගවගාල් ඉදිකිරිම | 42 |
| කිරිගවයින් ලබාදිම | 61 |
| තෘණ කැබිළි යන්ත්‍ර ලබාදිම | 12 |
| කිරි දොවන යන්ත්‍ර ලබාදිම | 12 |
| තෘණ වගාව හා ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරිම | 05 |
| සයිලේජ් නිෂ්පාදනය | 03 |
| **එකතුව** | **135** |

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතෙහි කිරි ගොවිපල 100 ක් සංවර්ධනය කිරිම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්වූ අතර එමගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිපල් 67 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 33 ක් සඳහා පහසුකම් සපයා ඇත.

කිරි ගොවිපලවල් සංවර්ධනය යටතේ ඒ සඳහා ලබාදුන් පහසුකම්වල විස්තරය වගුවෙහි දැක්වේ.

## කිරි ගොවිපළවල යටිතල පහසුකම් සංවර්ධනය - පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| ගවගාල් ඉදිකිරීම | 11 |
| කිරිගවයින් මිලදී ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම | 19 |
| තෘණ කැබිළි යන්ත්‍ර ලබාදීම | 16 |
| කිරි දොවන යන්ත්‍ර ලබාදීම | 05 |
| සයිලේජ් බැරල් මිළදී ගැනීම | 77 |
| තෘණ වගාව හා ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරීම | 02 |
| අලි වැට ඉදි කිරීම | 04 |
| **එකතුව** | **134** |

## 2.2. සේවා සැපයීම ඉහළ නැංවීමට ජංගම සායන පැවැත්වීම

මේ යටතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ජංගම සායන 350ක් ඉලක්ක කර තිබූ අතර, ජංගම සායන 332ක් පවත්වා තිබේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජංගම සායන 224 ක්ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජංගම සායන 108 ක්ද පවත්වා ඇත. මේ යටතේ සත්ත්ව ප්‍රතිකාර හා රෝග මර්ධන කටයුතු මෙන්ම සතුන් හඳුනා ගැනීමේ කණ් සළකුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති පසු විපරම් කටයුතු සිදුකිරීම, හඳුනාගත් ගොවිපළ ගැටළුවලට විසඳුම් ලබාදීම, ගොවීන්ට තාක්ෂණික සේවා ලබා ගැනීමේ දුෂ්කරතාවයන්ට යම් විසඳුමක් ලබාදීම සිදුකරන ලද සේවාවන් වේ.

## 2.3. සත්ත්ව පෝෂණ සම්පත් ඉහළ නැංවීම

කිරි ගව පාලනයේදී සත්ත්ව පෝෂණය ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. වසර පුරා කිරිදෙනුන්හට නිසි ආකාරයට අහාර ලබා නොදීම උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට ප්‍රධාන බාධාවක් වී ඇත. එබැවින් මෙම පළාතේ කිරි ගව පෝෂණය ඉහළ නැංවීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කය හා පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා හේ බේලර් යන්ත්‍ර 02ක් මිල දීගෙන ඇති අතර, එම යන්ත්‍ර දෙක අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික් සත්ත්ව නිෂ්පාදන සමුපකාර සමිති වෙත ලබා දී ඒ හරහා ගොවීන් වෙත අදාල සේවාව ලබා දීමට කටයුතු කර ඇත.

## 1.4. එළ ගවයින් ගේ සහ මී ගවයින්ගේ සෞඛ්‍යය තත්ත්වය වැඩි දියුණු කිරීම

උතුරු මැද පළාතේ වසංගත රෝග තුරන් කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මාස 04ට වැඩි සියළුම සතුන් වර්ෂය තුළදී දෙවරක් එන්නත් කරන ලද අතර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුර හා මුඛ රෝගය සඳහා සතුන් 117,398, කාලගාත්‍රා රෝගය සඳහා සතුන් 19,101ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කුර හා මුඛ රෝගය සඳහා සතුන් 46,785 කාලගාත්‍රා රෝගය සඳහා සතුන් 1,023 එන්නත් කරන ලදී.

## 1.5. බුරුළු ප්‍රදාහය වැළැක්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම

පිරිසිදු කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් සියළුම පශු වෛද්‍ය කොට්ඨාශ තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර, පශු වෛද්‍ය කොට්ඨාශ මට්ටමින් පුහුණු වැඩ සටහන් පැවැත්වීම, උපසායනික බුරුළු ප්‍රදාහ පරික්ෂණ උපකරණ කට්ටල හා කිරි මුරය අවසන් වූ වියලි දෙනුන් සඳහා ප්‍රති බුරුළු ප්‍රදාහ ප්‍රතිජීවක කිරි ගොවින් වෙත ලබාදීම, සිදුකරන ලදි. මේ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුහුණු වැඩසටහන් යටතේ ගොවින් 360ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් 170 ක් සඳහා පුහුණුව සහ ප්‍රතිලාභ ලබාදී ඇත.

## 1.6. ස්වභාවික අභිජනන ප්‍රවර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතෙහි කිරි ගොවිපල 100ක් සවර්ධනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාද වෙන්වූ අතර එමඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 19 ක ගොවිපල් 71ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 07 ක ගොවිපල් 29 ක් සඳහා පට්ටි වස්සන් 100 ක් සපයා ඇත. එයට අමතරව කෘතිම සිංචනයෙන් බිහිවූ පිරිමි පැටවුවන් 100ක්, සඳහා පැටවි ආහාර මාස 06ක් වනතෙක් ලබාදීම, කිණිතුළු බෙහෙත්, ඛණිජ , පණු බෙහෙත් ලබාදීම සිදුකර ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වසු පැටවුන් 70ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වසු පැටවුන් 30 ක් තෝරාගෙන ඇත.

## 2.7. කෘතිම සිංචනය මඟින් දෙමුහුන් සතුන් බිහි කිරීම

කෘතිම සිංචනය කිරි ගවයින්ගේ ආරය උසස් කිරීමට යොදා ගැනෙන ප්‍රමුඛ තාක්ෂණය වන බැවින්, කෘතිම සිංචනයෙන් බිහි වූ වැස්සි පැටවුන් 1,000 ක් සඳහා කිණිතුළු බෙහෙත්, ඛණිජ ,පණු බෙහෙත් ලබාදීම මඟින් පැටවුන්ගේ වර්ධනය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම සිදුකර ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැස්සි පැටවි 680 ක් හා සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැස්සි පැටවි 320කට මෙම ප්‍රතිලාභ ලබා දී ඇත.

## 2.8. එළු ගොවිපල සංවර්ධනය

උතුරු මැද පළාතේ එළු ගොවිපල සංවර්ධනය 30ක් සංවර්ධනය සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන්වූ අතර, ඇස්තමේන්තු ගත සම්පූර්ණ මුදල වියදම් නොවූ බැවින්, ඉතිරි මුදල් යොදා එළු ගොවිපල 32 ක් සංවර්ධනය කිරිමට හැකිවිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිපල් 25ක් සංවර්ධනය කර ඇත. ඒ සඳහා පට්ටි එළුවන් 25 ක් සපයා ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 07ක් සංවර්ධනය කර ඇත. ඒ සඳහා පට්ටි එළුවන් 07ක් සපයා දිම මඟින් එළු මස් , එළු කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනයට දායකත්වය ලබා දි ඇත.

## 2.9. කිරිවලට අගය එකතු කිරිම ප්‍රවර්ධනය

කිරි වලට අගය එකතු කිරිම ප්‍රවර්ධනය කිරිම තුළින් නිෂ්පාදනවලට වැඩි මිලක් ලබා ගැනිමට ගොවින් යොමු කිරිම හා නිෂ්පාදනවල ගුණත්වය වැඩි දියුණු කිරිමට අවශ්‍ය තාක්ෂණ දැනුම ලබා දිම හා අවශ්‍ය යෙදවුම් ලබා දිම සිදුවිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාශ අට(08)ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ප්‍රතිලාභින් දස (10) දෙනෙකු ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කර ගත් අතර, බෝතල් ශිතකරණ (bottle cooler), ඉන්ක්‍යුබේටර්, සහ ක්‍රිම් සෙපරේටර් වැනි උපකරණ ලබා දිම මඟින් නිෂ්පාදනාගාරවල තත්ත්වය ඉහළ නැංවිම සිදු කරන ලදි.

කිරි නිෂ්පාදන සැකසුම් ඒකකය නවිකරණය සඳහා පහසුකම් සලසා ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය, පොළොන්නරුව, බකමුණ, ලංකාපුර, මැදිරිගිරිය පශු වෛද්‍ය කොට්ඨාශ තුළ කිරි සැකසුම්කරුවන් 05ක් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපකරණ ලබා දිම කිරි නිෂ්පාදන සැකසුම් ඒකකය නවිකරණය, කටයුතු සිදු කරන ලදි. ඒ යටතේ ශිතකරණ, ක්‍රිම් සෙපරේටර්, අධිශීතකරණ වැනි උපකරණ ලබාදුන් අතර අවශ්‍ය ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව ලබාදිම සිදුකරන ලදි.

## 2.10. නිදැළි කුකුල් පාලනය ප්‍රවර්ධනය

උතුරු මැද පළාත තුළ නිදැළි කුකුළු පාලන ප්‍රවර්ධන වැඩසටහන යටතේ මාසයක් වයසැති කිකිළි පැටවුන් 10,000 ප්‍රතිලාභින් 1,000ක් සඳහා සපයා ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 22 ක ප්‍රතිලාභින් 728 ක් සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් 7,280 ක් සපයා ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභින් 272 ක් සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් 2,720 ක් සපයා ඇත.

## 2.11. කාර්යාල අළුත්වැඩියාව

මේ යටතේ නැ.නු.ප.පශු වෛද්‍ය කොට්ඨාශයේ දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියා කටයුතු සහ ගලෙන්බිදුණුවැව පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියා කටයුතු නිමකර ඇත.

## 2.12. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබා දීම

යහපත් වැඩකිරීමේ වටපිටාවක් සැළසීමේ අරමුණින් පශු වෛද්‍ය කාර්යාල සඳහා ගෘහ භාණ්ඩ ලබා දීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර තිබේ.

## 2.13. පුහුණු වැඩසටහන්

### ගොවි පුහුණුව

සෑම පශු වෛද්‍ය කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ගොවින් 2,000 ක් පුහුණු කිරිම ඉලක්ක කර තිබු අතර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සත්ත්ව පාලන ගොවින් සඳහා පුහුණු සැසිවාර 55 ක් ගොවින් 1,995ක සහභාගිත්වයෙන් පවත්වා තිබේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කය ආවරණයවන පරිදි පුහුණු වැඩ සටහන් 20 ක් පවත්වා ඇත. මෙම පුහුණු වැඩසටහන් සඳහා ගොවින් 837 ක් සහභාගි වි තිබේ. මේ යටතේ සත්ත්ව පාලනයේ නියැලෙන ගොවින්ට අවශ්‍ය වන දැනුම ලබා දිම සඳහා පුහුණු වැඩසටහන් හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදි.

**2019**

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවින් 1,995 පුහුණු සැසිවාර 55ක්**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය පුහුණු වැඩසටහන් 20 ගොවීන් 837**

**සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා පුහුණු සැසි 02 ක්**

**කණිෂ්ඨ සේවකයින් සඳහා පුහුණු සැසි 02 ක්**

**ක්ෂේත්‍ර චාරිකා 02ක්**

**ශාඛා සමිති 313ක්**

## 2.14. නිලධාරි ධාරිතා සංවර්ධනය

මෙම දෙපාර්තමේන්තුවේ නවක සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා පුහුණු සැසි 02ක් ද, කණිෂ්ඨ සේවකයින් සඳහා පුහුණු සැසි 02 ක් පවත්වා ඇත. විකල්ප බල ශක්ති භාවිතය පිළිබඳ පුහුණු ක්ෂේත්‍ර චාරිකා 02 සඳහා පශු වෛද්‍ය නිලධාරින් ඇතුළු සියළුම නිලධාරින් සහභාගි වි ඇත. ව්‍යාපෘති සැළසුම්කරණය සම්බන්ධව පශු වෛද්‍ය නිලධාරි, සත්ත්ව සංවර්ධන උපදේශකවරු113ක් සඳහා පුහුණුව ලබා දී ඇත.

## 2.15. ගොවීන් බලගැන්වීම

සියළුම පශු වෛද්‍ය කොට්ඨාශ ආවරණය වන පරිදි සත්ත්ව නිෂ්පාදන ශාඛා සමිති පිහිටුවීම සහ ශාඛා සමිති එකතුකර ප්‍රාදේශීය සමිති පිහිටුවීම සිදුකර ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ශාඛා සමිති 67 ක් සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශාඛා සමිති 246 ක් පිහිටුවා ඇත. දිස්ත්‍රික් සමිති 02 පිහිටුවා ඇති අතර අනුරාධපුර දිස්ත්‍රික් සාමාජිකයන් සංඛ්‍යාව 4,892 සහ පොළොන්නරුව සාමාජික සංඛ්‍යාව 781කි.

## 2.16. සත්ත්ව පාලන ගොවීන් සහ ව්‍යවසායකයින් අභිප්‍රේරණය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය ගොවීන් අභිප්‍රේරණය කිරිම වන හෙයින් එමගින් ඔවුන්ගේ ගොවිපළ නිෂ්පාදනය ඉහළ යෑම සහ අනෙකුත් සත්ත්ව පාලන ගොවීන් උනන්දුව ඉහළ යෑම හා ප්‍රමිතිගත නිෂ්පාදකයින් දිරි ගැන්වීම සිදුකරනු ලබයි. මෙහිදි ප්‍රාදේශිය මට්ටමින් ,දිස්ත්‍රික් මට්ටමින් හා පළාත් මට්ටමින් හොඳම ගොවීන් ව්‍යවසායකයින් තෝරා ත්‍යාග සහ සහතිකපත් ලබා දිම සිදුකර ඇත.

## 2.17. ප්‍රදර්ශණ ඒකකය ස්ථාපණය කිරිම

මේ යටතේ ප්‍රදර්ශණ භාණ්ඩ සැකසිම, අවශ්‍ය උපකරණ මිලදි ගැනිම, නවින තාක්ෂණික දැනුම ලබාදිම සඳහා සැළසුම් සකස් කිරිම සිදුකරන ලදි.

## 2.18. කිරි නිෂ්පාදන ගොවිපල් හඳුනා ගැනිම (A2 ප්‍රෝටිනය සහිත)

පාරිභෝගික ප්‍රජාව වෙත ළඟා වෙන දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ඇල්ෆා කේසින් කිරි ප්‍රෝටිනය අඩංගු බව තහවුරුකර එම නිෂ්පාදනයට අදාලව ගව ගහනය ඉහළ නැංවීමේ අරමුණෙන්,සතුන්ගේ රුධිර සාම්පල පරික්ෂා කිරිම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ10 ක ක්‍රියාත්මක කරන ලදි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සතුන් 200 පරික්ෂා කිරිමේ කටයුතු සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සතුන් 50 ක් පරික්ෂා කිරිම සඳහා අවශ්‍ය යෙදවුම් මිලදි ගැනිමට කටයුතු සම්පාදනය කරන ලදි.

## 2.19. සත්ත්ව නිෂ්පාදන අලෙවිසැල් ස්ථාපනය

උතුරු මැද පළාත තුළ සත්ව නිෂ්පාදන අලෙවිකර ගැනිම සඳහා පහසුකම් හා අවශ්‍ය යෙදවුම් සහ තාක්ෂණික සහයෝගය ලබාදිම සඳහා මෙම ව්‍යාපාතිය ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සත්ත්ව නිෂ්පාදන අලෙවිසැල් 10ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සත්ව නිෂ්පාදන අලෙවිසැල් 04ක් ඉදිකරන ලදි.

## 2.20. යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම

පළාත් අධ්‍යක්ෂ කාර්යාලය වායු සමනය කිරිම සඳහා සැලසුම් කර ඉදිකරන ලද ගොඩනැගිල්ලක් වන අතර එහි වායු සමනය නොකර කාර්යාල කටයුතු කළ නොහැකි හෙයින් 2019 වර්ෂයේ ප්‍රතිපාදන ලබා ගෙන පළාත් අධ්‍යක්ෂ කාර්යාලය වායු සමනය කිරිම සඳහා වායු සමනය යන්ත්‍ර මිලදි ගැනිම සිදුකර ඇත.

## 2.21. පළාත් කාර්යාලය සංවර්ධන කටයුතු

ජල ටැංකියක අවශ්‍යතාවය තදින්ම පැවතුනු අතර විශේෂයෙන්ම සෑම වර්ෂයකම වියලි කාලයේදි මහත් අපහසුතාවයන්ට මුහුණ දිමට සිදුවෙන බැවින් 2019 වර්ෂයේ ප්‍රතිපාදන භාවිතයෙන් ජල ටැංකියක් ඉදිකිරිමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

## 3. කෘෂි කාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවලට අනුහුරු කරවිමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය පොළොන්නරුව පශු වෛද්‍ය කොට්ඨාශයේ ලංකාපුර පශු වෛද්‍ය කොට්ඨාශයේ ක්‍රියාත්මක විය. ඒ යටතේ ප්‍රතිලාභින් සඳහා සත්ව පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 10ක් පවත්වා ඇත. ක්ෂේත්‍ර චාරිකාවක් සහ කිරිවල ගුණාත්මකභාවය ඉහළ නැංවිමේ පුහුණු වැඩසටහන් පවත්වා ඇත. එයට අමතරව ලබාදුන් ප්‍රතිලාභ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභ ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කිරි දොවන යන්ත්‍ර මිලදී ගැනීම | 06 |
| තෘණ කැබිලි කපන යන්ත්‍ර මිලදී ගැනීම | 06 |
| එළුවන් මිල දි ගැනීම | 03 |
| එළු ගාල් ඉදිකිරිම | 09 |
| කුකුළු කූඩු ඉදිකිරිම | 24 |
| තෘණ කැපීමේ යන්ත්‍ර මිලදී ගැනීම | 51 |
| ගව ගාල් ඉදිකිරිම/පැටව් නිවාස ඉදි කිරිම | 24 |
| කිරි ගවයන් මිලදී ගැනීම | 09 |
| ගව රක්ෂණය | 07 |
| කුකුළු පැටව් 550 ක් බෙදාදීම | 22 |
| **එකතුව** | **123** |

## මැදිරිගිරිය පශු වෛද්‍ය කොට්ඨාශය

මැදිරිගිරිය පශු වෛද්‍ය කොට්ඨාශයේ ප්‍රතිලාභින් සඳහා සත්ත්ව පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 02ක්, ක්ෂේත්‍ර චාරිකා 02ක් සහ කිරිවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන් 02ක් පවත්වා ඇත.

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කිරි දොවන යන්ත්‍ර මිලදී ගැනීම | 05 |
| තෘණ කැබිලි කපන යන්ත්‍ර මිලදී ගැනීම | 15 |
| එළිච්චියන් මිළදි ගැනිම | 02 |
| එළු ගාල් ඉදිකිරිම | 02 |
| කුකුළු කූඩු ඉදිකිරිම | 07 |
| තෘණ කැපීමේ යන්ත්‍ර මිලදී ගැනීම | 03 |
| ගව ගාල් ඉදිකිරිම/පැටවි නිවාස ඉදිකිරිම | 09 |
| කිරි ගවයන් මිලදී ගැනීම | 09 |
| සයිලේජ් බැරල් මිලදි ගැනිම | 03 |
| කුකුළු පැටවි 800 ක් බෙදාදීම | 40 |
| හේ බේලර් මිලදි ගැනිම | 02 |
| පිදුරු නිවාස ඉදිකිරිම | 01 |
| **එකතුව** | **98** |

## 4. කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය - UNDP

මෙම ව්‍යාපෘතිය එක්සත් ජාතින්ගේ අරමුදල් යටතේ ලංකාපුර සහ මැදිරිගිරිය පශු වෛද්‍ය කොට්ඨාසවල ක්‍රියාත්මක විය. ලංකාපුර පශු වෛද්‍ය කොට්ඨාශය තුල ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් හා ඒ වෙනුවෙන් ලබාදුන් ප්‍රතිලාභ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**ලංකාපුර පශු වෛද්‍ය කොට්ඨාශය දේශගුණික විපර්යාසවලට අනුහුරු කරවීමේ ව්‍යාපෘති ක්‍රියාකාරකම්**

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කිරි කෑන් මිලදි ගැනිම | 20 |
| ගව ගාල් ඉදිකිරිම | 03 |
| තෘණ දඬු10,000 සැපයිම | 20 |
| මාසයක් වයසැති කිකිළි පැටවි 150 ක් බෙදාදීම | 10 |
| ගොවි පුහුණු වැඩසටහන් 06 ක්ෂේත්‍ර චාරිකා | 202 |
| **එකතුව** | **255** |

මැදිරිගිරිය පශු වෛද්‍ය කොට්ඨාශයේ ගව නිවාස 02ක් ඉදිකර ඇත. දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරිම සඳහා පාසැල් ළමුන් 400ක් සඳහා කිරි විදුරුව බැගින් ලබාදී, දියරකිරි පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

## 5. කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන (කෘෂිකර්ම අමාත්‍යාංශය)

අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභින් 15 දෙනෙකු සඳහා උපකරණ ලබාදිම, අධි ශිතකරණ, බෝතල් ශිතකරණ, කිරි උණු කිරිමේ භාජන, ක්‍රිම්සෙපරේටර්, අයිස්ක්‍රීම් යන්ත253, කිරි අලෙවිසැල් ඉදිකිරිම, කිරි නිෂ්පාදනාගාර ඉදිකිරිම යන පහසුකම් ප්‍රතිලාභින් වෙත ලබා දෙන ලදි.

## 6. පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල(රු.මි) | | ප්‍රගතිය(%) | | ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) | |
| ගව අභිජනන ගොවිපල ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | 0.50 | 0.09 | 100 | 18 | කිරි නිෂ්පාදනය වැඩි විම |
| පරිසර හිතකාමී සුකර ගොවිපල සංවර්ධනය | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | 0.25 | 0.05 | 100 | 20 | පරිසර දූෂණය වැලක්විමට කටයුතු කිරිම. බලශක්තිය ලබා ගැනිම |

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණු | මුදල | | ප්‍රගතිය(%) | | කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ මුදල (රු.මි) | වියදම් කළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) | |
| කුඩා හා මධ්‍යම පරිමාණ කුකුළු ගොවිපල සංවර්ධනය | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම | 6.00 | 3.90 | 100 | 65 | පවුලේ ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාගැනීම, ස්වයං රැකියා සඳහා යොමු වීම |
| කුකුළු මස් සැකසුම් මධ්‍යස්ථානය හා ශීතාගාර පහසුකම් සපයාදීම | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම | 0.26 | 0.04 | 100 | 15 | මස් නිෂ්පාදනය වැඩිවීම/ ආර්ථිකය ශක්තිමත් වීම |
| කාන්තා මූලික පවුල් සඳහා කිරි නිෂ්පාදන ආම්පන්න ලබාදීම | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම | 0.25 | - | 100 | - | පවුලේ ආර්ථිකය ශක්තිමත් වීම,ස්වයං රැකියා සඳහා යොමු වීම |
| කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර ස්ථාපනය | ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනීම/ සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම | 0.20 | 0.14 | 100 | 70 | කිරි නිෂ්පාදනය වැඩිවීම |
| | එකතුව | **7.46** | **4.22** | | | |

## 6.1. ගව අභිජනන ගොවිපල් ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගව අභිජනන ගොවිපල් 03 ක් සංවර්ධනය කිරිම සඳහා රු.මි. 0.3 ක් වැය කර ගව ගාල් 03 ක් ඉදිකිරිම, කිරිගවයින් 01ක් මිලදි ගැනිම මේ යටතේ සිදුකර ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 02 ක් සංවර්ධනය කර ඇත. ගව ගාල් 02ක් ඉදි කිරිම, මේ යටතේ සිදුකරන ලදි. ඒ සඳහා රු.මි.0.2 ක් වැය කර ඇත.

## 6.2. පරිසර හිතකාමි සූකර ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 04ක ක්‍රියාත්මක වූ අතර, ගොවිපල 04ක් සංවර්ධනය කරන ලදි. මෙහිදි සූකර නිවාස 04ක් ස්ථාපණය කිරිම, සිදු කරන ලදි. මේ සඳහා රු.මි. 0.2 ක් වැය විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව පශු වෛද්‍ය කොට්ඨාශයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, සූකර නිවාසයක් ඉදිකර ඇත. රු.මි.0.05ක් මේ සඳහා වැය විය.

## 6.3. කුකුළු මස් සැකසුම් මධ්‍යස්ථානය හා ශිතාගාර පහසුකම් සපයාදිම

හොරොව්පොතාන, නාච්චාදූව පශු වෛද්‍ය කොට්ඨාසවල ක්‍රියාත්මක විය. ප්‍රතිලාභින් විසින් කුකුළු මස් අලෙවිසැළ ඉදිකරන ලද අතර අධි ශීතකරණ 02ක් රජයේ දායකත්වය මත සපයා ඇත. මේ සඳහා රු.මි.0.26ක් වැය විය.

## 6.4. කාන්තා මූලික පවුල් සඳහා කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ ආම්පන්න ලබා දීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය සඳහා කාන්තා ප්‍රතිලාභින් 03 දෙනෙක් සඳහා කිරි දෙවීමේ යන්ත්‍ර සපයා දීම, කිරි ගවයින් මිළදී ගැනීම , කිරි නිෂ්පාදනාගාර අළුත්වැඩියාව සිදු කරන ලදි. වැයවූ මුදල රු.මි.0.24කි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 01 සඳහා ගව ගාලක් ඉදි කිරීම සිදු කරන ලදි. වැය වූ මුදල රු:මි.0.08 කි.

## 6.5. කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර ස්ථාපනය

නොච්චියාගම පශු වෛද්‍ය කොට්ඨාශයේ කුකුළු සාන්ද්‍ර ආහාර නිෂ්පාදනය කිරිමේ නිෂ්පාදනාගාරයක් රු.මි.0.2ක් වැය කර ස්ථාපනය කර ඇත.

## 7. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන -2019

| අනු අංකය | වැඩසටහන /ව්‍යාපෘතිය | විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | කෙටිකාලීන / දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ මුදල (රු. මි.) | වැයකළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) | |
| 1 | කුඩා පරිමාණ කිරි ගොවිපළවල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනීම/ සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | 4.80 | 1.60 | 100 | 33 | ගොවිපළ ප්‍රමාණය වැඩිවීම |
| 2 | කුඩා පරිමාණ එළු ගොවිපළල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනීම/ සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | 1.80 | 0.60 | 100 | 33 | ස්වයං රැකියා සඳහා යොමු වීම වැඩිවීම |
| එකතුව | | | **6.60** | **2.20** | | | |

## 7.1. කුඩා පරිමාණ එළු ගොවිපල දිරි ගැන්වීමේ ව්‍යාපෘතිය - ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 22 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර ගොවිපල් 22 ක් සංවර්ධනය කරන ලදි. ඒ යටතේ එළිච්චියන් 115ක් හා පට්ටි එළුවන් 28 ක් සපයා ඇත. වැයවු මුදල රු. මි. 0.56 කි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 07 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර ගොවිපල් 08ක් සංවර්ධනය කර ඇත. ඒ යටතේ එළිච්චියන් 38ක් හා පට්ටි එළුවන් 07ක් සපයා ඇත. රු.මි.0.05ක් වැයකර ඇත.

## 7.2. කුඩා පරිමාණ කිරි ගොවිපළවල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය යටතේ ගොවිපල් 51ක් සංවර්ධනය කරන ලද අතර, පශු වෛද්‍ය කොට්ඨාශ 19 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. වැයවූ මුදල රු. මි. 1.21කි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය යටතේ ගොවිපල් 11ක් සංවර්ධනය කරන ලද අතර, පශු වෛද්‍ය කොට්ඨාශ 06 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ඒ යටතේ කිරි ගවයින් මිළදී ගැනීම, තෘණ කැබලි යන්ත්‍ර ලබාදීම, කිරි දොවන යන්ත්‍රය ලබාදීම සිදු කර ඇත. වැයවූ මුදල රු. මි.0.36කි. ඒ යටතේ පහත සඳහන් පහසුකම් සහ ක්‍රියකාරකම් සිදු කර ඇත.

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභින් සංඛ්‍යාව | |
|---|---|---|
| | අනුරාධපුර | පොළොන්නරුව |
| ගවගාල් ඉදිකිරිම | 21 | 02 |
| කිරිගවයින් මිළදී ගැනිම | 18 | 05 |
| තෘණ කැබිළි යන්ත්‍ර ලබාදිම | 05 | - |
| කිරි දොවන යන්ත්‍ර ලබාදිම | 05 | - |
| ජීව වායු ජනකයක් ඉදිකිරිම | 01 | 04 |
| තෘණ වගා කිරීම | 01 | - |
| **එකතුව** | **51** | **11** |

## 7.3. සුළු හා මධ්‍යම පරිමාණ කුකුළ් සංවර්ධන ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 22 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, මාසයක් වයසැති කිකිළි පැටව් 11,700 ක් ප්‍රතිලාභින් 1170 ක් සඳහා සපයා ඇත. සියළුම ප්‍රතිලාභින් කුකුළු පාලනය සම්බන්ධව පුහුණු වැඩසටහන් මඟින් දැනුවත් කර ඇත. කිකිළි පැටව් සැපයිම් විස්තරය පහත දැක්වේ.

| පශු වෛද්‍ය කොට්ඨාශය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | කිකිළි පැටව් සංඛ්‍යාව |
|---|---|---|
| කැබිතිගොල්ලෑව | 86 | 860 |
| රඹෑව | 50 | 500 |
| රාජාංගනය | 36 | 360 |
| නැ.නු.ප | 38 | 380 |
| ම.නු.ප. | 37 | 370 |
| තිරප්පනය | 89 | 890 |
| ගලෙන්බිදුණුවැව | 50 | 500 |
| හොරොව්පොතාන | 50 | 500 |
| මැදවච්චිය | 50 | 500 |
| නොච්චියාගම | 50 | 500 |
| විලච්චිය | 83 | 830 |
| කැකිරාව | 37 | 370 |
| මිහින්තලය | 50 | 500 |
| නාච්චාදූව | 50 | 500 |
| තලාව | 37 | 370 |
| පදවිය | 89 | 890 |
| කහටගස්දිගිලිය | 50 | 500 |
| තඹුත්තේගම | 36 | 360 |
| ගල්නෑව | 36 | 360 |
| පලාගල | 37 | 370 |
| ඉපලෝගම | 43 | 430 |
| පළුගස්වැව | **86** | 860 |
| **එකතුව** | **1,170** | **11,700** |

පොළොන්නරුව දිස්ත්‍රිකයේ පශු වෛද්‍ය කොට්ඨාශ 07 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, මාසයක් වයසැති කිකිළි පැටව් 3,300 ක් ප්‍රතිලාභින් 330 ක් සඳහා සපයා ඇත. කිකිළි පැටව් සැපයීම් විස්තරය පහත දැක්වේ.

| පශු වෛද්‍ය කොට්ඨාශය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | කිකිළි පැටව් සංඛ්‍යාව |
|---|---|---|
| වැලිකන්ද | 36 | 360 |
| අරලගංවිල | 36 | 360 |
| ලංකාපුර | 50 | 500 |
| මින්නේරිය | 36 | 360 |
| මැදිරිගිරිය | 36 | 360 |
| පොළොන්නරුව | 50 | 500 |
| බකමූණ | 86 | 860 |
| **එකතුව** | **330** | **3300** |

## 8. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

### 8.1. සතුන් සඳහා ප්‍රතිකාර කිරිම

උතුරු මැද පළාත තුළ 2019 වර්ෂය තුළ සිදුකරන ලද සත්ත්ව ප්‍රතිකාර සේවාව පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | කාර්යාලය තුළදී ප්‍රතිකාර සිදුකරන ලද සතුන් සංඛ්‍යාව | ක්ෂේත්‍ර ප්‍රතිකාර සිදුකරන ලද සතුන් සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුර | 49,921 | 30,146 |
| පොළොන්නරුව | 5,563 | 6,843 |
| **එකතුව** | **55,484** | **36,989** |

### 8.2. වසංගත රෝග මර්ධන වැඩසටහන

උතුරු මැද පළාත තුළ ගවයින්ගේ වසංගත රෝග මර්ධනය සඳහා එන්නත් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ එන්නත් කරන ලද සතුන් සංඛ්‍යාව පහත පරිදිය.

| දිස්ත්‍රික්කය | කුර හා මුඛ රෝගය | කාල ගාත්‍රා රෝගය |
|---|---|---|
| අනුරාධපුර | 117,398 | 19,101 |
| පොළොන්නරුව | 46,785 | 1,050 |
| **එකතුව** | **164,183** | **20,151** |

### 8.3. සත්ත්ව අභිජනන වැඩසටහන

| දිස්ත්‍රික්කය | කෘතිම සිංචන සංඛ්‍යාව | ගැබ් පරික්ෂා සංඛ්‍යාව | පැටවු උපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | 12,017 | 2,394 | 3,030 |
| පොළොන්නරුව | 5,518 | 1,057 | 1,183 |
| **එකතුව** | **17,535** | **3,451** | **4,213** |


## 8.4. මානව සම්පත් කළමණාකරණය

මේ යටතේ ගොවි මහතුන් සඳහා නවීන තාක්ෂණික දැනුම ලබා දීම සඳහා ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු වැඩසටහන් ක්ෂේත්‍රයේ සහ ආයතන තුළ පවත්වන ලදි.

| දිස්ත්‍රික්කය | ගොවි පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව(ක්ෂේත්‍රය) | සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව | ගොවි පුහුණු ආයතන පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 292 | 7,626 | 22 | 858 |
| පොළොන්නරුව | 94 | 2,477 | 12 | 441 |
| **එකතුව** | **385** | **10, 103** | **34** | **1,299** |

## 9. කිරි නිෂ්පාදනය -2019

2016 වසරෙහි අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 24.66ක් පමන වූ අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය ලීටර් මිලියන 10.89 විය. 2017 වසරෙහි උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 49.20 ක් විය. 2018 වසරෙහි උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 44.15 ක් විය. 2019 වසරෙහි උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 40.69 ක් විය.



## 10. ව්‍යාපෘති සංශෝධන

මෙම වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සභා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මි.106.5ක් වෙන් කර තිබු අතර,(25%) රු.මි.26.625ක් ප්‍රතිපාදන අවුරා තබන ලදි. ඒ අනුව ව්‍යාපෘති සඳහා වෙන්ව ඇති ප්‍රතිපාදන සංශෝධනය කිරිමට සිදුවිය.සංශෝධිත මුදල රු.මි.80.24 වු අතර,වැය කරන ලද මුළු මුදල රු.මි.65.61කි.

## කාර්ය සාධනය කරා ළඟා විමේදි මුහුණ දුන් අභියෝග හා ගැටළු

- කිරි ගව පාලනයේදි සතුන්ගේ පෝෂණ අවශ්‍යතාවය ඉටුකිරිමට ප්‍රමාණවත් තෘණ බිම් නොමැති කම හා වියළි කාලයේ සතුන්ගේ පෝෂණ අවශ්‍යතා ඉටු කිරිමට නොහැකි විම.
- උසස් ආරයේ සතුන්ගේ හිඟකම.
- වර්තමානයේ කිරි අලෙවිය සඳහා ඇති ගැටළු සහ අගය එකතු කළ නිෂ්පාදනවල වෙළඳ පොළ තරඟකාරිත්වයට මුහුණ දිමේදි ඇතිවන ගැටළු.
- වරින්වර ප්‍රදේශයේ පැතිර යන වසංගත රෝග තත්ත්වයන්.
- පාරිසරික ගැටළු
- අවිධිමත් ගව ප්‍රවාහනය
- පුහුණු නිලධාරින්ගේ හිඟකම සහ ක්ෂේත්‍ර කටයුතුවල නිරතවිමට ප්‍රවාහන පහසුකම් ලබා ගැනිමේදි සිදුවන අපහසුතා.

## 2020 වසරේ ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘතිවලට අදාල ක්‍රියාකාරකම්

- කිරි නිෂ්පාදන සංවර්ධනය
- මස් නිෂ්පාදන සංවර්ධනය
- බිත්තර නිෂ්පාදනය
- ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා තාක්ෂණික උපදේශන
- වෙළඳපොල හා වෙළඳපොල සම්බන්ධතා සංවර්ධනය
- කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන හා ප්‍රවර්ධනය
- සතුන්ගෙන් මිනිසාට වැළඳෙන රෝග පාලනය
- වෙළෙඳපොල හා වෙළඳපොල සම්බන්ධතා සංවර්ධනය
- පෙර පාසල් දරුවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම.
- ආයතනික සංවර්ධනය
- රාජ්‍ය ආයතන ධාරිතා සංවර්ධනය

මෙම ක්‍රියාකාරකම් යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා තෝරා ගන්නා ලද ප්‍රතිලාභින් උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන සමිතියේ සාමාජිකත්වය ලබා ගත යුතුය . මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමෙන් ගොවිපළ නිෂ්පාදනය ඉහළ නංවා නිෂ්පාදන වියදම අවම මට්ටමක පවත්වා ගැනිමෙන් ප්‍රතිලාභි දෛනික ආදායම වැඩි කිරිම තුළින් ගෘහ ආර්ථිකය දියුණු විමත්, ග්‍රාමිය මට්ටමේ මුදල් සංසරණය ඉහළ යාමත් සිදුවේ. එමගින් ග්‍රාමිය වශයෙන් ජිවන මට්ටමේ සංවර්ධනය අපේක්ෂා කරයි. සමස්තයක් ලෙස පළාත් මට්ටමේ නිෂ්පාදනය ඉහළ යාමෙන්, ජාතික නිෂ්පාදනයට දායක විමෙන් ජාතික ආර්ථික වර්ධනයට දායක විම සිදුවේ.

## කාර්ය සාධනය පිළිබඳව සමස්ත අදහස

කාර්ය මණ්ඩලය පුරප්පාඩු පැවතුනද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කෙරුණු සංවර්ධන ව්‍යාපෘති ඇතුළු සියළු සේවාවන් සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දුනි. ගොවින් මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ සත්ත්ව රෝග ප්‍රතිකාර සහ පාලනයත් , සතුන්ගේ ආරය උසස්කර ගැනිමේ සේවාවන් ලබා ගැනිමයි. එසේම රජයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන පශු සම්පත් ව්‍යාපෘතින් සඳහා දෙපාර්තමේන්තුවේ සහාය අපේක්ෂා කළ ද වර්තමානයේ දෙපාර්තමේන්තුව මුහුණ පා සිටින සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ හිඟය නිසා එම අපේක්ෂාවන් සඳහා සාධාරණයක් ඉටුකිරිම දුෂ්කර කටයුත්තක්ව ඇත.

සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ හිඟය යම් තරමකින් හෝ මේ වන විට අවමකර ගැනිමට කටයුතු සංවිධානය කර ඇත. ප්‍රමාණවත් තෘණ බිම් නොමැතිකම, කිරි අලෙවි කරගැනීමේ දුෂ්කරතාවය අවිධිමත් සතුන් ප්‍රවාහනය නිසා වසංගත රෝග පැතිරීම සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ උන්නතියට බාධාවක්ව ඇත.කෙසේ වුවද 2018 වර්ෂය තුළ 2017ට සාපේක්ෂව ඉහළ කාර්ය සාධනයක් ළඟාකර ගත හැකි විය.

දෙපාර්තමේන්තුව සතු පහසුකම් සීමිත වුවත් කාර්ය මණ්ඩලය ඒ සියළු දුෂ්කරතා විඳදරාගනිමින් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘති ඇතුළු සියළු සේවාවන් සඳහා ඉතා හොඳ දායකත්වයක් ලබාදුනි. ගොවින් මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තුවන්නේ සත්ත්ව රෝග ප්‍රතිකාර සහ පාලනයත් , සතුන්ගේ ආරය උසස්කර ගැනිමේ සේවාවන් ලබා ගැනිමත්, සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා තාක්ෂණික දැනුම සහ ව්‍යාපෘති සඳහා මුල්‍යමය දායකත්වයයි.

වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව මුහුණ පා සිටින වාහන සහ රියදුරන්ගේ හිඟය නිසා ක්ෂේත්‍ර රාජකාරි කටයුතු ඉටුකිරිම දුෂ්කර කටයුත්තක්ව ඇත. තවද ප්‍රමාණවත් තෘණ බිම් නොමැතිකම, කිරි අලෙවි කරගැනීමේ දුෂ්කරතාවය හා අවිධිමත් සතුන් ප්‍රවාහනය නිසා වසංගත රෝග පැතිරීම සත්ත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ උන්නතියට බාධාවක්ව **ඇත.**

# 08. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය.

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

**අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා පැවරී ඇති ප්‍රධාන විෂයයන්**

- පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය
- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
- පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව,
- පළාත් පරිවාස දෙපාර්තමේන්තුව
- පරිසර විෂය හා සම්බන්ධ සංවර්ධන කටයුතු
- පළාත් සභා කටයුතු

## දැක්ම

"සුව සම්පන්න හා සුරක්ෂිත ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක්".

## මෙහෙවර

"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර හා පළාත් සභා කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම".

## අරමුණු

### දිගු කාලීන අරමුණු.

- ඵලදායි සේවාවක් සැපයීම සඳහා ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ඇති කිරීම තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ඇති කිරීම, සේවාලාභීන් තුළ ප්‍රචලිත දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබීම,සමාජ සුබසාධනය සවිබල ගැන්වීම තුළින් රැකවරණය ලැබිය යුත්තන් සවිබල ගැන්වීම හා ළමාරක්ෂක සේවා විධිමත් කිරීම තුළින් ළමුන්ගේ රැකවරණය ශක්තිමත් කිරීම.
- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් සියළු දෙපාර්තමේන්තු කාර්යයන් නියාමනය, ප්‍රතිපත්ති සම්පාදනය, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය, මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
- පරිසර විෂය යටතේ නිරෝගී දිවියක් උදෙසා යහපත් ස්වභාවික පරිසරයක් ඇති කිරීම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

## කෙටි කාලීන අරමුණු

- ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ඇති කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත කිරීම.
- පළාතට අවශ්‍ය දේශීය නිම් ඖෂධ පළාත තුළම නිපදවීම.
- ළමා අපචාරවලට ලක්වූවන් රැකගැනීම හා පුනරුත්ථාපනය කිරීම.
- ළමා අපචාර පිළිබඳ ප්‍රජාව සහ පාසල් දරුවන් දැනුවත් කිරීම.
- ආබාධ සහිත වූවන් නගාසිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අසරණ පවුල් නඟාසිටුවීමට කටයුතු කිරීම.
- මානසික හා කායික වශයෙන් නිරෝගී ශක්ති සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම.
- නගර හා උප නගරවල පරිසර සංරක්ෂණය හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ස්වභාඋයන් මහජන පරිහරණයට සුදුසු පරිදි වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානීය ජලය මහජනතාවට ලබාදීම හා උල්පත් සංරක්ෂණය.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු කිරීම.
- සියළු සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචනය

## ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශයට අයත් සියළුම දෙපාර්තමේන්තු කළමනාකරණය හා සංවර්ධනය
- පරිසර කටයුතු සංවර්ධනය
- අමාත්‍යාංශීය ආයතනික ධාරිතා සංවර්ධනය
- යහපාලනය

## ප්‍රධාන උපාය මාර්ගයන්


- පළාත් සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩිකිරීම.
- පළාත තුළ දේශීය වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත කිරීම
- පළාතට අවශ්‍යතාවයට සරිලන පරිදි දේශීය නිමි ඖෂධ පළාත තුළම නිපදවීම.
- ළමා අපචාරවලට ලක්වූවන් රැකගැනීම හා පුනරුත්ථාපනය කිරීම.
- ළමා අපචාර පිළිබඳ ප්‍රජාව සහ පාසල් දරුවන් දැනුවත් කිරීම.
- ආබාධ සහිත වූවන් නඟා සිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විවිධ ආධාර ක්‍රම මගින් අසරණ පවුල් නඟාසිටුවීමට කටයුතු කිරීම.
- මානසික හා කායික වශයෙන් නිරෝගී මෙන්ම ශක්ති සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම.
- නගර හා උප නගරවල පරිසර සංරක්ෂණය හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- මහජන පරිභරණයට සුදුසු පරිදි ස්වභාවයන් වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානීය ජලය මහජනතාවට ලබා දීම හා උල්පත් සංරක්ෂණය.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු කිරීම.
- සියළු සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචනය.

## සෞඛ්‍ය සේවා අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

| | |
|---|---|
| 6 CLEAN WATER AND SANITATION | සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම. |
| 13 CLIMATE ACTION | දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම. |
| 15 LIFE ON LAND | පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය හා කළමණාකරණ |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අනුමත | 52 |
| 2. | සේවයේ නියුතු | 39 |
| 3. | පුරප්පාඩු | 11 |
| 4. | අනුයුක්ත | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 26.00 | 24.74 | 1.26 | 95 |
| ගමන් වියදම් | 2.60 | 1.34 | 1.26 | 51 |
| සැපයීම් | 6.97 | 2.68 | 4.29 | 39 |
| නඩත්තු වියදම් | 3.34 | 2.12 | 1.22 | 63 |
| ගිවිසුම්ගත සේවා | 1.85 | 0.78 | 1.07 | 42 |
| මාරු කිරීම් | 0.51 | 0.40. | 0.11 | 78 |
| **එකතුව** | **41.27** | **32.06** | **9.21** | **78** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.70 | 0.61 | 0.09 | 87 |
| වාහන | 0.50 | 0.00 | 0.50 | 0 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 0.70 | 0.48 | 0.22 | 69 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.80 | 0.19 | 0.61 | 24 |
| දැනුම වර්ධනය හා ධාරිතා සංවර්ධනය | 0.30 | 0.21 | 0.09 | 70 |
| වෙනත් මූලධන වත්කම් (ආයෝජන) | 8.00 | 3.16 | 4.84 | 40 |
| **එකතුව** | **11.00** | **4.65** | **6.35** | **42** |

## තිරසර සංවර්ධන අරමුණු

භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනයකර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.

| තිරසර සංවර්ධන දර්ශකය | පළාත් දර්ශකය | ඉලක්ක | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක<br>**15.1.2020** වන භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියලි බිම් අන්තර් ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම | | | |
| **15.1.1**වන ආවරණය සමස්ත භූමි ප්‍රදේශයේ පංගුවක් ලෙස<br><br>**15.1.2**ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර පද්ධති ආකාරය අනුව භෞතික හා මිරිදිය ජෛව විවිධත්වය සඳහා වන වැදගත් ස්ථාන ප්‍රමාණය | 15.1.1.1වන වගාවන් ව්‍යාප්ත කරන අක්කර ප්‍රමාණය<br><br>15.1.1.2වර්ෂයක් තුළ සිටුවන ලද හා නඩත්තු කරන ලද වෘක්ෂලතා සංඛ්‍යාව.<br><br>15.1.1.2සංරක්ෂණය හා ප්‍රවර්ධනය කරන ලද වැව් ආශ්‍රිත ජල පෝෂක සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය(අක්කර) | 35<br><br>14000<br><br>35 | 100 |
| **15.22020** වන විට සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්වයට පත්කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම. | | | |
| **15.2.1**<br>තිරසර වනාන්තර කළමනාකරණය සම්බන්ධයෙන් වන ප්‍රගතිය | 15.2.1.1වනාන්තර කළමනාකරණය පිළිබඳව විධිමත්ව දැනුවත් කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | 10000. | 100 |
| **15.3.2030** වන කාන්තාරකරණය තුරන් කිරීම කාන්තාරකරණය, නියඟය සහ ගංවරතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම් සහ පස නැවත යථාතත්වයට පත්කිරීම සහ ඉඩම් විනාශයට පත්නොවන ලෝකයක් ඇති කර ගැනීම. | | | |
| **15.3.1**සමස්ත භූමි ප්‍රමාණයෙන් හායනයට ලක්ව ඇති ප්‍රමාණය | 15.3.1.1පෝෂක ප්‍රදේශ ප්‍රවර්ධනය මඟින් සංරක්ෂණය කරන ලද වාරි පද්ධති සංඛ්‍යාව<br>15.3.1.2නියඟයට ඔරොත්තු දෙන රුක් රෝපණය හා හානි අවම කිරීම සඳහා වූ උපක්‍රමයන් පිළිබඳව කරන ලද දැනුවත් කිරීම් සංඛ්‍යාව | 35 | 100 |
| **15.4. 2030** වන විට තිරසර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිලාභ ගෙන දීමට ඒවායේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා ජෛව විවිධත්වය ද සමඟින් කඳුකර පරිසර පද්ධති සංරක්ෂණය කිරීම තහවුරු කිරීම. | | | |
| **15.4.1.** කඳුකර ජෛව විවිධත්වය සම්බන්ධයෙන් වැදගත් ආරක්ෂිත ප්‍රදේශන්හි ව්‍යාප්තිය. | 15.4.1.1.උතුරු මැද පළාතේ ව්‍යාප්තව ඇති ශේෂ කඳු හා එහි වන සැලැස්මේ ප්‍රමාණය | හඳුනා ගත්තද 2019 වර්ෂයේදී ක්‍රියාත්මක නොවීය. | |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.** | | | | |
| උතුරු මැද පළාතේ ප්‍රජාවගේ පරිසර සංවේදීතාය ඉහළ නැංවීම<br><br>පළාතේ වන ගහනය වැඩි කිරිම | 1.රෝපනය කරන ලද ශාක ප්‍රමාණය<br><br>2.ආවරණය කරන ලද භූමි ප්‍රමාණය<br><br>3.පවත්වන ලද පරිසර වැඩසටහන් ගණන | උතුරු මැද පළාතේ හඳුනාගත් සංවේදී පාරිසරික කලාප ස්ථාන හා ආයතන ආශ්‍රිතව සුදුසු පළතුරු,ඖෂධීය ශාක හා වෙනත් තුරුලතා රෝපනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරිම. | 1.25 | 1.091 |
| | | සෞඛ්‍ය ආයතන ආශ්‍රිතව පළතුරු හා ඖෂධිය වටිනාකමින් යුත් රුක් රෝපණය | 0.45 | 0.10 |
| | | විහාරස්ථාන ආශ්‍රිතව පළතුරු හා ඖෂධීය වටිනාකමින් යුත් රුක් රෝපණය, පාසල් ආශ්‍රිත පරිසර ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0.750 | 0.118 |
| | | ස්වභාඋයන් නිර්මාණය | 1.10 | 0.976 |
| | | ප්‍රවර්ධනය කිරීම | 2.0 | - |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළුම ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| නිළ නිවාස අළුත්වැඩියාව | අළුත්වැඩියා | කාර්යාල හා රෝහල් කාර්ය මණ්ඩලය |
| වාහන අළුත්වැඩියාව | අළුත්වැඩියා | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | මිලදී ගැනීම් | |
| යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | මිලදී ගැනීම් | |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | දැනුවත් කිරීමේ වැඩසටහන් | 10000 |
| උතුරු මැද පළාතේ හඳුනාගත් සංවේදී පාරිසරික කලාප ස්ථාන හා ආයතන ආශ්‍රිතව සුදුසු පළතුරු,ඖෂධීය ශාක හා වෙනත් තුරුලතා රෝපනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරිම. | රුක් රෝපනය | 50000 |
| සෞඛ්‍ය ආයතන ආශ්‍රිතව පළතුරු හා ඖෂධිය වටිනාකමින් යුත් රුක් රෝපණය | රුක් රෝපනය | 25000 |
| විහාරස්ථාන ආශ්‍රිතව පළතුරු හා ඖෂධීය වටිනාකමින් යුත් රුක් රෝපණය | රුක් රෝපනය | 10000 |
| පාසල් ආශ්‍රිත පරිසර ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | දැනුම මිනුම තරගයක් පැවැත්වීම | 200000 |
| ස්වභාඋයන් නිර්මාණය, ප්‍රවර්ධනය කිරිම | - | - |

## කාර්ය සාධන ඉලක්ක 2018-2021

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2020 | 2021 |
| 1 | ගුණාත්මක භාවයෙන් ඉහළ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ඇති කිරීම තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ඇති කිරීම,සේවාලාභීන් තුළ ප්‍රචලිත දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබීම,සමාජ සුබසාධනය සවිබල ගැන්වීම තුළින් රැකවරණය ලැබිය යුත්තන් සවිබල ගැන්වීම හා ළමා රක්ෂක සේවා විධිමත් කිරීම තුළින් ළමුන්ගේ රැකවරණය ශක්තිමත් කිරීම. | පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | 20 | 12 | 12 | 12 |
| | | පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 04 | 04 | 04 | 04 |
| | | පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් ගණන | 4 | 5 | 12 | 15 |
| 2 | පරිසර විෂය යටතේ නිරෝගී දිවියක් උදෙසා යහපත් ස්වභාවික පරිසරයක් ඇතිකිරීම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම. | පවත්වන දැනුවත් කිරිමේ වැඩසටහන් ගණන | 10 | 80 | 30 | 34 |
| 3 | පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. | ආදර්ශ වන වගා ඇති කරන ලද පාසල් ගණන ගණන | 30 | 23 | 25 | 30 |
| | | ආදර්ශ වන ඇති කරන ලද සෞඛ්‍ය ආයතන ගණන | - | 16 | 25 | 30 |
| | | ආදර්ශ වන ඇති කරන ලද විහාරස්ථාන ගණන | - | 20 | 25 | 30 |
| | | ආදර්ශ වන ඇති කරන ලද වැව් ගණන | 3 | 16 | 30 | 30 |
| | | පවත් වන ලද දැනුම මිණුම වැඩසටහන් ගණන | - | 1 | 1 | 1 |
| | | සංවර්ධනය කරන ලද ස්වභා උයන් ගණන | - | 1 | 2 | 5 |

**ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හී ප්‍රගතිය**

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කල ප්‍රතිපාදන (රු) | සමුච්චිත වියදම (රු) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ගුණාත්මක භාවයෙන් ඉහළ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ඇති කිරීම තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ඇති කිරීම, සේවාලාභීන් තුළ ප්‍රචලිත දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබීම,සමාජ සුබසාධනය සවිබල ගැන්වීම තුළින් රැකවරණය ලැබිය යුත්තන් සවිබල ගැන්වීම හා ළමා රක්ෂක සේවා විධිමත් කිරීම තුළින් ළමුන්ගේ රැකවරණය ශක්තිමත් කිරීම | ප්‍රගති සමාලෝචන රැස්වීම්,ක්ෂේත්‍ර කටයුතු, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | ඵලදායි ආයතන පද්ධතියක් | - | - | - |
| | කාර්යාල උපකරණ මිලදී ගැනීම | ඵලදායි සේවාවක් | 500,000.00 | 479,740.00 | 96 |
| | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | ඵලදායි සේවාවක් | 500,000.00 | 191,950.00 | 38 |
| | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය උදෙසා නිළධාරීන්ට පුහුණු වැඩසටහන් | ඵලදායි සේවාවක් | 300,000.00 | 214,771.00 | 72 |
| පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. | උතුරු මැද පළාතේ හඳුනාගත් සංවේදී පාරිසරික කලාප ස්ථාන හා ආයතන ආශ්‍රිතව සුදුසු පළතුරු,ඖෂධීය ශාක හා වෙනත් තුරුලතා රෝපනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරිම. | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 1,250,484.00 | 1,091,697.00 | 87 |
| | සෞඛ්‍ය ආයතන ආශ්‍රිතව පළතුරු හා ඖෂධීය වටිනාකමින් යුත් රුක් රෝපණය | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 450,000.00 | 102500.00 | 23 |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කල ප්‍රතිපාදන (රු) | සමුච්චිත වියදම (රු) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම | විහාරස්ථාන ආශ්‍රිතව පළතුරු හා ඖෂධීය වටිනාකමින් යුත් රුක් රෝපණය | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 750,000.00 | 118523.00 | 15 |
| | පාසල් ආශ්‍රිත පරිසර ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 1,100,000.00 | 976233 | 88 |
| | ස්වභාඋයන් නිර්මාණය, ප්‍රවර්ධනය කිරීම | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 2,000,000.00 | - | 0 |

**සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.**

| අරමුණු | ඉලක්ක | | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|---|
| | දර්ශකය | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| 01. ඵලදායි සේවාවක් සැපයීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන නියාමනය සිදු කිරීම සඳහා, ප්‍රතිපත්ති, උපදෙස් හා ප්‍රගති සමාලෝචනයන් සිදු කිරීම. | කාර්ය මණ්ඩල අභිප්‍රේරණය හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 12 | 15 | කාර්යක්ෂම මහජන සේවාවක් සපයන ආයතන පද්ධතියක් | තෘප්තිමත් ප්‍රජාවක් |

## සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක | | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|---|
| | දර්ශකය | 2020 | 2021 | කෙටි කාලීන | දිගුකාලීන |
| 2. පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායී පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. | වැව් රක්ෂිත හා වැව් ආශ්‍රිතව පරිසරයන්හි සුසුදු වනගහනය ව්‍යාප්ත කිරිම හා වැඩි දියුණු කිරිම | 30 | 30 | හරිත බල ශාලාවක් | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. |
| | උතුරු මැද පළාතේ විහාරස්ථාන හා වෙනත් ආගමික ස්ථාන ආශ්‍රිතව ප්‍රජා දායකත්වය සහිතව ඖෂධීය, පළතුරු හා වෙනත් තුරු ලතා රෝපනය හා ප්‍රවර්ධනය | 25 | 30 | | |
| | උතුරු මැද පළාතේ සෞඛ්‍ය ආයතන ආශ්‍රිතව පළතුරු හා ඖෂධීය වටිනාකමින් යුතු ශාක රෝපනය හා ප්වර්ධනය | 25 | 30 | | |
| | පාසල් හා පෙරපාසල් හා වෙනත් ආයතන ආශ්‍රිතව පළතුරු සහ වෙනත් ශාක රෝපනය හා ප්‍රවර්ධනය | 25 | 30 | | |
| | පළාත් පාලන ආයතන හරහා නඩත්තු වන ස්ථානවල මී පැල රෝපනය හා ප්‍රවර්ධනය | 2500 | 3000 | | |
| | වස විස රහිත ආහාර සුලභ කිරිම සඳහා ප්‍රාදේශීය ආයුර්වේද වෛද්‍යවරු හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. | 12 | 12 | | සුරක්ෂිත ප්‍රජාවක් |
| | පළාත් පෝෂණ සැලැස්ම සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරිම හා අධීක්ෂණය | 12 | 12 | | සෞඛ්‍ය සම්පන්න සවිමත් පරපුරක් |
| | ලෝක පරිසර දිනය සැමරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම. | 05 | 10 | | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක් |
| | පරිසර සංරක්ෂණය අරමුණ කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම | 24 | 24 | | |
| | පාරිසරික බලපෑම් හේතුවෙන් ඇතිවන හදිසි ආපදා තත්ව සඳහා සහන සැලසීම. | 03 | 03 | | |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

මෙම අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා මූලික අරමුණුවලට අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු මෙහෙයවීමේ කාර්යයේදී අදාළ වන වැය දැරීම සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස රු.මි.41.63 ලැබී තිබූ අතර එහි සත්‍ය වියදම රු.මි.32.02 ක් වේ. එය ප්‍රතිශතයක් ලෙස76.9% ක අගයක් ගන්නා අතර සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා මූලධන ප්‍රතිපාදන ලෙස රු.මි.11 ක් ලැබී ඇත. නමුත් 25% ප්‍රතිපාදන ඉතිරි කිරීම මත වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු 7,371,493 ක් විය. එහි වැය රු. 3,786,279 වන අතර එය ප්‍රතිශතයක් ලෙස 51.36 % කි.

ඒ අනුව අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් සියළු දෙපාර්තමේන්තුවල කාර්යයන් නියාමනය, ප්‍රතිපත්ති සම්පාදනය, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය, මෙහෙයවීම හා සම්බන්ධීකරණය යන කාර්යයන් ඉටු කිරීමේදී ඉහළ කාර්ය සාධනයක් මෙම අමාත්‍යාංශය මගින් අත්පත් කරගෙන ඇති අතර දෙපාර්තමේන්තුවල කාර්ය සාධන ඉලක්ක සාධනීය ලෙස ඉටු කර තිබීම මගින් එය තව දුරටත් තහවුරු වේ.

ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකුව යන ආයතනවල මූල්‍ය ප්‍රතිපාදන මත 2019 වර්ෂයේදී ක්‍රියාත්මක වූ සහ 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හා සැලසුම්කරණයේදී මෙම අමාත්‍යාංශයේ දායකත්වය ඉතා ඉහළ මට්ටමක පැවතුණි. 2019 වර්ෂය තුළදී ඉලක්කගත සංවර්ධන කටයුතු සාර්ථකව නිම කිරීමට අදාළ දෙපාර්තමේන්තුවලට හැකියාවක් ලැබිණි.

පළාත් ආයුර්වේද, සමාජසේවා හා පරිවාස යන දෙපාර්තමේන්තුවල ඵලදායීතාවය ඉහළ නංවාලීම සඳහාද මෙම අමාත්‍යාංශයේ දායකත්වය ලබාදුන් අතර එම දෙපාර්තමේන්තුවලද කාර්ය සාධනය ඉහළ නංවාලමින් ප්‍රශස්ත මහජන සේවාවක් 2019 වර්ෂයේදී ලබා දීමට ඔවුන්හට හැකියාවක් ලැබී ඇති බව එම දෙපාර්තමේන්තුවල සංවර්ධන ඉලක්ක පරික්ෂාකර බැලීමේදී පැහැදිලි වේ.

කාර්ය සාධනය කරා ළඟා වීමේ දී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස කාර්ය මණ්ඩලවල පවතින ඌනතාවයන්, ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය වාහන පහසුකම් හිඟතාවය සහ බාහිර ආයතන හා නිලධාරීන් කළමනාකරණය කරගැනීමේදී මතුවන ගැටළුවලට මුහුණ දීමට සිදු වීම ආදිය දැක්විය හැකිය.ඒ අනුව 2019 වර්ෂයේදී ලබාගත් අත්දැකීම් උපයෝගී කරගෙන 2020 වර්ෂය සඳහා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

# 8.1.පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන පද්ධතිය

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | 01 | - | 01 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 01 | 02 |
| සෞඛ්‍ය නිලධාරී කාර්යාලය | 22 | 08 | 30 |
| මූලික රෝහල් | 06 | 02 | 08 |
| ප්‍රාදේශීය රෝහල් (ඒ ශ්‍රේණිය) | 01 | 01 | 02 |
| ප්‍රාදේශීය රෝහල් (බී ශ්‍රේණිය) | 10 | 04 | 14 |
| ප්‍රාදේශීය රෝහල් (සී ශ්‍රේණිය) | 21 | 04 | 25 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක | 22 | 16 | 37 |
| ක්ෂය රෝග මර්ධන සායන මධ්‍යස්ථාන | 01 | 01 | 02 |
| ලිංගාශ්‍රිත බෝවන රෝග නිවාරණ ඒකක | 01 | 01 | 02 |
| වාහන සේවා මධ්‍යස්ථාන | 01 | - | 01 |
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු ඒකකය | 01 | - | 01 |
| **එකතුව** | **88** | 38 | **125** |

ඒ ශ්‍රේණිය - ඇඳන් 100ට අඩු බී ශ්‍රේණිය - ඇඳන් 50-100 සී ශ්‍රේණිය - ඇඳන් 50ට අඩු

මහජන සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාස - 110

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි කොට්ඨාස - 446

උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන පිළිබඳ තොරතුරු -2019

| අංකය | වාහන වර්ගය | පළාත් කාර්යාලය | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | එකතුව |
|---|---|---|---|---|---|
| | | | අනුරාධපුර | පොළොන්නරුව | |
| 01 | මෝටර් කාර් | 01 | - | - | 01 |
| 02 | ගිලන් රථ | 01 | 70 | 28 | 99 |
| 03 | කැබ් රථ | 06 | 41 | 27 | 74 |
| 04 | වෑන් | 03 | 12 | 14 | 29 |
| 05 | ජීප් රථ | 02 | 04 | 02 | 08 |
| 06 | ලොරි රථ | - | 04 | 04 | 08 |
| 07 | බවුසර් රථ | - | 02 | 01 | 03 |
| 08 | ත්‍රිවීල් රථ | 02 | 04 | 02 | 08 |
| 09 | මෝපෙඩ් මෝටර් සයිකල් | 01 | 02 | - | 03 |
| 10 | බස් රථ (ජංගම දන්ත සායන) | - | 02 | 01 | 03 |
| 11 | මෝටර් බයිසිකල් | - | 01 | 01 | 02 |
| | **එකතුව** | **16** | **142** | **80** | **238** |

### පළාතේ මහජනතාව සඳහා සපයනු ලබන සේවාවන්

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| බාහිර රෝගීන් | අනුරාධපුර | 2,645,417 | 2,635,718 | 2,224,028 | 2,213,126 | 2946311 |
| | පොළොන්නරුව | 856,179 | 880,498 | 854,620 | 893,141 | 954569 |
| | **එකතුව** | **3,501,596** | **3,516,216** | **3,078,648** | **3,106,267** | **3900880** |
| නේවාසික රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 183,981 | 180,066 | 172,567 | 186,322 | 183156 |
| | පොළොන්නරුව | 64,373 | 61,995 | 59,372 | 62,361 | 39706 |
| | **එකතුව** | **248,354** | **242,061** | **231,939** | **248,683** | **222862** |
| සායනික ප්‍රතිකාර සේවා රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 474,629 | 534,822 | 473,558 | 2,399,448 | 664377 |
| | පොළොන්නරුව | 179,101 | 227,110 | 227,032 | 955,502 | 244914 |
| **එකතුව** | | **653,730** | **761,932** | **700,590** | **3,354,950** | **909291** |

### නිවාරණ සෞඛ්‍ය සේවාවන් සැපයීම

| | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ | 72 | 38 | 110 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් | 58 | 29 | 87 |
| පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාශ | 298 | 148 | 446 |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් | 222 | 128 | 350 |
| ග්‍රාමීය සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන | 202 | 107 | 309 |

### පළාතේ සෞඛ්‍ය දර්ශක 2014 – 2019

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතය (සජීවී උපත්1000 ට) | අනුරාධපුර | 10.9 | 16.7 | 16.7 | 16.7 | 7.9 |
| | පොළොන්නරුව | 9.2 | 11.6 | 7.5 | 7.5 | 10.1 |
| මාතෘ මරණ අනුපාතය (සජීවී උපත්1000 ට) | අනුරාධපුර | 28.4 | 47.7 | 32.0 | 32 | 25.8 |
| | පොළොන්නරුව | 27.4 | 28.4 | 28.0 | 28 | 13.3 |
| දළ උපත් අනුපාතය (පුද්ගලයින් 1000 ට) | අනුරාධපුර | 17.8 | 17.3 | * | - | - |
| | පොළොන්නරුව | 17.7 | 16.9 | * | - | - |
| දළ මරණ අනුපාතය ( පුද්ගලයින් 1000 ට) | අනුරාධපුර | 5.5 | 5.8 | * | - | - |
| | පොළොන්නරුව | 5.5 | 5.2 | * | - | - |
| මන්දපෝෂණ තත්වය(වයස 05ට අඩු - අඩු බර) | අනුරාධපුර | - | - | - | - | 22.2 |
| | පොළොන්නරුව | - | - | - | - | 16.6 |

## තෝරා ගත් රෝග කිහිපයක වාර්තා වූ රෝගීන් ව්‍යාප්තිය

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|
| වකුගඩු රෝගීන් | 3,515 | 4,122 | 16,464 | 19,377 |
| ඩෙංගු රෝගීන් | 809 | 637 | 953 | 1,373 |
| ක්ෂය රෝගීන් | 381 | 393 | 399 | 364 |
| පිළිකා රෝගීන් | 1,596 | 1,768 | 1,619 | 1,562 |
| ලාදුරු රෝගීන් | 140 | 176 | 137 | 131 |

## දැක්ම

" නීරෝගිමත් ජනතාවක් සමෘද්ධිමත් පළාතක් "

## මෙහෙවර

"උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාන හා සමානුපාතික ලෙස ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ප්‍රජාව වෙත සැපයීම සඳහා තම සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස යෙදවීම".

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ සෞඛ්‍ය ආයතනයන්හී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- උතුරු මැද පළාතට සුවිශේෂී වූ සෞඛ්‍ය ගැටළුවන වකුගඩු රෝගය, වස විෂ ශරීරගත වීම් සහ පිළිකා රෝග තත්වයන් අවම කිරීම.
- ප්‍රාදේශීය රෝහල් මගින් ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ලබා දීම සහ පළාතේ මූලික රෝහල් අංග සම්පූර්ණ පහසුකම් සහිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා දායකත්වය සහ අන්තර් පාර්ශවීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම.

## කෙටි කාලීන අරමුණු

- වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදනයන් කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරීම.
- ප්‍රමුඛතාවය මත හඳුනාගත් ඉලක්කගත වැඩසටහන් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- වකුගඩු රෝග කළමනාකරණයේදී හඳුනාගත් රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.
- වසවිෂ ශරීරගත වීම් සහ පිළිකා තත්වයන් කළමනාකරණය ඉලක්ක සහගත ලෙස ක්‍රියාත්මක කිරීම.
- සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන් ඉලක්ක සහගත ලෙස නියාමනය කිරීම.
- හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම.
- තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කළමනාකරණය කාර්යක්ෂම කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ප්‍රතිකාරක සෞඛ්‍ය සේවා සැපයීම සහ රෝග නිවාරණ සෞඛ්‍ය සේවා සැපයීම.
- පර්යේෂණ, සමීක්ෂණ හා ධාරිතා සංවර්ධනය.
- අන්තර් ආංශික සම්බන්ධතා ශක්තිමත් කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ප්‍රම්පාදන ක්‍රියාවලිය විධිමත්ව අධීක්ෂණය කිරීම.
- පුහුණු වැඩසටහන් දත්ත පද්ධතියක් මගින් යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩල තොරතුරු හා පෞද්ගලික ලිපිගොනු, වැටුප් වර්ධක, පත්වීම් සම්බන්ධයෙන් ඉලක්ක සහගත ලෙස කළමනාකරණය සිදු කිරීම.
- පුහුණුකරුවන් පුහුණු කිරීම්, දැනුවත් කිරීම් සහ දැනුවත් කිරීම් වැඩසටහන් ගුණාත්මක ලෙස සිදු කිරීම.
- සෞඛ්‍ය ආයතන ආයෝජනයේදී ප්‍රතිකාර සේවා සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- ප්‍රදේශයේ ඇති සෞඛ්‍ය ආයතන අදාල ශ්‍රේණියට අනුව සියළු පහසුකම් ලබා දිය හැකි සෞඛ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කිරීම.
- පළාත තුළ ක්‍රියාත්මකවන පර්යේෂණ හා සමීක්ෂණ, පළාත් පර්යේෂණ හා සමාලෝචන කමිටුව මගින් නියාමනය කිරීම.

## අංශය නියෝජනය කරන
## තිරසර සංවර්ධන අරමුණු යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

**03**


**නීරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම**

3 GOOD HEALTH AND WELL-BEING

- මාතෘ හා ළමා මරණ අවම කිරීම
- සරම්ප ප්‍රතිශක්තීකරණ ආවරණය වැඩිකිරීම
- දිළිඳුකම හේතුකරගෙන ළමා වියේදී ඇතිවන අයහපත් සංකූලතා අවම කිරීම
- එච්.අයි.වී සහ මැලේරියා රෝගීන්ගේ ව්‍යාප්තිය අවමකිරීම
- වකුගඩු රෝග ව්‍යාප්තිය අවම කිරීම සහ රෝගීන් කල්තබා හඳුනාගෙන ප්‍රතිකාර සිදුකිරීම,
- සියදිවි නසාගැනීම් සහ ස්වයංහානි කරගැනීමට තැත් කිරීම් අවම කිරීම
- මාතෘ හා ළමා මන්ද පෝෂණ තත්ත්වය අවම කිරීම


## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 5155 |
| 2 | සේවයේ නියුතු | 3906 |
| 3 | පුරප්පාඩු | 1249 |
| 4 | අනියම් | 35 |
| 5 | කොන්ත්‍රාත් පදනම මත | 65 |
| 6 | ආදේශක | 34 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම් ( රු.මි.) | ඉතිරිය ( රු.මි. ) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 3817.98 | 3816.19 | 1.79 | 99 |
| ගමන් වියදම් | 141.70 | 141.69 | 0.01 | 99 |
| සැපයීම් | 250.05 | 244.88 | 5.17 | 97 |
| නඩත්තු | 91.86 | 88.77 | 3.09 | 96 |
| ගිවිසුම්ගත සේවා | 220.48 | 211.93 | 8.55 | 96 |
| මාරු කිරීම් | 13.80 | 12.80 | 1.00 | 92 |
| **එකතුව** | **4535.87** | **4516.26** | **19.61** | **99** |




## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම් (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 246.45 | 127.39 | 119.06 | 52 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 216.98 | 103.59 | 113.39 | 48 |
| වාහන | 1.63 | 0.80 | 0.83 | 49 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 230.42 | 104.38 | 126.04 | 45 |
| **එකතුව** | **695.48** | **336.16** | **359.32** | **48** |

## කාර්යය සාධන ඉලක්ක 2017-2019

පළාත් සෞඛ්‍ය අංශයේ දර්ශකයන්ගේ සාධනීය මට්ටමක් ළඟාකර ගැනීම සඳහා අරමුණු ( අංක 1- 7 දක්වා), දර්ශක හා ඉලක්ක පිළිබඳ විග්‍රහය (2017-2019)



**පළාත් සෞඛ්‍ය අංශයේ දර්ශකයන්ගේ සාධනීය මට්ටමක් ළඟාකර ගැනීම සඳහා අරමුණු ( අංක 8-10 දක්වා), දර්ශක හා ඉලක්ක පිළිබඳ විග්‍රහය (2017-2019)**

| ආයතනයේ අරමුණ | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| 08.දිස්ත්‍රික්කය තුළ සෞඛ්‍ය සම්පන්න නිරෝගිමත් ප්‍රජාවක් බිහි කිරිම | මාතෘ මරණ සංඛ්‍යාව අඩු කිරීම | 1% | 1% | 0% |
| | ළදරු මරණ අනුපාතිකය අඩු කිරීම | 8.3% | 7.8% | 7.0% |
| | අඩු බර උපත් අඩු කිරීම | 10% | 9% | 7% |

**පළාත් සෞඛ්‍ය අංශයේ දර්ශකයන්ගේ සාධනීය මට්ටමක් ළඟාකර ගැනීම සඳහා අරමුණු ( අංක 8-10 දක්වා), දර්ශක හා ඉලක්ක පිළිබඳ විග්‍රහය (2017-2019) ඉතිරි කොටස...**

| ආයතනයේ අරමුණ | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| 09.දිස්ත්‍රික්කය තුළ බෝවන රෝග ව්‍යාප්තිය අවම කිරිම සහ ඩෙංගු ව්‍යාප්තිය මැඩලීම | ලීෂ්මනයිසීස් රෝග ව්‍යාප්තිය අඩු කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 142 | 246 | 180 |
| | ලාදුරු රෝග ව්‍යාප්තිය අවම කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 57 | 45 | 35 |
| | ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 1086 | 247 | 200 |
| 10. ජනතාව තුළ දන්ත රෝග අවම කිරිම මෙන්ම මුඛ පිළිකා වැළැක්වීම | දත් දිරායාම අවම කිරිම | 60% | 58% | 55% |
| | විදුරුමස් රෝගය අවම කිරිම | 75% | 72% | 69% |
| | පූර්ව මුඛ පිළිකා හඳුනා ගැනීම | 0 | 2% | 3% |

ඉහතින් දක්වා ඇති පළාත් සෞඛ්‍ය අංශයේ දර්ශකයන්ගේ සාධනීය මට්ටමක් ළඟාකර ගැනීම සඳහා ඉලක්කගත අරමුණු ඔස්සේ අපේක්ෂා කරයි. එහිදී නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම, ගුණාත්මක හා ඵලදායි පහසුකම් සහිතව රෝහල් වැඩිදියුණු කිරීම, ආයතන කළමනාකරණ සංවර්ධන හා සේවාව ප්‍රශස්ත මට්ටමේ පවත්වාගෙන යාම, ගුණාත්මක හා ඵලදායි බාහිර රෝගී සත්කාර සේවාව වැඩිදියුණු කිරීම, මාතෘ හා ළමා සෞඛ්‍ය පෝෂණය ප්‍රවර්ධනය කිරීම, ආයතනික ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පළාත තුළ සෞඛ්‍ය සම්පන්න නිරෝගිමත් ප්‍රජාවක් බිහි කිරිම, බෝවන රෝග ව්‍යාප්තිය අවම කිරිම සහ ඩෙංගු ව්‍යාප්තිය මැඩලීම මෙන්ම පළාතේ ජනතාව තුළ දන්ත රෝග අවම කිරිම හා මුඛ පිළිකා වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ඉලක්ක කෙරේ.

පළාතේ තෝරා ගත් දර්ශකයන්ගේ සැලකිය යුතු කාර්ය සාධනයක් ලබා ගැනීමට 2017-2019 තුන් අවුරුදු ඉලක්ක තුළ අපේක්ෂා කරයි. එහිදී මාතෘ මරණ අනුපාතිකය, ළදරු මරණ අනුපාතිකය යන දර්ශකවල සැලකිය යුතු ප්‍රගතියක් අපේක්ෂා කරන අතර මනා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රෝගීන්ගේ ප්‍රතිකාර සේවා ලබා ගැනීම සඳහා ගතවන කාලය අඩුකිරීම මෙන්ම සමස්තයක් ලෙස මුළු රට තුළම ඉහළ යාමේ ප්‍රවණතාවයක් පවතින බෝ නොවන රෝග පරීක්ෂා කිරීම හා බෝ නොවන රෝග වලින් වැළකී සිටීමට ජනතාව නැඹුරු කිරීමත්, බාහිර රෝගී ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රැඳවුම් කාලය අඩුකිරීමත්, උපතේදී අඩු බර උපත් අඩු කිරිමත් කැපී පෙනෙන ලෙස ඉලක්ක සාධනය කර ගැනීමත් අපේක්ෂා කරයි.

එමෙන්ම ලීෂ්මනයිසීස් රෝග ව්‍යාප්තිය අඩු කිරිම, ලාදුරු රෝග ව්‍යාප්තිය අවම කිරිම, ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කිරිමත් මුඛ සෞඛ්‍ය හා සම්බන්ධ දත් දිරායාම අවම කිරිම, විදුරුමස් රෝගය අවම කිරිම, පූර්ව මුඛ පිළිකා හඳුනා ගැනීම යන අංශයන්ගේ දර්ශකයන්හී ඉලක්ක සාධනය කරගැනීමත් අපේක්ෂා කරයි.

**අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා නිමැවුම් දර්ශක.**

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය ( රු.මි ) | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් මගින් නිරෝගී දිවි පෙවතක් ස්ථාපිත කිරිම | ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමේ ප්‍රතිශතය 25 % කින් වැඩි කිරිම | මාතෘ මරණ අනු.<br>ළදරු මරණ අනු.<br>මන්දපෝෂණ ප්‍රතිශතය | 620 | 318 |

**තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්ක | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය ( රු.මි ) | ඉලක්කගත වියදම ( රු.මි ) |
|---|---|---|---|---|---|
| ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් මගින් නිරෝගී දිවි පෙවතක් ස්ථාපිත කිරිම | ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමේ ප්‍රතිශතය 25 % කින් වැඩි කිරිම | මාතෘ මරණ අනු.<br>ළදරු මරණ අනු.<br>මන්ද පෝෂණ ප්‍රතිශතය | PSDG<br>PSSP<br>SHSDP | 620 | 318 |

## කාර්යය සාධන ඉලක්ක

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව ) - වියදම /ආයෝජනය (රු.මි ) | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 01 | නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම | ගුණාත්මක සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 40% | 60% | රු.මි 150 | රු.මි 150 |
| | | ගුණාත්මක පානීය ජල පහසුකම් සැපයීම | 40% | 60% | රු.මි 30 | රු.මි 20 |
| | | ප්‍රතිකාර සඳහා රෝගීන්ට ගතවන කාලය අඩුකිරීම | 40% | 60% | රු.මි 80 | රු.මි 70 |
| | | බෝ නොවන රෝග අවම කිරිම | 52% | 62% | රු.මි 30 | රු.මි 40 |
| 02 | ගුණාත්මක හා ඵලදායි පහසුකම් සහිතව රෝහල් වැඩිදියුණු කිරීම | ගුණාත්මකව සංවර්ධිත රෝහල් ස්ථාපිත කිරිම | 70% | 90% | රු.මි 420 | රු.මි 280 |
| 03 | හදිසි ප්‍රතිකාර සේවාව වැඩිදියුණු කිරීම | හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපිත කිරිම | 70% | 90% | රු.මි 120 | රු.මි 150 |
| 04 | ගුණාත්මක හා ඵලදායි බාහිර රෝගී සත්කාර සේවාව වැඩිදියුණු කිරීම | රැඳවුම්කාලය අඩුකිරීම | 50% | 75% | රු.මි 180 | රු.මි 260 |
| 05 | මාතෘ හා ළමා සෞඛ්‍ය පෝෂණය ප්‍රවර්ධනය කිරීම | මාතෘ මරණ අනුපාතිකය | 22 | 21 | රු.මි 70 | රු.මි 80 |
| | | ළදරු මරණ අනුපාතිකය | 6 | 5.5 | රු.මි 12 | රු.මි 15 |
| 06 | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් | මානව සම්පත් සංවර්ධනය | 40% | 60% | රු.මි 7 | රු.මි 8 |
| 07 | දිස්ත්‍රික්කය තුළ බෝවන රෝග ව්‍යාප්තිය අවම කිරිම සහ ඩෙංගු ව්‍යාප්තිය මැඩලීම | ලීෂ්මනයිසීස් රෝග ව්‍යාප්තිය අඩු කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 246 | 180 | රු.මි 7 | රු.මි 8 |
| | | ලාදුරු රෝග ව්‍යාප්තිය අවම කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 45 | 35 | රු.මි 1 | රු.මි 1 |
| | | ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 247 | 200 | රු.මි 4 | රු.මි 5 |
| 08 | ජනතාව තුළ දන්ත රෝග අවම කිරිම මෙන්ම මුඛ පිළිකා වැළැක්වීම | දත් දිරායාම අවම කිරිම | 58% | 55% | රු.මි 12 / රු.මි 15 | |
| | | විදුරුමස් රෝගය අවම කිරිම | 72% | 69% | | |
| | | පූර්ව මුඛ පිළිකා හඳුනා ගැනීම | 2% | 3% | | |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2019

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| වකුගඩු රෝග නිවාරණ, ප්‍රතිකාර, පර්යේෂණ සහ රෝගී සුහසාධන වැඩසටහන් කළමනාකරණය | මැදවච්චිය ,පදවිය, හිගුරක්ගොඩ සහ මැදිරිගිරිය ප්‍රාදේශීය රෝහල්හි රුධිර කාන්දුකරණ ඒකක වැඩිදියුණු කිරිම, දිස්ත්‍රික් රසායනාගාර ස්ථාපිත කිරිම,රෝගීන් හඳුනාගැනිමේ වැඩසටහන් ව්‍යාප්ත කිරිම,මෙත්සිරි සෙවන සහන සත්කාර මධ්‍යස්ථානය ස්ථාපිත කිරිම. | ප්‍රාදේශීය රෝහල්හි රුධිර කාන්දුකරණය සඳහා වැඩි රෝගීන් සංඛ්‍යාවක් යොමු වීම, ,අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක සඳහා රසායනාගාර සේවා ස්ථාපිත කිරිම, පූර්ව රෝග ලක්ෂණ සහිත රෝගීන් හඳුනාගැනිම. අනුරාධපුර ශික්ෂණ රෝහලට පැමිණෙන වකුගඩු රෝගීන් සඳහා රාත්‍රී නවාතැන් පහසුකම් සැපයීම. | 220 | 180 | 82 |
| නව යොවුන්වියේ දරුවන් අතර යහපත මානසික සුවතාවයක් ඇතිකර අධ්‍යයනය නිසි පරිදිකරගෙන යා හැකි පරිසරයක් ගොඩනැගීම | නව යොවුන්වියේ දරුවන්ට බලපාන මානසික ගැටළු සහ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් දරුවන් සහ දෙමාපියන් දැනුවත්කිරීම | නව යොවුන්වියේ දරුවන්ගේ මානසික ගැටළු අවමකර අධ්‍යාපනය නිසි පරිදිකරගෙන යා හැකි පරිසරයක් ගොඩනැගීම | 0.1 | 0.1 | 100 |
| විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් දෙමාපියන් සහ පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම | පෙර පාසල් ගුරුවරු හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කුඩා කලම හඳුනාගෙන ඔවුන් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීම | 2 | 3 | 100 |
| පුනරුත්ථාපනය ලබන මානසික රෝගීන්ගේ පවුල්වල මානසික සුවතාවය වර්ධනය කිරීම | මානසික සුවතා වැඩසටහන් (භාවනා වැඩසටහන සහ අවුරුදු උත්සවය) | පුනරුත්ථාපනය ලබන මානසික රෝගීන්ට පවුල්වල මානසික සුවතාවය වර්ධනය කිරීම | 0.1 | 0.1 | 100 |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මකකළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් දිස්ත්‍රික් වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය | ප්‍රගති සමාලෝචන රැස්වීම් | ප්‍රගතිය සමාලෝචන රැස්වීම් | 0.5 | 0.5 | 100 |
| යොවුන්වියේ දරුවන්ට බලපාන මානසික රෝග, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා පුහුණුව ලබාදීම | මානසික සෞඛ්‍ය දින වැඩසටහන් පැවැත්වීම | මානසික ගැටළුවලින් තොර යහපත් මානසික වටපිටාවක් ගොඩනගා දීම | 0.6 | 0.6 | 100 |
| බෝවන රෝග සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | දිස්ත්‍රික්කයේ රෝගීන් 50%කින් අඩුකිරීම | 0.5 | 0.5 | 100 |
| ඩෙංගු පිළිබඳ වැඩසටහන් සඳහා සති නාමකරණය | සතියෙහි ශ්‍රමදාන වැනි වැඩසටහන් පැවැත්වීම | ඩෙංගු රෝගීන් අඩුකිරීම සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මරණ සංඛ්‍යාව අඩුකිරීම | 2 | 2 | 100 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සමග බෝනොවන රෝග සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | බෝ නොවන රෝග සම්බන්ධයෙන් අවශ්‍යතා මිලදී ගැනීම සහ වැඩසටහන් සංවිධානය කිරීම | 0.1 | 0.1 | 100 |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මකකළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ගුණාත්මක හා ඵලදායී පහසුකම් සහිතව රෝහල් වැඩිදියුණු කිරීම | රෝහල් ගොඩනැගිලි සහ කාර්යය මණ්ඩලය සඳහා ලබාදී ඇති නිල නිවාස ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | රෝහල් ගොඩනැගිලි වැඩිදියුණු කිරීම මගින් වඩාත් ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ලබාදීම | 420 | 220 | 50 |
| ගුණාත්මක හා ඵලදායී පහසුකම් සහිතව බාහිර රෝගී සත්කාර සේවාව වැඩිදියුණු කිරීම | බාහිර රෝගී අංශ ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | බාහිර රෝගී සත්කාර සේවාව වැඩිකිරීම මගින් රැඳවුම් කාලය අඩුකිරීම හා ගුණාත්මක හා ඵලදායී සත්කාර සේවාව සිදුකිරීම | 180 | 100 | 55 |
| හදිසි ප්‍රතිකාර සේවාව වැඩිදියුණු කිරීම | හදිසි ගොඩනැගිලි ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | පැය 24 ක් තුළ සිදුවන මරණ අවම කිරීම | 120 | 100 | 80 |
| මාතෘ හා ළමා සෞඛ්‍ය පෝෂණය ප්‍රවර්ධනය කිරීම | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වැඩිදියුණු කිරීම මගින් නිවාරණ සෞඛ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිකිරීම | 12 | 12 | 100 |
| ආයතන කළමනාකරණ, සංවර්ධන හා සේවාව ප්‍රශස්ථ මට්ටමේ පවත්වාගෙන යාම | ආයතනයෙන් සපයනු ලබන සේවාවන් පිළිබඳව සැලකිලිමත්වීම | ආයතන කළමනාකරණ, සංවර්ධන හා සේවාව ප්‍රශස්ථ මට්ටමේ පවත්වාගෙන යාම තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබාදීම | 75 | 75 | 100 |
| ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් | කාර්ය මණ්ඩලය සඳහා නව පුහුණු සැසි පවත්වා දැනුම සහ නව උපකරණ පිළිබඳ දැනුම ලබාදීම | කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය මගින් වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ප්‍රජාව වෙත ලබාදීම | 8 | 6 | 80 |

**විදේශ ආධාර මත ක්‍රියාත්මක කරනලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම**

| අ.අ | ව්‍යාපෘතිය | විෂයපථයට අසුවන කරුණු | ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) |
| 01 | ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වු SHSDP ව්‍යාපෘතිය | රෝහල් ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම. | 91.00 | 38.00 | 55 | 41 |
| | | නිවාරණ සේවා වැඩිදියුණු කිරිම | 11.00 | 4.80 | 60 | 43 |
| | | කළමණාකරන සේවා වැඩිදියුණු කිරිම | 87.00 | 45.00 | 70 | 50 |
| 02 | ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වු PSSP ව්‍යාපෘතිය | රෝහල් ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම. | 138.0 | 71.00 | 25 | 51 |
| | | නිවාරණ සේවා වැඩිදියුණු කිරිම | 8.00 | 4.00 | 55 | 50 |
| | | කළමනාකරණ සේවා වැඩිදියුණු කිරිම | 3.50 | 3.00 | 90 | 85 |
| 03 | ADB ආධාර යටතේ ක්‍රියාත්මක වු HSEP ව්‍යාපෘතිය | ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරිම | 209.80 | 42.30 | 45 | 20 |
| **එකතුව** | | | **548.40** | **208.10** | | **38** |

2019 වර්ෂයේ උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පළාත් සෞඛ්‍ය අංශය සංවර්ධනය උදෙසා රු.මි. 548.40ක් වෙන් කර තිබු අතර ඉන් රු.මි. 208.10ක් පමණ වැය වු අතර මූල්‍ය ප්‍රගතිය 38% කි. ඒ අනුව සෞඛ්‍ය අංශයේ සංවර්ධනය උදෙසා හඳුනාගත් අත්‍යාවශ්‍ය සෞඛ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වීමත්, උසස් රෝගී ප්‍රතිකාර හා සත්කාරක සේවාවක් ලබාදීම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමත් ,කාර්ය මණ්ඩලය දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා උසස් පුහුණුවක් ලබාදීමත් සිදු විය. ඒ තුළින් බෝවන රෝග හා බෝ නොවන රෝග ව්‍යාප්තිය අවම කිරීම , මාතෘ හා ළදරු මරණ අවම කිරීම හා සෞඛ්‍යමත් ප්‍රජාවක් බිහි කිරීමටත් අපේක්ෂා කරන ලදී.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | විෂය පථයට හසුවන අරමුණු | ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) |
| 01 | තඹුත්තේගම මුලික රෝහල වැඩිදියුණු කිරිම | ද්විතීක/තෘතීක ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම | 156 | 46 | 70 | 29 |
| 02 | රෝහල් ජාලගත කිරිම | ජාලගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරිම | 4.5 | 1.9 | 50 | 42 |
| 03 | මැදවච්චිය රෝහලේ වකුගඩු ඒකකය වැඩිදියුණු කිරිම | වකුගඩු රෝග ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම | 13 | 2 | 40 | 15 |
| 04 | වකුගඩු රෝග නිවාරණ | | 45 | 45 | 100 | 100 |
| 05 | මෛත්සිරි සෙවණ මධ්‍යස්ථානයට උපකරණ සැපයීම | | 14.8 | 14.8 | 100 | 100 |
| 06 | තඹුත්තේගම රෝහලට උපකරණ සැපයීම | | 10.4 | 10.4 | 100 | 100 |
| 07 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රෝහල් සඳහා වෛද්‍ය උපකරණ සැපයිම | රෝගී සත්කාරක සේවා සංවර්ධනය | 1.78 | | 100 | |
| 08 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රෝහල් සඳහා කාර්යාල උපකරණ සැපයිම | රෝගී සත්කාරක සේවා කාර්යක්ෂමතාවය සංවර්ධනය | 0.20 | | 100 | |

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටි කාලීන | දිගු කාලීන |
| රෝහල් ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරිම. | රෝහල් ප්‍රතිකාර සේවා 60% කින් වැඩිදියුණු කිරිම | රෝහල් ප්‍රතිකාර සේවා 70% කින් වැඩිදියුණු කිරිම | ගුණාත්මක සෞඛ්‍ය සේවා සංවර්ධනයක් ස්ථාපිත කිරිම | නීරෝගිමත් ප්‍රජාවක් තුළින් සමෘද්ධිමත් පළාතක් බිහි කිරිම |
| නිවාරණ සේවා වැඩිදියුණු කිරිම | නිවාරණ සේවා 60% කින් වැඩිදියුණු කිරිම | නිවාරණ සේවා 80% කින් වැඩිදියුණු කිරිම | | |
| කළමනාකරණ සේවා වැඩිදියුණු කිරිම | කළමනාකරණ සේවා 50 % වැඩිදියුණු කිරිම | කළමනාකරණ සේවා 60 % වැඩිදියුණු කිරිම | | |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂයේ සමස්ත කාර්ය සාධනය ඇගයීමේදී මූලධන ප්‍රතිපාදනයන්ගේ උපයෝජනය 55%ක් වන අතර මෙය පිළිවෙළින් දේශීය අරමුදල් යොදා ගැනීමේදී 55%ක් සහ විදේශ ණය ආධාර ව්‍යාපෘතීන්ට 53%ක් ලෙස දැක්විය හැක.

මාතෘ හා ළමා සෞඛ්‍ය අංශයන්ගේ ප්‍රවර්ධනයක් නිරීක්ෂණය වූ අතර ප්‍රජාව වෙත වඩාත් සමීප වූ සෞඛ්‍ය සේවාවන් ලබා දීමේදී ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සමස්ත සෞඛ්‍ය ප්‍රවර්ධනයේ මූලික ගුණාංගයක් විය.

එමෙන්ම හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපිත කිරීම සඳහා රෝහල් රසායනාගාර ස්ථාපිත කිරීම, තොරතුරු තාක්ෂණය සෞඛ්‍ය  අංශයන්ගේ ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීම කැපී පෙනෙන වර්ධනයක් සිදුවූ අංශයක් ලෙස හැඳින්විය හැකිය.

උතුරුමැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා 2019 වර්ෂයෙහි සිදුකරන ලද ආයෝජනයන් මගින් භෞතික සම්පත් මෙන්ම මානව සම්පත්හි ධාරිතා සංවර්ධනය ද සිදු කෙරුණි. ප්‍රජා මූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් වඩාත් සමීප වූ සමාන හා සමානුපාතික ලෙස පළාත් ප්‍රජාව වෙත සෞඛ්‍ය සේවාවන් ලබාදීමට හැකියාව ලැබුණි.

පළාත් සභාවේ මෙන්ම මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අරමුදල්ද යොදා ගනිමින් පළාත් ප්‍රජාවෙහි නීරෝගීභාවය තහවුරු කිරීම තුළින් සමස්ත දළ දේශීය නිෂ්පාදිතය ද උතුරු මැද පළාත මගින් ලබාදෙන දායකත්වය වැඩි කිරීමට හැකිවන ශ්‍රම බලකායක් සමාජගත කිරීම අරමුණුකරගෙන ඇත.

2019 වර්ෂයේ වෙන් වූ  ප්‍රතිපාදනයන් තුළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී සමස්තයක් ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේදී තාක්ෂණ මණ්ඩල සඳහා ගතවන කාලය ඉතා අසාමාන්‍ය ලෙස දීර්ඝ බවත් මීට ප්‍රධාන හේතුව ලෙස ප්‍රමාණවත් තාක්ෂණ මණ්ඩල ප්‍රමාණයක් නොතිබීමත් නිරීක්ෂණය වූ අතර 2020 වසර සඳහා පෙර වසරේ හඳුනාගත් දුර්වලතා මගහරිමින් කාර්යක්ෂම ක්‍රමවේදයන් අනුගමනය කිරීම තුළින් ඵලදායී ආයෝජනයක් සිදු කිරීමට සැලසුම් කර ඇත.


කාර්ය සාධනය ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු  ලෙස  2019 වර්ෂයේ දි විවිධ අවස්ථාවන්හි වාර්ෂික ප්‍රතිපාදන සංශෝධනයට ලක් වීම මත වැඩසටහන් සැලසුම් කිරීම අපහසු වීම හා වර්ෂයේ අවසාන කාර්තුවේ දී ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් අත්පත්කරගෙන නොතිබූ හෙයින් අවසාන මාස දෙක තුළ ප්‍රමාණවත් අක්මුදල් ලබාගැනීමට නොහැකි වීම දැක්විය හැකිය.

# 8.2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

| අනුරාධපුර දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 04 | පොළොන්නරුව දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 05 |
|---|---|
| අනුරාධපුර | මින්නේරිය |
| තඹුත්තේගම | වැලිකන්ද |
| ගාලදිවුල්වැව | මනම්පිටිය |
| පදවිය | සිරිපුර |
| | ඇලහැර |

මධ්‍යම බෙහෙත් ශාලා - 30

| අනුරාධපුර දිස්ත්‍රික්කය - 21 | පොළොන්නරුව දිස්ත්‍රික්කය - 09 |
|---|---|
| නොච්චියාගම | තමන්කඩුව |
| පලුගස්වැව | දියසෙන්පුර |
| ගල්නෑව | මැදිරිගිරිය |
| තලාව | අරලගංවිල |
| මිහින්තලය | අත්තනකඩවල |
| කැකිරාව | ගල් අමුණ |
| රාජාංගනය | ලංකාපුර |
| රඹෑව | නවසේනපුර |
| මැදවච්චිය | ජයසිරිපුර |
| ඉපලෝගම | |
| ඇඳගල | |
| තිරප්පනේ | |
| කැබිතිගොල්ලෑව | |
| තන්තිරිමලේ | |
| හොරොව්පොතාන | |
| ගලෙන්බිඳුණුවැව | |
| කහටගස්දිගිලිය | |
| නාච්චාදූව | |
| පලාගල | |
| විලච්චිය | |




ආයුර්වේද රෝහල්

| වර්ගය | අ/පුර | පොළ/ නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් රෝහල් | 01 | - | 01 |
| මූලික රෝහල් | - | 01 | 01 |
| ග්‍රාමීය රෝහල් | 03 | 04 | 07 |
| මධ්‍යම බෙහෙත් ශාලා | 21 | 09 | 30 |
| ආයුර්වේද මධ්‍යස්ථාන | 05 | - | 05 |
| ඖෂධ නිෂ්පාදනාගාර | 01 | - | 01 |
| **එකතුව** | **31** | **14** | **45** |

## ප්‍රතිකාර සේවා සැපයීම 2014-2016

[

| ප්‍රතිකාර ලබාගත් රෝගීන් | අනුරාධපුර | | | පොළොන්නරුව | | | පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 |
| බාහිර රෝගීන් | - | 126960 | 138954 | 133409 | 72734 | 103507 | 445366 | 199694 | 242461 |
| නේවාසික රෝගීන් | 2277 | 2013 | 1992 | 1741 | 1862 | 2391 | 4018 | 3875 | 4383 |
| සායන සඳහා පැමිණීම | - | 57988 | 61751 | - | 36945 | 50487 | - | 94933 | 112233 |
| ගෙවන වාට්ටුවේ නේවාසික රෝගීන් | - | 150 | 134 | - | - | - | - | 150 | 134 |
| එකතුව | 314234 | 187111 | 202831 | 135150 | 111541 | 156385 | 449384 | 298652 | 359211 |

## දැක්ම

"සොබාදහමට අනුකූල වූ නිරෝගිමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්.

## මෙහෙවර

" ආයුර්වේද දර්ශනය අර්ථවත් ලෙස උපයෝගී කර ගනිමින් රෝග නිවාරණ හා ප්‍රතිකාර හා පර්යේෂණ සේවා වැඩිදියුණු කිරීම, පාරම්පරික වෛද්‍ය ක්‍රමය හා ඖෂධීය ශාක වගාව සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම, විනිවිදභාවයෙන් හා ආයුර්වේද සේවාවේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යුතුව ක්‍රියාවට නැංවීම."

## දිගුකාලීන අරමුණු

- ආයුර්වේද දර්ශනය තුළින් පළාත තුළ නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ආයුර්වේද ප්‍රතිකාර භාවිතයෙන් රෝග සුව කිරීම.
- ස්වභාවධර්මයට අනුකූලව අතුරු ආබාධවලින් තොර ප්‍රතිකාර පද්ධතියක් ඇති කිරීම.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම මඟින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ඖෂධ වගාව කිරීම තුළින් ඖෂධ හිඟය මගහරවා ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක ඖෂධ රෝගීන් වෙත ලබා දීම.
- ස්වභාවධර්මය සුරැකීම.

## කෙටි කාලීන අරමුණු

- ❖ ආයුර්වේද දර්ශනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ❖ ආයුර්වේද ජීවන දර්ශනයට ජනතාව හුරු පුරුදු කිරීම.
- ❖ අතුරු ආබාධවලින් තොරව නිට්ටාවටම රෝග සුව කිරීම.
- ❖ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මධ්‍යම බෙහෙත් ශාලාවක් ඇති කිරීම.
- ❖ පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණ සහාව වෙත යොමුකර ඔවුන්ගේ දත්ත ලේඛණගත කිරීම.
- ❖ ඔසු උයන් දහයක් පළාත තුළ ඇති කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ රෝග නිවාරණ සත්කාර සංවර්ධනය.
- ❖ රෝග ප්‍රතිකාර සේවාව සංවර්ධනය.
- ❖ පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.
- ❖ ඖෂධීය ශාක වගාව සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

### 01.රෝග නිවාරණ

ආදර්ශ ගම්මාන ඇති කිරිම, ප්‍රවර්ධන සමාජ ඇති කිරිම, පාසල් සෞඛ්‍යදාන ඒකක ඇති කිරිම, පෙර පාසල් පෝෂණ වැඩසටහන් ඇති කිරිම, රාජ්‍ය ආයතන දැනුවත් කිරිම, ජංගම සායන පැවැත්විම.

### 02. රෝග ප්‍රතිකාර

සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක්, සෑම රෝහලකම ආයුර්වේද විවිධ සායන ආරම්භ කිරිම. සෑම රෝහලක්ම හා මධ්‍යම බෙහෙත් ශාලවකම බෝ නොවන රෝග සායන පැවැත්විම.

### 03. ඖෂධ

ඔසු ගොවින් ඇති කිරිම, පළාත් ඖෂධ නිෂ්පාදනාගාරය වැඩි දියුණු කිරිම, රෝහල් ආශ්‍රිතව ඔසු උයන් 7 ක් අරම්භ කිරිම.

## තිරසර සංවර්ධන අරමුණු අංක 03
යටතේ දක්වා ඇති නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා භාවිතා කළ ප්‍රධාන කාර්යයන්.

පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය තුලින් එම වෛද්‍ය ක්‍රමය රැක ගැනිම.

රෝග නිවාරණය සම්බන්ධයෙන් මැදිහත් වී උතුරු මැද පළාත තුල නිරෝගි ජනතාවක් ඇති කිරිම සඳහා ඉහළම දායකත්වය සැපයීම

3 GOOD HEALTH AND WELL-BEING

රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාරවල සාර්ථකත්වය ඉහළ දමමින් සෞඛ්‍ය ක්ශේත්‍රය නගා සිටුවීම

ඖෂධ වගාව හා නිශ්පාදනය තුළින් ඖෂධ හිඟය අවම කර ප්‍රමිතියෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබාදිම

### කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 647 |
| 2 | සේවයේ නියුතු | 449 |
| 3 | පුරප්පාඩු | 176 |
| 4 | අනියම් | 20 |
| **5** | කොන්ත්‍රාත් | 03 |

### පුනරාවර්තන වියදම් - 2019

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2019 වියදම් ( රු.මි.) | ඉතිරිය ( රු.මි. ) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 292.00 | 286.00 | 6.00 | 97 |
| ගමන් වියදම් | 6.00 | 5.00 | 1.00 | 83 |
| සැපයිම් | 130.00 | 126.00 | 4.00 | 97 |
| නඩත්තු | 16.00 | 16.00 | 0.00 | 100 |
| ගිවිසුම්ගත සේවා | 25.00 | 25.00 | 0.00 | 100 |
| මාරු කිරිම් | 1.00 | 0.40 | 0.60 | 40 |
| **එකතුව** | **470.00** | **458.4** | **11.60** | **98** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.

| අනු අංකය | ව්‍යාපෘතිය /වැඩ සටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපෙක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | අ/පුර ආයුර්වේද රෝහලේ ප්‍රධාන ජල ටැංකියේ කාණු ආධාර කරගෙන කාමරයක් සකස් කිරිම | ඉදිකිරිම | පහසුකම් වැඩිදියුණු කිරීම | 148320 |
| 02 | ඇලහැර ග්‍රාමීය ආයුර්වේද රෝහලේ පැතිබැම්ම ඉදි කිරිම සහ ගංවතුර වැළැක්විම සඳහා පස් පිරවිම | ඉදිකිරිම | ආරක්ෂාව වැඩිකිරිම | 29880 |
| 03 | ඇලහැර ග්‍රාමීය ආයුර්වේද රෝහලේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 29880 |
| 04 | මින්නේරිය මුලික ආයුර්වේද රෝහලේ වැසිකිළි වල අළුත්වැඩියා කිරිම | ඉදිකිරිම | පහසුකම් වැඩිදියුණු කිරීම | 69480 |
| 05 | මින්නේරිය මුලික ආයුර්වේද රෝහලේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 69480 |
| 06 | වැලිකන්ද ග්‍රාමීය ආයුර්වේද රෝහලේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 14040 |
| 07 | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කැමරා පද්ධතිය නවිකරණය කිරිම | අළුත්වැඩියා කිරීම | ආරක්ෂාව වැඩිකිරිම | 148320 |
| 08 | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ ශබ්ධ විකාශන පද්ධතිය නවිකරණය කිරිම | අළුත්වැඩියා කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 148320 |
| 09 | ගලෙන්බිඳුනුවැව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරිම | 16920 |
| 10 | පලාගල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ අබලන් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරිම | අළුත්වැඩියා කිරීම | පහසුකම් වැඩිදියුණු කිරිම | 11160 |
| 11 | පලුගස්වැව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ වැසිකිළිය අළුත්වැඩියා කිරිම | අළුත්වැඩියා කිරීම | සනිපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | 5040 |

| අනු අංකය | ව්‍යාපෘතිය / වැඩ සටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපෙක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|
| 12 | මැදිරිගිරිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිම් ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 10080 |
| 13 | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ තෙවන මහල ඉදි කිරිම | ඉදිකිරිම | පහසුකම් වැඩිදියුණු කිරීම | 148320 |
| 14 | ගාලදිවුල්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහලේ නවීකරණ කටයුතු | අළුත්වැඩියා කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 19080 |
| 15 | පළාත් ආයුර්වේද කොමසාරිස්තුමාගේ නිල නිවාසයේ ගරාජය නවීකරණය | අළුත්වැඩියා කිරීම | ආරක්ෂාව වැඩි කිරීම | 5 |
| 16 | පළාත් ආයර්වේද නිශ්පාදනාගාරයට මුර කුටියක් ඉදි තිරිම | ඉදිකිරිම | ආරක්ෂාව වැඩි කිරීම | 9400 |
| 17 | තිරප්පනේ ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ වැසිකිළිය ඉදි කිරිම | ඉදිකිරිම | පහසුකම් වැඩිදියුණු කිරීම | 21600 |
| 18 | තිරප්පනේ ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ වැසිකිළිය අළුත්වැඩියා කිරිම | අළුත්වැඩියා කිරිම | පහසුකම් වැඩිදියුණු කිරීම | 21600 |
| 19 | තිරප්පනේ ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිම් ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 21600 |
| 20 | ඇඳලගා ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිම් ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 13680 |

## මුලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරිම් | 91.40 | 81.00 | අවුරා තැබිම | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 9.80 | 9.80 | අවුරා තැබිම | 100 |
| වෙනත් මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | 16.80 | 5.00 | අවුරා තැබිම | 100 |
| **එකතුව** | **118.00** | **95.80** | අවුරා තැබිම | **100** |

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක |
|---|---|
| නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරිම | මූල්‍යමය අවදානයට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරි, ඵලදායි,ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියළුදෙනාටම ලබා ගත හැකි වීම ඇතළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම |

## තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟාවීම කෙරෙහි පළාත දායකත්වය

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **තිරසර සංවර්ධන අරමුණු** .නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගෙම සුබසාධනය ප්‍රවර්ධනය කිරිම | | | |
| මූල්‍යමය අවදානයට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරි, ඵලදායි,ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියළුදෙනාටම ලබා ගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම | රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාරවල සාර්ථකත්වය ඉහළ දමමින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත්වීම. රෝග නිවාරණය සම්බන්ධයෙන් මැදිහත් වී උතුරු මැද පළාත තුළ නිරෝගී ජනතාවක් ඇති කිරීම සඳහා ඉහළම දායකත්වය "සපයන්නන් බවට පත්වීම'' | 85.7 | 100% |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ පල්දොරු පද්ධතිය අළුත්වැඩියාව | 148320 |
| පළාත් ආයුර්වේද ඖෂධ නිශ්පාදනාගාරයට තෛල කසාය නිෂ්පාදනයට ගොඩනැගිල්ලක් ඉදිකිරිම | 488757 |
| පාරම්පරික සංරක්ෂණ සහා ගොඩනැගිල්ලේ (පුලතිසි වෙද මැදුර දේශීය ආහාර හා ඖෂධ අලවිසල ඉදිකිරීම (දෙවන පියවර) | 9472 |
| අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ පල්දොරු පද්ධතිය අළුත්වැඩියාව - II | 148320 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරිම | 65 |
| දෙමහල් වෛද්‍ය නිල නිවාස - A ඉදිකිරීම | 24 |
| දෙමහල් වෛද්‍ය නිල නිවාස - B ඉදිකිරීම | 24 |
| පදවිය ආයුර්වේද රෝහලේ වෛද්‍ය නිල නිවස ඉදිකිරීම කිරිම | 6 |
| කහටගස්දිගිලිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිකිරිම | 14447 |
| මින්නේරිය පංචකර්ම ඒකකය සඳහා භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීම | 24730 |
| රෝහල් සඳහා භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීම | 488757 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් (උපකරණ මිල දී ගැනීම) | 488757 |
| පළාත් ආයුර්වේද ඖෂධ නිශ්පාදනාගාරයට තෛල කසාය නිෂ්පාදනයට ගොඩනැගිල්ලක් ඉදිකිරිම - II | 488757 |
| පළාත් ආයුර්වේද ඖෂධ නිශ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිකිරිම | 488757 |
| ආයුර්වේද පාසල් සෞඛ්‍යදාන වැඩසටහන | 10020 |
| වකුගඩු රෝග නිවාරණ වැඩසටහන් | 25000 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට යම් ආකාරයකින් කරන ලද දායකත්වය

1. රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාරවල සාර්ථකත්වය ඉහළ දමමින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත්වීම.
2. රෝග නිවාරණය සම්බන්ධයෙන් මැදිහත් වි උතුරු මැද පළාත තුළ නිරෝගී ජනතාවක් ඇති කිරීම සඳහා ඉහළම දායකත්වය “ සපයන්නන් බවට පත්වීම”
3. ඖෂධ වගාව හා නිෂ්පාදනය තුළින් ඖෂධ හිඟය අවමකර ප්‍රමිතියෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබාදීම.
4. පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය තුළින් එම වෛද්‍ය ක්‍රමය රැක ගැනීම.

## කාර්ය සාධන ඉලක්ක - 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | වියදම/ආයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 01 | ප්‍රතිකාර සේවාව සංවර්ධනය | ප්‍රතිකාර කිරීම (රෝගීන්ගණන) | 715924 | - | - | - |
| 02 | රෝග නිවාරණ සේවාව සංවර්ධනය | දැනුවත් කිරීමේ වැඩසටහන් පවැත්වීම (වැඩසටහන් ගණන) | 68 | 120 | 99 | 175 |
| 03 | පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ සංවර්ධනය | දිරි ගැන්වීම සඳහා ප්‍රතිලාභ ලබා දීම (වෛද්‍යවරුන් සංඛ්‍යාව) | 355 | 355 | 327 | 350 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණ | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1.ප්‍රතිකාර සේවාව සංවර්ධනය | රෝහල්,ඖෂධ නිෂ්පාදනාගාර,නිල නිවාස සංවර්ධනය | ආයුර්වේද දර්ශනය තුළින් නිරෝගීමත් ජනතාවක් | 118 | 89.7 | 76 |
| 2.රෝග නිවාරණ සේවාව සංවර්ධනය | දැනුවත් කිරීමේ වැඩ සටහන් | බෝ නොවන රෝග පිටු දැකීම, දේශිය ආහාරයෙන් සුව ජීවයට අත්වැලක් | 5.2 | 5.2 | 100 |
| 3.පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය | පාරම්පරික සංරක්ෂණ ගොඩනැගිල්ලේ දේශිය ආහාර හා ඖෂධ අලෙවිසැල් ඉදිකිරීම | පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම මගින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම | 2.5 | 2.5 | 100 |

## 2020 වර්සයේදී ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

- දෙදාස් විස්සේදි (2020) නව රජයේ ප්‍රතිපත්තිවලට අනුව වඩාත් විද්‍යාත්මක නූතන භාවිතයන් ඔස්සේ දේශීය ආයුර්වේද ක්‍රම ශක්තිමත් කොට රට තුළ පමණක් නොව ගෝලීය සමාජයට ව්‍යාප්ත කිරිම උදෙසා සහ එහි සුවිශේෂි දර්ශනය සමාජගත කිරිම උදෙසා ව්‍යාපෘති කිහිපයක් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- ඒ අනුව වකුගඩු රෝග නිවාරණය සඳහා රුපියල් මිලියන තුනක (රු.මි. 3 ) ක් ද, මන්ද පෝෂණය දුරලීමේ අරමුණින් රුපියල් මිලියන හතර (රු.මි. 4 ) ක් ද, ආදර්ශ ගම්මාන සඳහා රුපියල් මිලියන හතර (රු.මි. 4 ) ක් ද, පාසල් සෞඛ්‍යදාන ඒකක සඳහා රුපියල් මිලියන හතර (රු.මි. 4 ) ක් ද, ආයුර්වේද පිළිබඳව දැනුවත් කිරිම සඳහා රුපියල් මිලියන දෙක (රු.මි. 2 ) ක් ද, වෙන් කිරීම. මෙම වැඩ සටහන් ආයුර්වේද ප්‍රවර්ධන සමාජවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වේ.
- ඔසු ගොවින් හා ඔසු උයන් සඳහා රුපියල් මිලියන තුන (රු.මි. 3 ) ක් , වෙන් කිරිම.
- ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදි ගැනිම සඳහා රුපියල් මිලියන දෙක (රු.මි. 2 ) ක් , වෙන් කරන අතර රෝහල්වලට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ලබා ගැනිම සඳහා මෙවර රුපියල් මිලියන හතර (රු.මි. 4 ) ක් , වෙන් කිරිම.
- දෙදාහස් දහනවය වර්ෂයේ (2019) දී, අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ තෙමහල් නිළ නිවාස දෙකෙහි වැඩ නිම කිරිම සඳහා රුපියල් මිලියන හැත්තෑ අටයි දශම නවය (රු.මි. 78.9 ) ක් , වෙන් කිරිම.
- සහකාර පළාත් ආයුර්වේද කොමසාරිස් සහ රෝහල් අධ්‍යක්ෂ නිලනිවාසය (දෙමහල්) ඉදිකිරිමට රුපියල් මිලියන පහළව (රු.මි. 15) ක් වෙන් කිරිම, පළාත් ආයුර්වේද කොමසාරිස් නිල නිවාසය ඉදි කිරිම සඳහා රුපියල් මිලියන දහයක් (රු.මි. 10) වෙන් කිරිම, පසු ගිය වසරේ ආරම්භ කළ, පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයේ අරිෂ්ඨ ආසව සන්දාන ගොඩනැගිල්ලේ වැඩ නිම කිරිම සඳහා රුපියල් මිලියන දහයයි දශම හතරක් (රු.මි. 10.4) වෙන් කිරිම.
- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කිරිමේ වැඩ නිම කිරිම සඳහා රුපියල් මිලියන හයයි දශම පහක් (රු.මි. 6.5) වෙන් කිරිම.
- පළාත තුළ සිටින අති දක්ෂ පාරම්පරික වෛද්‍යවරුන්ගේ සේවය ඇගයිමට සහ ඔවුන්ගේ සුභ සාධනය සඳහා රුපියල් මිලියන දෙකයි දශම පහක් (රු.මි. 2.5) වෙන් කිරිම.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ. අ | ව්‍යාපෘතිය | විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මුල්‍ය (%) | |
| 1 | ගෙවන වාට්ටු | පහසුකම් සහිතව නේවාසික ප්‍රතිකාර සේවාව ඇති කිරීම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම. | 5.7 | 5.7 | 100 | 100 | විදේශිකයින්ට හා දේශිය මුදල් වැය කිරීමට හැකි අයට ප්‍රතිකාර කර එම මුදල් රජයට ලබා දීම. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දෙස් විදෙස්වල ප්‍රචලිත කිරීම |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2021 | 2022 | කෙටිකාලීන | දිගුකාලීන |
| ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම ප්‍රවර්ධනය | ග්‍රාමීය රෝහල් 10 දක්වා වැඩි කිරීම | ග්‍රාමීය රෝහල් 12 දක්වා වැඩි කිරීම | ග්‍රාමීය ජනතාවට නේවාසික පහසුකම් වැඩි කිරීම | ජනතාව ආයුර්වේද ප්‍රතිකාර කෙරෙහි නැඹුරු වීම |
| රෝග නිවාරණය ප්‍රවර්ධනය | බෝ නොවන රෝග අවම කිරීම | බහුතර ජනතාව නිරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බවට පත් කිරීම | ජනතාව නිරෝගී වීම | ජනතාවගේ ආර්ථිකය ඉහළ නැංවීම |
| ඖෂධ වගාව හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීම | ඖෂධ උයන් 15 වැඩි දියුණු කිරීම. පළාතට අවශ්‍ය ඖෂධ පළාත තුළම නිෂ්පාදනය කරගැනීම | ඖෂධ උයන් 20 ස්ථාපිත කිරීම. අතිරික්ත ඖෂධ අලෙවි කිරීම. | ඖෂධ හිඟයක් නොමැති වීම | ස්වභාවධර්මය සුරැකීම, ඖෂධ ගොවින්ට ස්වයං රැකියා බිහිවීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

කාර්ය සාධනය කරා ළඟා විමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස නියමිත කාලයේදි ඇස්තමේන්තු නොලැබිම, ලැබෙන ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරිමේදි වෙනස් වීම, ප්‍රතිපාදන නියමිත වෙලාවට නොලැබීම හා සැලසුම් අනුමත කිරිමට ප්‍රමාද විම දැක්විය හැකිය.

ලැබුණු ප්‍රතිපාදනවලට අනුව ඉහළ ඵලදායිතාවයක් ලබා ඇති බවට සහතික කළ හැක. එනම් පළාත තුළ මධ්‍යම බෙහෙත් ශාලා 30 න් 27 ක් අංග සම්පූර්ණ කිරීම, එයින් 20කට වැඩි සංඛ්‍යාවක් ඉඩම් ආරක්ෂිත වැටවල් ඉදි කර ඇත. එමෙන්ම මධ්‍යම බෙහෙත් ශාලාවලට අවශ්‍ය සියළු ගෘහ උපකරණ ද ලබාදි ඇත. අනුරාධපුර රෝහලේ රාසායනාගාරයක් ඉදිකර එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළු උපකරණ, රසායනික ද්‍රව්‍ය ලබා දි ඇත. පළාත් නිෂ්පාදනාගාරයේ ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය ගොඩනැගිල්ල ඉදි කර ඇති අතර ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ කට්ටල 35 ක් ලබා දි ඇත. මානව සම්පතෙහි දැනුම ඉහළ දැමිම සඳහා වෛද්‍යවරුන්ට පුහුණු වැඩසටහන් 12 ක්ද ඇතුළුව අනෙකුත් සැම කාර්ය මණ්ඩල සමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

පාරම්පරික වෛද්‍යවරුන් ඇගයිම සඳහා පරිත්‍යාග උපකරණ මිලදි ගෙන ඇත. අනුරාධපුර පළාත් රෝහලේ සියළු පහසුකම් සහිතව ගෙවන කාමර සංකිර්ණයේ වැඩ නිමකර ඇත.



**ප**ළාතේ ජනතාවට ඉහළ ගුණත්වයෙන් යුතු ආයුර්වේද සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ඇගයීම වන ජාතික ඵලදායිතා තරඟාවලිය සඳහා 2019 වර්ෂයේදී ආයුර්වේද රෝහල් ඉදිරිබත් විය. එහිදී අනුරාධපුර පළාත් රෝහල ජාතික ඵලදායිතා තරඟයෙන් 3 වන ස්ථානයත්, තඹුත්තේගම ග්‍රාමිය රෝහල සහ මැදවච්චිය මධ්‍යම බෙහෙත් ශාලාව කුසලතා සම්මානය ද ලබා ගනිමින් සේවයේ ගුණත්වය තහවරු කර ඇත.

2019 වසරේ පළාත් ආයුර්වේද අංශයේ සංවර්ධනය උදෙසා විවිධ මුලාශ්‍ර මගින් ලැබු මුදල් නිසි පරිදි කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරමින් පළාතේ ජනතාවට පහසුවෙන් ළඟාවිය හැකි වන අයුරින් ආයුර්වේද සේවාව ලබා ගැනීමට මෙන්ම සැලසුම්ගත ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි කටයුතුකර ඇත.

# 8.3.පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

1956 වසරේ ආරම්භ කරන ලද පරිවාස දෙපාර්තමේන්තුව පෙර ක්‍රියාත්මකවූයේ බන්ධනාගාරය හා සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේය. එහෙත් 1956 වසරේ පරිවාස විෂය වෙනම දෙපාර්තමේන්තුවක් යටතේ රේඛීය අමාත්‍යාංශය මඟින් පාලනය විය. 1987 වසරේ ක්‍රියාත්මක වූ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ පරිවාස හා ළමා රක්ෂක සේවා විෂය පළාත් සභා විෂයක් බවට පත් වීමත් සමඟ පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි.

ඒ අනුව වර්තමානයේදී දෙපාර්තමේන්තුවේ සේවාවන් පළාත පුරා ක්‍රියාත්මක කිරීමට අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ දෙපාර්තමේන්තුවට අයත් පරිපාලන ආයතන විහිදී ඇති ආකාරය පහත පරිදිවේ.

## පරිපාලන ආයතන

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පරිවාස කාර්යාල | 04 | 02 | 06 |
| උපදේශන මධ්‍යස්ථාන | 01 | - | 01 |
| ළමා රැඳවුම් මධ්‍යස්ථාන | 02 | - | 02 |
| සහතික කළ පාසල්(ගැහැණු) | 01 | - | 01 |
| භාර ගැනීමේ නිවාස | 01 | - | 01 |
| ළමා නිවාස | 06 | 04 | 10 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 01 | - | 01 |
| පෙර පාසල් | 01 | - | 01 |

**ළමා නිවාස - 15 (ළමුන් 495)**

## දෙපාර්තමේන්තු කළමනාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා නිවාස

01. අභය ළමා නිවාසය
02. යෙහෙළි උපදේශන මධ්‍යස්ථානය
03. මඩාටුගම සහතික කළ පාසල
04. කාන්තා ළමා රැඳවුම
05. පිරිමි ළමා රැඳවුම
06. අවන්ති දේවි ළමා නිවාසය
07. බෝසත් බාලිකා ළමා නිවාසය

## ස්වේච්ඡා සංවිධානවල කළමනාකාරිත්වය යටතේ ක්‍රියාත්මකවන ළමා නිවාස

| අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|
| ප්‍රීති ළමා නිවාසය | පැරකුම් බාලිකා ළමා නිවාසය |
| අශෝක බාලක ළමා නිවාසය | බෝසත් බාලක ළමා නිවාසය |
| සරණ සෙවණ ළමා නිවාසය | ශාන්ත ජෝශප් බාලිකා ළමා නිවාසය |
| මිත්‍ර ළමා නිවාසය | |
| SOS ගම්මානය | |

## දැක්ම

“නීතිගරුක ප්‍රජාවක්, සුරක්ෂිත ළමා පරපුරක්”.

## මෙහෙවර

“සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන්, විශෝධනය සහ ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකමින් සියළු පාර්ශවයන්ගේ මනා සහභාගීත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම”.

## දිගුකාලීන අරමුණු

- යහපත් පුරවැසියන්ගෙන් සපිරි සමාජයක්.
- ඉහළ ගුණාත්මක ළමා සුභසාධනයක්.
- ගුණාත්මක සේවාවන් සපයන ආයතනයක්.
- සංහිඳියාවෙන් යුත් කාර්යාලයක්.

## කෙටිකාලීන අරමුණු

- ළමා රැකවරණය හා සුභසාධනය ඉහළ යාම.
- වරදකරුවන් පුනරුත්ථාපනය (ළමා, වැඩිහිටි) ඉහළ යාම.
- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම වර්ධනය වීම.
- ළමා අපයෝජන හා අපචාර අවම වීම.
- ආයතනයේ සියළු කටයුතු හා කාර්ය සාධනය ඉහළ යාම.

## ප්‍රධාන කාර්යයන්

- සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය.
- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහ පාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ළමා අපචාරවලට ලක් වුවන් සඳහා නීතියේ රැකවරණය ලබා දීම සඳහා ඉදිරිපත් වීම.
- ළමා අපචාරවලට ලක් වු දරුවන් සඳහා රැකවරණය ලබා දීම.
- ළමා අපචාර සම්බන්ධයෙන් පාසල් ළමුන් ප්‍රජාව දැනුවත් කිරිම.
- අඩු ආදායම්ලාභි දරුවන් සිටින පවුල්වල ආර්ථික මට්ටම නගා සිටුවීමට කටයුතු කිරිම.
- කායික හා මානසික වශයෙන් නිරෝගි ළමා ප්‍රජාවක් බිහි කිරීම.
- නීතියේ රැහැනට හසු වු බාල වයස්කාර දරුවන් හා වැඩිහිටි පිරිස පුනරුත්ථාපනය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය.
- කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනයට අවශ්‍ය පියවර ගැනීම.

## දෙපාර්තමේන්තුව මගින් සලසනු ලබන සේවාවන්

**01.** විශෝධන සේවාව

අධිකරණයට යොමුවන නොයෙකුත් වැරදිවලට යොමුවන ළමුන් හා තරුණ, වැඩිහිටි වරදකරුවන්ගේ චරිත හැඩගස්වා පුනරුත්ථාපනය කිරීම මෙම සේවාව මගින් සිදු වේ. මෙය ආයතනගතව සපයන සේවාවන් හා ආයතනගත නොවන සේවාවන් ලෙස සපයනු ලබයි.

**02.** වෙනත් සේවාවන්

අනාථ,අසරණ,අත්හළ,කෘරකම්වලට හා නොයෙකුත් ආපදාවලට මුහුණ පා සිටින ළමුන් රැකබලා ගැනීම,අධ්‍යාපනය,පෝෂණය හා අනෙකුත් සියළු සංවර්ධන අවශ්‍යතා සපුරාලීම මේ යටතේ සිදු කරනු ලබයි. මෙය ආයතනගතව සපයන සේවාවන් හා ආයතනගත නොවන සේවාවන් ලෙස සපයනු ලබයි.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




3 — නිරෝගී ජීවිත සහතිකකර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම

- ඉහළ ගුණාත්මක ළමා සුභසාධනයක්
- ළමා රැකවරණය හා සුභසාධනය ඉහළ යාම




4 — පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථාව සැලසීම

- සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය
- පරිවාසගත ළමුන් අධ්‍යාපනයට යොමු කිරීම
- පරිවාසගත ළමුන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම





5 — ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම

- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම
- ළමා අපයෝජන හා අපචාර අවම කිරීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 186 |
| 2 | සේවයේ නියුතු | 108 |
| 3 | පුරප්පාඩු | 76 |
| 4 | අනියම් | 02 |



## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 60.06 | 59.63 | 0.43 | 99 |
| ගමන් වියදම් | 3.00 | 2.99 | 0.01 | 99 |
| සැපයීම් | 14.08 | 13.95 | 0.13 | 99 |
| නඩත්තු වියදම් | 2.95 | 2.83 | 0.12 | 95 |
| ගිවිසුම්ගත සේවා | 9.31 | 8.12 | 1.19 | 87 |
| මාරු කිරීම් | 15.13 | 12.12 | 3.01 | 80 |
| **එකතුව** | **104.53** | **99.64** | **4.89** | **94** |

## මුලධන වියදම් – 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 23.82 | 13.40 | 10.42 | 56.26 |
| මුලධන වත්කම් අත්පත්කර ගැනිම | 8.26 | 2.70 | 5.56 | 32.70 |
| ප්‍රාග්ධන මාරු කිරීම් | 0.52 | 0.52 | 0.00 | 100 |
| ධාරිතා සංවර්ධනය | 1.00 | 0.34 | 0.66 | 34.09 |
| වෙනත් මුලධන වියදම් | 19.63 | 16.21 | 3.42 | 83.35 |
| **එකතුව** | **53.23** | **33.18** | **20.06** | **62.31** |

## දෙපාර්තමේන්තුව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

### තිරසර සංවර්ධන අරමුණු 01 :- සියළු තන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.

| අනු අංකය | ඉලක්ක | දර්ශක |
|---|---|---|
| 1 | පළාත තුළ සිටින දරිද්‍රතාවයෙන් පෙළෙන දරුවන් සිටින පවුල්වල ආදායම ඉහළ නැංවීම | ස්වයං රැකියා ආධාර ලබා දීමේ ව්‍යාපෘතිය මගින් එක් පවුලක් මාසිකව ලබන ආදායම |
| 2 | දරුවන් සම්බන්ධයෙන් සමාජ ආරක්ෂණ ක්‍රම ඇති කිරීම | දරුවන් ආරක්ෂා කිරිම සඳහා පනවා ඇති නීති ප්‍රමාණය |
| | | අනාරක්ෂිත දරුවන් නිවාසගත කිරීම් ප්‍රමාණය |
| | | නිතියේ රැහැනට හසු වු බාල වයස්කාර දරුවන් රැඳවුම් නිවාසගත කිරිම් ප්‍රමාණය |
| | | ආරක්ෂාව සපයන ලද ළමා මව්වරු ප්‍රමාණය |
| | | අඩු ආදායම්ලාභී, දරුවන් සිටින පවුල් සඳහා නිවාස ආධාර ලබාදිම් ප්‍රමාණය |
| | | අඩු ආදායම්ලාභී,දරුවන් සිටින පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදිම් ප්‍රමාණය |

**තිරසර සංවර්ධන අරමුණු 03.- නිරෝගී ජීවිත සහතිකකර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය වර්ධනය කිරීම.**

| ඉලක්කය | දර්ශක |
|---|---|
| ප්‍රදේශය තුළ සිටින කුඩා දරුවන්ගේ සුභසාධනය වර්ධනය කිරීම. | ප්‍රදේශය තුළ සිටින අඩු ආදායම්ලාභී,දරුවන් සිටින පවුල් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම් ප්‍රමාණය |

**තිරසර සංවර්ධන අරමුණු 04 - පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම**

| ඉලක්ක | දර්ශක |
|---|---|
| සැම මට්ටමකමදීම අධ්‍යාපනය ලැබීමට ඇති පහසුකම් ඉහළ නැංවීම | ළමා නිවාසගතව සිටින පාසල් යන දරුවන් ප්‍රමාණය |
| | ළමා නිවාසගත දරුවන්ගේ අධ්‍යාපන මට්ටම |
| | 01.සාමාන්‍ය පෙළ සමත් දරුවන් සංඛ්‍යාව |
| | 02.උසස් පෙළ සමත් දරුවන් සංඛ්‍යාව |
| | 03.උසස් අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව |
| | 04.වෘත්තිය අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව |
| | අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමේ ප්‍රමාණය |
| | අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබා දීම් ප්‍රමාණය |
| | ක්‍රිඩා ඉසව් සඳහා විදේශගතවන දරුවන් සඳහා මුදල් ආධාර ලබා දීම් ප්‍රමාණය |

**තිරසර සංවර්ධන අරමුණු 05- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම**

| ඉලක්ක | දර්ශක |
|---|---|
| කාන්තාවන් සහ ගැහැණු දරුවන් සඳහා අධ්‍යාපනය,සෞඛ්‍ය පහසුකම් හා නිසි මෙහෙවර සැලසීම | අනාරක්ෂිත ගැහැණු දරුවන් ළමා නිවාසගත කිරීම් ප්‍රමාණය |
| | නිතියේ රැහැනට හසුවූ බාල වයස්කාර ගැහැණු දරුවන් රැඳවුම් නිවාසගත කිරීම් ප්‍රමාණය |
| | පුනරුත්ථාපනය කරන ලද ගැහැණු දරුවන් සංඛ්‍යාව |
| | සමාජගත කරන ලද ගැහැණු දරුවන් ප්‍රමාණය |
| | අඩු ආදායම්ලාභී ගැහැණු දරුවන් සිටින පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම් ප්‍රමාණය |
| | අඩු ආදායම්ලාභී ගැහැණු දරුවන් සිටින පවුල් සඳහා නිවාස ආධාර ලබා දීම් ප්‍රමාණය |

**තිරසර සංවර්ධන අරමුණු 10-රටවල් තුළ හා රටවල් අතර පවතින අසමානතා අවම කිරීම.**

| ඉලක්ක | දර්ශක |
|---|---|
| සමාජ පරිධියෙන් ඈත සිටින ජනතාවගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය |
| | පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය |
| | අඩු ආදායම්ලාභී දරුවන් සිටින පවුල් සඳහා නිවාස ආධාර ලබා දීම් ප්‍රමාණය |
| | අඩු ආදායම්ලාභී දරුවන් සිටින පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම් ප්‍රමාණය |

## තිරසර සංවර්ධන අරමුණු 13 - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සැම මට්ටමකම ඵලදායි,වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.


| ඉලක්ක | දර්ශක |
|---|---|
| ආයතනය විසින් නියෝජනය කරන සමාජ ස්ථරයට අදාලව ඵලදායි වගවීම් සහිත ආයතන ගොඩ නැගීම | ආයතනයේ ඵලදායි මට්ටම |
| | දෙපාර්තමේන්තු කාර්ය සාධන මට්ටම |

පළාත තුළ දරුවන්ගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කරන ප්‍රමුඛ පෙළේ ආයතනයක්වන පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිමට දෙපාර්තමේන්තුව මෙහෙයවන ලදී.

ඒ සඳහා 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තු සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සියළු සංවර්ධන ව්‍යාපෘති ඍජුව හෝ වක්‍රව දෙපාර්තමේන්තුවට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගත හැකි වන පරිදි ඒ කෙරෙහි අවධානය යොමු කරමින් පළාත් මට්ටමින් එම අරමුණු ඉටුකර ගැනීමට විවිධ ව්‍යාපෘති සකස් කිරීමටත් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගන්නා ලදී.

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය 2017-2019

| වර්ෂය | PSDG | PCDG | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| 2017 | 23.87 | 1.33 | 25.20 |
| 2018 | 29.67 | 0.96 | 30.63 |
| 2019 | 33.18 | 0.92 | 34.11 |




## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන ව්‍යාපෘති

***ව්‍යාපෘතිය - ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම්***

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉලක්ක ගත ආයෝජනය (රු.මි) | ඉලක්ක ගත වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| හිඟුරක්ගොඩ බෝසත් බාලිකා ළමා නිවාසය අළුත්වැඩියා කිරීම. | 44 | හිඟුරක්ගොඩ | 4.644 | 2.29 | 100 |
| පිරිමි රූදවුම් නිවාසයේ සනීපාරක්ෂක පද්ධතිය අළුත්වැඩියා කිරීම. | 15 | නැ.නු.ප | 1.102 | 1.037 | 100 |
| අශෝක ළමා නිවාසය අළුත්වැඩියා කිරීම. | 35 | නැ.නු.ප | 0.37 | 0.31 | 100 |
| යෙහෙළි උපදේශන සේවා මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම. | 17 | ම.නු.ප | 7.64 | 6.3 | 100 |

ව්‍යාපෘතිය - ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම්

| ක්‍රියාකාරකම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| සාලියපුර කාන්තා රැඳවුමේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | ම.නු.ප | 6.87 | 6.44 | 100 |
| එල් ආර් පෙරේරා ළමා උද්‍යානයේ වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීම | නැ.නු.ප | 2.68 | - | 100 |
| එල් ආර් පෙරේරා දිවා සුරකුම් මධ්‍යස්ථානයේ ටයිල් ඇතිරීම | නැ.නු.ප | 0.92 | 0.84 | 100 |
| දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල නවීකරණය | නැ.නු.ප | 4.5 | 2.65 | 100 |
| අනුරාධපුර පරිවාස කාර්යාලය අළුත්වැඩියාව | නැ.නු.ප | 2.5 | 2.02 | 100 |
| පරිවාස කාර්යාල තුනක් වැඩිදියුණු කිරීම(අධිකරණ බල ප්‍රදේශයට අයත් ප්‍රතිලාභී පවුල් සඳහා) | තමන්කඩුව කැබිතිගොල්ලෑව තඹුත්තේගම | 4.0 | 2.27 | 100 |
| කැකිරාව පරිවාස කාර්යාලයේ මහජන වැසිකිලිය ඉදිකිරීම | කැකිරාව | 0.5 | - | 100 |
| දෙපාර්තමේන්තු පරිශ්‍රය සඳහා මුරකුටියක් ඉදිකිරීම | නැ.නු.ප | | 0.5 | - |
| **ව්‍යාපෘතිය - අධාර ලබා දීම්** | | | | |
| නිවාසගත කිරීම අවම කිරීම සඳහා ස්වයං රැකියා ආධාර හා නිවාස ආධාර ලබාදීම. | පොදු | 7.0 | 7.0 | 100 |
| පරිවාසිකයින් පුනරුත්ථාපනය හා ස්වයං රැකියා ආධාර ලබාදීම. | පොදු | 1.35 | 1.35 | 100 |
| **දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | | | |
| පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පොදු | 2.0 | 1.94 | 100 |
| ප්‍රජාව දැනුවත් කිරීම | පොදු | 2.0 | 1.84 | 100 |
| **ව්‍යාපෘතිය - සමාජගත කිරීම** | | | | |
| නිවාසගත දරුවන් සමාජගත කිරීම | පොදු | 2.2 | 1.79 | 81 |
| **ව්‍යාපෘතිය - නිවාස ගත දරුවන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම** | | | | |
| නිවාසගත ළමුන්ගේ විෂයානුබද්ධ කුසලතා ඉහළ නැංවීම | පොදු | 1.49 | 0.56 | 100 |
| නිවාසගත ළමුන්ගේ වෘත්තීය කුසලතා ඉහළ නැංවීම | පොදු | 3.2 | 1.52 | 47 |
| **ව්‍යාපෘතිය- මිලදී ගැනීම්** | | | | |
| ළමා නිවාස සඳහා උපකරණ මිලදී ගැනීම | පොදු | 6.0 | 2.46 | 41 |
| **ව්‍යාපෘතිය - ධාරිතා සංවර්ධනය** | | | | |
| දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහළ නැංවීම | පොදු | 1.0 | 0.34 | 34 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්ගේ ප්‍රගතිය 2019

නීතිගරුක ප්‍රජාවක්, සුරක්ෂිත ළමා පරපුරක් බිහි කිරීම මූලික පරමාර්ථය කරගත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාරත්මේන්තුව, 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සියලු ව්‍යාපෘති තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම පෙරටු කරගනිමින්, කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වේ.

## 01.ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම් හා මිලදී ගැනීම්

පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව දරුවන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ළමා නිවාස, රැඳවුම් නිවාස, උපදේශන මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු සඳහා මෙන්ම ආයතනික ධාරිතා සංවර්ධනය කිරීම තුළින් තවදුරටත් සේවා සැපයිය හැකි පරිදි ආයතනය දියුණු කරගැනීම සඳහා දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල නවීකරණය හා පරිවාස කාර්යාල නවීකරණය කිරීමට මුදල් ආයෝජනය කරන ලද අතර ළමා නිවාස හා දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන මිලදී ගැනීම් ද සිදුකරන ලදි.

| අ.අ | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01. | හිඟුරක්ගොඩ බෝසත් බාලිකා ළමා නිවාසය අළුත්වැඩියා කිරීම | 4.64 | 100 | 49 |
| 02. | පිරිමි රැඳවුම් නිවාසයේ වැසිකිළි පද්ධතිය නවීකරණය | 1.10 | 100 | 100 |
| 03. | අශෝක ළමා නිවාසය අළුත්වැඩියා කිරීම | 0.37 | 100 | 100 |
| 04. | යෙහෙළි උපදේශන සේවා මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 0.76 | 100 | 100 |
| 05. | සාලියපුර කාන්තා රැඳවුමේ විදුලි පද්ධතිය නවීකරණය | 0.76 | 100 | 100 |
| 06. | එල්.ආර් පෙරේරා ළමා උද්‍යානයේ වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම | 0.68 | 100 | 2.68 |
| 07. | එල්.ආර් පෙරේරා දිවා සුරැකුම් මධ්‍යස්ථායේ ටයිල් ඇතිරීම | 0.92 | 100 | 100 |
| 08. | දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල නවීකරණය කිරීම | 4.5 | 100 | 58 |
| 09. | පොළොන්නරුව පරිවාස කාර්යාලය අළුත්වැඩියා කිරීම | 4.0 | 100 | 100 |
| 10. | කැබිතිගොල්ලෑව පරිවාස කාර්යාලය අළුත්වැඩියා කිරීම | - | - | - |
| 11. | තඹුත්තේගම පරිවාස කාර්යාලය නවීකරණය කිරීම | - | - | - |
| 12. | අනුරාධපුර පරිවාස කාර්යාලය අළුත්වැඩියා කිරීම | - | - | - |
| 13. | කැකිරාව පරිවාස කාර්යාලයේ මහජන වැසිකිළි ඉදිකිරීම | 2.5 | 100 | - |
| 14 | අභය ළමා නිවාසය නවීකරණය කිරීම | 1.0 | 100 | 100 |
| 15 | දෙපාර්තමේන්තුව සඳහා මුරකුටියක් ඉදිකිරීම | 0.5 | | |
| 16 | ළමා නිවාස සඳහා උපකරණ මිලදී ගැනීම | 6.0 | 41 | 41 |
| 17 | කාර්යාල හා පරිවාස කාර්යාල සඳහා උපකරණ මිලදී ගැනීම | 1.0 | 5 | 5 |

## 02. නිවාසගත කිරීම අවම කිරීම සඳහා ආධාර ලබාදීම්

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ දහස් ගණනින් දරුවන් විවිධ ආයතනගතව රැකවරණය ලබන අතර, එසේ දරුවන් ආයතනගත කිරීමට බොහොවිට හේතු වී ඇත්තේ ඔවුන්ගේ පවුල් පරිසරය තුළ පවත්නා විවිධ ගැටළුකාරී තත්ත්වයන් ය. ඒ අතර, පවුල් පරිසරයේ පවතින ආර්ථික තත්ත්වය, ජීවත්වන නිවස අනාරක්ෂිත වීම, ප්‍රධාන ගැටළු ලෙස හඳුනාගෙන ඇත. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සතු තවත් සුවිශේෂ කාර්යභාරයන් අතර, පළාත තුළ ජීවත්වන නීතියේ රැහැනට හසු වූ බාල වැඩිහිටි පුද්ගලයින් අධිකරණය මගින් පරිවාස කාල සීමාවකට යටත් කළ පසු ඔවුන් පිළිබඳව අධ්‍යනයකර නැවත එවැනි තත්ත්වයක් ඇති නොවන පරිදි අවශ්‍ය කටයුතු යෙදීමයි.


පෙර තත්වය


පසු තත්වය

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, පරිවාස කාර්යාල මඟින් හඳුනාගත් පිරිස් සඳහා ආධාර ලබා දීම සඳහා 2019 වර්ෂයේදී නිවාසගත කිරීම අවම කිරීම සඳහා නිවාස ආධාර හා ස්වයං රැකියා ආධාර ලබා දීම, පරිවාසිකයින් පුනරුත්ථාපනය හා ස්වයං රැකියා ආධාර ලබා දීම යන ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කරන ලදි. ස්වයං රැකියා ආධාර යටතේ මහන මැෂිං, තණ කොළ කපන යන්ත්‍ර, මැහුම් කටයුතු සඳහා අමු ද්‍රව්‍ය සැපයීම සිදුකරන ලදි.

### නිවාසගත කිරීම අවම කිරීම සඳහා නිවාස ආධාර හා ස්වයං රැකියා ආධාර ලබාදීම.

| අනු අංකය | පරිවාස කාර්යාලය | නිවාස ආධාර ලබාදුන් සංඛ්‍යාව පවුල් ඒකක ගණන | මුදල (රු.මි) | ස්වයං රැකියා ආධාර ලබාදුන් සංඛ්‍යාව පවුල් ඒකක ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | අනුරාධපුර පරිවාස කාර්යාලය | 01 | 0.35 | 02 | 0.20 |
| 02 | කැකිරාව පරිවාස කාර්යාලය | 03 | 1.54 | 02 | 0.07 |
| 03. | පොළොන්නරුව පරිවාස කාර්යාල | 01 | 0.58 | - | - |
| 04. | තඹුත්තේගම පරිවාස කාර්යාලය | 03 | 1.21 | - | - |
| 05. | කැබිතිගොල්ලැව පරිවාස කාර්යාලය | 01 | 0.54 | - | - |
| 06. | හිඟුරක්ගොඩ පරිවාස කාර්යාලය | 05 | 2.47 | - | - |
| **එකතුව** | | **14** | **6.69** | **04** | **0.27** |

## පරිවාසිකයින් පුනරුත්ථාපනය හා ස්වයං රැකියා ආධාර ලබාදීම.

| අනු අංකය | පරිවාස කාර්යාලය | ප්‍රතිලාභී පවුල් ඒකක ගණන | වියදම (රු.මි) |
|---|---|---|---|
| 01 | කැබිතිගොල්ලෑව | 03 | 0.75 |
| 02 | කැකිරාව | 01 | 0.24 |
| 03 | අනුරාධපුර | 01 | 0.25 |
| 04 | තඹුත්තේගම | 01 | 0.08 |
| එකතුව | | 06 | 1.32 |

## 03. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

වත්මන් සමාජය තුළ ළමා අපයෝජන හා ළමා අපචාරවලට ශීඝ්‍ර වර්ධනයක් දැකගත හැකි වීම අභාග්‍ය සම්පන්න කරුණකි. දෙමව්පියන් වැඩිහිටියන් තම දරුවන් සම්බන්ධයෙන් වගකීම් නිසි ආකාරව ඉටු නොකිරීම වැඩිහිටියන් මගින් සිදුවන විවිධ අකටයුතුකම් හා අසාධාරණකම් වැඩිහිටියන්ගේ වැරදි ආදර්ශ හා මගපෙන්වීම් පොළඹවා ගැනීම් දරුවන් විසින් සිදු කරනු ලබන විවිධ විෂමාචාර ක්‍රියා ආදිය හේතුවෙන් ආර්ථික ශක්තීන් ඇති නැති, ජාති ,කුල ,ආගම් ,ස්ත්‍රී පුරුෂ, උගත් නුගත් ආදි භේදයකින් තොරව වත්මන් දරුවා විවිධාකාර වූ ගැටළු රාශියකට මුහුණ දී කායික මානසික වශයෙන්ද ලිංගික වශයෙන්ද අධ්‍යාත්මික සදාචාරාත්මක වශයෙන්ද පීඩනයට පත්ව සිටියි.

ළමා අපයෝජන අවම කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මේවන විට විවිධ වැඩසටහන් පළාත තුළ ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රයෝජනවත් බව හැඟී ගිය බැවින් එම කාර්ය ඉටුකර ගැනීම සඳහා 2019 සංවර්ධන සැලැස්ම මගින් පාසල් ළමුන් දැනුවත් කිරීම හා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා මුදල් ආයෝජනය කරන ලදි.

| පරිවාස කාර්යාලය | | වැඩසටහන් සංඛ්‍යාව | වියදම (රු.මි) | | වැඩසටහන් සංඛ්‍යාව | වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | පාසල් ළමුන් දැනුවත් කිරීම | 12 | 0.40 | ප්‍රජාව දැනුවත් කිරීම | 04 | 0.26 |
| කැකිරාව | | 07 | 0.23 | | 04 | 0.26 |
| පොළොන්නරුව | | 13 | 0.44 | | 04 | 0.26 |
| තඹුත්තේගම | | 07 | 0.23 | | 04 | 0.26 |
| කැබිතිගොල්ලෑව | | 10 | 0.34 | | 03 | 0.19 |
| හිඟුරක්ගොඩ | | 08 | 0.27 | | 02 | 0.13 |
| **එකතුව** | | **57** | **1.91** | | **21** | **1.36** |

## 04. නිවාසගත දරුවන් විවාහ කර දීම තුළින් සමාජගත කිරීම.

විවිධ ගැටළුවලට මැදි වූ දරුවන්, වින්දිත දරුවන්, භාරය හා ආරක්ෂාව අවැසි දරුවන් වශයෙන් මෙම දෙපාර්තමේන්තු රැකවරණ මධ්‍යස්ථාන වෙත නිරන්තරයෙන් යොමු වේ. ආයතනගත රැකවරණය සඳහා යොමුවන මෙම දරුවන් නැවත හැකි ඉක්මනින් සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ සමාජගත කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික වගකීමකි.

එසේ සිදු කළ හැකි වනුයේ අදාල දරුවා භාරගෙන ඔහුගේ/ඇයගේ ආරක්ෂාව රැකවරණය සැලසිය හැකි ඔහුට ඇයට ආදරය කරුණාව සෙනෙහස දක්වා රැකබලාගත හැකි හා ඔහුට ඇයට අධ්‍යාපනය පෝෂණය ලබා දෙමින් අනාගත සුභසිද්ධිය සැලසිය හැකි බවට සෑහීමකට පත්විය හැකි වැඩිහිටියෙක් දරුවා භාර ගැනීමට ඉදිරිපත් වන්නේ නම් පමණි. නමුත් මෙසේ ආයතනගත වන ළමුන් අතර ඇතමුන්හට මෙවැනි වූ පරිසරයක් සහිත වැඩිහිටියෙක් සොයාගත නොහැකි වන අවස්ථාද පවතී.

මෙවැනි වූ අවස්ථාවන්හීදී විශේෂයෙන් ගැහැණු දරුවන් සමාජගත කිරීමේ එක් ක්‍රමවේදයක් ලෙසට ඔවුන් වෙත සුදුසු සහකරුවකු සොයා විවාහකර දිම තුළින් සමාජගත කිරීම සුදුසු බැවින් ඒ සඳහා මුදල් යොදවන ලදී.

නිවසක් තුළ ඇති දැඩිවන තම ආදරණීය දියණිය නිසි වයසට පැමිණි පසු විවාහකර දීමට කටයුතු කරන මවකගේ හා පියෙකුගේ කාර්යභාරය ගන්නා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව එම දරුවන්ට කිසිදු ආකාරයක අඩුවක් නොකර සියළු යුතුකම් සමග උත්සවශ්‍රීයෙන් සුදුසු සහකරුවකු වෙත යැවීමට 2019 වර්ෂයේ කටයුතු කිරිම ජන මාධ්‍යවලද අවධානයට ලක් වී තිබුණි.

ඒ අනුව ගැහැණු දරුවන් හය දෙනෙකු(6) සමාජගත කළ අතර ඒ සඳහා රු.මි.1.79ක වියදමක් දරන ලදී.

## 01. කුසලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



නිවාසගතවන පාසල් යන හා නොයන දරුවන් සඳහා ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය අමතර පංති හා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පෙර වර්ෂවලදී මෙන්ම මෙම වසර තුළද මුදල් යෙදවීම සිදු විය.

පළමු ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා සිටින දරුවන්ගේ විෂයානුබද්ධ කුසලතා වැඩිදියුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරු යොදවා අමතර පංති පැවැත්වීමට කටයුතු යෙදවීම තුළින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකකර ගැනීමට කටයුතු කරන ලදි. පාසල් නොයන දරුවන්ගේ වෘත්තිය කුසලතා වැඩිදියුණු කිරීම සඳහා මැහුම් පාඨමාලා පරිගණක පාඨමාලා පේෂකර්ම පාඨමාලා රූපලාවන්‍ය පාඨමාලා ක්‍රියාත්මක කිරීම තුළින් දරුවන්ට සුදුසු වෘත්තීය පුහුණුවක් ලබා දීම ඔවුන් පසු කලෙක සමාජගත වූ පසු එය ආදායම් මාර්ගයක් වනු ඇත. මේ සඳහා රු.මි.2.08ක් වැය කරන ලදී.

## 06.ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



දෙපාර්තමේන්තුවට අයත් මානව සම්පත වැඩිදියුණු කිරීම සඳහා 2019 වර්ෂයේ මුදල් යොදවන ලදී.

පළාතේ සිටින අනාථ දරුවන් වෙනුවෙන් ක්‍රියා කරන ප්‍රමුඛ පෙළේ ආයතනයක්වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය විවිධ පරාසයන් ඔස්සේ විහිදී පවති. එය අනෙකුත් ආයතන කාර්යමණ්ඩලවලට වඩා වෙනස් ස්වරූපයක් ගනී. විවිධ කරුණු කාරණා හේතුවෙන් අධිකරණ ගතවන කුඩා දරුවන් වෙනුවෙන් රජයේ පාර්ශවයෙන් මැදිහත් වීමේ සිට දරුවන් සම්බන්ධයෙන් වන අතිශය සංවේදී කරුණු කාරණා සමග ගනුදෙනු කරමින් ඔවුන් සුරක්ෂිත කිරීමට කටයුතු කරන දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ වෘත්තීය අභිවෘද්ධිය වෙනුවෙන් අවශ්‍යවන පුහුණු වැඩසටහන් පැවැත්වීම අවශ්‍යතාවයකි.මේ සඳහා 2019 වර්ෂය තුළ රු.මි.0.34ක් වැය කරන ලදි.

## 08. ළමාරක්ෂක අරමුදල ක්‍රියාත්මක කිරීම

කායික මානසික සහ සදාචාරාත්මක වර්ධනයට අවශ්‍ය මූලික පහසුකම් නොමැති උතුරු මැද පළාතේ ළමුන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සඳහා මුදලක් සහ වෙනත් අයුරින් ආධාර සැපයීමට 1995දී පිහිටුවන ලද ළමාරක්ෂක සේවා අරමුදල මගින් පළාතේ ව්‍යාප්ත වී ඇති පරිවාස කාර්යාල මගින් හඳුනාගනු ලබන අඩු ආදායම්ලාභී දරුවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම 2019 වර්ෂයේදී සිදු කරන ලදී. මේ සඳහා පවුල් ඒකක 110ක් තෝරාගනු ලැබූ අතර රු.මි. 0.46ක් ඒ සඳහා වැය විය.

## 07.නිවාසගත දරුවන් වෙනුවෙන් විවිධ සුභසාධන වැඩසටහන් පැවැත්වීම.

උතුරු මැද පළාත තුළ පිහිටි ළමා රැකවරණ මධ්‍යස්ථාන 15ක් වන අතර මේවායේ රැකවරණය ලබන දරු දැරියන් සංඛ්‍යාව 450ක් පමණ වේ.දරුවකු හැදී වැඩීමට උචිත පරිසරය වනුයේ තමා ජීවත්වන ගෘහාශ්‍රිත පරිසරය ලෙසට සමාජගත වුවද වර්තමානය වනවිට පවුල් පරිසරය තුළ සිදු වන්නා වූ නොයෙක් ගැටළුකාරී තත්වයන් හේතුවෙන් හා සමාජයේ ඇතැම් පුද්ගලයන් වෙතින් දරුවන්ට සිදුවන යම් යම් අකටයුතුකම් අසාධාරණයන් හේතුවෙන් අනාථ අත්හල අසරණභාවයට පත්වන දරුවන් මෙන්ම භාරය හා ආරක්ෂාව නොමැති දරුවන් ලෙසින් සමාජයේ ඇතැම් දරුවන්ට ආයතනගත වන්නට සිදු වි ඇත. එවිට ඔවුන්ගේ හැදී වැඩෙන පරිසරය මෙන්ම ළමා කාලයද ගෙවී යන්නේ ළමා නිවාස තුළය. රටේ අනාගත වගකීම් බාර ගැනීමට සිටින මෙම දරුවන්ගේ කායික මානසික සංහිඳියාව හැකියා කුසලතා වර්ධනය කිරීම අධ්‍යාත්මික දියුණුව ඇති කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එම වැඩසටහන් 2019 වර්ෂය තුළ ද ක්‍රියාත්මක කරන ලදී.

## 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විවිධ සුභසාධන වැඩසටහන්

| අනු අංකය | වැඩසටහන | වියදම (රු.මි) | |
|---|---|---|---|
| 01 | වැඩිහිටි සත්කාරක වැඩසටහන | 0.37 |  |
| 02 | විශ්ව ළමා දින සැමරුම | 0.28 |  |
| 03 | නිවාසගත දරුවන්ගේ හැකියා ප්‍රදර්ශනය | 0.24 |  |
| 04 | ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 0.0016 |  |
| 05 | අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා අධ්‍යාපන උපකරණ ලබාදීම | 1.68 | තෝරාගත් අඩු අදායම්ලාභී පවුල් 650 |
| 06 | ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන | 0.17 | ළමා නිවාස මට්ටමින් තරඟාවලියක් ලෙස පවත්වන ලදි. ජයග්‍රාහී දරුවන් සඳහා ත්‍යාග ප්‍රදාන කරන ලදි. |
| 06 | රැඳවුම් නිවාසගත දරුවන්ගේ විවිධ ප්‍රසංගය | 0.02 | |

## සමස්ත කාර්ය සාධනය පිළිබඳ අදහස

රටේ ජීවනාලිය වන දරු පරපුරේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහාවන අරමුණු පෙරටුකර ගනිමින් ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමෙන්තුව නීතිගරුක ප්‍රජාවක් සුරක්ෂිත ළමා පරපුරක් සඳහා 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සඳහා ලබා දුන් සියළු ප්‍රතිපාදන උපයෝජනය සඳහා කටයුතු කරන ලදී.
විවිධ අරමුණු ඔස්සේ සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම තරමක් දුරට ප්‍රමාද වුවද එම අභියෝග මගහරවා ගෙන සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් නිම කිරීම සඳහා උත්සුක විය.
2019 වර්ෂයේ දෙපාර්තමේන්තු පුනරාවර්තන වැය වෙනුවෙන් රු.මි.104.53ක් ලබා දුන් අතර ඉන් රු.මි.99.64ක මුදලක් උපයෝජනය කරන ලද අතර ඉතිරි රු.මි.5.38කි. ඒ අනුව සමස්ත උපයෝජනය 94%ක් වේ.2019 වර්ෂයේ දෙපාර්තමේන්තු මූලධන වැය විෂය යටතේ උපයෝජනය සඳහා ලබා දුන් ප්‍රතිපාදනය රු.මි.53.25කි.එයින් 33.16 ක මුදලක් උපයෝජනය කරන ලදි. ඉතිරිය රු.මි.19.67කි.ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 62%කි.
2019 වර්ෂය සඳහා මූලධන ප්‍රතිපාදන ලෙස දෙපාර්තමේන්තුව සඳහා ලබා දුන් රු.මි.71ක මුදල විවිධ ව්‍යාපෘති සඳහා වෙන්කර සැලසුම් සකස්කර තිබුනද මුදල් කොමිෂන් සභාව විසින් වියදම් කළමනාකරණය කිරීම සඳහා ලබා දුන් ප්‍රතිපාදනයෙන් 25%ක ප්‍රමාණයක් අවුරා තැබීමට කටයුතු කිරීමට සිදු විය. ඒ අනුව මුළු ප්‍රතිපාදනයෙන් රු.මි.17.75ක ප්‍රතිපාදනයක් අවුරා ලබන ලද අතර ඉතිරිය වන රු.මි.53.25 සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් කළමනාකරණය කරමින් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන ලදී.
2019 වර්ෂයේ අප්‍රේල් 21 පාස්කු ඉරිදා දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරය හේතුවෙන් රට තුළ නිර්මාණය වූ ආරක්ෂක තත්වය මත පෙර වර්ෂවල අඛණ්ඩව පැවති ළමා නිවාස දරුවන්ගේ අවුරුදු උත්සවය හා කාර්ය මණ්ඩලය වෙනුවෙන් පැවැත්වීමට කටයුතුකර තිබූ පුහුණු වැඩසටහන් කිපයක් නවතා දැමීමට සිදු විය.
ඉදිකිරීම් කටයුතුවලදී ඉංජිනේරු ඇස්තමේන්තු හා ලංසු ලියවිලි ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීමේදි සිදුවන ප්‍රමාදය නිසා සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීමට එය බාධාවක් වන බැවින් ඒ සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් කටයුතු කළ බැවින් එම බාධාව මගහරවාගෙන කටයුතු කළ හැකි වීම නිසා සියළු ඉදි කිරීම් ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය ඉහළ මට්ටමක රඳවා ගැනීමට හැකියාව ලැබීම සතුටට කරුණකි. 2018 වර්ෂයේදී ඉදි කිරීම් කටයුතු අවසන් කරන ලද කිරිකෙටුවැව සහතික කළ පාසල සඳහා අවශ්‍ය තනතුරු බඳවාගෙන එම ආයතනය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළ ද එය ව්‍යර්ථ විය. එම කටයුත්ත ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා 2020 වර්ෂයේදී එම බඳවාගැනීම් සිදු කිරීමට කටයුතු කිරීමට අවශ්‍යව ඇත. නියමිත කාර්ය සාධනය සපුරා ගැනීමට අවශ්‍ය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවුවද පවතින මානව සම්පත උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව උපයෝජනය කිරීමට කටයුතු කිරිම තුළ ගැටළු මගහරවා ගැනීමට කටයුතු කරන ලදී.

# 8.4.පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

**ආයතනය පිළිබඳ මූලික තොරතුරු**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ප්‍රතිපාදනයන්ට අනුව 1988.05.12 වන දින උතුරු මැද පළාත් සභාව ස්ථාපිත කිරීමෙන් අනතුරුව 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ පැවරුණු විධි විධානයන්ට යටත්ව පළාත් සභාවට පැවරුණු සමාජ සේවා විෂයට අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත. මුලිකවම සාලියපුර රජයේ වැඩිහිටි නිවාසයේ කටයුතු මෙන්ම මහජනාධාර ගෙවීමෙන් ආරම්භ වන මෙම ආයතනයේ කටයුතු වර්තමානය වනවිට ඉතා පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වී ඇත.

උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය අනුරාධපුරයේ පිහිටා ඇති අතර, ඒ යටතේ සෘජුව පාලනයවන ආයතන 03කි. එනම්, සාලියපුර ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය, බුල්නෑව සුපසන් විශ්‍රාමික වැඩිහිටි නිවාසය හා ගිරිතලේ අත්වැළ පුහුණු මධ්‍යස්ථාන යි.

එසේම ප්‍රාදේශීයව කටයුතු කිරීම සඳහා සමාජ සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ම ආවරණය වන පරිදි යොදවා ඇත. තවද අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව මධ්‍යම රජයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, ආබාධ සහිත තැනැත්තන්ගේ මහ ලේකම් කාර්යාලය, සමාජ සේවා අමාත්‍යාංශය යන ආයතන සමඟ සමීපව කටයුතු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවට අයත් නමුත් රාජ්‍ය නොවන ආයතන මඟින් පවත්වාගෙන යන ආයතන පවතින අතර, එම ආයතන සඳහා යථායෝග්‍යාධාර හා වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර ලබාදීම සහ අධීක්ෂණය දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ. සාලියපුර සතුටු ළමා නිවාසය, නොච්චියාගම බුද්ධි ඌණතා සහිත ළමුන්ගේ විශේෂ පුහුණු පාසල, ඇලගමුව ආබාධ සහිත ළමුන් සඳහා වෘත්තීය පුහුණු ආයතනය, සේවාගම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ වෘත්තීය පුහුණු ආයතනය, තලාව අක්ශි ආබාධ සහිත කාන්තාවන්ගේ ආයතනය, ඔළුකරද විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ රැකවරණ මධ්‍යස්ථානය ඒ අතර වේ.

තවද රාජ්‍ය නොවන ආයතන හෝ පාලක මණ්ඩලයකින් පාලනය වන පහත ආයතනද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් කරන අතර, යථායෝග්‍යාධාරද ගෙවනු ලැබේ.

I. හිඟුරක්ගොඩ මිණිහිරි කාන්තා සුරැකුම් මධ්‍යස්ථානය.
II. අනුරාධපුර රියෙන්සි අලගියවන්න අඳ බිහිරි විදුහල.
III. පොළොන්නරුව පැරකුම් වැඩිහිටි නිවාසය.

## දෙපාර්තමේන්තුව සතු ආයතන

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | උ.මැ.ප |
|---|---|---|---|
| වැඩිහිටි නිවාස | 01 | 01 | 02 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ පුහුණු පාසැල් | 03 | 01 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථාන | 01 | - | 01 |
| සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන | - | 01 | 01 |

## නේවාසික පහසුකම් ලබාදිය හැකි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

| ආයතනය | නේවාසික පහසුකම් දිය හැකි සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| **වැඩිහිටි නිවාස** | | ගැහැණු | පිරිමි | එකතුව |
| ශාන්ති සෙවණ වැඩිහිටි නිවාසය - සාලියපුර | 302 | 151 | 151 | 302 |
| සැදෑ සෙවණ විශ්‍රාමික වැඩිහිටි නිවාසය - බුල්නෑව | 05 | 02 | 12 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ පුහුණු පාසැල් | | | | |
| සතුට ළමා නිවාසය - සාලියපුර | 30 | 28 | - | 28 |
| ඇලගමුව වෘත්තීය පුහුණු ආයතනය | 30 | 11 | 11 | 22 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - සේවාගම | 50 | - | 38 | 38 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - නොච්චියාගම | 25 | - | 13 | 13 |
| **අනෙකුත් ආයතන** | | | | |
| ඔළුකරද රැකවරණ මධ්‍යස්ථානය | - | - | - | - |
| අත්වැල සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | 12 | - | - | - |

## ආධාර ගෙවීම් පිළිබඳ විස්තර

| විස්තරය | අනුරාධපුර | | පොළොන්නරුව | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** |
| මහජන ආධාරලාභීන් | 23,750 | 23,338 | 4,876 | 28,626 | 28,626 | 27,958 |
| විශේෂ මහජනාධාර | 2,767 | 3,116 | 335 | 3,059 | 3,059 | 3,451 |
| රෝගාධාර | 1,688 | 419 | 113 | 2,306 | 2,306 | 532 |
| නිවුන්දරු ආධාර | 151 | 332 | 60 | 218 | 218 | 392 |
| විවිධ රෝග ආධාර | 3,322 | 2,949 | 168 | 3,520 | 3,520 | 3,117 |
| පූර්ණ ආබාධ ආධාර | 630 | 743 | 162 | 770 | 770 | 905 |
| පාසැල් ශිෂ්‍යාධාර | 3,507 | 4,286 | 1,172 | 4,598 | 4,598 | 5,458 |
| **එකතුව** | **35,815** | **35,183** | **6,630** | **43,086** | **43,086** | **41,813** |

## වැඩිහිටි ජනගහනය

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය | - | 2,650,000 |
| උතුරුමැද පළාතේ වැඩිහිටි ජනගහනය | - | 124,685 (4.7%) |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | - | 82,889 (3.13%) |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | - | 41,796 (1.58%) |

## දැක්ම

"සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක්"

## මෙහෙවර

"පළාතේ ජීවත්වන දිළිඳු, ආබාධ සහිත, වැන්දඹුභාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම්, අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින් ,ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජයේ පිළිගත් පිරිසක් බවට පත් කිරීම."

## දිගුකාලීන අරමුණු

- ❖ සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් හෝ පවුල් ඒකක සඳහා සාමාජයීය වටිනාකමක් ගොඩනැගීම.
- ❖ රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සුරක්ෂිත කිරීම.
- ❖ වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ සමාජ සුභසාධනය ඉහළ මට්ටමක් දක්වා ළඟාකර ගැනීම.
- ❖ අයහපත් චර්යාවන්ගෙන් යුත් තරුණයින් යහපත් පුරවැසියන් බවට පත්කර රටේ සංවර්ධනයට දායකවන තරුණ ප්‍රජාවක් බිහි කරලීම.
- ❖ ප්‍රජාව ආපදා තත්වයෙන් සුරක්ෂිත කර ගැනීම.
- ❖ ප්‍රශස්ත මහජන සේවයක් ලබාදෙන රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

## කෙටි කාලීන අරමුණු

- ❖ අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය වීම.
- ❖ අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකවල ජීවනෝපාය සංවර්ධනය දිරිමත් කිරීම.
- ❖ රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සැලසීම.
- ❖ වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ඉහළ නැංවීම පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහි කිරීම.
- ❖ වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා සංවිධාන ව්‍යුහය ශක්තිමත්ව පවත්වා ගෙන යාම.
- ❖ වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ දැනුම,කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම හා ඇගයීම.
- ❖ සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නිරත හා දුරාචාරයන්වලට ඇබ්බැහි වූවන් එම චර්යාවන්ගෙන් වළක්වා ගැනීම සහ ඒ සඳහා යොමුවීම වැළක්වීම.
- ❖ ආපදා තත්වයන්ට පෙර සූදානම හා හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහිකිරීම.
- ❖ නවීන තාක්ෂණය හා පිළිගත් ක්‍රමවේද අනුගමනයකර දෙපාර්තමෙන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය ඉහළ නැංවීම.
- ❖ දෙපාර්තමෙන්තු කාර්ය මණ්ඩලයේ ආකල්ප හා ධාරිතාවය සංවර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- අඩු ආදායම්ලාභීන් සඳහා ක්ෂේත්‍ර රාශියක් යටතේ මූල්‍යාධාර ලබා දීම.
- අඩු ආදායම්ලාභීන් සඳහා උපකරණ ආධාර ලබා දීම.
- හඳුනාගත් විශේෂ අවස්ථාවලදී අවශ්‍ය මූල්‍යාධාර හා උපකරණ ලබා දීම.
- වැඩිහිටි නිවාස පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන හා රැකවරණ ආයතන පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- පළාතේ මහජනතාවට සහනයක් ලබාදිය හැකි වෙනත් ආයතන පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත, ගෘහමූලික කාන්තා හා අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමේ හා ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා නව සංවිධාන ආරම්භ කිරීම , රැස්වීම් කැඳවීම හා යටිතල පහසුකම් සැපයීම.
- මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
- වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත පුද්ගලයන් හා ගෘහමූලික කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සුභසාධනය ඉහළ නැංවීමට ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ ආයතනික පරිපාලනය හා කළමණාකරණය.

## ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත සියළුම ග්‍රාම නිලධාරි තුලාන්වල ජීවත්වන අඩු ආදායම්ලාභී, අන්ත අසරණ බවට පත්ව සිටින රෝගී පුද්ගලයින් සහ එම පවුල්, ආර්ථික හා වෙනත් හේතූන් මත විවිධ තර්ජනයන්ට, මානසික, කායික රැකවරණය අහිමිව සිටින වැඩිහිටි තැනැත්තන් පිළිබඳව, ආබාධ සහිත තත්ත්වය මත සාමාජයීය වරප්‍රසාද අහිමි වී සිටින පුද්ගලයින් පිළිබඳව දත්ත රැස් කරමින් එම පුද්ගල අවශ්‍යතාවයන් ඉටුකරලීම සඳහා සෘජු මැදිහත්වීම, අවශ්‍ය පරිදි මාසික සහනයන් සැලසීම සිදුකෙරේ.


- රැකවරණය අහිමිව විවිධ ස්ථානයන්වල අනාරක්ෂිතව සිටින සහ නිවෙස් තුළ අසරණව අනාරක්ෂිතව සිටින වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා රැකවරණය සපයමින් නිවාසගත කිරීමට හෝ පවුල තුළ මානසික, කායික ආරක්ෂාව සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාදීමට මැදිහත් වීම.
- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා අවශ්‍ය කරන ආධාරක, උපකරණ ලබා දීම.
- එම පුද්ගලයින්ගේ සහ එම පවුල්වල ආර්ථික ගැටළු අවම කරමින් ජීවන උත්පාදනයන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අවශ්‍ය පුහුණු සමඟ ස්වයං රැකියා අවස්ථා වෙත යොමු කරමින් එමගින් ආර්ථික වාසි ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කිරීම.
- ස්වාමියා අහිමිවීම නිසා වැන්දඹුභාවයට හා අසරණභාවයට පත්වෙමින් තම දූ දරුවන් සමග ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව වෙහෙසෙමින් ඔවුන්ගේ අධ්‍යාපනයන් සඳහා වෙහෙස වෙමින්, තම ආර්ථිකය ද ශක්තිමත් කරගැනීමට වෙර වීරිය දරන කාන්තාවන්ගේ අනාරක්ෂිත නිවාස සහ ආබාධිත, වැඩිහිටි තැනැත්තන්ගේ අනාරක්ෂිත නිවාස සකස් කරගැනීමට සුවසේ ජීවත්වීම සඳහා නිවාස ආධාර ලබාදීම.
- රෝගී පවුල්, වැන්දඹු සහ ආබාධ සහිත තත්ත්වයට පත්ව සිටින පවුල්වල මහත් දුෂ්කරතාවයෙන් යුතුව අධ්‍යාපනය ලබා දීමට වෙහෙසෙන මෙන්ම මහත් උනන්දුවෙන් අධ්‍යාපනය ලැබීමට වෙහෙසෙන දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මාසිකව ශිෂ්‍යාධාර ලබාදෙමින් රටට ඵලදායී දරු පිරිසක් නිර්මාණය කිරීමට මැදිහත්වීම.
- විවිධ ඇබ්බැහිවීම් සහ සමාජ විරෝධී පුද්ගලයින් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගනිමින් ඔවුන් සඳහා කඳවුරුගත නේවාසික වැඩසටහන් පවත්වා පසුවිපරම් කරමින් ඔවුන් යහමාර්ගයට ගැනීම.

## අංශය සෘජුව හා වක්‍රව නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්

| අංකය | තිරසර සංවර්ධන අරමුණ | අංකය | තිරසර සංවර්ධන අරමුණ |
|---|---|---|---|
| 1 NO POVERTY | සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම (1.1,1.3,1.4,1.5,1 අ) | 2 ZERO HUNGER | සාගින්න නැති කර,ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම(2.2.) |
| 4 QUALITY EDUCATION | පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථාව සැලසීම.(4.5,4 අ) | 6 CLEAN WATER AND SANITATION | සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනකරණය සහතික කිරීම(6.2) |
| 8 DECENT WORK AND ECONOMIC GROWTH | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම(8.5,8.6) | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම(9.අ) |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 173 |
| 2 | සේවයේ නියුතු | 122 |
| 3 | පුරප්පාඩු | 51 |
| 4 | පුහුණු | 01 |



## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 65.79 | 65.19 | 0.60 | 99 |
| ගමන් වියදම් | 3.90 | 3.90 | 0.00 | 100 |
| සැපයීම් | 3.02 | 2.94 | 0.076 | 97 |
| නඩත්තු වියදම් | 3.43 | 3.41 | 0.02 | 99 |
| ගිවිසුම්ගත සේවා | 11.15 | 10.76 | 0.39 | 97 |
| මාරු කිරීම් | 430.58 | 406.23 | 24.35 | 95 |
| සහනාධාර | 0.005 | 0.005 | 0.00 | 100 |
| **එකතුව** | **517.87** | **492.43** | **25.43** | **95** |

## පුනරාවර්තන වියදම් දරමින් සිදු කළ සංවර්ධන කටයුතු හා ක්‍රියාකාරකම්

| අ.අ | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | අපේක්ෂිත ප්‍රතිපලය | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තුව | සාලියපුර වැඩිහිටි නිවාසයේ සුළු වෙනත් අළුත්වැඩියා කිරීම් | 301 | නේවාසිකයන්ගේ හා කාර්ය මණ්ඩලයේ පහසුකම් වැඩිදියුණු කිරීම | 0.91 |
| 02 | | සාලියපුර වැඩිහිටි නිවාසයේ වැසිකිළි පද්ධතියේ සුළු අළුත්වැඩියා කිරීම් | 301 | | 0.88 |
| | | **එකතුව** | **602** | | **1.79** |

## මූලධන වියදම් (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - PSDG ) - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| සාලියපුර වැඩිහිටි නිවාසයේ නවීකරණය | 17.00 | 14.61 | 2.39 | 86 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ නවීකරණය | 2.55 | 2.53 | 0.02 | 100 |
| ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | 2.77 | 2.76 | 0.01 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 0.11 | 0.11 | 0.00 | 100 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 1.87 | 0.71 | 1.16 | 38 |
| සාලියපුර වැඩිහිටි නිවාසයේ ගොඩනැගිලි ඉදිකිරීම් | 14.96 | 13.99 | 0.97 | 94 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් | 3.00 | 2.96 | 0.04 | 99 |
| ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම | 2.00 | 1.89 | 0.11 | 95 |
| මාසික මහජනාධාර ජාලගත කිරීම | 0.10 | 0.09 | 0.01 | 97 |
| දෙවටු පුරවැසි ආශිර්වාද පූජා වැඩසටහන | 1.12 | 1.12 | 0.0 | 100 |
| **එකතුව** | **45.48** | **40.77** | **4.71** | **90** |

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)- අවිච්ඡේද ව්‍යාපෘති


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වැඩිහිටි නිවාස නවීකරණය | 0.32 | 0.32 | 0.0 | 100 |
| කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස අළුත්වැඩියාව | 1.56 | 1.56 | 0.0 | 100 |
| සාලියපුර වැඩිහිටි නිවාසයේ ගොඩනැගිලි ඉදිකිරීම | 3.62 | 3.62 | 0.0 | 100 |
| **එකතුව** | **5.50** | **5.50** | **0.00** | **100** |

## මූලධන වියදම් (පළාත් සභා සංවර්ධන ප්‍රදාන- PCDG) - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.75 | 0.57 | 0.18 | 76 |
| **එකතුව** | **0.75** | **0.57** | **0.18** | **76** |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - ප්‍රාග්ධන වැයවීම 2016 – 2019

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුළු මුදල (රු.මි) |
|---|---|---|---|
| 2016 | 12.71 | 14.19 | 26.90 |
| 2017 | 13.43 | 0.5 | 13.93 |
| 2018 | 31.9 | 5.78 | 37.68 |
| 2019 | 40.77 | 0.57 | 41.34 |



## අමාත්‍යාංශ දෙපර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු,ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය /රු.මි | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| 01 | 1.3.1 | මාසික මූල්‍යාධාර සඳහා වියදම | 325 | 322.22 |
| | | මාසික නොවන මූල්‍යාධාර සඳහා වියදම | 48 | 47.42 |
| | | ආබාධිත උපකරණ ලබාදීම සඳහා වියදම | 15 | 14.68 |
| | 1 අ.2 | දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම | 516 | 492.5 |
| | | දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම | 52 | 47.29 |
| 03 | 3.3.2 | ක්ෂය රෝග ආධාර සඳහා වැයකරන මුදල | 3 | 3.10 |
| | 3.5.2 | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා වැය කරන මුදල | 1.5 | 1.44 |
| 04 | 4.5.1 | ශිෂ්‍යාධාර සඳහා වැය කරන මුදල | 54 | 53.02 |
| | | සිසු දිරිය සඳහා වැය කරන මුදල | 5.0 | 4.98 |
| | | පාසල් උපකරණ ලබාදීම සඳහා වැය කරන මුදල | 1.25 | 1.23 |
| | | යථායෝග්‍යාධාර ගෙවීම සඳහා වැය කරන මුදල | 3.00 | 3.16 |
| | | ආබාධිත ආයතනවල වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා වැය කරන මුදල | 0.25 | 0.27 |
| | 4.අ.1 | ආබාධිත වෘත්තීය පුහුණු ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනයට සඳහා වැය කරන මුදල | 5.37 | 4.65 |
| | | ආබාධිත දරුවන් සඳහා විශේෂ උපකරණ ලබාදීමට වැය කරන මුදල | 0.5 | 0.54 |
| 08 | 8.5.1 | ස්වයං රැකියා ආධාර වශයෙන් වැය කරන මුදල | 15.0 | 15.75 |
| | 8.5.2 | ස්වයං රැකියා පුහුණු වැඩසටහන් සඳහා වැය කරන මුදල | 0.25 | 0.25 |
| 10 | 10.2.1 | මූල්‍යාධාර වශයෙන් වැයකරන මුදල | 370 | 369.64 |
| | | ආබාධිත උපකරණ ආධාර ලබාදීමට වැයකරන මුදල | 15 | 14.68 |
| | | දැනුම,කුසලතා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් සඳහා වැයකරන මුදල | 6.5 | 6.28 |
| 11 | 11.1.1 | නිවාස ආධාර සඳහා වැයකරන මුදල | 23.00 | 22.4 |
| 16 | 16.6.1 | දෙපාර්තමේන්තුවේ එදිනෙදා පුනරාවර්තන වියදම් සඳහා වැයකරන මුදල | 516 | 492.5 |
| | | දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් සඳහා වැයකරන මුදල | 51.75 | 47.28 |
| | 16.6.2 | ධාරිතා සංවර්ධනය සඳහා වැයකරන මුදල | 0.75 | 16.6.2 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්ක | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජනය /රු.මි | ඉලක්ක ගත වියදම/රු.මි |
|---|---|---|---|---|---|
| 16 | 16.6 | 16.6.1 | සාලියපුර වැඩිහිටි නිවාසයේ නවීකරණය | 17.00 | 14.61 |
| | | | බුල්නෑව වැඩිහිටි නිවාසයේ නවීකරණය | 2.55 | 2.53 |
| | | | ආබාධිත රණවිරු නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | 2.77 | 2.76 |
| | | | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 0.11 | 0.11 |
| | | | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 1.87 | 0.70 |
| | | | සාලියපුර වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් | 14.96 | 13.99 |
| | | | බුල්නෑව වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම | 3.00 | 2.96 |
| | | | ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම් | 2.00 | 1.89 |
| | | 16.6.2 | මාසික මහජනාධාර ජාලගත කිරීම | 0.10 | 0.09 |
| | | | දැනුම වර්ධනය හා ආයතනික ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 0.75 | 0.56 |
| 10 | 10.2 | 10.2.1 | දෙවු පුරවැසි ආශිර්වාද පූජා වැඩසටහන | 1.12 | 1.12 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආවරණය කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන |
|---|---|---|---|
| සාලියපුර වැඩිහිටි නිවාසයේ නවීකරණය | සාලියපුර වැඩිහිටි නිවාසයේ මුළුතැන්ගෙය නවීකරණය | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ කාර්යාල සංකීර්ණය නවීකරණය | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ බහු කාර්යය ගොඩනැගිල්ල නවීකරණය | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ නඩත්තු ඒකකය සඳහා ගොඩනැගිල්ලක් නවීකරණය | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ ප්‍රධාන ශාලාව නවීකරණය | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ පුස්තකාලය සඳහා ගොඩනැගිල්ලක් නවීකරණය | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ වැසිකිළි පද්ධතිය නවීකරණය ii අදියර | 301 | 01 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ නවීකරණය | බුල්නෑව වැඩිහිටි නිවාසයේ නවීකරණය | 14 | 01 |

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන |
|---|---|---|---|
| ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | සේවාගම **ආබාධිත** වෘත්තීය පුහුණු ආයතනය නවීකරණය | 31 | 01 |
| | නොච්චියාගම **ආබාධිත** වෘත්තීය පුහුණු ආයතනය නවීකරණය | 11 | 01 |
| | සාලියපුර **ආබාධිත** වෘත්තීය පුහුණු ආයතනය නවීකරණය | 28 | 01 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 122 | 03 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 301 | 01 |
| වැඩිහිටි නිවාස ගොඩනැගිලි ඉදිකිරීම | සාලියපුර වැඩිහිටි නිවාසයේ භාවනා මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ ජල අපවහන පද්ධතියක් සකස් කිරීම | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ නිල නිවාසය සඳහා වැසිකිලියක් ඉදිකිරීම. | 20 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ මෘත දේහාගාරයේ පිවිසුම සකස් කිරීම | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සකස් කිරීම. | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ දෙපාර්තමේන්තු බස් රථය සඳහා නැවතුම් ස්ථානයක් ඉදිකිරීම. | 41250 | 29 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ පසුපස මුරකුටියක් ඉදිකිරීම. | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය කාපට් කිරීම | 301 | 01 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ වාට්ටුව ඉදිකිරීම. | 18 | 01 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම්. | බුල්නෑව වැඩිහිටි නිවාසයේ මුරකුටියක් ඉදිකිරීම. | 14 | 01 |
| | බුල්නෑව වැඩිහිටි නිවාසයේ පිටත වැසිකිලියක් ඉදිකිරීම | 14 | 01 |
| | බුල්නෑව වැඩිහිටි නිවාසයේ වතුර ටැංකිය ඉදිකිරීම. | 14 | 01 |
| ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම | ඔළුකරඳ ආබාධිත රැකවරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් | 11 | 01 |
| | ඇලගමුව ආබාධිත රැකවරණ මධ්‍යස්ථානයේ වැසිකිලියක් ඉදිකිරීම | 22 | 01 |
| වෙනත් | මාසික මහජනාධාර ජාලගත කිරීම | 43156 | 29 |
| ආයෝජන | දෙටු පුරවැසි ආශිර්වාද පූජා වැඩසටහන | 1685 | 29 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 81 | 29 |

දුගී බව අවසන් කිරීම යටතේ ආහාර, සෞඛ්‍ය, අධ්‍යාපනය, නිවාස හා රැකියා වැනි මූලික මිනිස් අවශ්‍යතාවයන් යම් ආකාරයකට හෝ සපුරා ගැනීම සඳහා මාසිකව වාරික වශයෙන් හා එක්වරක් පමණක් ගෙවන මූල්‍යාධාර ලබාදීම සඳහා ප්‍රතිලාභීන් 45195ක් සඳහා රු. මිලියන 369.64 අදාල ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. මෙහිදි මෙම වර්ෂයට අදාලව මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුණු මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.මිලියන 492.43ක් පුනරාවර්තන වියදම් වන අතර රු.මිලියන 46.86ක් ප්‍රාග්ධන වියදම් වේ. එය ප්‍රතිශතාත්මකව පිළිවෙලින් 91% හා 9% කි.

ක්ෂය රෝගීන් 85 දෙනෙකු සඳහා ක්ෂය රෝගාධාර වශයෙන් රු. මිලියන 3.1ක් එක් අයෙකුට රු. 3000.00 බැගින් ලබා දී ඇති අතර හානිකර ආකාරයට මධ්‍යසාර භාවිතය හා අන්තරායකර ඖෂධ භාවිතය වැළැක්වීමේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා වියදම් කර ඇති මුදල රු. මිලියන 1.44කි. එම මුදල වියදම් කරන ලද්දේ මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූවන් 332ක ප්‍රමාණයක් ඉන් මුදවාලීම සඳහා වන අතර එම කාර්යයන් තිරසර සංවර්ධන අරමුණ 03 අනුව නිරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් සිදු කරන ලද්දකි.

තිරසර සංවර්ධන අරමුණ 04 යටතේ පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථාව සැලසීම අරමුණු කරගනිමින් පාසල් දරුවන්ට මූල්‍යාධාර ලබාදීමට පාසල් උපකරණ සඳහා වැයකරන ලද මුදල රු. මිලියන 1.23ක් වන අතර එම මුදල වැය කරන ලද්දේ පාසල් දරුවන් 954 ක් සඳහාය. මෙහිදී ආබාධිත වෘත්තීය පුහුණු ආයතනවල නේවාසික ළමුන් 221 ප්‍රමාණයක් සඳහා යථායෝග්‍යාධාර ලබාදීමට රු. මිලියන 3.16 ක මුදලක් වැය කරන ලද අතර, වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා වැය කරන ලද මුදල රු. මිලියන 0.27කි. එහිදි විසිතුරු මල් වගාව, කෝමාරිකා වගාව, කෘතීම මල්, හඳුන්කූරු, ඉදල්, පාපිසි වැනි භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා එම දරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීමට අවස්ථාව සැළසුණි. එමෙන්ම ආබාධිත වෘත්තීය පුහුණු ආයතන නගා සිටුවීමට සඳහා යටිතල පහසුකම් සංවර්ධනයට රු. මිලියන 4.70 කුත් ආබාධිත දරුවන් සඳහා විශේෂ ආබාධිත උපකරණ ලබාදීම සඳහා රු. මිලියන 0.54.ක් වැය කරන ලද අතර, එමඟින් ඔවුන්ගේ අධ්‍යාපනය හා වෘත්තීය පුහුණු කටයුතු මැනවින් සිදු කිරීමට හැකියාව ලැබී ඇත.

සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ, තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී හා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම 08 වන තිරසර සංවර්ධන අරමුණ යටතේ දක්වා ඇති අතර, එමඟින් ආවරණය වන එක් අංශයක් වන්නේ වැඩිහිටි, ආබාධිත සහ ගෘහ මූලික කාන්තාවන්ගේ ආදායම් ඉපයීම ඉහළ නැංවීම සඳහා රැකියා විරහිත එම ප්‍රජාවන් වෙත සුනිසි රැකියා අවස්ථාවන් ඇති කිරීමයි. එම අරමුණු ඉටුවන පරිදි මෙම දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ එම ප්‍රජා කාණ්ඩ වෙත විධිමත් පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව ස්වයං රැකියාවක යෙදීම සඳහා පුද්ගලයින් 807කට රු.මිලියන 15.75ක මුදලක් ලබා දී ඇත. මෙම ස්වයං රැකියා පුහුණු වැඩසටහනට වියදම් කර ඇති මුදල ආසන්න වශයෙන් රු.මි. 0.25ක් වන අතර, එමඟින් එම ප්‍රජා කාණ්ඩවල විරැකියාව තුරන් කිරීමත් රටේ සංවර්ධනයට දායක කර ගැනීමත්, ආදායම් ඉපයීම වැඩිකර ගැනීමත් අපේක්ෂා කෙරේ.

පළාතේ වැදගත්ම සම්පත වශයෙන් මානව සම්පත හඳුනාගෙන ඇති අතර ඔවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින් 2019 වසරේ ක්ෂේත්‍රගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 6.28ක මුදලක් වියදම් කර ඇති අතර, පුද්ගලයන් 3308ක් සඳහා ආබාධිත උපකරණ ලබා දීමට රු.මි.14.68ක මූල්‍යාධාර ලබා දීම සඳහා රු.මිලියන 369.64ක මුදලක් ප්‍රතිලාභීන් 45195ක් සඳහා වැයකර ඇත. එමඟින් අපේක්ෂා කරන්නේ තිරසර සංවර්ධන අරමුණු 10 අනුව රට තුළ පවතින අසමානතාවය අඩු කිරීමය.

තිරසර සංවර්ධන අරමුණ 11 යටතේ නගර හා ජනාවාස, පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් හා තිරසර ලෙස සකස් කිරීම සිදුකළ යුත්තක් බැවින් අඩු ආදායම්ලාභීන් 896 කගේ නිවාසවල පවතින අත්‍යවශ්‍ය අළුත්වැඩියා සඳහා රු.මි. 22.4 ක මුදලක් 2019 වසරේ වැයකර ඇත. එමඟින් එම අරමුණ ඉටු වූ බවට නිරීක්ෂණය කරන අතර, තිරසර සංවර්ධන අරමුණු අංක 16 යටතේ ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම ඉටුවන පරිදි දෙපාර්තමේන්තුව පුනරාවර්තන වියදම් දැරීමට 2019 වර්ෂයේ රු.මිලියන 492.5 ක මුදලක් වැයකර ඇත. ඉහත දක්වා ඇති පරිදි දෙපාර්තමේන්තු කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා දෙපාර්තමේන්තුවට අයත් කාර්ය මණ්ඩලය ප්‍රමුඛ සාධකය වශයෙන් හඳුනා ගන්නා ලද බැවින්, නිලධාරී 81ක් ප්‍රමාණයක් සඳහා ඔවුන්ගේ නායකත්වය, කණ්ඩායම් හැඟීම, ධනාත්මක ආකල්ප වැනි කුසලතා සංවර්ධනයට 2019 වර්ෂයේ වැය කරන ලද මුදල රු. මිලියන 0.56 කි. එමඟින් වඩා කාර්යක්ෂමව හා ප්‍රශස්ත සේවයක් මහජනතාවට ලබා දීමට අපේක්ෂා කෙරේ.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක(සංඛ්‍යාව) | | වියදම/ආයෝජනය(රු/මි.) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| **01.අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සහායවීම.** | | | | |
| මාසික මූල්‍යාධාර ලබාදෙන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 46439 | 43156 | 322.22 | 322.00 |
| එක්වරක් පමණක් මූල්‍යාධාර ලබාදෙන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 795 | 1226 | 31.66 | 35.00 |
| ආබාධිත උපකරණ ලබා දෙන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 5861 | 3209 | 14.68 | 25.00 |
| නිවාස ආධාර ලබාදෙනු ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 418 | 896 | 22.4 | 22.00 |
| **02.අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකවල ජීවනෝපාය සංවර්ධනය දිරිමත් කිරීම.** | | | | |
| ස්වයං රැකියා ආධාර ලබාදෙන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 911 | 807 | 15.73 | 15.00 |
| **03.රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සැළසීම.** | | | | |
| වැඩිහිටි නිවාසවලින් නඩත්තුවන වැඩිහිටියන් සංඛ්‍යාව | 312 | 314 | 22.07 | 25.00 |
| වැඩිහිටි නිවාසවල යටිතල පහසුකම් සංවර්ධනයට ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව | 06 | 06 | 38.9 | 50.00 |
| යථායෝග්‍යාධාර ලබාදෙන ආබාධිත පුද්ගල සංඛ්‍යාව | 183 | 221 | 3.16 | 3.50 |
| විශේෂ අවශ්‍යතා සහිතවූවන් සඳහා වූ ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනයට ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව | 02 | 02 | 4.6 | 1.00 |
| **04.වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ඉහළනැංවීම පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහිකිරීම.** | | | | |
| ජනමන පුබුදමු හා වියැකෙන ගුණදම් පුබුදමු නැණසින් වැනි දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 29 | 17 | 0.61 | 0.75 |
| **05.වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා සංවිධාන ව්‍යුහය ශක්තිමත්ව පවත්වා ගැනීම** | | | | |
| වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා දිස්ත්‍රික් හා පළාත් සංවිධාන රැස්වීම් පැවැත්වූ වාර සංඛ්‍යාව | 24 | 24 | 0.024 | 0.025 |

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | වියදම/ ආයෝජනය (රු/මි.) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| 06.වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ දැනුම,කුසළතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම හා ඇගයීම. | | | | |
| වැඩිහිටියන් සඳහා පවත්වනු ලැබූ දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව (දෙවුපුරවැසි ආශිර්වාද පූජාව,දැනුම මිණුම තරඟ, වැඩිහිටි දින සැමරුම් උත්සව ,අවුරුදු උත්සව) | 101 | 53 | 2.9 | 3.00 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | - | 04 | 0.27 | 0.25 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හා ගෘහ මූලික කාන්තාවන්ගේ අවුරුදු උත්සව සංඛ්‍යාව | 29 | 22 | 0.83 | 1.00 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන් සංඛ්‍යාව | 29 | 25 | 1.03 | 1.00 |
| 07. සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නිරත හා දුරාචාරයන්වලට ඇබ්බැහි වූවන් එම චර්යාවන්ගෙන් වළක්වා ගැනීම සහ ඒ සඳහා යොමුවීම වැළක්වීම | | | | |
| පවත්වන ලද මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංඛ්‍යාව | 04 | 06 | 1.44 | 1.50 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා පසුවිපරම් වැඩසටහන් සඳහා සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 285 | 332 | 1.44 | 1.50 |
| 08. ආපදා තත්වයන්ට පෙර සූදානම හා හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහිකිරීම. | | | | |
| ජනමත පුබුදමු වැඩසටහන් සංඛ්‍යාව | 18 | 12 | 0.49 | 0.50 |
| 09. නවීන තාක්ෂණය හා පිළිගත් ක්‍රමවේද අනුගමනය කර දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය ඉහල නැංවීම. | | | | |
| ව්‍යාපෘති සංඛ්‍යාව(මහජනාධාර ජාලගත කිරීම) | 01 | 01 | 0.01 | 5.00 |
| 10. දෙපාර්තෙම්න්තු කාර්ය මණ්ඩලයේ ආකල්ප හා ධාරිතාවය සංවර්ධනය කිරීම. | | | | |
| සහභාගීවූ කාර්ය මණ්ඩල නිලධාරීන් සංඛ්‍යාව | 53 | 81 | 0.56 | 0.5 |
| පවත්වනු ලැබූ වැඩසටහන් සංඛ්‍යාව | 03 | 02 | 0.56 | 0.5 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය - 2019 -

### 1.මාසික මහජනාධාර ගෙවීම

**මාසික මහජනාධාර ගෙවීම**

දිළිඳු බවින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආධාර ලබා දීම තුළින් ජීවත් වීමට රුකුලක් වීම, ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ ආර්ථික තත්ත්වය නගාසිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම, අන්ත දුගී පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය හා අන්ත දුගී වකුගඩු රෝගය නිසා මව/පියා අහිමි වූ පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන්ගේ අධ්‍යාපනය සංවර්ධනය අරමුණු කර ගනිමින් ප්‍රධාන ව්‍යාපෘති හය (06)ක් ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් කරා ළඟා විය හැකි විය.

**මාසික මහජනාධාර ගෙවීම - 2019**

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|
| මහජනාධාර ගෙවීම් | 27,855 | 114.01 |
| විශේෂ මහජනාධාර ගෙවීම් | 4,055 | 39□57 |
| නිවුන් දරු ආධාර | 242 | 5.86 |
| පූර්ණ ආබාධිත ආධාර | 1,652 | 36.12 |
| ශිෂ්‍යාධාර ගෙවීම | 5,971 | 53.02 |
| “සිසු දිරිය” | 138 | 4.98 |
| **එකතුව** | **39,913** | **253.56** |



## මාසික රෝගාධාර ගෙවීම් හා වෙනත් ආධාර

රෝගීවීම මගින් අසරණ වූ පුද්ගලයින් සඳහා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම, ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ ආර්ථික තත්ත්වය නගාසිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා රෝගාධාර ගෙවීම, විවිධ ශල්‍යකර්ම ආධාර ගෙවීම, වකුගඩු රෝගය නිසා රුධිරය මාරු කරනු ලබන රෝගී පුද්ගලයින්ගේ සුභසාධන කටයුතු , ප්‍රා.ලේ නිර්දේශ අනුව ලැබෙන අයදුම්පත්‍ර ගෙවීම් මේ යටතේ සිදු කළ අතර එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%කි.

### මාසික රෝගාධාර ගෙවීම් හා වෙනත් ආධාර - 2019

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|
| පිළිකා ආධාර ගෙවීම | 2,670 | 48.04 |
| තැලසීමියා ආධාර | 397 | 14.31 |
| ක්ෂය රෝග ආධාර | 85 | 3.10 |
| බරවා | 16 | 0.54 |
| ලාදුරු | 75 | 2.67 |
| ඇටමිදුළු බද්ධ කිරීම | 03 | 1.50 |
| වකුගඩු බද්ධ කිරීමෙන් පසු ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම | 10 | 0.29 |
| ශල්‍යකර්ම | 13 | 0.74 |
| වකුගඩු රෝගීන් සඳහා ආහාර මුද්දර | 167 | 2.62 |
| වකුගඩු රෝගීන් සඳහා ගමන් වියදම් | 137 | 4.03 |
| නිවාස ආධාර | 896 | 22.40 |
| විස්තීරණ ආපදා ආධාර | 06 | 0.11 |
| ස්වයං රැකියා ආධාර | 807 | 15.73 |
| ස්වයං රැකියා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 807 | 0.25 |
| **එකතුව** | **6089** | **116.33** |

# 3.වැඩිහිටි තැනැත්තන් සඳහා සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණයවන පරිදි පවත්වන ලද විවිධ වැඩසටහන් - 2019

## වැඩිහිටි තැනැත්තන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

අසරණ වූ වැඩිහිටියන් , සුරක්ෂිත කිරීම හා වැඩිහිටි සුභ සාධනය ඉහළ නැංවීම මෙන්ම විවිධ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. එසේම වැඩිහිටියන්ගේ විනෝදාත්මක වැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු විය.





## වැඩිහිටි තැනැත්තන් සඳහා සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි පවත්වන ලද විවිධ වැඩසටහන් - 2019

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| ශාන්ති සෙවණ වැඩිහිටි නිවාසයේ නඩත්තු | 301 | 01 | 21.06 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ නඩත්තු | 14 | 01 | 1.01 |
| වැඩිහිටි සංවිධාන සඳහා බස්රථ වෙන් කිරීම | 2,115 | 50 | 0.43 |
| බලමණ්ඩල චාරිකා, සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම | 8,410 | 29 | 2.90 |
| දෙවු පුරවැසි ආශිර්වාද පූජා වැඩසටහන | 1,685 | 01 | 1.15 |
| වැඩිහිටියන් සඳහා අවුරුදු උත්සව පැවැත්වීම | 15,645 | 32 | 1.23 |
| වැඩිහිටියන් සඳහා දැනුම හා ආකල්ප සංවර්ධන වැඩසටහන් | 6,994 | 04 | 0.036 |
| වැඩිහිටි නිවාස සඳහා වූ වැඩසටහන් (චාරිකා,උත්සව, අත්දැකීම් හුවමාරු,) | 360 | 04 | 0.36 |
| ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සව | 13,652 | 26 | 1.02 |
| වියැකෙන ගුණදම් පුබුදමු නැණසින් වැඩසටහන | 4,425 | 05 | 0.12 |
| මා පිය වන්දනා වැඩසටහන | 573 | 01 | 0.01 |
| වෙනත් විශේෂ ව්‍යාපෘති | 1,770 | 17 | 0.37 |
| එකතුව | **48,950** | **171** | **29.696** |

විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ කායික,මානසික, ආධ්‍යාත්මික සුවතාවය ආරක්ෂා කරමින් ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම.

පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක වැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

එම අරමුණු ළඟාකර ගැනිම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% මට්ටම කරා 2019 වර්ෂයේදී ළඟා විය හැකි විය.

## විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන් - 2019

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| ඔළුකරද ආබාධිත රැඳවුම් මධ්‍යස්ථානය නඩත්තු වියදම් | 11 | 01 | 0.06 |
| නිවාසගත කිරීම් | 13 | 01 | 0.00 |
| ජාත්‍යන්තර ආබාධ සහිත දින සැමරුම් වැඩසටහන් | 2,200 | 25 | 1.03 |
| වන්දනා චාරිකා | 1,740 | 29 | 1.44 |
| යථායෝග්‍යාධාර ගෙවීම් | 221 | 01 | 3.16 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සිටින පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීම | 573 | 02 | 0.97 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 100 | 04 | 0.27 |
| දිස්ත්‍රික් ආබාධිත සංවිධානය -අනුරාධපුර | 157 | 06 | 0.01 |
| දිස්ත්‍රික් ආබාධිත සංවිධානය -පොළොන්නරුව | 118 | 06 | 0.006 |
| **එකතුව** | **5133** | **75** | **6.946** |

## 5.ගෘහ මූලික කාන්තාවන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන් - 2019

### ගෘහ මූලික කාන්තාවන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

ස්වාමියා අහිමිවී විවිධ ආර්ථික හා සමාජයීය අභියෝග සහිත වැන්දඹු කාන්තා පවුල්වල සුභසාධනය හා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම.
පුහුණු වැඩසටහන්,දැනුවත් කිරීමේ වැඩසටහන්,විනෝදාත්මක වැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



### ගෘහ මූලික කාන්තාවන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන් - 2019

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| වන්දනා චාරිකා | 1,305 | 29 | 0.87 |
| ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන් | 846 | 02 | 0.46 |
| ගෘහ මූලික කාන්තා අත්දැකීම් හුවමාරු වැඩසටහන | 84 | 01 | 0.06 |
| ගෘහ මූලික කාන්තා පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීම(මා දරු වන්දනා වැඩසටහන) | 381 | 04 | 0.26 |
| ගෘහ කාන්තා හා විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා අවුරුදු උත්සව | 3,022 | 22 | 0.83 |
| දිස්ත්‍රික් ගෘහ මූලික කාන්තා සංවිධාන ආරම්භ කිරීම-අ/පුර | 105 | 04 | 0.005 |
| දිස්ත්‍රික් ගෘහ මූලික කාන්තා සංවිධාන ආරම්භ කිරීම-පොළොන්නරුව | 72 | 04 | 0.003 |
| **එකතුව** | 5,815 | 66 | 2.488 |

## 6.දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ වැඩසටහන් සහ වෙනත් විශේෂ වැඩසටහන් - 2019

### දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ වැඩසටහන් සහ වෙනත් විශේෂ වැඩසටහන්

විවිධ ආබාධ සහිත තත්ත්වයනට පත්ව සිටින පුද්ගලයින් සහ ස්වාමියා අහිමිවීම නිසා පසුතැවිලි වන්නා වූ කාන්තා ප්‍රජාව ඇතුළු සැමගේ කායික,මානසික,ආධ්‍යාත්මික ,සමාජයීය වශයෙන් සුවතාවය ආරක්ෂා කිරීම, දුම්වැටි,මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් අවම කරමින් සමාජ සාරධර්ම සුරකින, පෞර්ෂ සංවර්ධනයෙන් යුක්ත තරුණ ප්‍රජාවක් ගොඩනැගීම, පුහුණු, දැනුවත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කඳවුරුගත වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන්, පාගමන් සංවිධානයකර ක්‍රියාත්මක කිරිම.

### දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ වැඩසටහන් සහ වෙනත් විශේෂ වැඩසටහන් - 2019

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| ජන මන පොබයන නැණස සහ වෙනත් වැඩසටහන් | 1,512 | 12 | 0.49 |
| දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුර | 332 | 02 | 1.10 |
| නේවාසික කඳවුරු පිළිබඳ පසුවිපරම් වැඩසටහන් | 326 | 02 | 0.21 |
| දිරියට අත්වැලක් සංචිතය ආරම්භ කිරීම | 242 | 01 | 0.13 |
| එකතුව | **2,412** | **17** | **1.93** |

## 7. ගුණාත්මක හා ඵලදායී රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබාදීම සඳහා නිලධාරි ධාරිතා සංවර්ධනය - 2019

**ගුණාත්මක හා ඵලදායී රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබාදීම සඳහා නිලධාරි ධාරිතා සංවර්ධනය**

සාර්ථක, ඵලදායී, ගුණාත්මක හා කඩිනම් සේවාවක් ලබාදීම සඳහා ආකල්ප සංවර්ධනය, ධාරිතා සංවර්ධනය හා නිලධාරීන් තුළ තීරණ ගැනීමේ හැකියාව පෝෂණය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් කරා ළඟා විය හැකි විය.

**ගුණාත්මක හා ඵලදායී රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබාදීම සඳහා නිලධාරි ධාරිතා සංවර්ධනය - 2019**

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| කුඩා ඔය කොමාන්ඩෝ රෙජිමේන්තු නායකත්ව පුහුණුව | **81** | **02** | **0.56** |
| ගිරිතලේ “අත්වැල” සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය නඩත්තු කිරීම | **1000** | **01** | **0.25** |
| සුවෝදය මධ්‍යස්ථානය නඩත්තු කිරීම (පරිපාලන,ජල බිල්,විදුලි බිල්) | 35 | 01 | 0.09 |
| එකතුව | 1,116 | 4 | 0.9 |

## 8. ආබාධිත උපකරණ ලබාදීම - 201

**ආබාධිත උපකරණ ලබාදීම - 2019**

රෝගී බව, මහළු බව, ආබාධිත බව නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම සහ සමාජානුයෝජනය කිරීම ආබාධිත උපකරණ ලබා දීම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබයි.

2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් කරා ළඟා විය හැකි විය.

**ආබාධිත උපකරණ ලබාදීම - 2019**

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැයකළමුදල (රු.මි) |
|---|---|---|
| රෝදපුටු | **329** | **4.19** |
| කොමඩ් රෝද පුටු | **107** | **1.49** |
| ළමා රෝදපුටු ලබාදීම | **26** | **0.34** |
| ට්‍රයිසිකල් ලබාදීම | **56** | **1.96** |
| වතුර මෙට්ට ලබාදීම | **34** | **0.29** |
| අත්වාරු ලබාදීම | **288** | **0.35** |
| අක්ෂි කාච ලබාදීම | **10** | **0.14** |
| වෝකර් ලබාදීම | **83** | **0.28** |
| කිහිලිකරු ලබාදීම | **120** | **0.21** |
| ශ්‍රවණ උපකරණ ලබාදීම | **137** | **2.86** |
| ශ්‍රවණ උපකරණ (ළමා ) ලබාදීම | **04** | **0.1** |
| සුදු සැරයටි ලබාදීම | **16** | **0.01** |
| හැරමිටි ලබාදීම | **143** | **0.17** |
| ඇස් කන්ණාඩි | **895** | **1.69** |
| වායු මෙට්ට ලබාදීම | **41** | **0.29** |
| විශේෂ (ළමා ) උපකරණ ලබාදීම | **11** | **0.10** |
| විශේෂ (වැඩිහිටි ) උපකරණ | **06** | **0.12** |
| ජංගම සේවා වැඩසටහන් | **1002** | **0.09** |
| **එකතුව** | **3308** | **14.68** |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2019





**2019** සංවර්ධන වැඩසටහන තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රුපියල් මිලියන 45.48 ක් සහ පළාත් සභා සංවර්ධන ප්‍රදාන රුපියල් මිලියන 0.75ක් ලෙස වෙන්වී තිබුණි. වෙන් වූ ප්‍රතිපාදන තුළින් 2018 වර්ෂයේ අවිච්ඡේද වී තිබූ වැඩිහිටි නිවාස නවීකරණය, කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස අළුත්වැඩියාව හා සාලියපුර වැඩිහිටි නිවාසයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.මි 5.50ක් වැය කර, 2018 වර්ෂයේ වැඩ නිම කරන ලදී.

එමෙන්ම රු.මි. 517.87ක පුනරාවර්තන මුදල් මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙන්ව තිබූ අතර එමගින් සංවර්ධන ව්‍යාපෘති රැසක් මෙම වර්ෂයේදී ඵලදායීව නිම කිරීමට හැකියාව ලැබුණි.

ඒ අතරින් විශේෂයෙන්ම මෙම වර්ෂයේ වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ගෘහ මූලික කාන්තාවන් යන දෙපාර්තමේන්තුවේ සුවිශේෂී කණ්ඩායම් අන්තර්කරණය කරමින් අවුරුදු උත්සව, දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. ඒ තුළින් ඒ සෑම ප්‍රජා කණ්ඩායමකම සාමාජිකයින් සඳහා ගෞරවණීයබවක් අභිමානයක් සහ ජීවිතය ජීවත් කරවීමට සවියක් ලබා දෙන්නට මහඟු දායකත්වයක් ලබා දීමට හැකියාව ලැබුණි.

| ව්‍යාපෘතිය | මුදල (රු .මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය |
| හොඳම ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩලය තේරීම | 0.025 | 100 | 100 |
| හොඳම වැඩිහිටි නිවාසය තේරීම | | | |
| හොඳම වැඩිහිටි ව්‍යවසායකයා තේරීම | | | |
| වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන කාර්ය සාධන තරඟය පැවැත්වීම | | | |
| **එකතුව** | **0.025** | - | |

## අංශයේ සංවර්ධනය සම්බන්ධයෙන් වන අනාගත අපේක්ෂාවන්

| අරමුණු | ක්‍රියාකාරකම | ඉලක්ක 2020 | ඉලක්ක 2021 | අපේක්ෂිත ප්‍රතිඵල දිගු කාලීන |
|---|---|---|---|---|
| අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සහායවීම. | අඩු ආදායම්ලාභීන් සඳහා විවිධ ක්ෂේත්‍ර මූල්‍යාධාර ලබා දීම. | 43,156 | 40,000 | දුගී බව තුරන්වීම සමාජ ආරක්ෂණය හා සුභසාධනය |
| | අඩු ආදායම්ලාභීන් සඳහා උපකරණ ආධාර ලබා දීම. | 3,209 | 3,000 | සමාජ ආරක්ෂණය හා සුභසාධනය |
| | හඳුනාගත් විශේෂඅවස්ථාවලදී අවශ්‍ය මූල්‍යාධාර හා උපකරණ ලබා දීම. | 23 | 25 | ආයු අපේක්ෂාව වැඩිවීම හා සුභසාධනය |
| අඩු ආදායම්ලාභී පවුල් ඒකකවල ජීවනෝපාය සංවර්ධනය | ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම | 807 | 800 | විරැකියාව අඩු වීම<br>දුගී බව තුරන්වීම |
| රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සැළසීම. | වැඩිහිටි නිවාස පිහිටුවීම,පවත්වා ගැනීම හා අධීක්ෂණය | 02 | 02 | සමාජ සුභසාධනය හා සමාජ ආරක්ෂණය තහවුරු වීම |
| | විශේෂ අවස්ථා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන හා රැකවරණ ආයතන පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය. | 05 | 05 | සමාජ සුභසාධනය හා සමාජ ආරක්ෂණය තහවුරු වීම |
| වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ඉහළ නැංවීම පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහිකිරීම. | වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත පුද්ගලයන් හා ගෘහමූලික කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සුභසාධනය ඉහළ නැංවීමට ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම | 20 | 20 | සමාජ ආරක්ෂණය හා සුභසාධනය වැඩිදියුණු වීම |
| වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා සංවිධාන ව්‍යුහය ශක්තිමත්ව පවත්වා ගෙන යාම. | වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත හා ගෘහමූලික කාන්තා නව සංවිධාන ආරම්භ කිරීම , රැස්වීම් කැඳවීම හා යටිතල පහසුකම් සැපයීම. | 07 | 07 | සංවිධාන ව්‍යුහය ශක්තිමත් වීම මඟින් සුභසාධනය ඉහල යාම |
| වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ දැනුම,කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම හා ඇගයීම | දැනුම කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමේ හා ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම | 324 | 324 | මානසික තෘප්තිය වර්ධනය |
| සමාජ විරෝධී ක්‍රියාකාරකම් වල නිරත හා දුරාචාරයන් වලට ඇබ්බැහි වූවන් එම චර්යාවන්ගෙන් වළක්වා ගැනීම | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම. | 05 | 06 | මත්ද්‍රව්‍ය උවදුරෙන් තුරන්වීම |
| ආපදා තත්වයන්ට පෙර සූදානම හා හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහි කිරීම. | ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම. | 12 | 12 | අනතුරු අවම වීම |
| දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය ඉහළ නැංවීම. | දෙපාර්තමේන්තුවේ ආයතනික පරිපාලනය හා කළමණාකරණය | 04 | 04 | ආයතනයේ කාර්යක්ෂමතාව ඉහල යාම |
| දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ආකල්ප හා ධාරිතාවය සංවර්ධනය කිරීම. | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 02 | 02 | යහපත් ආකල්ප සහිත කාර්යක්ෂම නිළධාරින් පිරිසක් බිහිවීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව සතුව පවතින ප්‍රධානම ආයතනය වන්නේ සාලියපුර ශාන්ති සෙවණ වැඩිහිටි නිවාසයයි. දැනට එය මෙම පළාතේ පමණක් නොව මුළු දිවයිනම ආවරණය වන පරිදි රැකවරණය අහිමි වැඩිහිටියන් සඳහා නේවාසික පහසුකම් ලබා දෙන දිවයිනේ විශාලතම වැඩිහිටි නිවාසය වන අතර මෙම ආයතනයේ පවතින යටිතල පහසුකම් තවදුරටත් වැඩි කිරීම අත්‍යවශ්‍ය කාර්යයකි.

සාමාන්‍යයෙන් එහි නේවාසික පහසුකම් ලබා දිය හැකි සංඛ්‍යාව 250ක් පමණ වුවත් වර්තමානයේදී එම සංඛ්‍යාව 300 ද ඉක්මවා තිබීම මෙහිදි විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. එහිදි එම ආයතනයේ පවතින පැරණි ගොඩනැගිලි වන කොරිඩෝ, වාට්ටු, කෑම ශාලා හා කාර්ය මණ්ඩල නේවාසිකාගාර දීර්ඝ කාලයකින් අළුත්වැඩියා සිදුකර නොමැති බැවින් එහි කාර්ය මණ්ඩලය හා නේවාසිකයින්ට පහසුවක් සැලසෙන ආකාරයෙන් ද එම ගොඩනැගිලිවල වටිනාකම අඩු නොවී පවත්වා ගැනීම සඳහාද අත්‍යවශ්‍ය අළුත්වැඩියා කිරීම් සිදු කළ යුතුව ඇත. ඒ සඳහා ආසන්න වශයෙන් 2020 වසරට රු.මිලියන 18ක පමණ මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කිරීමට අපේක්ෂා කරන අතර, අභ්‍යන්තර විදුලි පද්ධතිය ක්‍රමවත් කිරීමද මෙහිදි සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

නේවාසිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය, ආධ්‍යාත්මික සංවර්ධනය වාසය කිරීමේ පහසුව සඳහා ද ආයතනයට පැමිණෙන විවිධ පාර්ශවයන්ගේ පහසුව සඳහා ද ආයතනික පරිපාලනය විධිමත් කිරීම සඳහා ද කාර්ය මණ්ඩල සුභසාධනය ඉහළ නැංවීම සඳහා ද දේපලවල ආරක්ෂාව සැපයීම සඳහා ද පහසු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ද නවීන තාක්ෂණය කැටි කොට අවම පිරිවැයක් සහිත ක්‍රමවේද හඳුන්වා දීම ද 2020 වසරේ සිදු කිරීමට අපේක්ෂා කර ඇත.

ඒ සඳහා අවශ්‍ය ව්‍යුහයන් වන භාවනා මධ්‍යස්ථානයක්, ජල අපවහන පද්ධතියක්, සනීපාරක්ෂක පද්ධතියක් , ප්‍රධාන ශාලාවට හා කාර්යාලයට අවශ්‍ය සවි කිරීම්, ප්‍රධාන ගේට්ටුව, මුරකුටිය සහ පිළිගැනීමේ ස්ථානයක්, අධිකාරී නිල නිවාසය සඳහා මුළුතැන්ගෙයක්, ලේඛනාගාරයක්, පුස්තකාලයක්, කාර්ය මණ්ඩල විවේකාගාරයක්, නව ආපන ශාලාවක් ඉදි කිරීමටත්, සූර්යකෝෂ විදුලි පහන් පද්ධතියක් ඉදිකිරීමටත් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘති සඳහා රු. මිලියන 35 ක් පමණ වෙන් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

බුල්නෑව වැඩිහිටි නිවාසයේ නේවාසික සංඛ්‍යාවද ක්‍රමයෙන් ඉහළ යන බව නිරීක්ෂණය වන බැවින් පැරණි වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීමටත් ලබා දී ඇති ත්‍රීවිලර් රථය සඳහා නැවතුම් ස්ථානයක් ඉදි කිරීමටත් කාර්ය මණ්ඩල නේවාසිකාගාරයක් ඉදි කිරීමටත් රු. මිලියන 12 ක් පමණ වෙන්කර ගැනීමට සැලසුම් කර ඇත.

මීට වසර කිහිපයකට පෙර ඉදි කර ඇති ඇලගමුව ආබාධිත වෘත්තීය පුහුණු ආයතනයේ නව ගොඩනැගිල්ල සඳහා විදුලි ජේනු පද්ධතියක් සවිකිරීම කළ යුතුව ඇති බැවින් ඒ සඳහා රු. මිලියන 01 කුත්, සාලියපුර වැඩිහිටි නිවාසයේ අත්‍යවශ්‍ය සේවාවන් සිදු කර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර මිල දී ගැනීමට රු.මිලියන 05 කුත්, ඒ සඳහා අවශ්‍ය ගෘහ හා කාර්යාල උපකරණ මිල දී ගැනීමට රු.මි. 05 කුත් වශයෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමද අපේක්ෂා කෙරේ.

කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන නොකඩවා සිදු කළ යුතු බැවින් ඉහත ව්‍යාපෘතිවලට අමතරව ඒ සඳහා රු.මිලියන 0.5 ක්ද දැනට ක්‍රියාත්මක කිරීමට සූදානම් කර ඇති මහජනාධාර ජාලගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අත්‍යවශ්‍ය උපකරණ මිල දී ගැනීමට රු.මිලියන 03 ක් ද වෙන් කර ගැනීමට යෝජනා කර ඇත. අඩු ආදායම්ලාභී, වැඩිහිටි ආබාධිත හා ගෘහ මූලික කාන්තා නිවාස ඉදි කිරීමට ඉල්ලීම් ඉදිරිපත් විය.

ඒ අනුව මිතුරු සෙවණ ව්‍යාපෘතියට රු.මිලියන 01 ක්ද වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන නවීකරණයට තවත් රු.මිලියන 01 ක්ද වෙන් කර ගැනීම සැලසුම් කර ඇති අතර, පළාතේ ප්‍රධාන පෙලේ පාසල්වල වැඩිහිටි  දුවා දරුවන්ගේ වැඩිහිටියන් පිළිබඳව පවතින ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරන වියැකෙන ගුණදම් පුබුදමු නැණසින් වැඩසටහනට රු.මිලියන 01 ක් ද ආබාධිත හා ගෘහ මූලික කාන්තා ස්වයං රැකියා වැඩසටහනට රු.මිලියන 14 ක්ද යෙදවීමට අපේක්ෂා කර ඇත.

2020 වසර සඳහා යෝජනා කර ඇති ඉහත වැඩසටහන් කුමක්වුව ලැබෙන සත්‍ය මූල්‍ය ප්‍රතිපාදනය මත පදනම්ව එම ව්‍යාපෘති ප්‍රමුඛතාගතකරණය කරගනිමින් ලැබෙන ප්‍රතිපාදන සීමාව තුළ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

2019 වර්ෂයේ දෙපාර්තමේන්තු කාර්ය සාධන ළඟා කර ගැනීමේ දී පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 517ක මුදලක් වෙන්ව තිබූ අතර වසර අවසන් වන විට දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන ස්වාභාවයන් සහිත සියළු වියහියදම් එම ප්‍රතිපාදන සීමාව තුළ පියවා ගැනීමට හැකි විය. විශේෂයෙන් සුභසාධන වැය විෂය යටතේ දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ සියළු මූල්‍යාධාර ඉල්ලුම්පත් සඳහා එම ආධාර මුදල් හා උපකරණ ආධාර අදාල ප්‍රතිලාභීන් වෙත ලබා දී අවසන් කිරීමට හැකි විම විශේෂයෙන් සඳහන් කල යුතුය.

දෙපාර්තමේන්තු ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 69 ක් වෙන්ව තිබූ අතර එයින් 25%ක් අවුරා තැබීමට සිදු වූ බැවින් එම ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 51.75 ක් දක්වා සීමා කිරීමට සිදු වුවත් ඊට අදාලව සංවර්ධන ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කරන ලදි. ඒ සඳහා දරනු ලැබූ වියදම රුපියල් මිලියන 47.28 වූ අතර සංවර්ධන ව්‍යාපෘතිවලින් ක්‍රියාකාරකම් 3ක් හැර ඉතිරි සියලු ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් අවසන් කිරිමට හැකිවිය.ඒ අනුව අවිච්ඡේද ව්‍යාපෘති යටතේ ක්‍රියාකාරකම් ගණන 3ක් වන අතර අවිච්ඡේද වටිනාකම රුපියල් මිලියන 1.09 කි. නිසි කලට ඉංජිනේරු ඇස්තමේන්තු දෙපාර්තමේන්තුව වෙත ලැබුනේනම් ව්‍යාපෘති අවිච්ඡේද වීමකින් තොරව අවසන් කිරීමට තිබූ බව මෙහිලා සඳහන් කළ යුතුය.

දෙපාර්තමේන්තුව වෙත 2019 වසරේ ලැබුණු රුපියල් මිලියන 517 ක පුනරාවර්තන මූල්‍ය ප්‍රතිපාදන, රුපියල් මිලියන 51.75 ක ප්‍රාග්ධන මූල්‍ය ප්‍රතිපාදන යන මූල්‍ය සම්පත්ද දෙපාර්තමේන්තුව සතු වැඩිහිටි නිවාස හා අනෙකුත් ආයතනවලට අදාලව භෞතික සම්පත් ද දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂයේ සේවය කරන ලද 122 ක කාර්යය මණ්ඩලය අයත් මානව සම්පතද යොදවා ප්‍රධාන කාර්යයන් ඔස්සේ දෙපාර්තමේන්තුවේ දිගු කාලින හා කෙටි කාලින අරමුණු ළඟා කරගනිමින් ප්‍රශස්ත කාර්ය සාධනයක් ළඟාකර ගැනීමට හැකි වූ බව සඳහන් කළ හැක.

# 09. ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

## ආයතන පිළිබඳ මූලික තොරතුරු

ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය පළාත් සභා පිහිටුවීමට පෙර මධ්‍යම රජයේ සමුපකාර අමාත්‍යාංශය යටතේ සමුපකාර අමාත්‍යවරයා යටතේ ප්‍රාදේශීය කාර්යාලයක් වශයෙන් පැවති අතර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව පළාත් සභා ආරම්භ කිරීමත් සමඟ උතුරු මැද පළාතේ සමුපකාර අමාත්‍යාංශය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවන ලදී.

මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වන්නේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවයි.

## පළාත් ව්‍යවස්ථාපිත ආයතන

ව්‍යවස්ථාපිත ආයතන ලෙස පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, සමුපකාර සේවක කොමිෂන් සභාව යන ආයතන ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ වේ.

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

පළාත් සභා පිහිටුවීමට පෙර මධ්‍යම රජයේ සමුපකාර අමාත්‍යාංශය යටතේ සමුපකාර කොමසාරිස්වරයා යටතේ ප්‍රාදේශීය කාර්යාලයක් වශයෙන් පැවති අතර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව පළාත් සභා ආරම්භ කිරීමත් සමග උතුරු මැද පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව ආරම්භකර අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක සඳහා සහකාර කොමසාරිස් කාර්යාල දෙකක් ද ආරම්භකර පාලන කටයුතු සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුව මගින් සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට හා ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම.

## පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වෙනි පරිච්ඡේදය අනුව කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත.ඒ හා සමාන බලතල අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවද පිහිටුවා ඇත. තවද,1987 ට පෙර මධ්‍යම රජය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තු දෙක පළාත් සභා පිහිටුවීමෙන් පසුව පළාත් සභාව යටතට බලය පවරන ලදී. එසේ පළාත් සභා පිහිටුවීමෙන් පසුව 2003 වර්ෂයේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තු හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව එක්කොට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් මෙම දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත.

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02 න් සමන්විත වේ. මෙම දෙපාර්තමේන්තුව 1987 අංක 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තිය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. කෘෂිකර්ම හා සත්ත්ව පාලන අමාත්‍යාංශය වෙනම ඒකකයක් වශයෙන් පිහිටුවා තිබුණි.

මෙම දෙපාර්තමේන්තුව 1987 වර්ෂයේ සිට අනුරාධපුර කච්චේරි භූමිය සහ පොළොන්නරුව දිස්ත්‍රික් කච්චේරි භූමිය තුළ ආරම්භ වී අනුරාධපුර පළාත් කාර්යාලය වශයෙන් ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයක් වශයෙන් ද පිහිටුවිය.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 29 ක් ආවරණය වන පරිදි බල ප්‍රදේශය විශාල වීමත්, කාර්යය බහුල වීමත් නිසා 1989 ජුනි 01 වන දින වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. පළාතේ ක්‍රීඩා පරිපාලනය හා සංවර්ධන කටයුතුවලට ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සල්ගාදු ක්‍රීඩාංගන භූමියේ 2004 අප්‍රේල් 27 වන දින සිට නව පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කරන ලදි. එතැන් සිට අද දක්වා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව එම භූමියේ පිහිටා තිබේ.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වනුයේ උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හා සහජ දක්ෂතාවලින් හෙබි ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගනිමින් ඔවුනට මනා ක්‍රීඩා පුහුණුවක් ලබාදීම,හඳුනා ගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ජාතික හා ජත්‍යාන්තරය ජය ගත හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් බිහි කිරිමයි.

## පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ ලියාපදිංචිකර ඇති වාහන සඳහා පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් හෝ පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ආදායම් බලපත්‍රය ලබා ගැනීමට e-RL -1 වැඩ සටහන යටතේ කටයුතු කර ඇත. මෙය තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ලංකාවේ ඕනෑම පළාතකින් තම වාහනය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හැකිවන පරිදි ,වාහන ආදායම් බලපත්‍ර ලබාදීමේ මෘදුකාංගය වැඩිදියුණු කර ඇත.

2020 වසරේදී e-RL -11 අදියර ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය වසර හතරක ව්යාපෘතියක් ලෙස සැලසුම් කර ඇති අතර, දැනටමත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.

## සමූපකාර සේවක කොමිෂන් සභාව.

1994 අංක 09 දරණ ප්‍රඥප්තිය අනුව (NCP/PC/FC/4/4/ප්‍රඥප්තිය /2 හා 1996.01.19 දිනැති ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි) උතුරු මැද පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. එම ප්‍රඥප්තියට අනුව රෙගුලාසි සකස් කර ගැසට් පත්‍රයේ පළ කරන තෙක් ,1972 අංක 12 දරණ සමූපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි අනුව කටයුතු කිරිමට උතුරු මැද පළාත් සමූපකාර අමාත්‍යාංශ ලේකම්ගේ 1994.10.03 දිනැති ලිපියෙන් ලබාදී ඇති අනුමැතිය අනුව මෙහි කටයුතු අරඹා ඇත. 1994 අංක 09 දරණ උතුරු මැද පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ වූ රෙගුලාසි 1273/8 – 2003/01/27 දින දරන විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත.

## කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

2003 දෙසැම්බර් මස 11 වන දින 2003 අංක 2 දරණ උතුරු මැද පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය මගින් ආරම්භ කරන ලදි. ඒ අනුව පළාතේ සියළුම නව කර්මාන්ත බිහි කිරිම සහ පවත්නා කර්මාන්තවල ප්‍රවර්ධනයක් ඇති කිරිම, මෙම අධිකාරියේ අරමුණ වේ.

## මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභාවලට ලැබී ඇති බලතල මත පළාත තුළ පොදු ප්‍රවාහන කටයුතු නියාමනය කිරීම සඳහා උතුරු මැද පළාත් සභාව මගින් 1994 අංක 8 දරණ ප්‍රඥප්තිය සම්පාදනය කර අනුමත කර ඇත. එසේ අනුමත කරන ලද ප්‍රඥප්තිය මගින් ලැබී ඇති බලය මත 2000.01.01 දින සිට උතුරු මැද පළාත් මගී ප්‍රවාහන අධිකාරිය ස්ථාපිත කර ඇත.එතැන් සිට ඉහත ප්‍රඥප්තියට අනුව පොදු මගී ප්‍රවාහන කටයුතු නියාමනය කරන ලදී. ඉහත ප්‍රඥප්තියේ යම් යම් අඩුපාඩුකම් පැවති හෙයින් 2014 පෙබරවාරි මස අංක 1850 දරණ අංක 03 දරණ සංශෝධිත ප්‍රඥප්තියක් ඇති කර ඒ තුළින් අධිකාරියේ, පාලන අධිකාරියේ පාලන ව්‍යුහයද මගී ප්‍රවාහනය යන්න වෙනස්කර භාණ්ඩ හා වෙනත් ප්‍රවාහන යනුවෙන් සංශෝධනය කර මේ දක්වා ක්‍රියාත්මක වේ.

මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය අරමුණ වනුයේ  බස් රථ, ත්‍රී රෝද රථ ඇතුළු මගී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය ,ආරක්ෂිත හා ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම, බස්නැවතුම්පල කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය ආදී කරුණු ප්‍රධාන වන අතර එමගින් ජාතික ආර්ථිකයට මනා දායකත්වයක් ලබා දෙයි.

### ආදායම් බලපත්‍ර නිකුත් කරන ලද වාහන සංඛ්‍යාව

| වාහන | 2015 | 2016 | 2018 |
|---|---|---|---|
| යතුරු පැදි | 193,774 | 211,301 | 221618 |
| ත්‍රිවිල් | 56,413 | 58,961 | 55096 |
| බස් | 924 | 878 | 722 |
| ලොරි | 120,610 | 11,941 | 11343 |
| ද්වි කාර්ය වාහන | 21,174 | 23,602 | 23335 |
| විශේෂ කාර්ය වාහන | 18 | 62 | 02 |
| අවමංගල / ගිලන් රථ | 17 | 12 | 10 |
| කාර් | 16,181 | 18,454 | 19450 |
| මෝටර් කෝච් | 809 | 915 | 1030 |
| ඉඩම් වාහන | 9,443 | 10,871 | 8450 |
| ටෙලර් | - | 329 | 2189 |
| **එකතුව** | **419,363** | **337,326** | **343245** |

### ප්‍රවාහන තොරතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොලවල් (14) | සංසරණය වන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණය වන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| අනුරාධපුර (පැරණි) | 90 | 2,700 |
| අනුරාධපුර (නව) | 65 | 1,950 |
| අනුරාධපුර (දුර සේවා) | 175 | 5,250 |
| කැකිරාව | 50 | 1,500 |
| තඹුත්තේගම | 50 | 1,500 |
| ගල්නෑව | 30 | 900 |
| ගල්කිරියාගම | 9 | 200 |
| හොරොව්පොතාන | 30 | 900 |
| කහටගස්දිගිලිය | 19 | 570 |
| මිහින්තලේ | 70 | 1300 |
| මැදවච්චිය | 12 | 360 |
| කැබිතිගොල්ලෑව | 50 | 1,000 |
| නොච්චියාගම | 35 | 1,050 |
| ගලෙන්බිඳුණුවැව | 35 | 1,050 |
| **එකතුව** | **720** | **20,230** |

උප බස් නැවතුම්පොළවල් - 13

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොළවල් (8) | සංසරණයවන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණයවන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| හිඟුරක්ගොඩ | 69 | 2,700 |
| කදුරුවෙල | 220 | 6,600 |
| මැදිරිගිරිය | 16 | 480 |
| බකමූණ | 18 | 540 |
| වැලිකන්ද | 09 | 270 |
| සිරිපුර | 40 | 500 |
| මින්නේරිය | 105 | 950 |
| **එකතුව** | **477** | **12,040** |

උප බස් නැවතුම්පොළවල් - 09

## ලියාපදිංචි ප්‍රවාහන සේවා පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 1 | මගී ප්‍රවාහන බස් රථ | 770 |
| 2 | පාසැල් ප්‍රවාහන බස් රථ | 14 |
| 3 | සිසු සැරිය බස් රථ | 98 |
| 4 | භාණ්ඩ ප්‍රවාහන රථ | 56 |
| 5 | ත්‍රී රෝද රථ | 1800 |
| 6 | කාර්යාල සේවා බස් රථ | 02 |

## දැක්ම

"අභිමානවත් සමාජයක්, ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත අංශ සඳහා සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරිමේ ආයතන නිසි පරිදි නියාමනය කිරිම".

## දිගුකාලීන අරමුණු

- කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ ආයතන පද්ධතියක් ඇති කිරීම.
- තෘප්තිමත් පාරිභෝගික හා වෙළඳ ප්‍රජාවක් ඇති කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීමය රැකියා අවස්ථා ළඟා කර දීම හා ඔවුන්ගේ යහගුණ ආකල්ප සංවර්ධනය කිරීම.
- පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය තුළින් කර්මාන්තකරුවන්ගේ ආර්ථිකමය හැකියාවන් වර්ධනය හා ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධනය කිරිම.

## කෙටිකාලීන අරමුණු

- ආහාර භාවිතයේ වැදගත්කම පිළිබඳ ජනතාව තුළ නිවැරදි මතයක් නිර්මාණය කිරීම.
- රැකියා විරහිතව සිටින තරුණ ප්‍රජාව සඳහා රැකියා ඉලක්ක කර ගැනීම.
- පළාතේ තරුණ ප්‍රජාව තුළ ගුණාත්මක ආකල්ප සංවර්ධනය කිරිම.
- ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම හා අභිප්‍රේරණය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමේ ආයතන නියාමනය
- වෙළඳ හා ආහාර සහ යෞවන කටයුතු විෂය යටතේ සංවර්ධනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- යහපාලනයට දායක වීම

## උපාය මාර්ගයන්

ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ආයතනික කටයුතු මෙහෙය වීමෙන් සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම මඟින් පළාතේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

| දරිද්‍රතාවයෙන් තොරවීම | නීරෝගී බව සහ යහපැවැත්ම | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | වගකීමෙන් යුතු පාරිභෝජනය සහ නිෂ්පාදනය |
|---|---|---|---|




## කාර්යය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත | 37 |
| සේවයේ නියුතු | 32 |
| පුරප්පාඩු | 05 |
| අනියම් | 01 |

## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය(රු.මි.) | උපයෝජනය(%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 19.39 | 19.23 | 0.16 | 99.16 |
| ගමන් වියදම් | 0.55 | 0.54 | 0.003 | 99.62 |
| සැපයීම් | 1.79 | 1.71 | 0.086 | 95.20 |
| නඩත්තු වියදම් | 2.48 | 1.45 | 1.03 | 58.79 |
| ගිවිසුම්ගත සේවා | 0.58 | 0.33 | 0.25 | 56.89 |
| මාරු කිරීම් | 54.36 | 54.27 | 0.09 | 99.83 |
| ගිවිසුම්ගත සේවා ( අමාත්‍යවරයා) | 3.03 | 0.02 | 3.008 | 0.73 |
| **එකතුව** | **82.18** | **77.55** | **4.63** | **94.36** |

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 5.10 | 4.82 | 0.28 | 94.44 |
| ගමන් වියදම් | 0.09 | 0.05 | 0.04 | 55.55 |
| සැපයීම් | 0.70 | 0.39 | 0.31 | 55.71 |
| නඩත්තු වියදම් | 0.22 | 0.15 | 0.07 | 68.18 |
| ගිවිසුම්ගත සේවා | 3.03 | 1.43 | 1.60 | 47.19 |
| **එකතුව** | **9.14** | **6.84** | **2.38** | **74.83** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජන (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම | 4.00 | 3.89 | 0.11 | 97.25 |
| වාහන | 0.20 | 0.08 | 0.12 | 40 |
| *මූලධන වත්කම් අත්පත් කර ගැනීම* | | | | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.40 | - | 0.40 | - |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.40 | 0.39 | 0.01 | 97.5 |
| වෙනත් මූලධන වියදම් | | | | |
| වෙළඳ හා ආහාර | 3.00 | 1.83 | 1.17 | 61 |
| යෞවන කටයුතු | 1.00 | 0.77 | 0.23 | 77 |
| බස්නැවතුම්පළවල් නඩත්තුව හා සංවර්ධනය කිරීම | 5.79 | 3.38 | 2.41 | 58.37 |
| මගී ආවරණය නඩත්තුව හා සංවර්ධනය | 1.88 | 1.79 | 0.09 | 95.21 |
| බස්නැවතුම්පලවල පොදු දැන්වීම් පුවරු සැකසීම | 1.03 | 0.98 | 0.05 | 95 |
| තඹුත්තේගම බස් නැවතුම්පල සංවර්ධනය (1වන අදියර) | 12.33 | 7.69 | 4.64 | 62.36 |
| **එකතුව** | **30.03** | **20.80** | **9.23** | **69.26** |

## මූලධන වියදම් -මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව-(640-03-04)

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන (රු.මි.) | 2019 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය (රු.මි.) |
|---|---|---|---|
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | |
| විද්‍යුත් ආදායම් බලපත්‍ර නිකුත් කිරිම | 1.78 | - | 1.78 |

## මූලධන වියදම් - ප්‍රවාහන (640-52-05)

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන (රු.මි.) | 2019වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජන (%) |
|---|---|---|---|---|
| **ධාරිතා සංවර්ධනය** | | | | |
| 1.දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 1,000,000.00 | 316,927.00 | 683,073.00 | 31.69 |
| **වෙනත් මූලධන වියදම්** | | | | |
| 1.බස්නැවතුම්පලවල් නඩත්තුව හා සංවර්ධනය | 2,968,202.00 | 2,550,334.43 | 417,867.57 | 85.92 |

## අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු,ඉලක්ක හා නිමවුම් දර්ශක

<table>
<tr><th rowspan="2">තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශකය</th><th rowspan="2">පළාත් නිමවුම් දර්ශක</th><th colspan="2">ආයෝජන (රු.මි)</th></tr>
<tr><th>ඉලක්ක</th><th>ප්‍රගතිය</th></tr>
<tr><td colspan="4">01. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම</td></tr>
<tr><td>1.අ.1දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා රජය විසින් වෙන්කර ඇති දේශීය වශයෙන් ජනනය කරන ලද සම්පත් ප්‍රමාණය<br>1.අ.3 දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා සෘජුව වෙන්කර ඇති සමස්ත මූල්‍ය ප්‍රදානයන්ගේ සහ ණය නොවන මූලාශ්‍රවල මුළු එකතුව</td><td>උතුරු මැද පළාතේ දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා අමාත්‍යාංශය විසින් වෙන්කර ඇති සම්පත් ප්‍රමාණය<br><br>උතුරු මැද පළාතේ දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා සෘජුව වෙන්කර ඇති සමස්ත මූල්‍ය ප්‍රදානයන්ගේ සහ ණය නොවන මූලාශ්‍රයන්වල මුළු එකතුව</td><td rowspan="3">0.76</td><td rowspan="3">0.76</td></tr>
<tr><td colspan="2">08- සියල්ලන් සඳහාම පෝෂිත ,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය,පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය</td></tr>
<tr><td>8.1.1 සත්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ වාර්ෂික වර්ධනය</td><td>ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය සඳහා උතුරු මැද පළාතේ දායකත්වය</td></tr>
<tr><td colspan="2">03.නිරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය</td><td rowspan="4">1.83</td><td rowspan="4">1.83</td></tr>
<tr><td>3.4.1 හෘද නාල ආශ්‍රිත රෝග,පිළිකා,දියවැඩියාව හෝ නිදන්ගත රෝග හේතුවෙන් මිය යන ප්‍රමාණය</td><td>උතුරු මැද පළාතේ හෘද නාල ආශ්‍රිතරෝග,පිළිකා,දියවැඩියාව හෝ නිදන්ගත රෝග හේතුවෙන් මිය යන ප්‍රමාණය</td></tr>
<tr><td colspan="2">12.තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම</td></tr>
<tr><td>12.2.2 දේශීය භාණ්ඩ පරිභෝජනය ,ඒක පුද්ගල දේශීය භාණ්ඩ පරිභෝජනය සහ දළ දේශීය නිෂ්පාදනයට අනුව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය</td><td>උතුරු මැද පළාතේ දේශීය භාණ්ඩ පරිභෝජනය ,ඒක පුද්ගල දේශීය භාණ්ඩ පරිභෝජනය සහ දළ දේශීය නිෂ්පාදනයට අනුව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය</td></tr>
</table>

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්ක | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයෝජන (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 සහ 08. | 1.(අ)සහ 8.1. | 8.1.1 | බරවාහන රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා තරුණයින් පුහුණු කිරීම | 0.38 | 0.38 |
| 01 සහ 08. | 1.(අ)සහ 8.1. | 8.1.1 | ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු පාඨමාලාව | 0.38 | 0.38 |
| 01,03 සහ12. | 1.(අ) ,3.4 සහ 12.2 | 1.අ.1 ,3.4.1සහ 12.2.2 | මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා නවීන උපකරණ ලබාදීම. | 1.83 | 1.83 |
| 09 | 9.(ඇ) | 9.(ඇ)1 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම. | 0.39 | 0.39 |
| 11 | 11.2 | 11.2.1 | තඹුත්තේගම බස් නැවතුම්පළ 1 අදියරය වැඩ අවසන් කිරීම සහ භූමිය සකස් කිරීම | 8.85 | 7.68 |
| 11 | 11.2 | 11.2.1 | අනුරාධපුර පැරණි බස් නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 0.83 | 0.83 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන/ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01.බරවාහන රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා තරුණයින් පුහුණු කිරීම | 50% දායකත්වය මත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් බරවාහන රියදුරු පුහුණුව සඳහා තරුණයින් යොමු කිරීම | 53 | පොදු |
| 02.ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු පාඨමාලාව | 50% දායකත්වය මත ඉදිකිරීම් යන්ත්‍ර පුහුණුව ලබාදීම. | 23 | පොදු |
| 03.මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා නවීන උපකරණ ලබාදීම. | 10% දායකත්වය මත උපකරණ ලබාදීම. | 26<br>මැටි පහන් අච්චු-30 | තිරප්පනය |
| 04. අමාත්‍යාංශ ලේකම් නිල නිවස අළුත්වැඩියා කිරීම හා කාර්යාලය අළුත්වැඩියා කිරීම | ආයතනික ධාරිතා සංවර්ධනය | නිවස-01<br>පිරිස-07 | නැ.නු.ප |
| 05. තඹුත්තේගම බස්නැවතුම්පළ1 අදියරය වැඩ අවසන් කිරීම සහ භූමිය සකස් කිරීම | මහජනයා සඳහා පහසුකම් සැපයීම | පොදු | තඹුත්තේගම |
| 06. අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ සනීපාරක්ෂක පද්ධතිය අළුත්වැඩියා කිරීම. | මහජනයා සඳහා පහසුකම් සැපයීම | පොදු | නැ.නු.ප |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනිම සඳහා උතුරු මැද පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින් ලෙස බරවාහන රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා තරුණයින් පුහුණු කිරීම, ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු පාඨමාලාව, මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා නවීන උපකරණ ලබාදීම, අමාත්‍යාංශ ලේකම් නිලනිවස අළුත්වැඩියා කිරීම හා කාර්යාලය අළුත්වැඩියා කිරීම, තඹුත්තේගම බස් නැවතුම්පළ පළමු අදියර වැඩ අවසන් කිරිම සහ භූමිය සකස් කිරිම ද අනුරාධපුර පැරණි බස් නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරිම යන ව්‍යාපෘතින් දැක්විය හැකිය.

තිරසර අරමුණුවල පළමු අරමුණ වන සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම සහ අටවන අරමුණ වන සියල්ලන් සඳහාම පෝෂිත ,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය යන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා උතුරු මැද පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින් ලෙස බරවාහන රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා තරුණයින් පුහුණු කිරීම සහ ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු පාඨමාලාව පැවැත්වීම සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස බරවාහන රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා තරුණයින් 53 දෙනෙකු පුහුණු කිරීම සහ ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු පාඨමාලාව සඳහා තරුණයින් 23 දෙනෙකු පුහුණු කිරිම් සඳහා යොමු කිරිම දැක්විය හැකිය.ඒ අනුව මෙම පුහුණුලාභින් දෙස් විදෙස් රැකියා අවස්ථා සඳහා යොමු වීම තුළින් එම තරුණයින් සහ ඔවුන්ගේ පවුල්වල යැපෙන්නන්ගේ ආර්ථිකය ශක්තිමත් විම තුළින් සියළු තැන්හි පවත්නා දුගී බව අවසන් කිරීමට යම් තාක් දුරට එය ඉවහල් වනු ඇත.

මෙහි තිරසර සංවර්ධන ඉලක්කය වනුයේ "විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා සියළුම ආකාරයේ දරිද්‍රතාවයන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රම සම්පාදනය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබාදීම කැපී පෙනෙන ආකාරයෙන් අවශ්‍ය සම්පත් ලබාදීම" යි. මෙම ඉලක්ක සපුරා ගැනීමට ඉහත ව්‍යාපෘති දෙක සඳහා උතුරු මැද පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය විසින් රුපියල් 769,284.56 ක මූල්‍යමය දායකත්වය ලබා දී ඇත.

පළමු තිරසර සංවර්ධන අරමුණ වන සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම, තුන් වන අරමුණ වන නිරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ දොළොස්වන අරමුණ වන තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම යන අරමුණු පෙරදැරිව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

ඒ යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් ලෙස මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා නවීන උපකරණ ලබාදීම දැක්විය හැකිය.මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රතිලාභින් 56 දෙනෙකු සඳහා ප්‍රතිලාභ හිමි කර දී ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ සාම්ප්‍රදායික මැටි නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින ග්‍රාමීය අත්කම් නිෂ්පාදනකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍යවන තාක්ෂණික මෙවලම් (විදුලි සකපොරු ,මැටි පහන් අච්චු) 50% ක ප්‍රතිලාභී දායකත්වය මත ලබා දිමට 2016/01 මුදල් කොමිෂන් සභා චක්‍ර ලේඛය යටතේ උපදෙස් ලැබී තිබුනද ප්‍රතිලාභින් විසින් 50% ක් ගෙවීමට අපහසු බව පවසා ඉදිරිපත් කළ ඉල්ලීම් ලිපිය අනුව මුදල් කොමිෂමෙන් කරන ලද ඉල්ලීමට අනුව 10% ප්‍රතිලාභි දායකත්වය මත විදුලි සකපෝරු 26 ක් හා මැටි පහන් අච්චු 30 ක් තිරප්පනේ පණ්ඩිත රඹෑවට ලබා දෙන ලදී.

එමගින් උතුරු මැද පළාතේ මැටි භාණ්ඩ භාවිතය ප්‍රචලිත කිරිමට අපේක්ෂා කෙරෙන අතර මෙහි තිරසර සංවර්ධන ඉලක්කය වනුයේ , 2030 වනවිට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමණාකරණය කිරීම සහ කාර්යක්ෂම භාවිතා කිරීම වෙත ළඟා වීමයි.

එම ඉලක්ක සපුරා ගැනීමට ඉහත ව්‍යාපෘතිය උතුරු මැද පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය විසින් රුපියල්1,835,100.00ක මුල්‍යම දායකත්වය ලබා දී ඇත. මෙමඟින් එම ව්‍යාපෘතින්හි උතුරු මැද පළාතේ හෘද නාල ආශ්‍රිත රෝග,පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත රෝග හේතුවෙන් මිය යන ප්‍රමාණය යම්තාක් දුරට අඩුකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවද උතුරු මැද පළාතේ ජනතාව දේශීය භාණ්ඩ පරිහරණය කිරීමට නැඹුරු වීම හේතුවෙන් දේශීය නිෂ්පාදන ඉහළ යෑම මඟින් රටෙහි දළ දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීමෙහිලා ඔවුන්ගේ සෘජු දායකත්වයක් සැපයෙනු ඇත.

තිරසර සංවර්ධන අරමුණුවල එකොළොස්වන අරමුණ වන නගර සහ ජනවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම යන අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක වූ ව්‍යාපෘතින් ලෙස තඹුත්තේගම බස් නැවතුම්පළ පළමු අදියරය වැඩ අවසන් කිරිම සහ භූමිය සකස් කිරිම ද අනුරාධපුර පැරණි බස් නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරිම යන ව්‍යාපෘතින් දැක්විය හැකිය. මෙමඟින් ජාතික සහ කලාපීය සංවර්ධන සැළසුම් ශක්තිමත් කිරිම මගින් නාගරික, උපනාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ධනාත්මක ආර්ථික සමාජයීය සහ පරිසරාත්මක සම්බන්ධතාවලට සහාය දැක්වීම යන ඉලක්ක සපුරා ගැනීම අපේක්ෂා කෙරේ.ඒ අනුව මෙම ඉලක්ක සපුරා ගැනීමට ඉහත ව්‍යාපෘතින් සඳහා උතුරු මැද පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය විසින් රුපියල්.8,527,760.83 මුල්‍යම දායකත්වය ලබා දී ඇත.

## කාර්ය සාධන ඉලක්ක - 2019

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | වියදම්/ ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 01 | අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සම්බන්ධීකරණය | දැනුවත් කිරීම් රැස්වීම් ගණන | වැඩසටහන් 02 | - | - | - |
| 02 | ජනතාව තුළ මැටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම තුළින් දිළිඳු බව තුරන් කිරීම සඳහා දායක වීම .ජනතාව තුළ යහපත් සෞඛ්‍ය,යහපැවැත්ම,ඇති කරවීම සහ කර්මාන්ත,නව නිපයුම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | ආහාර තාක්ෂණය පිළිබඳ පුහුණු පැවැත්වූ වැඩසටහන් ගණන | 02 | - | - | |
| | | විදුලි සකපෝරු ලබා දීම | | 26 | 1.835 | 9.00 |
| | | මැටි පහන් අච්චු ලබා දීම | - | 30 | | |
| 03 | තරුණ තරුණියන්ගේ ආකල්ප සංවර්ධනය | පැවැත්වූ තරුණ කඳවුරු ගණන | 07 | - | - | |
| 04 | පළාතේ තරුණ පිරිස සඳහා වෘත්තීමය ක්ෂේත්‍රයන් වෙත යොමු කිරීම | ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී පාඨමාලාව ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 33 | 23 | 0.38 | 1.00 |
| | | බරවාහන රියදුරු පුහුණු ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 54 | 53 | 0.38 | 0.065 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| පළාතේ මැටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය තුළින් ආදායම් වර්ධනය | මැටි ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය | මැටි ආශ්‍රිත නිෂ්පාදන තුළ ප්‍රචලිත කිරීම. විදුලි සකපෝරු ලබා දීම-26,මැටි පහන් අච්චු ලබා දීම-30 | 1.83 | 1.83 | 10 |
| බස්නැවතුම්පල සංවර්ධනය | තඹුත්තේගම බස්නැවතුම්පල වැඩ අවසන් කිරීම, සහ භූමිය සකස් කිරීම | ක්‍රමවත්ව සකස් කරන ලද බස්නැවතුම්පල | 8.85 | 7.68 | 100 |
| | අනුරාධපුර පැරණි බස් නැවතුම්පල වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව | පොදු සනීපාරක්ෂාවක පහසුකම් සැලසීම | 0.83 | 0.83 | 50 |
| වෘත්තිය හැකියාවන් සහිත තරුණ ප්‍රජාවක් බිහිකිරීම | ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් පුහුණු පාඨමාලා පැවැත්වීම | වෘත්තිය හැකියාවන් සහිත තරුණයින් 23 | 0.38 | 0.38 | 100 |
| | බර වාහන රියදුරු පාඨමාලා පැවැත්වීම | වෘත්තිය හැකියාවන් සහිත තරුණයින් 53 | 0.38 | 0.38 | 100 |

## ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් පුහුණු පාඨමාලා (යෙදූ ප්‍රතිපාදනය රු.මි.0.38)

පළාතේ තරුණ ප්‍රජාව මුහුණ දෙන ප්‍රමුඛතම ගැටළුව වන්නේ උසස් අධ්‍යාපනයෙන් පසු රැකියා විරහිතයින් බවට පත් වීමයි.විරැකියාවෙන් පෙළෙන අවම අධ්‍යාපන සුදුසුකම් සහිත තරුණයින් තෝරා ගෙන එක්ස් කැවේටර්,ලෝඩර්,බැක්හෝ,මෝටර් ග්‍රේඩර් ඇතුළු වාහන 10ක් සඳහා පුහුණුව ලබා දීම සිදු කෙරේ.අයදුම් කළ 34ක් අතුරින් සම්මුඛ පරීක්ෂණය සමත් වූ 25ක පිරිසෙන් 23 දෙනෙකු පාඨමාලා නිම කර ඇත. පාඨමාලා ලාභියෙකුගෙන් 50% ක් අයකර ඉතිරිය අමාත්‍යාංශය මඟින් ගෙවීමටත් කටයුතු කර ඇත. ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ ප්‍රමුඛයා වන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අයත් ගල්කුලම ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු විද්‍යාලයේ සම්පත්දායකත්වයෙන් පුහුණුව ලබා දී ඇත. ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ ඇතිව තිබෙන සීඝ්‍ර වර්ධනය හා පුහුණු ශ්‍රමය හිඟකම නිසා රැකියා අවස්ථා රැසක් නිර්මාණය කර ගත හැකි අතරම NVQ3 මට්ටම් සඳහා ලබාදෙන සහතිකය ජාත්‍යන්තරව පවතින රැකියා අවස්ථා ලබාගැනීමට ද හැකි වනු ඇත.







## බර වාහන රියදුරු පුහුණු පාඨමාලා පැවැත්වීම. (රු.මි.0.38)

පළාතේ තරුණයින්ගේ විරැකියාව අවම කිරීමත්, වෘත්තීය මාර්ග වෙත යොමුකිරීමේ අදහස ඇතිව 2019 වර්ෂයේ දී අනුරාධපුර ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියදුරු පාසැලේ සම්පත් දායකත්වයෙන්, සැහැල්ලු වාහන, ත්‍රී විලර් බලපත්‍ර ලබාගෙන වසර දෙකක් ගත වී ඇති පළාතේ පදිංචි තරුණයන්ගෙන් 50%ක ගාස්තුවක් අය කර ගෙන රියදුරු පුහුණු ලබා දී ඇත.රාජ්‍ය අංශයේ රියදුරු බලපත්‍ර ලබාදීමේ ප්‍රමුඛ ආයතනයක් මෙන්ම විනය ගරුක රියදුරන් බිහිකිරීමේ ජාතික මෙහෙවරක යෙදී සිටින ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියදුරු පාසැලේ සම්පත්දායකත්වය ලබාගැනීමට හැකි වීමත් සුවිශේෂී කාරණයකි. උතුරු මැද පළාතේ සියළුම කාර්යාලවල හා පොදු ස්ථානවල දැනුවත්කර එම කොට්ඨාශ මඟින් අප වෙත යොමුකරන ලද අයදුම් පත්‍ර 154 ක් අතරින් සම්මුඛ පරීක්ෂණය සඳහා 80 දෙනෙකු ඉදිරිපත් වූ අතර ඉන් 53 ක් පාඨමාලාව හදාරන ලදි.

## මැටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කිරිමේ ව්‍යාපෘතිය(රු.මි.1.83)

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ සාම්ප්‍රදායික මැටි නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින ග්‍රාමීය අත්කම් නිෂ්පාදනකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍යවන තාක්ෂණික මෙවලම් (විදුලි සකපොරු ,මැටි පහන් අච්චු) 50% ක ප්‍රතිලාභී දායකත්වය මත ලබා දීමට 2016/02 චක්‍රලේඛය යටතේ උපදෙස් ලැබී තිබුනද ප්‍රතිලාභින් විසින් 50% ක් ගෙවීමට අපහසු බව පවසා ඉදිරිපත් කළ ඉල්ලිම් ලිපිය අනුව මුදල් කොමිෂමෙන් කරන ලද ඉල්ලීමට අනුව 10% ප්‍රතිලාභි දායකත්වය මත විදුලි සකපෝරු 26 ක් හා මැටි පහන් අච්චු 30 ක් තිරප්පනේ පණ්ඩිත රඹෑවට ලබා දීම තුළින් මැටි භාණ්ඩ භාවිතය ප්‍රචලිත කිරිමට අපේක්ෂා කෙරේ.

## තඹුත්තේගම බස්නැවතුම්පල 1 අදියරය වැඩ අවසන් කිරිම, සහ භූමිය සකස් කිරිම (8.85)

මහජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතාවක්ව පැවති පහසුකම් සහිත බස්නැවතුම්පල භූමිය කාපට් කිරීමට අදාළව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

## ආයතනයේ දැක්ම කරා ළගා විමට 2020 වසරේ දි ක්‍රියාත්මක කිරිම සඳහා යොජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අදහස් හා යෝජනා

අභිමානවත් සමාජයක්, සහ ඉසුරුමත් පළාතක් යන දැක්ම කරා ළඟා වීම සඳහා උතුරු මැද පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය මගින් 2020 වසර සඳහා ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘතින් පහත පරිදි වේ.

### ➢ බර වාහන රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා හා තරුණයින් පුහුණු කිරිම

යෞවනයන්ගේ වෘත්තිය පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා පළාතේ තරුණ පිරිස වෘත්තිමය ක්ෂේත්‍ර වෙත යොමු කිරිමයි. මෙමගින් අපේක්ෂිත වාර්ෂික නිමැවුම පුහුණුලාභින් සංඛ්‍යාව 85 දෙනකු වන අතර ඒ සඳහා අපේක්ෂිත වියදම රු.650,000.00 (0.65 මිලියන)කි.

### ➢ මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා නවීන උපකරණ ලබාදීම

මැටි ආශ්‍රිත නිෂ්පාදනවල යෙදි සිටින කර්මාන්තකරුවන් භාවිතා කරන සාම්ප්‍රදායික උපකරණ වෙනුවට ඉහළ තාක්ෂණයක් සහිත උපකරණ ලබා දීම තුළින් ගුණත්වයෙන් උසස් මැටි භාණ්ඩ නිෂ්පාදනයට හා ඉහළ ආර්ථික තත්වයක් ළඟාකර ගැනිමට සහය වීම හා වෙළදපොලේ මැටි භාණ්ඩ සුලභ කිරිම මගින් ආහාර පිසීම සඳහා මැටි භාණ්ඩ භාවිතයට මහජනතාව පෙළඹවීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙමගින් අපේක්ෂිත වාර්ෂික නිමැවුම ලෙස පුහුණුලාභින් සංඛ්‍යාව 235 දෙනකු වන අතර ඒ සඳහා අපේක්ෂිත වියදම රු.9,000,000.00 (9.0 මිලියන) කි.

### ➢ ඉදිකිරිම් යන්ත්‍ර මෙහෙයුම් පුහුණු පාඨමාලාව පැවැත්වීම

යෞවනයන්ගේ වෘත්තිය පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා පළාතේ තරුණ පිරිස වෘත්තිමය ක්ෂේත්‍ර වෙත යොමු කිරිමයි. මෙමගින් අපේක්ෂිත වාර්ෂික නිමැවුම පුහුණුලාභින් සංඛ්‍යාව 85 දෙනකු වන අතර ඒ සඳහා අපේක්ෂිත වියදම රු.1.000,000.00 (1.0 මිලියන ) කි.

## ➢ විද්‍යුත් ආදායම් බලපත්‍ර ලබාදීම

දිවයින තුළ විද්‍යුත් ආදයම් බලපත්‍ර ලබා දීම ජාල ගත කිරීමයි.මෙම ජාල ගත කිරීම තුළින් දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් වාහන බලපත්‍ර ලබා ගැනිමේ හැකියාව ලැබෙනු ඇත.

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | කෙටි කාලින | දිගුකාලින |
| 01. පළාතේ තරුණ පිරිස වෘත්තීමය ක්ෂේත්‍ර වෙත යොමු කිරීම | 50% දායකත්වය මත බරවාහන රියදුරු පුහුණුව සඳහා තරුණයින් යොමු කිරීම | සංඛ්‍යාව-85 | සංඛ්‍යාව-100 | 2020 බරවාහන වෘත්තිය පුහුණුව ලැබු තරුණයින් 85 දෙනෙකු. | රැකියා විරහිත තරුණ පිරිස් වෙත බර වාහන රියදුරු බලපත්‍ර ලබා ගැනිමට සහය වීම මගින් බරවාහන ක්ෂේත්‍රෙය් රැකියා වෙත යොමු කර විමෙන් පළාතේ තරුණ විරැකියාව අවම විම |
| | 50% දායකත්වය මත ගල්කුලම ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු විදුහලේ සම්පත්දායකත්ව යෙන් ඉදිකිරීම් යන්ත්‍ර පුහුණුව ලබාදීම. | සංඛ්‍යාව-85 (1.00m) | සංඛ්‍යාව-100 | 2020 ඉදිකිරීම් යන්ත්‍ර පුහුණුව ලැබු තරුනයින් 85 දෙනෙකු බිහි කිරිම,ඔවුන් සඳහා NVQ3 මට්ටම හා ජාත්‍යන්තර පිළිගත් සහතිකයක් ලබා දීම | ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී පුහුණුව ලබා දිම තුලින් ,රැකියා විරහිත තරුණ පිරිස් ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ක්ෂේත්‍රයේ රැකියා වෙත යොමු කිරීම මගින් පළාතේ තරුණ විරැකියාව අවම කිරීම. |
| 02. මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන් සවිබල ගැන්වීම | මැටි කර්මාන්තකරුව න්ගේ ධාරිතා සංවර්ධනය කිරිම | සංඛ්‍යාව-235 (9. m) | සංඛ්‍යාව-250 | 2020 වර්ෂය තුලමැටි ආශ්‍රිත කර්මාන්තයේ නියැලෙන පාරම්පරික කර්මාන්ත කරුවන් 225 සඳහා උපකරන 225ක් ලබා දීම | අභාවයට යමින් පවතින මැටි ආශ්‍රිත කර්මාන්තය ප්‍රවර්ධනය කිරිම තුළින් කර්මාන්ත කරුවන්ගේ ආදායම් මට්ටම ඉහළ දැමිම තුළින් දිළිඳු බව තුරන් කිරිමට දායක වීම සහ ජනතාව තුළ යහපත් සෞඛ්‍ය,යහ පැවැත්ම ඇති කරවිම . |

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | කෙටි කාලින | දිගුකාලින |
| 02. මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන් සවිබල ගැන්වීම | මැටි කර්මාන්තකරුවන්ගේ ධාරිතා සංවර්ධනය කිරිම | සංඛ්‍යාව-235 (9. m) | සංඛ්‍යාව-250 | 2020 වර්ෂය තුළ මැටි ආශ්‍රිත කර්මාන්තයේ නියැලෙන පාරම්පරික කර්මාන්ත කරුවන් 225 සඳහා උපකරණ 225ක් ලබා දීම | අභාවයට යමින් පවතින මැටි ආශ්‍රිත කර්මාන්තය ප්‍රවර්ධනය කිරිම තුළින් කර්මාන්ත කරුවන්ගේ ආදායම් මට්ටම ඉහළ දැමීම තුළින් දිළිදු බව තුරන් කිරිමට දායක වීම සහ ජනතාව තුළ යහපත් සෞඛ්‍ය,යහපැවැත්ම ඇති කරවිම . |
| 03. රාජකාරී කටයුතු ඵලදායීව කාර්යක්ෂමව සිදු කිරීම සඳහා පහසුකම් සැලසීම | අමාත්‍යාංශ ලේකම් නිල නිවස අළුත්වැඩියා කිරිම මගින් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දිම | සංඛ්‍යාව -01 ( 3.9m) | - | අංග සම්පූර්ණ නිල නිවස | කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දිම සඳහා නිලධාරින්ට නිවාස ලබා දීම. |
| 04. විද්‍යුත් ආදායම් බලපත්‍ර ලබාදීම | උතුරු මැද පළාතට අයත් මෝටර් වාහන සම්බන්ධයෙන් නීති මගින් නියම කරනු ලැබිය හැකි සීමා ඇතුළත නිදහස් කිරිම් වලට යටත්ව මෝටර් වාහන සඳහා වූ කවර හෝ බලපත්‍ර නිකුත් කිරිම හා ඒ සම්බන්ධ ගාස්තු අයකර ගැනිම. | සංඛ්‍යාව -380745 (1.42 m) | - | 2020 වසර තුළ ලබා දිය හැකි බලපත්‍ර සංඛ්‍යාව | කාර්යක්ෂම මහ ජන සේවය ලබා දිම |

## සමස්ත කාර්ය සාධනය ළඟා කර ගැනීම පිළිබඳ සමස්ත අදහස.

**වෙළඳ හා ආහාර** - මැටි ආශ්‍රිත නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මැටි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදුකරන කර්මාන්තකරුවන් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා සහාය වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය සිදුකළ අතර මේ යටතේ පණ්ඩිත රඹෑව ගම්මානයේ කර්මාන්තකරුවන් 26 දෙනෙකු සඳහා විදුලි සකපෝරු 26 ක් හා මැටි පහන් අච්චු30ක්ද ලබාදෙන ලද අතර මේ වන විට ඔවුන් එම උපකරණ මනාව භාවිත කරමින් සාර්ථකව තම නිෂ්පාදන කටයුතු සිදු කරමින් සිටියි.

**යෞවන කටයුතු** - පළාතේ තරුණ ප්‍රජාවහට ජාතික වශයෙන් පවතින ප්‍රධාන ගැටළුවක් ලෙස විරැකියාව හඳුනාගත හැකි අතර එය අවම කිරීමට හා ඔවුන් වෘත්තිය මාර්ග වෙත යොමු කිරිමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක වූ ඉදිකිරිම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී පුහුණු පාඨමාලාව සහ බර වාහන රියදුරු පුහුණු පාඨමාලාව සඳහා පිළිවෙලින් තරුණයින්, 23දෙනෙකු හා 53 දෙනෙකුහට පුහුණුව ලබා දී ඇත.

# 9.1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සේවා ජාලය

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| විවිධ සේවා | 17 | 09 | 26 |
| පාරිභෝගික සමිති | 02 | - | 02 |
| සමුපකාර බැංකු | 3 | - | 3 |
| කෘෂිකාර්මික | 1 | - | 1 |
| සත්ත්ව නිෂ්පාදන - කිරි | 3 | 1 | 4 |
| ධීවර | 2 | 4 | 6 |
| කර්මාන්ත | 1 | 1 | 2 |
| කම්කරු | - | 1 | 1 |
| තරුණ සේවා | - | 1 | 1 |
| සුභසාධන | - | 1 | 1 |
| වෙනත් ප්‍රාථමික | - | 1 | 1 |
| සේවක සංඛ්‍යාව | 711 | 606 | 1,317 |
| සාමාජික සංඛ්‍යාව | 166,706 | 130,773 | 297,479 |
| ඉන්ධනහල් | 7 | 11 | 18 |
| කෝප් සිටි | 14 | 13 | 27 |
| මිනි කෝප් සිටි | 49 | 38 | 87 |
| මෙගා කෝප් සිටි | 03 | 01 | 04 |
| ග්‍රාමීය බැංකු | 106 | 40 | 146 |
| සණස සංගම් | 70 | 43 | 113 |
| ඉතිරි කිරීමේ ගිණුම් | 129,653 | 174,023 | 303,676 |
| ස්ථාවර තැම්පතු | 8,853 | 5,132 | 13,985 |

## දෙපාර්තමේන්තු නියාමනය යටතේ පවතින ආයතන

| ආයතනය | ප්‍රමාණය |
|---|---|
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල | 02 |
| මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය | 01 |
| සමුපකාර ශ්‍රවණාගාරය | 01 |
| සී/ස විවිධ සේවා සමුපකාර සමිති | 26 |
| සී/ස කෘෂිකාර්මික සමුපකාර සමිති | 01 |
| සී/ස කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති | 05 |
| සී/ස ධීවර සමුපකාර සමිති | 02 |
| සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති | 111 |
| සී/ස පේෂ කර්මාන්ත සමුපකාර සමිති | 01 |
| සී/ස කර්මාන්ත සමුපකාර සමිති | 02 |
| දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල | 02 |
| පළාත් සමුපකාර සමිති සංගම් | 02 |
| ස.ණ.ස සංගම් | 01 |
| පාසල් සමුපකාර සමිති | 04 |

විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමට පෙර සමූපකාර ග්‍රාමීය ජනතාවගේ මූලික අවශ්‍යතා සඳහා මැදිහත්කරුවකු වශයෙන් විශාල කර්යභාරයක් ඉටුකරමින් ජනතාවට සමීප වෙමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කරගෙන සිටි අතර, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසු විවෘත වූ වෙළඳ ලෝකය තුළ එම ව්‍යාපාරයන් සමඟ තරඟ කිරිමට සිදුවීමෙන් වර්තමානයේ යම් තරමකින් පසුබෑමකට ලක්ව ඇත. එදා මෙදාතුර සමූපකාර ජාලය තුළ ලියාපදිංචි සමූපකාර සමිති සියල්ල අධීක්ෂණය හා නියාමනය මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලැබේ. වර්තමානයේ විවෘත වෙළඳපළ සමග තරඟ කරමින්, පාරිභෝගික ජනතාවට සහන සැලසීමටත් ගොවි ජනතාවට සහන සැලසීමේ අරමුණින් රජයේ මැදිහත් විම මත කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම, ගබඩා කිරිම හා නිමි ආහාර සැකසීමේ කාර්යයන්වල නියලෙමින් සිටින අතර, ඒ තුළින් නැවත සමූපකාර ව්‍යාපාර ශක්තිමත් කිරීමේ කර්තව්‍ය සඳහා සමූපකාර දෙපාර්තමේන්තුව දායකත්වය හා මඟපෙන්වීම සිදු කරනු ලැබේ.

## දැක්ම

"තිරසර සමූපකාර ව්‍යවසායත්, සෞභාග්‍යමත් සමාජයක්"

## මෙහෙවර

"සමූපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම සියළු පාර්ශවකරුවන් මනා සහභාගීත්වයෙන්, විනිවිදභාවයෙන් යුක්තව සහ සමූපකාර සංකල්පවලට, ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු




## කෙටිකාලීන අරමුණු

සමූපකාර ව්‍යාපාර තුළින් තාක්ෂණික උපකාර හා ක්‍රමෝපායන් සැකසීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

01. පළාතේ පාරිභෝගික ජනතාවට සහන මිලට ද්‍රව්‍ය සැපයීම.
02. පළාතේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් ඇති කිරීම මඟින් ගොවීන්ට සහන සැලසීම.
03. පළාතේ ජනතාවට සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු


1 උතුරු මැද පළාතේ දරිද්‍රතාවය තුරන් කිරිම සඳහා අත්වැලක් විම.

2 කුසගින්න තුරන් කිරිම.

3 කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම් සැපයීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 178 |
| 2 | සේවයේ නියුතු | 114 |
| 3 | පුරප්පාඩු | 64 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන(රු.මි.) | 2019 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 66.78 | 65.49 | 1.29 | 98.07 |
| ගමන් වියදම් | 5.87 | 5.80 | 0.07 | 99.87 |
| සැපයීම් | 2.91 | 2.26 | 0.65 | 77.63 |
| නඩත්තු වියදම් | 2.05 | 1.78 | 0.28 | 86.24 |
| ගිවිසුම්ගත සේවා | 5.02 | 4.32 | 0.69 | 86.24 |
| මාරු කිරීම් | 10.32 | 10.23 | 0.86 | 99.16 |
| **එකතුව** | **92.95** | **89.88** | **3.84** | **96.76** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | 2019 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.5 | 2.00 | 0.5 | 80.00 |
| ධාරිතා සංවර්ධන | 0.3 | 0.25 | 0.05 | 83.33 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 3.20 | 1.25 | 1.95 | 39.06 |
| **එකතුව** | **6.00** | **3.50** | **2.50** | **58.33** |

## කාර්ය සාධන ඉලක්ක - 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|
| සමුපකාර ක්‍රමය ප්‍රවර්ධනය කිරිම. | ආරම්භ කරන ලද නව ව්‍යාපාර සංඛ්‍යාව (ස.ණ.ස, ශ්‍රම ඵලදායීතා සමිති) | 10 | 12 | 06 |
| | ලාභ ලබන සමිති සංඛ්‍යාව | 24 | 18 | 27 |
| | සමිති ප්‍රතිසංවිධානය(ස.ණ.ස සමිති) | - | - | 01 |
| | වර්ෂයේ නිම කළ විගණන ගණන(වි.සේ.ස සමිති, ස.ණ.ස සමිති, පාසල් සමුපකාර සමිති, වෙනත් සමිති, බැංකු සමිති) | - | - | 193 |
| සමුපකාර ජාලය ශක්තිමත් කිරිම. | පරිගණකගත කර ඇති ග්‍රාමීය බැංකු ශාඛා ප්‍රමාණය | 107 | 120 | 123 |
| | පළාත තුළ සිටින සමුපකාර සමාජිකයින් සංඛ්‍යාව. | 269981 | 295479 | 319864 |
| මානව සම්පත් වැඩි දියුණු කිරිම. | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව. | 03 | 03 | 04 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියන්හි ප්‍රගතිය - 2019

### 6.1 සමුපකාර දෙපාර්තමේන්තුවේ ආයතනික සංවර්ධනය

අනුරාධපුර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය 2019 වර්ෂයේදී වායු සමනය කිරීම සිදු කරන ලදී. ඒ සඳහා පළාත් සහා සංවර්ධන ප්‍රධාන යටතේ රුපියල් 1,234,405.78ක මුදලක් වියදම් කරන ලද අතර එහි ප්‍රගතිය 100% විය. සමුපකාර ශ්‍රවණාගාරය නවීකරණය සිදු කිරීම සඳහා රුපියල් 1,998,834.46ක මුදලක් වියදම් කරන ලද අතර එහි ප්‍රගතිය 100% විය.

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **01.** මානව සම්පත්වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරිම | | | | |
| සමුපකාර සංවර්ධන නිලධාරීන් සඳහා විගණන තාක්ෂන පුහුණු වැඩමුළුව වි.සේ.ස සමිතිවල නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම හා ඵලදායීතාවය පිළිබඳ දෙදින වැඩමුළුව | යාවත්කාලින දැනුමෙන් සමන්විත දෙපාර්තමේන්තු හා සමිති සේවක පිරිසක් බිහිවිම. | 0.15 | 0.12 | 80 |
| | | 0.15 | 0.10 | 67 |
| දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නිති පුහුණු වැඩමුළුව දෙපාර්මේන්තු නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | යාවත්කාලින දැනුමෙන් සමන්විත දෙපාර්තමේන්තු හා සමිති සේවක පිරිසක් බිහිවිම | මූල්‍ය දායකත්වය We effect ආයතනය මගින් සිදු කර ඇත | | 100 |
| **02.**දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම. | | | | |
| අනුරාධපුර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය වායු සමණය කිරිම | දෙපාර්තමේන්තු පරිශ්‍රය ක්‍රමවත් විම | 1.50 | | 1.23 |
| සමුපකාර ශ්‍රවණාගාරයේ අබලි දොර ජනෙල් ඉවත් කර ඇළුමිනියම් දොර ජනෙල් සවි කිරීම. | | 2.00 | | 1.99 |

## 6.2.දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සිදු කළ ධාරිතා සංවර්ධන වැඩසටහන්

සමූපකාර ව්‍යාපාරය ජාතික වශයෙන් මෙන්ම ජත්‍යන්තර වශයෙන්ද ක්‍රියාත්මක ව්‍යාපාරයකි. උතුරු මැද පළාතේ ක්‍රියාත්මක සමූපකාර සමිතිවල ගුණාත්මකභාවය , නව තාක්ෂණය භාවිතය හා දැනුම යාවත්කාලීන කිරිමේ අරමුණින් රුපියල් මිලියන 03 යටතේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. සමූපකාර සංවර්ධන නිලධාරීන් සඳහා විගණන තාක්ෂණ පුහුණු වැඩමුළුව සඳහා රු.මි. 0.15ක මුදලක් වෙන් කළ අතර රු.මි.0.12ක මුදලක් වැය කරන ලදී. වි.සේ.ස සමිතිවල නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම හා ඵලදායිතාවය පිළබඳ දෙදින වැඩමුළුව සඳහා වෙන් කළ මුදල රු.මි. 0.15ක් වන අතර ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 0.10කි.

## 6.3. සමූපකාර දෙපාර්තමේන්තු නියාමනය යටතේ සමූපකාර සමිති විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

### ග්‍රාමීය බැංකු අංශයේ තැන්පත් ප්‍රවර්ධනය

උතුරු මැද පළාත තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමූපකාර සමිති 17 ක ග්‍රාමීය බැංකු ශාඛා 117 ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමූපකාර සමිති 09 ක ග්‍රාමීය බැංකු ශාඛා 45ක් ද පවත්වා ගෙන යනු ලබයි. මෙම ශාඛා 156 මඟින් සිංහල අළුත් අවුරුදු උත්සවය ඉලක්ක කර ගනිමින් සිදු කළ තැන්පත් ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගිණුම් 12975ක් අළුත්කළ අතර තැන්පත්වල මුල්‍යමය වටිනාකම රු.මි.530.66කි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගිණුම්12690ක් වූ අතර මුල්‍යමය වටිනාකම රු.මි 626.39ක් විය. ඒ අනුව පළාතේ යාවත්කාලීන කළ ගිණුම් ගණන 25665ක් වූ අතර මුල්‍ය වටිනාකම රු.මි.1157.05 විය.**

### ග්‍රාමීය බැංකු නවීකරණය හා නව ග්‍රාමීය බැංකු ආරම්භ කිරීම.

වර්තමාන බැංකු ක්ෂේත්‍ර තුළ රාජ්‍ය හා වාණිජ බැංකු හා තරඟකාරී ලෙස කටයුතු කිරීමේ අරමුණින් තම ගනුදෙනුකරුවන් ආකර්ශණය දිනා ගැනීමට හා බැංකු කටයුතු පුළුල් කිරීමේ අරමුණින් නව බැංකු ආරම්භ කිරීම හා ග්‍රාමීය බැංකු නවීකරණය කිරීම සිදු කරයි. ග්‍රාමීය බැංකු ශාඛා 15ක නවිකරණ කටයුතු සිදු කරනු ලැබිය. මේ සඳහා වැය වූ මුදල රු.2.77 කි. නව ග්‍රාමීය බැංකු ශාඛා 01ක් අළුතින් ආරම්භ කරන ලද අතර ඒ සඳහා රු.මි.0.18ක් වැය කරන ලදී.



ජේ මඩුව ග්‍රාමීය බැංකව නවීකරණය

### පාරිභෝගික අංශය

| නවිකරණය කරන ලද සමූපකාර අලෙවි සැල් | |
|---|---|
| **සමිතිය** | **නවිකරණය කරන ලද සමූපකාර අලෙවි සැල්** |
| 01. දිඹුලාගල විවිධ සේවා සමූපකාර සමිතිය. | • අරුණගම්විල කෝප් සිටිය. |
| 02. අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය. | • ගල්කඩවල මිනි කෝප් සිටි. |
| 03. මරදන්කඩවල විවිධ සේවා සමූපකාර සමිතිය. | • පලයාකුලම මිනි කෝප්සිටිය. |

| සමිතිය | නවීකරණය කරන ලද සමූපකාර අලෙවි සැල් |
|---|---|
| 04. විලච්චිය විවිධ සේවා සමූපකාර සමිතිය. | • තන්තිරිමලය මිනිකෝප් සිටිය. |
| 05. පදවිය විවිධ සේවා සමූපකාර සමිතිය. | • කෝප්සිටි. |
| 06.එප්පාවල විවිධ සේවා සමූපකාර සමිතිය | • මෙගා කෝප්සිටි |
| 07.කැකිරාව විවිධ සේවා සමූපකාර සමිතිය | • කැකිරාව කෝප්සිටි |
| 08.පොළොන්රුව විවිධ සේවා සමූපකාර සමිතිය | • කදුරුවෙල කෝප්සිටි |
| අළුතින් ඉදිකළ වෙළෙඳසැල් | |
| සමිතිය | අළුතින් ඉදිකළ වෙළෙඳසැල් |
| 01.කැබිතිගොල්ලෑව විවිධ සේවා සමූපකාර සමිතිය. | • බෝගස්වැව මිනිකෝප්සිටි |
| 02.ශ්‍රාවස්තිපුර විවිධ සේවා සමූපකාර සමිතිය. | • කුඩා බෝගස්වැව මිනිකෝප්සිටි |
| 03.මරදන්කඩවල විවිධ සේවා සමූපකාර සමිතිය. | • මුරියාකඩවල මිනිකෝප්සිටි |
| 04. පොළොන්නරුව විවිධ සේවා සමූපකාර සමිතිය | • බ්‍රැන්ඩෙක්ස් මිනිකෝප්සිටි |

## ඉන්ධන අංශය - නවීකරණය කරන ලද ඉන්ධනහල්

| අ.අ | සමිතිය | ඉන්ධනහලෙහි නම | වියදම (රු.මි) | ප්‍රතිපාදන ලබා ගත් අකාරය |
|---|---|---|---|---|
| 1 | සී/ස පොළොන්නරුව වි.සේ.ස සමිතිය | කදුරුවෙල ඉන්ධනහල | 3.50 | ඛනිජතෙල් සංස්ථාවේ අධාර යටතේ |
| 2 | සී/ස කැබිතිගොල්ලෑව වි.සේ.ස සමිතිය | කැබිතිගොල්ලෑව ඉන්ධනහල | 0.01 | - |
| 3 | සී/ස රඹෑව වි.සේ.ස සමිතිය | රඹෑව ඉන්ධනහල | 0.35 | - |
| 4 | සී/ස ගල්නෑව වි.සේ.ස සමිතිය | ගල්නෑව ඉන්ධනහල | 27.00 | ඛනිජතෙල් සංස්ථාවේ අධාර යටතේ |

## වෙනත් ව්‍යාපාරික අංශ - නවීකරණය කළ

| අ.අ | සමිතිය | වෙළඳසැලෙහි නම | වියදම (රු.මි) |
|---|---|---|---|
| 1 | සී/ස පොළොන්නරුව වි.සේ.ස සමිතිය | සමූපකාර | 0.09 |
| | | පෙර පාසල | 1.70 |
| 2 | සී/ස කැබිතිගොල්ලෑව වි.සේ.ස සමිතිය | තොග ගබඩාව | 0.05 |
| | | විසිතුරු වෙළඳ අංශය | 0.21 |
| | | ආපන ශාලාව | 2.04 |
| | | කාර්යාලය නවීකරණය | 0.37 |
| 3 | සී/ස අනුරාධපුර වි.සේ.ස සමිතිය | ඔසුසළ | 0.02 |
| 4 | සී/ස රඹෑව වි.සේ.ස සමිතිය | වී ගබඩාව සාලියපුර | 0.32 |

## 6.4 සමූපකාර සමිතීන් හි ධාරිතා සංවර්ධන වැඩසටහන්

සමිති සේවකයන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා සමිති විසින් ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලබයි .

සී/ස ජයන්තිපුර විවිධ සේවා සමූපකාර සමිතිය මගින් ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන, රඳවා ගැනීමේ බදු ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදී. උතුරු මැද පළාත් කාර්යාලය හා දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය එක්ව මෙම වැඩසටහන් සංවිධානය කරන ලදී. දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයේ සංවිධානත්වයෙන් සී/ස පොළොන්නරුව විවිධ සේවා සමූපකාර සමිතිය මගින් ග්‍රාමීය බැංකු ණය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් පවත්වන ලදී. සමූපකාර සේවක කොමිෂන් සභාවේ සංවිධායකත්වයෙන් සී/ස අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය මගින් සමූපකාර සේවක ආකල්ප පුහුණු වැඩසටහන ,කාර්යාල ක්‍රම හා ඵලදායීතා සංකල්ප පුහුණුව හා පුද්ගලික ලිපි ගොනු සැකසීම පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

ජාතික සමූපකාර මණ්ඩලය හා ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ (පොල්ගොල්ල ) සංවිධානයෙන් සී/ස එප්පාවල විවිධ සේවා සමූපකාර සමිතිය මගින් සමූපකාර උසස් පෙළ සඳහා සේවකයන් යොමු කිරීම හා මානව සම්පත් කළමනාකරණ පිළිබඳ පුහුණු වැඩසටහන පවත්වන ලදී. සී/ස කැකිරාව විවිධ සේවා සමූපකාර සමිතිය මගින් ණය දීමේ ක්‍රියාවලිය හා තැන්පතු වර්ධනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලද අතර අනුරාධපුර දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය මගින් සංවිධානය කරන ලදී.

### සුභසාධක හා ප්‍රජා සත්කාරක වැඩසටහන්

### සමූපකාර අලෙවිසැල් සඳහා නව මුහුණුවරක් ලබා දෙමින් කෝප් සිටි සහ මිනි කෝප් සිටි ලෙස සුපර් මාර්කට් ප්‍රචලිත කිරීම.

සමූපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරිම උදෙසා සමූපකාර අලෙවිසැල් සඳහා නව මුහුණුවරක් ලබා දෙමින් කෝප් සිටි සහ මිනි කෝප් සිටි ලෙස සුපර් මාර්කට් ඇති කිරීම සමූපකාර දෙපාර්තමේන්තු නියාමනය යටතේ සමිති විසින් ක්‍රියාත්මක කරනු ලැබූ තවත් ව්‍යාපෘතියකි.

වෙළෙඳසැල් නවීකරණය සඳහා රු.මි. 13.93ක මුදලක් වැය කරන ලදි. මෙලෙස නවීකරණ කිරීම හේතුවෙන් මෙම වෙළඳසැල්වල ආදායම වර්ධනය වී ඇති අතර ජනතා ආකර්ශනය ද වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය. අළුතින් වෙළෙඳසැල් ඉදි කිරීම සඳහා රු.මි. 0.61ක මුදලක් වැය විය.

### ධාරිතා සංවර්ධන වැඩසටහන් හා ප්‍රජා සත්කාරක වැඩසටහන්

සමිති සේවකයින්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනිම සඳහා සමිති විසින් ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලබයි. ඒ සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධිකරණය හා සම්පත්දායකත්වය මෙන්ම බාහිර සම්පත්දායකයින්ගේ ද සහභාගිත්වය යටතේ සිදු කරනු ලැබිය. මේ යටතේ වැඩසටහන් 9ක් සිදු කරන ලදී.

2019 වර්ෂයේ දි ද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මෙන්ම සමිති විසින් ද සේවක සුභ සාධක වැඩසටහන් මෙන්ම ප්‍රජා සත්කාරක වැඩසටහන් ද පවත්වනු ලැබිය. සේවක අභිප්‍රේරණය වර්ධනය කිරිම මෙන්ම සමුපකාර ක්‍රමය ප්‍රචලිත කිරිම ද මින් අපේක්ෂා කෙරිණ. ඒ අනුව උතුරු මැද පළාත තුළ,

- පහ වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන්.
- වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දීමේ වැඩසටහන.
- සෞඛ්‍ය දැනුවත් කිරිම වැඩසටහන් හා සෞඛ්‍ය සායන පැවැත්විම.
- ලේ දන් දිමේ වැඩසටහන පැවැත්වීම.
- සේවක සුභසාධන චාරිකා / කාර්ය මණ්ඩල සඳහා නිල ඇඳුම් ප්‍රදානය කිරිම.
- දන්සල් පැවැත්විම.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා එහි නිගමනය යටතේ පවතින සමිති මඟින් සමුපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය ඉටු කිරිම සඳහා විවිධ ව්‍යාපෘති හා වැඩ සටහන් 2019 වසරේ දි ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව වාර්ෂික ත්‍රියාකාරි සැලැස්මට අනුව ළඟාකරගත් භෞතික ප්‍රගතිය 100% ලෙස සැලකිය හැකි එසේම රාජ්‍ය අරමුදල් යටතේ මෙන්ම සමිති අරමුදල් හා බාහිර ආයතනවල මූල්‍ය ආයතනයෙන් ද වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එහි දි උපරිම මූල්‍ය කාර්යක්ෂමතාවය ඇති වන පරිදි කටයුතු කරන ලදි.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා එහි නිගමනය යටතේ පවතින සමිති මඟින් සමුපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය ඉටු කිරිම සඳහා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් 2019 වසරේ දි ක්‍රියාත්මක කරනු ලැබිය. ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ළඟා කර ගත් භෞතික ප්‍රගතිය 100% ලෙස සැලකිය හැකිය. එසේම රාජ්‍ය අරමුදල් යටතේ මෙන්ම සමිති අරමුදල් හා බාහිර ආයතනවල මූල්‍ය දායකත්වයෙන් ද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. එහි දි උපරිම මූල්‍ය කාර්යක්ෂමතාවය ඇති වන පරිදි කටයුතු කරන ලදි.

දෙපාර්තමේන්තුවේ අරමුණ හා ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු යම් ප්‍රමාණයක් පැවතීම ප්‍රධාන ගැටළු වශයෙන් පැවතුන ද සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල මනා කාර්ය සාධනයෙන් යුක්තව, සමුපකාර සේවකයින්ගේ හා පළාතේ පාරිභෝගික ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කැප වීමෙන් කටයුතු කළ අතර ආයතනික විනය හා මූල්‍ය විනය විධිමත්ව පවත්වා ගනිමින් 2019 වර්ෂය තුළදී මහජන ප්‍රසාදය ලබා ගැනීමටත් ඉහළ කාර්ය සාධනයක් කරා ළඟා විමටත් හැකි විය.දෙපාර්තමේන්තු වෙත් වූ පුනරාවර්තන ප්‍රතිපාදන අනුව අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වූ අතර 2019.12.31 දින වන විට අනුමත එහෙත් තෝරා ගන්නා ලද මූලධන ව්‍යාපෘති සියල්ලේ වැඩ අවසන් කර ඇත. මුදල් අමාත්‍යංශයේ චක්‍රලේඛ අය 4/ 2019 හා ජාතික අයවැය චක්‍රලේඛ 5/2019 අනුමත මුදලින් 25% ක් අහුරා තැබීමට සිදු වූ හෙයින් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ඉතිරි කිරීමට සිදු විය.

දෙපාර්තමේන්තුවේ අරමුණ හා ප්‍රධාන කාර්යන් ඉටු කර ගැනීමේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පැවතීම, වාර්ෂික සැලසුම් සකස් කිරිම සඳහා ප්‍රමාණවත් දැනුමක් නොතිබිම හා මානව හා භෞතික සම්පත්වල පැවති ඌණතාවය හා ප්‍රධාන ගැටළු වශයෙන් පැවතුන ද සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල මනා කාර්ය සාධනයෙන් යුක්තව, සමුපකාර සේවකයින්ගේ හා පළාතේ පාරිභෝගික ජනතාවගේ සුභසිද්ධිය උදෙසා කැප වීමෙන් කටයුතු කළ අතර ආයතනිත විනය හා මූල්‍ය විනය විධිමත්ව පවත්වා ගනිමින් මහජන ප්‍රසාදය ලබා ගැනීමට ප්‍රයත්න දරා ඇත.

# 9.2. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

## කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පසුබිම.

උතුරු මැද පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයට දායකත්වය සැපයීමට උතුරු මැද පළාත සතුව 2003 වර්ෂයට පෙර පේෂකර්ම දෙපාර්තමේන්තුව හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යනුවෙන් ආයතන 02ක් පැවති අතර 2003 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව විසින් ගත් තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් දෙපාර්තමේන්තු 02 ඒකාබද්ධ කොට පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබී ය. ඉන් පසු එකී එක් එක් දෙපාර්තමේන්තු යටතේ පාලනය වූ සියලුම අංශයන්හී පාලනය, අධීක්ෂණය සහ විවිධ අංශයන් සඳහා පහසුකම් සැපයීම යනාදි කාර්යයන් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. නව ආයතනයේ ප්‍රධාන පරමාර්ථයන් කිහිපයකි.

එක් එක් ආයතනයේ නිෂ්පාදන අංශ කළමනාකරණය කිරීම මගින් උතුරු මැද පළාත් සභාවට සැලකිය යුතු ආදායමක් එකතු කිරීම හා එම ආයතනවල එක් එක් අංශ මගින් උතුරු මැද පළාතේ වෙසෙන තරුණ තරුණියන්හට වෘත්තීය පුහුණුව ලබාදීම ඒ අතර ප්‍රමුඛ පරමාර්ථයක් බවට පත්ව ඇත.

උතුරු මැද පළාත තුළ අපතේ යන ශ්‍රමය ඵලදායීව යොදවා ගනිමින් නිර්මාණශීලීව ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් සංවර්ධනය කරලීම, ස්වයං රැකියා අවස්ථා උදා කරලීම, දැනට ක්ෂත්‍රයේ සිටින කණ්ඩායම්වල තාක්ෂණික සහ ව්‍යවසායකත්ව හැකියාවන් ප්‍රවර්ධනය කිරීම නව ස්වයං රැකියා අවස්ථා සඳහා ඔවුන්ව යොමු කිරීමට අවශ්‍ය මූලික පදනම සැකසීම සහ සමාජීය සංවර්ධනය ඇති කරලීම සහ ඊට අවශ්‍ය සේවා සපයන්නෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. එමගින් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත වඩු කර්මාන්ත යන ප්‍රධාන අංශ 03ක් යටතේ දේශීය දළ ජාතික නිෂ්පාදන කාර්යට උර දෙමින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා විවිධ කාර්යයන් රැසක් මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි.

මෙකී අරමුණු ඉටුකර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 43ක් සහ වඩු කර්මාන්ත මධ්‍යස්ථාන 10ක් පළාත පුරා ස්ථාපනය කර ඇත. මීට අමතරව ග්‍රාමීය මට්ටමේ කර්මාන්ත සහ හස්ත කර්මාන්ත අංශය නගාසිටුවීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් සහ නිෂ්පාදනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ කුසලතා හා ප්‍රාග්ධන උපකරණ ලබා දීමෙන් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මහගු කාර්ය භාරයක් ඉටු කරයි.

මෙම දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය පුරවැසියන්ට අමතරව රාජ්‍ය ආයතන හා ව්‍යාපාරික ප්‍රජාව සඳහා ද පහත සඳහන් සේවාවන් සපයමින් සිය කාර්යභාරය තව දුරටත් පුළුල් කර ඇත.

- ❖ ව්‍යාපාරිකයින්ට සිය නිෂ්පාදන කාර්යන් සඳහා අවශ්‍යවන වඩු නිෂ්පාදන ලබා දීම සහ වෘත්තීය පුහුණුවක් සහිත වඩු කාර්මිකයින් තම ව්‍යාපාර කටයුතු සඳහා නිෂ්පාදකයින් ලෙස යොදා ගැනීමට හැකි වන අවස්ථා විවර කරදීම.

- ❖ නව නිෂ්පාදන සඳහා පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කිරිමෙහිලා වාර්ෂිකව පවත්වනු ලබන ප්‍රදර්ශනවලදි ව්‍යාපාරික ප්‍රජාවට සහභාගි වීමේ අවස්ථා ලබා දීම.

## දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ආයතන

| | | |
|---|---|---|
| අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන | - | 27 |
| පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන | - | 14 |
| අනුරාධපුර අලෙවි මධ්‍යස්ථාන | - | 03 |
| පොළොන්නරුව අලෙවි මධ්‍යස්ථාන | - | 01 |

### අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන - 27

| | |
|---|---|
| නොච්චියාගම | පල්ලේකාගම |
| මුදිතාගම | වලච්චේගම |
| රළපනාව | මානෑව |
| පණ්ඩුලගම | කලාකරඹෑව |
| පෙරිමියන්කුලම | හිරිපිටියාගම |
| කටුකැලියාව | නෙළුඹෑව |
| රුවන්ගම | කල්පේ |
| පුබ්බෝගම | 21 ජනපදය |
| මානේරුව | ගෝමරන්කල්ල |
| නෙළුම්පත්ගම | හුරුළු නිකවැව |
| රාජාංගනය | තිරප්පනේ |
| රඹෑව | මාමිනියාව |
| දෙමටගල | හුරිගස්වැව |
| නාමල්පුර | |

### පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන - 14

| | |
|---|---|
| පත්තිනි පෙදෙසගම | බුද්ධයාය |
| නෙළුම්විල | අතරගල්ලැව |
| කඩලවැව | අත්තනකඩවල |
| බෝ අත්ත | අරලගන්විල |
| හිඟුරක්දමන | පැරකුම් |
| රජඇලගම | බැදිවැව |
| පුලතිසිගම | තල්පොත |

### අලෙවි මධ්‍යස්ථාන - 04

කඩ පනහ - අනුරාධපුර
කච්චේරිය - අනුරාධපුර
තිරප්පනේ
රජ ඇලගම -පොළොන්නරුව

## අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේ පිහිටි වඩු පාසල්

| අ.අ | වඩු පාසල | |
|---|---|---|
| 1 | සෙලෙස්තිමඩුව යාන්ත්‍රික වඩු පාසල | නාච්චාදූව |
| 2 | කලාවැව යාන්ත්‍රික වඩු පාසල | ඉපලෝගම |
| 3 | නොච්චියාගම යාන්ත්‍රික වඩු පාසල | නොච්චියාගම |
| 4 | කැකිරාව යාන්ත්‍රික වඩු පාසල | කැකිරාව |
| 5 | ගලෙන්බිඳුණුවැව යාන්ත්‍රික වඩු පාසල | ගලෙන්බිඳුණුවැව |
| 6 | මානිංගමුව යාන්ත්‍රික වඩු පාසල | මානිංගමුව |
| 7 | ඔරුබැදිසියඹලාව යාන්ත්‍රික වඩු පාසල | ඇලහැර |
| 8 | ගිරිපොකුණ යාන්ත්‍රික වඩු පාසල | දිඹුලාගල |
| 9 | මැදිරිගිරිය යාන්ත්‍රික වඩු පාසල | මැදිරිගිරිය |
| 10 | ඒරියාගම දැව තාක්ෂණ උසස් පුහුණු ආයතනය | තලාව |

## දැක්ම

“නිර්මාණශීලි කර්මාන්ත ප්‍රජාවක්, අභිමානවත් පළාතක්”.

## මෙහෙවර

“කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත්, ආයෝජන, නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන, සියළු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රවර්ධනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් ජාතික නිෂ්පාදනයට කරනු ලබන්නා වූ දායකත්වය ඉහළ නංවාලීම හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම.

## කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ශිල්පීන්හට රැකියා අවස්ථා සලසා දීම හා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ජාතික ප්‍රමිති තත්ත්වයට නංවාලීම හා පවත්නා නිෂ්පාදන අලෙවි ආදායම් මට්ටම ඉහළ නැංවීම හා වැඩිකිරීම.

## ප්‍රධාන කාර්යයන්


- කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත අංශයේ ආයෝජන ප්‍රවර්ධනය.
- නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා සංවර්ධනය.
- පර්යේෂණ හා සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- හස්ත කර්මාන්තය, පේෂ කර්මාන්ත හා වඩු කර්මාන්ත යන අංශවල කර්මාන්තකරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගුණාත්මක නිර්මාණ හා නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කිරීම.
- ස්වයං රැකියාවන්ට යොමු කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආධාර ලබා දී අලෙවි පහසුකම් ද සලසා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම.

## කාර්ය මණ්ඩල තොරතුරු - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 157 |
| 2 | සේවයේ නියුතු | 118 |
| 3 | පුරප්පාඩු | 39 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 61.94 | 60.49 | 1.45 | 98 |
| ගමන් වියදම් | 2.80 | 2.70 | 0.10 | 96 |
| සැපයීම් | 3.87 | 3.78 | 0.09 | 98 |
| නඩත්තු වියදම | 2.89 | 2.56 | 0.33 | 89 |
| ගිවිසුම්ගත සේවා | 27.40 | 23.84 | 3.56 | 87 |
| මාරු කිරීම් | 0.43 | 0.41 | 0.02 | 95 |
| **එකතුව** | **99.33** | **93.78** | **5.55** | **94** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2019 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා ඉදි කිරීම් | 24.80 | 21.61 | 3.19 | 87.14 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 5.76 | 4.68 | 1.08 | 81.25 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 13.51 | 6.13 | 7.38 | 45.25 |
| **එකතුව** | **44.07** | **32.42** | **11.65** | **73.56** |

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු,ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්ක හා නිමැවුම් දර්ශක |
|---|---|
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගිම ,පරිපුර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරි ගැන්වීම | සියළු දෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වනවිට ජාතික දායකත්වයන්ට අනුකූල රැකියාවන් සැපයමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම |
| | විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම්දාමයන්ට ඒකාබද්ධ කිරීම |
| | සංවර්ධනය වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම, එකිනෙකා අතර කර්මාන්ත වර්ගීකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයන් සැකසීම |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි පළාත් දායකත්වය

| ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජන(%) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **තිරසර සංවර්ධන අරමුණ - සවිමත් යටිතල පහසුකම් ගොඩනැගිම,පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම** | | | |
| සියළු දෙනාම අන්තර්ගතවන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වනවිට ජාතික දායකත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම. | 30 | 98 | 98 |
| විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම්දාමයන්ට ඒකාබද්ධ කිරීම | 50 | 98 | 98 |
| සංවර්ධනය වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම, එකිනෙකා අතර කර්මාන්ත වර්ගීකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයන් සැකසීම | 50 | 97 | 96 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **9.2** | 9.1.1<br>9.1.2 | පොල් ගස ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය | 1.05 | 0.42 |
| **9.3** | 9.3.1 | අලෙවි ප්‍රවර්ධන වැඩසටහන | 0.21 | 0.16 |
| | | ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.28 | 0.28 |
| **9.ආ** | 9.ආ.1 | අභ්‍යාසලාභීන්ගේ දැනුම වර්ධනය කිරීම | 0.88 | 0.65 |
| | | හඳුනාගත් ආයතනවල යටිතල පහසුකම් ඇති කිරීම හා අළුත්වැඩියා කිරීම | 6.61 | 6.03 |

## කාර්ය සාධන ඉලක්ක - 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධක දර්ශක | ඉලක්ක | | වියදම | |
|---|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2019 | 2020 |
| ආධුනික පුහුණුලාභීන් වර්ධනය | පුහුණුලාභීන් සංඛ්‍යාව | 200 | 250 | 0.65 | 0.50 |
| පුහුණුව හා තාක්ෂණික දැනුම දීම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 12 | 15 | 0.30 | 0.50 |
| නිෂ්පාදනය වැඩිදියුණු කිරීම | නිෂ්පාදන වටිනාකම රු.මි. | 25 | 26 | 23 | 41 |
| විකුණුම් ආදායම වැඩිකර ගැනීම | විකුණුම් වටිනාකම රු.මි. | 24 | 24 | 57.90 | 0.00 |
| කර්මාන්ත ප්‍රදර්ශනය හා අලෙවි වැඩ සටහන් පැවැත්වීම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 02 | 05 | 07 | 09 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණ | ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය ( %) |
|---|---|---|---|---|
| වඩු හා පේෂකර්ම මධ්‍යස්ථාන වෙත පුහුණුව සඳහා යොමුවන ආධුනිකයින්ගේ සංඛ්‍යාව වර්ධනය කරගැනීම | විඩීයෝ දර්ශන නිළ ඇඳුම් ලබාදීම පුහුණුව අවසන් කරන අයවළුන් සඳහා වඩු උපකරණ ලබාදීම හා පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම් ලබා දීම තුළින් දිරි ගැන්වීම, පුහුණ වැඩසටහන් පැවැත්වීම | 0.88 | 0.65 | 100 |
| පේෂකර්ම අංශයේ සහ වඩු පාසල් අංශයේ නිෂ්පාදනය වැඩිදියුණු කර විකුණුම් තුළින් ආදායම් උත්පාදනය කර පළාත් රාජ්‍ය ආදායමට යම් දායකත්වයක් සැපයීම | කර්මාන්ත ප්‍රදර්ශනය තුළින් තරඟකාරී ලෙස නිෂ්පාදන ඉහළ නැංවීම සහ ඇගයීම,පේෂකර්ම හා වඩු පුහුණු මධ්‍යස්ථාන යටිතල පහසුකම් සංවර්ධනය සහ නව යන්ත්‍රෝපකරණ හා ගෘහ භාණ්ඩ සැපයීම තුළින් නිෂ්පාදනය වැඩිකර ගැනීම,රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හී ඇණවුම් තුළින් ආදායම ඉහළ නංවා ගැනීම | 10.30 | 7.90 | 100 |
| අලෙවි වැඩසටහන් පැවැත්වීම හා තෝරාගත් කර්මාන්ත කරුවන් වෙත සහනදායී පදනමට අලෙවි කුටි ලබාදීම | ජංගම අලෙවි වැඩසටහන් , අලෙවිපොල වැඩසටහන පැවැත්වීම, ප්‍රාදේශිය හා ජාතික මට්ටමින් අලෙවි වැඩසටහන් පැවැත්වීම හා කර්මාන්ත ප්‍රදර්ශනයේ අලෙවි කුටි 100ක් නොමිලේ ලබා දීම | 11.1 | 8.07 | 100 |

## ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අදහස් හා යෝජනා

දැක්ම මෙහෙවර හා සමගාමීව යන පේෂකර්ම හා වඩු අංශයන්හී අලෙවි ප්‍රවර්ධන කිරීම සඳහා නව පේෂකර්ම අලෙවිසැලක් හබරණ ප්‍රදේශයේත් වඩු ප්‍රදර්ශනාගාරයක් කැකිරාව ප්‍රදේශයේත් ඉදි කිරීමට යෝජිතය. මිලදී ගන්නා නූල්වල පිරිවැය වැඩිවීම හා නියමිත වේලාවට නූල් නොලැබීම හේතුවෙන් ආයතනයේ නිෂ්පාදන කටයුතුවලට බාධාවන් ඇතිවන බැවින් පේෂකර්ම නූල් වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයක් සංවර්ධනයට මෙවර ප්‍රමුඛ ස්ථානයක් ලබා දී ඇත. නිසි වේලාවට නියමිත ගුණත්වයෙන් යුතු නූල් අඩු පිරිවැයක් යටතේ ලබා ගැනීමටත් එමගින් ප්‍රතිලාභ කාර්මිකාවන්ට ලබා දීමත් අරමුණුකර ගෙනය.

වඩු හා පේෂකර්ම මධ්‍යස්ථානයන්හී නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීමට අවශ්‍ය වන උපකරණ මිලදී ගැනීම්, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් හා අනෙකුත් අළුත්වැඩියාවන් සිදු කිරීමට නියමිතය.

## අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

2020 වර්ෂය සඳහා ප්‍රධාන වශයෙන් දැක්ම,මෙහෙවර හා සමගාමීව යන පේෂකර්ම වඩු අංශයන්හී අලෙවි ප්‍රවර්ධනය කිරීම සඳහා නව පේෂකර්ම අලෙවිසැළක් හබරණ ප්‍රදේශයේත් වඩු ප්‍රදර්ශනාගාරයක් කැකිරාව ප්‍රදේශයේත් ඉදි කිරීමට යෝජිතය. පේෂකර්ම නූල් වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයක් සංවර්ධනයට මෙවර ප්‍රමුඛ ස්ථානයක් ලබා දී ඇත්තේ අමුද්‍රව්‍ය පිරිවැය අඩුකර ගැනීමටත් ප්‍රතිලාභ කාර්මිකාවන්ට ලබා දීමත් අරමුණු කරගෙනය. වඩු හා පේෂකර්ම මධ්‍යස්ථානයන්හී නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීමට අවශ්‍ය වන උපකරණ මිලදී ගැනීම්, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් හා අනෙකුත් අළුත්වැඩියාවන් ඇතුළත් කර ඇත.

තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි පළාත් දායකත්වය සැපයීමෙහිලා දෙපාර්තමේන්තුව විසින් රු.මි.9කට ආසන්න මුදලක් 2019 වර්ෂය වෙනුවෙන් ආයෝජනය කර ඇත. එහිදී උතුරු මැද පළාත තුළ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් මෙන්ම ව්‍යවසායකයින්ටත් පාසල් හැර යන ළමුන් ද ඇතුළුව විශාල පිරිසක් මෙම ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් මගින් ප්‍රතිලාභ ලබා ඇත.

| ක්‍රියාකාරකම් | ඉලක්ක(%) | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| | 2020 | 2021 | |
| **කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය** | | | |
| පුහුණු පැවැත්වීම | 20 | 30 | රැකියා විරහිත තරුණ තරුණියන් හස්ත කර්මාන්ත ,පේෂ හා වඩු කර්මාන්ත අංශයේ නියුතු වුවන් වර්ධනය කිරීම |
| **කර්මාන්ත අංශයේ ආයෝජන ප්‍රවර්ධනය** | | | |
| කර්මාන්ත සංවර්ධනය | 20 | 25 | දිළිඳු ජනතාව කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවා නියුක්ත කරලීම තුළින් ජීවන තත්වය ඉහළ නැංවීම |
| **නිෂ්පාදන හා වෙළෙඳපොළ අවස්ථා සංවර්ධනය කිරීම** | | | |
| අලෙවිපොළ වැඩසටහන් | 50 | 50 | හස්ත, පේෂ,ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවා නියුක්ත කරලීම තුළින් රටේ ජාතික නිෂ්පාදනයට උතුරු මැද පළාතේ වන දායකත්වය ඉහළ නැංවීම |
| **පර්යේෂණ හා සංවර්ධනය** | | | |
| පුහුණු පැවැත්වීම | 35 | 25 | |
| ආයතනික ධාරිතා සංවර්ධනය | | | |
| පුහුණු පැවැත්වීම | 35 | 55 | |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

මෙම දෙපාර්තමේන්තුව සඳහා 2019 වර්ෂයට ලැබුණු ප්‍රතිපාදන මගින් පේෂකර්ම මධ්‍යස්ථාන 14ක්ද වඩු මධ්‍යස්ථාන 07ක්ද නවීකරණය කිරීම හා යටිතල පහසුකම් සැපයීම සිදු කරන ලදී. මෙහිදි ඌන උපයෝජනයකින් තොරව සියළුම ව්‍යාපෘතීන් 100%කින් නිම කිරීමට මෙම වර්ෂයේදී හැකි විය. වඩු කර්මාන්ත අංශය පිළිබඳ සලකා බැලීමේදී වසර ගණනාවක් නවතා තිබූ උසස් පුහුණු පාඨමාලාව නැවත ආරම්භ කිරීමටත් ඒ හරහා වඩු කර්මාන්තයට පිවිසෙන්නන්හට අත්වැලක් ලබා දීමටත් අවස්ථාව උදා විය. උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පාසල් ඩෙස්ක් පුටු නිෂ්පාදනය මෙම දෙපාර්තමේන්තුවේ වඩු පාසල් හරහා සිදු කිරීම තුළින් පළාතෙහි මුදල් පළාත තුළම උපයෝජනය කිරීමටත් එමගින් පුහුණුලාභීන්ට හා කාර්මිකයන්ට හොඳ ආදායමක් උපයා ගැනීමටත් අවස්ථාව සැලසිණි. පේෂකර්ම අංශයෙහි පසුගිය වර්ෂයට සාපේක්ෂව නිෂ්පාදන ප්‍රමාණය සහ අලෙවි ආදායම ඉහළ නංවා ගැනීමට හැකි විය.

වැඩකිරීමට සුදුසු වාතාවරණයක් සකස්කරදීම හේතුවෙන් හා හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා ප්‍රාග්ධන උපකරණ සැපයීම හේතුවෙන් ජාතික මට්ටමේ විවිධ සම්මාන හා කුසලතා හිමිකර ගැනීමට හැකි විය.මේ අතර පේෂකර්ම උපදේශිකාවන් හා පේෂකාර්මිකාවන්ගේ වඩු උපදේශකයින්ගේ හා වඩු පුහුණුලාභීන්ද උතුරු මැද පළාත තුළ විසිරී සිටින හස්ත කර්මාන්ත ශිල්පීන් හා කුඩා කර්මාන්තකරුවන්ද විය.

2019 වර්ෂයේ පළාත් කර්මාන්ත ප්‍රදර්ශනයේදී වඩු පාසල් අතර තරඟයෙන් හොඳම නිර්මාණය අල්මාරියක් අකුලා ඇඳක් සකස් කිරීම වෙනුවෙන් මානිංගමුව වඩු පුහුණු පාසලට ද දෙවන ස්ථානය අකුලා තැබිය හැකි මේසයක් හා පුටු වෙනුවෙන් කලාවැව වඩු පුහුණු පාසලට ද නිර්මාණාත්මක ඇඳක් සකස් කිරීම වෙනුවෙන් මැදැරිගිරිය වඩු පුහුණු පාසලට ද හිමි විය.

පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත වෙනුවෙන් පළාත් කුසලතා පළමු දෙවන හා තෙවන ස්ථාන මෙන්ම කුසලතා සම්මාන 124ක් ද ජනාධිපති සම්මාන ජාතික ප්‍රදර්ශනයේදී ප්රථම ස්ථාන 03ක් ද දෙවන ස්ථාන 03ක් ද තෙවන ස්ථාන 04ක් ද කුසලතා සම්මාන 13ක් ද හිමිකරගෙන ඇත.

මුහුණ දුන් අභියෝග හා ගැටළු වශයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාද වී ලැබීම, අළුත්වැඩියාව සඳහා ඉංජිනේරු ඇස්තමෙන්තු ලබා ගැනීමට ප්‍රමාද වීම, රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුව වර්ෂයට වෙන් වූ ප්‍රතිපාදන අගයෙන් 25%ක් රඳවා ගැනීම නිසා ව්‍යාපෘති අවලංගු කිරීමට හා සීමා කිරීමට සිදු වීමට සිදු වුවද මුදල් රෙගුලාසි ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති අනුගමනය කරමින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක කරා ළඟා වූ වසරක් ලෙස 2019 වසර සඳහන් කළ හැකිය.

# 9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

2003 අංක 2 දරණ උතුරු මැද පළාත් ප්‍රඥප්ති ප්‍රකාරව මෙම ආයතනය ආරම්භකර ඇත.

### දැක්ම

“උතුරු මැද පළාතේ හොඳම කර්මාන්ත ප්‍රවර්ධකයා වෙමින් තිරසාර සංවර්ධනයේ ප්‍රධානතම පහසුකම් සලසන්නා වීම”.

### මෙහෙවර

“උතුරු මැද පළාතේ සම්පත් ඵලදායි ලෙස යොදා ගනිමින් වෙළඳපොළ අභිමුඛ කාර්මීකරණයක් තුළින් අදාළ පාර්ශවකරුවන් සමඟ උතුරු මැද පළාතේ නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම”.

### දිගුකාලීන අරමුණු

- පළාතේ කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම.
- පළාතේ කර්මාන්ත ව්‍යාප්තිය හා නවීකරණය කිරීම.
- පළාතේ කර්මාන්ත විවිධාංගීකරණය හා දිරි ගැන්වීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් සොයා දීමට මැදිහත්වීම.

### කෙටිකාලීන අරමුණු

- පළාතේ නව කර්මාන්ත බිහි කිරීම සහ පවත්නා කර්මාන්තවල ප්‍රවර්ධනයක් ඇති කිරීම.
- පළාතේ නව සහ දැනට පවත්වාගෙන යනු ලබන කර්මාන්ත අධිකාරිය යටතේ ගාස්තු ප්‍රමාණයක් යටතේ ලියාපදිංචි කිරීම.
- පවතින සහ නව කර්මාන්ත සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන හා තාක්ෂණික පුහුණු පාඨමාලා පැවැත්වීම.
- පළාතේ කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා සහන මිලකට උපකරණ ලබා දීම.
- පුහුණු කිරීම හා උපදේශන සේවා මගින් පළාතේ කර්මාන්ත ඒකකවල කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- තාක්ෂණික පැවරීම්, තාක්ෂණික තොරතුරු ලබා ගැනීම සහ බෙදා හැරීම යාවත්කාලීන කරන ලද තාක්ෂණය සහ නව තාක්ෂණය යනාදි සේවාවන් ව්‍යවසායකයින් වෙත ලබා දීම.
- කර්මාන්ත නිෂ්පාදනවල අලෙවිය පහසු කරනුවස්, සම්මන්ත්‍රණ වැඩමුළු, දේශීය හා විදේශීය අලෙවි පොළවල් හා ප්‍රදර්ශන පැවැත්වීම.

## ප්‍රධාන කාර්යයන්


- ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික, ව්‍යවසායක පුහුණු හා මූල්‍ය පහසුකම්, තාක්ෂණික උපකරණ ලබාදීම.
- ව්‍යවසායක සංගම් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.
- පළාතේ කර්මාන්තකරුවන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිකර ගැනීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- යටිතල පහසුකම් සැලසීම.
- මූල්‍ය පහසුකම් සලසා දීම.
- ආකල්ප වර්ධනයට හා කුසලතා වර්ධනයට සුදුසු දේශකයන් යොදා ගැනීම.
- වෙළෙඳපොල අවස්ථා සලසා දීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | අනුමත | 12 |
| 02. | සේවයේ නියුතු | 04 |
| 03. | පුරප්පාඩු | 08 |
| 04. | අනියම් | 03 |
| 05. | තාවකාලික | 02 |
| 06. | කොන්ත්‍රාත් | 01 |
| 07 | පුහුණු | 01 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| පුද්ගලික පඩිනඩි | 3.55 | 3.55 | 0.00 | 100 |
| ගමන් වියදම් | 0.13 | 0.13 | 0.00 | 100 |
| සැපයීම් | 0.27 | 0.27 | 0.00 | 100 |
| නඩත්තු වියදම් | 0.30 | 0.30 | 0.00 | 100 |
| ගිවිසුම්ගත සේවා | 0.27 | 0.27 | 0.00 | 100 |
| **එකතුව** | **4.52** | **4.52** | **0.00** | **100** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම - 2019

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසායක ණය ලබා දීම | පළාතේ ව්‍යවසායකයින් අසූහත්දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව ණය ලබා දීම | සුළු පරිමාණ ව්‍යවසායකයින් නඟා සිටුවීම | 87 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | පළාතේ ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික පුහුණු වැඩ සටහන් දෙකක් පැවැත්වීම | නිවැරදි තාක්ෂණික දැනුමින් පරිපූර්ණ ව්‍යවසායක පිරිසක් බිහි වීම | 40 |
| අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පහක් පැවැත්වීම | කර්මාන්තකරුවන්ගේ වෙළඳ පොල අවස්ථා වැඩිදියුණු කරමින් නිෂ්පාදන අලෙවිය වැඩිකිරීම සඳහා දායක වීම. | 75 |
| අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | 2019 වර්ෂයේ උතුරු මැද පළාත් කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශණය සඳහා ආයතනයේ ලියාපදිංචි ව්‍යවසායකයින් සහභාගි කරවීම. | නව කර්මාන්තකරුවන් වෙළඳපොලට හඳුන්වා දෙමින් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිය වැඩිකිරීමට දායක වීම. | 25 |
| පළාතේ ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්තකරුවන් හඳුනා ගැනීම | උතුරු මැද පළාතේ ක්ෂුද්‍ර හා සුළු කර්මාන්තකරුවන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීම | හඳුනාගත් සුළු හා ක්ෂුද්‍ර කර්මාන්තකරුවන් ලියාපදිංචි කරමින් ඔවුන්ට අවශ්‍ය ණය සහ වෙළඳ පොළ අවස්ථා ලබාදෙමින් දිරිගැන්වීම. | 277 |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2019 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වාහන | - | 0.18 | 0.00 | 0 |
| **එකතුව** | | **0.18** | **0.00** | **0** |

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශන | ආයෝජනය (රු.) | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය |
| 01 | 1.1 , 1.2.1 | ව්‍යවසායකයින් සංඛ්‍යාව | 0.04 | 0.03 |
| 08 | 8.3 , 8.3.1 | බිහිවූ නව ව්‍යවසායකයින් සංඛ්‍යාව | 0.04 | 0.03 |
| 09 | 9.3 , 9.3.2 | මූල්‍ය වශයෙන් සවිබල ගැන්වූ ව්‍යවසායකයින් සංඛ්‍යාව | 8.20 | 8.20 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජන (රු.) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | 1.1 | 1.2.1 | තාක්ෂණික පුහුණු | 0.04 | 0.03 |
| 08 | 8.3 | 8.3.1 | | 0.04 | 0.03 |
| 09 | 9.3 | 9.3.2 | සුළු පරිමාණ ණය වැඩසටහන් | 8.20 | 8.20 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභින් සංඛ්‍යාව | ප්‍රා. ලේ. කො ගණන/ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| තාක්ෂණික පුහුණු | පුහුණු වැඩමුළු පැවැත්වීම | 50 | ප්‍රා.ලේ.කො 03 |
| සුළු පරිමාණ ණය වැඩසටහන | සුළු පරිමාණ ණය නිකුත් කිරීම | 84 | ප්‍රා.ලේ.කො 12 |
| ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම | ව්‍යවසායකයින්ට ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීම | 277 | ප්‍රා.ලේ.කො 19 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද තාක්ෂණික පුහුණු වැඩසටහන්, සුළු පරිමාණ ව්‍යවසායකයන්ට ණය ලබා දීමේ වැඩසටහන් මගින් තිරසර අරමුණු 01,08,09 ළඟාකර ගැනීමට හැකිවිය. තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් 2019 වර්ෂයේදී නව ව්‍යවසායකයන් 50 දෙනෙකුගේ දැනුම මට්ටම ඉහළ නැංවූ අතර සුළු පරිමාණ ණය ලබාදීමේ වැඩසටහන මගින් ව්‍යවසායකයන් 84 දෙනෙකු මූල්‍ය වශයෙන් සවිබල ගැන්වීම සඳහා රු 8,200,000 මුදලක් යොදවන ලදි.

## කාර්ය සාධන ඉලක්ක 2018-2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක | | ආයෝජනය (රු.මිළි) | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 01. | ව්‍යවසායකයින්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම | හැකියා වර්ධනය | 10 | 15 | 0.03 | 11.30 |
| 02. | ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා ණය පහසුකම් ලබාදීම | ධාරිතා වර්ධනය | 10 | 15 | 8.20 | 11.30 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ව්‍යවසායකයින්ගේ තාක්ෂණික හැකියාව වර්ධනය කිරිම. | තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. | නව ව්‍යවසායකයින් බිහි කිරීම | 0.035 | 0.03285 | 94 |
| සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍යමය හැකියාව වර්ධනය කිරිම | සුළු පරිමාණ ව්‍යවසායකත්ව ණය වැඩසටහන | නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම | 8.2 | 8.2 | 100 |

## තම ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

### නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම Quality Improvements

උතුරු මැද පළාතේ ව්‍යවසායකයන් මුහුණ දෙන ගැටළුවක් වන්නේ නිෂ්පාදන ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතිම නිසා ඔවුන්ට අනෙකුත් නිෂ්පාදකයන් සමඟ තරඟයක් ලබාදීමට නොහැකි නිසා ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිය පහළ මට්ටමක පැවතිමයි. මේ සඳහා ව්‍යවසායකයන්ගේ නිෂ්පාදනවල අලංකාරය, කල්පැවැත්ම, නිමාව, වැඩිදියුණුකර නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කළ යුතුය. මෙමගින් ව්‍යවසායකයන්ට වෙළඳපොළ තරඟයට මුහුණ දීමට හැකිවන අතර, ඔවුන්ගේ නිෂ්පාදනවල අලෙවිය වැඩි වී ආදායම් තත්වය ඉහළ යනු ඇත.

### වෙළඳපල සංවර්ධනය Market Development

දක්ෂ ව්‍යවසායකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවිකර ගැනීමේ ගැටළුවකට උතුරු මැද පළාතේ ව්‍යවසායකයන් මුහුණ පා සිටින අතර එම නිසා ව්‍යවසායකයන්ගේ ආදායමද පහළ මට්ටමක පවතී. වෙළඳපල සංවර්ධනය තුළින් වාර්ෂික මාසික ප්‍රදර්ශන පැවැත්වීම, අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම තුළින් ව්‍යවසායකයන්ට වෙළඳපල සඳහා ප්‍රවේශ වීමට පහසුකම් සපයන අතර, තොග ගැනුම්කරුවන් සම්බන්ධ කිරීම තුළින් නිෂ්පාදන අලෙවිය ඉහළ නැංවීම මේ තුළින් සිදුවේ.

### ව්‍යවසායකත්ව සංවර්ධනය Entrepreneur Developments

ව්‍යවසායකයන්ට ව්‍යාපාර ක්ෂේත්‍රයේ මූල්‍ය කළමනාකරණය ගිණුම්කරණය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුම නොමැති නිසා අඛණ්ඩ ව්‍යාපාර කටයුතු සාර්ථකව කරගෙන යාමේ ගැටළු පැනනැගීම නිසා උතුරු මැද පළාතේ කර්මාන්ත වැසී යාමේ තර්ජනයට මුහුණ පා සිටී. උතුරු මැද පළාතේ ව්‍යවසායකයින් රැකගැනීමේ අරමුණින් පළාතේ ව්‍යවසායකයන් ඉලක්ක කර ගනිමින් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමුකර ව්‍යවසායකයා නඟා සිටුවිය යුතුය.

### අන්තර් පළාත් දැනුම හුවමාරු වැඩ සටහන් Knowledge sharing Programmes

උතුරු මැද පළාතේ ව්‍යවසායකයන් අනෙකුත් පළාත් ව්‍යවසායකයන් සමඟ සම්බන්ධකර අත්දැකීම්, තාක්ෂණය, දැනුම, හුවමාරු කරවීම අත්‍යාවශ්‍ය වන අතර, මෙමඟින් නව දැනුම තාක්ෂණය පළාත් අතර ව්‍යවසායකයින්ගේ දැනුම හුවමාරු වී ඔවුන්ගේ නිෂ්පාදන ශිල්ප ක්‍රම, අලෙවි උපක්‍රම වැඩිදියුණුකර ගැනීමට අවස්ථාව උදා වේ.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| | 2020 | 2021 | |
| ක්ෂුද්‍ර, කුඩා හා අත්කම් කර්මාන්ත සංවර්ධනය කිරීම | 15% | 20% | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව තුරන්කිරීම |
| හැකියා හා වෘත්තිමය සංවර්ධනය | 15% | 25% | සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව තුරන් කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළුම කාන්තා හා ගැහැණු ළමුන් සවිබල ගැනීම. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස





කර්මාන්ත සංවර්ධන අධිකාරිය, 2019 වර්ෂය තුළ විවිධ අභියෝග, ගැටළුවලට මුහුණ දෙමින් කටයුතු කරන ලද අතර, 2019 වර්ෂයේ උතුරු මැද පළාත් සභාව දේශපාලන නායකත්වයෙන් තොරවීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මූල්‍ය පහසුකම් සපයාගැනීමට නොහැකි වීම හා ක්‍රියාත්මක කළයුතු යෝජනා පිළිබඳ මහජන අදහස් ගලා නොයෑමේ අභියෝගයන්ට මුහුණ දුන් අතර, එම අභියෝග හා ගැටළුවලට ආයතන සතු ප්‍රමාණවත් නොවන මූල්‍ය හා භෞතික, මානව සම්පත් සමඟ සසඳන විට හිඟ සම්පත්වලින් සෑහිමකට පත්විය හැකි සේවාවක් උතුරු මැද පළාතේ ව්‍යවසායකයන්ට ලබා දෙන ලදි. හිඟ සම්පත් මනා ලෙස කළමනාකරණය කරමින් මෙහෙයවීම හා නිවැරදි නායකත්වය ලැබීම තුළින් අභියෝග ජයගනිමින් කටයුතු කළ අතර, ආයතනය සතු මූල්‍ය, භෞතික හා මානව සම්පතට සාපේක්ෂව ලබාගත් කාර්යය සාධනය ප්‍රමාණවත් බව පැහැදිළි වේ.

කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණදුන් අභියෝග හා ගැටළු ලෙස උතුරු මැද පළාත තුළ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුණු හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී එම පෘථුල කාර්යය භාරය ඉටුකිරීමට සමපාත ප්‍රශ්ධන සම්පාදනයක් හා කාර්යය මණ්ඩලයක් අධිකාරිය සතු නොවීම, ගතවූ කාල පරිච්ඡේදය තුළ බඳවාගැනීමේ පරිපාටි අනුමත කරවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් අනුමත කාර්යය මණ්ඩලය හෝ බඳවා ගැනීමට නොහැකි වීම, 2019 වර්ෂයේ පළාත් සභාව දේශපාලන නායකත්වයෙන් තොර වීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මූල්‍ය පහසුකම් හා ක්‍රියාත්මක කළ යුතු යෝජනා පිළිබඳ මහජන අදහස් නොලැබීම, ව්‍යවසායකයන් සම්බන්ධකර ගැනීම සහ ඔවුන්ගේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට අධිකාරිය සතුව වෙබ් අඩවියක් නොමැති වීම හා කාර්යක්ෂමව ණය ලබාදීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට දත්ත පද්ධතියක් නොමැති වීම සඳහන් කළ හැකිය.

# 9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය ආරම්භ වීමෙන් පසු මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක කරන ලද පොදු ප්‍රවාහන සේවාවන් පළාත් සභා විෂයපථය යටතට ඇතුළත් කොට ඇත. ඒ අනුව ඒ ඒ පළාත් සභා විසින් ප්‍රඥප්ති අනුමත කරවා " පළාත ඇතුළත මෝටර් වාහන මඟින් මාර්ග ඔස්සේ මගීන් ගෙන යෑමේ සේවා සහ භාණ්ඩ ගෙනයාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම" යන ව්‍යවස්ථාමය බලතල ක්‍රියාත්මක කරනුවස් 1994 අංක 08 දරණ ප්‍රඥප්තිය මගින් උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවන ලදී. වර්තමානය වනවිට උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් මහඟු කාර්යභාරයක් ඉටු කරයි. බස් රථ ඇතුළු මඟී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය, ආරක්ෂිත හා ගුණාත්මක මඟී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම, බස්නැවතුම්පළ කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය ආදී කරුණු ප්‍රධාන වන අතර එමඟින් ජාතික ආර්ථිකයට සපයන දායකත්වය සුළුපටු නොවේ. නිදසුනක් ලෙස 2019 වර්ෂය අවසන් වන විට උතුරු මැද පළාත් මර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පමණක් බස් රථ 687ක් ද, ත්‍රී රෝද රථ 6,744 ක් ද භාණ්ඩ ප්‍රවාහන රථ 61 ක් පමණ ද, පාසැල් ප්‍රවාහන රථ 28 ක් ද, සිසු සැරි බස් රථ 103 ක් ද අධිකාරියේ ලියාපදිංචි කොට පළාත් ප්‍රවාහන පද්ධතියට එකතුකොට ඇත. උතුරු මැද පළත තුළ සංසරණයවන බස් රථ නියාමනය කිරීම සඳහා දිස්ත්‍රික්ක දෙකෙහි කාර්යාල දෙකක් පිහිටුවා ඇත. උතුරු මැද පළාතේ මාර්ග 250ක් පිහිටා ඇත. පළාත තුළ ප්‍රධාන බස් නැවතුම්පළ 20 ක් හා උප බස් නැවතුම්පළ 21ක් ස්ථාපිතකර ඇති අතර එහි නියුක්ත සේවක සංඛ්‍යාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ 50ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 22ක්ද අනුරාධපුර ප්‍රධාන කාර්යාලයේ සේවක සංඛ්‍යාව 46ක්ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ සේවක සංඛ්‍යාව 06කි.

දෛනිකව ධාවනය වන ගමන් වාර සංඛ්‍යාව 6,980ක් පමණ වන අතර මෙම පළාත තුළ ධාවනය වන බස් රථවල සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව 2800 ක් පමණ වේ.

## දැක්ම

“කාර්යක්ෂම ජනතාවාදී ප්‍රවාහන සේවාවක්”.

## මෙහෙවර

“මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා හා යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම හා නියාමනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් පළාත් සභාව විසින් පළාතේ ජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික පරිපාලනමය හා සමාජ සුභසාධනමය කටයුතු අරමුණු කරගෙන සැලසුම් කරනු ලබන ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රවාහන සේවා පද්ධතිය කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමත් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## කෙටිකාලීන අරමුණු

- පළත් අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කරනු ලබන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ, පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ සහ වෑන්රථ, මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවයේ යෙදෙන සියළුම රථ වාහන, කාර්යාල සහ ඇඟළුම් සේවයේ යෙදෙන සියළුම රථ වාහන නියාමනය කිරීම සහ එකී සේවාවන්හී ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවනු වස් නව තාක්ෂණය පදනම් කරගත් කාර්යයන් කිරීම.

- කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ කටයුතුවල සේවයේ නියැලී සිටින කාර්ය මණ්ඩලවල මෙන්ම අධිකාරිය මගින් නියාමනය කරනු ලබන විවිධ අංශවල ප්‍රවාහන සේවා සපයන කාර්ය මණ්ඩලයන්හි කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වර්ධනය කරනු වස් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මෙහෙයුම් හා නියාමන කටයුතු විධිමත් කරනුවස් නවීන තාක්ෂණය හඳුන්වා දීම.
- ආයතනයේ ආදායම් තත්වය ඉහළ නංවනුවස් නව ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දීම හා පවත්නා ආදායම් මාර්ග පුළුල් කිරීම සහ විධිමත් කිරීම.

## ප්‍රධාන කාර්යයන් හා උපාය මාර්ග

**01.මගී ඉල්ලුම අනුව මගී ප්‍රවාහන බස්රථ සඳහා නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ මගී ප්‍රවාහන බස් රථ සේවය සඳහා නව බලපත්‍ර නිකුත් කිරීමේදී මගී ඉල්ලුම හඳුනා ගැනීම, නියමිත ක්‍රමවේද අනුගමනය කොට නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සහ ධාවනයට සුදුසු බස්රථ ධාවනයට එකතු කිරීම.

♣ මගී සහ භාණ්ඩ සංසරණය සඳහා ප්‍රධාන මාර්ගයන්හි ප්‍රවාහන පහසුකම් යම් ඉහළ මට්ටමකට පවත්වන නිසා ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් ඉහළ නැංවීම සඳහා වැඩි අවධානය යොමු කිරීම සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම.
♣ නිත්‍ය නව බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම අත්හදා බැලීමේ පදනම මත තාවකාලික බලපත්‍ර නිකුත් කොට ව්‍යවසායක ආකර්ශනය ලබා ගැනීම හා ධාවන ගැටළු හඳුනා ගැනීම.

♣ අත්හදා බැලීමේ කාලසීමාව තුළ හෝ නිත්‍ය බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ග්‍රාමීය මාර්ග පද්ධතියේ පවතින ගැටළු මගී ජනතාව මගින් ලබා ගැනීම

**02.මගී ඉල්ලුම අනුව පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා සිසු සැරි සහ පාසල් ප්‍රවාහන බස්රථ සඳහා මාර්ග බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ සිසු ඉල්ලුම අනුව (සමීක්ෂණය මගින් හා කේවල ඉල්ලීම් අනුව) නියමිත ක්‍රමවේද අනුගමනය කොට ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත සිසු සැරිය සේවාව සඳහා නිර්දේශ ඉදිරිපත් කොට සිසු සැරිය බස්රථ සේවයට එකතු කිරීම.

♣. බස්රථ අවශ්‍යතා ඇති මාර්ගයන්හි සිසු ප්‍රවාහන බස්රථ සේවයට එක් කිරීම (නියමිත ක්‍රමවේද අනුගමනය කොට බලපත්‍ර ලබා දීමෙන්)

**03. භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලොරි රථ හා වෙනත් රථ සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ පළාත තුළ සංසරණය වන භාණ්ඩ ප්‍රවාහන රථ (විවිධ ආර්ථික කටයුතු පදනම් කරගෙන) පිළිබඳ සමීක්ෂණයක් කොට නියමිත අවශ්‍යතා පෙන්වා දෙමින් බලපත්‍ර නිකුත් කිරීම.
♣ භාණ්ඩ ප්‍රවාහන රථ සඳහා නැවතුම් ස්ථාන ලකුණුකර දිම.(අදාල පාර්ශවයන්ගේ නිර්දේශ ලබාගෙන)
♣ ශ්‍රී ලංකා පොලීසියේ සහය ලබාගෙන බලපත්‍ර ලබාගනුවස් භාණ්ඩ ප්‍රවාහන කුලී රථකරුවන් අධිකාරිය වෙත පොළඹවා ගැනීම.
♣ විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් පවත්වා ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**04. මගී ආවරණ ඉදිකිරීම සහ අබලන්වූ ස්ථාන ප්‍රතිසංස්කරණය.**

♣ පළාත පුරා සමීක්ෂණ කොට මගී ආවරණ ඉදි කිරීම සඳහා විවිධ ආයතන හා පුද්ගලයින් නැඹුරු කරවා ගැනීම.
♣ අබලන් මගී ආවරණ සුදුසු පරිදි නවීකරනය කිරීම.
♣ මගී ආවරණ ඉදි කිරීම මගින් මගී පහසුව සහ ආරක්ෂාව උපරිම අයුරින් සැලකිල්ලට ගැනීම.

**05.** **භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා ත්‍රි රෝද රථ සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග ).**

♣ බලපත්‍ර රහිතව මගී ප්‍රවාහනයේ යෙදෙන ත්‍රි රෝද රථ හඳුනාගෙන අධිකාරියේ ලියාපදිංචි කරවාගෙන බලපත්‍ර නිකුත් කිරීම.
♣ නිශ්චිත ත්‍රිරෝද රථගාල් ස්ථාපිත කර දී ප්‍රවාහනයේ යෙදීමට අවසර ලබා දීම.
♣ ශ්‍රී ලංකා පොලිසියේ සහය ලබාගෙන බලපත්‍ර ලබා ගැනීමට පෙළඹවීම.
♣ අනවසර ත්‍රි රෝද රථකරුවන් නීතියේ රැහැනට හසුකරගෙන (ලියාපදිංචිය මගහරිමින් සිටින ලියාපදිංචියට නැඹුරු කරවා ගැනීම.
♣ ලියාපදිංචි ත්‍රී රෝද රථවල පමණක් ගමන් ගන්නා ලෙස මගී ජනතාව දැනුවත් කිරීම තුළින් නව ලියාපදිංචිය වැඩිකර ගැනීම.
♣ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන කේන්ද්‍ර කරගෙන ත්‍රි රෝද රථ ගාල් පිහිටුවා නව බලපත්‍ර ලබා ගැනීම සඳහා ත්‍රි රෝද රථකරුවන් ආකර්ශනය කර ගැනීම.
♣ ත්‍රි රෝද රථ පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය හා ඒකාබද්ධ වී කටයුතු කිරීම.
♣විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් කොට ලියාපදිංචිය ආකර්ශනය කිරවීම.

**06.** **කාර්යාල සහ ඇඟළුම් සේවක ප්‍රවාහනය සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ ඇඟළුම් කර්මාන්ත සම්බන්ධව සමීක්ෂණයක් කොට ඒවායේ සේවකයින් ප්‍රවාහනය සඳහා යොමු වී ඇති බස්රථ හෝ වෑන් රථ හඳුනා ගැනීම,ලියාපදිංචි කිරීම.
♣ නියාමන අවශ්‍යතා හඳුන්වා දෙමින් ඇඟළුම් කර්මාන්ත සේවක ප්‍රවාහනයේ යෙදී සිටින්නන් දැනුවත් කිරීම.
♣ කාර්යාල සේවක ප්‍රවාහනයේ යෙදී සිටින්නන් ආයතනයේ ලියාපදිංචි කරවා ගැනීමට කටයුතු කිරීම.
♣ ලියාපදිංචි බස් රථයක හෝ වෑන් රථයක පමණක් ප්‍රවාහන පහසුකම් සලසා ගන්නා ලෙස කාර්යාල සේවයේ නියුත් වුවන් දැනුවත් කිරීම.
♣ කාර්යාල සේවකයින් හා ඇඟළුම් සේවකයින් ප්‍රවාහනය කරන රථ සඳහා නැවතුම් ස්ථාන ස්ථාපිත කරදීම.
♣ විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් පවත්වා ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**07.** **සිසු ප්‍රවාහන බස්රථ සහ වෑන් රථ නියාමනය කාර්යක්ෂම කිරීම විධිමත් කිරීම සහ ගුණත්වය ඉහළ දැමීම.**

♣ සිසු ඉල්ලුමට සරිලන පරිදි මාර්ග හඳුනා ගැනීම හා ප්‍රමාණවත් බස්රථ යෙදවීම.
♣ විධිමත් ආරක්ෂිත ගුණාත්මක සේවාවක් ඇති කිරීම සඳහා බස් රථ හා වෑන් රථ , සේවක මණ්ඩලය, දෙමව්පියන් හා පාසැල් දරුවන් දැනුවත් කිරීම.
♣ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම, මාර්ග සමීක්ෂණ කිරීම, සිසුන්ගෙන් හා දෙමාපියන්ගෙන් අදහස් ලබා ගැනීම,පරීක්ෂා කිරීම.
♣ මාර්ග පරීක්ෂක නිලධාරීන් යොදවා පරීක්ෂා කිරීම.

**08.** **කොන්දොස්තර,රියදුරු මහතුන් හා බස්රථ හිමියන්ගේ දැනුම ආකල්ප වර්ධනය තුළින් ගුණාත්මක බව වැඩිදියුණු කිරීම.**

♣ බස්රථ සේවා ගනයන්හී සේවයේ නියුක්ත වුවන් සහ ත්‍රි රෝද රථ රියදුරන්ගේ ආකල්ප වර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම.

## 09. ඒකාබද්ධ කාලසටහන් අනුව ධාවනයවන බස්රථවල කාර්යක්ෂමතාවය ගුණාත්මක අගය වැඩි කිරීම හා ආයතනගත කිරීම.

♣ මහජනතාවගේ සේවා අවශ්‍යතාවයට උචිත පරිදි මාර්ග සාකච්ඡා පවත්වා ධාවන ගැටළු අවම කිරීමට උත්සාහ කිරීම.
♣ ශ්‍රී ලංගම බස්රථ 40%ක් ධාවනයට එක් කිරීම. නියාමනය ආයතනය 60%ක් ධාවනයට යෙදවීම.
♣ කාලසටහන් අනුව ධාවනය කිරීම සඳහා බස්නැවතුම්පළ සේවකයින් යෙදවීම හා ලොග් සටහන් පත්‍ර අත්සන් කිරීම තුළින් දෛනිකව බස්රථ ධාවනය අධීක්ෂණය කිරීම.
♣ කොන්දොස්තර, රියදුරු මහතුන් හා බස් හිමියන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය තුලින් ගුණාත්මක බව වැඩිදියුණු කිරීම.
♣ නව බලපත්‍ර නිකුත් කරන හා දැනටමත බලපත්‍ර නිකුත්කර ඇති මගී ප්‍රවාහන සිසු ප්‍රවාහන, භාණ්ඩ ප්‍රවාහන සහ වෙනත් ප්‍රවාහන සේවා නියාමනය කිරීම.
♣ මගි ප්‍රවාහන බස්රථ ඒකාබද්ධ කාල සටහනක් අනුව ධාවනයේ යෙදවීම
♣ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා 40%ක්ද ප්‍රවාහන අධිකාරියේ බලපත්‍ර ලබන බස්රථ සඳහා 60%ක්ද වන පරිදි පළාතේ සියවම මාර්ග සඳහා කාලසටහන් සකස් කිරීම
♣ කාලසටහන් අනුව බස්රථ ධාවනයේ යෙදවීමේදි මාසිකව නිකුත් කරනු ලබන ලොග්පත්‍ර පිවිසුම්පත්‍ර සහ අතුරු ගමන්වාර අවසර පත්‍ර බස් නැවතුම්පලවල් තුලින් දෛනිකව අත්සන් කිරීමට යොමු කිරීම තුළින් බස්රථ අධීක්ෂණය කිරීම
♣ මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවලට ගැලපෙන පරිදි හා බස්රථ සන අතර පවතින්නා වූ ගැටළු හඳුනාගෙන මාර්ග සාකච්ඡා පැවැත්වීම.
♣ බස් රථ කාර්ය මණ්ඩලය විසින් නියාමන කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හීදී දඩුවම්වලට යටත් කිරීම.
♣ මාර්ග පරීක්ෂකවරුන් මාර්ගයෙන් නියාමන කොන්දේසි නිරන්තර පරීක්ෂාවට ලක් කිරීම.
♣ සිසු ප්‍රවාහන බස්රථවල තත්වය ,සේවය හා අනෙකුත් නියාමන අවශ්‍යතා වරින්වර පරීක්ෂාවට ලක් කිරීම.(මීට අමතරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ද පරික්ෂා කරනු ලබයි)
♣ සිසු සැරිය බස්රථ සඳහා රජය විසින් ගෙවන ජනතාවගේ මුදල් අධිකාරියේ නිර්දේශ තුළින් පමණක් ගෙවීම.
♣ මගි ප්‍රවාහන ත්‍රි රෝද රථ,භාණ්ඩ ප්‍රවාහන රථ ලියාපදිංචි කළ පසු ස්ටිකර් අලවා එය අධිකාරියේ ලියාපදිංචි කළ වාහනයක් බව මහජනතාව මෙන්ම නිතිය ක්‍රියාත්මක කරන ආයතනවලට දන්වා සිටීම.
♣ සියළු ආකාරයේ බලපත්‍ර වාර්ෂිකව දිර්ඝ කිරීමට ලක්කොට නියාමනය තහවුරු කිරීම.

## 10. භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය කාර්යක්ෂම කිරීම, විධිමත් කිරීම සහ ගුණත්වය ඉහළ දැමීම.

♣ පනතේ බලතල ප්‍රකාරව අධිකාරියේ ලියාපදිංචි කරවීම.
♣ විධිමත් රථගාල් ස්ථාපිත කරදීම.
♣ පොලීසිය හා එක්ව ආරක්ෂක වැඩසටහන් සංවිධානය කිරීම.
♣ මාර්ග පරීක්ෂක නිලධාරින් යොදවා පරීක්ෂා කිරීම.
♣ සමික්ෂණ කිරීම.

## 11. මගි ගැටළු හඳුනා ගැනීම හා විසඳුම් ලබා දීම.

♣ පොදු ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා මහජනතාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සඳහා සෑම බස්නැවතුම්පල ස්ථානයක්ම පැමිණිලි පෙට්ටි සවිකිරිම.
♣ මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරිම සඳහා දුරකථන අංක ප්‍රසිද්ධ කිරීම.
♣ ජංගම පරීක්ෂණ වලදි මගි ජනතාවගෙන් ගැටළු ලබා ගැනීම.
♣ සියළු ගැටළු සඳහා කඩිනමින් විසඳුම් ලබා දී ගුණාත්මක මගි ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරිම.

## 12. බස්නැවතුම්පල ඉදිකිරීම , නවීකරණය සහ අළුත්වැඩියා කිරීම.

- ♣ හඳුනාගත් ස්ථානවල සියළු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පල ඉදි කිරීම
- ♣ පැරණි බස්නැවතුම්පලවල් නවීකරණය කිරීම හා අළුත්වැඩියා කිරීම.
- ♣ අලුතින් ඉදිකරන සහ දැනටමත් ඉදිකර ඇති බස්නැවතුම්පලවල් සඳහා තාක්ෂණය හඳුන්වා දීම

### අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු







01.මගී ප්‍රවාහන සේවා සපයන්නන් ලෙස කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරීම.

02.මගී ප්‍රවාහන සේවාවට අදාළව යටිතල පහසුකම් වර්ධනය කිරීම.


03.ආදායම් උත්පාදනය වර්ධනය කිරීම හා ආයතනික ස්ථාවරත්වය ගොඩ නැගීම.

**04.මගී ජනතාවගේ ආරක්ෂාව ඉහළ නැංවීම උදෙසා මහජන හිතෛෂී තොරතුරු සන්නිවේදන ක්‍රම ඇති කිරීම.**

**05.ශ්‍රී ලංකාව තුළ පළාත් ප්‍රවාහන අධිකාරී අතරින් ආදර්ශ අධිකාරිය බවට පත්කිරීම.**

### කාර්යය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත | 121 |
| සේවයේ නියුතු | 123 |
| පුරප්පාඩු | 03 |
| අධි සේවක පදනම | 02 |




### පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 67.16 | 66.22 | 0.94 | 98.60 |
| ගමන් වියදම් | 3.37 | 1.23 | 2.14 | 36.55 |
| සැපයීම් | 4.58 | 3.51 | 1.07 | 76.75 |
| නඩත්තු වියදම් | 2.00 | 1.72 | 0.28 | 86.11 |
| ගිවිසුම්ගත සේවා | 6.16 | 4.26 | 1.90 | 69.26 |
| මාරු කිරීම් | 0.96 | 0.89 | 0.07 | 92.41 |
| සහනාධාර | 0.05 | 0.03 | 0.02 | 55.00 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 1.84 | 0.97 | 0.87 | 52.55 |
| **එකතුව** | **86.12** | **78.83** | **7.29** | **91.55** |


## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 25.00 | 8.15 | 16.85 | 32.60 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම හා උපකරණ | 15.50 | 0.76 | 14.76 | 4.87 |
| වාහන | 3.00 | 0.00 | 0.00 | - |
| වෙනත් මුලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 31.50 | 0.08 | 31.42 | 0.24 |
| **එකතුව** | **75.00** | **8.99** | **63.03** | **11.97** |

## ආදායම් ඉපයීම - 2019

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 1. මාර්ග බලපත්‍ර | 4.06 | 4.27 | 105 |
| 2. සිසු සැරිය (මාර්ග බලපත්‍ර ) | 1.15 | 0.37 | 32 |
| 3. සිසු ප්‍රවාහන (මාර්ග බලපත්‍ර) | 0.79 | 0.06 | 07 |
| 4. නව බලපත්‍ර | 3.00 | 1.34 | 45 |
| 5. හිමිකාරීත්වය පැවරීම | 9.00 | 2.13 | 24 |
| 6. ලොග් පත්‍ර | 12.00 | 10.87 | 91 |
| 7. සිසු සැරිය ලොග්පත්‍ර | 1.20 | 0.63 | 53 |
| 8. පිවිසුම් පත්‍ර | 4.50 | 3.78 | 84 |
| 9. කොන්දොස්තර බලපත්‍ර | 1.00 | 0.84 | 84 |
| 10. විශේෂ චාරිකා බලපත්‍ර | 1.00 | 0.99 | 100 |
| 11. මගී ප්‍රවේශ පත්‍ර | 0.70 | 0.72 | 103 |
| 12. අතුරු ගමන්වාර බලපත්‍ර | 2.50 | 2.12 | 85 |
| 13. තාවකාලික මගී සේවා බලපත්‍ර | 0.30 | 0.31 | 104 |
| 14. කඩ කාමර හා කිරිහල් කුලී | 5.50 | 0.88 | 16 |
| 15. දඩ මුදල්- ජංගම පරීක්ෂක | 3.40 | 2.60 | 77 |
| 16. වැසිකිළි බදු මුදල් | 2.00 | 0.86 | 43 |
| 17. ත්‍රී රෝද රථ ආදායම | 2.00 | 1.09 | 54 |
| 18. ඇඟලුම් හා වෙනත් මගී සේවා | 0.40 | 0.29 | 72 |
| 19. පාසල් ප්‍රවාහන සේවා | 0.30 | 0.11 | 35 |
| 20. භාණ්ඩ ප්‍රවාහන සේවා | 0.30 | 0.002 | 01 |
| 21. විවිධ ආදායම් -වෙනත් | 0.65 | 0.11 | 17 |
| 22. රියදුරු බලපත්‍ර | 0.40 | 0.0025 | 01 |
| 23. වෙළඳ ප්‍රචාරය | 3.00 | 0.57 | 19 |
| 24. පොලී / ආපදා ණය | 0.15 | 0.15 | 104 |
| 23.පොලී / රැඳවුම් ගිණුම් INTEREST | 1.70 | 0.06 | |
| 24.පොලී / පාරිතෝෂිත ගිණුම INTEREST | | 0.17 | |
| 25.පොලී /NSB ගිණුම් අංකය 1000505 | | 0.00058 | |
| 25. අමාත්‍යාංශ ප්‍රතිපාදන (වැටුප්) | 40.00 | 50.00 | 125 |
| **එකතුව** | **101.00** | **85.34** | **1481** |

## ආදායම් ඉපයීම - 2019




## අමාත්‍යංශ/දෙපාර්තමේන්තු හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජනය | |
|---|---|---|---|
| | | ඉලක්කය (රු.මි) | ප්‍රගතිය (%) |
| **මගී ප්‍රවාහන සේවාවක් උදෙසා මගී ප්‍රවාහන සේවාවට අදාලව යටිතල පහසුකම් සංවර්ධනය** | | | |
| ඉලක්කය 06 - ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා මගී පහසුකම් සංවර්ධනය කිරීම, මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම මගී හිතෛෂී ආකල්ප වර්ධනය | මගී පහසුකම් සංවර්ධනය කිරීම සඳහා බස්නැවතුම්පල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 17.96 | 100 |
| **ගුණාත්මක හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් උදෙසා ප්‍රවාහන සේවා සපයන්න්න්ගේ ආකල්ප වර්ධනය ඉහළ නැංවීම සහ ආයතන ධාරිතා සංවර්ධනය** | | | |
| ඉලක්ක 02- ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා සේවා සපයන්නන්ගේ ආකල්ප වර්ධනය හා පුහුණුව | ගුණාත්මක මගී ප්‍රවාහන සේවයකට ප්‍රවාහන සේවා සපයන්නන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | 1.00 | 100 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| දර්ශකය | ක්‍රියාකාරකම | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|
| **ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් උදෙසා මගී ප්‍රවාහන සේවාවට අදාලව යටිතල පහසුකම් සංවර්ධනය** | | | |
| ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් උදෙසා මගී ප්‍රවාහන සේවාවට අදාලව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම, මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම | කැකිරාව බස් නැවතුම්පළ භූමියේ කඩතොලු වසා කාර්යාල කාමර නවීකරණය | 17.96 | 17.96 |
| | කදුරුවෙල බස්නැවතුම්පල කාර්යාල කාමරය නවීකරණය | | |
| | අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පලේ තීන්ත ආලේප කිරීම | | |
| | අලුත්වැඩියා කිරීම සහ බස් පර්යන්තයේ මාර්ග දැන්වීම් පුවරු සවි කිරීම | | |
| | අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පල සනීපාරක්ෂක පද්ධතිය අළුත්වැඩියාව | | |
| | මැදවච්චිය බස්නැවතුම්පල වේලා සටහන් කුටියේ වහලය සැකසීම | | |
| | අනුරාධපුර පැරණි බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ කාර්යාල කාමරය අළුත්වැඩියාව හා කුරුණෑගල බස් පර්යන්තය දිගේ ගල් පේළිය ඇල්ලීම | | |
| | අබලන් මගී ආවරණ අළුත්වැඩියාව | | |
| **ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් උදෙසා මගී ප්‍රවාහන සේවා සපයන්නන්ගේ ආකල්ප වර්ධනය ඉහළ නැංවීම** | | | |
| ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් උදෙසා මගී ප්‍රවාහන සේවා සපයන්නන්ගේ ආකල්ප වර්ධනය හා පුහුණුව | බස්රථ සේවක කණ්ඩායම් සඳහා වැඩමුළු, දේශන සම්මන්ත්‍රණ පැවැත්වීම | 1.00 | 0.31 |

බස්නැවතුම්පල යටිතල පහසුකම් සංවර්ධනය හා ආයතන ධාරිතා සංවර්ධනය ව්‍යාපෘති යටතේ 2019 වර්ෂය තුළ සංවර්ධන කටයුතු රාශියක් ක්‍රියාත්මක කරන ලදි. මෙහි ප්‍රතිලාභ විශාල පිරිසකට හිමි විය.කැකිරාව, තමන්කඩුව, නැගෙනහිර නුවරගම් පළාත,මැදවච්චිය,මිහින්තලේ හා මධ්‍යම නුවර ගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීම - 2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක සංඛ්‍යාව | | වියදම්/ආයෝජනය(රු.මි) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| **මගී පහසුකම් සංවර්ධනය කිරීම** | | | | |
| උප නගරවල සියළු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පල ඉදි කිරීම | - | 02 | 15.97 | 11 |
| ප්‍රධාන නගරවල සහ උපනගරවල බස්නැවතුම්පලවල් නවීකරණය කිරීම හා වැඩි දියුණු කිරිම | 02 | 02 | - | 07 |
| බස්නැවතුම්පල භූමි කාපට් කිරීම | 03 | 01 | - | 12 |
| මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල නව මගී ආවරණ ඉදි කිරිම | - | 10 | - | 04 |
| අබලන් තත්වයේ පවත්නා මගී ආවරණ අළුත්වැඩියා කිරීම | 20 | 31 | - | 04 |
| සියළු යටිතල පහසුකම් වලින් සමන්විත ආපනශාලා පහසුකම් සහිත දුර ගමන් සේවා බස්රථ නතර කරන ස්ථාන ස්ථාපනය | - | - | - | 06 |
| අවිධිමත්ව ස්ථාපිත කර ඇති ත්‍රි රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ඉවත් කොට විධිමත් ත්‍රි රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ස්ථාපිත කිරීම | 23 | - | - | 03 |
| **මගී ආරක්ෂාව සහ සුවපහසුව ඉහල නැංවීම** | | | | |
| සෑම ප්‍රධාන නගරයකම ප්‍රධාන බස්නැවතුම්පලවල්හී ඇති වැසිකිළි පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම | 2 | 04 | - | 06 |
| වැසිකිළි පහසුකම් රහිත බස් නැවතුම්පලවල්හී වැසිකිළි පද්ධති ස්ථාපිත කිරීම | - | 03 | - | 04 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්හී CCTV කැමරා පද්ධති සවි කිරීම | - | - | - | 06 |
| බස්රථවල CCTV කැමරා සහ GPS යන්ත්‍ර සවි කිරිම | - | - | - | 07 |
| බස්රථවල නිරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික මෙහෙයුම් මැදිරි ස්ථාපිත කිරීම | - | - | - | 04 |
| අධික මගී ඉල්ලුමක් පවතින තෝරාගත් මාර්ගවල සුඛෝපභෝගී බස්රථ සේවා ආරම්භ කිරිම | - | - | - | 0.2 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල ඩිජිටල් කාලසටහන් පුවරු සවි කිරිම | - | 03 | - | 1.5 |
| බස්නැවතුම්පලවල්හී මහජන ඇමතුම් පද්ධති ස්ථාපිත කිරීම | - | - | - | 02 |
| වේලා සටහන් කුටි සඳහා තාක්ෂණික උපකරණ හඳුන්වා දීම | - | - | - | 02 |
| ජංගම පරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික උපකරණ හඳුන්වා දීම | - | - | - | 02 |
| මාර්ග සමීක්ෂණ පැවැත්වීම | - | - | - | 0.4 |
| ටිකට් මැෂින් ක්‍රමය හඳුන්වා දීම | - | - | - | 0.3 |
| මගී ආරක්ෂාව උදෙසා වන දැන්වීම්, ප්‍රචාරක පුවරු ස්ථාපිත කිරීම | - | - | - | 1.5 |
| මගී අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අත් පත්‍රිකා හා ස්ටිකර්ස් ප්‍රචාරක සටහන් පැවැත්වීම | - | - | - | 0.8 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්වල උප බස්නැවතුම්පලවල ස්වයංක්‍රියව කාලය සටහන් වන තාක්ෂණික උපකරණ ස්ථාපිත කිරීම | - | - | - | 8.00 |
| සිසු සැරිය බස්රථ සේවාව පුළුල් කිරීම | - | - | - | 1.00 |

| කාර්ය සාධන දර්ශක | වියදම/ආයෝජනය (රු.මි) 2019 | 2020 |
|---|---|---|
| **මගී ආරක්ෂාව සහ සුවපහසුව ඉහල නැංවීම** | | |
| සිසු ප්‍රවාහන රථ සේවා පුළුල් කිරීම | - | 01 |
| මගී ප්‍රවාහන ත්‍රි රෝද රථ සේවාව පුළුල් කිරීම | | 2.5 |
| කාර්යාලීය සේවක ප්‍රවාහන රථ ලියාපදිංචිය පුළුල් කිරීම | | 01 |
| මගී පැමිණිලි අවම කිරිම | | 0.75 |
| වාර්ෂික ජංගම පරීක්ෂක වාර පුළුල් කිරීම | | 1.5 |
| ප්‍රධාන බස්නැවතුම්පල බස්රථ කාර්ය මණ්ඩල සඳහා විවේකාගාර පහසුකම් ස්ථාපිත කිරිම | | 04 |
| පළාත පුරා බස්නැවතුම් ස්ථාන පුවරු ස්ථාපිත කිරීම | | 03 |
| ටිකට් බුකින් ක්‍රමය හඳුන්වා දීමට අදාල තාක්ෂණික උපකරණ මිලදී ගැනීම | | 1.5 |
| **බස්රථ සන අතර මගී හිතෛශී ආකල්ප වර්ධනය කිරීම** | | |
| කොන්දොස්තර පුහුණු වැඩමුළු පැවැත්වීම | - | 0.8 |
| රියදුරු පුහුණු වැඩමුළු පැවැත්වීම | | 0.8 |
| බස්රථ හිමියන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම | | 0.5 |
| පාසල් ප්‍රවාහන සේවකයින් දැනුවත් කිරිම සඳහා වැඩමුළු පැවැත්වීම | | 0.6 |
| කාර්යාල/ඇඟළුම්/භාණ්ඩ ප්‍රවාහන සේවා හිමියන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම | | 0.4 |
| හොඳම කොන්දොස්තරවරයා හොඳම රියදුරු සහ හොඳ බස්රථ හිමියා තේරීම සඳහා වූ වාර්ෂික සම්මාන උළෙලක් පැවැත්වීම | | 0.6 |
| පුහුණු රියදුරු/කොන්දොස්තරවරු සංචිතයක් පිහිටුවීම | | 0.3 |
| **නිති බලාත්මක කිරීම** | | |
| ප්‍රඥප්තියේ අඩුපාඩු සකස් කිරීම | - | - |
| ගැසට් නිවේදන විධිමත් කිරීම | | - |
| නීති බලාත්මක කිරීමේ ප්‍රඥප්ති විධිමත් කිරීම | | - |
| **නව මාර්ග හඳුන්වා දීම** | | |
| මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හැකි ග්‍රාමීය මාර්ග හඳුන්වා දීම | - | 0.2 |
| සිසු ඉල්ලුම අනුව නව සිසුසැරිය බස්රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම | | 0.2 |
| සිසු ඉල්ලුම අනුව නව පාසල් ප්‍රවාහන සේවා රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම | | 0.2 |
| කාර්යාල සේවක ඉල්ලුම අනුව නව කාර්යාල සේවක ප්‍රවාහන රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම | | 0.2 |
| සේවකයින්ගේ ආකල්ප වර්ධනය සඳහා දේශන හා වැඩමුළු පැවැත්වීම | | 01 |
| පළාත් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම | | 0.5 |
| කාර්ය මණ්ඩලයට සේවාස්ථ පුහුණු ලබා දීම | | 0.5 |
| ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | 0.7 |
| සේවක ප්‍රණාම උළෙල පැවැත්වීම | | 0.8 |
| සේවකයින් අධ්‍යාපනයට යොමු කරනු වස් අර්ධ/පූර්ණ ශිෂ්‍යත්ව පිරිනැමීම | | 0.7 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| කැකිරාව බස්නැවතුම්පළ භූමියේ කඩතොලු වසා කාර්යාල කාමරය නවීකරනය කිරීම | වඩාත් බස්නැවතුම්පලක් ඉදිවීම තුලින් පොදු මගී ජනතාවට ඉතා යහපත් සංවිධිත පරිසරයක් නිර්මාණය වීම තුලින් රජය හා ආයතනය කෙරෙහි ජනතා ප්‍රසාදය ඉහළ යාම | 1.97 | 1.74 | 100 |
| කදුරුවෙල බස්නැවතුම්පල කාර්යාල කාමරය නවිකරණය | | 1 | 0.76 | 100 |
| අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පලේ තීන්ත ආලේප කිරීම හා බස් පර්යන්තයේ මාර්ග දැන්වීම් පුවරු සවි කිරීම | | 13 | 1.09 | 100 |
| අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පල වැසිකිලිය අළුත්වැඩියාව | | | 0.26 | 100 |
| මැදවච්චිය බස්නැවතුම්පල වේලා සටහන් කුටියේ වහලය සකස් කිරීම | | | 0.57 | 100 |
| අනුරාධපුර පැරණි බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ කාර්යාල කාමරය අළුත්වැඩියා කිරීම සහ කුරුණෑගල බස් පර්යන්තය දිගේ ගල් පේළියක් ඇතිරීම | | | 0.61 | 100 |
| අනුරාධපුර පැරණි බස්නැවතුම්පල සනීපාරක්ෂක පද්ධතිය අළුත්වැඩියා කිරීම | | | ප්‍රවාහන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතියකි | |
| අබලන් මගී ආවරණ අළුත්වැඩියාව | මගී ජනතාවට ආරක්ෂාකාරි සුවපහසු සේවාවක් සැපයීම | 2 | 1.79 | 100 |
| බස්රථ සේවක කණ්ඩායම් සඳහා වැඩමුළු, දේශන සම්මන්ත්‍රණ පැවැත්වීම | ගුණාත් මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම | 1 | | 100 |

ප්‍රාග්ධන ඌනතාවය නිසා අත්හැරීමට සිදු වූ 2019 වර්ෂයේ යෝජිත ව්‍යාපෘති හා 2020 වර්ෂයට හඳුනාගත් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඒවා තුළින් මහජනතාවට උපරිම ආකාරයෙන් ගුණාත්මක හා කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවාවක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

## ආයතනයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| උප නගරවල හා ප්‍රධාන නගරවල සියළු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පලවල් ඉදි කිරීම | 07 | 07 |
| බස්නැවතුම්පල භූමි කාපට් කිරීම | 08 | 08 |
| මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල නව මගී ආවරණ ඉදි කිරීම | 45 | 60 |
| සියළු යටිතල පහසුකම් වලින් සමන්විත ආපනශාලා පහසුකම් සහිත දුර ගමන් සේවා බස් රථ නතර කරන ස්ථාන ස්ථාපනය කිරීම | 01 | 02 |
| විධිමත් ත්‍රි රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ස්ථාපිත කිරීම | 40 | 65 |

## මගී පහසුකම් සංවර්ධනය කිරීම මගින් ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම.

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| සනීපාරක්ෂක පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම | 08 | 07 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්හී CCTV කැමරා පද්ධති සවි කිරීම | 05 | 04 |
| බස්රථවල CCTV කැමරා සහ GPS යන්ත්‍ර සවි කිරීම | 200 | 300 |
| බස්රථවල නිරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික මෙහෙයුම් මැදිරි ස්ථාපිත කිරීම | 03 | 02 |
| අධික මගී ඉල්ලුමක් පවතින තෝරාගත් මාර්ගවල සුඛෝපභෝගී බස්රථ සේවා ආරම්භය | 02 | 02 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල ඩිජිටල් කාලසටහන් පුවරු සවි කිරීම | 03 | 02 |
| බස්නැවතුම්පලවල්හී මහජන ඇමතුම් පද්ධති ස්ථාපිත කිරීම | 02 | 01 |
| වේලා සටහන් කුටි සඳහා තාක්ෂණික උපකරණ හඳුන්වා දීම | 02 | 02 |
| ජංගම පරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික උපකරණ හඳුන්වා දීම | | |
| මාර්ග සමීක්ෂණ පැවැත්වීම | 40 | 30 |
| ටිකට් මැෂින් ක්‍රමය හඳුන්වා දීම | 30% | 30% |
| මගී ආරක්ෂාව උදෙසා වන දැන්වීම්, ප්‍රචාරක පුවරු ස්ථාපිත කිරීම | 10 | 10 |
| මගී අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අත් පත්‍රිකා හා ස්ටිකර්ස් ප්‍රචාරක සටහන් පැවැත්වීම | 100% | 100% |
| සිසු සැරිය බස් රථ සේවාව පුළුල් කිරීම | 10 | 10 |
| සිසු ප්‍රවාහන රථ සේවා පුළුල් කිරීම | 50 | 50 |
| මගී ප්‍රවාහන ත්‍රී රෝද රථ සේවාව පුළුල් කිරීම | 5000 | 4000 |
| කාර්යාලීය සේවක ප්‍රවාහන රථ ලියාපදිංචිය පුළුල් කිරීම | 20 | 10 |
| භාණ්ඩ ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම | 1000 | 1000 |
| ප්‍රධාන බස්නැවතුම්පල බස්රථ කාර්ය මණ්ඩල සඳහා විවේකාගාර පහසුකම් ස්ථාපිත කිරීම | 02 | 02 |
| පළාත පුරා බස්නැවතුම් ස්ථාන පුවරු ස්ථාපිත කිරීම | 75 | 75 |
| ටිකට් බුකින් ක්‍රමය හඳුන්වා දීමට අදාල තාක්ෂණික උපකරණ මිලදී ගැනීම | - | 02 |

### බස්රථ සහ අතර මගී හිතෛශී ආකල්ප වර්ධනය කිරීම

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| කොන්දොස්තර/ රියදුරු / බස්රථ හිමියන් / පාසල් ප්‍රවාහන සේවකයින් / කාර්යාල/ඇඟළුම්/භාණ්ඩ ප්‍රවාහන සේවා හිමියන් /පුහුණු වැඩමුළු පැවැත්වීම | 02 | 05 |
| හොඳම කොන්දොස්තරවරයා හොඳම රියදුරු සහ හොඳ බස්රථ හිමියා තේරීමේ වාර්ෂික සම්මාන උළෙලක් පැවැත්වීම | 01 | 01 |
| පුහුණු රියදුරු/කොන්දොස්තරවරු සංචිතයක් පිහිටුවීම | 100 | 100 |

### නව මාර්ග හඳුන්වා දීම

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හැකි ග්‍රාමීය මාර්ග හඳුන්වා දීම | 05 | 05 |
| සිසු ඉල්ලුම අනුව නව සිසුසැරිය බස්රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම | 05 | 05 |
| සිසු ඉල්ලුම අනුව නව පාසල් ප්‍රවාහන සේවා රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම | 10 | 10 |
| නව කාර්යාල සේවක ප්‍රවාහන රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම | 10 | 10 |
| සේවකයින්ගේ ආකල්ප වර්ධනය සඳහා දේශන හා වැඩමුළු පැවැත්වීම | 01 | 03 |
| පළාත් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම | 01 | 01 |
| කාර්ය මණ්ඩලයට සේවාස්ථ පුහුණු ලබා දීම | - | 05 |
| ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | - | 12 |
| සේවක ප්‍රණාම උළෙල පැවැත්වීම | - | 01 |
| සේවකයින් අධ්‍යාපනයට යොමු කරනු වස් අර්ධ/පූර්ණ ශිෂ්‍යත්ව පිරිනැමීම | 07 | 09 |

ඉහත අරමුණු කරා ළඟා වීමේ අපේක්ෂිත කෙටිකාලීන ප්‍රතිඵලය වන්නේ, අධිකාරිය විසින් නියාමනය කරනු ලබන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ,පාසල් ළමුන්, ප්‍රවාහනය කරනු ලබන බස්රථ හා වෑන් රථ මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවයේ යෙදෙන සියළුම රථවාහන කාර්යාල සහ ඇඟළුම් සේවයේ යෙදෙන සියළුම රථ වාහන සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම වන අතර දිගුකාලීන ප්‍රතිඵලය ලෙස කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ නියැලි සිටින කාර්ය මණ්ඩලවල සමාජ සදාචාරය හා දේශීය අනන්‍යතාවය ආරක්ෂා කිරීම හා සංස්කෘතික වටිනාකම ආරක්ෂා කිරීම හා සංස්කෘතික වටිනාකම ආරක්ෂාකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යි.

## කාර්ය සාධන ඉලක්ක 2017-2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| නගරවල සියලු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පලවල් ඉදි කිරීම සහ නවීකරණය කිරීම. | 03 | 05 | 07 |
| බස් නැවතුම්පල භූමි කාපට් කිරීම. | 01 | 03 | 08 |
| මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල නව මගී ආවරණ ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම . | 11 | 32 | 40 |
| දුර ගමන් සේවා බස්නැවතුම්පළවල් හි ආරක්ෂිත මගී විවේකාගාර සහ සියලු යටිතල පහසුකම්වලින් සමන්විත ආපනශාලා ඉදි කිරීම. | - | - | 01 |
| විධිමත් ත්‍රි රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ස්ථාපිත කිරීම. | - | - | 25 |
| වැසිකිළි පහසුකම් රහිත බස්නැවතුම්පලවල්හි සනීපාරක්ෂක පද්ධතිය ස්ථාපිත කිරීම සහ ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඇති සනීපාරක්ෂක පද්ධතිය නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම | 02 | 07 | 08 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල් හි CCTV කැමරා පද්ධති සවි කිරීම. | - | - | 05 |
| බස්රථවල CCTV කැමරා සහ GPS යන්ත්‍ර සවි කිරීම. | - | - | 100 |
| බස්රථ නිරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික මෙහෙයුම් මැදිරි ස්ථාපිත කිරීම සහ තාක්ෂණික උපකරණ හඳුන්වා දීම. | - | - | 03 |
| අධික මගී ඉල්ලුමක් පවතින තෝරාගත් මාර්ගවල සුඛෝපභෝගී බස්රථ සේවා ආරම්භ කිරීම. | - | - | 04 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල් හි ඩිජිටල් කාලසටහන් පුවරු සවි කිරීම. | - | 02 | 02 |
| බස්නැවතුම්පලවල් හි මහජන ඇමතුම් පද්ධති ස්ථාපිත කිරීම. | - | - | 03 |
| වේලා සටහන් කුටි සඳහා තාක්ෂණික උපකරණ හඳුන්වා දීම. | - | - | 06 |
| මාර්ග සමීක්ෂණ පැවැත්වීම. | - | - | 30 |
| ටිකට් මැෂින් ක්‍රමය හඳුන්වා දීම. | - | - | 40% |
| මගී ආරක්ෂාව උදෙසා වන දැන්වීම් ප්‍රචාරක පුවරු ස්ථාපිත කිරීම. | - | - | 05 |
| මගී අයිතිවාසිකම් පිළිඹඳ මහජනතාව දැනුවත් කිරීමේ අත් පත්‍රිකා හා ස්ටිකර් ප්‍රචාරක වැඩසටහන් පැවැත්වීම. | - | - | 100% |
| සිසුසැරිය බස්රථ සේවාව පුළුල් කිරීම. | - | 30 | 30 |
| සිසු ප්‍රවාහන සේවා රථ සේවාව පුළුල් කිරීම. | - | 15 | 50 |
| මගී ප්‍රවාහන ත්‍රි රෝද රථ සේවාව පුළුල් කිරීම. | - | 1000 | 5000 |
| කාර්යාලීය සේවක ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම. | - | 10 | 20 |
| භාණ්ඩ ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම. | 60 | 100 | 1000 |
| මගී පැමිණිලි. | | 550 | 400 |
| හඳුනාගත් අනවසර ඉදිකිරීම් සහිත වෙළඳුන් ඉවත් කිරීම. | - | 10% | 35% |
| වාර්ෂික ජංගම පරීක්ෂක වාර පුළුල් කිරීම. | 250 | 275 | 300 |

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්හි බස්රථ කාර්ය මණ්ඩල සඳහා විවේකාගාර පහසුකම් ස්ථාපිත කිරීම. | - | - | 02 |
| පළාත පුරා බස්නැවතුම් ස්ථාන පුවරු ස්ථාපිත කිරීම. | 100 | 100 | 100 |
| ටිකට් බුකින් ක්‍රමයට අදාල තාක්ෂණික උපකරණ මිලදී ගැනීම. | - | - | 02 |
| කොන්දොස්තර/රියදුරු/බස්රථ හිමියන් / කාර්යාල/ ඇඟලුම්/භාණ්ඩ ප්‍රවාහන සේවාවේ යෙදෙන්නන්/ ත්‍රිරෝද රථ හිමියන් දැනුවත් කිරීම | 02 | 02 | 02 |
| හොඳම රියදුරුවරයා, හොඳම කොන්දොස්තරවරයා, හොඳම බස්රථ හිමියා තේරීම සඳහා වාර්ෂික සම්මාන උළෙලක් පැවැත්වීම. | - | - | 01 |
| පුහුණු රියදුරු/කොන්දොස්තරවරු සංචිතයක් පිහිටුවීම. | - | 100 | 100 |
| ප්‍රඥප්තියේ අඩුපාඩු සකස් කිරීම. | - | - | 100% |
| ගැසට් නිවේදන විධිමත් කිරීම. | 10% | 25% | 75% |
| නීති බලාත්මක කිරීම ප්‍රඥප්ති විධිමත් කිරීම. | - | - | 50% |
| මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හැකි ග්‍රාමීය මාර්ග හඳුන්වා දීම. | 05 | 05 | 05 |
| සිසුසැරිය සේවාව පුළුල් කිරීම. | 90 | 30 | 30 |
| සේවකයින්ගේ ආකල්ප වර්ධනය සඳහා දේශන හා වැඩසුළු පැවැත්වීම. | 01 | - | 02 |
| පළාත් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් | - | - | 01 |
| කාර්ය මණ්ඩලයට සේවස්ථ පුහුණු ලබාදීම. | - | - | 01 |
| 5S,SLIM හෝ වෙනත් ආකාරයේ ඵලදායිතා වැඩසටහන් පැවැත් වීම. | - | - | 01 |
| සේවක ප්‍රණාම උළෙල පැවැත්වීම. | - | - | 01 |
| සේවකයින් අධ්‍යාපනයට යොමු කරනුවස් අර්ධ/පූර්ණ ශිෂ්‍යත්ව පිරිනැමීම. | - | - | 05 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී 98%ක ඉහළ සාපේක්ෂ ඵලදායිතාවයක් ලබා ගන්නා ලදී.පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගෙන තිබීම සතුටුදායක තත්වයකි. අබලන් මගී ආවරණ අළුත්වැඩියා කිරීම, බස්නැවතුම්පල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම,කදුරුවෙල බස්නැවතුම්පල කාර්යාල කාමරය නවීකරණය කිරිම,2018 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති වන අනුරාධපුර දූර සේවා බස් නැවතුම්පල තීන්ත ආලේපකර අළුත්වැඩියා කිරීම සහ බස් පර්යන්තයේ මාර්ග දැන්වීම් පුවරු සවි කිරීම මගින් අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පල ආදර්ශ බස්නැවතුම්පලක් ලෙස සියළු පහසුකම් වලින් යුක්තව හඳුන්වා දීමට හැකි වීම , අනුරාධපුර දුර සේවා බස්නැවතුම්පල සනීපාරක්ෂක පද්ධතිය අළුත්වැඩියා කිරීම,මැදවච්චිය බස්නැවතුම්පල වේලාසටහන් කුටියේ වහලය සකස් කිරීම අනුරාධපුර පැරණි බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ කාර්යාල කාමරය අළුත්වැඩියා කිරීම සහ කුරුණෑගල බස් පර්යන්තය සැකසීම යන ව්‍යාපෘති සාර්ථකව ඉටු කළ හැකි විය.

ප්‍රධාන මාර්ග පුළුල් කිරීමට සාපේක්ෂව අතුරු මාර්ග සංවර්ධනය කිරීම නිසා අතුරු මාර්ගවල බස්රථ ධාවනය කිරීම මගින් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකි වීම ආයතනය ලද ජයග්‍රහණයකි. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සකස්කර අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට හැකි විය. 2019 වර්ෂයේ බලාපොරෙත්තු වූ ආදායම රු.මි.34ක් වුවත් ළඟා විමට හැකි වූ ආදායම රු.මි.26.01කි. තවද 2019 වර්ෂය සඳහා අමාත්‍යාංශයෙන් වැටුප් ප්‍රතිපාදන වශයෙන් රු.මි.40ක් බලාපොරොත්තු වුවද රු.මි.50ක් ලැබුනි.2019 වර්ෂයේ සමස්ත කාර්යසාධනය සතුටුදායක තත්වයක පවතී.

# 9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය හා මූලික තොරතුරු

උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02න් සමන්විත වේ. මෙම දෙපාර්තමේන්තුව 1987 අංක 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තිය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. කෘෂිකර්ම හා සත්ත්ව පාලන අමාත්‍යාංශය වෙනම ඒකකයක් වශයෙන් පිහිටුවා තිබුණි.
මෙම දෙපාර්තමේන්තුව 1987 වර්ෂයේ සිට අනුරාධපුර කච්චේරි භූමිය සහ පොළොන්නරුව දිස්ත්‍රික් කච්චේරි භූමිය තුළ ආරම්භ වී අනුරාධපුර පළාත් කාර්යාලය වශයෙන් ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයක් වශයෙන් ද පිහිටු විය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් ආවරණය වන පරිදි බල ප්‍රදේශය විශාල වීමත්, කාර්යය බහුල වීමත් නිසා 1989 ජුනි 01 වන දින වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. පළාතේ ක්‍රීඩා පරිපාලනය හා සංවර්ධන කටයුතුවලට ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සල්ගාදු ක්‍රීඩාංගන භූමියේ 2004 අප්‍රේල් 27 වන දින සිට නව පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කරන ලදී. එතැන් සිට අද දක්වා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව එම භූමියේ පිහිටා තිබේ.

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතු භෞතික සහ අනෙකුත් සම්පත්

- දැනට පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු කාර්යාලය පවත්වාගෙන යන දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල.
- උතුරු මැද පළාත් ක්‍රීඩා සංකීර්ණය-අනුරාධපුර.
- අනුරාධපුර පිහිණුම් තටාකය.
- අනුරාධපුර ගෘහස්ත ක්‍රීඩාගාරය.
- අනුරාධපුර හා පොළොන්නරුව බර ඉසිලීමේ පුහුණු මධ්‍යස්ථාන.
- පොළොන්නරුව දිස්ත්‍රික් උප කාර්යාලය.
- කැබ් රථ 02.
- වෑන් රථ 01.

## ක්‍රීඩකයන්ට පුහුණු පහසුකම් සැපයෙන ක්‍රීඩාංගන

- ❖ අනුරාධපුර ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ අනුරාධපුර පිහිනුම් සංකීර්ණය
- ❖ පොළොන්නරුව ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ පොළොන්නරුව ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණය

## ක්‍රීඩා පුහුණු සංචිත

| | | |
|---|---|---|
| ජිම්නාස්ටික් | වොලිබෝල් | කරාතේ දෝ |
| බැඩ්මින්ටන් | මල්ලව පොර | පාපන්දු |
| ජූඩෝ | බර ඉසිලීම | පිහිනුම් |
| මලල ක්‍රීඩා | කායවර්ධන | |

## දැක්ම

"ජාතික හා ජාත්‍යන්තර කෙළිබිම ජයගන්නා නීරෝගීමත් හා ක්‍රියාශීලී ජනතාවක්, සංවර්ධිත පළාතක්".

## මෙහෙවර

"උතුරු මැද පළාතේ ජනතාව නීරෝගීමත් හා ක්‍රියාශීලී කිරීම සඳහාත් ක්‍රීඩකයින් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ වෙත යොමු කිරීම සඳහාත් ක්‍රීඩා පුහුණු කටයුතු, හඳුනා ගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම, යටිතල පහසුකම් හා ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.
- උතුරු මැද පළාත තුළ අභිමානවත් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම.
- ක්‍රීඩිකාවන් හඳුනා ගැනීම.
- පළාත තුළ සිටින සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම


## කෙටිකාලීන අරමුණු

- ජාතික ක්‍රීඩා උළලේ පදක්කම් වැඩිපුර ලබා ගැනීම.
- ජාතික ක්‍රීඩා උළලේදී පළාත ඉහළ මට්ටමේ තැබීම.
- ග්‍රාමීය මට්ටමේ දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉදිරියට ගෙන ඒම.
- පුහුණු මධ්‍යස්ථාන, තරඟ ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්




## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 95 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 79 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 16 |

## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 39.09 | 39.02 | 0.07 | 98 |
| ගමන් වියදම් | 2.94 | 2.93 | 0.01 | 100 |
| සැපයීම් | 8.74 | 7.60 | 1.14 | 87 |
| නඩත්තු වියදම් | 2.11 | 1.73 | 0.38 | 82 |
| ගිවිසුම්ගත සේවා | 21.69 | 20.66 | 1.03 | 95 |
| **එකතුව** | **74.57** | **71.94** | **2.63** | 96 |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අ. අ | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | ජනාධිපති ශිල්ප ශාලිකා ගොඩනැගිල්ල අළුත්වැඩියාව | ජනාධිපති ශිල්ප ශාලිකා ගොඩනැගිල්ල අළුත්වැඩියාව | නව කාර්යාල ගොඩනැගිල්ල ස්ථාපිත කිරීම | කාර්යාල සේවකයින්, ක්ෂේත්‍ර නිළධාරින් හා සේවය අපේක්ෂා කරන්නන් |
| 2 | ක්‍රීඩා ඉසව් සංවර්ධනය | ජාතික මට්ටමේ පදක්කම් සඳහා යා හැකි ක්‍රීඩා ඉසව් සංවර්ධනය | ජාතික මට්ටමේ පදක්කම් ජයග්‍රහණය කිරීම | ක්‍රීඩකයින් 193 |

## මූලධන වියදම්( පළාත් සභා සංවර්ධන ප්‍රදාන) - 2019 - නව වැඩ

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | 0.70 | 0.68 | 0.02 | 97 |
| **එකතුව** | **0.70** | **0.68** | **0.02** | **97** |

## මූලධන වියදම් - 2019 - නව වැඩ

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ක්‍රීඩා පිටි සංවර්ධනය කිරිම | 1.45 | 1.27 | 0.18 | 88 |
| කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය කිරිම | 12.5 | 4.4 | 8.1 | 35 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.2 | 0.09 | 0.11 | 45 |
| පුහුණු කඳවුරු පැවැත්වීම | 0.11 | 0.11 | 0 | 100 |
| ජගත් කෙලිබිමට රන් අරුණැල්ල, කුසලතා ඇගයීම/පෝෂණ දීමනා දීරි දීමනා ලබා දීම | 8.5 | 8.4 | 0.1 | 99 |
| රජරට රන් කුසලාන වොලිබෝල් තරඟ | 0.98 | 0.89 | 0.09 | 91 |
| ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ජල නල පද්ධතිය/වහලය සකස් කිරිම හා කාර්යාලයේ ඉතිරි කොටස වායු සමීකරණය | 1.0 | 0.15 | 0.85 | 15 |
| හඳුනාගත් ක්‍රීඩා ඉසව් සංවර්ධනය | 0.5 | 0 | 0.5 | 0 |
| ක්‍රීඩා තරු වැඩසටහන | 0.5 | 0.3 | 0.2 | 60 |
| ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා භාණ්ඩ ලබා දීම | 6.5 | 6.4 | 0.1 | 99 |
| දෙපාර්තමේන්තුවට ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ලබාදීම | 1.0 | 0.9 | 0.1 | 99 |
| **එකතුව** | **33.24** | **22.91** | **10.33** | 69 |

## වර්ෂය තුළදී ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2019

### 01.දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම

වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 0.7 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.68 මූල්‍ය ප්‍රගතිය :- ප්‍රතිශතය 97%

දෙපාර්තමේන්තුවේ පහසුකම් වර්ධනය හා සේවා කටයුතු කාර්යක්ෂම වීම මෙන්ම කාර්යල පරිශ්‍රය විධිමත් ලෙස පවත්වා ගැනීම සඳහා 2019 වර්ෂය වන විට දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය මිලදී ගැනීම සිදු කරන ලදී.

## 02.ක්‍රීඩා පිටි සංවර්ධනය කිරිම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 1.45 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 1.27 මූල්‍ය ප්‍රගතිය :- ප්‍රතිශතය 85%**

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රීඩා පිටි 04 ක් හා වොලිබෝල් ක්‍රීඩා පිටි 01 ක් සංවර්ධනය කළ අතර ව්‍යාපෘතිය සඳහා රු. ලක්ෂ 706,857.00 ක මුදලක් වියදම් කරන ලදි. තඹුත්තේගම සුදර්ශනගම ක්‍රීඩා පිටිය සංවර්ධනය, තලාව එළිය දිවුල්වැව ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය කිරිම, ගල්නෑව නෑගම්පහ ක්‍රීඩාංගනය ප්‍රතිසංස්කරණය, කහටගස්දිගිලිය කුරුදුවැව ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය හා රාජාංගනය යුනයිටඩ් වොලි බෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිම මේ යටතේ සිදු විය.

**තිරසර සංවර්ධන අරමුණුවලට දායකත්වය**

ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරිම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම , ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසිමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරිම වසර පුරා ක්‍රිඩාංගන භාවිතා කරන ප්‍රමාණය ක්‍රිඩාංගන භාවිතා කළ හැකි කාලසිමාව.

## 03.ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ජලනල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරිම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 1.0 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.15 මූල්‍ය ප්‍රගතිය :- ප්‍රතිශතය 15%**

ගෘහස්ථ ක්‍රීඩාගාරය තුළ දෛනිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන් 100 කට අධික ප්‍රමාණයක් පුහුණුවිම් කටයුතු වල නිරත වන අතර වෙනත් පෞද්ගලික හා රාජ්‍ය ආයතන මඟින් ක්‍රීඩා තරඟාවලිද පවත්වන බැවින් ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පවතින අඩුපාඩු සකස් කිරීම මේ යටතේ සිදු විය.

## 04. පුහුණු වැඩසටහන් පැවැත්වීම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 0.2 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.09 මූල්‍ය ප්‍රගතිය :- ප්‍රතිශතය 15%**

ඉලක්කගත කණ්ඩායම වුයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරින්/පුහුණුකරු නිලධාරින්/ ක්‍රීඩා නිලධාරින්/දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ය.

**තිරසර සංවර්ධන අරමුණුවලට දක්වන දායකත්වය**

නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සහජීවනය ප්‍රවර්ධනය කිරීම. 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරිම සියදිවි නසා ගැනීම්/මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම කිරිම යන තිරසර සංවර්ධන අරමුණ මෙන්ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම යන තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනිම සඳහා දායකත්වය දැක්වීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත.

| පුහුණු වැඩසටහන | සම්පත් දායකත්යවය | වැය වු මුදල (රු) |
|---|---|---|
| තොරතුරු දැන ගැනීමේ පනත හා විගණන පනත පිළිබඳ මුලික අවබෝධය ලබා දිම | බස්නාහිර පළාත් ප්‍රධාන නීති උපදේශක | 31,070.00 |
| මුල්‍ය කටයුතු හා මුල්‍ය විනය පිළිබඳ මුලික අවබෝධය | උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හා සමුපකාර අමාත්‍යාංශ ගණකාධිකාරි | 24,620.00 |
| සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳ මුලික අවබෝධය | උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් | 26,776.50 |
| ධනාත්මක චින්තනය | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පාසැල් වෛද්‍ය | 28,352.00 |
| තාක්ෂණික දැනුම වර්ධනය | දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි | |

## 05. දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ලබා දීම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 1.0 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.9 මූල්‍ය ප්‍රගතිය :- ප්‍රතිශතය 99%**

අනුරාධපුර ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ පිහිණුම් තටාකයට හා ක්‍රීඩා පිටියට අවශ්‍ය උපකරණ ලබා ගැනීම මේ යටතේ සිදු විය. මේ සඳහා රුපියල් 525,504.00 ක මුදලක් වැය විය.

**ආයතනය හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණ**

ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම,සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසිමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## 06. රජරට රන් කුසලාන වොලිබෝල් තරඟ

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 0.98 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.89 මූල්‍ය ප්‍රගතිය :- 91%**

පළාත තුළින් දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් හඳුනා ගැනීම හා ඔවුන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙනයාම මෙමගින් සිදු විය. මේ සඳහා කණ්ඩායම් 42ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් 504 සහභාගි විය.

## 07. ක්‍රීඩා තරු වැඩසටහන

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 0.5 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.3 මූල්‍ය ප්‍රගතිය :- ප්‍රතිශතය 60%**

ක්‍රීඩක ක්‍රීඩිකාවන් 85ක් මේ සඳහා සහභාගි විය.

## 08. ජගත් කෙළිබිමට රන් අරුනාණැල්ලක් -ක්‍රීඩා උපහාර උළෙල

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 8.5 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 8.4 මූල්‍ය ප්‍රගතිය :- ප්‍රතිශතය 99%**

ජාතික මහා ක්‍රීඩා උළෙලෙන් ජයග්‍රාහනය ලබා ගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඊට උරදුන් පුහුණුකරුවන් සඳහා කුසලතා ඇගයීම මෙමගින් සිදු කළ අතර ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 117ක් සඳහා ද ජාත්‍යන්තර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 17 ක් සඳහා මුදල් ත්‍යාග සමඟ උපහාර ලබා දුන් අතර, එම ක්‍රීඩකයින්හට පුහුණුව සඳහා උරදුන් පුහුණුකරුවන් 57ක් සඳහා ඇගයීම් සිදු කළ අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 144 දෙනෙකු වෙනුවෙන් පෝෂණ දීමනා ලබා දීම ද සිදු විය. ක්‍රීඩක ක්‍රීඩිකාවන් 30 දෙනෙකු සඳහා දිරි දීමනා ලබා දීමද සිදු විය.

උපහාර ලාභී ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය (ප්‍රතිලාභීන්) - 165
උපහාරලාභී නිලධාරීන් ප්‍රමාණය (ප්‍රතිලාභීන්) - 80
පෝෂණ දීමනා හිමි ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය - 170
දිරි දීමනා හිමි ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය - 48
වියදම-රුපියල් 8,474,460.00

## 09.ජාතික මහා ක්‍රීඩා උළෙල

බදුල්ල විල්සන් ඩයස් ක්‍රීඩාංගනයේ 45 වන ජාතික මහා ක්‍රීඩා උළෙල පැවති අතර උතුරු මැද පළාත පළාත් මට්ටමෙන් හයවන (6) ස්ථානය හිමිකර ගනු ලැබිය. තවද කණ්ඩායම් තරඟ මඟින් විශිෂ්ට ජයග්‍රහණ හිමිකර ගත් අතර පළාත වෙනුවෙන් පදක්කම් රැසක් හිමි කර ගත්තේය.

**45 වැනි ජාතික මහ ක්‍රීඩා උළෙලේ සමස්ත පදක්කම් සටහන**

| පළාත | රන් | රිදී | ලෝකඩ | පදක්කම් එකතුව |
|---|---|---|---|---|
| බස්නාහිර | 99 | 78 | 81 | 258 |
| මධ්‍යම | 51 | 38 | 60 | 149 |
| වයඹ | 32 | 33 | 44 | 109 |
| දකුණ | 29 | 31 | 45 | 105 |
| සබරගමුව | 19 | 30 | 38 | 87 |
| උතුරු මැද | 17 | 20 | 41 | 78 |
| ඌව | 11 | 23 | 29 | 63 |
| නැගෙනහිර | 08 | 06 | 09 | 23 |
| උතුර | 03 | 09 | 10 | 22 |

## අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ,ඉලක්ක හා නිමවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක |
|---|---|
| 03. නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සහජීවනය ප්‍රවර්ධනය කිරීම | 3.4. 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම |
| | 3.5.හානිකර ආකාරයට මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරි ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග 3.4.1.හෘදරෝග/පිළිකා/දියවැඩියාව /හෝ නිදන්ගත රෝග වලින් මිය යන ප්‍රමාණය |
| | 3.4.2..සියදිවි නසා ගැනීම්/මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම විම. |
| | 3.5.1.මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හටගන්නා ආබාධ අවම විම |
| 09. ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම,සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම | 9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |
| | 9.1.1.වසර පුරා ක්‍රිඩාංගන භාවිතා කරන ප්‍රමාණය ක්‍රිඩාංගන භාවිතා කළ හැකි කාලසීමාව |
| 05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම | 5.1.කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීම /ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම |
| | 5.1.1.ස්ත්‍රීපුරුෂභාවයට අදාලව සමානත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම අධීක්ෂණය පිණිස නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළගා විම කෙරේහි පළාත දායකත්වය

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **03.නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සහජීවනය ප්‍රවර්ධනය කිරීම**<br>3.4. 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම<br>3.5.හානිකර ආකාරයට මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරි ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග<br>3.4.1.හෘදරෝග/පිළිකා/දියවැඩියාව /හෝ නිදන්ගත රෝගවලින් මිය යන ප්‍රමාණය<br>3.4.2..සියදිවි නසා ගැනීම්/මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම විම.<br>3.5.1.මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හටගන්නා ආබාධ | -බෝනොවන රෝග වලට ගොදුරු වන ප්‍රමාණය හා එවැනි රෝග වලින් මිය යන ප්‍රමාණය 75% කින් අවම කිරීම.<br>-සිය දිවි නසා ගැනීම් හා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වන ප්‍රමාණය.<br>-පළාත්, ජාතික,ජාත්‍යන්තර, ක්‍රිඩා තරග සඳහා ක්‍රිඩකයින්ගේ හා ක්‍රිඩිකාවන්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම.<br>-සංවර්ධනය කරන ලද ක්‍රිඩා පිටි සංඛ්‍යාව.<br>-ක්‍රිඩාංගනය භාවිතා කරන බාහිර පර්ශවයන් විසින් පවත්වන ලද ක්‍රිඩා තරඟ සංඛ්‍යාව.<br>-ක්‍රිඩාංගනය තුළ පුහුණු වන ක්‍රිඩක ක්‍රිඩිකාවන් සංඛ්‍යාව.<br>-ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව. ඇගයුම්ලහි ක්‍රිඩකයින්/නිළධාරින් සංඛ්‍යාව<br>-දිරි දිමනා ලබා දුන් ක්‍රීඩකයින් සංඛ්‍යාව<br>-පෝෂණ දීමනා ලබා දුන් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 90% | 100% |

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයෝජනය (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| 09.ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම,සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරිම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම<br>9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසිමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරිම<br>9.1.1.වසර පුරා ක්‍රිඩාංගන භාවිතා කරන ප්‍රමාණය ක්‍රිඩාංගන භාවිතා කල හැකි කාලසිමාව | බෝනොවන රෝගවලට ගොදුරු වන ප්‍රමාණය හා එවැනි රෝගවලින් මිය යන ප්‍රමාණය<br>සිය දිවි නසා ගැනීම් හා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වන ප්‍රමාණය<br>පළාත්,ජාතික, ජාත්‍යන්තර,ක්‍රිඩා තරඟ සඳහා ක්‍රිඩකයින්ගේ හා ක්‍රිඩිකාවන්ගේ නිපුනතා වැඩිදියුණු කරන ලද ප්‍රමාණය<br>හඳුනා ගන්නා ලද වොලිබෝල් කාණ්ඩායම් සංඛ්‍යාව | 75% | 50% |
| 05.ස්ත්‍රි පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම<br>5.1.කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරිම ප්‍රචණ්ඩත්වය තුරන් කිරිම<br>5.1.1.ස්ත්‍රීපුරුෂභාවයට අදාලව සමානත්මතාවය සහ වෙනස් කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරිම අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න | හඳුනා ගන්නා ලද වොලිබෝල් ක්‍රිඩක ක්‍රිඩිකාවන් සංඛ්‍යාව<br>ආරම්භ කරන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව<br>ක්‍රියාකාරී සමාජික සංඛ්‍යාව<br>පහසුකම් සපයන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව | 100% | 100% |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරහි ත්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය(රු.මි) | සත්‍ය වියදම (රු.මි) |
|---|---|---|
| ක්‍රීඩා පිටි සංවර්ධනය කිරිම | 1.45 | 1.27 |
| කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය කිරිම | 12.5 | 4.39 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.20 | 0.09 |
| පුහුණු කඳවුරු පැවැත්වීම | 0.11 | 0.11 |
| ජගත් කෙලිබිමට රන් අරුණැල්ල, කුසලතා ඇගයීම/පෝෂණ දීමනා දීරි දීමනා ලබා දීම | 8.5 | 8.4 |
| රජරට රන් කුසලාන වොලිබෝල් තරඟ | 0.97 | 0.89 |
| ගෘහස්ථ ක්‍රීඩාගාරයේ හා කාර්යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය | 1.00 | 0.15 |
| හඳුනාගත් ක්‍රීඩා ඉසව් සංවර්ධනය | 0.50 | 0 |
| ක්‍රීඩා තරු වැඩසටහන | 0.50 | 0.35 |
| ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම | 6.50 | 6.47 |
| තරග වෙනුවෙන් අවශ්‍ය උපකරණ ලබා ගැනීම | 1.00 | 0.99 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ක්‍රීඩාපිටි හා වොලිබෝල් ක්‍රීඩාපිටි සංවර්ධනය කිරිම | සුදර්ශනගම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිම -තඹුත්තේගම | 150 |
| | කුරුදුවැව ක්‍රීඩා පිටිය සංවර්ධනය -කහටගස්දිගිලිය | 100 |
| | රාජාංගනය යුනයිටඩ් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරිම | 175 |
| | තලාව එළිය දිවුල්වැව ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරිම | 200 |
| | ගල්නෑව නෑගම්පහ ක්‍රීඩා පිටිය සංවර්ධනය | 100 |
| කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය කිරිම | කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය කිරිම | |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | තොරතුරු පනත හා විගණන පනත සම්බන්ධ පුහුණු වැඩසටහන | 90 |
| | මූල්‍ය පාලන මූල්‍ය විනය | 90 |
| | සාමාන්‍ය හැසිරීම හා විනය | 90 |
| | ධනාත්මක චින්තනය | 85 |
| | ක්‍රීඩා නිලධාරින් සඳහා තාක්ෂණික දැනුම ප්‍රවර්ධන වැඩසටහන | 60 |
| ජගත් කෙළිබිමට රන් අරුණැල්ල, කුසලතා ඇගයීම/පෝෂණ දීමනා දිරි දීමනා ලබා දීම | දිරිදීමනා ලබා දීම | 48 |
| | පෝෂණ දීමනා ලබා දීම | 170 |
| | ජාතික මහා ක්‍රීඩා උලෙළ ජයග්‍රාහකයන්ට උපහාර ලබා දීම | 165 |
| | නිලධාරීන් ඇගයීම | 80 |
| රජරට රන් කුසලාන වොලිබෝල් තරඟ | උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සියල්ල නියෝජනය කරමින් කාන්තා පිරිමි කණ්ඩායම් ගෙන්වා වොලිබොල් තරගාවලියක් පවත්වා ජයග්‍රාහක කණ්ඩායම් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමට ලක් කිරිම | 800 |
| ශෘහස්ථ ක්‍රීඩාගාරයේ ජල නල පද්ධතිය,වහලය සකස් කිරිම හා කාර්යාලය වායු සමීකරණය කිරිම | ගෘහස්ත ක්‍රීඩාගාරයේ ජලනල පද්ධතිය අක්‍රියව පැවති සියලු මුද්‍රිත වැසිකිළි පද්ධති හා ජල කරාම සකස් කිරිම | 1000 |
| හඳුනාගත් ක්‍රීඩා ඉසව් සංවර්ධනය | පසු පෙළ ක්‍රීඩකයින් හඳුනාගැනීම වොලිබෝල්/කබඩි | 200 |
| ක්‍රීඩා තරු වැඩසටහන | දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සියලුම නිලධාරීන් හා සේවක මණ්ඩලයේ සහභාගිත්වයෙන් අභිප්‍රේරණ වැඩසටහනක් ලෙස ක්‍රීඩා ඉසව් කිහිපයක් තෝරා ගනිමින් තරගාවලියක් පවත්වා ඔවුන් ඇගයීම | 85 |
| ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා භාණ්ඩ ලබා දීම | ලියාපදිංචි වී ඇති ක්‍රියාකාරි ක්‍රීඩා සමාජ දිරිමත් කිරිම සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම | ක්‍රීඩා සමාජ 700 |
| දෙපාර්තමේන්තුව මගින් පවත්වන ක්‍රීඩා තරඟ වෙනුවෙන් අවශ්‍ය උපකරණ ලබා ගැනීම | පිහිණුම් තටාකයේ ආරම්භක පුවරු අලුතින් සකස් කිරිම/පිටියේ ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය ආරම්භක පුවරු/යගුලිය රඳවන කවපෙත්ත රඳවන ලබා ගැනීම | 1000 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මගින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු 17 න් අරමුණු 04 ක් කරා ළඟා විමට අවශ්‍ය දායකත්වය ලබා දීමට පළාත් ක්‍රීඩා දෙපාර්තමෙන්තුවට හැකියාව ලැබි ඇත.

නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සහජිවනය ප්‍රවර්ධනය කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම යන තිරසර සංවර්ධන අරමුණ ළඟාකර ගැනීම යන දර්ශක කෙරේ යොමු විමට හැකි වි ඇත. තිරසර සංවර්ධන අරමුණ කරා යාමට හැකි වන ආකාරයේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරිමට හැකියාව ලැබුණි. ඒ අතර ප්‍රාදේශීය ක්‍රීඩා පිටි 05 ක් සංවර්ධනය පුහුණු වැඩසටහන් 05 ක් පැවැත්විම,පුහුණු කඳවුරු පැවැත්වීම,දෙස් විදෙස් තරඟ සඳහා සහභාගි වී ජයග්‍රහණය ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් 213 ඇගයීමට ලක් කරන ලදී. ඒ සඳහා උරදුන් නිලධාරීන් 80 ඇගයීමට ලක්කිරිම ජයග්‍රහකයන් 48 දෙනෙකුට දිරි දීමනා ලබා දීමට හා පෝෂණ දීමනා 170 දෙනෙකුට ලබා දීමට ද හැකිවිය.

පළාත තුළ විසිර සිටින දක්ෂ වොලිබෝල් කණ්ඩායම් 42 ක් හඳුනා ගැනීම,පසු පෙළ ක්‍රිඩකයින් හඳුනා ගැනීම හා දිරිමත් කිරිම නිලධාරින් හා සේවකයන් 80 දෙනෙකු අභිප්‍රේරණය සඳහා වැඩසටහන් ක්‍රියාක්මක කිරිම සිදු කරන ලද අතර, ඒ තුළින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය දායකත්වය ලබා දී ළඟා කර ගත් අරමුණු මැනිය හැක්කේ 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරිම සියදිවි නසා ගැනීම්,මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම කිරිම යන දර්ශකයන් තුළිනි.

ස්ථායි යටිතල පහසුකම් ගොඩනැගීම, සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරිම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසිමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරිම යන තිරසර සංවර්ධන අරමුණ කරා ගමන් ගන්නා ආකාරයේ ව්‍යාපෘති කිහිපයක්ද ක්‍රියාත්මක කිරිමට හැකිවිය.

කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධනය , ක්‍රීඩා පිටි සංවර්ධනය , පිහිණුම් තටාකයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරිම වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද අතර උතුරු මැද පළාත නියෝජනය කරනු ලබන සියලු ක්‍රිඩක ක්‍රීඩිකාවන් නිලධාරින් ක්‍රීඩාංගන ,ක්‍රීඩාගාර, පිහිනුම් තටාකය, භාවිතා කරන සියලු ක්‍රිඩකයින් පාසැල් සිසුන් ,සාමාන්‍ය ජනතාව , රාජ්‍ය ආයතන නිලධාරීන් ප්‍රතිලාභින් වන අතර ඔවුන්ගේ භාවිතය සඳහා සකස් කරන ලද ඉහත යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රතිලාභ ලෙස විග්‍රහ කළ හැකිය.

## කාර්ය සාධන ඉලක්ක - 2019

| ප්‍රධාන කාර්ය සාධන දර්ශක(KPIs) | ඉලක්ක | | වියදම | |
|---|---|---|---|---|
| | **2018** | **2019** | **2019** | **2020** |
| **පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය** | | | | |
| 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 79 | 80 | - | - |
| 2.ක්‍රීඩාංගනය භාවිතා කරන බාහිර පාර්ශවයන් විසින් පවත්වන ලද ක්‍රීඩා තරඟ සංඛ්‍යාව | 50 | 100 | 0.15 | - |
| 3. ක්‍රීඩාංගන තුළ පුහුණු ලබන සංඛ්‍යාව | 800 | 1000 | - | - |
| 1. ප්‍රතිසංස්කරණය කළ ක්‍රීඩාංගන සංඛ්‍යාව | - | 05 | 1.27 | 1.00 |
| **කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.** | | | | |
| 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 79 | 80 | - | - |
| 2. ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයින් ප්‍රමාණය | 45 | 45 | - | - |
| 3. තාක්ෂණයෙන් පිරි නිලධාරින් සංඛ්‍යාව | 85 | 85 | 0.11 | 2.50 |
| 4. තාක්ෂණික දැනුම ලත් නිලධාරින් සංඛ්‍යාව | 85 | 85 | - | - |
| 5. පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 5 | 05 | 0.09 | 1.00 |
| 6. පුහුණු කඳවුරු සඳහා සහභාගී වන නිලධාරින් සංඛ්‍යාව | 85 | 85 | - | - |
| **ජාතික ක්‍රීඩා උළෙලේ පදක්කම් වැඩිපුර ලබා ගැනීම.ජාතික ක්‍රීඩා උළෙලේදී පළාත ඉහළ මට්ටමේ තැබීම.** | | | | |
| 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 80 | 90 | 8.47 | 12.00 |
| 2. ජාත්‍යන්තර මට්ටමට ගිය ක්‍රීඩකයින් ප්‍රමාණය | 45 | 55 | | |
| 3. පුහුණු කරන ලද කාණ්ඩායම් ක්‍රීඩා සංඛ්‍යාව | 34 | 34 | | |
| 4. එලදායී ලෙස පවත්වන ලද පුහුණු කඳවුරු සංඛ්‍යාව | 34 | 01 | | |
| 5. පුහුණුව සඳහා සහභාගී වූ ක්‍රීඩකයින් සංඛ්‍යාව | 225 | 235 | | |
| 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 79 | 79 | 5.92 | |
| 2. ඇගයූ ක්‍රීඩකයින්/නිළධාරින් සංඛ්‍යාව | 250 | 290 | | |
| 3. දිරි දීමනා ලබා දුන් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 39 | 40 | 7.70 | |
| 4. පෝෂණ දීමනා ලබා දුන් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 165 | 175 | **1.77** | |
| 1. හඳුනා ගන්නා ලද වොලිබෝල් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 300 | 500 | 0.89 | 1.50 |
| 2. හඳුනා ගන්නා ලද වොලිබෝල් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 3600 | 4200 | | |
| **පුහුණු මධ්‍යස්ථාන,තරඟ ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබාදීම** | | | | |
| **1.** ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 79 | 80 | **0.99** | **5.00** |
| 2. ලබා ගැනීමට බලාපොරොත්තුවන උපකරණ සංඛ්‍යාව | 15 | 07 | | |
| 3. පුහුණු වන ක්‍රීඩකයින් සංඛ්‍යාව | 250 | 350 | | |
| 1. පවත්වන ලද ක්‍රීඩා තරඟ සංඛ්‍යාව | 40 | 50 | | |
| 2. ක්‍රීඩා කරන ක්‍රීඩකයින් සංඛ්‍යාව | 560 | 685 | | |
| 3. උපකරණ භාවිතා කරන නිළධාරින් සංඛ්‍යාව | 76 | 76 | | |
| 1. ආරම්භ කරන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව | 600 | 700 | **6.47** | **7.0** |
| 2. ක්‍රියාකාරී සමාජික සංඛ්‍යාව | 40000 | 42500 | | |
| 3. පහසුකම් සපයන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව | 900 | 700 | | |
| **ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රීඩා කෞශලයයෙන් පිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීම. පළාත තුල සිටින සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | | | |
| 1 පුහුණුවීම් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 80 | 80 | 0.35 | 0.75 |
| 2. ජාත්‍යන්තර මට්ටමට ගිය ක්‍රීඩකයින් ප්‍රමාණය | 45 | 40 | | |
| 3. හඳුනාගන්නා ලද ක්‍රීඩාවන් සංඛ්‍යාව | 10 | 12 | | |
| 4අභිප්‍රේරණ වැඩසටහනට සම්බන්ධ වූ නිලධාරීන් ප්‍රමාණය | 80 | 80 | | |

**ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

| ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.** | | | | |
| ක්‍රීඩා පිටි හා වොලිබෝල් ක්‍රීඩා පිටි සංවර්ධනය | ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 1.45 | 1.27 | 88 |
| වොලිබෝල් ක්‍රීඩාපිටිය සංවර්ධනය | ක්‍රීඩාංගනය භාවිතා කරන බාහිර පර්ශවයන් විසින් පවත්වන ලද ක්‍රීඩා තරඟ සංඛ්‍යාව | | | |
| කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | ක්‍රීඩාංගන තුළ පුහුණු ලබන සංඛ්‍යාව | 12.5 | 4.4 | 35 |
| පිහිණුම් තටාකයේ නවීකරණය | ක්‍රීඩාංගනය භාවිතායෙන් ලැබූ ආදායම (රු.මි.) | 1.0 | 0.9 | 99 |
| ගෘහස්ත ක්‍රීඩාගාරයේ අලුත්වැඩියාව | ප්‍රතිසංස්කරණය කළ ක්‍රීඩාංගන සංඛ්‍යාව | 1.0 | 0.15 | 15 |
| **උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.** | | | | |
| පුහුණු කඳවුරු පැවැත්වීම | ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 0.11 | 0.11 | 100 |
| පුහුණු වැඩසටහන් පැවැත්විම | ජාත්‍යන්තර මට්ටමට ගිය ක්‍රීඩකයින් ප්‍රමාණය | 0.2 | 0.09 | 45 |
| ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා භාණ්ඩ ලබා දීම | ලියාපදිංචි ක්‍රීඩා සමාජ සංඛ්‍යාව | 6.5 | 6.4 | 99 |
| දෙපාර්තමේන්තුවට භාණ්ඩ ලබා ගැනීම | භාණ්ඩ පරිහරණය කරන ප්‍රමාණය | 1.0 | 0.9 | 99 |
| ක්‍රීඩා තරු වැඩසටහන | අභිප්‍රේරණය වූ සේවක සංඛ්‍යාව<br>පුහුණු කඳවුරු සඳහා සහභාගී වන නිළධාරින් සංඛ්‍යාව | 0.5 | 0.3 | 66 |
| **ජාතික ක්‍රීඩා උළලේ පදක්කම් වැඩිපුර ලබා ගැනිම.** | | | | |
| ජගත් කෙළිබිමට රන් අරුණැල්ලක් උපහාර උළෙල | ජාතික ජයග්‍රහණ සංඛ්‍යාව<br>ජාත්‍යන්තර මට්ටමට ගිය ක්‍රීඩකයින් ප්‍රමාණය<br>පුහුණු කරන ලද කණ්ඩායම් ක්‍රීඩා සංඛ්‍යාව<br>ඵලදායී පුහුණු කඳවුරු සංඛ්‍යාව<br>පුහුණුව සඳහා සහභාගී වූ ක්‍රීඩකයින් සංඛ්‍යාව<br>පිට පළාත්වල පැවති පුහුණු සඳහා සහභාගී වූ ක්‍රීඩකයින් සංඛ්‍යාව | 8.5 | 8.4 | 99 |

## ආයතනය හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත ආපේක්ෂාවන්

ප්‍රාදේශිය මට්ටමෙන් කුසලතා සපිරි ක්‍රිඩක ක්‍රිඩිකාවන් හදුනා ගනිමින්, ඔවුන්ගේ හැකියාවන් ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒමත් පළාත් ක්‍රිඩා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ.ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ දක්ෂතා හඳුනා ගැනීමටත් , ඔවුන්ගේ හැකියා හා දක්ෂතා ඇගයිමටත් ,ඔවුන්ගේ මානසික හා කායික වර්ධනයටත් ,අවශ්‍ය සහාය හා මඟ පෙන්විම ලබා දීම ප්‍රධාන කාර්යයකි. එසේම උතුරු මැද පළාත තුළ නිරෝගි දරු පරපුරක් ගොඩනැගිමේ කාර්යයට ද දායක වෙමින් ඉහත කී අරමුණ ළඟා කර ගැනීම සඳහා වන වැඩසටහන් 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදී. 2020 වර්ෂයේදී පළාත්, ජාතික, ජාත්‍යන්තර ක්‍රිඩා තරඟ සඳහා ක්‍රිඩකයින්ගේ සහ ක්‍රිඩිකාවන්ගේ නිපුනතා වැඩිදියුණු කිරිමට අවශ්‍ය සැලසුම් සකස් කර අවසන් කරන ලදී.

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහිම පවතින ක්‍රිඩා පිටිවලින් බොහෝමයක් කිසිදු පහසුකමක් නොමැති නිසාම ක්‍රිඩාවට නුසුදුසු තත්වයට පත්ව ඇත. ග්‍රාමීය මට්ටමේ සිටින ළමා පරපුර හා තරුණ පරපුර ක්‍රිඩාව වෙත යොමු කිරීමට නම් ඔවුන්ට ක්‍රිඩා කළ හැකි පහසුකම් සහිත ක්‍රිඩා පිටි සකස් කර දිය යුතුය. පවතින ක්‍රිඩා පිටි ප්‍රතිසංස්කරණය කිරීම හරහා නව පරපුර ක්‍රිඩාවට යොමු කිරීමට හැකි වීම, ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතය වැනි නරක පුරුදු වෙත යොමු විමට ඇති ඉඩකඩ අහුරාලීමට හැකි වීම හා නිරෝගි දරු පරපුරක් බිහි කිරිමට හැකි වේ.

ජාතික මහා ක්‍රිඩා තරඟාවලිය සඳහා ක්‍රිඩා ඉසව් 34ක් නියෝජනය කරමින් ක්‍රිඩකයින් 850කට අධික ප්‍රමාණයක් උතුරු මැද පළාත නියෝජනය කරමින් සහභාගි විය. ජාතික තරඟවලට සහභාගි විමට පෙර ඔවුන්ගේ දක්ෂතාවයන් හඳුනා ගනිමින් දක්ෂ පුහුණුකරුවන් යටතේ පුහුණු කරවීම සඳහා පුහුණු කඳවුරු පැවැත්විමට සිදු විය.තිරසර සංවර්ධන අරමුණු හා සෞභාග්‍යයේ දැක්ම කරා ළඟාවිය හැකිවන ආකාරයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම පළාත් ක්‍රිඩා දෙපාර්තමේන්තුවේ අනාගත අපේක්ෂාව වේ.

## 2020 දී ක්‍රියාත්මක කිරිම සඳහා යෝජිත නව සංවර්ධන ව්‍යපෘති පිළිබඳ අදහස් හා යොජනා

තිරසර සංවර්ධන අරමුණු හා සෞභාග්‍යයේ දැක්ම අනුව යමින් 2020 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කෙරේ. ඒ යටතේ ප්‍රාදේශීය ක්‍රිඩා පිටි සංවර්ධනය ,කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරිම සිදුකිරිමට යෝජනා ඉදිරිපත් කර ඇත.එමෙන්ම කාර්යාලය, ගෘහස්ත ක්‍රිඩාගාරය ,පිහිණුම් තටාකය හා ක්‍රිඩා සංකීර්ණය සඳහා මාසිකව විදුලිබිල්පත් ලෙස විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. එය අවම කර ගැනීම හා ජාතික විදුලි බල සැපයුමට යම් දායකත්වයක් ලබා දීමේ අරමුණින් ගෘහස්ත ක්‍රිඩාගාරයේ වහලය මත සූර්යය විදුලි පද්ධතියක් ඉදිකිරිමට අපේක්ෂා කෙරේ.යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පළාත් සභා සංවර්ධන ප්‍රධාන ප්‍රතිපාදන මගින් කාර්යාල භූමිය වටා ගේට්ටු හා වැට සකස් කිරිමට සැලසුම් කර ඇත.

ජාතික හා ජාත්‍යන්තර තරඟ නියෝජනයට සුදුසුකම් ලබන ක්‍රිඩක ක්‍රිඩිකාවන් හඳුනා ගනිමින් ඔවුන් තරඟවලට සහභාගි වීමට පෙර පුහුණු කටයුතු සඳහා යොමු කිරිම හා තරඟ ජයග්‍රාහකයන් හා පුහුණු කරුවන් ඇගයීම සඳහා උපහාර උළෙල පැවැත්විමට යෝජනා ඉදිරිපත් කර ඇත. එමෙන්ම තරඟ කරුවන් සඳහා පෝෂණ දීමනා හා දිරි දීමනා ලබා දීමටද සැලසුම් කර ඇත.නිලධාරින් සඳහා අභිප්‍රේරණ වැඩසටහන් අන්තර් දෙපාර්තමේන්තු සුහදතා වර්ධන වැඩසටහනක්ද ක්‍රියාත්මක කිරිමට යෝජනා කර ඇත. ඒ අතර ක්‍රිඩා තරු වැඩසටහන හා අන්තර් දෙපාර්තමේන්තු තරඟාවලියක් පැවැත්විම/දෙපාර්තමේන්තු හා කාර්යාලගත නිලධාරීන් ගේ දැනුම ආකල්ප කුසලතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් කීපයක් ද ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂයේදී ලද ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරමින් උතුරු මැද පළාත් ක්‍රිඩා අංශය නංවාලීම සඳහා කටයුතු කරන ලදී. එහිදී ක්‍රිඩාංගන සංවර්ධනය, ක්‍රිඩා උපකරණ ලබා දීම, පුහුණු වැඩසටහන් හා පුහුණු කඳවුරු පැවැත්වීම සිදු කරන ලදී.

# 10. පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

## උතුරු මැද පළාතේ මාර්ග සංයුතිය

| විධායක ඉංජිනේරු කාර්යාලය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව(කි.මී.) |
|---|---|---|---|
| මරදන්කඩවල | 184.55 | 190.40 | 374.95 |
| හොරොව්පොතාන | 146.66 | 226.58 | 373.24 |
| නොච්චියාගම | 212.03 | 107.45 | 319.48 |
| අනුරාධපුර | 197.35 | 173.17 | 370.52 |
| එකතුව | **740.59** | **697.60** | **1438.19** |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව (කි.මී.) |
|---|---|---|---|
| මින්නේරිය | 153.45 | - | 153.45 |
| මනම්පිටිය | 225.62 | 12.56 | 238.18 |
| සේවාගම | 116.65 | 0.85 | 117.50 |
| එකතුව | **495.72** | **13.41** | **509.19** |

## දැක්ම

"තෘප්තිමත් ජනතාවක් ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු සම්බන්ධ සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව නියාමනය කිරීම මඟින් සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු

ජාතික සාර්ව ප්‍රතිපත්තිවලට අනුකූලව ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස කටයුතු හා කාන්තා කටයුතු පිළිබඳ උතුරු මැද පළාතේ ප්‍රතිපත්ති සකස් කිරීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම මෙන්ම නිවාස හා කාන්තා කටයුතු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් පළාතේ ජනතාවගේ ජීවන තත්වය වර්ධනය කිරීමට දායක වීම.

## කෙටිකාලීන අරමුණු

- පළාත් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.

- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- තෝරාගත් අඩු ආදායම්ලාභීන් වෙත නිවාස ආධාර ලබා දීම.
- තෝරාගත් වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස ආධර ලබා දීම.
- තෝරාගත් කාන්තාවන් සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් (සජීවීකරණ) පැවැත්වීම.
- තෝරාගත් ස්වයං රැකියාලාභී කාන්තාවන් සවිබල ගැන්වීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම.
- ක්ෂේත්‍ර අධීක්ෂණය.
- දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- නිවාස ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.




## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 65 |
| 2 | සේවයේ නියුතු | 32 |
| 3 | පුරප්පාඩු | 33 |
| | **එකතුව** | 130 |

## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන(රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 21.70 | 20.18 | 1.52 | 93 |
| ගමන් වියදම් | 1.14 | 1.11 | 0.03 | 97 |
| සැපයීම් | 2.19 | 2.01 | 0.18 | 92 |
| නඩත්තු වියදම් | 1.59 | 1.43 | 0.16 | 90 |
| ගිවිසුම් ගත සේවා | 0.98 | 0.79 | 0.19 | 76 |
| මාරු කිරීම් | 0.05 | 0.04 | 0.01 | 76 |
| **එකතුව** | **27.65** | **25.56** | **2.09** | **92.44** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.15 | 0.00 | 0.15 | 0 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.15 | 0.00 | 0.15 | 0 |
| වාහන | 0.60 | 0.14 | 0.46 | 23 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.45 | 0.38 | 0.07 | 85 |
| ධාරිතා සංවර්ධනය | 0.90 | 0.80 | 0.10 | 89 |
| **එකතුව** | **2.25** | **1.32** | **0.93** | **59** |

## අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජන (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **තිරසර සංවර්ධන අරමුණ -ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.** | | | |
| තිරසර සංවර්ධන ඉලක්කය - 5.1 සහ 5.2<br>ස්ත්‍රී පුරුෂ භාවයට අදාලව සමානාත්මතාවය සහ වෙනස් කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවත්නේද ? නැද්ද යන්න. | දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන.<br>සහභාගී වන කාන්තාවන් ගණන.<br>ස්වයං රැකියා ගන්වන ලද කාන්තා ගෘහ මූලික පවුල් ගණන | 1.50<br>1.10<br>1.50 | 1.40<br>1.10<br>1.50 |
| **තිරසර සංවර්ධන අරමුණ - නගර සහ ජනාවාස පරිපූර්ණ , ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.** | | | |
| තිරසර සංවර්ධන ඉලක්කය -11-2<br>පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත්වන නාගරික ජනතාවගේ ප්‍රමාණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව<br>සංවර්ධනය කරන ලද නිවාස සංඛ්‍යාව | 5.80 | 5.40 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණ | ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 5 | 5.1 | 5.1.1 | ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩ සටහන | 0.3 | 0.2 |
| | 5.2 | 5.2.2 | කාන්තා සජීවිකරණය හා බල ගැන්වීම | 1.1 | 1.1 |
| | 5- c | 5-c-1 | දිරිය කාන්තා වැඩසටහන | 1.5 | 1.5 |
| 11 | 11.1 | 11.1.1 | පවුල්වල නිවාස ඉදි කර ගැනීම සඳහා මූල්‍යාධාර ලබාදීම | 5.8 | 5.8 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රා. ලේ කො.ගණ න |
|---|---|---|---|
| ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩ සටහන | දැනුවත් කිරීමේ වැඩසටහන | 100 | 29 |
| කාන්තා සජීවිකරණය හා බල ගැන්වීම | | 2550 | 15 |
| දිරිය කාන්තා වැඩසටහන | ස්වයං රුකියා සඳහා යොමු කිරීම | 73 | 29 |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට යම් ආකාරයකින් කරන ලද දායකත්වය

2019 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය වෙත ප්‍රාග්ධන අරමුදල ලෙස රු.මිලියන 33 ක මුදලක් වෙන්කර තිබුණු අතර පුනරාවර්තන වියදම් ලෙස රු.මිලියන 27.4ක ප්‍රතිපාදන මුදලක් වෙන් කර තිබුණි. ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් අහුරා තැබීම්වලට යටත්ව හා රාජ්‍ය වියදම් කළමනාකරණ සීමාවන්ට යටත්ව 28% ක ප්‍රතිශතයක් අත්පත් කරගෙන තිබුණි. පුනරාවර්තන වියදමින් 92% ක උපයෝජනයක් යටතේ පවත්වාගෙන ඇත.

ස්වකීය අරමුණු ඉටුකර ගැනිම සඳහා අමාත්‍යාංශය සතු භෞතික හා මානව සම්පත් මනාව කළමනාකරණය කොටගෙන පවත්වා ගැනීම තුළින් ඉහත ප්‍රතිශතයන් 2019 වර්ෂයේදී අත්පත් කර ගැනීමට හැකි විය. එනිසා පළාතේ කාන්තාවන් 100 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන ක්‍රියාත්මක කිරිම තුළින් තිරසර සංවර්ධන අරමුණු 5.1.1 කරා ළඟා වීමට හැකිවිය. එසේම ප්‍රතිලාභින් 2550ක් සජීවිකරණයට ලක් කිරීම තුළින් තිරසාර සංවර්ධන අරමුණු 5.2.2 හරහා සාර්ථකව ළඟා වීමට හැකි විය. එමෙන්ම දිරිය කාන්තා වැඩසටහන යටතේ කාන්තා ගෘහ මුලික පවුල් 73 ක් ස්වයංරැකියාවන් සඳහා යොමු කිරිමට හැකි විය.

## කාර්ය සාධන ඉලක්ක - 2019

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | වියදම්/ ආයෝජන (රු.මි) | |
|---|---|---|---|---|---|---|
| | | | 2018 | 2019 | 2019 | 2020 |
| 1 | දෙපාර්තමේන්තු අධීක්ෂණය | අධීක්ෂණය කල වාර ගණන | 12 | 12 | - | - |
| 2 | ප්‍රගති සමාලෝචනය | ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | 12 | 12 | - | - |
| 3 | ධාරිතා සංවර්ධනය | වැඩසටහන් සංඛ්‍යාව | 02 | 02 | 0.83 | 1.50 |
| 4 | අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීම | ඉදිකළ නිවාස සංඛ්‍යාව | 1310 | 58 | 5.80 | 30.00 |
| 5 | දිරිය කාන්තා වැඩසටහන | ස්වයංරැකියා සඳහා යොමු කළ පවුල් සංඛ්‍යාව | 150 | 73 | 1.50 | 12.00 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2019

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම | ජාත්‍යන්තර කාන්තා දින සැමරීම | කාන්තාවන්ට දැනුම ලබා දීම | 0.50 | 0.23 | 62 |
| කාන්තාවන් ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය | කාන්තා සවිබල ගැන්වීම | සවිබල ගන්වන ලද කාන්තාවන් | 1.50 | 1.12 | 75 |
| ස්වං රැකියා උත්පාදනය | දිරිය කාන්තා වැඩ සටහන | ආදායම් උත්පාදනය, | 2.00 | 1.48 | 74 |
| අඩු ආදායම්ලාභි වැන්දඹු කාන්තාවන්ගේ නිවාස ගැටළුව විසඳීමට දායක වීම | වැන්දඹු හෝ කාන්තා මූලික අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරිම සඳහා මුල්‍යාධාර ලබා දිම | වැන්දඹු කාන්තාවන්ගේ පවුල්වල නිවාස ගැටළුව විසඳීමට සහාය වීම | 4.00 | - | - |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2019

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටළුව විසඳීමට දායක වීම | අඩු ආදායම්ලාභී නිවාස ඉදි කිරීම හෝ අළුත්වැඩියා කර ගැනීම සඳහා ද්‍රව්‍ය ආධාර ලබා දීම | පළාතේ තෝරාගත් අඩු ආදායම් ලාභී වැන්දඹු කාන්තාවන්ගේ පවුල්වල නිවාස ගැටළුව විසඳීමට සහාය වීම | 10.00 | - | - |
| නිවාස ගැටළුව විසඳීමට දායක වීම | අඩු ආදායම්ලාභී නිවාස ඉදි කිරීම හෝ අළුත්වැඩියා කර ගැනීම සඳහා මූල්‍යාධාර ලබා දීම | පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටළුව විසඳීමට සහාය වීම | 15.00 | 5.80 | 39 |
| **එකතුව** | | | **33** | **8.63** | **26** |

## තම ආයතනයේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති

01. තෝරා ගන්නා ලද අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමට පහසුකම් සැපයීම.
02. තෝරා ගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස අළුත්වැඩියා කර ගැනීම සඳහා මූල්‍ය ආධාර සැපයීම.
03. අඩු ආදායම්ලාභී පවුල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
04. කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගන්වමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම.
05. පළාතේ තෝරා ගන්නා ලද අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ප්‍රජා දායකත්වය මත ස්වයං රැකියාගත කිරීම.
06. පළාතේ කාන්තා මූලික පවුල්වල නිවාස සංවර්ධනයට පහසුකම් සැපයීම.
කාන්තා සජීවිකරණය හා බල ගැන්වීම.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලින |
| තෝරාගත් අඩු ආදායම්ලාභීන් වෙත නිවාස ආධාර ලබා දීම | 400 | 500 | අළුත්වැඩියා වූ නිවාස | ජීවන තත්වය ඉහළ නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය |
| තෝරාගත් වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස ආධාර ලබා දීම. | 150 | 200 | අළුත්වැඩියා වූ නිවාස | |
| තෝරාගත් කාන්තාවන් සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් (සජීවීකරණ) පැවත්වීම | 30 | 40 | දැනුවත් වූ කාන්තාවන් | කාන්තාවන් සවිබල ගැන්වීම |
| තෝරාගත් ස්වයං රැකියාලාභී කාන්තාවන් සවිබල ගැන්වීම. | 200 | 250 | අළුතින් බිහිවූ ස්වයං රැකියාවන් | ආදායම් උත්පාදනය හා ජීවන තත්වය වර්ධනය කිරීම |

## සමස්ත කාර්ය සාධනය පිළිබඳ අදහස

අමාත්‍යාංශය වෙත පැවරි ඇති ප්‍රධාන කාර්යයන් වනුයේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල අධීක්ෂණය, නියාමනය හා සම්බන්ධීකරණය පවත්වාගෙන යාම වේ.

අමාත්‍යාංශයේ අධීක්ෂණය හා නියාමනය අනුව ඉහත දෙපාර්තමේන්තු මඟින් 2019 වර්ෂය සඳහා ඉලක්ක කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පළාතේ සංවර්ධනයට දායකත්වය සපයමින් පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට කටයුතු කරන ලදි. අමාත්‍යාංශය වෙත සෘජුවම පැවරී ඇති විෂයයන් දෙකකි. නිවාස සංවර්ධන කටයුතු සහ කාන්තා කටයුතු එම විෂයයන් දෙක වන අතර 2019 වසරේදි මෙම විෂයයන් දෙක සඳහා වෙන් වි තිබු ප්‍රතිපාදන මුදලට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට සැලසුම් සකස් කර තිබුණි.

උතුරු මැද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 11/2019 සහ මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ 5/2019 අනුව ආරම්භ කර තිබු සංවර්ධන ව්‍යාපෘතිවලින් වෙන් කර තිබු ප්‍රතිපාදනවලින් 25% ක අහුරා තැබිමට සිදු වු අතර ගිවිසුම් ගත නොවි තිබු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිමට සිදු විය.

නිවාස විෂය යටතේ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී පළාතේ දිස්ත්‍රික්ක දෙකම නියෝජනය වන පරිදි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් තෝරා ගනු ලැබු ප්‍රතිලාභින් දෙදෙනෙකු සඳහා නිවාස ඉදි කර දිමේ වැඩසටහන සඳහා අමාත්‍යාංශ විසින් වෙන් කර තිබු රු 5,800,000.00 මුදල පමණක් වියදම් කර එම ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරිමට හැකිවිය. නිවාස විෂය යටතේ ක්‍රියාත්මක කිරිමට අනුමැතිය ලබාගත් අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට නොහැකි වුණි. ඒ අනුව නිවාස විෂයෙහි සමස්ත ප්‍රගතියෙහි යම් කිසි පසුබෑමක් සිදු වී ඇත.

කාන්තා සංවර්ධන විෂය යටතේ කාන්තා සජිවිකරණ හා බල ගැන්වීමේ වැඩසටහන් 15ක් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15ක සාර්ථකව පවත්වන ලදි. එහි සමස්ත ප්‍රගතිය 100% කි. ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන ද සාර්ථකව නිම කරන ලදි.

දිරිය කාන්තා වැඩසටහන යටතේ තෝරාගනු ලැබු අඩු ආදායම්ලාභි කාන්තාවන් සඳහා 50% ප්‍රතිලාභි දායකත්වය මත අධිවේගි ජුකි මැෂින් ලබා දෙනු ලැබිණ. ව්‍යාපෘතිය අනුමැතියේදි ජුකි මැෂින් 93 ගැනීමට සැලසුම් කළ ද රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනිමේ චක්‍රලේඛ අනුව මෙම වසර තුළදි ලබා දිය හැකි වූයේ ජුකි මැෂින් 73කි. එම වැඩසටහනෙහි ප්‍රගතිය 100% කි.

# 10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාත තුළ පවතින කෘෂිකාර්මික ජීවන රටාව ගොඩනැගීම සඳහා හා කුඩා වාරිමාර්ග පද්ධතියේ සංවර්ධනය සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන මෙහෙයක් සිදු කරමින් පවතී. එහිදී ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුළ පවතින සුළු වාරිමාර්ග තුන්දහස් දෙසිය විසි හයක (3226) ගොවිබිම් අක්කර එක්ලක්ෂ තිස්නව දහසකට (139,000 ) ආසන්න ප්‍රමාණයක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යය හා බැදේ. එම වැව් පද්ධතිය තව දුරටත් සංවර්ධනය කරමින් හා ප්‍රශස්ත මට්ටමකින් නඩත්තු කර පවත්වාගෙන යමින් පළාතේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. එහිලා පළමු ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය කහටගස්දිගිලිය කැකිරාව හන්දිය අසල පිහිටුවන ලදී. දෙවන ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය කැකිරාව ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය අසල පිහිටුවන ලදී. වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු යටතේ මෙම ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල පාලනය වේ. කහටගස්දිගිලිය ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය යටතේ හොරොව්පොතන, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, මැදවච්චිය, මිහින්තලේ, පදවිය, හා රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ. කැකිරාව උප කාර්යාලය යටතේ කැකිරාව, ගලෙන්බිඳුණුවැව, පලුගස්වැව, තිරප්පනේ, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ දැනට පිහිටුවා ඇති අනුරාධපුර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය යටතේ ගල්නෑව, ඉපලෝගම, මහ විලච්චිය, නොච්චියාගම, පලාගල, මධ්‍යම නුවරගම් පළාත, තලාව, නැගෙනහිර නුවරගම් පළාත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරන ලැබේ.දෙපාර්තමේන්තුව සතුව පවතින තත්ත්ව පාලන ඒකකය මගින් මුළු පළාතම ආවරණය වන පරදී සියලුම වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල තත්ත්ව පාලන කටයුතු සිදු කරනු ලැබේ. ආයතන අංශය, සැලසුම් අංශය හා ගිණුම් අංශය ද දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ පිහිටුවා ඇත.

## පළාත් වාරිමාර්ග පද්ධති

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| වාරිමාර්ග වැව් ප්‍රමාණය | 2991 | 235 | 3,226 |
| වැව් මගින් වගා කරන ලද කුඹුරු අක්කර ප්‍රමාණය | 128,608 | 19,881 | 138,877 |
| ගොවි පවුල් සංඛ්‍යාව | 83,885 | 5,779 | 89,664 |

## ප්‍රධාන කෘෂිකාර්මික ජලාශ

| අනුරාධපුර දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්) |
| පදවිය | 85,000 | 83,200 | 6,000 |
| වාහල්කඩ | 43,000 | 12,600 | 2,500 |
| නාච්චාදූව | 45,150 | 94,400 | 3,000 |
| තුරුවිල වැව | 5,190 | 12,200 | 500 |
| නුවර වැව | 36,050 | 13,000 | 2,500 |
| මහකනදරා වැව | 36,250 | 50,400 | 3,200 |
| මහවිලච්චිය වැව | 31,500 | 56,560 | 2,500 |
| තිසා වැව | 3,500 | 800 | 350 |
| බසවක්කුලම වැව | 1,910 | 1,440 | 200 |
| රාජාංගනය වැව | 81,603 | 1,188,000 | 4,000 |
| අංගමුව වැව | 14,400 | 5,000 | 1,200 |
| හුරුළු වැව | 55,000 | 308,000 | 3,500 |
| මානන්කට්ටිය වැව | 7,600 | 9,520 | 750 |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්කර) |
| පරාක්‍රම සමුද්‍රය | 110,000 | 17,920 | 6,275 |
| මින්නේරි වැව | 110,000 | 59,264 | 6,300 |
| ගිරිතලේ වැව | 18,800 | 6,016 | 775 |
| රොට වැව | 1,028 | 4,800 | - |
| කවුඩුළු වැව | 104,000 | 22,400 | 6,400 |
| බෙබියා වැට | 938 | 1,856 | 261 |
| අඹගස් වැව | 4,000 | 12,512 | 318 |
| මහහල්මිල්ල වැව | 900 | 1,575 | 260 |
| ඇල්ලේ වැව | 1,100 | 330 | - |
| පේස්කුලම වැව | 1,750 | 439 | 535 |

**අස්වද්දා ඇති බිම් ප්‍රමාණය අක්කර 200ට වැඩි (විශාල වාරි මාර්ග) කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය ලබාගන්නා ජලාශ**

## දැක්ම

"ප්‍රශස්ත වාරි කළමනාකරණයක්, සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක්."

## මෙහෙවර

"අතීත උරුමයන් ආරක්ෂාකර ගනිමින්, තාක්ෂණික හා උපදේශන සේවා සැපයීමෙන් සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සුළු හා මධ්‍ය වාරි කර්මාන්තයන්හී ගුණාත්මක සංවර්ධනය, නඩත්තුව, පරිසර ආරක්ෂණය සහ ජල සම්පත ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම මගින් පළාතේ තිරසාර සංවර්ධනයේ ප්‍රමුඛ හවුල්කරු වීම."

## දිගුකාලීන අරමුණු

- සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම.
- ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ත දැනුමක් සහ අවබෝධයක් ලබා දීම.
- සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම.
- වර්ධනය වූ ආයතනික ධාරිතාවයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ඇළ මාර්ග පද්ධතීන් මනා ලෙස සංවර්ධනය කරමින් නිසි පරිදි නඩත්තු වැඩපිළිවෙළක් පවත්වාගෙන යාම.
- ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අවදානම් තත්වයේ පවතින වැව් සංවර්ධනය කිරීම.
- වාරිමාර්ග රක්ෂිත සලකුණු කිරීම මගින් අනවසර ක්‍රියා අවම කිරීම.
- රොන්මඩ හා ජලජ ශාක ඉවත් කිරීම තුළින් ජල ධාරිතාවය සංවර්ධනය.
- දැනුමෙන් හා හැකියාවෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම.
- පසු අස්වනු හානිය අවම කිරීම, යාන්ත්‍රික කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම.
- වාරි පද්ධති නඩත්තු කිරීම.
- වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම.
- ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම.
- ජල ගැලීම් හා හානි කළමනාකරණය කිරීම.
- පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.
- අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම.
- කාර්යාල පද්ධති ධාරිතාවය ඉහළ නැංවීම.

## උපාය මාර්ගයන්

| අ.අ | කාර්යය | උපායමාර්ග (ය) |
|---|---|---|
| 01 | වාරි පද්ධති පුනරුත්ථාපනය කිරිම | • මුලස්ථායි වැඩ කොටස් පුනරුත්ථාපනය<br>• ඇල වේලි පුනරුත්ථාපනය<br>• කෘෂි මාර්ග පුනරුතථාපනය<br>• පෝෂක ඇල මාර්ග පුනරුත්ථාපනය<br>• පෝෂක ප්‍රදේශ පුනරුත්ථාපනය<br>• අපවහන ඇල මාර්ග පුනරුත්ථාපනය<br>• එල්ලංගා පද්ධති පුනරුත්ථාපනය |
| 02 | වාරි පද්ධති නඩත්තු කිරිම | • මුලස්ථායි වැඩ කොටස් නඩත්තු කිරිම<br>• ඇල වේලි නඩත්තු කිරිම<br>• කෘෂි මාර්ග නඩත්තු කිරිම<br>• පෝෂක ඇල නඩත්තු කිරිම<br>• අපවහන ඇල නඩත්තු කිරිම<br>• පෝෂක ප්‍රදේශ නඩත්තු කිරිම<br>• එල්ලංගා පද්ධති නඩත්තු කිරිම |
| 03 | වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම | • අමුණු ඉදිකිරීම<br>• ඇල වේලි ඉදිකිරිම<br>• කෘෂි මාර්ග ඉදිකිරිම<br>• පෝෂක ඇල ඉදිකිරිම<br>• මුලස්ථායි වැඩ කොටස් ඉදිකිරිම<br>• අපවහන ඇල මාර්ග ඉදිකිරීම<br>• පවතින ඇල මාර්ග කොන්ක්‍රීට් කිරීම |
| 04 | ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරිම | • ජල කළමනාකරණටය අදාල නිර්මිත ඉදිකිරීම<br>• ගොවි සංවිධාන (වාරි කළමණාකරණ කමිටු) බල ගැන්විම<br>• දැනුවත් කිරිමෙ වැඩසටහන්<br>• තාක්ෂණික පුහුණුව<br>• ගොවි උපකරණ ලබා දිම |


| | | |
|---|---|---|
| 05 | ජල ගැලීම සහ හානි කළමනාකරණය කිරිම | • දත්ත රැස් කිරිම හා ගවේෂණය<br>• ආපදා හඳුනා ගැනීම හා පිළියම් යෙදීම<br>• දෙපාර්තමේන්තුවේ ආපදා කළමනාකරණ කමිටුව සක්‍රියව පවත්වාගෙන යාම හා ධාරිතා සංවර්ධනය |
| 06 | පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරිම | • සුදුසු ගස් වර්ග සිටුවීම හා නඩත්තුව<br>• ප්‍රදේශ නිර්ණය කිරිම හා මැනුම් කිරිම<br>• ගොවීන් දැනුවත් කිරිමේ වැඩසටහන්<br>• සීමා මායිම් ලකුණු කිරිම<br>• නෛතික රාමුව බලාත්මක කිරීම |
| 07 | අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම | දත්ත පද්ධතිය ස්ථාපනය කිරිම<br>දත්ත පද්ධතිය වාර්ෂිකව යාවත්කාලින කිරිම<br>තොරතුරු කළමනාකරණ ඒකකයේ ධාරිතාවය ඉහළ නැංවීම |
| 08 | තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම | මානව හා භෞතික සම්පත් ඉහළ නැංවීම |
| 09 | කාර්යාල ධාරිතාවය ඉහළ නැංවිම | මානව හා භෞතික සම්පත් වැඩිදියුණු කිරීම |

## අංශය නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු

| | SDG NO |
|---|---|
| දුගී බව අවසන් කිරිම | 01 |
| සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සම යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | 02 |
| සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම | 06 |
| නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | 11 |
| දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම | 13 |
| භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය , තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහි ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනයකර ආරක්ෂාකර ප්‍රවර්ධනය කිරීම,ඉඩම් යාහනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම | 15 |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 105 |
| 2 | සේවයේ නියුතු | 85 |
| 3 | පුරප්පාඩු | 27 |
| 4 | අතිරික්ත | 07 |




## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 45.42 | 44.38 | 1.05 | 98 |
| ගමන් වියදම් | 2.96 | 2.56 | 0.40 | 87 |
| සැපයීම් | 5.04 | 4.62 | 3.34 | 92 |
| නඩත්තු වියදම් | 203.42 | 172.31 | 31.11 | 85 |
| ගිවිසුම්ගත සේවා | 11.44 | 9.98 | 1.47 | 87 |
| මාරු කිරීම් | 0.21 | 0.20 | 0.00 | 100 |
| සහනාධාර | 0.01 | 0.01 | 0.00 | 100 |
| **එකතුව** | **268.50** | **234.05** | **37.36** | |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.

| අ.අ | ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | පළාත් වාරිමාර්ග වැඩිදියුණු කිරීම | වැවෙහි ප්‍රධාන අංග අළුත්වැඩියා කිරීම, ඇළමාර්ග ප්‍රතිසංස්කරණය | අවදානම තත්ත්වය අඩුවීම, ජල පරිමාව වැඩි කිරීම, වගා තිව්‍රතාව ඉහළ දැමීම, කුඹුරු ඉඩම් පරිභෝජන හානිය අවම කිරීම | 5000 |
| 2 | දෙපාර්තමේන්තු හා කලාප කාර්යාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම | ගොඩනැගිල්ල අළුත්වැඩියාව | වඩා හොඳ කාර්යාල පසුබිමක් ඇති කිරීම අවදානම අඩුවීම | 84 (සේවක) |

## මුලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 5.0 | 4.137 | 0.862 | 75 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.1495 | 0.1495 | - | 100 |
| වෙනත් මුලධන වත්කම් වැඩිදියුණු කිරීම | 200 | 157.94 | 42.06 | 89 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 193.5 | 149.039 | 44.46 | 94 |
| පළාත් සභා සංවර්ධන ප්‍රදාන | 5.0 | 3.26 | 1.74 | 100 |
| **එකතුව** | **403.6** | **314.5** | **89.1** | **78** |

## ආදායම් ඉපයීම

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රතිශතය(%) |
|---|---|---|---|
| තත්ත්ව පාලන වාර්තාකරණය | 2.0 | 2.1 | 100 |

## දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක, නිමැවුම් දර්ශක හා ක්‍රියාත්මක ව්‍යාපෘති

| තිරසර සංවර්ධන | | පළාත් නිමැවුම් දර්ශක |
|---|---|---|
| **ඉලක්ක** | **නිමැවුම් දර්ශක** | |
| **1. දුගී බව අවසන් කිරීම** | | |
| 1.5 - 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන්නන්ගේ සහ අවදානමට ලක්විය හැකි තත්ත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණික තත්ත්වයන්ගෙන් ඇති වන්නා වූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නා වූ හානි සහ ආපදාවලට නිරාවරණය වීම ද අඩු කිරීම. | 1.5.1 - ජනගහනයේ ලක්ෂයකින් ස්වභාවික ව්‍යසන හේතුවෙන් මියයන, අතුරුදහන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව | ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය සහ අවදානමට ලක්වීම හේතුවෙන් ප්‍රතිසංස්කරණය (වැව් සහ අමුණු සංඛ්‍යාව) |
| | 1.5.2 - ලෝක දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු ආර්ථික හානිය. | අත්හැර දැමූ වැව් ප්‍රතිසංස්කරණය පද්ධති ගණන. |
| **2. සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම** | | |
| 2.4 – 2030 වනවිට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ | 2.4.1 - ඵලදායී සහ තිරසාර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය | ඵලදායී සහ තිරසාර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය (අක්කර) |

| | | |
|---|---|---|
| **6. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම** | | |
| 6.4 - 2030 වන විට සියලුම ක්ෂේත්‍රයන්හි ජලය භාවිතා කිරීම සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම, තිරසාර අන්දමින් ජලය ලබා ගැනීම සහ සැපයීම, ජලය හිඟ කම මගහැරවීම සඳහා සහ ජලය හිඟ කමින් පීඩා විඳින ජනතාවගේ සංඛ්‍යාව ප්‍රාමාණික ලෙස අවම කිරීම. | 6.4.2 - ජල භාවිත මට්ටම. පවත්නා මිරිදිය මූලාශ්‍ර ප්‍රමාණයට අනුපාත වූ ජලය භාවිතයට ගන්නා ප්‍රමාණය. | සුළු වාරිමාර්ග නඩත්තු යටතේ වැවේ අංග, ඇල වෙලි ප්‍රතිසංස්කරණය. (වැව් ගණන) |
| **11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම** | | |
| 11.5 – 2030 වනවිට දරිද්‍රතාවයෙ හි සහ අවදානමට පත්විය හැකි තත්ත්වයන් හි සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ජලය මගින් සිදුවන්නා වූ විනාශයන් ද ඇතුළු ආපදා වලින් ලෝකයේ දළ දේශිය නිෂ්පාදිතයට සිදුවන සෘජු ආර්ථික හානිය සැලකිය යුතු ලෙස අඩු කිරීම සහ මෙමගින් බලපෑමට හා මරණයට පත් වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු කිරීම. | 11.5.2 - ආපදා තත්ත්ව හේතුවෙන් ගෝලීය දළ දේශිය නිෂ්පාදනයට සාපේක්ෂව සෘජු ආර්ථික හානිය, අත්‍යවශ්‍ය යටිතල පහසුකම්වලට සිදු වූ හානිය සහ මූලික සේවා වලට සිදුවූ බාධාවන්. | ගංවතුර හේතුවෙන් කැඩීගිය සහ කැඩීයාමේ අවදානම් සහිත, ප්‍රතිසංස්කරණය කරන ලද වැව්. |
| **13. දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම** | | |
| 13.1 - සියලුම රටවල කාලගුණය සම්බන්ධයෙන් විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණදීමේ හැකියාව ශක්තිමත් කිරීම | 13.1.1. ජනගහනයේ පුද්ගලයන් ලක්ෂයක් අතරින් හදිසි ආපදා හේතුවෙන් සිදුවන මරණ, අතුරුදහන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව. | ගංවතුර හේතුවෙන් කැඩීගිය සහ කැඩීයාමේ අවදානම් සහිත, ප්‍රතිසංස්කරණය කරන ලද වැව්. |
| **15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහි ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.** | | |
| 15.1 – 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර් ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම. | 15.1.2 ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර පද්ධති ආකාරය අනුව භෞතික හා මිරිදිය ජෛව විවිධත්වය සඳහා වන වැදගත් ස්ථාන ප්‍රමාණය | ප්රතිසංස්කරණය කරන ලද වැව් තුළ පැල සිටුවීම හා නඩත්තු කිරීම. (ක්‍රියාත්මක කරන ලද වැව් සංඛ්‍යාව) |
| 15.3 – 2030 වන විට කාන්තාරකරණය තුරන් කිරීම, කාන්තාරකරණය, නියගය සහ ගංවතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම් ද ඇතුළුව විනාශයට පත් වූ ඉඩම් සහ පස නැවත යථා තත්ත්වයට පත් කිරීම සහ ඉඩම් විනාශයට පත් නොවන ලෝකයක් ඇති කිරීම. | 15.3.1 සමස්ත භූමි ප්‍රමාණයෙන් හායනයට ලක්ව ඇති ප්‍රමාණය | අත්හැර දමන ලද වාරි පද්ධති ප්‍රතිසංස්කරණ. (ව්‍යාපෘති සංඛ්‍යාව) |

තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සාධනය කර ගැනීම විෂයයෙහි පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඉලක්කය රු.මි.393.5ක් වන අතර වියදම රු.මි 341.5 කි.එහි ප්‍රගතිය 94%කි. මේ යටතේ වන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාධනය කර ගැනීම සඳහා සකස් කරන ලද පළාත් නිමැවුම් දර්ශක උපයෝගි කර ගන්නා ලදී. සංවර්ධන ක්‍රියාවලිය තුළ ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය සහ අවදානමට ලක්වීම හේතුවෙන් ප්‍රතිසංස්කරණය (වැව් සහ අමුණු සංඛ්‍යාව), අත්හැර දැමූ වැව් ප්‍රතිසංස්කරණය පද්ධති ගණන, ඵලදායී සහ තිරසාර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය (අක්කර), සුළු වාරිමාර්ග නඩත්තු යටතේ වැවේ අංග, ඇල වේලි ප්‍රතිසංස්කරණය. (වැව් ගණන) , ප්‍රතිසංස්කරණය කරන ලද වැව් තුළ පැල සිටුවීම හා නඩත්තු කිරීම. (ක්‍රියාත්මක කරන ලද වැව් සංඛ්‍යාව) මගින් පළාත් දායකත්වය ඉහත කී නිමැවුම් දර්ශකවලට අදාල ව්‍යාපෘති තුළින් සපයන ලදී.

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන/ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව |
|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | කැකිරාව නව කලාප කාර්යාලය අළුත්වැඩියාව' පැරණි ගොඩනැගිල්ල අළුත්වැඩියා කර කාර්යාලය ඉදි කිරීම | 23158 ක පමණ ගොවි ප්‍රජාව | 09 |
| පළාත් වාරිමාර්ග පුනරුත්ථාපන වැඩිදියුණු කිරීම | ජල හානිය අවම කොට වගා තීව්‍රතාවය වැඩි කිරීම සඳහා 2019 වසරේ දී ගංවතුර හැනි නිසා කැඩී ගිය සහ කැඩීයාමේ අවදානමට ලක් වූ වැව් 18ක් සහ අමුණු 2 ක් ප්‍රතිසංස්කරණය කරන ලදි | 1275 | 20 |
| සුළු වාරිමාර්ග නඩත්තු | ගොවි සංවිධාන හරහා වැවේ අංග සහ ඇලවේලි පද්ධති ප්‍රතිසංස්කරණය කරන ලද වැව් ප්‍රමාණය 52කි. කොන්ත්‍රාත් ආයතන හරහා වාරි ව්‍යාපෘති 24කි. | 3120 | 20 |
| ගොවි බිම් ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම් | ගොවිබිම් ප්‍රවේශ මාර්ග කිලෝමීටර් 0.93 ක ප්‍රමාණයක් බොරළු දමා ප්‍රතිසංස්කරණය කරන ලදි. | 108 | 1 |

උතුරු මැද පළාත තුළ සෞභාග්‍යාමත් ගොවි පරපුරක් බිහි කිරීමේ දැක්ම සඵල කර ගැනීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු 6කින් දායකත්වය ලබා දෙයි.අතීතයේ දී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කරන ලද වැවයි දාගැබයි ගමයි පන්සලයි යන සංකල්පය වර්තමානයේදී තිරසර සංවර්ධන සංකල්පයට ඇතුළත් වී තිබේ.

ඒ අනුව සුළු හා මධ්‍යම වාරි පද්ධති 4000 කට ආසන්න ප්‍රමාණයකින් බල ප්‍රදේශය තුළ වගා කළ හැකි කුඹුරු අක්කර ආසන්න වශයෙන් 139,000 ක පමණ ප්‍රමාණයක් පවතියි. නමුත් ගංවතුර හා නියං ආපදා තත්ත්වයන් හේතුවෙන් ඉන් වර්ෂාපතනය ලැබෙන මහ කන්නයේ දී 75%කට වැඩි ප්‍රමාණයක් වගා කළ ද අඩු වර්ෂාපතනය හේතුවෙන් වගා ප්‍රතිශතය යල කන්නයේ දී 30%කට අඩු ප්‍රමාණයක් දක්වා පහළ මට්ටමකට අඩු වේ.

එබැවින් ජල හානිය අවම කොට වගා තීව්‍රතාවය වැඩි කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මිලියන 169ක් ද සුළු වාරිමාර්ග නඩත්තු යටතේ මිලියන 200ක් වැය කරන ලදි. එමගින් ගොවි පවුල් 5000 කට ආසන්න ප්‍රමාණයක සෘජුව හා වක්‍රව ප්‍රතිලාභ සැකසීමට හැකි විය. 2019 වසරේ සුළු වාරිමාර්ග නඩත්තු යටතේ වැවේ අංග සහ ඇල වේලි පද්ධති ප්‍රතිසංස්කරණය කරන ලද වැව් ප්‍රමාණය 52කි.

ආහාර සුරක්ෂිතතාවය ඇති කරමින් තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය සඳහා දායකත්වය සැපයීමට හැකි විය. එමෙන් ම වගා තීව්‍රතාවය වැඩි වීම තුළින් කෘෂි නිෂ්පාදන ප්‍රමාණය වැඩිකරගැනීම තුළින් දේශීය නිෂ්පාදන දායකත්වය ලබා දෙන අතර ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය නංවාලීමට පිටිවහලක් ද වේ. ජල හානිය අවම කරමින් ජල කාර්යක්ෂමතාවය වැඩි කොට සැමට ජලය සහ තිරසර කළමනාකරණය සහතික කිරීම සහ අරමුණ සාර්ථක කර තැනීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකි විය. 2019 වසරේ දී ගංවතුර හානි නිසා කැඩී ගොස් අතහැරදැමූ සහ කැඩීයාමේ අවදානමට ලක් වූ ද වැව් සහ අමුණු 44ක් ප්‍රතිසංස්කරණය කරන ලදි. පළාත් සභා සංවර්ධන ප්‍රදාන - ගොවි බිම් ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම යටතේ 2019 වසර තුළ මිලියන 3.2ක වියදම දරමින් ගොවිබිම් ප්‍රවේශ මාර්ග කිලෝමීටර් 0.93 ක ප්‍රමාණයක් බොරලු දමා ප්‍රතිසංස්කරණය කරන ලදි. ගොවිබිම් ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් අස්වැන්න ප්‍රවාහනය කිරීමේ පහසුකම් සැලසීම මෙන් ම ඔවුන්ගේ එදිනෙදා කටයුතු කරගෙන යාමට මහත් අස්වැසිල්ලක් වේ.
තවද අතීත උරුමයෙන් පැවත එන වැව් හා සම්බන්ධ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම අපගේ එක් අරමුණකි. එබැවින් වර්තමානයේ පවතින කාලගුණික හා දේශගුණික විපර්යාසයන් හේතුවෙන් කෘෂි කර්මාන්තයට සහ සුළු හා මධ්‍යම වාරි පද්ධති වලට අහිතකර බලපෑම් එල්ල වී ඇත. 2019 වර්ෂයේ ප්‍රතිසංස්කරණය කරන ලද බොහොමයක් වැව් සඳහා එක් ව්‍යාපෘතියකට අදාළව පැල සිටුවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව උතුරු මැද පළාත තුළ සුළුවාරි පද්ධති ආශ්‍රිතව සැලකිය යුතු ප්‍රමාණයක් පැල සිටුවමින් පරිසර පද්ධතියට ඒවා එක් කිරීමට හැකි විය. එමගින් දේශගුණික විපර්යාසය සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම හා භූගෝලීය තිරසර පරිසර පද්ධතියක් ඇතිකිරීම යහ තිරසර අරමුණුවලට දායකත්වය ලබා දෙන ලදි. ඒ අනුව වාරි පද්ධතිය සම්පූර්ණ පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම තුළින් ගම තුළ ජල සුරක්ෂිතතාවය ඇති විය. තවද වැව හා බැඳුන පරිසර පද්ධතිය ද ආරක්ෂා කිරීමට දායකත්වය සැපයීමට හැකි වූ අතර ග්‍රාමීය ප්‍රජාවගේ ආහාර සුරක්ෂිත භාවය ඇති කර ඔවුන්ගේ ආදායම් මට්ටම වැඩි කරලීමට දායකත්වය සැපයීමට හැකි විය.

## කාර්ය සාධන ඉලක්ක - 2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | ආයෝජනය(රු.මි) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2018 | 2019 |
| පුනරුත්ථාපනය හා නඩත්තු කරන ලද වැව් හා අමුණු ප්‍රමාණය | 43 | 7 | 201.5 | 315 |
| පවත්වනලද පුහුණු වැඩ සටහන් හා රැස්වීම් ගණන | 43 | 44 | - | * |
| පරිසර ආරක්ෂණය සඳහා කරන ලද ව්‍යාපෘති ගණන | - | 10 | 0.01 | ** |
| ආයතනික සංවර්ධනය හා පුහුණු වැඩසටහන් ගණන | 2 | 3 | 1.16 | 0.225 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය.

| ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම** | | | | |
| පළාත් වාරිමාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | අවදානම් තත්ත්වය අඩුවීම, ජල පරිමාව වැඩි කිරීම, වගා තිව්‍රතාව ඉහළ දැමීම, කුඹුරු ඉඩම් පරිභෝජන හානිය අවම කිරීම, ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීම. | 193.5 | 169.2 | 98 |

| ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම | | | | |
|---|---|---|---|---|
| දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | දැනුවත් කිරීමේ හා පැහැදිලි කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ගොවි සංවිධාන සාකච්ඡා පැවැත්වීම | ව්‍යාපෘතික් ආරම්භයදී ගොවි සංවිධාන හා ප්‍රජාව දැනුවත් කිරීම,ප්‍රාග්ධන වැය නැත | | |
| **සංරක්ෂිත හා ආරක්‍ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම්** | | | | |
| වැව් රක්ෂිත වෙන් කිරීම | වැව් රක්ෂිතය වෙන් කිරීම,පිඹුරු පත් සැකසීම, අනවසර අල්ලා ගැනීම සම්බන්ධව ග්‍රාමසේවක හා ගොවිසංවිධාන දැනුවත් කිරීම | 1 | ප්‍රතිපාදන අවුරා තබන ලදි. | |
| **වර්ධනය වූ ආයතනික ධාරිතාවක් ඇති කිරීම** | | | | |
| ආයතනික ධාරිතා සංවර්ධනය | පුහුණු වැඩමුළු පැවැත්වීම, කාර්යාල උපකරණ මිලදී ගැනීම, ආයතනික ගොඩනැගිලි අළුත්වැඩියාව . | 0.3 | 0.70 අවුරා තබා ඇත. | 100 |

* ජල කළමනාකරණය සඳහා සෑම ව්‍යාපෘතික් ආරම්භයේදී ගොවි සංවිධාන හා ප්‍රජාව දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම සිදුකර තිබේ.

## පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැක්ම කරා ළඟා වීමට 2020 වසරේ දී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අදහස් හා යෝජනා.

උතුරු මැද පළාත තුළ පවතින සුළු හා මධ්‍යම පරිමාණ වැව් පද්ධතිය නිසි පරිදී නඩත්තු කරමින් සෞභාග්‍යමත් ගොවි පරපුරක් බිහි කිරීම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැක්ම වේ. 2019 වර්ෂයේ ගොවි සංවිධාන හරහා සුළු වාරිමාර්ග ව්‍යාපෘති 52ක් ද කෝන්ත්‍රාත් ආයතන මගින් ව්‍යාපෘති 45ක් ද වැව් නඩත්තු වැඩසටහන යටතේ ව්‍යාපෘති 18ක් ඇතුළුව සමස්ත ව්‍යාපෘති සිදු කළ අතර ඉන් ව්‍යාපෘති 117කට ආසන්න ප්‍රමාණයක් සාර්ථකව වැඩ නිම කරන ලදි.

වාරි පද්ධති නිසි පරිදි නඩත්තු කිරීම සඳහා තිරසර කෘෂිකර්මාන්තය අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව, 2019 වසරේ මූලික ව්‍යාපෘතිය ලෙස ආරම්භ කරන ලද සුළු වාරිමාර්ග නඩත්තු ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක වූ කුඹුරු අක්කර 100ට වැඩි තෝරාගත් වැව් සඳහා පවතින සුළු නඩත්තු කටයුතු සිදු කිරීමේ වැඩසටහන සාර්ථකව නිම කරන ලදි. බොහෝමයක් වාරිමාර්ග පද්ධතිවල පවතින සුළු ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට හැකි වේ.මෙම වසරේ දී එම ප්‍රතිපාදන මුදල් වැඩිකොට 2018 වර්ෂයේ ප්‍රතිසංස්කරණය කරන ලද කුඹුරු අක්කර 100කට වැඩි වැව් 50ක් පමණ එම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2019 වසරේ දී සෑම ව්‍යාපෘතියක් හරහාම සිදු කරන ලද පැල සිටුවීමේ ව්‍යාපෘතිය මෙම වර්ෂයේ දී ද ගොවි සංවිධාන හරහා ගිවිසුම්ගත වී සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ඊට අමතරව පුනරුත්ථාපන හා වැඩිදියුණු කළයුතු වැව් හා වාරි පද්ධති හඳුනා ගැනීම හා ප්‍රමුඛතාවය මත ඒවා සකස් කිරීම ප්‍රධාන අභියෝගයකි. මේ සම්බන්ධයෙන් 2019 වර්ෂයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ප්‍රාදේශීය කෘෂිකර්ම හා සංවර්ධන කමිටු මගින් ලැබෙන පුනරුත්ථාපනය කළ යුතු වැව් පිළිබඳ විස්තර ලබා දෙන ලෙස දන්වන ලදි. ඒ ඇතුළුව විවිධ ගොවි සංවිධාන හා මහජන නියෝජිත මහතුන් හා නිලධාරීන් හඳුනා ගන්නා ඉල්ලීම් 400ක් ලැබේ යැයි අපේක්ෂා කරන ලදි.

සියලු ව්‍යාපෘති ක්ෂේත්‍ර පරීක්ෂා කර ප්‍රමුඛතා ලැයිස්තුගත කර ඒ අනුව තෝරාගත් ව්‍යාපෘති සඳහා මූලික විමර්ශන වාර්තා (PIR) සකස් කිරීමට සැලසුම් කර ඇත. 2019 නොවැම්බර් මස සිදුවූ ගංවතුර නිසා හානියට පත් සහ හානි වීමේ අවදානමට ලක්වූ වැව් සඳහා මෙම වර්ෂයේ ප්‍රමුඛතාවය ලබා දීමට සැලසුම් කර ඇත.එමගින් වැව් 80කට ප්‍රමුඛතාව අනුව ඇස්තමේන්තු කිරීමට හා ලැබෙන ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. 2019 තත්ත්ව පාලන ඒකකය විශාල වැඩ කොටසක් සිදු කරන ලදි. තත්ත්ව පාලන ගිණුමක් ආරම්භ කොට අපේක්ෂිත ඉලක්කය වන මිලියන 2 ළඟාකර ගැනීමට ද 2020 වර්ෂයේ දී පවතින පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැඩි ඉඩකඩක් ලබා දීමට අපේක්ෂා කෙරේ. 2020 වර්ෂයේ දී ද දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

## කාර්ය සාධනය ළඟාකර ගැනීමේ දී මුහුණ දුන් අභියෝග හා ගැටළු

වාරිමාර්ග ව්‍යාපෘති මූලික වශයෙන් ඉදිකිරීමට සුදුසු අමුද්‍රව්‍ය ඒ සඳහා සුදුසු කාලගුණික තත්වයක් පැවතිය යුතුය.අධික නියං තත්වයත් හා වර්ෂාවත් ඉදිකිරීම් කටයුතු සඳහා බාධාවක් ඇති කරයි. තවද කුඹුරු අස්වනු නෙලන කාලයේදී ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වේ. ඒ අනුව ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම මැයි මාසයේදිවත් සිදු කළ යුතු අතර අවසන් කිරීම ඔක්තෝම්බර් මාසයේදී සිදු විය යුතුය. ඒ අනුව ව්‍යාපෘති හඳුනා ගැනීම ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු මැයි මාසය වනවිට අවසන් කිරීම දෙපාර්තමේන්තුව සතුව පවතින අභියෝගක් වේ. එය පසුගිය වසර තුළදී සාර්ථකව සැලැස්මට අනුකූලව සිදුකිරීමට හැකි විය.

මෙම වර්ෂය අවසානයේ දී ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත් ආයතනයන් සමග ගිවිසුම්ගතව එම ආයතනය මගින් සිදුකරගැනීමක් කරන අතර ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සඳහා කොන්ත්‍රාත් ආයතනයේ කාර්යක්ෂමතාව බලපානු ඇත. තවද 2019 වසර තුළ අනපේක්ෂිත ලෙස අගෝස්තු, සැප්තැම්බර් මාස වලදී වර්ෂාව ඇද හැලීම තුළින් සංවර්ධන කටයුතු කරගෙන යාමට බොහෝ සෙයින් බාධා ඇති විය. එමෙන්ම වන ජීවී හා වන සංරක්ෂණ කළාප තුළ පවතින වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ දී අදාළ අනුමැතිය නිසි පරිදි කලට වේලාවට නොලැබීම මෙම ආයතනය මුහුණ දෙන තවත් ගැටළුවකි.ගොවි සංවිධාන මගින් සිදු කරන්නා වූ නඩත්තු කාර්යයන් හි දී ඔවුන්ගෙන් අවශ්‍ය සහයෝගය ලැබෙන්නේ බොහොම මන්දගාමී ලෙසින් ය. තවද ඉදිකිරීම් ප්‍රගතිය අඩුවීමට බලපෑ තවත් කාරණාවක් වන්නේ බොරළු ලබා ගැනීමේ දී පවතින රාජ්‍ය ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම ය. තවද පළාත තුළම ආවරණය වන පරිදි සංවර්ධන කටයුතු සිදු කිරීම හේතුවෙන් අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතුව පවත්නා වාහන හිඟතාව මත යම් යම් අවස්ථාවන්හි අමාත්‍යංශය මගින් ද වාහන ලබා ගැනීමට සිදු විය .කෙසේ නමුත් මේ සියලු අභියෝග ගැටළු හමුවේ මෙම දෙපාර්තමේන්තුව සාධනය කරගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය සතුටුදායක මට්ටමක පවතී.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම.

පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම ව්‍යාපෘතිය හා වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් ආධාර යටතේ ද කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) ලෝක බැංකු ආධාර යටතේ ද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගය යටතේ ක්‍රියාත්මක විය.

| විෂයපථයට අසුවන අරමුණ | මුදල (රු .මි) | | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|
| | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය |
| **පාරසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය හා පරිසර පද්ධති සේවා නඩත්තුව 2 අදියර** | | | | |
| සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම, ජල කළමනාකරණය පිළිබඳ ප්‍රසස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම, සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම | 4.8 | 4.8 | 100 | 100 |

| වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය | | | | |
|---|---|---|---|---|
| මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය පිළිබද ප්‍රශස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම, සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම | 501 | - | 90 | - |
| **කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP)** | | | | |
| සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම,ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 206.3 | 119.5 | 89 | 84 |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම - 2019

- පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව ව්‍යාපෘතිය යටතේ අධීක්ෂණය , බිල්පත් පරීක්ෂාව , තත්ත්ව පාලන කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණ .
- වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ සියලු ව්‍යාපෘතින්හි නිර්මාණ පරීක්ෂාව රැස්වීම් සඳහා සහභාගි වීම , ඉදිකිරීම්හි තත්වය අධීක්ෂණය හා අවසාන වූ ව්‍යාපෘති බාර ගැනීම දෙපාර්තමේන්තුව මගින් සිදු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂය ආරම්භ වූ අතර 2024 වර්ෂයදී අවසන් වීමට නියමිතය.
- කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) යටතේ සියලු ව්‍යාපෘති හඳුනා ගැනීම හා මූලික විමර්ශන වාර්තා සකස් කිරීම ,මැනුම් කරණය, නිර්මාණ සකස් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය , තත්ත්ව පාලන කටයුතු , බිල්පත් පරීක්ෂාව යන සියලුම කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදි.

2019 වර්ෂයේදී ව්‍යාපෘති අධීක්‍ෂණ කටයුතු, බිල්පත් පරීක්ෂා කිරීම, තත්ත්ව පාලන කටයුතු සිදු කරන ලදි. මීට අමතරව ලෝක බැංකු ආධාර මගින් සිදු වන දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ නොච්චියාගම රනෝරාව එල්ලංගා පද්ධතියට අයත් වැව් 07ක ඇස්තමේන්තු කරන ලදි.

## වෙනත් රේඛීය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති | විෂයපථයට අසුවන අරමුණ | මුදල(රු .මි) | | ප්‍රගතිය(%) | | කෙටි කාලින හා දිගුකාලින ප්‍රතිපල |
|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය | |
| ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 24 | - | 99 | - | වගා තිව්‍රතාව ඉහළ දැමීම, කුඹුරු ඉඩම් පරිභෝජන හානිය අවම කිරීම |
| ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය (ග්‍රාම ශක්ති වැඩසටහන ) | සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 139 | - | 77 | - | වගා තිව්‍රතාව, කුඹුරු ඉඩම් පරිභෝජන හානිය අවම කිරීම |

- ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය ව්‍යාපෘති යටතේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ජනාධිපති කාර්යාලය සමග එක්ව මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය නබඩගස්දිගිලිය එල්ලංගා පද්ධතියේ ව්‍යාපෘති 7ක් ද මූලික විමර්ශන කටයුතු කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම හා අධීක්ෂණ, තත්ත්ව පාලන කටයුතු හා බිල්පත් පරීක්ෂාව කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරමින් පවතී. මෙහි ඉදිකිරීම් කටයුතු යුධ හමුදාව මගින් සිදු වන අතර ව්‍යාපෘතිය අධීක්ෂණ කටයුතු, තත්ත්ව පාලන කටයුතු, බිල්පත් පරීක්ෂා කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. අඹගහවැව එල්ලංගා පද්ධතිය තුළ ව්‍යාපෘති 3, මිහින්තලේ බුලන්කුලම වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක කරන ලදි.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

2020 වර්ෂයේ ලැබේ යැයි අපේක්ෂිත ප්‍රතිපාදන සඳහා මේ වනවිට (2019 නොවැම්බර් මස සිට) ව්‍යාපෘති හඳුනා ගැනීමේ කටයුතු කරමින් පවතී. ව්‍යාපෘති හඳුනා ගැනීම 2020 මුල් මාසය තුළ සිදුකිරීමට සැලසුම් කර ඇත.එමෙන්ම පෙබරවාරි මාසය ඇතුළත එම ව්‍යාපෘතිවල මූලික විමර්ශන වාර්තාද ,මාර්තු මස අවසානයට පෙර ඇස්තමේන්තු කටයුතු ද නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව අප්‍රේල් මස මුල් සතිය ඇතුළත ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමටත් මැයි මාසයදී ව්‍යාපෘති ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වේ. එමගින් 2020 වර්ෂයේ අපේක්ෂිත කාර්යය සාධනය ළඟාකර ගැනීමටත් අදහස් කර ඇත.මෙහිදී මූලධන වියදම් යටතේ ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මුල් කාර්තුව තුළ දැන ගැනීමට නොහැකිව යම් ගැටළුකාරී තත්ත්වයක් පැන නගින අතර පුනරාවර්තන වියදම් යටතේ පවතින ප්‍රදාන නිශ්චිත බැවින් ඒ සඳහා සැලසුම් සකස් කොට ඇත.

මිලදී ගැනීම් හා පුහුණු වැඩසටහන් මේ වනවිට හඳුනා ගෙන ඇති අතර ඒවා නිශ්චිත කිරීමේ කටයුතු මුල් මාස 2 ,3 අතර සිදු කර වර්ෂය මැද භාගයේදී නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා උතුරු මැද පළාත් සභාව නියෝජනය කරමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිත වේ. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන දේශගුණික සුහුරු කෘෂිකාර්මික ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘතිවල ඇස්තමේන්තු කටයුතු සිදු කිරීමට නියමිත අතර ඒ සඳහා ද අවශ්‍ය තාක්ෂණික හා මග පෙන්වීම ලබා දෙමින් අනාගත අපේක්ෂාවන් ළඟාකර ගැනීමට සැලසුම් කරමින් ඇත.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක (CRIMP) වැව් ගම් පුබුදුව 2020 වර්ෂය සඳහා එල්ලංගා පද්ධති 3ක් සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු සකසමින් පවතී. දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ පිහිටුවා තිබූ කැකිරාව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය කැකිරාව ප්‍රදේශයේ ස්ථාපනය කර ගොවි ජනතාවට වඩාත් සමීප සේවාවක් සැපයීමට කටයුතු කරන ලදි. තවද තත්ත්ව පාලන ඒකකය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික උපකරණ ලබා ගැනීමට බලාපොරොත්තු වන අතර එමගින් තත්ත්ව පාලන ගුණාත්මක බව හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට අදහස් කෙරේ.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 වර්ෂය තුළ මුදල් වියදම් කිරීමේදී වාරිමාර්ග ව්‍යාපෘති 117 ක් ක්‍රියාත්මක කළ අතර ඉන් ව්‍යාපෘති 96 ක් සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට හැකි වූ අතර ව්‍යාපෘති 19 ක වැඩ අවසන් අදියර දක්වා ගෙන ඒමට හැකිවිය. මූලධන වත්කම් අත්පත් කර ගැනීම හා වැඩි දියුණු කිරිම යටතේ සිදු කරන ලද ගොඩනැගිලි ඉදිකිරීම් හා පුනරුත්ථාපන ව්‍යාපෘතියක් ද අවසන් කරන ලදී. එමෙන්ම පසුගිය වර්ෂය තුළ අවිච්ඡේද ව්‍යාපෘති 2 ක් සිදු කළ අතර එම සියලුම ව්‍යාපෘති සාර්ථකව අවසන් කරන ලදී. ඒ අනුව සමස්ත දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රගතිය 94% දක්වා ළඟාකර ගැනීමට හැකි විය.

ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා විදේශ ව්‍යාපෘති ආයතන සමග එක්ව රු.මි 800කට ආසන්න වටිනාකමින් යුත් ව්‍යාපෘති 225 ක් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය කිරීම හා බිල්පත් සකස් කිරීම හෝ පරික්ෂා කිරීම කටයුතු ද අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම ද සිදු විය. ඒ අනුව උතුරු මැද පළාත තුළ සෞභාග්‍යමත් ගොවි පරපුරක් බිහිකොට පළාතේ තිරසර සංවර්ධනයෙන් යුතු ගොවි ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණු සඵල කරගැනීම සමස්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය උපරිම දායකත්වය ලබා දෙන ලදි.

එසේ වුවද කාර්ය සාධනය ළඟාකර ගැනීමේ දී ගැටළු හා අභියෝගවලට මුහුණ දිමට ද සිදුවිය. විශේෂයෙන්ම වාරිමාර්ග ව්‍යාපෘති මූලික වශයෙන් ඉදිකිරීමට සුදුසු අමුද්‍රව්‍ය ඒ සඳහා සුදුසු කාලගුණික තත්වයක් පැවතිය යුතුය. අධික නියං තත්වයත් හා වර්ෂාවත් ඉදිකිරීම් කටයුතු සඳහා බාධාවක් ඇති කරයි. තවද කුඹුරු අස්වනු නෙලන කාලයේදී ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වේ. ඒ අනුව ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම මැයි මාසයේදිවත් සිදුකර යුතු අතර අවසන් කිරීම ඔක්තෝම්බර් මාසයදී සිදු විය යුතුය.ඒ අනුව ව්‍යාපෘති හඳුනා ගැනීම ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු මැයි මාසය වන විට අවසන් කිරීම දෙපාර්තමේන්තුව සතුව පවතින අභියෝගයක් වේ. එය පසුගිය වසර තුළදී සාර්ථකව සැලැස්මට අනුකූලව සිදුකිරීමට හැකි විය.

ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත් ආයතනයක් සමග ගිවිසුම්ගතව එම ආයතනය මගින් සිදුකර ගැනිමක් කරන අතර ව්‍යාපෘතින්හි ප්‍රගතිය සඳහා කොන්ත්‍රාත් ආයතනයේ කාර්යක්ෂමතාව බලපානු ඇත. ඒ අනුව පසුගිය වසර තුළ සිදුකරනු ලැබූ ව්‍යාපෘති 89කින් ව්‍යාපෘති 3ක් කාලගුණික හා කොන්ත්‍රාත් ආයතනයේ කාර්යක්ෂමතාව දුර්වලතාවය අනුව අවසන්කර ගැනීමට නොහැකි වුව ද එම ව්‍යාපෘති 3න් 2 ක් 95 % භෞතික ප්‍රගතියකට ළඟාකර ගැනීමට හැකි විය.

2018 වර්ෂයේ දි දෙපාර්තමේන්තුව ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රශස්ත ලෙස වෙන් කිරීම මගින් මහජනතාවට හා සේවකයන්ගේ අභිවෘද්ධිය සඳහා උපරිම ආකාරයෙන් උපයෝජනය කිරීමට හැකි විය.

# 10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යටතේ ස්ථාපිත පළාත් සභා නම් නෛතික සංවිධාන ව්‍යුහයේ තවත් එක් විෂයයක් ලෙස ඉඩම් විෂයය හඳුන්වා දිය හැකිය. ඒ අනුව යමින් 1989 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පළාත් ඉඩම් කාර්යාලය නමින් මෙම දෙපාර්තමේන්තුව ආරම්භ විය. ආරම්භයේදී ඉඩම් අධ්‍යක්ෂක යන තනතුර යටතේ ආරම්භ වී වසරක් ඇවෑමෙන් එනම් 1990 වර්ෂයේදී දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදී. ඒ අනුව ඉඩම් කොමසාරිස්වරයෙකුගෙන් සමන්විතව උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ලෙස මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත විය. මේ වන විට නිළධාරින් සහ සෙසු කාර්ය මණ්ඩලය 92 දෙනෙකුගෙන් සමන්විත වේ.

## ඉඩම් පරිහරණය

| | අනුරාධපුර (හෙක්ටයාර) | පොළොන්නරුව (හෙක්ටයාර) | උතුරු මැද පළාත (හෙක්ටයාර) |
|---|---|---|---|
| ගෙවතු | 96,424 | 48,926.14 | 145,350.14 |
| කුඹුරු | 131,222 | 83,453.56 | 214,675.56 |
| පොල් | 1,865 | 873.24 | 2,738.24 |
| වෙනත් වගාවන් | 8,577 | 3374.99 | 11,951.99 |
| වනාන්තර | | | |
| • ඝණ | 199,428 | 163163.05 | 362,591.05 |
| • විවෘත | 15,922 | 4445.64 | 20,367.64 |
| • වගා කළ | 5,477 | 1718.68 | 7,195. 68 |
| • ලඳු කැලෑ | 191,100 | 11473.13 | 202,573.13 |
| වගුරු බිම් | 2,542 | 4156.45 | 6,698.45 |
| ජලාශ | 55,241 | 16240.86 | 71,481.86 |
| ඉදිකිරීම් | 1,585 | 1229.44 | 2,814.44 |
| ගල්පර | 2,949 | 5576.66 | 8,525.66 |
| මුඩු බිම් | 82 | 2006.03 | 2088.03 |
| වෙනත්/සුසාන භූමි/මාර්ග | 5,486 | 0 | 5,486 |
| **එකතුව** | **717,900** | **346,637.86** | **1,064,537.87** |

## දැක්ම

"නීත්‍යානුකූල ඉඩමක් - සංවර්ධිත ප්‍රජාවක්"

## මෙහෙවර

"නෛතික රාමුවට අනුකූලව යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම් සහිත ප්‍රජාවට විධිමත්ව ලබාදීම, ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය, රජයේ ඉඩම්වල සුරක්ෂිතභාවය සංර්ධනය, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙවන් හා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම."

## දිගුකාලීන අරමුණු

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම.
- ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය.
- අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම.
- ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.
- ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාව ලබාදෙන ආයතනයක් ඇති කිරීම.
- පළාත් සභා ආදායම් ඉහළ නැංවීම.

## කෙටිකාලීන අරමුණු

- වර්ෂයකදී දළ වශයෙන් හිමිකම් පත්‍ර 15000කට ආසන්න සංඛ්‍යාවක් ලබා දීම.
- සෑම වර්ෂයකමදීම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- දිස්ත්‍රික්ක දෙකම ආවරණය වන පරිදි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක හෝ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියා කිරීම.
- අනවසර අල්ලා ගැනීම් පෙර වර්ෂයට සාපේක්ෂව අවම කිරීම.
- වසරින් වසර විවිධාංගිකරණය කරන ලද පුහුණු වැඩසටහන් සැලසුම් කර විවිධ අංශයන්ගෙන් දැනුම ලබා දීම.
- ඵලදායිතා සංකල්ප හඳුන්වා දෙමින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- පෙර වසරට වඩා ඉහළ හා හිඟ අවම වූ බදු ආදායමක් එකතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම සහිත ප්‍රජාවට විධිමත්ව ලබා දීම සංවර්ධනය.
- ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.
- රජයේ ඉඩම්වල සුරක්ෂිතතාව සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.
- රජයට ලැබිය යුතු බදු මුදල් විධිමත්ව හා කාර්යක්ෂමව ලබා ගැනීම හා ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම.
- නව සංවර්ධන ව්‍යාපෘතින් හඳුනා ගැනීම හා ඒ සඳහා සුදුසු ආයෝජකයින් යෙදවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ✓ 2008/04 චක්‍රලේඛයේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත අවශ්‍ය මානව, භෞතික, මූල්‍ය සම්පත් ලබා දීම.
- ✓ අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් වාර්තාකරණය සඳහා වැඩසටහන් සකස් කිරීම.
- ✓ විවිධ අංශයන්ගෙන් පිරිපුන් දැනුමක් සහිත පුද්ගලයින් බිහි වීම තුළින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීම.
- ✓ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බදු කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

1 NO POVERTY

1.4.විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වනවිට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන් ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

9.1.ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියළු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම්ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

15 LIFE ON LAND

15.1 2020 වනවිට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන් ,විශේෂ වනාන්තර ,කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගා සිටුවීම,සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.

17 PARTNERSHIPS FOR THE GOALS

17.1 බදු හා වෙනත් ආදායම් එක් රැස් කිරීම වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර් ජාතික සහයෝගය ලබාදීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 112 |
| 2 | සේවයේ නියුතු | 91 |
| 3 | පුරප්පාඩු | 21 |
| 4 | පුහුණු | 02 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම් -2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 59.69 | 59.23 | 0.46 | 99.22 |
| ගමන් වියදම් | 4.47 | 4.09 | 0.37 | 91.63 |
| සැපයීම් | 2.66 | 2.29 | 0.36 | 86.19 |
| නඩත්තු වියදම් | 1.80 | 1.46 | 0.34 | 80.92 |
| ගිවිසුම්ගත සේවා | 5.73 | 4.65 | 1.07 | 81.25 |
| මාරු කිරීම් | 0.62 | 0.51 | 0.10 | 82.67 |
| **එකතුව** | **74.98** | **72.25** | **2.73** | **96.35** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරිම.

| ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| **ව්‍යාපෘතිය - ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම.** | | |
| 1.ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම. (මහජනතාව වෙත ගොස් ඔවුන්ගේ ඉඩම් ගැටළු හඳුනා ගැනීම,උපදෙස් ලබාදීම, මැනුම් නිරවුල් කිරීම,දීමනා පත්‍ර පසු කටයුතු, පැවරීම් හා දීමනාපත්‍ර බෙදාදීම් ආදිය) | 1.මහජනතාවගේ ඉඩම් ගැටළු විසඳීම කඩිනම් කිරීම. | 1047 |
| 2. ඉඩම් කාර්ය සංග්‍රහය සහ චක්‍රලේඛ හා නීති රීති පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම. | 2. ඉඩම් රාජකාරී කටයුතු නීත්‍යානුකූලව ඉටු කිරීමට නිලධාරීන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීම. | 2034 |
| 3. ඉඩම් හිමිකම ලබාදීම සඳහා මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම. | 3. ප්‍රදාන පත්‍රයක් හෝ අවසරපත්‍රයක් මඟින් තම ඉඩම් කොටසට නීත්‍යානුකූල හිමිකම ලබාදීම . | 11617 |
| 4.බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බදු ගොනු යාවත්කාලීන කිරීම | 4. රජයේ ඉඩම් සඳහා අයවිය යුතු බදු ආදායම එකතු කිරීම කාර්යක්ෂම කිරීම. | 463 |
| 5.ඉඩම් ඵලදායිතා සංකල්පය හඳුන්වාදීම පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම. | 5. නිලධාරීන් පුහුණු කිරීම. | 73 |
| **“ඉඩම් ඵලදායිතා ප්‍රණාම” අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉඩම් රාජකාරී ඉටු කරන ලද නිලධාරීන් ඇගයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ඉඩම් නිලධාරීන්ගේ සේවාව ඵලදායී හා කාර්යක්ෂම කිරීම. | ප්‍රා.ලේ.කා- 6 නිලධාරීන් 313 |
| **ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.** | | |
| ඉඩම් රාජකාරී කටයුතු සම්බන්ධව අදාල කාර්යයන් ඉටුකර ගන්නේ කෙසේද යන්න පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන පුවරු සවිකිරීම. | ඉඩම් රාජකාරී කටයුතු සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම. | පළාතේ මහජනතාව |
| **වන රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.** | | |
| රජයේ රක්ෂිතවල පැළ සිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | රක්ෂිත ඉඩම් සංවර්ධනය කර සංරක්ෂණය කිරීම. | රක්ෂිත -1 |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 10.00 | 2.25 | 7.74 | 22.56 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 2.80 | 2.51 | 0.28 | 89.89 |
| වාහන | 1.75 | - | 1.75 | - |
| වෙනත් මූලධන වත්කම් වැඩිදියුණු කිරීම | 3.95 | 3.38 | 0.56 | 85.78 |
| වෙනත් | 2.35 | 0.31 | 2.04 | 13.32 |
| **එකතුව** | **20.85** | **8.47** | **12.38** | **40.63** |

| ආදායම් ඉපයීම - 2019 | | | |
|---|---|---|---|
| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
| වෙනත් ඉපයීම් (20.02.01.03 ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු) | 131 | 187 | 142 |

**දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක**

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමවුම් දර්ශක | ආයොජනය (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **01. සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම.** | | | |
| 1.4 .සියළුම පිරිමින්ට හා කාන්තාවන්ට 2030 වසර වන විට ඉඩම් හිමිකාරීත්වය සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවසිකම් තහවුරු කිරීම.<br>1.4.2. සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය | * පවත්වන ලද මූලික ඉඩම් සමීක්ෂණ හා ඉඩම් කච්චේරි ගණන<br>*පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | 0.63<br>2.22 | 0.61<br>1.70 |
| **08. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය** | | | |
| 8.2 .තාක්ෂණය ඉහළ නැංවීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම. | *නවීකරණය කරන ලද ඉඩම් අංශ ගණන | 1.5 | 1.49 |
| 8.2.1 .සේවා නියුක්ත පුද්ගලයකු සඳහා වන සත්‍ය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය | *සපයන ලද ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ , යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගණන. | 2.8 | 2.70 |
| **09. සවිමත් යටිතල පහසුකම් ගොඩ නැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.** | | | |
| 9.1.ආර්ථික සංවර්ධනය හා මානව යහ පැවැත්ම වෙනුවෙන් තිරසර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br>9.1.1.කි.මී.2ක දුර ප්‍රමාණයන් තුළ ජීවත්වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය | ප්‍රතිසංස්කරණය කරන ලද දුර ප්‍රමාණය / සකස් කරන ලද මාර්ග ගණන | 1.90 | 1.89 |
| **15.භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම, සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.** | | | |
| 15.1.2020 වන විට භූමියේ, ගොඩබිම හා මිරිදිය පරිසර පද්ධති සංරක්ෂණය<br>15.1.2 .ආරක්ෂිත ප්‍රදේශ හා මිරිදිය ජෛව විවිධත්ව සඳහා වන වැදගත් ස්ථාන ගණන<br>15.2 .2020 වන විට ජගත් මට්ටමින් වන රෝපණය.<br>15.2.1.තිරසර වනාන්තර කළමනාකරණය සම්බන්ධයෙන් වන ප්‍රගතිය. | මායිම්කොට වෙන් කරන ලද රක්ෂිත ගණන<br>රක්ෂිතවල සිටුවන ලද පැළ ගණන | 0.72<br>0.01 | 0.72<br>0.01 |
| **17.ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය.** | | | |
| 17.1.බදු හා වෙනත් ආදායම් එක් රැස් කිරීම වර්ධනය කිරීම.<br>17.1.2 .දේශීය අයවැයෙන් දේශීය බදු ආදායමෙහි පංගුව | පළාත් සභා ඉඩම්වලින් උපයන ලද බදු ආදායම | 0.50 | 0.47 |

## තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ඉලක්ක ගත ආයොජනය (රු.මි) | ඉලක්ක වියදම (රු.මි) |
|---|---|---|
| 1.අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම.<br>2.පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 3.0<br>0.45 | 2.78<br>0.31 |
| 1. අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩ ඉඩම් අංශ අළුත්වැඩියා කිරීම.<br>2. අඩු පහසුකම් සහිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ ලබාදීම.<br>3. රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය ( E-slims ) යාවත්කාලීන කිරීම සඳහා පහසුකම් සැපයීම .<br>4.අඩු පහසුකම් සහිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම | 1.5<br>2.3<br>0.3<br>0.2 | 1.49<br>2.25<br>0.26<br>0.19 |
| 5.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අංක 1නිල නිවාසය ඉදිකිරීම<br>6.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අංක 2 නිල නිවාසය ඉදිකිරීම<br>7.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලේඛණාගාරය වැඩිදියුණු කිරීම .<br>8. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිල නිවාස දෙක ඉදිකරන ඉඩම වටා වැට සකස් කිරීම.<br>9. උතුරු මැද පළාත් සභාවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා ඉදිකරන නිල නිවාස සංකීර්ණයට අදාල ඉඩම වටා වැට සකස් කිරීම. | 5.64<br>1.82<br>0.37<br>0.44<br>0.80 | 3.48<br>1.74<br>0.37<br>0.41<br>0.16 |
| අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග ඇති කිරීම හා ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය. | 1.90 | 1.89 |
| 1.රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම.<br>2. රජයේ රක්ෂිතවල පැළ සිටුවීම. | 0.72<br>0.01 | 0.72<br>0.01 |
| ඉඩම් වලින් බදු ආදායම් ඉපැයීම සඳහා වාණිජ ඉඩම්, නේවාසික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් හා කෘෂිකාර්මික ඉඩම් මැනුම් කිරීම. | 0.39 | 0.39 |

## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො/ ග්‍රා.නි.වසම් ගණන |
|---|---|---|
| **ප්‍රා.ලේ.කො. මට්ටමින් ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම.** | | |
| 1.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මූලික ඉඩම් සමීක්ෂණ , ඉඩම් කච්චේරි පැවැත්වීම. | 11617 | ප්‍රා.ලේ.කො.22/ ග්‍රා.නි.ව.292 |
| 3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම | 1047 | ප්‍රා.ලේ.කො.9/ ග්‍රා.නි.ව.71 |
| 4. ඉඩම් චක්‍රලේඛ /නීති රීති පිලිබඳ සාකච්ජාමය පුහුණු වැඩසටහන හා රජයේ ඉඩම් කාර්ය සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන | 2034 | ප්‍රා.ලේ.කො. 24 |
| 6. ඉඩම් එලදායිතා සංකල්පය හඳුන්වාදීම පිළිබඳ පුහුණු වැඩසටහන | 73 | ප්‍රා.ලේ.කො. 24 |
| 7. ඉඩම් කටයුතු සම්බන්ධව අධිකරණමය රාජකාරි හා නීතිමය උපදෙස් පිළිබඳ පුහුණුව | 90 | ප්‍රා.ලේ.කො. 24 |
| 8. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දීර්ඝකාලීන බදු ගොනු යාවත්කාලීන කිරීම. | | ප්‍රා.ලේ.කො. 3 |
| 6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බදුකරුවන් දැනුවත් කිරීම. | 463 | ප්‍රා.ලේ.කො. 4 |
| **අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග ඇති කිරීම හා ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය.** | | |
| 1.මධ්‍යම නුවර ගම් පළාත. ප්‍රා.ලේ.කො.ගල්පොත්තේගම කෘෂි මාර්ගය සංවර්ධනය. | 480 | ප්‍රා.ලේ.කො. 4 |
| 2.ම.නු.ප. ප්‍රා.ලේ.කො. පහලගම කෘෂි මාර්ගය සංවර්ධනය. | 360 | |
| 3.නොච්චියාගම ප්‍රා.ලේ.කො.තරණගහවැව මාර්ගය සිට කරගහවැව වැව් බැම්ම දක්වා නව කෘෂි මාර්ගය ඉදි කිරීම. | 80 | |
| 4.තලාව ප්‍රා.ලේ.කො.මාවතවැව කෘෂි මාර්ගය සංවර්ධනය. | 500 | |
| 5.හිඟුරක්ගොඩ ප්‍රා.ලේ.කො. FC 9 ඇල සිට L.M ඒකනායක මහතාගේ ඉඩම දක්වා කෘෂි මාර්ගය සංවර්ධනය. | 150 | |
| **රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම.** | | |
| 1.මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිරල්ලුගම වැව් රක්ෂිත මැන වෙන් කිරීම | 250 | ප්‍රා.ලේ.කො.2 |
| 2.නොච්චියාගම 349- ග්‍රා.නි.තුලානේ නැලවගම වැව් රක්ෂිතය මායිම් කොට වෙන් කිරීම. | 250 | |
| **අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ ලබාදීම.** | | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් අංශ සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ ලබාදීම. | ඉඩම් අංශයේ සියළුම නිලධාරීන් | ප්‍රා.ලේ.කො. 22 |

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො/ ග්‍රා.නි.වසම් ගණන |
|---|---|---|
| **ආයතනයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.** | | |
| මනෝ උපදේශන පිළිබඳ පුහුණු වැඩසටහන. | 80 | ප්‍රා.ලේ.කො.24 |
| දීර්ඝකාලීන බදු ගොනු සකස් කිරීම, ගිණුම්ගත කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ පුහුණුව. | 78 | |
| මැනුම් සහයකවරුන් සඳහා පුහුණු වැඩසටහන. | 08 | |
| e-slims මගින් දීමනාපත්‍ර සැකසීම පිළිබඳ පුහුණුව. | 58 | |
| e-slims මගින් ඉඩම් කච්චේරි පැවැත්වීම පිළිබඳ පුහුණුව. | 45 | |
| ආකල්ප හා කුසලතා සංවර්ධනය තුලින් මහජනතාවගේ ඉඩම් ගැටළු නිරාකරණයේදී ඒ සඳහා ප්‍රවේශ විය හැකි ආකාරය පිළිබඳ පුහුණුව. | 75 | |
| භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ GIS පුහුණුව | 26 | |
| **අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම.** | | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් අංශ සඳහා අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ උපකරණ ලබාදීම. | ඉඩම් අංශයේ සියළුම නිලධාරීන් | ප්‍රා.ලේ.කො. 13 |
| **රජයේ ඉඩම් තෙරතුරු කළමණාකරන පද්ධතිය ( E-slim ) යාවත්කාලීන කිරීම සඳහා පහසුකම් සැපයීම** | | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය ( E-slims ) යාවත්කාලීන කිරීම සඳහා ගෘහභාණ්ඩ / කාර්යාලයීය උපකරණ/ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම. | ඉඩම් අංශයේ සියළුම නිලධාරීන් | ප්‍රා.ලේ.කො. 8 |
| **වන රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.** | | |
| ඉපලෝගම තේන්කුට්ටිය රජයේ රක්ෂියේ පැළ සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම. | 120 | ප්‍රා.ලේ.කො. 1 |
| **ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | |
| ඉඩම් රාජකාරී කටයුතු සම්බන්ධව අදාල කාර්යයන් ඉටුකර ගන්නේ කෙසේද යන්න පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන පුවරු සවිකිරීම. | පළාතේ මහජන තාව | |
| **"ඉඩම් ඵලදායිතා ප්‍රණාම" අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල 6ක ඉඩම් රාජකාරී ඉටු කරන ලද නිලධාරීන් ඇගයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (මිහින්තලේ, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, කහටගස්දිගිලිය, තමන්කඩුව, හිඟුරක්ගොඩ) | 313 | ප්‍රා.ලේ.කො. 6 |

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රා.ලේ.කො / ග්‍රා.නි.වසම් ගණන |
|---|---|---|
| **අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ.කර්යාල වල ඉඩම් අංශ අළුත්වැඩියා කිරීම.** | | |
| හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය නවීකරණය | ඉඩම් අංශයේ සියළුම නිලධාරී න් | ප්‍රා.ලේ.කො . 4 |
| මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය අළුත්වැඩියාව | | |
| කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය නවීකරණය කිරීම. | | |
| කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය නවීකරණය | | |
| **ඉඩම් වලින් බදු ආදායම් ඉපැයීම සඳහා වානිජ ඉඩම්, නේවාසික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් හා කෘෂිකාර්මික ඉඩම් මැනුම් කිරීම.** | | |
| පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හබරණ හා පලුගස්වැව ග්‍රාම නිලධාරී තුලානේ නේවාසික ඉඩම් කට්ටි 3 හා වානිජ ඉඩම් කට්ටි 5 ඇතුළු ඉඩම් කට්ටි 8ක් මැනුම් කිරීම. | 8 | ප්‍රා.ලේ.කො . 1 |
| **පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලේඛණාගාරය වැඩිදියුණු කිරීම .** | | |
| දෙපාර්තමේන්තුවේ ලේඛණාගාරය සකස්කර අවසන් කිරීම. | ආයතනයේ නිලධාරීන් | |
| **පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිල නිවාස දෙක ඉදිකරන ඉඩම වටා වැට සැකසීම** | | |
| නිල නිවාස දෙක ඉදිකරන ඉඩම වටා වැට සකස් කිරීම. | මාණ්ඩලික නිලධාරීන් | |
| **උතුරු මැද පළාත් සභාවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා ඉදිකරන නිල නිවාස සංකීර්ණයට අදාල ඉඩම වටා වැට සකස් කිරීම.** | | |
| මාණ්ඩලික නිලධාරීන් සඳහා ඉදිකරන නිල නිවාස සංකීර්ණයට අදාල ඉඩම වටා වැට සකස් කිරීම. | මාණ්ඩලික නිලධාරීන් | |
| **පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අංක 1නිල නිවාසය ඉදිකිරීම.** | | |
| අංක 1නිල නිවාසය සම්පූර්ණයෙන් ඉදිකර අවසන් කිරීම. | මාණ්ඩලික නිලධාරීන් | |
| **පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අංක 2 නිල නිවාසය ඉදිකිරීම** | | |
| අංක 2 නිල නිවාසයේ කොටසක් ඉදි කිරීම. | මාණ්ඩලික නිලධාරීන් | |

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට කරන ලද දායකත්වය

ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අංක 2008/4 හා 2018/3 චක්‍රලේඛය අනුව ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනාගෙන ලියාපදිංචිකර ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් නොමැති පුද්ගලයන් සඳහා නිරවුල් ඉඩමක හිමිකම ලබාදීම සඳහා කටයුතු කරයි. ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අඩු ආදායම්ලාභී ගොවි පන්තියේ අයට ප්‍රමුඛත්වය ලැබෙන පරිදි නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම සිදුකරනු ලබයි.

එසේම රජයේ ඉඩම් ආඥා පනත යටතේ රජයේ හා පුද්ගලික ආයතනයන්ට සහ වැඩි ආදායම්ලාභී පුද්ගලයන්ට,නාගරික ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන්ට නේවාසික, කෘෂිකාර්මික, වාණිජ හා කාර්මික අවශ්‍යතාවයන් සඳහා ඉඩම් ලබාදීම සිදුකරයි. ඒ අනුව මෙම වසරේදී බලපත්‍ර ලබාදීම සඳහා ඉඩම් කට්ටි 14,637 හඳුනාගෙන ඇත.

බලපත්‍ර 2709ක් හා දීමනා පත්‍ර 865ක් පුද්ගලයන් වෙත බෙදා දී ඇති අතර බලපත්‍ර 3922ක් හා දීමනාපත්‍ර 1039ක් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එසේම ඉඩම්ලාභීන්ගේ ඉඩම් ගැටළු රාජ්‍ය නිලධාරීන් මැදිහත්වී විසඳීම හා උපදෙස් සැපයීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 9ක ජංගම සේවා වැඩසටහන් 18ක් පවත්වා ඉඩම් ගැටළු 1616ක් විසඳා ඇති අතර පුද්ගලයන් සඳහා ඉඩම් හිමිකාරිත්වය ලබාදීම සඳහා කටයුතු කරමින් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට දායකත්වයක් සපයා ඇත .

රජයේ ඉඩම් සම්පත ප්‍රශස්ත කළමනාකරණය තුළින් රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමේ විශේෂ ක්‍රියාවලියක් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටුකරනු ලබයි.මෙහිදී නේවාසික, කෘෂිකාර්මික, වාණිජ හා කාර්මික කටයුතු සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට රජයේ ඉඩම් බදු දී ආදායම් රැස් කිරීම කරනු ලැබේ. මූලික වශයෙන් දීර්ඝකාලීන බදු, වාර්ෂික අවසර පත්‍ර බදු , එළදා බදු හා ගැනුම් මිල අයකිරීම් දෙපාර්තමේන්තුව මඟින් රැස්කරන බදු ආදායමට ගැනේ. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කළ යුතු බදු ආදායම පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද ඇස්තමේන්තු ඉලක්කයට වඩා වැඩි ඇති අතර එය පසුගිය වසරේ උපයන ලද බදු ආදායමද ඉක්මවා ඇත. ඉඩම් නව බදු දීම් ප්‍රමාණාත්මකව ඉහළ යාම ඉඩම්වල තක්සේරු වටිනාකම ඉහළ යාම හා බදු එකතු කිරීම විධිමත් කිරීම මෙසේ බදු ආදායම වැඩිවීම සඳහා බලපෑ හේතු ලෙස පෙන්වා දිය හැකිය. නව බදු ආදායම් රැස්කිරීම හා හිඟ බදු ආදායම් රැස් කිරීම සඳහා මෙම වසරේදී සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර සැකසීම, බදු ගොනු පවත්වාගෙන යාම හා ගිණුම්ගත කිරීම සම්බන්ධ පුහුණුව ලබාදීම සිදුකර නිසි අධීක්ෂණයක් යටතේ බදු අයකර ගැනීමට කටයුතු යොදන ලදි.

අදාල කටයුතු විධිමත් කිරීම සඳහා 2018 වසරේදී පත්කරන ලද සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත සංචිතය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පැවති බදු ගොනු යවත්කාලීන කිරීමේ කටයුතු සිදු කිරීමත් , බදු ගෙවීම් පැහැර හැර ඇති අයවලුන් දැනුවත් කිරීම හා බදු අය කිරීමට ඇති රජයේ ඉඩම් හඳුනාගෙන කඩිනමින් මැනුම් කටයුතු සිදුකිරීම හේතුවෙන් මේ වසරේදී පෙර වසරවලට වඩා ඉහළ බදු ආදායමක් එකතු කර ගත හැකි වී ඇත. උපයන ලද බදු ආදායම ඉලක්කයට වඩා 142.7% ක වැඩි වීමක් වන අතර එය තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට සුවිශේෂී දායකත්වයක් සපයා ඇත. අනවසර අල්ලා ගැනීම් පාලනය කිරීම සඳහා රජයේ රක්ෂිත මැනුම් කර මායිම් කිරීම මෙම වසරේදී ද ක්‍රියාත්මක කර ලද අතර පළාත් සෞඛ්‍ය හා පරිසර අමාත්‍යාංශයේ දායකත්වයෙන් පරිසර හානිය අවම කර ගැනීම සඳහා මෙම රක්ෂිතවල රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි.

ඒ අනුව පරිසර පද්ධති ආරක්ෂා කිරීම , සංරක්ෂණය කිරීම, ඉඩම් හායනය වැළැක්වීම හා නැවත නගා සිටුවීම මඟින් තිරසර වනාන්තර කළමනාකරණය සඳහා දායකත්වයත් සපයා ඇති අතර අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීමට කටයුතු කර ඇත. ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග සකස්කර ඇත. මෙම වැඩසටහන ආර්ථික, සංවර්ධනය හා මානව යහපැවැත්ම වෙනුවෙන් තිරසර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යන ඉලක්ක ඔස්සේ තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමකි .

ඉඩම් රාජකාරී ගත්විට දීර්ඝ ක්‍රියාවලියක් හා අණ පනත් රාශියක් සමග බැඳුණු විෂයන් වන බැවින් මහජනයා වෙත ඉඩම් හිමිකමක් ලබා ගැනීමට අයදුම්පත්‍රය නිකුත් කරන අවස්ථාවේ සිට හිමිකම් පත්‍රයක් ඔවුන්ගේ අතට ලැබෙන අවස්ථාව දක්වාම සම්බන්ධ වන නිලධාරීන් දැනුමෙන් සන්නද්ධ වී සිටීම අත්‍යවශ්‍ය කරුණකි. සෑම වසරකම ඉඩම් රාජකාරී කටයුතු ඉටු කරන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර මෙම වසරේදී පුහුණු වැඩසටහන් 37ක් පවත්වා නිලධාරීන් 2477ක් පුහුණු කර ඇත.

එසේම නිලධාරීන්ගේ සේවා පහසුව සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශ නවීකරණය කිරීමට කටයුතු කර ඇති අතර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදී මහජන මිත්‍රශීලී කාර්යක්ෂම නිලධාරින්ගෙන් යුත් ගුණාත්මක සේවා සපයන ආයතනයක් ඇති කිරීමට කටයුතු කර ඇත.

## කාර්ය සාධන ඉලක්ක - 2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | වියදම්/ආයෝජනය (රු.මි.) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම | | | | |
| නිකුත් කල බලපත්‍ර හා දීමනා පත්‍ර සංඛ්‍යාව | 8000 | 9000 | 2.78 | 3.0 |
| පවත්වන ලද මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි ගණන | 125/125 | 100/150 | | |
| ඉඩම් වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය | | | | |
| ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග ගණන /දුර ප්‍රමාණය | 4 | 10 | 1.89 | 4.5 |
| අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම . | | | | |
| මායිම්කර වෙන්කරන ලද රක්ෂිත සංඛ්‍යාව | 5 | 2 | 0.72 | 2.0 |
| ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය. | | | | |
| පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | 10 | 15 | 0.31 | 2.5 |
| පුහුණුකළ නිලධාරීන් ගණන | 92 | 92 | 0.20 | |
| ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීම. | | | | |
| නවීකරණය කරන ලද හා ඉදිකරන ලද ගොඩනැගිලි ගණන | 1 | 5 | 6.18 | 6.7 |
| නවීකරණය වූ ඉඩම් අංශ ගණන | 2 | 4 | 1.49 | 5.0 |
| භෞතික සම්පත් සපයන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | 24 | 24 | 2.7 | 5.0 |
| පළාත් සභා ආදායම ඉහළ නැංවීම | | | | |
| රජයේ ඉඩම්වලින් වාර්ෂිකව උපයන ලද බදු ආදායම(රු.මි) | 129 | 132 | 187 | 136 |
| මනින ලද ඉඩම් කට්ටි ගණන | 10 | 10 | 0.39 | 2.0 |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හී ප්‍රගතිය

| අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | වෙන්කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | 2019.12.31 | |
|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
| **සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම.** | | | | |
| ප්‍රා.ලේ.කො. මට්ටමින් ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම. | 3 | 2.78 | 100 | 92 |
| **ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය.** | | | | |
| සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීම හා ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය | 1.902 | 1.892 | 100 | 99 |
| **අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම .** | | | | |
| රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම. | 0.725 | 0.725 | 100 | 100 |
| **ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.** | | | | |
| ආයතනයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 0.45 | 0.313 | 100 | 70 |
| **ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීම** | | | | |
| 1.අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ ලබාදීම. | 2.6 | 2.516 | 100 | 93 |
| 2.අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම | 0.2 | 0.192 | 100 | 96.1 |
| 3.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලේඛණාගාරය වැඩිදියුණු කිරීම . | 0.375 | 0.371 | 100 | 99 |
| 4.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අංක 1නිල නිවාසය ඉදිකිරීම. | 5.64 | 3.487 (2.229අතැති බිල්) | 90 | 61.82 |
| 5.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අංක 2 නිලනිවාසය ඉදිකිරීම ඉදිකිරීම. | 1.822 | 1.741 (0.99 අතැති බිල්) | 100 | 95.57 |
| 6.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිල නිවාස දෙක ඉදිකරන ඉඩම වටා වැට සකස් කිරීම. | 0.444 | 0.419 (අතැති බිල්) | 100 | 94.39 |
| 7. උතුරු මැද පළාත් සභාවේ මාණ්ඩලික නිලධාරීන් සඳහා ඉදිකරන නිල නිවාස සංකීර්ණයට අදාල ඉඩම වටා වැට සකස් කිරීම. | 0.806 | 0.165 | 25 | 20.53 |
| 8. ප්‍රා.ලේ කාර්යාලවල ඉඩම් අංශ අළුත්වැඩියා කිරීම | 1.5 | 1.49 | 100 | 99 |
| **පළාත් සභා ආදායම ඉහළ නැංවීම.** | | | | |
| ඉඩම්වලින් බදු ආදායම් ඉපැයීම සඳහා වාණිජ ඉඩම්, නේවාසික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් හා කෘෂිකාර්මික ඉඩම් මැනුම් කිරීම. | 0.368 | 0.368 | 100 | - |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හී ප්‍රගතිය - 2019

### ව්‍යාපෘතිය 01 :-ඉඩම් නිරවුල් කිරිමේ කඳවුරු පැවැත්වීම

සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම කඩිනම් කිරීම මෙමගින් සිදු විය. මේ සඳහා වැය කරන ලද මුදල රු. 2,780,854.18 කි.මෙම වැඩසටහන යටතේ ජංගම සේවාවන් පැවැත්වීම(මහජනතාව වෙත ගොස් ඔවුන්ගේ ඉඩම් ගැටලු හඳුනා ගැනීම/උපදෙස් ලබාදීම/ පැවරීම් / මැනුම් නිරවුල් කිරීම්/ දීමනා පත්‍ර පසු කටයුතු හා දීමනාපත්‍ර බෙදාදීම ) රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් සංවර්ධන ආඥා පනත පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම , ඉඩම් චක්‍රලේඛ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම, ඉඩම් හිමිකම ලබාදීම සඳහා මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම , බදුකරුවන් දැනුවත් කිරීම, දීර්ඝකාලීන බදු ගොනු යාවත්කාලීන කිරීම යන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇත.

### 01 - ජංගම සේවාවන් පැවැත්වීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත, තිරප්පනේ, ගල්නෑව, ගලෙන්බිඳුණුවැව, ඉපලෝගම, තලාව හා කැකිරාව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය, ඇළහැර යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ජංගම සේවාවන් 18ක් පවත්වා ඇත.ඒ සඳහා එම ප්‍රදේශවල මහජනතාව 1047ක් සහභාගි වී ඇත. ඒ තුළින් ඉඩම් ගැටළු 1616ක් සඳහා විසඳුම් ලබාදීමට හැකි වි ඇති අතර ඒ තුළින් ග්‍රාම නිලධාරී තුලාන් 71 ක් පමණ ආවරණය විය.



### 02 - රජයේ ඉඩම් කාර්ය සංග්‍රහය සහ නීතිරීති පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිලධාරීන් දැනුවත් කිරීම සහ ඉඩම් චක්‍රලේඛ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රජයේ ඉඩම් කාර්ය සංග්‍රහය සහ නීතිරීති පිළිබඳ පුහුණු වැඩසටහන් හතක් (07)ක් ද ඉඩම් චක්‍රලේඛ පිළිබඳව පුහුණු වැඩසටහන් විසි දෙකක් (22) ක් පවත්වා ඇත. නැ.නු.ප, පලුගස්වැව, කැකිරාව, මිහින්තලේ, තිරප්පනේ, ගල්නෑව, ම.නු.ප, මැදිරිගිරිය, නොච්චියාගම, ගලෙන්බිඳුණුවැව, පලාගල, තලාව, කැබිතිගෙල්ලෑව, කහටගස්දිගිලිය, ඇළහැර, තමන්කඩුව, පදවිය, රඹෑව, හොරොව්පොතාන, මැදවච්චිය, මහවිලච්චිය, නාච්චාදූව, හිඟුරක්ගොඩ යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල ආවරණය කරන ලදී. පුහුණු කරන ලද නිලධාරීන් ගණන 2034 කි.

### 03 - ඉඩම් හිමිකම් නොමැති පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා මූලික සමීක්ෂණ පැවැත්වීම හා ඉඩම් කච්චේරි පැවැත්වීම

| පවත්වන ලද ප්‍රා.ලේ.කො ගණන | පවත්වන ලද මූලික ඉඩම් සමීක්ෂණ ගණන | පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන | ලියාපදිංචි පුද්ගලයන් ගණන | ආවරණය කරන ලද ග්‍රාම නිලධාරී වසම් ගණන |
|---|---|---|---|---|
| 22 | 174 | 152 | 11617 | 292 |

## 04 - බදුකරුවන් දැනුවත් කිරීම

බදුකරුවන් දැනුවත් කිරීමේ ප්‍රධාන අරමුණ පළාත් සභා ආදායම ඉහළ නැංවීම වන අතර මධ්‍යම නුවරගම් පළාත, නැගෙනහිර නුවරගම් පළාත, කැකිරාව හා කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

### ව්‍යාපෘතිය 02 - සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල යටිතල පහසුකම් සංවර්ධනය සිදුවිය. ඒ යටතේ මාර්ග 05ක් සකස් කළ අතර ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.1.902ක් වු අතර වැය කළ මුළු මුදල රු.1.892 කි.



ම.නු.ප - පහලගම කෘෂි මාර්ගය සංවර්ධනය

### ව්‍යාපෘතිය 03:- රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර,කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම.

අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම අරමුණු කොට රක්ෂිත මැනිම සිදු විය. ඒ යටතේ මැනුම් කළ රක්ෂිත ගණන 2 කි. මැදවච්චිය අංක 54 ග්‍රාම නිලධාරී තුලානේ හිරල්ලුගම වැව් රක්ෂිතය හා නොච්චියාගම 349- ග්‍රාම නිලධාරී තුලානේ නැලවගම වැව් රක්ෂිතයට අයත් ඉඩම්වල පැරණි මායිම් විවෘත කරගැනීමට අදාලව ඉඩම් මැනුම් කිරීම මේ යටතේ සිදු කරන ලදී. මේ සඳහා වෙන් කරන ලද මුදල රු. 0.725ක් වු අතර වැය කළ මුදල රු. 0.725කි.



මැදවච්චිය - අංක 54 ග්‍රා.නි.තුලානේ හිරල්ලුගම වැව් රක්ෂිතය මායිම් කොට වෙන් කිරීම.

### ව්‍යාපෘතිය 04 - ඉඩම්වලින් බදු ආදායම් ඉපැයීම සඳහා වාණිජ ඉඩම්, නේවාසික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් හා කෘෂිකාර්මික ඉඩම් මැනුම් කිරීම.

පළාත් සභා ආදායම ඉහළ නැංවීම සඳහා පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නේවාසික ඉඩම් කට්ටි 3 හා වාණිජ ඉඩම් කට්ටි 5 මැනීම සිදු කරන ලද අතර ඒ සඳහා රු.398,600.00ක් වැය විය.

## ව්‍යාපෘතිය 05 - ආයතනයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

**ව්‍යාපෘතියේ අරමුණ - ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය**

| පුහුණු වැඩසටහන | ඉලක්කගත කණ්ඩායම | පුහුණු ලාභීන් ගණන | වැයකලමුදල (රු.මි) |
|---|---|---|---|
| මනෝ උපදේශන පුහුණු වැඩසටහන | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලය | 80 | 46,875.00 |
| දීර්ඝකාලීන බඳුගොනු සකස් කිරීම, ගිණුම් ගත කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ පුහුණුව | සංවර්ධන නිලධාරි, ඉඩම් නිලධාරි ,කළමණාකරන සහකාර | 78 | 42,730.00 |
| ඵලදායිතා සංකල්පය හඳුන්වාදීම | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලය | 73 | 72,017.00 |
| මැනුම් සහයකවරුන් සඳහා පුහුණුව | මැනුම් සහයකවරුන් | 8 | 51,555.00 |
| GIS පුහුණුව | ඉඩම් නිලධාරි | 26 | 276,810 |
| e-slims පුහුණුව- දීමනාපත්‍ර සැකසීම | ඉඩම් නිලධාරි , සංවර්ධන නිලධාරි , කළමණාකරන සහකාර | 58 | 60,500.00 |
| ආකල්ප හා කුසලතා සංවර්ධනය තුළින් මහජනතාවගේ ඉඩම් ගැටළු නිරාකරණයේදී ඒ සඳහා ප්‍රවේශ විය හැකි ආකාරය පිළිබඳ පුහුණුව. | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලය | 75 | 55,430.00 |
| e-slims පුහුණුව- ඉඩම් කච්චේරි පැවැත්වීම | ඉඩම් නිලධාරි , සංවර්ධන නිලධාරි , කළමනාකරණ සහකාර | 45 | 56,715.00 |

## ව්‍යාපෘතිය 06 - අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ.කර්යාලවල ඉඩම් අංශ අළුත්වැඩියා කිරීම.

| නවීකරණය කරන ලද ඉඩම් අංශ | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වෙන්කල මුදල (රු) | වියදම (රු) | භෞතික ප්‍රගතිය(%) |
|---|---|---|---|---|
| මැදිරිගිරිය, කැකිරාව, හිඟුරක්ගොඩ, කහටගස්දිගිලිය ප්‍රා.ලේ.කාර්යාලයන්හි ඉඩම් අංශ අළුත්වැඩියාව | මැදිරිගිරිය | 0.065 | 0.065 | 100 |
| | කැකිරාව | 0.610 | 0.604 | 100 |
| | කහටගස්දිගිලිය | 0.240 | 0.240 | 100 |
| | හිඟුරක්ගොඩ | 0.585 | 0.585 | 100 |
| **එකතුව** | | **1.50** | **1.49** | **100** |

## ව්‍යාපෘතිය 07 - “ඉඩම් ඵලදායිතා ප්‍රණාම” ඇගයීම් වැඩසටහන

අරමුණ -ඵලදායී කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීමේ අරමුණින් නිලධාරීන් ඇගයීමට ලක්කිරීම.2019 වර්ෂයේ දී මිහින්තලේ,මැදවච්චිය,කැබතිගොල්ලැව,කහටගස්දිගිලිය,තමන්කඩුව, හිඟුරක්ගොඩ යන ප්‍රා.ලේ.කාර්යාලවල වැඩසටහන් පවත්වන ලදී.

## ව්‍යාපෘතිය 08- රුක් රෝපණ වැඩසටහන් පැවැත්වීම

රුක් රෝපණ වැඩසටහන යටතේ ඉපලෝගම තේන්කුට්ටිය වැව් රක්ෂිතයේ කුඹුක් හා මී පැළ 100ක් සිටුවන ලදි.

## ක්‍රියාත්මක කරන ලද අනෙකුත් වැඩසටහන්


| අ.අ | විස්තරය | |
|---|---|---|
| 01 | පළාත්<br>ඉඩම් දෙපාර්තමේන්තුව සඳහා<br>නිල නිවාස අංක 01<br>ඉදිකිරීම. |  |
| 02 | දෙපාර්තමේන්තුව සඳහා<br>නිල නිවාස අංක 02<br>ඉදිකිරීම. |  |
| 03 | පළාත්<br>ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ<br>නිල නිවාස දෙක<br>ඉදිකරන ඉඩම වටා<br>වැට සකස් කිරීම. |  |
| 04 | පළාත්<br>ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ<br>ලේඛණාගාරය<br>වැඩිදියුණු කිරීම . |  |
| 05 | හිමිකම්පත් බෙදා දීම යටතේ<br>2019.08.02 දින පවත්වන ලද ඉඩම් ඔප්පු<br>බෙදාදීමේ ජාතික වැඩසටහන යටතේ<br>අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයින් සඳහා<br>1046ක් සඳහා දීමනාපත්‍ර හා බලපත්‍ර<br>ලබාදී ඇත. |  |

## ඉඩම් බදු ආදායම බදු ආදායම ඉපයීම -2019.12.31

| අ.අ | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ආදායම (රු.මි) |
|---|---|---|
| 1 | පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය | 1.31 |
| 2 | නැ.නු.ප | 121.88 |
| 3 | ම.නු.ප | 6.07 |
| 4 | තලාව | 1.83 |
| 5 | තිරප්පනේ | 4.82 |
| 6 | නොච්චියාගම | 1.85 |
| 7 | මිහින්තලේ | 2.56 |
| 8 | රඹෑව | 0.52 |
| 9 | හොරොව්පතාන | 1.04 |
| 10 | කහටගස්දිගිලිය | 2.30 |
| 11 | ගලෙන්බිඳුනුවැව | 0.07 |
| 12 | විලච්චිය | 0.73 |
| 13 | ගල්නෑව | 0.24 |
| 14 | ඉපලෝගම | 0.67 |
| 15 | කැකිරාව | 14.27 |
| 16 | පලුගස්වැව | 9.81 |
| 17 | කැබිතිගොල්ලෑව | 2.66 |
| 18 | පලාගල | 0.01 |
| 19 | මැදවච්චිය | 2.80 |
| 20 | නාච්චාදූව | 0.84 |
| 21 | හිඟුරක්ගොඩ | 2.20 |
| 22 | තමන්කඩුව | 7.67 |
| 23 | මැදිරිගිරිය | 0.00 |
| 24 | ඇළහැර | 0.90 |
| මුළු එකතුව | | 187.07 |

## දීර්ඝකාලීන බදු බලපත්‍රවලින් එකතු කරන ලද බදු ආදායම (රු.මි) 2014-2019


| වර්ෂය | බදු ආදායම (රු.මි) |
|---|---|
| 2014 | 64.3 |
| 2015 | 67.9 |
| 2016 | 111.1 |
| 2017 | 151.9 |
| 2018 | 186.95 |
| 2019 | 187.07 |




## මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම - 2019

| විස්තරය | මූලික සමීක්ෂණ | ඉඩම් කච්චේරි |
|---|---|---|
| ඉලක්කය | 100 | 150 |
| පවත්වන ලද සංඛ්‍යාව | 174 | 152 |

පළාතේ ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම සම්බන්ධයෙන් යහපත් ප්‍රගතියක් පෙන්වයි. මූලික සමීක්ෂණ 100ක් ඉලක්ක වූ අතර 174ක් පැවැත්වීමට හැකි විය. එසේම ඉඩම් කච්චේරි පැවැත්වීම ඉලක්කය 150ක් වූ අතර ප්‍රගතිය 152කි.



## ආයතනයේ ගුණාත්මක අංශයේ සංවර්ධනය සඳහා සිදු කරන ලද දායකත්වය

පළාත් ඉඩම් කොමසාරිස්තුමාගේ මග පෙන්වීම හා මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව පළාත් සභා පරිපාලනයට අයත් ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24ක් තුළ ඉඩම් රාජකාරි කටයුතු සිදුකරනු ලබයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24 ආවරණය වන පරිදි ඉඩම් රාජකාරි සඳහා එක් කොට්ඨාසයකට ඉඩම් නිලධාරියෙකු සහ සංවර්ධන නිලධාරියෙකු බැගින් යොදවා ඇත. එසේ වුවද දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සහකාර ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තු) වරයකු, මිනින්දෝරුවරයෙකු, සංවර්ධන නිලධාරීන් 8, හා ඉඩම් නිලධාරීන් 7, රියදුරු1 , කාර්යාල කාර්ය සහායක 1 හා මැනුම් සහයකයකු යන තනතුරු ඇතුළත් වන පරිදි පුරප්පාඩු 21ක් පමණ පවතී.

මෙවැනි සේවක පුරප්පාඩු පැවතියත් විධිමත් කළමනාකරණයක් යටතේ ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2019 වර්ෂයේ විවිධ අංශයන් යටතේ ක්‍රියාකාරකම් සිදුකර ගුණාත්මකව ඉහළ ප්‍රගතියක් ආයතනය වෙත ළඟාකර ගැනීමට හැකිවී ඇත. පසුගිය වසරට සාපේක්ෂව එක් එක් වැය විෂයන් යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි වී ඇත. ඒ අනුව පහත දක්වා ඇති අංශයන් යටතේ වියදම් දරා ඇති අතර ඒ සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය 100%ක ප්‍රශස්ත මට්ටමක ඇත.

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම සඳහා ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම.(මූලික ඉඩම් සමීක්ෂණ/ඉඩම් කච්චේරි/නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්/ජංගම සේවාවන්/බදුකරුවන් දනුවත් කිරීමේ වැඩසටහන්)
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය භෞතික සම්පත් සැපයීම හා යටිතල පහසුකම් සංවර්ධනය.
- කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය හා ඇගයීම.
- රජයේ ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.
- රජයේ ඉඩම්වලින් බදු ආදායම ඉපයීම ක්‍රමවත් කිරීම.

ප්‍රතිපාදන උපයෝජනය ගත්විට පසුගිය වසරට සාපේක්ෂව වියදමේ ප්‍රතිශතය ඉහළ ගොස් ඇත. ඒ අනුව මනා භෞතික සම්පත් කළමනාකරණයක් තුළ ප්‍රාග්ධන වියදම් අදාල ප්‍රතිපාදන සීමාවන් තුළම රඳවා ගැනීමට හැකිවී ඇත.

ඉඩම් විෂය තාක්ෂණික විෂයක් බැවින් සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය රජයේ ඉඩම් කළමනකරණය ප්‍රශස්ත අයුරින් සිදුකිරීම බැවින් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් රාජකාරී ඉටු කරන නිලධාරීන් පුහුණු කිරීම සඳහා විශේෂ අවධානය යොමුකර ඇත. විවිධ ක්ෂේත්‍රයන් හා ක්‍රමවේදයන් ඔස්සේ ප්‍රවීණ සම්පත්දායකයින් යොදාගනිමින් පුහුණු වැඩසටහන් 38ක් ක්‍රියාත්මක කළ අතර එමඟින් ඉඩම් රාජකාරී කටයුතුවල ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමට අවකාශ සැලසුන අතර ඒ අනුව මහජනතාව වෙත තෘප්තිමත් සේවාවක් ලබාදීමට අවශ්‍ය පසුබිම නිර්මාණය වී ඇත.

## ආයතනයේ දැක්ම කරා ළඟාවීමට 2020 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

- රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) මඟින් ඉඩම් කච්චේරි පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් වැඩි ප්‍රමාණයක් පැවැත්වීමට හා ඒ අනුව එකී තාක්ෂණය භාවිතා කරමින් ඉඩම් කච්චේරි පැවැත්වීමටත් සැළසුම් කර ඇත.
- රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) මඟින් දීමනාපත්‍ර සකස් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම හා ඒ සඳහා අවශ්‍ය භෞතික සම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ.
- බදු ආදායම රැස්කිරීම විධිමත්ව කිරීම සඳහා අවශ්‍ය නිලධාරී පුහුණු කිරීමේ වැඩසටහන් හා බදු ගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ. බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නියමිත පරිදි බදු ගෙවීමේ වැදගත්කම පහදාදීම හා බදුකරුවන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම මඟින් දැනට පවතින හිඟ බදු ආදායම එක්රැස් කිරීමටත් ඉදිරියේදී බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීමටත් පියවර ගනු ලැබේ.
- බදු ආදායම් නිවැරදිව පුරෝකථනය නොවීම තුළ ලැබිය යුතු බදු ආදායම සහ වාර්ෂිකව රැස්කරගනු ලබන බදු ආදායම අතර නොගැලපීමක් පෙන්නුම් කරන බැවින් මෙම තත්වය මගහරවා ගැනීම සඳහා නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් සකස්කරන ලද විධිමත් වැඩසටහනක් වන රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-slims) උපයෝගීකර ගනිමින් බදු අදායම් රැස් කිරීම ක්‍රමවත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී මෙතෙක් බදු අනුමැතිය ලබා ඇති ඉඩම්වල තොරතුරු මෙම පද්ධතියට ඇතුළත් කිරීම හා එම තොරතුරු යාවත්කාලීන කිරීම සිදුවන බැවින් ඉදිරියේදී බදු ආදායම් ව්‍යුහය වඩාත් ශක්තිමත් වනු ඇත.
- රජයේ ඉඩම් ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි රක්ෂිත ඉඩම්වල පැළ 5000ක් සිටුවීම ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන ඇති අතර එය 2020 වර්ෂය පුරා ක්‍රියාත්මක කරනු ලැබේ. එමඟින් ප්‍රබල පරිසර ගැටළුවක්ව පවතින මිහිතලය උණුසුම් වීමට බලපා ඇති ප්‍රධාන හේතූන් දෙකින් එකක් වන වනාන්තර විනාශවීම අඩු කිරීමට අවශ්‍ය දායකත්වය ලබාදීම අපේක්ෂා කෙරේ.
- ඉඩම් අයිතිය නීත්‍යානුකූලව ලබාගැනීමේ වැදගත්කම හා ඒ සඳහා මහජනතාව සතු වගකීම පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඉදිරි වර්ෂයේදී අපේක්ෂා කෙරේ.
- ඉඩම් රාජකාරී ඉටු කිරීමේදී ඉඩම් විෂය පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීම හා වෙනස්වන රාජ්‍ය ප්‍රතිපත්ති හා චක්‍රලේඛ විධි විධාන අනුව පවතින දැනුම යාවත්කාලීන වීමද ඉතා වැදගත්වේ. එමෙන්ම යහපත් මහජන සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය හා කාර්යක්ෂම සඵලදායී සේවාවක් ලබාදීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කර ගැනීමටද අවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය සඳහා 2020 වර්ෂයේදීද ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට සැළසුම් කර ඇත.

එමෙන්ම රාජකාරී කටයුතු ඵලදායී අයුරින් ඉටු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් හා පහසුකම් ලබාදීමටද කටයුතු කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශ ශක්තිමත් කිරීම තුළින් ආයතනික කටයුතු වැඩි දියුණු කිරිමටත් ඉඩම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමටත් 2020 වර්ෂයේදී ද වැඩි අවධානයක් යොමු කර ඇත.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

| අ.අ | ව්‍යාපෘතිය | අරමුණ | ප්‍රගතිය | කෙටිකාලීන/දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 1 | රජයේ ඉඩම් සඳහා කඩිනම් දීමනාපත්‍ර ලබාදීමේ ජාතික වැඩසටහන - 1.1 MN ඉඩම් මැනීම | මහජනතාව වෙත ලබාදී ඇති තාවකාලික හිමිකම් පත්‍රය /බලපත්‍රය වෙනුවට ස්ථිර හිමිකම්පත්‍රයක් /දීමනාපත්‍රයක් ලබාදීම. | මෙම ව්‍යාපෘතිය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මුදල් වැයකර ක්‍රියාත්මක කරන අතර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය සිදුකරයි. | නිවැරදි මායිම් හා ඉඩමේ විස්තර ඇතුළත්වූ ස්ථර හා නීත්‍යානුකූල හිමිකම් පත්‍රයක්/දීමනාපත්‍ර යක් මහජනතාව වෙත ලබාදීම. |
| 2 | රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ( e-Slim ) | නවීන තාක්ෂණය භාවිතා කර සියළුම ඉඩම් රාජකාරී වඩා කාර්යක්ෂම සහ ඵලදායී කිරීම සහ රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම. (අන්තර් ජාලය හරහා සවිස්තර ඉඩම් තොරතුරු ඇතුළත් කිරීම සහ දීමනාපත්‍ර සකස්කිරීම කඩිනම් කිරීම ) | මෙම ව්‍යාපෘතිය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් මුදල් වැයකර ක්‍රියාත්මක කරන අතර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය සිදුකරයි. | කෙටි කාලසීමාවක් තුළදී (දින 14) සකස් කරන ලද නීත්‍යානුකූල ස්ථිර හිමිකම් පත්‍රය /දීමනාපත්‍රය මහජනතාව වෙත ලබාදීම. |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්කය 2020 | ඉලක්කය 2021 | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 1.සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම. | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම | 10000 (හිමිකම්පත්)<br>150/150 (මූලික සමී/ඉඩම් ක.) | 12000 (හිමිකම්පත්)<br>150/150 (මූලික සමී/ඉඩම් ක.) | . නීත්‍යානුකූල හිමිකම් පත්‍රයක් ලැබීම/අනවසර අල්ලාගැනීම් පාලනය /ඉඩම් ආරවුල් අවම වීම/මහජනතාවගේ ආර්ථිකය සංවර්ධනය සහ සවිබල ගැන්වීම . |
| 2.ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය | බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග ඇති කිරීම හා ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය | මාර්ග ගණන 15 | මාර්ග ගණන 15 | . ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වීම. |

| අරමුණු | ක්‍රියාකාරකම් | ඉලක්කය 2020 | ඉලක්කය 2021 | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|
| 3.අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම . | 1.රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම. | 8 (රක්ෂිත) | 15 (රක්ෂිත) | රක්ෂිත ඉඩම් සංරක්ෂණය වීම හා සංවර්ධනය වීම. |
| | 2. රජයේ රක්ෂිතවල පැළ සිටුවීම. | පැල 5000 | පැල 5000 | |
| 4.කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය. | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 14 වැඩසටහන් | 15 වැඩසටහන් | ඵලදායී හා තෘප්තිමත් මහජන සේවාවක් ලබාදීම. |
| 5.ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීම. | පළාත් ඉඩම් කො. දෙපාර්තමේන්තුවේ නිල නිවාස ඉදිකිරීම/ /ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරු පැදි ලබාදීම/ප්‍රා.ලේ.කා.වල ඉඩම් අංශ නවීකරණය/ප්‍රා.ලේ. කාර්යාලවලට අවශ්‍ය කාර්යාල උපකරණ /යන්ත්‍ර ලබාදීම. | 5/150 (ගොඩනැගිලි / උපකරණ)<br>7 යතුරු පැදි<br>5(ඉඩම් අංශ) | 5/150 (ගොඩනැගිලි/ උපකරණ)<br>10 යතුරු පැදි<br>5 (ඉඩම් අංශ) | |
| 6.පළාත් සභා ආදායම ඉහළ නැංවීම | ඉඩම් වලින් බදු ආදායම් ඉපැයීම සඳහා වාණිජ, නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් මැනුම් කිරීම. | 15 (ඉඩම් කට්ටි) | 15 (ඉඩම් කට්ටි) | ඉඩම් බදු ආදායම් ඉහළ නැංවීම සහ හිඟ බදු අය කර ගැනීම. |
| | ප්‍රා.ලේ.කාර්යාලවල යාවත්කාලීන වී නොමැති බදු ගොනු යාවත්කාලීන කිරීම. | රු.මි.136 (ආදායම) | රු.මි.141 (ආදායම) | |
| | බදු කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | රු.මි.136 (ආදායම) | රු.මි.141 (ආදායම) | |

රජයේ ඉඩම් කාර්යක්ෂමව යොදා ගැනීම, ඉඩම් සංවර්ධනය හා ඉඩම්වල ඵලදායීතාවය වැඩිදියුණු කිරීම, සැලසුම්කරණය හා කළමනාකරණය සහ ධාරිතා සංවර්ධනය යන සංරචකයන් යටතේ 2020 වර්ෂයේ ඉඩම් දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. මේ යටතේ ඉදිරි වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි රක්ෂිතයන්හි පැළ සිටුවීම ප්‍රමුඛ කාර්යයක් ලෙස ක්‍රියාත්මක කිරීමට ඉදිරි වර්ෂය තුළ යෝජිතය. 2020 වර්ෂයේදී ඉඩම් රාජකාරි කටයුතු ඉටුකරන නිලධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමටද සැලසුම් කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශ ශක්තිමත් කිරීම තුළින් ආයතනික කටයුතු වැඩිදියුණු කිරීමටත් ඉඩම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමටත් අපේක්ෂා කෙරේ. සෑම වසරකම රජයේ ඉඩම් වලින් උපයන බදු ආදායම වැඩිකර ගැනීමට ප්‍රමුඛත්වයක් ලබාදී වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර 2020 වර්ෂයේදීද මෙම කටයුතු නොකඩවා පවත්වාගෙන යාම සඳහා අවධානය යොමු කර ඇත. ඉඩම් ගැටළු හා ආරවුල් විසඳීම තුලින් එම ඉඩම් වල නිරවුල් අයිතිය තහවුරු කිරීම සඳහා ජංගම සේවාවන් පැවැත්වීමත් ඉඩම් හිමිකම් නොමැති පුද්ගයින් හට ඉඩම් හිමිකමක් ලබාදීම සඳහා මූලික ඉඩම් සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීමත් 2020 වර්ෂයේ ඉඩම් සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. එසේම ඉඩම් අයිතිය නීත්‍යානුකූලව ලබාගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ කටයුතුද ඉදිරි වර්ෂයේදී සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

## සමස්ත කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳ අදහස

පළාත් සභා පරිපාලනය යටතේ පවතින ඉඩම් අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24හි ඉඩම් රාජකාරී හා පළාත තුල ඉඩම් රාජකාරී ආශ්‍රිත සම්බන්ධීකරණ කටයුතු කාර්යක්ෂමව ඉටු කරමින් තෘප්තිමත් මහජන සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මඟපෙන්වීම මෙන්ම අවශ්‍ය සම්පත් ලබාදීමද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

ඒ අනුව රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත ,රජයේ ඉඩම් ආඥා පනත ,ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව ඉටු කරනු ලැබේ.මෙහිදී රජයේ ඉඩම් බැහැර කිරීම , සංවර්ධනය හා සංරක්ෂණය යන ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි. ඒ අනුව 2019 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගනිමින් දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ අතර ඒවා මගින් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට සුවිශේෂී දායකත්වයක් සපයා ඇත.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් මූලික ඉඩම් සමීක්ෂණ පැවැත්වීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, බදු ආදායම් රැස්කිරීම හා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම පෙන්වාදිය හැකි අතර මෙම ක්‍රියාකාරකම් අතරින් මූලික ඉඩම් සමීක්ෂණ 174 % කින්ද ඉඩම් කච්චේරි පැවැත්වීම 101 %කින්ද බදු ආදායම් රැස්කිරීම 142% කින්ද වශයෙන් වාර්ෂික ඉලක්කයන් අභිබවා ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග 5ක් සකස් කර ඇත. අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම සඳහා වැව් රක්ෂිත 2ක් මායිම් කොට වෙන්කිරීම සිදුකර ඇත.එමගින් ඉඩම් සංවර්ධනය සඳහා පහසුකම් සැළසීමත් විධිමත් ඉඩම් පරිහරණ රටාවක් මඟින් රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරුවීමත් සිදුවී ඇති අතර අනවසර අල්ලාගැනීම්ද පාලනය වී ඇත.

ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය සඳහා රක්ෂියන්හි පැළ සිටුවීමේ ව්‍යාපෘතිය මෙම වසරේදී ආරම්භ කරන ලද අතර එමඟින් තිරසර වනාන්තර කළමනාකරණය සඳහා ප්‍රවේශය සපයා ඇත. පළාත් සභා ආදායම ඉහළ නැංවීමේ අරමුණ යටතේ මෙම වසරේදී සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර සැකසීම, බදු ගොනු පවත්වා ගෙන යාම, ගිණුම්ගත කිරීම සම්බන්ධ පුහුණුව ලබාදී නිසි අධීක්ෂණයක් යටතේ බදු අයකර ගැනීමට කටයුතු කර ඇති අතර මේ වසරේදී පෙර වසරවලට වඩා ඉහළ බදු ආදායමක් එකතු කර ගැනීමට හා හිඟ බදු අඩුකර ගැනීමට හැකි වී ඇත.

එය මෙම වසරේ ඉලක්කයට වඩා 142%ක වැඩි වීමකි. කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් මහජනතාව වෙත ලබාදීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා පුහුණු වැඩසටහන් 29ක්ද ප්‍රධාන කාර්යාලය මගින් පුහුණු වැඩසටහන් 8ක්ද ක්‍රියාත්මක කර ඇත. ඵලදායී මහජන සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදුන් අතර ඉඩම් අංශ 4ක් නවීකරණය කර මහජන මිත්‍රශීලී කාර්යක්ෂම නිලධාරින්ගෙන් යුත් ගුණාත්මක සේවා සපයන ආයතනයක් ඇති කිරීමට කටයුතු කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6ක ඉඩම් විෂය සම්බන්ධ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අභිප්‍රේරණ වැඩසටහන් 6ක් පැවැත්වීම සඳහා කටයුතු කර ඇත. එමෙන්ම 2018 වර්ෂයේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව උපයන ලද බදු ආදායමෙන් 5%ක ප්‍රතිශතයක් ඉඩම් බදු රැස්කිරීමේ කාර්යය ඉටු කරනු ලබන කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා වශයෙන් ගෙවීම් කර ඇත. ඉඩම් රාජකාරී කටයුතු සම්බන්ධව අදාල කාර්යයන් ඉටුකර ගන්නේ කෙසේද යන්න පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන පුවරු සවිකිරීමද මෙම වසරේදී සිදු කරන ලදි.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් විශේෂ ව්‍යාපෘති දෙකක් මේ වන විට ක්‍රියාත්මක කරන අතර ඒවා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ සිදුවේ. ඒ අනුව ඉඩම් මිලියන එකයි දශම එකක් (මිලියන 1.1) මැන දීමනාපත්‍ර නිකුත් කිරීමේ රජයේ ඉලක්කගත වැඩසටහන සහ රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය (e-slim) මඟින් දීමනාපත්‍ර සකස්කිරීම හා ඉඩම් කච්චේරි පැවැත්වීම යන වැඩසටහන් ක්‍රියාත්මන වන අතර එමඟින් දීමනාපත්‍ර සකස් කිරීම කඩිනම් වී ඇත.

ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සුවිශේෂී සහයෝගයද සහිතව පළාත් ඉඩම් කොමසාරිස් දෙපර්තමේන්තුවේ සමස්ත අරමුණු ඉටුකර ගැනීම තුළින් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය දායකත්වයද සපයමින් 2019 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය ප්‍රශස්ත මට්ටමින් අත්කර ගැනීමට හැකි වී ඇත. කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස දෙපාර්තමේන්තුවේ පවතින කාර්ය මණ්ඩල ඌනතා හේතුවෙන් රාජකාරී කටයුතු ඉටු කිරීමේදී දුෂ්කරතා පැවතීම, රාජකාරී විෂයන් පිළිබඳ නිලධාරීන් තුළ පවතින දැනුවත්භාවය අඩුවීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහෝමයක ප්‍රමාණවත් පරිදි භෞතික සම්පත් නොමැති වීම ආදිය දැක්විය හැකිය.

# 10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

සාරධර්ම සුරකින පරිසර හිතකාමී විනයගරුක නිරෝගී අභිමානවත් සමාජයක් ගම තුළ නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට දායකත්වය සපයන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 තුළ විවිධ වැඩසටහන් පවත්වමින් ප්‍රජාව සමග ඍජුව සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සාම්ප්‍රදායික තත්වයන්ගෙන් මිදී තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගත හැකි පරිදි පළාත් සභා ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රජා දායකත්වය ප්‍රමුඛ කොටගෙන 2018 වර්ෂයේ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සිදු කොට ඇත. ඒ සඳහා බිම් මට්ටමින් අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල පවතින ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් සහ දිස්ත්‍රික් සංගම් සඳහා ක්‍රියාත්මක සැලසුම් සකස්කර ඇත.2019 වර්ෂයේ උතුරු මැද පළාත් සභාව මගින් ලබාදුන් ප්‍රතිපාදන යොදා ගනිමින් 2011 අංක 03 දරණ උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සහ පළාත් සභා මූල්‍ය නීති සංග්‍රහය, භාණ්ඩාගාර චක්‍රලේඛන, රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛන , පළාත් සභා සැලසුම් අංශයේ චක්‍රලේඛන හා ආකෘතිවලට අනුව විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීම සිදුවේ.උතුරු මැද පළාත් සභාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම ග්‍රාම සංවර්ධන නිලධාරීන් එක් අයෙක් බැගින් අනුයුක්තකර ඇති අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම පවත්වාගෙන යනු ලබන තිරසර සංවර්ධන ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන (ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ) සඳහා මැහුම් උපදේශිකාවන් එක් අයෙකු බැගින් පත්කර ඇත. අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ක්ෂේත්‍ර රාජකාරී අධීක්ෂණය කිරීමට ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් දෙදෙනෙක් සහ ජ්‍යෙෂ්ඨ මැහුම් උපදේශිකාවන් දෙදෙනෙක් පත්කර ඇත.

1947න් පසු බිහිවූ නිදහස් ශ්‍රී ලංකාවෙහි ප්‍රථම රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දෙපාර්තමේන්තු විෂය ලැයිස්තුවෙහි දක්නට ලැබෙන ග්‍රාම සංවර්ධන විෂය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා 1987.11.14 දින සම්මත කරන ලද 13 වන සංශෝධනයෙන් පළාත් සභා මඟින් ක්‍රියාත්මක කළ යුතු පළාත් සභා විෂයක් ලෙස ලැයිස්තු ගත කර තිබේ. ඒ අනුව මධ්‍යම රජයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරය පළාත් සභාව තුළ ආරම්භ වූ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය වෙත පැවරී ඇත. මධ්‍යම රජය යටතේ ග්‍රාම සංවර්ධන විෂය තුළ කටයුතු කළ ග්‍රාම සංවර්ධන නිලධාරීන් (RDO) පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර තිබේ.පසු කාලීනව ග්‍රාම සංවර්ධන විෂය ක්ෂේත්‍රය තුළ අත්කරගත් ප්‍රගතියත් සමඟ අදාල කාර්යය සංවිධිත ලෙස ඉටුකිරීම සඳහා 1990.01.01 දින සිට උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

අදාල විෂයපථයෙහි පරිපාලනමය හා සංවර්ධන කටයුතු විමධ්‍යගත කරමින් පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 හි ප්‍රාදේශීය ලේකම්වරුන් ග්‍රාම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස පත් කිරීම තුළින් ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන කාර්යභාරය ඵලදායී හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. වර්තමානය වනවිට 2011 අංක 3 දරන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය මඟින් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල සියලු කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය බලය ප්‍රදානය කර ඇත.

## ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන -11

| |
|---|
| හොරොව්පතාන |
| මැදවච්චිය |
| රඹෑව |
| පදවිය |
| කැබිතිගොල්ලෑව |
| මිහින්තලේ |
| කැකිරාව |
| ඉපලෝගම |
| නොච්චියාගම |
| නාච්චාදූව |
| පලුගස්දමන |

## ලියසවිය මධ්‍යස්ථානය - 14

| | |
|---|---|
| තිරප්පනේ | වැලිකන්ද |
| හිඟුරක්ගොඩ | මැදිරිගිරිය |
| මධ්‍යම නුවරගම් පළාත | රඹෑව |
| කහටගස්දිගිලිය | කැබිතිගොල්ලෑව |
| ගල්නෑව | තලාව |
| පලුගස්වැව | රාජාංගනය |
| ඉපලෝගම | පදවිය |

## ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ තොරතුරු

| අංකය | ප්‍රාදේශිය ග්‍රාම සංවර්ධන කාර්යාලය | ග්‍රාම සං. සමිති සංඛ්‍යාව | මූල්‍ය වත්කම (රු) | තුලාන සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | නැ.නු.ප | 54 | 22,632,659 | 29 | 72 | 16,382 |
| 2 | ම.නු.ප | 32 | 2,159,575 | 40 | 181 | 15,721 |
| 3 | මහ විලච්චිය | 21 | 2,300,000 | 17 | 102 | 6,817 |
| 4 | නොච්චියාගම | 36 | 4,618,870 | 36 | 110 | 16,355 |
| 5 | රාජාංගනය | 21 | 870,000 | 21 | 53 | 10,521 |
| 6 | තඹුත්තේගම | 26 | 1,000,000 | 26 | 63 | 13,843 |
| 7 | ගල්නෑව | 35 | 2,425,259 | 30 | 71 | 11,374 |
| 8 | පලාගල | 35 | 907,402 | 35 | 98 | 11,124 |
| 9 | නාච්චාදූව | 37 | 4,389,525 | 19 | 49 | 7,995 |
| 10 | තලාව | 52 | 3,595,376 | 39 | 120 | 19,433 |
| 11 | ඉපලෝගම | 36 | 1,600,000 | 32 | 106 | 10,225 |
| 12 | කැකිරාව | 59 | 1,744,174 | 53 | 118 | 18,873 |
| 13 | මිහින්තලේ | 45 | 3,688,365 | 25 | 82 | 9,890 |
| 14 | තිරප්පනේ | 42 | 1,100,000 | 41 | 81 | 8,031 |
| 15 | පලුගස්වැව | 19 | 1,487,806 | 16 | 38 | 5,419 |
| 16 | හොරොව්පොතාන | 19 | 16,000,000 | 37 | 112 | 11,400 |
| 17 | ගලෙන්බිඳුනුවැව | 38 | 875,000 | 41 | 115 | 15,951 |
| 18 | කහටගස්දිගිලිය | 31 | 815,000 | 40 | 127 | 11,346 |
| 19 | කැබිතිගොල්ලෑව | 38 | 1,222,000 | 26 | 103 | 8,118 |
| 20 | පදවිය | 45 | 3,850,000 | 15 | 45 | 6,520 |
| 21 | මැදවච්චිය | 44 | 15,060,101 | 37 | 112 | 16,309 |
| 22 | රඹෑව | 38 | 2,675,000 | 38 | 104 | 11,853 |
| 23 | තමන්කඩුව | 53 | 6,400,000 | 56 | 117 | 23,259 |
| 24 | හිඟුරක්ගොඩ | 54 | 4,060,998 | 53 | 140 | 19,211 |
| 25 | මැදිරිගිරිය | 87 | 9,064,158 | 45 | 111 | 20,195 |
| 26 | ලංකාපුර | 31 | 10,002,000 | 28 | 51 | 11,381 |
| 27 | වැලිකන්ද | 34 | 4,500,000 | 29 | 48 | 12,120 |
| 28 | දිඹුලාගල | 49්6 | 9,500,000 | 56 | 90 | 24,745 |
| 29 | ඇළහැර | 33 | 9,893,398 | 28 | 89 | 10,797 |
| | **මුළු එකතුව** | **1141** | **148,436,666** | **988** | **2,708** | **385,208** |

## තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන 11

- රඹෑව
- මැදවච්චිය
- පදවිය
- හොරොව්පොතාන
- කැබිතිගොල්ලෑව
- මිහින්තලේ
- කැකිරාව
- ඉපලෝගම
- නොච්චියාගම
- නාච්චාදූව
- තමන්කඩුව

## දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

- ප්‍රාදේශීය සංගම් 29 (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව)
- දිස්ත්‍රික් සංගම් 02
- තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන 29

| | |
|---|---|
| මුළු ග්‍රාම සංවර්ධන සමිති සංඛ්‍යාව | 1141 |
| අනුරාධපුර | 803 |
| පොළොන්නරුව | 338 |

## දැක්ම

"උරුමය සුරකින පිරිපුන් ගමක්, සෞභාග්‍යමත් පළාතක්."

## මෙහෙවර

"උරුමය සුරකින පිරිපුන් ගමක් බිහි කිරීම සඳහා ප්‍රජාව සංවිධානගත කිරීම, ආයතනගත කිරීම හා දැනුම ආකල්ප හා කුසලතාවලින් සන්නද්ධ කිරීම සහ ග්‍රාම සංවර්ධනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිද භාවයකින් යුක්තව සංවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු

1. පුද්ගල සංවර්ධනය ,කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාලව තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම.
2. සාරධර්ම සුරකින, විනයගරුක, අභිමානවත් හා දැනුමැති ප්‍රජාවක් බිහිකිරීම.
3. දැනුම,කුසලතා ,ආකල්ප ,පුරුදු හා සෞඛ්‍යය යන අංශවලින් යහපත් වූත් ,පරිපූර්ණ වූත් දැහැමි පවුල් ඒකක ගොඩනැංවීම.
4. සමිති ගිණුම් ක්‍රියාවලිය මඟින් මූල්‍ය සාක්ෂරතාව ,රක්ෂණය ,අලෙවිකරණය සහ ක්ෂුද්‍ර මූල්‍යකරණය ,බැංකු සංගම්කරණය පිළිබඳ ග්‍රාමීය ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම සහ එම දැනුම ක්‍රියාවට නැංවීම.
5. නායකත්වය, කළමනාකරණය, ඵලදායීතාව වෘත්තීය හා අධ්‍යාපනික සුදුසුකම් වැඩිදියුණුව මූලික කරගත් පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
6. නව නිෂ්පාදන හා සේවා ආරම්භ කිරීම පවත්වාගෙනයාම හා වැඩිදියුණු කිරීම සඳහා ස්වයංරැකියා බිහිකිරීම තුළින් ග්‍රාමීය ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම.
7. න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව නවීන තාක්ෂණය හා නිර්මාණකරණයට අදාල දැනුම පවුල් ඒකක වෙත හා ග්‍රාමීය සංවිධාන වෙත ප්‍රවේශ කරවීම.

8. ළමා , කාන්තා, ආබාධිත හා තරුණ ප්‍රජාව විෂයෙහි ග්‍රාමීය සංවර්ධනයට අදාලව සුවිශේෂී ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.
9. "ගමට දැනුම" සංකල්පය ඔස්සේ ග්‍රාමීය දැනුම් කේන්ද්‍රස්ථාන බිහිකිරීම තුළින් දැනුමැති ප්‍රජාවක් බිහි කිරීම.
10. මත්ද්‍රව්‍ය උවදුර වැලැක්වීම, වකුගඩු රෝග නිවාරණය, පාරම්පරික ගොවිතැන, සාම්ප්‍රදායික සංස්කෘතිකාංග සංරක්ෂණය හා රජරට ප්‍රෞඪ සංස්කෘතිය ආරක්ෂා කරගැනීම ආදී පළාතේ අනන්‍යතාවට හා අභිවෘද්ධියට පාදකවන සුවිශේෂී කාර්යයන් කෙරෙහි ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම.

## කෙටිකාලින අරමුණු

1. පුද්ගල සංවර්ධනය , කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.
2. සමිති ගිණුම්කරණ වැඩසටහන් ඔස්සේ විධිමත් ගිණුම්කරණ හා විගණන ක්‍රියාවලියක් ස්ථාපිත කොට සමිතිවල ප්‍රගතිය ඉහළ මට්ටමකට ගෙන ඒම දක්වා ගිණුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
3. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය මඟින් කුඩා කණ්ඩායම් ක්‍රමය ශක්තිමත් කිරීම , සමිති වර්ගීකරණය හා ශ්‍රේණිගත කිරීම තුළින් ග්‍රාම සංවර්ධන සමිති හා සංගම්වල කාර්යභාරය හා ප්‍රගතිය වැඩි දියුණු කිරීම.
4. ග්‍රාම සංවර්ධන ව්‍යවසායකත්ව සංගමය ස්ථාපිතකර පළාත පුරා විසිරී සිටින සුළු හා මධ්‍යම පරිමාණ ග්‍රාමීය ව්‍යවසායකයින්ට නිෂ්පාදන හා සේවා අලෙවි කටයුතුවලට අවශ්‍ය පුහුණුව, අරමුදල්, අමුද්‍රව්‍ය,වෙළඳපොළ යන ක්ෂේත්‍රවලට අදාලව පහසුකම් සැපයීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලිය ශක්තිමත් කොට ග්‍රාමීය ප්‍රජාව සඳහා ග්‍රාමීය බැංකු සංගම්කරණය ඔස්සේ ණය ලබාදීම ක්‍රමවත් කිරීම හා වැඩි දියුණු කිරීම.
6. ග්‍රාමීය ප්‍රජාවගේ මූලික අවශ්‍යතා සැපිරීම හා නාගරික පරිසරයේ පවතින යටිතල පහසුකම් ග්‍රාමීය ප්‍රජාව වෙත ප්‍රවේශ කරවීම යන කාර්යය ද්විත්වය සඳහා තිරසර ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.
7. ග්‍රාමීය දැනුම් කේන්ද්‍රස්ථාන ලෙස පුස්තකාල හා තාක්ෂණික, අධ්‍යාපනික පහසුකම් සහිත මධ්‍යස්ථාන ගොඩනැංවීමට ග්‍රාමීය ප්‍රජාව සංවිධානගත කිරීම.
8. ග්‍රාමීය ස්වේච්ඡා නායකත්වය වැඩිදියුණු කිරීම සඳහා තරුණ ප්‍රජාව සම්බන්ධ කිරීමට ග්‍රාමීය තරුණ සංගමය ස්ථාපිතකර තරුණ ප්‍රජාව සවිබලගැන්වීම.
9. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල ක්‍රියාත්මක පාඨමාලා ඔස්සේ ග්‍රාමීය ප්‍රජාව තුළ කාන්තාවන් ඇතුළු ඉලක්කගත කණ්ඩායම්හි වෘත්තීය නිපුණතා හා කුසලතා වැඩිදියුණු කිරීම.
10. ග්‍රාමීය පරිසරය සුරක්ෂිත මෙන්ම ප්‍රියමනාප පරිසරයක් ලෙස ගොඩනැංවීම උදෙසා හරිත ඵලදායිතා සංකල්පය ක්‍රියාවට නැංවීම.
11. ග්‍රාම සංවර්ධන විෂය ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට කටයුතු කළ විශිෂ්ට ක්‍රියාකාරිකයින් හා ස්වේච්ඡා සංවිධාන ඇගයීම.
12. පවුල් ඒකක දියුණු කිරීම තුළින් "දැහැමි නිවහනක් "ගොඩනැංවීම සඳහා ගෘහස්ථ ඵලදායීතාවය පදනම් කරගත් ස්වයං ඇගයීම් හා කණ්ඩායම් ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
13. රාජ්‍යය ආයතන හා රාජ්‍යය නොවන ආයතන සමඟ අත්දැකීම්, දැනුම හා සම්පත් හුවමාරුව මඟින් බාහිරදාම කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම.

## ප්‍රධාන කාර්යයන්

1. පුද්ගල සංවර්ධනය , කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාළව තිරසර සංවර්ධන දර්ශක ක්‍රියාවට නැංවීම.
2. කුඩා කණ්ඩායම් පිහිටු වීම , ග්‍රාම සංවර්ධන සමිති පිහිටු වීම, ලියාපදිංචි කිරීම , සමිති සක්‍රියව පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු කාර්යයන් ඉටු කිරීම.
3. සමිති ගිණුම් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම , සමිති මූල්‍ය කටයුතු විගණනය හා විමර්ශනය කිරීමට අදාල ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. සමිති වර්ගීකරණය හා සමිති ඇගයීම.
5. ග්‍රාමීය ස්වේච්ඡා නායකයින් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන්, අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම හා ජොෂ්ඨ සමිති ක්‍රියාකාරීන් ඇගයීම හා සම්මාන ප්‍රදානය කිරීම.
6. ග්‍රාමීය ව්‍යවසායකයින් බිහිකිරීම, ජාලගත කිරීම , පුහුණු කිරීම, මූල්‍ය හා භෞතික පහසුකම් සැපයීම, ඇගයීම හා පසුවිපරම් කිරීම.
7. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ,ග්‍රාමීය ප්‍රජාව ඉතිරිකිරීම්වලට පෙළඹවීම හා ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ගොඩනැගීම මගින් බැංකු සංගම් බිහිකිරීම.
8. අඩු ආදායම්ලාභීන් වෙත මූලික අවශ්‍යතා සපුරාගැනීමට අදාලව නිවාස ඉදිකිරීම පානීය ජල අවශ්‍යතා සැපිරීම වැනි විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
9. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිත NVQ පුහුණු පාඨමාලා පැවැත්වීම පුහුණුලාභීන් වෙත ද්‍රව්‍ය හා මූල්‍යාධාර පිරිනැමීම , පුහුණුලාභින්ගේ නිපුණතා , කුසලතා ඇගයීම හා සම්මාන ප්‍රදානය කිරීම.
10. ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය ඇතුළු පළාත් සභාවේ සමගාමී විෂයන් සහිත ආයතන මගින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සඳහා දායකත්වය සැපයීම.
11. ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය වෙත තරුණ ප්‍රජාව සම්බන්ධ කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප ප්‍රවර්ධනය සඳහා විශේෂ පාඨමාලා සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.
13. ග්‍රාමීය පරිසරය තුළ සුරැකි රජරටට සුවිශේෂී වූ සංස්කෘතිකාංග හා කලාකෘති ආරක්ෂිත කිරීම, පෝෂණය කිරීම හා ඇගයීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
14. ග්‍රාමීය ස්වයංපෝෂිතභාවය කෙරෙහි බලපාන ජල ශක්තිය, බලශක්තිය, දැනුම් ශක්තිය, ශ්‍රම ශක්තිය හා ආරක්ෂාව(සෞඛ්‍යය) යන පංච ශක්තීන් වැඩිදියුණු කිරීමට අදාල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

1. සහභාගීත්ව ගැමි විමසුම තුළින් අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට හා තීරණ ගැනීමට ජනතාවට අවස්ථාව සලසා දීම.
2. ගමේ සම්පත් අධ්‍යයනයකර ඒවායින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කිරීම.
3. නිෂ්පාදනයේදී හා අළෙවියේදී මතුවනගැටළු හඳුනාගෙන හා ඒවා විසඳා ගැනීමට සංවිධාන ශක්තිය ගොඩනැගීම.
4. ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ව්‍යවසායකයන් තුළ දැනුම කුසලතා ආකල්ප වැඩිදියුණු කිරීම.
5. සාමාජිකයන් ඉතිරිකිරීම්වලට පෙළඹවීම හා ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුදල් ගොඩනැගීම.
6. කුඩා කණ්ඩායම් ගොනු කිරීම.

7. කාන්තාවන්ට ක්‍රියාකාරී ලෙස සංවර්ධන කටයුතුවලට හවුල්වීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

8. ග්‍රාමීය ස්වයං පෝෂිතභාවය උදෙසා ජල, බල, දැනුම්, ශ්‍රම හා ආරක්ෂක යන පංච ශක්තීන් වැඩිදියුණු කිරීම් සඳහා ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9. ආගමික හා සංස්කෘතික කටයුතු වැඩිදියුණු කිරීම.

10. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.

11. තරුණයින් සංවිධානගත කිරීම

12. සුභසාධන සේවා සංවිධානය කිරීම හා වැඩිදියුණු කිරීම.

13. ළමා සමාජ පිහිටුවීම හා ළමා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.

පළාත් සභාව විසින් සපයනු ලබන පළාත් සභා සංවර්ධන ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා ග්‍රාම සංවර්ධන සමිති සතු අරමුදල් උපයෝගී කරගනිමින් හා ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ගේ සහ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් මැහුම් උපදේශිකාවන්ගේ උපදෙස් හා මගපෙන්වීම අනුව කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානවල පුහුණුලාභින්ගේ හැකියාවන් ප්‍රවර්ධනය.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

01.සියළු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.


02.සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය නව්‍යකරණය දිරිගැන්වීම.

03.නිරෝගීමත් ජීවිතයක් සහතිකකර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම.

04. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියළු කාන්තාවන් සහ ගැහැණු දැරියන් සවිබල ගැන්වීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2019

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුමත | 91 |
| 02 | සේවයේ නියුතු | 66 |
| 03 | පුරප්පාඩු | 25 |



## පුනරාවර්තන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු . මි) | 2019 වර්ෂයේ වියදම (රු . මි) | ඉතිරිය (රු . මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 109.00 | 35.00 | 74.00 | 33 |
| ගමන් වියදම් | 2.22 | 2.22 | 0.00 | 100 |
| සැපයීම් | 1.35 | 1.18 | 0.17 | 87 |
| නඩත්තු වියදම් | 1.02 | 1.02 | 0.00 | 100 |
| ගිවිසුම්ගත සේවා | 3.07 | 2.30 | 0.77 | 75 |
| මාරු කිරීම් | 0.45 | 0.34 | 0.11 | 76 |
| **එකතුව** | **117.54** | **42.92** | **75.05** | **36.51** |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු . මි) | 25% අවුරා තැබීමෙන් පසු ඉතිරි ප්‍රතිපාදනය | 2019 වර්ෂයේ වියදම (රු.මි) | 25% අවුරා තැබීමෙන් පසු ඉතිරිය (රු.මි) | 25% අවුරා තැබීමෙන් පසු උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 25.89 | 19.21 | 19.21 | 0.00 | 100 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 5.95 | 5.70 | 5.11 | 0.595 | 89 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 19.15 | 15.96 | 15.92 | 0.04 | 99.7 |
| **එකතුව** | **51.00** | **40.87** | **40.24** | **5.60** | **98.6** |

## දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක, හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක |
|---|---|
| 1.<br>සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | ස්වශක්තියෙන් නැගී සිටින විනයගරුක පරිසර හිතකාමී සාරධර්ම සුරකින නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.<br>ස්වශක්තියෙන් නැගී සිටින විනයගරුක පරිසර හිතකාමී සාරධර්ම සුරකින නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම. |
| 4.<br>පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථාව සැලසීම. | සියලුම ග්‍රාම සංවර්ධන සමිතිවල මූල්‍ය විනයක් ඇති කිරීම සඳහා එකම ක්‍රමයකට ගිණුම් තැබීම පිළිබඳව ග්‍රාම සංවර්ධන නිලධාරින් සහ සමිති නිලධාරීන් පුහුණු කිරීම, ගිණුම්කරණය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථ සකස් කිරීම. |

| තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක |
|---|---|
| 8.<br>සියල්ලන් සඳහාම පෝෂිත,<br>පරිපූර්ණ සහ තිරසර ආර්ථික<br>වර්ධනය,<br>පූර්ණ,<br>ඵලදායී සහ යහපත් රැකියා<br>ප්‍රවර්ධනය කිරීම<br>. | තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල ඉගෙනුම් ලාභීන්ගේ කුසලතාවයන් එලි දැක්වීම, ඔවුන් ඇගයීම සඳහා සහතිකපත් සහ මුදල් ත්‍යාග පිරිනැමීම, ස්වයංරැකියාවන් බිහිකිරීම. |
| | තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ජාතික වෘත්තීය නිපුණතා සහතික ලබා ගැනීම සඳහා සුදුසු පරිසරයක් තුළ ස්ථාපිත කිරීම , එම මධ්‍යස්ථානවල පුහුණුලාභීන්ගේ පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීම. |
| | සියලු සමිතිවල ක්‍රියාකාරකම් තිරසර සංවර්ධන වැඩසටහන් සහ පළාත් ප්‍රතිපත්ති හා මධ්‍යම රජයේ ප්‍රතිපත්තීන්ට අනුගතව ඉටු කර ගැනීමට හැකිවන පරිදි සැලසුම් කිරීම සඳහා තිරසර සංවර්ධන විෂය හා අධීක්ෂණ තිරසර නිලධාරීන් පත් කිරීම සහ සංවර්ධන කමිටු පත් කිරීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ග්‍රාම සංවර්ධන නිලධාරීන් සෞඛ්‍යය හා පෝෂණයට අදාළ තිරසර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| 9.<br>සවිමත්<br>යටිතල පහසුකම් ගොඩනැගීම,<br>පරිපූර්ණ සහ තිරසර<br>කාර්මීකරණය<br>ප්‍රවර්ධනය කර<br>නව්‍යකරණය<br>දිරිගැන්වීම | සියලු වයස් කාණ්ඩවලට අයත් ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කුඩා කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම. ස්වයං රැකියා තුළින් පවුල් ඒකකය සංවර්ධනය කිරීම, චක්‍රිය ණය යෝජනා ක්‍රමය මගින් කුඩා කණ්ඩායම් තුළ මූලධන පහසුකම් ඇති කරලීම, ආර්ථික සංවර්ධනයේදී බල පවත්වන මිත්‍යා මත නැති කිරිම සඳහා ග්‍රාමීය ජනතාව දැනුමින් සන්නද්ධ කිරීම. |
| | ප්‍රජා සහභාගීත්වයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ගම්දොර අභියස සංවර්ධන හා සංස්කෘතික වැඩසටහන තුළින් ප්‍රජා සහභාගිත්වයෙන් යටිතල පහසුකම් ප්‍රවර්ධනය, චක්‍රීය ණය යෝජනා ක්‍රමය මඟින් අවම පොලී අනුපාතයකට ග්‍රාමීය ප්‍රජාවගේ ණය අවශ්‍යතාව පූර්ණය කිරීම , සංස්කෘතික කලා උරුමයන් ජනතාව අතර ප්‍රචලිත කිරීම සහ ග්‍රාමීය ජනතාවගේ දක්ෂතා එළි දැක්වීමට වේදිකාව සකස් කර දීම, යෞවන හා වැඩිහිටි ග්‍රාමීය ප්‍රජාවගේ ශාරීරික සුවතාවය සඳහා ක්‍රීඩා තරඟ පැවැත්වීම. |
| | සවිඥානිකව නිර්මාණශීලිව තාක්ෂණය භාවිතය තුළින් රටේ සංවර්ධනයට දායක වීමට ග්‍රාමීය තරුණ ප්‍රජාව නිවැරදි මාවතකට යොමු කරලීම සඳහා තරුණ සංගම් පිහිටු වීම සහ ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා චක්‍රීය ණය අරමුදල් ලබා දීම. |

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජන (රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **8.සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ,ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** | | | |
| සියලු වයස් කාණ්ඩවලට අයත් ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කුඩා කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ස්වයං රැකියා තුළින් සංවර්ධනය කිරීම, චක්‍රිය ණය යෝජනා ක්‍රමය මගින් කුඩා කණ්ඩායම් තුළ මූලධන පහසුකම් ඇති කරලීම,ආර්ථික සංවර්ධනයේදී බලපවත්වන මිත්‍යා මත නැති කිරිම සඳහා ග්‍රාමීය ජනතාව දැනුමින් සන්නද්ධ කිරීම. | කුඩා කණ්ඩායම් ස්ථාපිත ග්‍රාම සංවර්ධන සමිති-10<br>කුඩා කණ්ඩායම් සංඛ්‍යාව -70<br>ව්‍යවසායකයින් සංඛ්‍යාව-350<br>චක්‍ර ප්‍රතිලාභීන් (පවුල් සාමාජිකයින් 10500)<br>ලබා දුන් චක්‍රිය ණය අරමුදල් ප්‍රමාණය ලක්ෂ 09. | 1.0 | 1.0 |
| **1. සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම** | | | |
| ස්වශක්තියෙන් නැගී සිටින විනය ගරුක පරිසර හිතකාමී සාරධර්ම සුරකින නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම. | ස්වයං ඇගයීම් පත්‍රිකාවේ සඳහන් ගෘහ ආර්ථික කළමනාකරණයට අදාළ උපදෙස් අනුගමනය කරන නිවාස සංඛ්‍යාව 1500 | 1.5 | 1.5 |
| **9. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම** | | | |
| ප්‍රජා සහභාගීත්වයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ගම්දොර අභියස සංවර්ධන හා සංස්කෘතික වැඩසටහන තුළින් ප්‍රජා සහභාගිත්වයෙන් යටිතල පහසුකම් ප්‍රවර්ධනය ,චක්‍රීය ණය යෝජනා ක්‍රමය මඟින් අවම පොලී අනුපාතයකට ග්‍රාමීය ප්‍රජාවගේ ණය අවශ්‍යතාව ,සංස්කෘතික කලා උරුමයක් ජනතාව අතර ප්‍රචලිත කිරීම සහ ග්‍රාමීය ජනතාවගේ දක්ෂතා එළි දැක්වීමට වේදිකාව සකස් කර දීම.<br>යෞවන හා වැඩිහිටි ග්‍රාමීය ප්‍රජාවගේ ශාරීරික සුවතාවය සඳහා ක්‍රීඩා තරඟ පැවැත්වීම. | සංවර්ධනය කල ග්‍රාමීය මාර්ග ප්‍රමාණය 2.0Km<br>ලබා දුන් චක්‍රිය ණය අරමුදල් ප්‍රමාණය ලක්ෂ 10<br>කලා මංගල්‍යයන් සඳහා සහභාගි වූ ජන සංඛ්‍යාව 15000<br><br>ක්‍රිඩා තරඟ සඳහා සහභාගි වූ ජන සංඛ්‍යාව 3000 | 3.8 | 3.79 |
| **11.නගර හා ජනාවාස සංයුක්ත,සුරක්ෂිත ,ස්ථායී සහ තිරසාර කරලීම.** | | | |
| පදිංචියට ස්ථිර නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ග්‍රම සහභාගීත්වයෙන් ස්ථිර නිවාස ඉදිකර දීම. | 2019 වසරේ උතුරු මැද පළාතේ ඉදිකළ නිවාස සංඛ්‍යාව 58 | 5.8 | 5.8 |
| **4.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථාව සැලසීම.** | | | |
| උතුරු මැද පළාත පුරා ස්ථාපිත වී ඇති සියළුම ග්‍රාම සංවර්ධන සමිතිවල මූල්‍ය විනයක් ඇති කිරීම සඳහා එකම ක්‍රමයකට ගිණුම් තැබීම පිළිබඳව ග්‍රාම සංවර්ධන නිලධාරීන් සහ සමිති නිලධාරීන් පුහුණු කිරීම, ගිණුම්කරණය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථ සකස් කිරීම. | පුහුණු කළ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 26<br><br>පුහුණු කළ සමිති නිලධාරින් සංඛ්‍යාව 1782<br><br>ගිණුම්කරණය පිළිබඳ නිර්මාණය කළ ග්‍රන්ථ සංඛ්‍යාව 02 | 2.2 | 2.2 |

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජන(රු.මි) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **8.සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ,ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** | | | |
| තාක්ෂණය භාවිතය තුළින් රටේ සංවර්ධනයට දායක වීමට ග්‍රාමීය තරුණ ප්‍රජාව නිවැරදි මාවතකට යොමු කරලීම සඳහා තරුණ සංගම් පිහිටු වීම සහ ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා චක්‍රීය ණය අරමුදල් ලබා දීම. | බිහිකළ තරුණ සංගම් සංඛ්‍යාව 05<br>නිකුත් කල චක්‍රීය ණය අරමුදල් ප්‍රමාණය 450000.00 | 0.5 | 0.49 |
| තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල ඉගෙනුම් ලාභීන්ගේ කුසලතාවයන් එළි දැක්වීම ,ඔවුන් ඇගයීම සඳහා සහතිකපත් සහ මුදල් ත්‍යාග පිරිනැමීම. | සිසුන් සඳහා ලබා දුන් මූල්‍යාධාර ප්‍රමාණය, පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව දෛනිකව සහභාගීවූ ජන සංඛ්‍යාව | 1.0 | 0.99 |
| තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ජාතික වෘත්තීය නිපුණතා සහතික ලබා ගැනීම සඳහා සුදුසු පරිසරයක් තුළ ස්ථාපිත කිරීම මගින් පුහුණුලාභින්ගේ පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීම. | NVQ උපදේශයන්ට අනුව නවීකරණය කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව | 1.0 | 1.0 |
| **9. සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කිර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම** | | | |
| සියලු සමිතිවල ක්‍රියාකාරකම් තිරසර සංවර්ධන වැඩසටහන් සහ පළාත් ප්‍රතිපත්ති හා මධ්‍යම රජයේ ප්‍රතිපත්තීන්ට අනුගතව ඉටු කර ගැනීමට හැකිවන පරිදි සැලසුම් කිරීම සඳහා තිරසර සංවර්ධන විෂය හා අධීක්ෂණ නිලධාරීන් පත් කිරීම සහ සංවර්ධන කමිටු පත් කිරීම.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සෞඛ්‍යය හා පෝෂණයට අදාළ තිරසර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | පත් කළ තිරසර සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව<br><br>කොට්ඨාසවල ක්‍රියාත්මක කළ වැඩසටහන් සංඛ්‍යාව | | |
| පළාත පුරා විසිරි ඇති ග්‍රාම සංවර්ධන සමිතිවල භෞතික මූල්‍ය ශ්‍රම ශක්තිය සහ අරමුණු දියුණු කිරීම පදනම් කරගෙන සෑම ග්‍රාම සංවර්ධන සමිතියක්ම දැනුවත් සමිති ඇතුළත්,අළු,කළු,සුදු වශයෙන් ශ්‍රේණිගත කිරිම. | 01.මුළු ග්‍රාම සංවර්ධන සමිති සංඛ්‍යාව සපිරි සමිති/දැනුවත් සමිති/ඇතුළත් සමිති/ අළු සමිති/කළු සමිති/සුදු සමිති | 0.27 | 0.25 |
| **4.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථාව සැලසීම.** | | | |
| ග්‍රාම සංවර්ධන නිලධාරීන් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා රජරට විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කිරීම. | ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සහභාගීවන නිලධාරීන් සංඛ්‍යාව ඵලදායී ගුණාත්මක සේවාවක් තුළින් ජීවන තත්වය උසස් කර ගන්නා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 0.1 | 0.1 |
| **8.සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ,ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** | | | |
| ග්‍රාම සංවර්ධන ස්වයං රැකියාකරුවන්ගේ සංගමය බිහි කිරීම සහ ගැමි පියස දිස්ත්‍රික් නිෂ්පාදන හා සේවා මෙහෙයුම් මධ්‍යස්ථානය ඉදි කිරීම තුළින් විසිරී සිටින ස්වයං රැකියාකරුවන් සවියක් වීම. | ස්වයං රැකියා සංගම් සංඛ්‍යාව ස්වයං රැකියාලාභීන් සංඛ්‍යාව ඉදිකල දිස්ත්‍රික් නිෂ්පාදන හා සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව | 19.2 | 19.2 |

## තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| තිරසර සංවර්ධන අරමුණු | ඉලක්ක | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්කගත ආයෝජනය (රු.මි) | ඉලක්කගත වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 08 | 08.3. | 08.3.1 | කුඩා කණ්ඩායම් සවිබල ගැන්වීම | 1.0 | 0.99 |
| | | | ග්‍රාම සංවර්ධන තරුණ පුහුණුව | 0.5 | 0.5 |
| 01 | 1.4 | 1.4.1 / 1.4.2 | දැහැමි නිවහන | 1.5 | 1.49 |
| 04 | 4.6 | 4.6.1 | ගිණුම්කරණ පුහුණුව | 2.22 | 2.21 |
| 08 | 8.6 | 8.6.1 | ග්‍රාම සංවර්ධන අභිමානී වැඩසටහන - හැකියාවට පියාපත් | 1.0 | 0.99 |
| 11 | 11.ඇ. | 11.ඇ.1 | ග්‍රාමාභිමානී නිවාස ව්‍යාපෘතිය | 1.4 | 1.4 |
| 04 | 4.ආ. | 4.ආ.1 | පුහුණු වැඩසටහන් | 0.5 | 0.49 |
| 08 | 8.6 | 8.6.1 | තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම | 1.0 | 1.0 |
| 08 | 08.3. | 08.3.1 | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල ඉදි කිරීම අවසන් අදියර | 19.2 | 19.2 |
| 04 | 4.ආ. | 4.ආ.1 | ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 0.1 | 0.1 |
| 09 | 9.1 | 9.අ.1 / 9.3.2 | ගම්දොර අභියස වැඩසටහන | 3.8 | 3.79 |
| | | | ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම | | |
| 04 | 4.ආ. | 4.ආ.1 | කාර්යාල උපකරණ මිලදී ගැනීම. | 1.9 | 1.9 |
| | | | මහන මැෂින් මිලදී ගැනීම. | 1.4 | 1.4 |
| 17 | 17.18 | 17.18.1 . | ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම. | 1.4 | 1.4 |
| | | | මැහුම් උපදේශිකාවන් සඳහා ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම | 7.5 | 5.9 |


## 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියලු සංවර්ධන ව්‍යාපෘති

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| **කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම - අවසන් අදියර** | |
| ග්‍රාම සංවර්ධන ස්වයං රැකියා කරුවන්ගේ සංගමයේ නිෂ්පාදන අළෙවි සේවා හා අළෙවි මෙහෙයුම් මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැකසීම, ග්‍රාම සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලිය කේන්ද්‍රකරගත් තිරසර ඉතුරුම් හා ආයෝජන සංවිධාන වල මූලස්ථානයක් ලෙස පවත්වාගෙන යාම. | ග්‍රාම සංවර්ධන ව්‍යවසායකත්ව සංගම් හා බැංකු සංගම් සාමාජිකයන් |
| **පුහුණු වැඩසටහන්** | |
| මානව සම්පත් සංවර්ධන සැලැස්ම යටතේ පුද්ගල වෘත්තීය හා ආයතන සංවර්ධනයට අදාළව නිලධාරීන් පුහුණු කිරීම | 75 |
| **ග්‍රාම සංවර්ධන ඩිප්ලෝමාව සකස් කිරීම** | |
| ප්‍රථමවරට ග්‍රාම සංවර්ධන විෂයය සම්බන්ධව රජරට විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හැදෑරීමට අවස්ථාව ලබාදීම තුළින් ක්ෂේත්‍ර රාජකාරී සඳහා නව හා පුළුල් දැනුමක් නිලධාරීන් තුළ ගොඩනැඟීම | 30 |
| **දැහැමි නිවහන** | |
| "දැහැමි නිවහන" ව්‍යාපෘතිය යටතේ සම්පාදිත පිරිපුන් කැදැල්ල උපදෙස් පත්‍රිකාවට අනුව එදිනෙදා ජීවිතයේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග 168ක් පිළිබඳව හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයන් දැනුවත් කිරීම හා කුඩා කණ්ඩායම් ක්‍රමය හා දර්ශක පාදක ස්වයං රැකියා ඇගයීමේ ක්‍රමවේදය යටතේ අදාල කාර්යයන් පවුල් ඒකකය තුළ ක්‍රියාත්මක භාවයට පත්කිරීම | 4500 |
| **ගම්දොර අභියස** | |
| සමාජයෙන් ගිලිහී යන ගැමි සමාජයේ විවිධ සංස්කෘතිකාංග අංග පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම, සංස්කෘතික අංග ඉදිරිපත් කිරීමට ග්‍රාමීය ප්‍රජාවට අවස්ථාවලබාදීම තුළ මානසික තෘප්තිය හා සමඟිය ගොඩනැංවීම හා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ගැමි ජනතාව වෙත ප්‍රවේශ කරවීම ජනප්‍රිය කිරීමත් සමිති සාමාජිකයන් සහ දෙපාර්තමේන්තුව එක්ව ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා සමිතිවල ක්ෂුද්‍ර මූල්‍යය ක්‍රියාවලිය ශක්තිමත් කිරීම | 1100 |
| **ග්‍රාම සංවර්ධන අභිමානී වැඩසටහන** | |
| තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල පුහුණුව ලැබූ සිසුන්ගේ නිර්මාණ ඇගයීමට ලක් කිරීම හා මෙම පාඨමාලා සඳහා නවක පිරිස් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය පිරිස් දැනුවත් කිරීම වෙළඳපල අවස්ථා උදාකරදීම | 2900 |
| **තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම** | |
| NVQ මට්ටමේ පුහුණුලාභීන් බිහි කිරීම සඳහා මැදවච්චිය ග්‍රාම සංවර්ධන ගොඩනැඟිල්ල තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස අළුත්වැඩියා කිරීම | වසරකට 40 දෙනා බැගින් |
| **තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම** | |
| NVQ මට්ටමේ පුහුණුලාභීන් බිහි කිරීම සඳහා මැදවච්චිය ග්‍රාම සංවර්ධන ගොඩනැඟිල්ල තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස අළුත්වැඩියා කිරීම | වසරකට 40 දෙනා බැගින් |

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| **ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම** | |
| සමිති ශ්‍රේණිගත කිරීම හා ඇගයීම තුළින් සමිති අතර ඇතිවන තරඟකාරිත්වය නිසා සෑම සමිතියක්ම භෞතික, දැනුම, මුල්‍ය හා ශ්‍රම ශක්තියෙන් පරිපූර්ණ වූ ස්වශක්තියෙන් නැගී සිටිය හැකි සමිති බවට පත්කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබාදීම. | 15000ක් |
| **කුඩා කණ්ඩායම් නායකත්ව පුහුණුව** | |
| කුඩා කණ්ඩායම් ක්‍රමය පිළිබඳ සමිති සාමාජිකයන් දැනුවත් කිරීම තුළින් සමිතවල සිටින ස්වයංරැකියා කරුවන් ඒකරාශිකර ව්‍යවසායක සංගමය ගොඩනැගීම තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීම | 150 |
| **ගිණුම්කරණ පුහුණුව** | |
| ග්‍රාම සංවර්ධන සමිතිවල ගිනුම්කරණ කටයුතු පළාත පුරා එකම ආකෘතියකට සහ නිවැරදි ගිනුම්කරණ පිළිවෙතකට අනුව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියලුම ග්‍රාම සංවර්ධන සමිති නියෝජනය වන පරිදි තෝරාගත් නිලධාරීන් එකම ක්‍රමයකට ගිණුම් තබමු, විගණනය අනිවාර්යයි- ප්‍රගතිය පැහැදිලියි" යන සංකල්පය ඔස්සේ දෙවන වටයේ පුහුණුවක් ලබාදීම. | 3000 |
| **ශ්‍රමාභිමානී නිවාස** | |
| ආරක්ෂිත නිවාස නොමැති පුද්ගලයන්හට නිවාස ඉදිකර දීම | 174 |
| **කාර්යාල උපකරණ මිළදී ගැනීම** | |
| ක්ෂේත්‍ර නිලධාරීන් හා මැහුම් උපදේශිකාවන් සඳහා කාර්යාල උපකරණ ලබාදීම | 58 |
| **මහන මැෂින් මිලදී ගැනීම** | |
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් ලබාදීම | වසරකට 1000 දෙනා |
| **ලැප්ටොප් මිළදී ගැනීම** | |
| ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලැප්ටොප් ලබාදීම | 13 |
| **මැහුම් උපදේශිකාවන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීම** | |
| උපදේශිකාවන් සඳහා ලැප්ටොප් ලබාදීම | 7 |

## අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

### "අලුත් නිවහනක් -පැහැබර අනාගතයක් "ශ්‍රමාභිමානී නිවාස වැඩසටහන.




ප්‍රජා ක්‍රියාකාරී සැලසුම්කරණය හා සහභාගීත්ව ක්‍රමවේදය ඔස්සේ ග්‍රාම සංවර්ධනය පිළිබඳ සාකල්‍යය ප්‍රවේශය මත පළාතේ තමන්ට නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා උනන්දු කරලීම , ඉඩ පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය කිරීම හා එමගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම හා ආර්ථික සමෘද්ධිය ළඟා කර දීම සඳහා කටයුතු කිරීම මෙම වැඩසටහනේ අපේක්ෂාවයි. 2019 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා රු.මි. 5.8ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 29 තුළ නිවාස 58ක් ඉදි කරන ලද අතර එක් නිවසක් සඳහා වෙන් කළ මුදල රු.100000.00කි.

**"හම්බන්තොට ජනශක්ති බැංකු සංගම්වල ඉතුරුම් හා ණය ක්‍රියාවලිය පිළිබඳ හැදෑරීම "**
**ධාරිතා සංවර්ධන වැඩසටහන.**

2019 වර්ෂයේදී උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සතු දත්තවලට අනුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 29ක් පුරා ග්‍රාම සංවර්ධන සමිති 1141 සතුව රු.256,787,013.00 ක අරමුදලක් වත්කම් ලෙස ඇත. එම මූල්‍ය වත්කම වැඩි දියුණු කෙරෙන ප්‍රධාන ක්‍රමවේදය "ක්ෂුද්‍ර මූල්‍ය ණය" ක්‍රියාවලියයි. ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන නව ප්‍රවණතා හා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයට එම ක්ෂේත්‍රයේ ඇති අභියෝග සලකා ක්ෂුද්‍ර මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරිමේ අවශ්‍යතාව ඉටු කිරීම මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරිණි. වෙන් කළ ප්‍රතිපාදන මුදල රු.මි.0.58කි. සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව 06ක් වූ අතර ස්වේච්ඡා සමිති නායකයින් 30 ක් මේ සඳහා සහභාගී විය.

**ග්‍රාම සංවර්ධන සමිති ස්වෙච්ඡා නායිකාවන් සඳහා වූ සමාජ සජීවීකරණ හා නායකත්ව පුහුණු වැඩසටහන - පිළිමතලාව ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා පුහුණු ආයතනය**



උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය තුළ සමස්ත සාමාජිකයින් සංඛ්‍යාව 25000 පමණ වන අතර එයින් බහුතර පිරිස කාන්තාවන් ය. ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය මගින් අපේක්ෂිත අරමුණු 02ක් විය.එනම්,එම සංවිධානවලට සම්බන්ධිත කාන්තාවන්ගේ පවුල්වල පරිභෝජන රටාව ඉහළ නැංවීම හා දිළිදු බවෙන් මුදවා ගැනීම හා ග්‍රාමීය අංශයේ ව්‍යවසායකත්වයන් ව්‍යාප්ත කිරීමයි. සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයට අදාළව ග්‍රාමීය ප්‍රජා සංවිධාන නායකයින් පුහුණු කිරිමේ ප්‍රධාන ආයතනයක් වන පිළිමතලාව ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා පුහුණු ආයතනය මගින් උතුරු මැද පළාතේ තෝරා ගත් ස්වේච්ඡා සමිති නායිකාවන් කණ්ඩායමකට නායකත්ව හා කළමනාකරණ පුහුණුවක් ලබා දීම මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරිණි. මේ සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල රු.මි.143,000කි.

**කාන්තා සජීවිකරණ වැඩසටහන**




ප්‍රජා සංවර්ධනය හා කාන්තා සහභාගීත්වය පිළිබඳ සැලකීමේදී මෙරට කාන්තාවන්ගේ දායකත්වය පිළිබඳ නිවැරදි තක්සේරුවක් හා නිවැරදි මඟ පෙන්වීමක් නොමැති වීම තුළ ඇති වී ඇති ගැටළු කෙරෙහි කාන්තා ප්‍රජාවගේ අවධානය යොමු කිරිම මෙම කාන්තා සජීවිකරණ වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය විය.

ආහාර රටාව, සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරීම, විෂ මත්ද්‍රව්‍ය, එහි දුර්විපාක හා මත් නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම හා ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රියාවලිය පිළිබඳ කාන්තාවන් දැනුවත් කිරිම මෙහිදි සිදු විය. සම්පත්දායකයින් ලෙස බටහිර හා ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් ,පොලිස් නිලධාරීන්, විධායක ශ්‍රේණියේ පරිපාලන නිලධාරීන් සහභාගි වූ අතර මේ සඳහා රු.මි.1.50ක ප්‍රතිපාදන වෙන් කරන ලදී.

**සයමාසික මැහුම් පාඨමාලා පුහුණුලාභීන් වෙත සහන ගෙවීමේ පදනම මත මහන මැෂින් ලබා දීම.**

2019 වර්ෂය තුළ උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද මැහුම් පුහුණු පාඨමාලාවෙහි පුහුණුලාභීන් සංඛ්‍යාව 959 කි. ඔවුන් අතරින් අඩු ආදායම්ලාභී රජයේ සේවයේ නොවන ස්වයං රැකියා කිරීමේ අපේක්ෂාව සහිත පුහුණුලාභීන් 73 දෙනෙකුට මෙම අධිවේගී ජුකී මහන මැෂින් ලබා දීම සිදු කරන ලදී. මේ සඳහා රු.මි.1.50ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් තෝරා ගත් ප්‍රතිලාභීන් ගණන 03කි. සමස්ත ප්‍රතිලාභීන් ගණන 73කි.

## ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

### “එකම ක්‍රමයකට ගිණුම් තබමු” ග්‍රාම සංවර්ධන සමිති ගිණුම් පුහුණු වැඩසටහන

එකම ගිණුම්කරණ ක්‍රමවේදයක් සහ එකම ආකෘතියක ගිණුම් පොත් හා ලේඛන සම්ප්‍රදායක් හඳුන්වාදීමත් අනතුරුව එය විද්‍යුත් ජාලකරණයකට ලක්කරමින් විගණනය සඳහා අවශ්‍ය පසුබිම සැකසීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. සමිතිවල අධීක්ෂණ තනතුරු දරණ ග්‍රාම සංවර්ධන නිලධාරීන් හා සමිති සාමාජිකයින් වෙත විධිමත් ගිණුම් පුහුණු වැඩසටහනක් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙමවැඩසටහන අදියර 02ක් යටතේ ක්‍රියාත්මක විය. පළමු අදියරේදි ග්‍රාම සංවර්ධන නිලධාරී පුහුණුව, ග්‍රාම සංවර්ධන සමිති සඳහා ගිණුම්කරණය ග්‍රන්ථය සම්පාදනය කිරීම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ස්වෙච්ඡා නායකයින් පුහුණු කිරීම සිදු වූ අතර මේ සඳහා රු.මි. 2.45ක මුදලක් වැය කරන ලදී.

දෙවන අදියරේදි ග්‍රාම සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලියට අදාළව ගිණුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ සමිති මුදල් කළමනාකරුවන් පුහුණු කිරීම , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ස්වෙච්ඡා නායකයින් පුහුණු කිරීම මෙහිදි සිදු කරන ලදී. මෙහිදී සණස බැංකු සංගමය, සමුපකාර බැංකු සංගමය, ග්‍රාම සංවර්ධන නිලධාරීන් හා හම්බන්තොට කාන්තා මහ බැංකු සංගමයේ බුද්ධි මණ්ඩලය මගින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

### ග්‍රාම සංවර්ධන සමිති වර්ගීකරණ වැඩසටහන


ග්‍රාම සංවර්ධන සමිතිවල භෞතික, මූල්‍ය, ශ්‍රම ශක්තිය හා අරමුණු පදනම් කරගෙන සෑම ග්‍රාම සංවර්ධන සමිතියක්ම ශ්‍රේණිගත කිරීම ආරම්භ කරන ලදී. සමිති වර්ගීකරණය සඳහා වාර්ෂිකව අයදුම්පත් ගොනු කරනු ලබන සියලු සමිතිවල අයදුම්පත් භාරගැනීමෙන් අනතුරුව පළමුවන වටයේදී ප්‍රජා මණ්ඩලයක් මගින්ද දෙවන වටයේදී නිලධාරී මණ්ඩලයක් මගින් ද තීරණාත්මක වටයේදි දෙපාර්තමේන්තුව මගින් ද අදාළ තොරතුරු පරීක්ෂාවට ලක්කර සමිති වර්ගීකරණය සිදු කරනු ලැබේ.

2019 වර්ෂයේ සිදු කරනු ලැබූ සමිති ශ්‍රේණිගත කිරීම අනුව සපිරි සමිති, දැනුවත් සමිති, ඇතුළත් සමිති , අලු සමිති, කළු සමිති, සුදු සමිති ලෙස වර්ගීකරණය කර ඇත. මුළු සමිති සංඛ්‍යාව 1141ක් වන අතර සක්‍රිය මුළු සමිති සංඛ්‍යාව 594කි. සාමාජික සංඛ්‍යාව 24007 ක වන අතර කුඩා කණ්ඩායම් සංඛ්‍යාව 2449ක් වේ. ව්‍යවසායකයින් සංඛ්‍යාව 5725කි. සමිති සතු මුළු අරමුදල රු.මි.256.80ක් වේ.කුඩා කණ්ඩායම් අරමුදල රු.මි.21.45කි

**ස්වයං රැකියා පදනම් කර ගත් කුඩා කණ්ඩායම් නායකත්ව පුහුණු වැඩසටහන.**

තෝරා ගත් සමිති තුළ ගොඩනගන කුඩා කණ්ඩායම් ඔස්සේ සමාජයේ අවාසිදායක හා පීඩනයට පත්ව ඇති පවුල්වලට මූල්‍ය හා මූල්‍ය නොවන සේවා සැපයීමෙන්ද සමාජයීය ,අධ්‍යාත්මික හා පාරිසරික සේවා සැපයීමෙන් ස්වයං රැකියා මූලික කරගත් සහභාගීත්ව හා සාකල්‍යමය සංවර්ධන ක්‍රියාවලියක් තුළින් ඔවුන්ගේ සමිති බලගැන්වීම මෙම ස්වයං රැකියා පදනම් කර ගත් කුඩා කණ්ඩායම් නායකත්ව පුහුණු_වැඩසටහනේ අපේක්ෂාව වේ. තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10ක කුඩා කණ්ඩායම් නායකත්ව පුහුණු වැඩසටහන ක්‍රියාත්මක විය. මේ සඳහා රු.මි.1.00ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී.

**ගැම්පියස දිස්ත්‍රික් නිෂ්පාදන හා සේවා මෙහෙයුම් මධ්‍යස්ථානය ගොඩනැංවීම**




ග්‍රාම සංවර්ධන සමිතිවල ස්වයංරැකියා පදනම් කරගත් කුඩා කණ්ඩායම් ක්‍රමය ඔස්සේ ගොඩනැගෙන සේවක, කුඩා ව්‍යාපාරික, ව්‍යාපාර අයිතිකරු, ආයෝජක යන ස්ථර හතර තුළට ග්‍රාමීය ජනතාව ගොනු කිරීම සඳහා වන ග්‍රාමීය පොදු වෙළඳපොල ක්‍රමය, ග්‍රාමීය පොදු වෙළඳසල ක්‍රමය, ග්‍රාමීය වෙළඳ කුටි ක්‍රමය, ප්‍රාදේශීය ජංගම වෙළඳපොල ක්‍රමය , ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන, දිස්ත්‍රික් නිෂ්පාදන හා සේවා මෙහෙයුම් මධ්‍යස්ථාන ක්‍රමය හා පළාත් ස්වයං රැකියාකරුවන්ගේ සංගමය ගොඩනැගීම හා එමඟින් කණ්ඩායම් තුළ , ග්‍රාමීය, ප්‍රාදේශීය , දිස්ත්‍රික්, පළාත් , ජාතික යන මට්ටම් ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව, අරමුදල් , අමුද්‍රව්‍ය වෙළඳපොල හා නායකත්වය ගොඩනැගීම මෙම ව්‍යාපෘතියේ අපේක්ෂාවයි.

**ගම්දොර අභියස කලා මංගල්‍යය වැඩසටහන.**

උතුරු මැද පළාත තුළ පවතින 1141 පමණ වන ග්‍රාම සංවර්ධන සමිති වෙත ඒකරාශී වී සිටින ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නංවමින් ආර්ථික සමාජීය අධ්‍යාපනික හා සංස්කෘතික ප්‍රබෝධයක් ඔවුන් තුළ ගොඩනැංවීමට සංස්කෘතිකමය පසුතලයක් හා සාමූහික ප්‍රවේශයක් නිර්මාණය කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

2019 වසරේදී මැදවච්චිය, හිඟුරක්ගොඩ හා තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3 මූලික කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. මේ සඳහා රු.මි. 4.8ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. මෙම වැඩසටහන තුළ චක්‍රීය ණය ආධාර වැඩසටහන,“ලස්සන ගමක්” ශ්‍රමදාන වැඩසටහන, “දැනුම ගමට” අධ්‍යාපනික වැඩසටහන, “ශ්‍රම ශක්ති” ග්‍රාමීය යටතල පහසුකම් සංවර්ධන වැඩසටහන ,“ගම්දොර ” කලා මංගල්‍යය,“ගැමි කිරුළ” එල්ලේ තරඟාවලිය වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක විය.

## "නිරෝගීකමේ පදනම දැහැමි නිවහනයි" - වකුගඩු රෝග නිවාරණ ආදර්ශ ගම්මාන වැඩසටහන

උතුරු මැද පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක් තුළ හඳුනාගත් පවුල් ඒකක 1500 ක් මූලික කරගෙන ඔවුන්ගේ ගෘහස්ත ආර්ථිකය සුරක්ෂිත කරමින් පවුල් ඒකක ශක්තිමත් කර දරිද්‍රතාවය පිටුදැකීම ,සෞඛ්‍යය හා පෝෂණය වැඩිදියුණු කිරීම,කාන්තාවන් සවිබල ගැන්වීම,මූල්‍ය කළමනාකරණය හා මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම,නීරෝගීමත් මෙන්ම සංතුෂ්ටිමත් ජනතාවක් බිහිකරමින් ග්‍රාමීය සංවර්ධනයේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම මෙම ව්‍යාපෘතියේ අපේක්ෂාව විය.පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන වකුගඩු රෝග නිවාරණ ගම්මාන වැඩසටහනට සමගාමීව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කල ප්‍රතිපාදන මුදල රු.මි.1.50කි.

## ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

තිරසර ග්‍රාම සංවර්ධනය (SUSTAINABLE RURAL DEVELOPMENT), නව ග්‍රාම සංවර්ධනය (NEW RURAL DEVELOPMENT), ග්‍රාම සංවර්ධනය සඳහා නව තාක්ෂණය (NEW TECHKOWLODGY FOR RURAL DEVELOPMENT) යන නව විෂයය පථයන් රැසක් මේ වන විට අනුව ගෝලීය වශයෙන් සංවර්ධනය වී ඇත. මෙම නව දැනුම ප්‍රායෝගිකත්වය හා මුසුකරමින් ගමට දැනුම සංකල්පය (KNOWLADGE TO VILLAGE) ඔස්සේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය තුළ නව ප්‍රවණතාවන් බිහි කිරීමට සුදුසු පරිදි ග්‍රාම සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම කළ යුතුව ඇත. ඒ අනුව ජාතික විශ්ව විද්‍යාලයක් මගින් නිර්මාණය කරනු ලබන නව පාඨමාලාවක් රජරට විශ්ව විද්‍යාලය මගින් නිර්මාණය කර ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට මෙන්ම රටේ ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා යොමු වන සියලු නිලධාරීන්ට එම පාඨමාලාව හැදෑරීම සඳහා අවස්ථාව උදාකරදීම මෙම වැඩසටහනේ මූලික අපේක්ෂාව විය.

මෙතෙක් මෙරට ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ග්‍රාම සංවර්ධන විෂයය සඳහා උපාධි හෝ ඩිප්ලෝමා වැඩසටහනක් ක්‍රියාත්මක නොවන තත්වයක් තුළ එම ගැටළුවද සළකා බලමින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනෙහි මේ වන විට විෂයය නිර්දේශ සකස් කිරීම හා පාඨමාලා පැවැත්වීමේ කාල සීමා සැලසුම් කිරීම අවසන් කර ඇත. 2019 සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදන මුදල රු.0.10කි. 2020 මැයි මාසය තුළදී පාඨමාලාව ප්‍රථම වරට ආරම්භ කිරීම අපේක්ෂාව වී ඇත.

## "දිදුලන මනසක් තරුණ රටක්" ග්‍රාම සංවර්ධන තරුණ සංගමය ගොඩනැඟීම සඳහා වන තරුණ පුහුණු වැඩසටහන.

ග්‍රාමීය ස්වෙච්ඡා සංවිධාන තුළින් තරුණ පිරිස් දුරස්වීම, පරම්පරා පරතරයක් ග්‍රාමීය මට්ටමින් ගොඩනැගෙමින් පැවතීම, විෂ මත්ද්‍රව්‍ය ආදී විනාශකාරී සමාජ ප්‍රශ්න කෙරෙහි තරුණ පරපුර ඇදී යාම වැනි ගැටළු නිරාකරණය කරමින් රටක අනාගතය ගොඩනැංවීමේ තීරණාත්මක පිරිස වන තරුණ පරපුර ජාතික සංවර්ධනයට සෘජුව දායක කර ගැනීම සඳහා ග්‍රාම සංවර්ධන සමිතිවල පරිපූර්ණ වගකීම් සහිත නිදහස හිමිවන කුඩා කණ්ඩායම් ක්‍රමවේදය තුළට ප්‍රවේශ කරමින් ග්‍රාමීය, ප්‍රාදේශීය , දිස්ත්‍රික් හා පළාත් මට්ටමෙන් එම ප්‍රජාව ජාලගතකර උතුරු මැද පළාතේ සංවර්ධනය කෙරෙහි බාධාකාරීව පවතින දැනුම, සෞඛ්‍යය හා විද්‍යුත් පාලනය (තොරතුරු තාක්ෂණය හා සංනිවේදනය) යන තත්ත්වයන් වැඩි දියුණුවට අදාළ ජාල ත්‍රිත්වයක් ගොඩනැංවීමට දායක කර ගැනීම මෙම වැඩසටහනෙහි අපේක්ෂාවයි . ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05ක් සඳහා ප්‍රතිපාදන මුදල රු.මි.0.5කි.

## තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ආරම්භයේ සිටම උතුරු මැද පළාත පුරා මධ්‍යස්ථාන 29 ක් තුළ පවත්වාගෙන යනු ලබන මැහුම් පුහුණු පාඨමාලාව මඟින් වර්ෂයකට පුහුණුලාභීන් 1000කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රසස්ත පුහුණුවක් ලබමින් සිටී. ඔවුන් ගෘහස්ථ ආර්ථික ඒකකය ශක්තිමත් කරන ස්වයං රැකියාකරුවන් ලෙසද නිපුන වෘත්තියක නියැලෙන වෘත්තිකයන් ලෙසද ජාතික ශ්‍රම බලකාය වෙත එක්වෙමින් සිටී. ජාතික වෘත්තීය සුදුසුකම් හෙවත් NVQ ක්‍රමවේදය ඔස්සේ පුහුණු පාඨමාලා වලින් නිපුණතාවෙන් හා ප්‍රවීණතාවයෙන් යුතු වෘත්තිකයකු බිහි කිරීම සඳහා වන රජයේ ප්‍රතිපත්තියට එම පාඨමාලාව අනුගත කිරීම කාලෝචිත අවශ්‍යතාවයක් වී තිබේ. ඒ අනුව ග්‍රාම සංවර්ධන මැහුම් පුහුණු පාඨමාලාව NVQ උපදේශයන්ට අනුව ප්‍රතිනය කිරීම මෙම ව්‍යාපෘතියේ අපේක්ෂාව වී ඇත.මේ සඳහා රු.මි.1.0ක ප්‍රතිපාදන මුදලක් වෙන් කරන ලදී.

## හැකියාවට පියාපත් තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන නිර්මාණ ඇගයීම.

උතුරු මැද පළාත පුරා ප්රාදේශීය ලේකම් කොට්ඨාශ 29 තුළ සය මාසික පුහුණු පාඨමාලා 2ක් මඟින් බිහිකරනු ලබන මැහුම් පාඨමාලාලාභීන්ගේ නිර්මාණ කුසලතාව ප්‍රකාශයට පත් කිරීම, ඇගයීම හා එමඟින් පළාතේ ග්‍රාමීය ශ්‍රම බලකායට මැහුම් පුහුණු පාඨමාලාව පිළිබඳ සන්නිවේදනය කිරීම යන අපේක්ෂාවන් මුල් කර ගනිමින් මෙම නිර්මාණ ඇගයීම් ප්‍රදර්ශනය සංවිධාන කරනු ලබයි. 2019 වසරේ මෙම නිර්මාණ ප්‍රදර්ශනය මිහින්තලය උතුරු දකුණු මිත්‍රත්ව සංස්කෘතික හුවමාරු මධ්‍යස්ථානයේදී පැවැත්විණි.එහිදී පුහුණු පාඨමාලාලාභීන් 150ක ප්‍රමාණයකගේ නිර්මාණ කුසලතාවයන් ඇගයීමට ලක් වු අතර ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු මි. 1.00කි.

## මැහුම් උපදේශිකාවන් සඳහා ලැප්ටොප් ලබාදීම

NVQ මැහුම් පුහුණු පාඨමාලා ආරම්භයත් නව තාක්ෂණය හා නව දැනුම පුහුණු පාඨමාලාලාභීන් වෙත ප්‍රවේශ කිරීමේ අවශ්‍යතාවයත් යන කරුණු මූලික කරගෙන මැහුම් උපදේශිකාවන් සඳහා ප්‍රධාන අවශ්‍යතාවයක්ව පවතින ලැප්ටොප් පරිගණක යන්ත්‍ර ලබාදීමේ වැඩසටහනේ පළමු අදියර මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාවට නැඟිණි.මේ සඳහා වැය වු මුදල රු.මි. 0.6කි.

## ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන්

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පළාත් පුහුණු ඒකකය මඟින් සහ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දින 2ක මූල්‍ය රෙගුලාසි හා ආයතන සංග්‍රහය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ පුහුණු වැඩසටහන සහ සාර්ථක ව්‍යවසායකත්ව සංවිධාන ජාලයක් වන වයඹ පළාත් "ඉසුරු පවුර" වැඩසටහන පිළිබඳ අත්දැකීම් හුවමාරු වැඩසටහන පළාත් පුහුණු ඒකකය මඟින් සිදු කරන ලද අතර ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කළ පුහුණු වැඩසටහන් වුයේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වූ "එකම ක්‍රමයකට ගිණුම් තබමු" ගිණුම් පුහුණු වැඩසටහන, මැහුම් උපදේශිකාවන් සඳහා වූ තැටිං පුහුණු වැඩසටහන හා මැහුම් උපදේශිකාවන් සඳහා වූ මැෂින් අළුත්වැඩියා වැඩසටහනයි.

## ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වෙනත් වැඩසටහන් කිහිපයක්

### "මතින් තොර ගමක්" වැඩසටහන යටතේ මත් ද්‍රව්‍ය නිවාරණ දේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම



2019 වර්ෂය තුළ උතුරු මැද පළාතේ 10000කට ආසන්න පිරිසක් විෂ මත්ද්‍රව්‍ය භාවිතයේ විපාක හා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදී. මෙහිදී අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය යටතේ පුහුණුව ලත් ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් එම වැඩසටහන් ග්‍රාමීය කාන්තා ප්‍රජාව,ශිෂ්‍ය ප්‍රජාව,වැඩිහිටි ප්‍රජාව හා තරුණ ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක විය.

### "හරිත සිරිත" ශ්‍රී ලංකාවේ ශාක ආවරණය වැඩිකිරීමේ ග්‍රාමීය වැඩසටහන (Green habit)

මෙම වැඩසටහන යටතේ උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 පුරා විසිරී ඇති ග්‍රාම සංවර්ධන සමිති මඟින් 2019 වර්ෂය තුළ පාරිසරික, වාණිජ වටිනාකමින් යුතු කුඹුක්,කොස්,පොල්,ගම්මිරිස් ආදී පැළ විශාල ප්‍රමාණයක් සිටුවීමේ කාර්යය බාහිර ආයතනවල සහයෝගය ද සහිතව ක්‍රියාත්මක කරන ලදී.

### "ඉඩෝර පාළුව ඇති දැන් - ඥාන වපුරන්න වඩින්න" පාසල් ළමුන්ගේ දැනුම වර්ධනය සඳහා වූ දැනුම මිනුම තරඟාවලිය.

මෙම වැඩසටහන 2019 වසර තුළ නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය පාසල් මූලික කරගෙන ක්‍රියාත්මක විය.

## තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමට යම් ආකාරයකින් කරන ලද දායකත්වය පිළිබඳ සමාලෝචනය

2019 වර්ෂයේදී තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා පහත සඳහන් කාර්යයභාරය ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටු කොට ඇත.

- තිරසර සංවර්ධන විෂය භාර හා අධීක්ෂණ නිලධාරීන් පත් කිරීම.
- ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් මූලික කරගෙන තිරසර සංවර්ධන කමිටු පත් කිරීම.
- ග්‍රාම සංවර්ධන නිලධාරීන් වෙත තිරසර සංවර්ධන අරමුණු,ඉලක්ක හා දර්ශකවලට අදාළව ක්‍රියාත්මක කළහැකි ආකාරයේ වැඩසටහන් හඳුන්වාදෙමින් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පොදු පළාත්දින රැස්වීමේදී අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්යය කරමින් විශේෂ නියෝග මාලාවක් නිකුත් කිරීම හා අදාළ කාර්යයන් අධීක්ෂණය කිරීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති තිරසර සංවර්ධන අරමුණු සාධනය වන ආකාරයෙන් පෙළගැස්වීම හා ක්‍රියාත්මක කිරීම.
- ග්‍රාම සංවර්ධන තිරසර සංවර්ධන ප්‍රවේශය හා අභියෝග නමින් ග්‍රන්ථයක් සකස් කිරීම.
- තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගත හැකි පරිදි ග්‍රාම සංවර්ධන ව්‍යවස්ථාව, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් ව්‍යවස්ථාව, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් සංගම් ව්‍යවස්ථාව සකස් කිරීම.
- නව ග්‍රාම සංවර්ධනය, තිරසර ග්‍රාම සංවර්ධනය ග්‍රාම සංවර්ධනය සඳහා තාක්ෂණය යන නව විෂය පථය පිළිබඳ ග්‍රාම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමට අදාළව ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් රජරට විශ්ව විද්‍යාලය මූලික කරගෙන සකස් කිරීම. (පාඨමාලාව ආරම්භය 2020 මැයි මස වන විට සිදු කිරීමට අපේක්ෂිතය.

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟාවීම - 2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | වියදම/ආයෝජනය (රු.මි.) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| හඳුනාගත් ව්‍යවසායකයින් නව ලොවකට ප්‍රවිශ්ට කරලීම | | | | |
| බිහිවූ සාර්ථක ස්වයං රැකියාකරුවන් | 100 | 400 | 1.0 | 1.0 |
| අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස ආධාර ලබාදීම | | | | |
| නිවාස ගණන | 87 | 58 | 5.8 | 5.8 |
| තෝරා ගත් සාමාජිකයින්ට නායකත්ව පුහුණුව ලබාදීම | | | | |
| පුහුණුලාභීන් | 1380 | - | - | - |
| ග්‍රාමීය තරුණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම | | | | |
| ව්‍යවසායකයින් | - | 80 | 0.5 | 0.5 |
| සියලුම ආකාරයේ සමාජ විෂමචාර වලින් ග්‍රාමීය ප්‍රජාව මුදවාගැනීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | | |
| මත්ද්‍රව්‍ය පුහුණුලාභීන් ගණන | වැඩසටහන් 10 | වැඩසටහන් 18 | - | - |
| පසැල් හැරගිය තරුණ තරුණියන් ප්‍රජා පුහුණු මධ්‍යස්ථානවලට යොමු කිරීම. | | | | |
| වාර්ෂිකව මධ්‍යස්ථානවල පුහුණුවන පුහුණුලාභීන් සංඛ්‍යාව | 877 | | 1.0 | 1.0 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ස්වයං පෝෂිත ආර්ථික රටාවකින් යුතු යහපත් පවුල් සංස්ථා බිහිකිරීම. | | | | |
| දැහැමි නිවහන | ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු වීම | 1.5 | 1.49 | 98 |
| පළාත පුරා ග්‍රාම සංවර්ධන සමිති වලට සම්බන්ධ ස්වෝත්සාහයෙන් නැගී සිටීමට උත්සාහ දරන සාමාජිකයන් ප්‍රවර්ධනය කිරීම. | | | | |
| කුඩා කණ්ඩායම්, තරුණ ව්‍යවසායක ප්‍රවර්ධනය | පුද්ගල සංවර්ධනය ඇති වීම. | 1.5 | 1.4 | 98 |
| යටිතල පහසුකම් සංවර්ධනය කරමින් සාරධර්ම සුරකින සමාජයක් බිහිකිරීම | | | | |
| ගම්දොර අභියස | සමෘද්ධිමත් ගම්මාන ඇතිවීම. | 3.8 | 3.8 | 100 |
| ග්‍රාම සංවර්ධන සමිති ඇගයීමකට ලක්කිරීම | | | | |
| ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම | ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ශක්තිමත් වීම | 0.2 | 0.19 | 98 |
| මැහුම් පාඨමාලාව අවසානයේ අත්කම් නිර්මාණ ප්‍රදර්ශනය කිරීම. | | | | |
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන නිර්මාණ ඇගයීම. | පාඨමාලාව අවසානයේ දක්ෂ සිසුන් බිහිවීම. | 1.0 | 1.0 | 100 |
| පළාත පුරා ග්‍රාම සංවර්ධන සමිති වලට සම්බන්ධ ස්වෝත්සාහයෙන් නැගී සිටීමට උත්සාහ දරන සාමාජිකයන් ප්‍රවර්ධනය කිරීම. | | | | |
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම | | 24.8 | 19.2 | 100 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **අඩු ආදායම්ලාභී නිවාස හිමි අඩක් නිම කල හෝ නව නිවසක් ආරම්භ කිරීමට මූල්‍ය ආධාර සපයනු ලැබේ.** | | | | |
| ශ්‍රමාභිමානි නිවාස වැඩසටහන | නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ වීම. | 5.8 | 5.8 | 100 |
| **නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය** | | | | |
| පුහුණු වැඩසටහන් | නිලධාරීන්ගේ දැනුම වර්ධනය වීම. | 0.5 | 0.49 | 98 |
| **සමිති ගිණුම් කටයුතු ක්‍රමවත් කිරීම** | | | | |
| ගිණුම්කරණ පුහුණුව | සමිති ගිණුම් කටයුතු ක්‍රමවත් වීම | 3.0 | 2.22 | 99 |
| **අවශ්‍යතා සම්පූර්ණ වීම** | | | | |
| මැහුම් උපදේශිකාවන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීම | කාර්යක්ෂම සේවාවක් ලබාගැනීම. | 0.75 | 0.59 | 78 |
| **නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය** | | | | |
| ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | නිලධාරීන්ගේ දැනුම වර්ධනය වීම. | 0.1 | 0.1 | 100 |

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක 2020 | ඉලක්ක 2021 | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|
| ග්‍රාම සංවර්ධන සමිති ශක්තිමත් කිරීම | 600 | 800 | ග්‍රාමීය ප්‍රජාව තුළ සවිමත් ආර්ථිකයක් ඇති කිරීම සඳහා පහසුකම් ඇතිවීම. |
| ව්‍යවසායක සංගම් ප්‍රවර්ධනය කිරීම. | 10 | 15 | ග්‍රාමීය නිෂ්පාදන ඉහළ යෑම. |
| ග්‍රාමීය ප්‍රජාව තුළ ජීවන වින්දනයක් ඇතිකිරීම. | 1500 | 1500 | යහපත් පවුල් සංස්ථා ඇතිවීම. |
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන (තිරසර සංවර්ධන ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.) | 3 | 3 | රැකියා අභිමුඛ අවස්ථා ඇතිවීම. |
| ප්‍රජා මූලික තිරසාර සංවර්ධන වැඩසටහන් පැවැත්විම. | 58 | 100 | ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය යහපත් වීම. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සාරධර්ම සුරකින නිරෝගී පරිසර හිතකාමී සමාජයක් ගම තුළ නිර්මාණය කිරිමේ ක්‍රියාවලියට දායකත්වය සපයන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ජනතාව සවිබල ගැන්විමේ අරමුණින් විවිධ ව්‍යාපෘති ග්‍රාම සංවර්ධන සමිති මූලිකත්වයෙන් පවත්වාගෙන යයි.ගම තුළ ඇති මානව හා භෞතික සම්පත් සංවර්ධනයේ මැදිහත්කරුවන් ලෙස ක්‍රියාකිරීමයි. විවිධ ජීවනෝපාය ක්‍රියාකරකම් මගින් ජන ජීවිතයේ යහපත් වෙනසක් අපේක්ෂා කරන හා ඊට අදාල විවිධ ව්‍යාපෘතින් ග්‍රාම සංවර්ධන සමිති මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

තිරසාර සංවර්ධන දැක්ම සඳහා පුද්ගල සංවර්ධනය කණ්ඩායම් සංවර්ධනය සහ කාර්ය බද්ධ සංවර්ධනය ඉලක්කකර වාර්ෂික පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන මගින් විවිධ ව්‍යාපෘති පළාත පුරා වාර්ෂික අඛණ්ඩව ක්‍රියාවට නංවනු ලබයි. විශේෂයෙන් ග්‍රාමීය ව්‍යවසායකයින් නගා සිටුවීම ව්‍යාපෘතීන් ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන්වල වර්ධනයක් සිදුවන අතර ගැමි ආර්ථිකය ශක්තිමත් වීම තුළින් ණය බර අවම වීම සිදුවන අතර ස්වශක්තියෙන් නැගී සිටින මනා කළමනාකරණයකින් යුතු පුද්ගලයින් බිහි කිරිම අපේක්ෂාවයි.

2019 වර්ෂය වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, පළාත් සභා සංවර්ධන ප්‍රදාන හා පුනරාවර්තන යන වියදම් සඳහා රුපියල් මිලියන 97ක මුදලක් මුළු වර්ෂය පුරා උතුරු මැද පළාතේ තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට සහ ආයතනය පවත්වා ගෙන යාම සඳහා යෙදවිමට හැකියාව ලැබුණු අතර වර්ෂය අවසානයේ සියළු ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමට හැකි වූ අතර එසේ විමට කාර්යාලගත සහ ක්ෂේත්‍රගත සියළුම කාර්ය මණ්ඩලය මනා කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම අගය කළ යුතුය.

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේනතුව නව්‍යකරණ වැඩසටහන් ඔස්සේ යම් වර්ධනයක් ළඟාකරගනු ලැබූ වර්ෂයක් ලෙස 2019 වර්ෂය හඳුන්වා දිය හැකිය. පළාත් නිශ්චිත සංවර්ධන ප්රදාන,පළාත් සභා සංවර්ධන ප්‍රදාන හා පුනරාවර්තන යන වියදම් සඳහා රුපියල් මිලියන 97ක මුදලක් සමස්ථ වර්ෂය තුළදී සංවර්ධන කටයුතු සඳහාත් ආයතනය පවත්වාගෙන යාම සඳහාත් යෙදවීමට හැකියාව ලැබිණි.

ප්‍රථම වරට ග්‍රාම සංවර්ධන සමිති වර්ගීකරණය, අඩු ආදායම්ලාභීන්ට රු.100,000.00ක වටිනාකමක් සහිත ශ්‍රමාභිමාණී නිවසක් ලබාදීම, "එකම ක්‍රමයකට ගිණුම් තබමු" වැඩසටහන යටතේ වසර 70ක් වන ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය සඳහා නිශ්චිත ඒකීය විධිමත් ගිණුම්කරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම , ග්‍රාම සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලිය විධිමත් කිරීම,ග්‍රාම සංවර්ධන මැහුම් පුහුණු පාඨමාලාව NVQ ක්‍රමවේදයට අනුගත කිරීම සඳහා ප්‍රථම NVQ මධ්‍යස්ථානය බිහිකිරීම, ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් රජරට විශ්ව විද්‍යාලය මූලික කරගෙන ප්‍රථමවරට මෙරට තුළ ආරම්භ කිරීමට සියළු කටයුතු සකස් කර අවසන් කිරීම , ග්‍රාම සංවර්ධන සමිති සඳහා නව ව්‍යවස්ථාවක් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් විශේෂ ජයග්‍රණය ලෙස ස්මරණය කළයුතු වේ. කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු වන්නේ කාර්යාලගත හා ක්ෂේත්‍රගත නිලධාරීන්ගේ තනතුරු පුරප්පාඩු පැවතීම හා දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම ආදිය වේ.

# 10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජන රජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) 1205/22 හා 2001.10.12 දින උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය බර්ටි ප්‍රේමලාල් දිසානායක මහතා (එවකට විෂය භාර අමාත්‍ය) විසින් 2001.01.01 දින සිට උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම හා පවත්වාගෙන යාම අනුමත කරන ලදි.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාස 04 කින්ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාස 03 කින් ද සමන්විත වේ.අනුරාධපුර දිස්ත්‍රික්කය අනුරාධපුර, හෙරොව්පතාන, මරදන්කඩවල හා නොච්චියාගම විධායක ඉංජිනේරු කොට්ඨාස වශයෙන්ද පොළොන්නරුව දිස්ත්‍රික්කය මනම්පිටිය, මින්නේරිය හා සේවාගම විධායක ඉංජිනේරු කොට්ඨාස වශයෙන්ද පිහිටා ඇත.

## දැක්ම

"ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ඒකාබද්ධ මාර්ග පද්ධතියක්, සමෘද්ධිමත් ප්‍රජාවක්."

## මෙහෙවර

"මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, නඩත්තුව ඇතුළු අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිදභාවයකින් යුක්තව ඉටු කිරීම."

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත තුළ ගුණාත්මක පළාත් මාර්ග පද්ධතියක් ඇති කිරීම.
- මාර්ගයන්හි වැඩිවන රථවාහන සංඛ්‍යාවට (Traffic volume) අනුරූපීව අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- ආරක්ෂිත ප්‍රාදේශීය මාර්ග පද්ධතියක් ඇති කිරීම මගින් මාර්ග අනතුරු අවම කිරීම.
- මාර්ග වත්කම් කළමනාකරණය
- ආයතනික ධාරිතා සංවර්ධනය

## කෙටිකාලීන අරමුණු

- දෛනික හා කාලීන නඩත්තු ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම මගින් මාර්ග බාධා හා අවහිරතා අවම කර ගමනා ගමනය විධිමත්ව පවත්වා ගැනීම.
- විධිමත් කාණු සහ ජල අපවහන පද්ධතියක් පවත්වා ගැනීම සහ මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම සහ සහයෝගය ලබා ගැනීම.

## ප්‍රධාන කාර්යයන්

**01. මාර්ග සැලසුම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.**

- ❖ මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම.
- ❖ මාර්ග ප්‍රවේශයන්, පරිශ්‍රයන් ඇතුළු යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

**02. මාර්ග නඩත්තු කිරීම.**

- ❖ දෛනික නඩත්තුව

**03. අධ්‍යයන සහ පර්යේෂණ සිදු කිරීම**

**I. ශක්‍යතා අධ්‍යයනය**

- ❖ අධිබර වාහන ගමනාගමනය පිළිබඳ අධ්‍යයනයන්.
- ❖ මාර්ගයන්හි රථවාහන ප්‍රමාණයන් සහ එහි ප්‍රවර්ධනයන් (Traffic Volume) අධ්‍යයනය.
- ❖ අනවසර සහ මාර්ග රක්ෂිතවලට සිදුවී ඇති බලපෑම් පිළිබඳ අධ්‍යයනයන්
- ❖ විශේෂිත මාර්ග අවශ්‍යතා සහ සිද්ධි සහිත මාර්ගයන් හඳුනා ගැනීම.
- ❖ මාර්ගවල යටිතල පහසුකම් සංවර්ධනය (පාලම්, බෝක්කු ඇතුළු නිර්මිතයන්)
- ❖ මාර්ග සංඥා සහ සළකුණු ස්ථාපිත කිරීම.
- ❖ කාලීන නඩත්තුව
- ❖ හදිසි අවස්ථා නඩත්තුව

**ii. සමාජ සහ පාරිසරික අධ්‍යයනයන්, කාණු සහ ජලප්‍රවාහන පද්ධතීන් පිළිබඳව අධ්‍යයනයන්.**

- ❖ කාණු සහ ජලප්‍රවාහන පද්ධතීන් පිළිබඳව අධ්‍යයනයන්

**iii. නව තාක්ෂණික ඉදි කිරීම් සහ රසායනාගාර පරීක්ෂණයන්.**

**04. තිරසර සංවර්ධනය මුලික කරගත් කාර්යාල පරිශ්‍රයක් ගොඩනැගීම**

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මාර්ග රක්ෂිත අත්පත් කර ගැනීමට අදාල නීතිමය පසුබිමක් ( පළාත් සභා නීති අංශයේ සහයෙන්) සකසා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.
- ❖ අතවශ්‍ය මාර්ග සංඥා ස්ථාපිත කිරීම සහ පදික මාරු වීම් සලකුණු කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් සැකසීම.
- ❖ පළාත් සභා මාර්ගයන් හි ස්ථාපිත කරනු ලබන නාම පුවරු නියාමනය කිරීමට වැඩ පිළිවෙලක් සැකසීම හා ඒ සඳහා අයකිරීමක් සිදු කිරීම.
- ❖ හියුම් නල (Hume pipe) නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම.
- ❖ මාර්ග නඩත්තු කටයුතු සඳහා කොට්ඨාශ මට්ටමින් බොරළු නිධි හඳුනාගැනිම සහ සේවා සලසා ගැනීමට සැලසුම් සකස් කිරීම.
- ❖ විධායක ඉංජිනේරු කාර්යාලවල සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීමට සැලසුම් සකස් කිරීම.
- ❖ අධිකාරියට අයත් තෝරාගත් මාර්ගවල රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE


**සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම.**

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

**නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.**

## කාර්ය මණ්ඩල තොරතුරු - 2019

| අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 169 |
| 2 | සේවයේනියුතු (ස්ථිර) | 164 |
| 3 | පුරප්පාඩු | 13 |
| 4 | අනියම් | 03 |
| 5 | තත්කාර්ය | 157 |
| 6 | කොන්ත්‍රාත් | 04 |




## පුනරාවර්තන වියදම් - 2019

අධිකාරියේ සමස්ත පුද්ගල පඩිනඩි සඳහා 2019 වර්ෂය වෙනුවෙන් රු119,029,542.24 ක මුදලක් වැය වී ඇති අතර, ඉන් රු 65,000,000.00 ක මුදල පළාත් සභා ප්‍රදාන වශයෙන් ලබා දී ඇති අතර, ඉතිරිය රු 54,029,542.24 ක මුදල ආයතනයේ ඉපයු මුදලින් දරා ඇත.

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2019 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 01.පුද්ගල පඩිනඩි | 65.00 | 119.03 | (54.03) | 100 |
| 02.මාර්ග නඩත්තු වියදම් | 225.00 | 225.00 | 0.00 | 100 |
| **එකතුව** | **290.00** | **344.03** | | |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම - 2019

| විධායක ඉංජිනේරු කාර්යාලය | විස්තරය | ප්‍රතිඵල |
|---|---|---|
| **බෝක්කු ඉදිකිරීම** | | සවිමත් ග්‍රාමීය යටිතල පහසුකම් ගොඩ නැගීම |
| හොරොව්පොතාන | කලවැදි උල්පත-බණ්ඩාර උල්පොත මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම (4+000) | |
| | කලවැදි උල්පත-බණ්ඩාර උල්පොත මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම (5+200) | |
| නොච්චියාගම | එප්පාවල කටියාව මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම (2+550,2+750) | |
| සේවාගම | පරාක්‍රම සමුද්‍රය වැව් බැම්ම මාර්ගයේ බෝක්කුව ඉදි කිරීම (2+600) | |
| මරදන්කඩවල | අලුත්වැව ගල්ලැව පයිඩිකුලම මාර්ගයේ බෝක්කුව අළුත්වැඩියා කිරීම (4+000-4+500) | |
| **පැති බැම් ඉදිකිරීම** | | |
| මනම්පිටිය | බෝගස්වැව-බිම්පොකුණ-වීරාණ මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම(0+380) | |
| සේවාගම | ඩී01, උතුරු ඇල බැම්ම මාර්ගයේ පැති බැම් ඉදි කිරීම(10+816-10+832) | |
| **සපත්තු පාලම් අළුත්වැඩියා කිරීම** | | |
| මනම්පිටිය | සෙවන පිටිය-සඳුන්පිටිය මාර්ගයේ සපත්තු පාලම අළුත්වැඩියා කිරීම (8+250-8+290) | |
| **මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම** | | |
| හොරොව්පොතාන | අගුනොච්චිය-වැලිමුවපොතාන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම (0+000-0+800) | |
| නොච්චියාගම | ගොවිපොළ හංදිය යාය 07 මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම (0+000-0+500) | |
| | ගොවිපොළ හංදිය යාය 07 මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම (0+500-1+000) | |
| සේවාගම | පොළොන්නරුව රවුම් පාර මාර්ගයේ පිවිසුම් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | |
| අනුරාධපුර | තිස්සපුර දෙවන පටුමග පළමු පිවිසුම් මාර්ගයේ කුට්ටිගල් ඇතිරීම. | |
| | 3 වන පියවර 2 වන පටුමග පන්සල මාර්ගය (0+2320 | |

## මූලධන වියදම් - 2019

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය(රු.මි) | 2019 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පළාත් මාර්ග පුනරුත්ථාපනය | 302.00 | 167.67 | 134.33 | 56 |
| **එකතුව** | **302.00** | **167.67** | **134.33** | **56** |

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| ණය පොලී | 0.50 | 0.64 | 127 |
| රසායනාගාර ඉපයීම් | 7.50 | 7.47 | 99 |
| යන්ත්‍රෝපකරණ ආදායම් | 24.0 | 18.39 | 76 |
| ණය ඉපයීම් ආදායම් | 8.77 | 11.34 | 129 |
| ඩයලොග් දුරකථන රැහැන් ආදායම් | 1.40 | 1.32 | 94 |
| සූර්ය පැනල ආදායම් | - | 1.06 | - |
| PRDA මුලධන ව්‍යාපෘති ඉපයීම්(PRDA Over Head) | 40.09 | 38.49 | 96 |
| ස්ථාවර තැන්පතු ආදායම් | 5.33 | 5.51 | 103 |
| වැලි බලපත්‍ර ආදායම් | - | 2.64 | - |
| උපදේශන සේවා | - | 20.08 | - |
| වෙනත් | - | 7.54 | - |

| තිරසර සංවර්ධන ඉලක්ක හා නිමැවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශක | ආයෝජන (රු.මි.) | |
|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය |
| **09.** **සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම** | | | |
| 9.1 ආර්ථික සංවර්ධන සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.<br><br>9.1.1 වසර පුරා භාවිත කළ හැකි මාර්ගයක සිට කි. මී. 2 ක දුර ප්‍රමාණයක් තුළ ජීවත් වන ග්‍රාමීය ජන ගහනයේ ප්‍රමාණය<br><br>9.1.2 මගීන් සහ භාණ්ඩ ප්‍රමාණය, ප්‍රවාහන මාධ්‍යය අනුව. | පුනරුත්ථාපනය කරන ලද මාර්ග දුර (km) හා වැඩිදියුණු කරන ලද මාර්ග දුර (km) | 302.00 | 167.67 |
| **11.** **නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම** | | | |
| 11.2 විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරිම මඟින් 2030 වනවිට සියලුමදෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසාර ප්‍රවාහන පද්ධති ලබාදීම.<br><br>11.2.1. ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත අය යන සාධක මත පොදු ප්‍රවාහන පහසුකම් පහසුවෙන් ලබාගත හැකි ජනගහනයේ ප්‍රමාණය | පුනරුත්ථාපනය කරන ලද මාර්ග දුර (km) හා වැඩිදියුණු කරන ලද මාර්ග දුර (km) | 302.00 | 167.67 |

| ඉලක්කය | දර්ශකය | ව්‍යාපෘතිය | ඉලක්ෂ ගත ආයෝජනය (රු.මි.) | ඉලක්ෂ ගත වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම** | | | | |
| 9.1 ආර්ථික සංවර්ධන සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | 9.1.1 වසර පුරා භාවිත කළ හැකි මාර්ගයක සිට කි. මී. 2 ක දුර ප්‍රමාණයක් තුළ ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය<br>9.1.2 මගීන් සහ භාණ්ඩ ප්‍රමාණය, ප්‍රවාහන මාධ්‍යය අනුව. | 1.බටුකොටුව-සන්සුන්ගම - පන්සල් ගොඩැල්ල මාර්ගය (0+000 - 1 + 000)<br>2.මහඋල්පොත-බිම්පොකුණ මාර්ගය (1 + 700 - 2 +530)<br>3.ගල්කුලම -සිරිපුර මාර්ගය (0 + 000 - 1 + 600)<br>4.තිරප්පනේ - දෙමටැගම මාර්ගය (0 + 000 - 1 + 000) | 302.00 | 167.67 |
| **11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම** | | | | |
| 11.2 විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මඟින් 2030 වන විට සියලුමදෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසාර ප්‍රවාහන පද්ධති ලබාදීම. | 11.2.1. ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත අය යන සාධක මත පොදු ප්‍රවාහන පහසුකම් පහසුවෙන් ලබාගත හැකි ජනගහනයේ ප්‍රමාණය | 5. මරදන්කඩවල - කුංචිකුලම මාර්ගය (6 + 000 - 7 + 000) සහ ගුවන්තොටුපල හන්දිය ආත්තිකුලම - නෙළුම්කුලම මාර්ගය (0 + 000 - 1 + 000)<br>6. මිස්සක මාවත - දෙවන පටුමග - මිහින්තලය මාර්ගය (0+000+1+255)<br>7. මිහිඳුපුර පන්සල මාර්ගය කාපට් ඇතිරීම (0+000+0+560) | 302.00 | 167.67 |

## 2019 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති | ක්‍රියාකාරකම | ආවරණය කරන ලද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස |
|---|---|---|
| බුද්ධගයා මාවත උරහිස් සකසා ඒබීසී යොදා මාර්ගය කාපට් කිරීම(0+000-1+000) | මාර්ග කාපට් කිරීම. | නැගෙනහිර නුවරගම් පළාත |
| සීප්පුකුලම -ගලෙන්බිදුණු වැව මාර්ගය (7+000+8+000) | | ගලෙන්බිදුනුවැව |
| පුලස්තිගම අභ්‍යන්තර මාර්ග(km) | | හිඟුරක්ගොඩ |
| දියසෙන්පුර-කහබිලියාව-පන්සල්ගොඩැල්ල මාර්ගය(7+750-8+400) | | ලංකාපුර |
| හිරිපිටියාගම -කළාඔය -කලාමැදවච්චිය මාර්ගය(7+300 10+000) | | මරදන්කඩවල |
| වැලිඔය-නබඩගහවැව මාර්ගය(0+000-1+000) | | රඹෑව |
| පිහිටිවැව- ඉහළ යක්කුරේ මාර්ගය(0+000-1+000) | | දිඹුලාගල |
| ඇලයාපත්තුව -මදුරුපිටිගම මාර්ගය(0+200-1+000) | | මධ්‍යම නුවරගම් පළාත |
| පහල හල්මිල්ලෑව -මැටිකෑව මාර්ගය(0+340-1+500) | | නොච්චියාගම |
| ඇතුන්ගම -ඒරු වැව මාර්ගය (0+000-1+000) | | තිරප්පනේ |
| මී ගස්වැව- තාමරවැව මාර්ගය (0+000-1+000) | | හොරොව්පොතාන |
| තිරප්පනේ-දෙමට වැව(0+000-1+000) පළමු අදියර | | තිරප්පනේ |
| ඉලුප්පුකුලම-කරඹවැව මාර්ගය(1+415-2+500) | | මධ්‍යම නුවරගම් පළාත |
| වැලිඔය-තම්මැන්නාව-කහපත්විල මාර්ගය පෙට්ටි බෝක්කුව(0+040) | පෙට්ටි බෝක්කු සෑදීම | රඹෑව |
| මලියදේව මාවත පෙට්ටි බෝක්කුව (0+240) | | නැගෙනහිර නුවරගම් පළාත |
| බුද්ධගයා මාවත (1+000-2+000) | මාර්ග කාපට් කිරීම. | නැගෙනහිර නුවරගම් පළාත |
| බටු කොටුව - සන්සුන්ගම මාර්ගය (0+000-1+000) | | හිඟුරක්ගොඩ |
| මහඋල්පත - බිම් පොකුණ මාර්ගය (1+700-2+530) | | දිඹුලාගල |
| ගල්කුලම - සිරිපුර මාර්ගය (0+000-1+600) | | පදවිය |
| මරදන්කඩවල - කුංචිකුලම මාර්ගය (6+000-7+000) සහ ගුවන් තොටුපල හංදිය - ආත්තිකුලම - නෙළුම්කුලම මාර්ගය (0+000-1+000) | | ඉපලෝගම /නැගෙනහිර නුවරගම් පළාත |
| තිරප්පනේ - දෙමටෑගම මාර්ගය (0+000-1+000) දෙවන අදියර | | තිරප්පනේ |
| මිස්සක මාවත - දෙවන පටුමග - මිහින්තලය මාර්ගය (0+000+1+255) | | මිහින්තලය |
| මිහිඳුපුර පන්සල මාර්ගය කාපට් ඇතිරීම (0+000+0+560) | | මධ්‍යම නුවරගම් පළාත |

## කාර්ය සාධන ඉලක්ක - 2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක (සංඛ්‍යාව) | | වියදම/ආයෝජනය(රු.මි) | |
|---|---|---|---|---|
| | 2018 | 2019 | 2019 | 2020 |
| **සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක, මාර්ග සංවර්ධන, වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම** | | | | |
| පුනරුත්ථාපනය කරන ලද පාරවල් වල දුර ප්‍රමාණය (කි.මී) | 6.70 | 1.60 | 51.88 | 95.0 |
| වැඩිදියුණු කරන ලද පාරවල්වල දුර ප්‍රමාණය (කි.මී) | 5.60 | 6.43 | 113.77 | 362.00 |
| **දෛනික හා කාලීන නඩත්තු ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම මගින් මාර්ග බාධා හා අවහිරතා අවම කර ගමනාගමනය විධිමත්ව පවත්වා ගැනීම** | | | | |
| නඩත්තු කරන ලද පාරවල්වල දුර ප්‍රමාණය (කි.මී) | 1667 | 1459 | 225.00 | 356.00 |
| **අතවශ්‍ය මාර්ග සංඥා ස්ථාපිත කිරීම සහ පදික මාරු වීම් සලකුණු කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසීම.** | | | | |
| මාර්ග සළකුණු කිරීම් ප්‍රමාණය (වර්ග මීටර්) | 3500.00 | 537.00 | 0.70 | 1.50 |
| සංඥා පුවරු ස්ථානගත කිරීම ( ගණන) | 460 | 98 | 0.90 | 2.00 |
| **විධිමත් කාණු සහ ජල අපවහන පද්ධතියක් හැකි සෑම විටම පවත්වා ගැනීම සහ මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම සහ සහයෝගය ලබා ගැනීම** | | | | |
| ඉදිකළ box culverts ( ගණන) | 01 | 01 | 1.89 | 35.00 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සංවර්ධන වැඩසටහන් - 2019

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග පද්ධතිය ගුණාත්මක ප්‍රාදේශීය මාර්ග පද්ධතියක් බවට පත් කිරීම | මාර්ග කාපට් අතුරා ගුණාත්මක අයුරින් සංවර්ධනය කිරීම. | 302.00 | 167.67 | 56 |

| විධායක ඉංජිනේරු කොට්ඨාශය | ආවරණය වන ප්‍රා.ලේ. කොට්ඨාශ | නඩත්තු කරන ලද මාර්ග | | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | දුර.කි.මි. | |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | |
| අනුරාධපුර | නැ.නු.ප.,රඹෑව,මිහින්තලේ,මැදවච්චිය | - | 260.34 | 23.63 |
| හොරොව්පොතාන | ගලෙන්බිඳුණුවැව, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, හොරොව්පොතාන, පදවිය | 32 | 244.35 | 21.42 |
| මරදන්කඩවල | ගල්නෑව,පලාගල,පලුගස්වැව,ඉපලෝගම, කැකිරාව,තිරප්පනේ | 22 | 197. 3 | 29.16 |
| නොච්චියාගම | තලාව, මනුප, විලච්චිය, නොච්චියාගම, රාජාංගනය | 35 | 294.62 | 56.28 |
| | | | **එකතුව** | 130.49 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | |
| සේවාගම | හිගුරක්ගොඩ,ලංකාපුර,තමන්කඩුව | 26 | 120.96 | 8.31 |
| මින්නේරිය | ඇලහැර/හිඟුරක්ගොඩ,හිගුරක්ගොඩ,හිගුරක් ගොඩ/මැදිරිගිරිය,හිගුරක්ගොඩ/ලංකාපුර, මැදිරිගිරිය | 20 | 124.49 | 15.07 |
| මනම්පිටිය | දිඹුලාගල,වැලිකන්ද | 39 | 216.60 | 17.27 |
| | | | **එකතුව** | 40.65 |
| | ප්‍රධාන කාර්යාලය | | | 36.24 |
| | | | **මුළු එකතුව** | **207.38** |

මාර්ග නඩත්තු වැඩසටහන යටතේ උතුරු මැද පළාතේ මාර්ග නඩත්තු කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු. මිලියන 225 කි. මාර්ග නඩත්තුව යටතේ පහත ක්‍රියාකාරකම් මූලික වශයෙන් සිදු කර ඇත.

- මාර්ගය දෙපස කැළය කැපීම.
- දෙපස උස් සහිත කොටස් යන්ත්‍රානුසාරයෙන් සැකසීම (Clearing High side ).
- මාර්ගය දෙපස සහ පෘෂ්ඨයේ පවතින කඩතොළු පෙරමුසු යොදා සැකසීම.
- අවශ්‍ය ස්ථානයන්හි තාර ආලේපනය (Sand Sealing).
- ක්ෂය වී ඇති උරහිස් (Shoulder) නැවත බොරළු අතුරා තලා සැකසීම.
- කාණු පවිත්‍රා කිරීම/ කැපීම හා ජල අපවාහන පද්ධති පිළිසකර කිරීම.
- කැඩී බිඳී ඇති නිර්මිතයන් පිළිසකර කිරීම.
- මාර්ග සංඥා පුවරු ස්ථාපනය.
- මාර්ග සලකුණු කිරීම.

## 2020 නව සංවර්ධන යෝජනා

| අංකය | ක්‍රියාකාරකම | ඇස්තමේන්තු පිරිවැය (රු.මි) |
|---|---|---|
| 01 | විජයපුර හන්දිය සිට පුබුදුපුර දක්වා මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරිම. | 35.0 |
| 02 | හොරොව්පොතාන සම්බන්ධිත මාර්ගය | 20.0 |
| 03 | මරදන්කඩවල - කුංචිකුලම | 10.0 |
| 04 | සේවාගම මොණරතැන්න මාර්ගය | 30.0 |
| 05 | ගුවන්තොටුපල හන්දිය - ආත්තිකුලම - නෙළුම්කුලම මාර්ගය | 50.0 |
| 06 | මීගස්වැව - තාඹරවැව මාර්ගය | 25.0 |
| 07 | කහටගොල්ලෑව - ගල්කඩවල - වාහල්කඩ මාර්ගය | 22.0 |
| 08 | කපුගොල්ලෑව - මරදන්මඩුව - වාගොල්ලාකඩ මාර්ගය | 45.0 |
| 09 | රනෝරාව - ඉට්ටිකුලම මාර්ගය ප්‍රතිසංස්කරණය | 65.0 |
| 10 | සීවලාකුලම - කයිනාටම | 40.0 |
| 11 | වෙහෙරගල - මල්දෙණිය මාර්ගය | 20.0 |
| 12 | මැදගම්පිටිය - පල්ලේගම මාර්ගය | 20.0 |
| 13 | බටුකොටුව මාර්ගය ඒබීසී අතුරා කාපට් කිරීම | 75.0 |
| 14 | පාලාඩිකුලම - යහලේගම මාර්ගයේ සපත්තු පාලම කොන්ක්‍රීට් කිරිම. | 10.0 |
| 15 | කහටගස්දිගිලිය - කෝන්වැව - දෙමටවැව මාර්ගය - පෙට්ටි බොක්කු | 25.0 |
| | **එකතුව** | **492.00** |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ (ආසියානු සංවර්ධන බැංකු ආධාර)

| ව්‍යාපෘතිය | මුදල (රු.මි) | | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|
| | වෙන්කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | භෞතික | මූල්‍ය |
| කැබිතිගොල්ලෑව - හඳගල මාර්ගය | 308.14 | 289.23 | 94 | 100 |
| තේක්කවත්ත පුල්එලිය මාර්ගය හා දාච්චිදමන -පරණ හල්මිල්ලෑව මාර්ගය | 303.14 | 282.42 | 93 | 100 |
| කිරිකෙටුවැව - බණ්ඩාර උල්පත - කපුගොල්ලෑව මාර්ගය | 559.37 | 509.53 | 91 | 100 |
| යකාවැව - මහකෝන්ගස්කඩ මාර්ගය | 395.06 | 391.44 | 99 | 100 |
| කිරිගල්ලෑව - හීරලුගම මාර්ගය හා ඇතාකඩ ඇටඹගස්වැව තෝනිගල මාර්ගය | 406.65 | 367.65 | 90 | 100 |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ (ලෝක බැංකු ආධාර)

| ව්‍යාපෘතිය | දුර ප්‍රමාණය (කි.මී.) | ඇස්තමේන්තුගත මුළු මුදල (රු. මිලියන) වැට් බදු සමග |
|---|---|---|
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | 371.55 |
| නොච්චියාගම - ගාලේදිවුල්වැව මාර්ගය (0+000-5+000) | 5.00 | |
| ඔයාමඩුව-පේමඩුව මාර්ගය (0+000-11+200) | 11.20 | |
| දඹුලු හල්මිල්ලැව -ගල්කිරියාගම මාර්ගය (0+000-11+000) | 11.00 | 553.87 |
| නෑගම-හල්මිල්ලෑව මාර්ගය (0+000-5+000) | 5.00 | |
| රත්මලේ - නාච්චාදුව මාර්ගය (0+000-5+000) | 3.00 | |
| අලිස්ථාන - තුරුවිල මාර්ගය (10+700-14+400) | 3.70 | |
| හොරොව්පොතාන-කපුගොල්ලෑව මාර්ගය (0+000-14+000) | 14.60 | 396.33 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | 410.71 |
| ඩී 2 ප්‍රධාන ඇල බැම්ම මාර්ගය (91+608-4+400) | 2.80 | |
| කොතලාවල මාර්ගය (0+000-5+000) | 5.00 | |
| මැදිරිගිරිය නව නගරය- අඹගස්වැව මාර්ගය (0+000-3+500) හා (12+000-15+000) | 6.50 | |
| අසේලපුර කුරුළු බැද්ද මාර්ගය (0+000-8+000) | 8.00 | |
| **එකතුව** | **75.80** | 1732.46 |

## වෙනත් රේඛීය අමාත්‍යංශ, දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2019

| ව්‍යාපෘතිය | මුදල(රු.මි) | | ප්‍රගතිය(%) | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|
| | වෙන් කළ | වැය කළ | භෞති ක | මූල්‍ය | |
| කහටගොල්ලෑව-ගල්කඩවල-වාහල්කඩ D2 මාර්ගය. (0+000-4+000 km) | 92.48 | 30.41 | 50 | 30 | ප්‍රවාහන පහසුව, ආරක්ෂිත මහාමාර්ග පද්ධතිය |
| අනුරාධපුර මුස්ලිම් පල්ලිය සළුසල මාර්ගය | 9.91 | 8.60 | 100 | 100 | |
| කැකිරාව ඩිපෝ පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (0+000-0+800) | 5.50 | 4.70 | 100 | 100 | |
| ආනකටාව හබරත්තාවල ගම්මානයේ මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | 4.92 | 4.45 | 100 | 100 | |
| දිවුලන්කඩවල හංදියේ සිට දේවාල කොළනිය හරහා කවුඩුළු වැව දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය | 4.98 | 3.32 | 100 | 100 | |
| අනුරාධපුර දුර සේවා බස්නැවතුම්පොළ භූමිය කාපට් ඇතිරීම. | 5.90 | 3.53 | 100 | 100 | |
| තඹුත්තේගම බස්නැවතුම්පොළ භූමිය කාපට් ඇතිරීම. | 12.68 | 10.74 | 100 | 100 | |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| ඉලක්ක - 2020 | අපේක්ෂිත දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|
| **ආයතනය තුළ ධාරිතා සංවර්ධනය කර කාර්ය සාධනය ඉහළ නංවා ගැනීම** | |
| හියුම් පයිප්ප නල (Hume pipe) නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන කටයුතු ආරම්භකිරීම. | නිසි සැලසුම්කරණයක් සහිතව අධිකාරියේ අවශ්‍යතාවයන් අනුව නිශ්පාදනයන් සිදුකර ගැනීම හා අමතර වශයෙන් වෙළඳපලට නිකුත් කිරීම මඟින් අමතර ආදායමක් ලබා ගැනීම |
| කොට්ඨාශ මට්ටමින් බොරළු නිධි හඳුනාගැනීම සහ සේවා සලසා ගැනීම | සංවර්ධන හා නඩත්තු කටයුතු සඳහා මූලික අමුද්‍රව්‍යයක් වන බොරළු සපයාගැනීමේ අපහසුතා අවම කරගනිමින් ආයතනයේ අවශ්‍යතාවයන් අනුව ප්‍රමාණාත්මකව බොරළු ලබා ගැනීමේ හැකියාව. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2019 සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන, මාර්ග සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතීන්ට අමතරව බාහිර ආයතනවල ප්‍රතිපාදන යොදවා කෙරෙන ව්‍යාපෘතීන්ද, මහජන ඉල්ලීම් හා දේශපාලනාධිකාරිය විසින් කරන ලද ඉල්ලීම්වලට අනුව සිදුකරන ව්‍යාපෘතීන් ද වේ.



වාහල්කඩ මාර්ගය කාපට් යොදා ප්‍රතිසංස්කරණය කිරීම

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පළාත් මාර්ග කි.මී. 14කට ආසන්න ප්‍රමාණයක් මෙම වර්ෂය තුළදී පුනරුත්ථාපනය කරන ලද අතර, මාර්ග නඩත්තු යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාර්ග 120 ක් පමණද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාර්ග 85ක් පමණද නඩත්තු කරන ලදි. මීට අමතරව මාර්ග හා සම්බන්ධ යටිතල පහසුකම් පුනරුත්ථාපනය සහ වෙනත් අදාල නවීකරණයන් සහිතව අඛණ්ඩව මාර්ග නඩත්තු කිරිම සිදු විය.



ගල්කුලම සිවලාකුලම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

ප්‍රදේශයේ මාර්ග සංවර්ධන හා අදාල තාක්ෂණික සේවාවන් අවශ්‍ය වේලාවන්වලදී අවශ්‍ය ආයතනවලට ලබාදීම මෙම අධිකාරියෙන් සිදු වූ සුවිශාල සේවාවකි. තවද තිරසර සංවර්ධනයක් අරමුණු කරගෙන ආයතනය විසින් සංවිධානය කරන ලද මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහනේ පළමු අදියර සාර්ථකව නිම කරන ලදි. කාර්ය සාධනය කරා ළඟා වීමේ දී මුහුණ දුන් අභියෝග හා ගැටළු ලෙස ව්‍යාපෘති පිරිනැමීමේදී ඇතිවූ දුෂ්කරතා හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කරතා සඳහන් කළ හැකිය.

පළාතේ මාර්ග සංවර්ධන ක්‍රියාවලිය උදෙසා අනෙකුත් ආයතන හා මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් තිරසර සංවර්ධනය මූලික කරගත් නිසා අපේක්ෂිත ප්‍රතිඵල කරා උපරිම අයුරින් ළඟා වීමටත් ආයතනයේ කාර්යය සාධනය පසුගිය වසරට වඩා ඉහළ නංවා ගැනීමටත් හැකි විය. අධිකාරියේ මෙහෙවර සමාජයට දායාද කරනු පිණිස ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් ගුණාත්මක ලෙස සිදු කිරිමට හා තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට ආයතනයේ භෞතික, මූල්‍ය හා මානව සම්පත් උපරිම අයුරින් උපයෝගී කර ගන්නා ලදි.

# ඇමුණුම්

# පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2019

## 01. පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ /නව (රු.මි.) | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.ප්‍රධාන අමාත්‍යාංශය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 447,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 372,774,450.37 | 23 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 67 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 258,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 204,236,842.80 | 6 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 27 |
| 02.පළාත් පාලන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 347,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 281,480,200.81 | 47 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 185 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 1,000,000.00 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 3 |
| 03.පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 16,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 13,600,000.00 | - |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 9 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 850,000.00 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 2 |
| 04.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 85,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 67,161,500.00 | - |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 12 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 5,000,000.00 | අඛණ්ඩ (රු.මි.) | 5,000,000.00 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තු

## 02. පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද /නව (රු.මි.) | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. කෘෂිකර්ම අමාත්‍යාංශය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 49,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 43,135,231.93 | 10 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 5 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 5,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 2,759,926.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 5 |
| 02.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 141,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 121,815,539.54 | 21 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 16 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 2,000,000.00 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 2 |
| 03. සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 103,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 86,517,133.97 | 20 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 42 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,500,000.00 | අවිච්ඡේද (රු.මි.) | 3,000,000.00 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 3 |

**මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## 03. පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි) | අවිච්ඡේද / නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.සෞඛ්‍ය අමාත්‍යාංශය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 11,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 7,371,484.00 | 16 |
| 02.සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 312,000,000.00 | අවිච්ඡේද | 91,886,964.78 | 57 |
| | | | නව | 152,588,285.65 | |
| | ලෝක බැංකු / ශ්‍රී ලංකා රජය | 150,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 150,000,000.00 | 95 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 4,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 3,000,000.00 | 1 |
| 03.ආයුර්වේද දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 3,000,000.00 | 2 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 115,000,000.00 | අවිච්ඡේද | 4,543,470.69 | 3 |
| | | | නව | 81,176,564.31 | 14 |
| 04.පරිවාස දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 70,000,000.00 | අවිච්ඡේද | 1,550,143.00 | 5 |
| | | | නව | 51,515,608.00 | 23 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 1,000,000.00 | 1 |
| 05.සමාජ සේවා දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 750,000.00 | 1 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 51,150,000.00 | අවිච්ඡේද | 5,508,089.87 | 3 |
| | | | නව | 45,491,910.13 | 11 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 04.පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූලාශ්‍ර ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද /නව (රු.මි.) | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 4,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 3,500,000.00 | - |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 2 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 200,000.00 | අවිච්ඡේද (රු.මි.) | 3,500,000.00 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 2 |
| 02. කර්මාන්ත සංවර්ධනදෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 50,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 38,081,558.21 | 15 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 31 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | - |
| 03. ක්‍රීඩා දෙපාර්තමේන්තුව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 44,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 38,081,558.21 | - |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 12 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 700,000.00 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 1 |
| 04. සමුපකාර අමාත්‍යාංශය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 25,000,000.00 | අවිච්ඡේද (රු.මි.) | 17,894,119.84 | 9 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | | නව (රු.මි.) | | 2 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 10,780,000.00 | අවිච්ඡේද (රු.මි.) | 8,697,059.56 | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව (රු.මි.) | | 7 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 05. පළාත් ඉඩම්, වාරිමාර්ග, නිවාස, ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි) | අඛණ්ඩ / නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. ඉඩම් | **ප.නි.සං.ප්‍ර.(PSDG)** | 18,500,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 14,115,785.00 | 10 |
| | **ප.ස.සං.ප්‍ර(PCDG)** | 2,355,900.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 1,250,800.00 | 2 |
| 02. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | **ප.නි.සං.ප්‍ර.(PSDG)** | 201,000,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 198,500,000.00 | 21 |
| | **BG** | 266,461,000.00 | අඛණ්ඩ | 2,663,109.00 | 3 |
| | | | නව | 197,090,513.00 | 76 |
| | **ප.ස.සං.ප්‍ර(PCDG)** | 5,000,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 3,581,857.00 | 2 |

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි) | අඛණ්ඩ / නව | 2019 වර්ශයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 03. පළාත් මාර්ග | ප.නි.සං.ප්‍ර.(PSDG) | 302,000,000.00 | අඛණ්ඩ | 118,681,177.86 | 15 |
| | | | නව | 172,034,447.62 | 7 |
| 04. ග්‍රාම සංවර්ධන | ප.නි.සං.ප්‍ර.(PSDG) | 50,000,000.00 | අඛණ්ඩ | 28,587,466.00 | 7 |
| | | | නව | 11,885,688.00 | 10 |
| | ප.ස.සං.ප්‍ර(PCDG) | 1,000,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 950,000.00 | 2 |
| 05. වාරිමාර්ග අමාත්‍යාංශය - (අමාත්‍යාංශ කටයුතු /කාන්තා කටයුතු / නිවාස කටයුතු) | ප.ස.සං.ප්‍ර(PCDG) | 11,000,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 8,775,000.00 | 12 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 327,000,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 14,250,000.00 | 2 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි) | අඛණ්ඩ / නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.මි) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය | PSDG | - | අඛණ්ඩ | - | 0 |
| | | - | නව | - | 0 |
| | BG | - | අඛණ්ඩ | - | 0 |
| | | - | නව | - | 0 |
| | PCDG | 7,500,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 5,992,250.00 | 8 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් සභා ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් සභා ලේකම් කාර්යාලය | PCDG | 17,435,325.00 | අඛණ්ඩ | 15,381,365.00 | 1 |
| | | | නව | 1,850,000.00 | 5 |
| | PSDG | | අඛණ්ඩ | - | 0 |
| | | | නව | - | 0 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | PCDG | 1,500,000.00 | අඛණ්ඩ | - | 0 |
| | | | නව | 500,000.00 | 2 |
| | PSDG | | අඛණ්ඩ | - | 0 |
| | | | නව | - | 0 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## ප්‍රධාන ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලය | BG | 212,195,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 200,000,000.00 | 2 |
| | PCDG | 18,834,350.00 | අවිච්ඡේද | 2,295,330.77 | 1 |
| | | | නව | 15,899,649.95 | 11 |
| | PSDG | 1,500,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 1,500,000.00 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් සැළසුම් දෙපාර්තමේන්තුව | PCDG | 6.128,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 6,128,000.00 | 9 |
| | PSDG | - | අවිච්ඡේද | - | 0 |
| | | | නව | - | 0 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් භාණ්ඩාගාරය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් භාණ්ඩාගාරය | PCDG | 85,920,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 62,000,000.00 | 4 |
| | PSDG | - | අවිච්ඡේද | - | 0 |
| | | | නව | - | 0 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | PSDG | - | අවිච්ඡේද | - | 0 |
| | | | නව | - | 0 |
| | PCDG | 25,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 25,000,000.00 | 10 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | PSDG | - | අවිච්ඡේද | - | 0 |
| | | | නව | - | 0 |
| | PCDG | 3,000,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 3,000,000.00 | 3 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2019 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | PCDG | 1,500,000.00 | අවිච්ඡේද | - | 0 |
| | | | නව | 1,260,210.00 | 3 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## අනුමත, වෙන් කළ ප්‍රතිපාදන - 2019

| ආයතනය | 2019 අනුමත වෙන් කළ ප්‍රතිපාදන | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | PSDG | PCDG | BG | other | |
| පළාත් ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය | - | 5,952,250.00 | - | - | 5,952,250.00 |
| **එකතුව** | **-** | **5,952,250.00** | **-** | **-** | **5,952,250.00** |
| පළාත් සභා ලේකම් කාර්යාලය | - | 17,231,365.00 | - | - | 17,231,365.00 |
| **එකතුව** | **-** | **17,231,365.00** | **-** | **-** | **17,231,365.00** |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | 500,000.00 | - | - | 500,000.00 |
| **එකතුව** | **-** | **500,000.00** | **-** | **-** | **500,000.00** |
| සමුපකාර සේවක කොමිෂන් සභාව | - | 11,750.00 | - | - | 11,750.00 |
| **එකතුව** | **-** | **500,000.00** | **-** | **-** | **500,000.00** |
| ප්‍රධාන අමාත්‍යාංශය | 372,774,450.00 | 204,236,842.00 | 0 | 125,605,000.00 | 702,616,292.00 |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 281,651,100.00 | 1,000,000.00 | 0 | 4,650,000.00 | 287,301,100.00 |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 62,361,500.00 | 5,000,000.00 | 0 | 0 | 67,361,500.00 |
| පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 13,600,000.00 | 850,000.00 | 0 | 0 | 14,450,000.00 |
| **එකතුව** | **730,387,050.00** | **211,086,842.00** | 0 | **130,255,000.00** | **1,071,728,892.00** |

| ආයතනය | 2019 අනුමත වෙන් කළ ප්‍රතිපාදන | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | PSDG | PCDG | BG | other | |
| පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 43,135,231.00 | 2,759,926.00 | 0 | 0 | 45,895,157.00 |
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 121,815,539.00 | 2,000,000.00 | 0 | 0 | 123,815,539.00 |
| පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 79,167,133.00 | 1,000,000.00 | 0 | 0 | 80,167,133.00 |
| **එකතුව** | **244,117,903.00** | **5,759,926.00** | 0.00 | 0.00 | **249,877,829.00** |
| **සෞඛ්‍ය අමාත්‍යාංශය** | - | 8,749,999.00 | - | - | 8,749,999.00 |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 231,014,493.72 | 3,000,000.00 | - | 149,500,000.00 | 383,514,493.72 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 88,720,035.00 | - | - | - | 88,720,035.00 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 51,150,000.00 | - | - | - | 51,150,000.00 |
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 40,473,154.00 | 950,000.00 | - | - | 41,423,154.00 |
| පරිවාස දෙපාර්තමේන්තුව | 53,065,750.50 | 1,000,000.00 | - | - | 54,065,750.50 |
| **එකතුව** | **464,423,433.22** | **13,699,999.00** | **-** | **149,500,000.00** | **627,623,432.22** |

| ආයතනය | 2019 අනුමත වෙන් කළ ප්‍රතිපාදන | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | PSDG | PCDG | BG | other | |
| **සමුපකාර අමාත්‍යාංශය** | 17,894,119.00 | 8,697,059.00 | 0 | 0 | 26,591,178.00 |
| සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 3,500,000.00 | 300,000.00 | 0 | 0 | 3,800,000.00 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 38,081,558.00 | - | 0 | 0 | 38,081,558.00 |
| පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 33,237,450.00 | 700,000.00 | 0 | 0 | 33,937,450.00 |
| **එකතුව** | **92,713,127.00** | **9,697,059.00** | **0** | **0** | **102,410,186.00** |
| **පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය** | 309,465,626.00 | 8,325,000.00 | - | - | 317,790,626.00 |
| පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 198,499,999.00 | 3,581,857.00 | 199,753,621.00 | - | 401,835,477.00 |
| පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව | 13,740,785.00 | 1,625,800.00 | - | - | 15,366,585.00 |
| පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 40,473,154.00 | 950,000.00 | - | - | 41,423,154.00 |
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 290,715,626.69 | - | - | - | 290,715,626.69 |
| **එකතුව** | **852,895,190.69** | **14,482,657.00** | **199,753,621.00** | **-** | **1,067,131,468.69** |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 1,500,000.00 | 14,878,980.00 | - | 200,000,000.00 | 216,378,980.00 |
| **එකතුව** | **1,500,000.00** | **14,878,980.00** | **-** | **200,000,000.00** | **216,378,980.00** |
| පළාත් භාණ්ඩාගාරය | 205,639,990.00 | 62,000,000.00 | - | 19,395,000.00 | 287,034,990.00 |
| **එකතුව** | **205,639,990.00** | **62,000,000.00** | **-** | **19,395,000.00** | **287,034,990.00** |
| **ආයතනය** | **2019 අනුමත වෙන් කළ ප්‍රතිපාදන** | | | | **එකතුව** |
| | **PSDG** | **PCDG** | **BG** | **වෙනත්** | |
| පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 31,729,324.00 | 5,000,000.00 | - | 1,128,000.00 | 37,857,324.00 |
| **එකතුව** | **31,729,324.00** | **5,000,000.00** | **-** | **1,128,000.00** | **37,857,324.00** |
| පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | - | 25,000,000.00 | - | - | 25,000,000.00 |
| **එකතුව** | **-** | **25,000,000.00** | **-** | **-** | **25,000,000.00** |
| පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂන දෙපාර්තමේන්තුව | - | 3,000,000.00 | - | - | 3,000,000.00 |
| **එකතුව** | **-** | **3,000,000.00** | **-** | **-** | |
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | - | 1,260,210.00 | - | - | 1,260,210.00 |
| **එකතුව** | **-** | **1,260,210.00** | **-** | **-** | **1,260,210.00** |
| **මුළු එකතුව** | 2,623,406,017.91 | 390,049,288.00 | 199,753,621.00 | 500,278,042.00 | 3,710,486,926.91 |

## උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය 2019.12.31 දිනට

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2019.12.31 දිනට වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය(Climate Smart Irrigated Agriculture Project) | World Bank(ලෝක බැංකුව) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව / ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව./ කෘෂිකර්ම අමාත්‍යාංශය | ඇ.ඩො.මි.140 | 2018-2024 | 6661823.49 | 0.07 | - |
| 2 | නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය(RIDEP) | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයJICA - ජපානය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය. | 32,000.00 | 2018 - 2021 | 23,732,217.85 | - | තාක්ෂණ ඇගයීම |
| 3 | පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය ( පුරනැගුම) | ආසියානු සංවර්ධන බැංකුව(ADB) - පිලිපීනය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 2,630.00 | 2017-2020 | 1017.69 | 38 | 67 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2019.12.31 දිනට වියදම(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | ප්‍රාථමික සෞඛ්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය(Primary Healthcare Strengthening In | ආසියානු සංවර්ධන බැංකුව | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 180.00 | - | - | - | - |
| 5 | පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය(ESA) | UNDP(එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන) | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය/ | 435,729,669.82 | 2018-2024 | - | - | 83 |
| | | | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6,592,500.00 | 2017 - 2020 | 3,644,863.00 | 55 | 75 |
| | | | | 2,962,620.00 | 2018 - 2019 | 2,130,701.52 | 72 | 90 |
| 6 | ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන අයි මාර්ග ව්‍යාපෘතිය(i- Roads) | ADB | මාර්ග සංවර්ධන අධිකාරිය | 10,502.00 | 2016.08.01 - 2021.07.31 | 9,183.74 | 87 | 100 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| **අනු අංකය** | **ප්‍රධාන ව්‍යාපෘතියේ නම** | **ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට** | **ක්‍රියාත්මක කරන ආයතනය** | **මුළු පිරිවැය (රු.මි.)** | **ව්‍යාපෘති කාලසීමාව** | **2019.12.31 දිනට වියදම (රු.මි)** | **මූල්‍ය ප්‍රගතිය (%)** | **භෞතික ප්‍රගතිය (%)** |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | සංවර්ධනය සඳහා වූ ප්‍රංශ ආයතනය (AFD)/ප්‍රංශය සහ ශ්‍රීලංකා රජයේ මූල්‍ය ප්‍රතිපාදන | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) (උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන/මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය) | 10125.00 (ඇ.ඩො.මි.) | 2016-2021 | 244.71 | - | 11.50% |
| 8 | වැව්ගම් පුබුදුව(CRIWMP) | GEF(හරිත දේශගුණ අරමුදල) | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව /පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය/ආපදා කළමණාකරණ අමාත්‍යාංශය / කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව. | ඇ.ඩො.මි.52 .04 (රු.මි.9400) | 2017-2024 | 410.04 | - | |
| 9 | කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය(ASMP) | World Bank(ලෝක බැංකුව) | පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව/ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. /පළාත් සහ රේඛීය වාරි මාර්ග දෙපාර්තමේන්තු,පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව. | ඇ.ඩො.මි.58 .63 | 2016-2021 | 203.45 | - | |

**මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2019.12.31 දිනට වියදම(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 10 | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | - | - | 2260.44 | - | 42.248 | - | - |
| 11 | ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව(ADB) | මහවැලි අමාත්‍යාංශය | රු.මි.65,000 | වසර 06 2025 දක්වා | 2900 මිලියන | 5.00% | 6.00% |
| 12 | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | - | - | - | - | 807.374025 | - | - |
| 13 | මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය (CCAP II) | UNAF | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 5,516,000.20 | 2018-2019 | 4,041,332.00 | 73% | 85% |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 2019 .12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | ආදායම් ඇස්තමේන්තුව (1) | | ආදායම් රැස්කිරීම් (2) | | | හිඟ ආදායම් රැස්කිරීම් | ආදායමෙන් ආපසු ගෙවීම් (4) | | | ශුද්ධ ආදායම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | අදාළ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් | වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් | එකතුව | | මුදලින් | වැරදි නිවැරදි කිරීම් | එකතුව | |
| <u>සටහන - 1</u> | <u>බදු ආදායම - දේශීය භාණ්ඩ හා සේවා මත බදු</u> | | | | | | | | | | |
| 10.02.04.05 | මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | | | | | | | | | | |
| 10.02.05.04 | මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු | 140,000,000 | | 92,550,601 | - | 92,550,601 | | - | | - | 92,550,601 |
| 10.02.07.00 | රජයේ මාරු කිරීම් - මුද්දර ගාස්තු | 550,000,000 | | 504,015,546 | 923 | 504,016,469 | | 34,085,297 | | 34,085,297 | 469,931,172 |
| 10.02.07.01 | දේපළ පැවරීම් මත මුද්දර ගාස්තු | | | | | | | | | | |
| 10.02.07.02 | අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | | | | | | | | | | |
| 10.02.09.00 | ව්‍යාපාර පිරිවැටුම් බදු | | | | | | | | | | |
| 10.02.12.00 | රජයේ මාරුකිරීම් - ජාතිය ගොඩනැගීමේ බදු | 2,500,000,000 | | 1,660,575,321 | - | 1,660,575,321 | | 34,699,077 | | 34,699,077 | 1,625,876,24 4 |
| 10.03.01.01 | මෝටර් වාහන බලපත්‍ර ගාස්තු | | | | | | | | | | |
| 10.03.07.09 | වෙනත් බලපත්‍ර ගාස්තු | 50,000 | | - | 650 | 650 | | - | | - | 650 |
| | මුළු බදු ආදායම | 3,190,050,000 | - | 2,257,141,468 | 1,573 | 2,257,143,041 | - | 68,784,374 | - | 68,784,374 | 2,188,358,66 7 |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

| ආදායම් සංකේතය | ආදායම් විස්තරය | ආදායම් ඇස්තමේන්තුව (1) | | ආදායම් රැස්කිරීම් | | | හිඟ ආදායම් රැස් කිරීම් | ආදායමෙන් ආපසු ගෙවීම් (4) | | | ශුද්ධ ආදායම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික ඇස්තමේන්තුව | (2) | අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් | වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම් | එකතුව | | මුදලින් | වැරදි නිවැරදි කිරීම් | එකතුව | |
| <u>සටහන -2</u> | **<u>බදු නොවන ආදායම - ගාස්තු, දඩ සහ බලපත්‍ර</u>** | | | | | | | | | | |
| **20.02.01.01** | රජයේ ගොඩනැගිලි බදුකුලිය | 23000000 | | 0 | 27649890 | 27649890 | | 897119 | | 897119 | 26,752,771 |
| **20.02.01.03** | ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු | | | | | | | | | | |
| **20.02.02.02** | පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් මත පොළී | 63,000,000 | | 271,026 | 73,703,099 | 73,974,125 | | 520,911 | | 520,911 | 73,453,214 |
| **20.02.02.03** | ආයෝජන පොළී | 77,000,000 | | 69,205,764 | 2,151,722 | 71,357,486 | | - | | - | 71,357,486 |
| **20.03.02.06** | වනසත්ව හා වෘක්ෂ ලතා ආඥා පනත යටතේ ආදායම් | | | | | | | | | | |
| **20.03.02.26** | වෛද්‍ය ආඥා පනත යටතේ අයකරන ගාස්තු | | | | | | | | | | |
| **20.03.02.27** | ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්ද | | | | | | | | | | |
| **20.03.02.29** | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ගාස්තු | | | | | | | | | | |
| **20.03.02.30** | ඛණිජ බද්ද | | | | | | | | | | |
| **20.03.02.99** | වෙනත් ලැබීම් | 107,000,000 | | 441,964 | 94,566,272 | 95,008,236 | | 1,046,113 | | 1,046,113 | 92,962,123 |
| **20.03.03.01** | උසාවි ගාස්තු | | | | | | | | | | |
| **20.03.03.04** | මෝටර් වාහන මත දඩ | | | | | | | | | | |
| **20.06.02.00** | පාවිච්චි කරන ලද වාහන හා උපකරණ විකුණුම් | 11,550,000 | | - | 2,870,061 | 2,870,061 | | - | | - | 2,870,061 |
| | බදු නොවන ආදායම් එකතුව | **281,550,000** | - | **69,918,754** | **200,941,044** | **270,859,798** | - | **2,464,143** | - | **2,464,143** | **267,395,655** |
| | **මුළු ආදායම (සටහන් 1 - 2)** | **3,471,600,000** | - | **2,327,060,222** | **200,942,617** | **2,528,002,839** | - | **71,248,517** | - | **71,248,517** | **2,455,754,322** |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

## උතුරු මැද පළාත් කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකයේ ලියාපදිංචි සම්පත්දායක සංචිතය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 1 | ජී.ඩී. කීර්ති ගමගේ මයා | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය | 077-3616468 |
| 2 | ආනන්ද කුලරත්න මයා | ලේකම්, ආණ්ඩුකාර කාර්යාලය | 071-4178291 |
| 3 | ඩී.එච්.එම්.එන්.පී. දසනායක මිය | ලේකම්, සමූපකාර අමාත්‍යාංශය | 077-3604296 |
| 4 | එල්.පී. මදනායක මයා | අතිරේක දිස්ත්‍රික් ලේකම් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අනුරාධපුර | 071-8042800 |
| 5 | එස්.එම්.එස්. බන්දුලසේන මයා | අතිරේක දිස්ත්‍රික් ලේකම් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අනුරාධපුර | 071-0361215 |
| 6 | ජී.ඒ. කිත්සිරි මයා | ප්‍රාදේශීය ලේකම් - මධ්‍යම නුවරගම් පළාත | 071-4459091 |
| 7 | එන්.එච්.ආර්. නිශාන්ත මයා | ප්‍රාදේශීය ලේකම් - කහටදිගිලිය | 071-8105505 |
| 8 | අනුරාධ සීබට් මයා | සහකාර ප්‍රාදේශීය ලේකම් - කහටගස්දිගිලිය | 071-3728952 |
| 9 | කේ.ඩබ්.එච්.එම්.ඒ.සී.කේ. හේරත් මයා | ව්‍යවසායකත්ව සංව. පුහුණු නිල.- දි.ලේ.කා අ/පුර | 071-9658076 |
| 10 | නිලංක පුෂ්ප කුමාර මහතා | ව්‍යවසායකත්ව සංව. පුහුණු නිල.- දි.ලේ.කා අ/පුර | 071-2434141 |
| 11 | ඩී.ජී.ඩබ්.සඳපානි ධර්මසේන මිය | ඵලදායිතා සංව. නිලධාරී,දි.ලේ.කා,අ/පුර | 071-8006984 |
| 12 | ටී.එම්.කේ.බී.ප්‍රේමතිලක මයා | පළාත් අධ්‍යක්ෂ,කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 071-8347904 |
| 13 | පී.එච්.එම්.අයි.විජයබණ්ඩාර මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 077-6214446 |
| 14 | අජන්ත ගුණවර්ධන මයා | සමාජ සේවා අධ්‍යක්ෂ | 071-8003969 |
| 15 | එච්.එම්. ප්‍රියදර්ශන හේරත් මයා | මානව සම්පත් නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,තඹුත්තේගම | 071-8075837 |
| 16 | එම්.එන්.ආර්.බී. නවරත්න මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 071-4874377 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 17 | ඩී.එම්.සී.කේ. චන්ද්‍රදාස මිය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) | 071-8227373 |
| 18 | කේ.ඒ. නොයෙල් මයා | සහකාර ලේකම් (සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-8104174 |
| 19 | එස්.වී. ද සේරම් මහතා | සහකාර ලේකම් (විශ්‍රාමික) | 071-6801481 |
| 20 | රේණුකා කුමාරි හේරත් මිය | ප්‍රාදේශීය ලේකම්. - තිරප්පනේ | 071-8226767 |
| 21 | පී. සෝමලතා මිය | පරිපාලන නිල. - සමූපකාර දෙපාර්තමේන්තුව | 077-8883845 |
| 22 | ඩබ්.එම්.ඩබ්.කේ. විජේසිංහ මිය | පරිපාලන නිලධාරී - කළාප අධ්‍යා.කා. කැකිරාව | 075-8216023 |
| 23 | වෛද්‍ය ඩබ්.එම්.එස්. ප්‍රනාන්දු මයා | කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 077-3417444 |
| 24 | නිලූකා ඩී. තිලකරත්න මිය | 718, 2 වන පියවර, අනුරාධපුරය | 7175750616 |
| 25 | ඒ.ජී.එල්.එස්. රණසිංහ මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-8276106 |
| 26 | ඩී.එම්.ආර්.ටී.බී. දිසානායක මයා | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 077-6201392 |
| 27 | පී.ජී. මාලනී මාග්‍රට් මිය | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 071-8096302 |
| 28 | රවීන්ද්‍රා කුමාරි වික්‍රමසිංහ මිය | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 071-8096301 |
| 29 | තුෂාරා දමයන්ති මිය | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 077-3396080 |
| 30 | ආර්.එම්.ඩබ්.එස්.බී. රත්නායක මයා | පරිපාලන නිලධාරී - කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 724084995 |
| 31 | ආර්.එම්.ඩබ්.ඩී. රත්නායක මයා | සහකාර ලේකම් (සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-8476064 |
| 32 | ඩී.බී. ජයතිලක මයා | කුඹුක්වැව, කැකිරාව | 077-0825118 |
| 33 | කේ.එම්. ගුණරත්න බංඩා මහතා | පරිපාලන නිලධාරී - දි.ලේ. කාර්යාලය | 025-2235048 |
| 34 | ටී.බී.එස්. ජිනාදරී මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ක.අ.කා. කැකිරාව | 071-9051380 |
| 35 | එම්.කේ. සෙනෙවිරත්න මයා | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-6554205 |
| 36 | බී.එම්.එන්. අබේරත්න මයා | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 077-3419148 |
| 37 | එම්.එන්.ආර්.බී. නවරත්න මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 071-4874377 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

උතුරු මැද පළාත් කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකයේ ලියාපදිංචි සම්පත්දායක සංචිතය ඉතිරි කොටස...

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 38 | ජේ.එම්.කේ.ආර්. බණ්ඩාර මයා | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-2221975 |
| 39 | ටී.එස්.සී. පෙරේරා මිය | සහකාර ලේකම් (පාලන) - ප්‍රධාන අමාත්‍යාංශය | 714870596 |
| 40 | එම්.ඒ. ප්‍රේමලතා මිය | පරිපාලන නිලධාරී (විශ්‍රාමික) | 071-4429660 |
| 41 | ආර්.එම්. වන්නිනායක මයා | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 072-3458242 |
| 42 | එස්.එන්. ආරියරත්න මෙය | සහකාර අධ්‍ය. (සැලසුම්) | 071-7101131 |
| 43 | එන්.ජී. ගුරුගේ මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය | 071-4458753 |
| 44 | එස්.එම්. ඉන්ද්‍රානී මිය | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-8613032 |
| 45 | එල්.එස්. පතිරාජ මයා | ගණකාධිකාරී,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 071-8165740 |
| 46 | මහාචාර්ය එස්. හෙට්ටිආරච්චි මයා | මහාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8508500 |
| 47 | ආචාර්ය ටී.වී. සුන්දරභාරතී | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8265938 |
| 48 | ආචාර්ය ටී.සී. බමුණුආරච්චිගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8096400 |
| 49 | ආචාර්ය පී.එන්. යාපා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8265938 |
| 50 | පී.බී. දයාරත්න මයා | නි.ප්‍ර.ලේ.(සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-6303356 |
| 51 | ඩී.එම්.එස්. දිසානායක මයා | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන ) - ප්‍රධාන අමාත්‍යාංශය | 071-8272764 |
| 52 | පී.ඒ.යූ. රණසිංහ මයා | සහකාර ලේකම් (සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-4416446 |
| 53 | එස්.එම් හලීම් මයා | පද්ධති පරිපාලක, ප්‍රධාන ලේකම් කාර්යාලය | 077-5045100 |
| 54 | ජේ.එස්.වළාකුළුආරච්චි මයා | කළමනාකරණ සහකාර, පළාත් භාණ්ඩාගාරය | 077-2299722 |
| 55 | එම්.එස්.එම්. කාසිම් මයා | ග්‍රාම නිලධාරී, ප්‍රා.ලේ.කා. හොරොව්පොතාන | 077-3673545 |
| 56 | එන්.එස්. ජයවර්ධන මිය | 2425, 3 පියවර, අනුරාධපුර | 077-4613446 |
| 57 | රත්නසිරි ද සිල්වා මයා | විගණන කාර්යාලය, අනුරාධපුර. | 077-3746001 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 58 | සී.එම්.එස්.පී. ප්‍රේමරත්න මයා | ග්‍රාම නිලධාරී, ප්‍රා.ලේ.කා. හොරොව්පොතාන | 071-8335646 |
| 59 | ආර්.එම්.ඩී. රාජපක්ෂ මයා | ව්‍යා.සං.ව. පුහුණු නිල., දි.ලේ.කා. අනුරාධපුර | 025-2221909 |
| 60 | වයි.ජී. සුමනාවතී මිය | ගුරු උපදේශක - කො.අ.කා. රඹෑව | 071-3383396 |
| 61 | ඒ.එම්.එච්.රංජනී මෙය | කළ.සහකාර සේවය අධි පන්තිය, කලාප අධ්‍යාපන කාර්යාලය, හිඟුරක්ගොඩ. | |
| 62 | ජේ.එම්.ජේ.උපුල්වැහැර මයා | ශ්‍රී ලං. ප.ප.සේ. (විශ්‍රාමික) | 077-3961559 |
| 63 | කුලතුංග බී. හෙට්ටිආරච්චි මයා | ශ්‍රී ලං. ප.ප.සේ. (විශ්‍රාමික) | 077-6060669 |
| 64 | එච්.ජී.එන්.සම්පත් මයා | ගණකාධිකාරී III - දි.ලේ.කා. අනුරාධපුර | 071-5530800 |
| 65 | කේ.ජී.එස්.පී.වීරකෝන් මයා | ප්‍රධාන අභ්‍ය. විගණක, අභ්‍ය. විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 071-2293822 |
| 66 | ඒ.විමලරත්න මයා | අධ්‍යක්ෂ (අයවැය), පළාත් භාණ්ඩාගාරය | 071-8167240 |
| 67 | පී.ඒ.ඩී.එම්.ඩී. පොන්වීර මයා | අධ්‍යක්ෂ (මුදල් හා ආදායම්), - එම - | 071-5350548 |
| 68 | ඩබ්.ටී.ඒ. මානෙල් මිය | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, උ.මැ.ප. | 071-4544925 |
| 69 | ආර්.එච්. ඒකනායක මයා | පරිපාලන නිලධාරී, මාර්ග සංව.අධි. උ.මැ.ප. | 071-8076622 |
| 70 | කේ.පී.සී.පී.කරුණානායක මයා | ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අමාත්‍යාංශය | 071-8101581 |
| 71 | එච්.කේ.ජී. නිරෝෂණා මිය | සහකාර දිස්ත්‍රික් ලේකම්, දි.ලේ.කා. පොළොන්නරුව | 077-7003980 |
| 72 | ඩී.එම්. රුවන් ප්‍රසන්න මයා | ඵලදායිතා නිලධාරී,දි.ලේ.කා,පොළොන්නරුව | 071-2107113 |
| 73 | කේ.ඒ.එස්.පී. විමලරත්න මයා | රාජ්‍ය කළ. සහ. දි.ලේ.කා,පොළොන්නරුව | 071-3013190 |
| 74 | පී.ආර්.එන්.කේ. විජේසිංහ මයා | විමර්ශන නිලධාරී, දි.ලේ.කා,පොළොන්නරුව | 071-8319360 |
| 75 | එම්.එම්.එස්.පී. හේරත් මයා | විමර්ශන නිලධාරී, දි.ලේ.කා,පොළොන්නරුව | 071-9545724 |
| 76 | ජී.ඩී. නයනා ඉන්දුමතී මිය | දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍ර.නිල. දි.ලේ.කා,පොළොන්නරුව | 071-8568430 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 77 | එච්.එම්.ඒ.සී. බණ්ඩාර මයා | රාජ්‍ය නොවන සංවිධාන දි. සම්බන්ධීකාරක | 071-4334182 |
| 78 | ආර්.ජී. ධර්මසේන මයා | දි. සංඛ්‍යා ලේඛනඥ, දි.ලේ.කා,පොළොන්නරුව | 071-8133332 |
| 79 | වයි.ඒ.එන්.එම්. ගුණවර්ධන මිය | පරිපාලන නිලධාරී,ප්‍රා.ලේ.කා. දිඹුලාගල | 077-1817302 |
| 80 | එච්.පී.පී.ආර්.පතිරණ මයා | රා.කළ.සහකාර I ශ්‍රේණිය, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-9754185 |
| 81 | මනෝජි තිලක්ෂිකා ගුරුසිංහ මිය | රා.කළ.සහකාර II ශ්‍රේණිය, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-1015557 |
| 82 | එම්.එල්.රේඛා මිය | රා.කළ.සහකාර II ශ්‍රේණිය, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-6904782 |
| 83 | ඩබ්.එම්.ඒ.වීරකෝන් මයා | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-8046871 |
| 84 | ඩබ්.එම්.යූ.පී.වික්‍රමසිංහ මයා | සංවර්ධන නිලධාරී, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-1094359 |
| 85 | බී.ඩී.කේ.චන්ද්‍රසේන මයා | දිස්ත්‍රික් ඉංජිනේරු III ශ්‍රේණිය, දි.ලේ.කා.පොළොන්නරුව | 077-2396325 |
| 86 | ජයන්ත ධනපාල | සහකාර අධ්‍යක්ෂ, දි.ලේ.කා.පොළොන්නරුව | 077-5688669 |
| 87 | එස්.එම්.කේ.කුමාරිහාමි මිය | ප්‍රාදේශීය ලේකම්, ප්‍රා.ලේ.කා, ඇළහැර | 077-4332338 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය